# ශරීරය සඳහා ඇති

# බල ගැටුම

## හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි. මෙම ඉගැන්වීම්, මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


කණ්ඩායම් වැඩ සඳහා යෝජනා . . . . . . I

හැඳින්වීම . . . . . . 1

අත්පොත . . . . . . 2

පාඩම් . . . . . . 3

පාඩමාලාවේ අරමුණු . . . . . . 4

**පළමුවන කොටස - ශරීරය සඳහා ඇති බල ගැටුම**

1. රාජ්‍යයන් අතර බලගැටුම . . . . . . . 6
2. සන්නද්ධ වීමට කැඳවීම . . . . . . . 18
3. බලගැටුමට පෙර . . . . . . . 24

**දෙවන කොටස - පහරදීම**

4. රෝගයේ මූලාශ්‍රය . . . . . . . 32
5. රෝගයට හේතූන් . . . . . . . 39
6. රෝග වර්ගයන් . . . . . . . 46
7. රෝගයේ අවසාන ප්‍රතිඵලය . . . . . . . 51

**තෙවන කොටස - ප්‍රතිප්‍රහාරය**

8. සුවකිරීමේ බයිබලීය පදනම . . . . . . . 57
9. සුවකිරීමේ පරමාර්ථයන් . . . . . . . 82
10. සුවකිරීමේ දීමනාවන් . . . . . . . 88

**සිව්වන කොටස - අභියෝග ජයගැනීම**

11. මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායයන් . . . . . . . 96
12. මාංසයෙහි කටුව (උල) . . . . . . . 106

13. පිළිතුරු නොලත් ප්‍රශ්න . . . . . . . 112

**පස්වන කොටස - සුවකිරීම සඳහා උපක්‍රම**

14. සුවය සඳහා සේවය කිරීම . . . . . . . 127

15. සුවකිරීමෙන් පසු සේවය . . . . . . . 137

16. අවසාන සුවය . . . . . . . 145

**හයවන කොටස - මිදීම සඳහා උපාය මාර්ග**

17. සාතන් මගින් බැඳ ඇති අය . . . . . . . 152

18. මිදීම ලබා ගැනීම සඳහා සේවය . . . . . . 165

19. මිදීම පිළිබඳ පසු කටයුතු සේවය . . . . . . 176

**හත්වන කොටස - රාජ්‍යයට අනුකූලව ජීවත්වීම**

20. නිරෝගි සටන්කරුවෝ . . . . . . . 181

නිගමනය . . . . . . . . . . 195

**උපග්‍රන්ථය අ.** - රෝග ලක්ෂණ විමර්ශනය . . . . . . 197

**උපග්‍රන්ථය ආ** - සුවය සහ මිදීම උදෙසා බයිබලීය පදනම . . . . 202

**උපග්‍රන්ථය ඇ.** - විශ්ලේෂණ පත්‍රිකාව . . . . . . . 226

ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු . . . . . . . 228

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයන්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තිරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයන් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයන් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා:** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයන්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයන්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්**: ශිෂ්‍යයන් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයන් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

**අවසාන පරීක්ෂණය**: ඔබගේ කණ්ඩායම් සම්මාන සඳහා ලියා පදිංචි වී ඇත්නම්, පාඨමාලාව සමඟ අවසාන පරීක්ෂණය ලැබෙන්නට ඇත. පාඨමාලාව අවසන් කළ පසු සෑම ශිෂ්‍යයෙකුටම ඉන් පිටපත බැගින් දී, පරීක්ෂණයට පිළිතුරු සැපයීම අධීක්ෂණය කරන්න.

# හැඳින්වීම

මුල් සභාව තම ආත්මික අත්දැකීම සැලකුවේ යුද්ධයක් ලෙසය. නව ගිවිසුම තුළ යුදමය වචන මාලාවක් භාවිත කර තිබේ. ආරක්ෂාව දෙවියන්වහන්සේගේ යුද්ධායුද තුළ දකින ලදී. දේව වචනය කඩුවකට සමාන කර ඇත. සාතන්ගේ පහරදීම් ගිනිමය හෙල්ලයන් ලෙස හඳුන්වා ඇත. ඇදහිල්ල "යහපත් යුද්ධය" ලෙසත් ඇදහිලිවතුන්ට යහපත් යුද්ධයේ යුද්ධකිරීමටත් පවසා ඇත. තමන් තියුණු ආත්මික යුද්ධයක නියුක්තව සිටින බව මුල් සභාව දැන සිටියේය.

දැනුම නොමැතිකම නිසා දේව සෙනඟ විනාශවන බව බයිබලය පවසයි (හොෂෙයා 4:6). මෙම අදෘශ්‍යමාන ආත්මික යුද්ධය පිළිබඳව දැනුමක් නොමැතිවීම ඇදහිලිවතුන් පරාජයවීමේ එක් කෙෂත්‍රයකි. අද ලෝකය තුළ ඉතා ප්‍රබල යුද්ධයක් සිදුවෙමින් පවතී. එය ජාතීන්, ගෝත්‍රයන් හෝ රාජ්‍යයන් අතර ගැටුමක් නොවේ. එය කැරලිකාරකමක් හෝ කුමන්ත්‍රණයක් ද නොවේ. එය ඉතා වැදගත්වූ ආත්මික ලෝකයේ සිදුවන යුද්ධයකි.

කිතුනු ජීවිතය යුද්ධයකි. අප එය කලින් දැනගෙන සූදානම්ව සිටීමෙන් අපට ඉක්මණින් ජයග්‍රහණය අත්දැකිය හැකිවේ. මෙම අදෘශ්‍යමාන යුද්ධයේ එක් අංශයක් වන්නේ මනුෂ්‍යයාගේ ප්‍රාණයට හා ආත්මයට විරුද්ධව කෙරෙන යුද්ධයක් වේ. ආත්මික යුද්ධයේ මේ පැත්ත ගැන අවධානය යොමු කරන *"ආත්මික උපක්‍රම: ආත්මික යුද්ධය පිළිබඳ අත්පොත"* නම් අධ්‍යයන පාඨමාලාවක් හාවස්ට්ටයිම් ඉන්ටර්නැෂනල් ආයතනයේ ඇත.

භෞතික තලයේ කරුණු ප්‍රදර්ශනය කෙරෙන මෙම යුද්ධයට අදාළ තවත් අංශයන් ඇත. මෙම පාඨමාලාව තුළ අප එය හඳුන්වා ඇත්තේ *"ශරීරය සඳහා ඇති බලගැටුම"* වශයෙනි. දුර්වල සහ රෝගී යුධවීරයන්ට රාජ්‍යයට එරෙහිව සාර්ථක යුද්ධයක් කළ නොහැකි බව සාතන් දන්නා නිසා ඔහු ඇදහිලිවතුන්ගේ ශරීරයට එරෙහි යුද්ධයක් ආරම්භකර ඇත.

ලූක් 14:31 මෙසේ පවසයි. "නොහොත් වෙන රජෙකුට විරුද්ධව යුද්ධයකට යන කවර රජෙක් තමාට විරුද්ධව විසිදහසක් ගෙන එන්නාවූ ඔහු ඉදිරියට දසදහසක් සමග යන්ට පුළුවන්දෝ කියා පළමුකොට හිඳ මන්ත්‍රණය නොකරන්නේද?" තමන් සතු සම්පත් සුපරීක්ෂාවෙන් පරීක්ෂාකර බැලීමක් සහ යුධමය උපායමාර්ගයන් වර්ධනය කර නොගෙන කිසිවෙක් යුද්ධයකට පිවිසිය යුතු නැත.

මෙම පාඨමාලාව තුළ ඔබගේ ශරීරයට විරුද්ධව සාතන්ගේ යුද්ධය ජයගැනීමට හැකිවන උපායමාර්ගයන් පිළිබඳව ප්‍රවේසම් සහිත ඇගයීමක් මෙම පාඨමාලාවෙන් සිදු කරමු. ඔබ ඔබගේ ශරීරයට යුද්ධය කරන ආකාරය ඉගෙන ගැනීමටත් එම සත්‍යතාවයන් දෙවියන්වහන්සේගේ හමුදාවේ තුවාලවූ යුධවීරයන්ට කියාදී මෙහෙකිරීමටත් ඉගෙන ගනු ඇත.

## අත්පොත

මෙම අත්පොත කාණ්ඩ හතකට වෙන් කර ඇත.

**ප්‍රථම කොටස : "ශරීරය සඳහා ඇති බලගැටුම"** දේවරාජ්‍යය හා සාතන්ගේ රාජ්‍යය අතර ඇති අදෘශ්‍යමාන යුද්ධය ගැන සාකච්ඡා කරයි. යුද්ධය සඳහා සන්නද්ධවීම ගැනත් යුද්ධයට අවශ්‍ය මූලික සූදානම ගැනත් කරුණු ඊට ඇතුළත් වේ.

**දෙවන කොටස: ප්‍රහාරය,** මූලාශ්‍රය, හේතූන්, වර්ග සහ රෝගයේ අවසාන ප්‍රතිඵල පිළිබඳව සාකච්ඡා කරයි.

**තෙවන කොටස : ප්‍රති ප්‍රහාරය,** සුවකිරීම පිළිබඳ බයිබලීය පදනම පිළිබඳ අවබෝධය, සුවකිරීමේ පරමාර්ථ සහ සුවකිරීමේ දීමනාවන් පිළිබඳව කරුණු ඉදිරිපත් කරමින් සතුරා ජයගැනීමේ උපායමාර්ගයන් පෙන්නුම් කරයි.

**සිව්වන කොටස : අභියෝගයන් ජය ගැනීම** යටතේ මනුෂ්‍ය සම්ප්‍රදායයන්, පාවුල්ගේ මාංශයේ කටුව සහ පිළිතුරු සපයනු නොලැබූ ප්‍රශ්න ඇතුලත් සුවකිරීමේ සහ මිදීමේ සේවයට අයත් දුෂ්කර අභියෝගයන් පිළිබඳව කරුණු සාකච්ඡා කෙරේ.

**පස්වන කොටස : සුවකිරීමේ උපාය මාර්ගයන්** ඔබව සුවකිරීමේ උපායමාර්ගයන්, පශ්චාත් සුවකිරීමේ මෙහෙය සහ සම්පූර්ණ සුවකිරීම යන කරුණුවලින් සන්නද්ධ කරයි.

**හයවන කොටස : මිදීමේ උපාය මාර්ගයන්** අවධානය යොමුකරන්නේ මිදීමේ සේවයේ "සාතන් විසින් බඳිනු ලැබූ අය", "නිදහස්කිරීම සිදුකිරීම" සහ පශ්චාත් නිදහස් කිරීමේ සේවාව යන පාඩම් කෙරෙහිය.

**හත්වන කොටස : දේවරාජ්‍යයේ ජීවිතය** යටතේ ඔබට ශරීර, ප්‍රාණ ආත්ම වශයෙන් සම්පූර්ණව යුද්ධයට සූදානම් වීර සෙබලෙක්ව සිටීමට හැකියාව සලසා දෙන දේව වචනයේ සඳහන් වැළැක්වීමේ හා සුවකිරීමේ උපාය මාර්ගයන් දැනගැනීම ලබාදෙයි.

**උපග්‍රන්ථය :** මේ අත්පොතට යා කර ඇති උපග්‍රන්ථය, සුවකිරීම හා මිදීමට අදාළ වැඩිමනත් බයිබලීය අධ්‍යයනයන් ද විෂය කරුණු පිළිබඳව ශුද්ධ ලියවිලි අධ්‍යයනය පහසුකරන විශ්ලේෂණයකින් ද සමන්විත වේ. ඔබ සුවකිරීමේ මෙහෙයේ යෙදීමේදී හෝ ඒ සඳහා සූදානම්වීමේදී අවශ්‍ය විය හැකි හේතූන් විනිශ්චය කිරීමේ මගපෙන්වීමක් ද එයට ඇතුලත් වේ.

## පාඩම්

මේ අත්පොතෙහි එන සෑම පාඩමක්ම පහත සඳහන් ආකාරයට සංවිධානය කර ඇත.

**පරමාර්ථ :** පාඩම අධ්‍යයනය කිරීමෙන් ඔබ ළඟාවිය යුතු ඉලක්කයන් මේ යටතේ දැක්වේ.

**සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:** මෙහි අඩංගුවන්නේ ඔබේ සුවය සඳහා අදාළකරගත හැකිවූ හා කඩපාඩම් කළ හැකි දේව වචනයේ සඳහන් සුවකිරීමේ පොරොන්දුවකි.

**හැඳින්වීම :** පරිච්ඡේදයේ අන්තර්ගත කරුණු පිළිබඳව සාරාංශයක් එහි ඉදිරිපත් කරයි.

**පාඩම :** පරිච්ඡේදයට අදාළ යුධමය සංක්ෂිප්ත උපදේශයයි. සංක්ෂිප්ත උපදේශය යනු සාර්ථක යුද්ධයක් කිරීම සඳහා යුද්ධයට කලින් සපයනු ලබන අත්‍යවශ්‍ය තොරතුරුය.

**ස්වයං පරීක්ෂණය :** ස්වයං පරීක්ෂණය පාඩම්වල ප්‍රධාන සංකල්පයන් පිළිබඳව ඔබගෙන් ප්‍රශ්න අසයි.

**එය ක්‍රියාත්මක කිරීම :** "භයෙනුත් වෙව්ලුමෙන් ඔබගේ ගැළවීම සම්පූර්ණ කරගන්න" යනුවෙන් බයිබලය පවසයි (පිලිප්පි 2:12). සුවය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම තුළින් ඔබට සපයා ඇති ගැළවීමේ කොටසක් බව ඔබ මේ පාඩම තුළින් ඉගෙන ගන්නවා ඇත. ඇදහිල්ල සහ ක්‍රියාකිරීම එකට ගමන් කරයි. ක්‍රියා නැති ඇදහිල්ල ප්‍රයෝජනයක් නැතිවාක් මෙන්ම ඇදහිල්ල නැති ක්‍රියා මැරිලාය (යාකොබ් 2:17-26).

"එය ක්‍රියාත්මක කිරීම" යන කොටස තුළ පාඩමෙන් ඔබ ඉගෙනගත් සංකල්පයන් ඔබේ ජීවිතයේ අදාළ කරගනී. මෙය පාඩමේ ඉතා වැදගත් කොටසකි. ඔබ රෝගීනම් ඔබ සුවය ලබාගැනීම පිණිස මෙය සැලසුම්කර තිබේ. ඔබ රෝගීව සිටින කෙනෙකුට සේවය කරන්නේ නම් පළමුව පාඩමෙහි අඩංගු දේ ඔවුන් සමග බෙදාගන්න. ඉන්පසු ඔවුන්ට සුවය ලබාගැනීමට උපකාරකරන පිණිස "ක්‍රියාත්මක කිරීම" ඔවුන් සමග ක්‍රියාවට නගන්න.

## ඔබ සූදානම්ද?

සතුරා සහ සතුරාගේ උපායමාර්ගයන් හෙළිදරව් කරදීම දේව වචනයේ ඇති ඉතා උතුම්ම එළිදරව්වකි. මෙම අත්පොත සුවය සහ මිදීම පිළිබඳ දීර්ඝ අධ්‍යයනයක් පමණක් නොව එය ශුද්ධ ලියවිලි ගැඹුරින් විග්‍රහ කිරීමක්ද වේ. ස්වභාවික යුද්ධයකදී මෙන්ම ඔබ ඔබේ ශාරීරිය සඳහා යුද පිටියට ඇතුළුව යුද්ධකිරීම ආරම්භ කරන විට දක්ෂතා ක්‍රමානුකූලව වර්ධනය වේ.

# පාඨමාලා අරමුණු:

මෙම පාඩමාලාව අවසානයේ ඔබට මේ දේවල් කළ හැකිවේ.

- ස්වභාවික සහ ආත්මික තලයන් ගැන අවබෝධය ප්‍රදර්ශනය කිරීම.
- “ආත්මික යුද්ධය” නිර්වචනය කිරීම.
- අදෘශ්‍යමාන යුද්ධයට හේතුව හඳුනාගැනීම.
- ආත්මික යුද්ධය තේරුම් ගැනීමට අවශ්‍ය මූලධර්ම ප්‍රකාශ කිරීම.
- “දිව්‍යමය සුවය” නිර්වචනය කිරීම.
- සුවකිරීමේ හා මිදීමේ වෙනස වෙන්කර දැක්වීම.
- ලෝකයට ශුභාරංචිය ගෙනයාමට සුවකිරීම හා මිදීම අදාළවන ආකාරය පැහැදිලි කිරීම.
- රෝගයේ මූලාශ්‍රය හඳුනාගැනීම.
- රෝගයට හේතූන් විග්‍රහ කිරීම.
- රෝග වර්ගයන් හඳුනාගැනීම.
- රෝගයේ අවසාන ප්‍රතිඵල ලැයිස්තු ගත කිරීම.
- සුවය පිළිබඳ බයිබලීය පදනම සාරාංශ කර දැක්වීම.
- සුවයේ පරමාර්ථයන් ලැයිස්තුගත කිරීම.
- සුවකිරීමේ දීමනාව භාවිත කිරීම තේරුම් ගැනීම.
- සුවය පිළිබඳව ඇති මනුෂ්‍ය සම්ප්‍රදායන්ට ප්‍රතිචාර දැක්වීම.
- සුවයට අදාළව පිළිතුරු නොසපයන ලද ප්‍රශ්න සමග ගනුදෙනු කිරීම.
- සුවකිරීම හා සුවය ලබාගැනීම.
- මිදීමේ සේවය කිරීම හා මිදීම ලබාගැනීම.
- අවසාන සුවය උදෙසා සෙනඟ සූදානම් කිරීම.
- සුවකිරීම හා මිදීමට අදාළ සේවාවන් සඳහා පසු සේවා වැඩසටහන් පැවැත්වීම.
- ජයග්‍රාහී සෙබලෙක් ලෙස ජීවත්වීම පිණිස මගපෙන්වීම් සාරාංශ කර දැක්වීම.
- ශරීරය උදෙසා ඇති යුද්ධයේ සාර්ථකව යුද්ධ කිරීම.

# පළමුවන කොටස

# ශරීරය සඳහා ඇති බල ගැටුම

ආත්මික ලෝකයේ ප්‍රබල වූ බලගැටුමක් ක්‍රියාත්මක වේ. මෙය මාංශය හා ආත්මය අතර සිදුවන පුද්ගලික බල ගැටුමකි. එය ලෝකයේ සිටින දුෂ්ට ආත්මවලට එරෙහිව කෙරෙන සමාජමය බලගැටුමකි. එය අධිස්වභාවික දුෂ්ට ආත්ම සමග කෙරෙන ආත්මික බලගැටුමකි. එමෙන්ම මෙම බලගැටුම ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාලිගය වූ ඔබගේ ශරීරයට විරුද්ධව කෙරෙන භෞතික බලගැටුමක් ද වේ.

පැරණි ගිවිසුම් සමයේ දේව සෙනඟ යුද්ධයකට කැඳවීම පිණිස හොරණෑවක් භාවිත කරන ලදී. අද ලෝකයේ සියලුම ජාතීන් අතර ආත්මික කැඳවීමක් නාද වේ. එය අදෘශ්‍යමාන යුද්ධය සඳහා කෙරෙන කැඳවීමකි. එය සන්නද්ධව සිටීම පිණිස කැඳවීමකි.

# පළමුවන පරිච්ඡේදය

# රාජ්‍යයන් අතර බලගැටුම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවය ලැබීමේ පොරොන්දුව මතකයෙන් ලිවීමට
- ස්වභාවික සහ ආත්මික තලයන් පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කිරීමට
- "රජ" යන වචනය අර්ථ දැක්වීමට
- "රාජ්‍යය" යන වචනය අර්ථ දැක්වීමට
- ආත්මික රාජ්‍යයන් දෙක හඳුනාගැනීමට
- ඔබ අයත්වන්නේ කුමන රාජ්‍යයට දැයි නිගමනය කිරීමට
- යහපත් ආත්මීක බලවේග හඳුනාගැනිමට
- නපුරු ආත්මීක බලවේග හඳුනාගැනිමට
- "ආත්මීක සටන" යන්නෙන් තේරුම් වන්නේ කුමක්දැයි විස්තර කර දිමට
- අදෘෂ්‍යමාන බලගැටුමට හේතුව හඳුනාගැනිමට
- ආත්මික සටන අවබෝධ කරගැනිමේ මූලික ප්‍රතිපත්තිය ප්‍රකාශ කිරීමට

## සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේගේ හඬට නුඹ ඕනෑකමින් ඇහුම්කන්දී උන්වහන්සේගේ ඇස් හමුයෙහි හරිව තිබෙන දේ කොට උන්වහන්සේගේ ආඥාවලට කන්දෙමින් උන්වහන්සේගේ සියලු නියෝග රක්ෂාකරන්නෙහි නම් මිසරවරුන් පිට මා පැමිණෙවූ රෝගවලින් එකක්වත් නුඹ පිටට නොපමුණුවන්නෙමි. මක්නිසාද මම වනාහි නුඹ සුවකරන්නාවූ ස්වාමින්වහන්සේයයි කීසේක. (නික්මයාම 15:26)**

## හැඳින්වීම

අද ලෝකයේ අති ප්‍රබල යුද්ධයක් සිදුවෙමින් පවති. එය ජාතින්, ගෝත්‍ර හෝ රාජ්‍ය නායකයන් අතර සිදුවන ගැටුමක් නොවේ. එය කැරලි ගැසීමක් හෝ කුමන්ත්‍රණයක් ද නොවේ. එය ආත්මික ලෝකයේ සිදුවන අදෘෂ්‍යමාන බලගැටුමකි. සැම ඇදහිලිවන්තයෙක්ම නියුක්තව සිටින අදෘෂ්‍යමාන යුද්ධය පිළිබඳව මෙම පරිච්ඡේදය හඳුන්වා දෙයි. මෙම යුද්ධය තුළ කිසිවෙක් නිල ඇඳුමක් පැළඳ නොසිටින නමුත් සැම කෙනෙක්ම එහි ඉලක්කය බවට පත්ව සිටි. මෙම යුද්ධයට අදාළ ඓතිහාසිකවුත් අනාගතවක්තෘමයවුත් වාර්තාව දේව වචනය වූ බයිබලයේ අඩංගු වේ.

## ස්වභාවික සහ ආත්මික තලයන්

මෙම අදෘෂ්‍යමාන යුද්ධය තේරුම්ගැනිම පිණිස පළමුව ඔබ විසින් ස්වාභාවික සහ ආත්මික ලෝකයන් පිළිබඳව අවබෝධයක් ලබාගත යුතුය. මනුෂ්‍යයා ජිවත්වන්නේ ලෝක දෙකක් තුළය. එනම් ස්වාභාවික ලෝකය සහ ආත්මික ලෝකයය. අපගේ ඇස්වලින් දැකිය හැකි, දැනෙන, ස්පර්ශ කළ හැකි, ඇසිය හැකි රස බැලිය හැකි ලෝකය ස්වාභාවික ලෝකයයි. එය ඇල්ලිය හැකිය, දැනිය හැකිය.

ඔබ ජිවත්වන රට, ජාතිය, නගරය හෝ ගම එම ස්වාභාවික ලෝකයේ කොටසකි. දෘෂ්‍යමානව තිබෙන ලෝකයේ ඇති එක් මහද්වීපයක ඔබ පදිංචිව සිටින ස්වාභාවික රාජ්‍යය පිහිටා තිබේ. ඔබේ පරිසරයේ කොටසක් වන මනුෂ්‍යයන් ඔබට දැකිය හැකිය. ඔබට ඔවුන් සමග සන්නිවේදනය

කිරීමට හැකියාව ඇත. ඔබට ඔබ වටා තිබෙන දර්ශන, ශබ්දයන් හා ගන්ධයන් අත්විඳීමට හැකිය.

එහෙත් ඔබ ජීවත්වන තවත් ලෝකයක් ඇත. එම ලෝකය ආත්මීක ලෝකයකි. එය ඔබට ඔබගේ සාමාන්‍ය ඇස්වලින් දැකිය නොහැකි නමුත් ඔබ ජීවත්වන ස්වාභාවික ලෝකය මෙන්ම එයත් සත්‍ය ලෝකයකි. 1 කොරින්ති 15:40 පදයේ පාවුල්තුමා මෙම ආත්මික සහ ස්වාභාවික ලෝක දෙකේ වෙනස ගැන කථා කරයි. ඔහු කියන්නේ ස්වාභාවික (භූමික) ශරීරයක් මෙන්ම ආත්මීක (දිව්‍යමය) ශරීරයක් තිබෙන බවය.

සියලු මනුෂ්‍යයන් හට මෙම ස්වාභාවික ලෝකයේ ජීවත්වීම පිණිස ස්වාභාවික ශරීරයක් ඇත. එමෙන්ම මනුෂ්‍යයා ආත්මික කෙනෙක් නිසා ඔහුට සදාකාල ප්‍රාණයක් සහ ආත්මයක් ද ඇත. මනුෂ්‍යයා ආත්මයක්, ප්‍රාණයක් හා ශරීරයක් සහිත අයෙකි. ඔබගේ ආත්මික තැනැත්තා (ප්‍රාණය හා ආත්මය) ආත්මීක ලෝකයේ කොටසක් වන ලෙසම ඔබගේ ස්වාභාවික ශරීරය ස්වාභාවික ලෝකයේ කොටසක් වේ.

## ආත්මික විමසීම

ආත්මික යුද්ධය ආත්මික දෙයක් වන බැවින් එය තේරුම් ගත යුත්තේ ආත්මීක මනසකින්ය. අපගේ ස්වාභාවික පාප සහිත ස්වභාවයට ආත්මීක දේ තේරුම්ගැනීමට හැකියාවක් නැත.

> **නමුත් ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළි නොගනියි. ඒවා ඔහුට මෝඩකමය. ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය. (1 කොරින්ති 2:14)**

එම නිසා ආත්මික දේ තේරුම්ගැනීම පිණිස ආත්ම විමසීම අත්‍යවශ්‍යය.

ස්වාභාවික සහ ආත්මික විමසීමට අදාළ ඉතාම හොඳ උදාහරණයක් 2 රාජාවලිය 6 වන පරිච්ඡේදයේ වාර්තාගත වේ. එහි සඳහන් කථාන්තරය අනාගතවක්තෘ එලිෂා නැවතී සිටි දෝතාන් නම් කුඩා නගරය සතුරු සිරියන් රාජ්‍යයේ හමුදාවන් විසින් වටකරනු ලැබීමේ ස්වාභාවික සටන පිළිබඳවය.

එලිෂාගේ මෙහෙකරුවූ ගෙහාසි මහත් සතුරු හමුදාව දුටු විට බියට පත්විය. තමන් ආරක්ෂා කිරීම පිණිස ඔවුන් වටා සිටින සුරදූත සමූහය දැකගැනීමට හැකිවන පිණිස ගෙහාසිගේ ආත්මික ඇස් විවෘත කරන ලෙස එලිෂා දෙවියන්වහන්සේට යාච්ඤා කළේය. මේ අවස්ථාවේදී ඇත්තෙන්ම දෙවියන්වහන්සේ ගෙහාසිගේ ස්වාභාවික ඇස් විවෘත කර තමන් වෙනුවෙන් දෙවියන්වහන්සේ විසින් පෙළගස්වා සිටි වඩා බලවත් හමුදාව දැකගැනීමට සැලැස්වූ සේක.

දෝතාන් හි යුද්ධය පිළිබඳ මෙම කතාන්තරය අද සභාවේ ආත්මික තත්වයන්ට සමානය. එලිෂා දුටු ආකාරයට ආත්මික තලයේ සිදුවන දේ පැහැදිලිව දැකීමට හැකි ඇතැම් අය සිටිති. සිදුවන බලගැටුම පිළිබඳවත්, සතුරා හඳුනාගැනීමටත් තමන්ට ජයදීමට සිටින වඩා බලවත් වූ දෙවියන්වහන්සේගේ හමුදා හඳුනාගැනීමටත් ඔවුන්ට හැකියාව ඇත.

එමෙන්ම ගෙහාසි මෙන් සුළු ධෛර්යවත් කිරීමකින් තමා ශක්තිමත් කරගෙන ආත්මික දෙනෙත් හැර බියවීමට හෝ කිසිම ආකාරයක පරාජයක් තමන්ට නොවන බවට ස්ථාවරයක් ඇතිකරගත හැකි ඇතැම් අය ද සිටිති. නමුත් කණගාටුවට කරුණ නම් දෝතාන්වල සිටි සෙනඟ මෙන් බොහෝ දෙනෙක් ආත්මිකව නිදා සිටින අය වීමයි. සතුරු සේනා තමන් වටකර තමන්ට පහරදීමට සූදානම්ව සිටින බව හෝ ඔවුහු නොදැන සිටිති.

## ආත්මික රාජ්‍යයන් දෙක

අප මේ කථාකරන ස්වාභාවික සහ ආත්මික තලයන් තුළ ස්වාභාවික සහ ආත්මික නායකයන් විසින් වෙන වෙනම පාලනය කරනු ලබන රාජ්‍යයන් ඇත.

**ස්වාභාවික රාජ්‍යයන් :**

සියලු මනුෂ්‍යයන් ජීවත්වන්නේ මේ ලෝකයේ ස්වාභාවික රාජ්‍යය තුළය. ඔවුහු යම් රටක කොටසක් වූ නගරයක හෝ ගමක ජීවත් වෙති. එම දේශය ලෝකයේ රාජ්‍යයකට අයත් වේ. ස්වාභාවික රාජ්‍යයක් යනු සත්‍යය රජ කෙනෙක් හෝ දේශපාලන නායකයෙක් ස්වෛරීව පාලකයා ලෙස ක්‍රියාකරන ප්‍රදේශයක් හෝ ජන සමූහයකි. මෙම ස්වාභාවික රාජ්‍යයන් බයිබලයේ සඳහන් කර ඇත්තේ "ලෝකයේ රාජ්‍යයන්" ලෙසය. මෙම ලෝකයේ රාජ්‍යයන් සාතන්ගේ බලය සහ බලපෑම යටතට පත්වී ඇත.

> **නැවතත් යක්ෂයා උන්වහන්සේ ඉතා උස් කන්දකට පමුණුවා, ලෝකයේ සියලු රාජ්‍යයන් ද එහි ඓශ්වර්යය ද උන්වහන්සේට පෙන්වා. ඔබ බිම වැටී මට නමස්කාර කරන්නෙහි නම් මේ සියල්ල ඔබට දෙන්නෙමියි උන්වහන්සේට කීවේය. (මතෙව් 4:8-9)**

1 යොහන් 5:19 "මුළු ලෝකයාම නපුරාගේ පාලනය යටතේ පවතී" යන්න කනගාටුවෙන් අපට මතක් කර දෙයි.

**ආත්මික රාජ්‍යයන් :**

මේ ලෝකයේ පවතින ස්වාභාවික රාජ්‍යයන්ට අමතරව ආත්මික රාජ්‍යයන් දෙකක් පවතී. එනම් සාතන්ගේ රාජ්‍යයත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයත්ය. ජීවත්ව සිටින සෑම කෙනෙක්ම මෙම රාජ්‍යයන් දෙකෙන් එකක පදිංචිකරුවෙකි.

සාතන්ගේ රාජ්‍යය, සාතන්, යක්ෂයන් යනුවෙන් හඳුන්වන ආත්මික අය සහ පාපයේ ජීවත්වන හා දෙවියන්වහන්සේගේ වචනයට විරුද්ධව කැරළි ගසන සියලු මනුෂ්‍යයන්ගෙන් සමන්විත වේ. මේ පුද්ගලයනුත්, ලෝකය සහ මාංශයත් අද ලෝකය තුළ ක්‍රියාත්මක වන නපුරු ආත්මික බලවේගයන් වේ.

දේව රාජ්‍යය, පියවූ දෙවියන්වහන්සේගෙන් ද ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන් ද ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් ද දේව දූතයන් වශයෙන් හඳුන්වනු ලබන ආත්මික දූතයන්ගෙන් ද, දේව වචනයට කීකරුව ධර්මිෂ්ඨ ජීවිත ගත කරන සියලු මනුෂ්‍යයන්ගෙන් ද සමන්විත වේ. ඔවුහු සියලු දෙනා යහපත් ආත්මික බලවේගයන් වෙති.

දේව රාජ්‍යය නිකායක් නොවේ. නිකායන් යනු සභා කණ්ඩායම්වලින් සැදුම්ලත් මනුෂ්‍යයන් විසින් සාදාගනු ලැබූ සංවිධානයන්ය. නිකායයන් පරිපාලනය සහ සංවිධානය වැනි ප්‍රායෝගික පරමාර්ථයන් උදෙසා ස්ථාපනය කරගනු ලැබ ඇත. බැප්ටිස්ට්, එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්, මෙතෝදිස්ත, ලූතරන් වැනි ප්‍රධාන සභා සංවිධානයන් නිකායන්ය. බයිබලයේ සඳහන්වී ඇති සැබෑ සභාව නිකායන් හෝ ආගමික සංවිධානයක් නොවේ. සැබෑ සභාව දේව රාජ්‍යයේ පදිංචිය ලැබූ සියලු දෙනාගෙන් සමන්විත වේ.

වර්තමානයේ ස්වාභාවික ලෝකය තුළ, ජේසුස්වහන්සේ තම ජීවිතයේ රජ බවට පත්කරගෙන සිටින සියලු පුරුෂයන්, ස්ත්‍රීන්, පිරිමි ළමුන් සහ ගැහැණු ළමුන් තුළ පුද්ගලික වශයෙන් දේව රාජ්‍යය පිහිටා ඇත. තව දුරටත් දේව රාජ්‍යය, ප්‍රජාවක් වශයෙන් සැබෑ සභාව තුළත්, මේ ලෝකය දෙවියන්වහන්සේ කැමති ආකාරයේ ලෝකයක් බවට පත්කරන අය තුළත් පිහිටා තිබේ. අනාගතයේදී දේව රාජ්‍යය සැබෑ ආකාරයට පෙනෙන ලෙස ප්‍රකාශයට පත්වේ.

## අදෘෂ්‍යමාන යුද්ධය

අදෘෂ්‍යමාන ආත්මික යුද්ධය සියලුම මනුෂ්‍යයන් හා ස්ත්‍රීන් නියුක්තවී සිටින බලගැටුමකි. මක්නිසාද සාතන්ගේ රාජ්‍යය ආත්මික රාජ්‍යයක් වන බැවින්ය.

> **මක්නිසාද අපේ පොරබැදීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12)**

ආත්මීක යුද්ධය මාංශයට හා රුධිරයට විරුද්ධව කෙරෙන ස්වාභාවික සටනක් නොවේ. එය මනුෂ්‍යයා මනුෂ්‍යයාට එරෙහිව කරන යුද්ධයක් ද නොවේ. එය දෘෂ්‍යමාන යුද්ධයක්ද නොවේ. එය ආත්මීක ලෝකයේ සිදුවන අදෘෂ්‍යමාන පොරබැඳීමකි. එය මනුෂ්‍යයා තුළත් මනුෂ්‍යයා වටේත් සිදුවන බලගැටුමකි. මෙයට ආත්මයන් සම්බන්ධ බැවින් එය දෘෂ්‍යමාන බලගැටුමක් නොවේ. ලූක් 24:39 පදයෙන් ආත්මයන්ට මාංශයක් හා රුධිරයක් නැති බව අපි ඉගෙන ගනිමු.

ආත්මීක යුද්ධය "බහුමානය." මන්ද එය විවිධ මානවලින් ක්‍රියාත්මක විය හැකි බැවිනි.

1. එය ඇදහිලිවන්තයා හා ලෝකය අතර සිදුවන සමාජ බලගැටුමකි :(යොහන් 15:18-27)
2. එය මාංශය සහ ආත්මය අතර සිදුවන පුද්ගලික බලගැටුමකි :(ගලාති 5:16-26)
3. එය ඇදහිලිවන්තයා සහ අධිස්වාභාවික නපුරු ආත්මයන් අතර සිදුවන අධිස්වභාවික බලගැටුමකි :(එපිස 6:10-27)
4. එය ඔබේ ශරීරය රෝගී බවට පත් කිරීමට සාතන් විසින් ක්‍රියාත්මක කරනු ලබන භෞතික බලගැටුමකි : (යෝබ් 1-2)

කෙනෙක් තේරුම්ගෙන සිටියත් නැතත් ජීවත්ව සිටින සෑම කෙනෙක්ම මෙම යුද්ධයේ යෙදී සිටී. නොඇදහිලිවතුන් නපුරාගේ බන්ධනයේ සිටින අතර සතුරු බලවේගයන් විසින් ඔවුන් ග්‍රහණයට හසුකරගෙන ලැබ ඇත. ඔවුන් මෙම යුද්ධයේ ගොදුරු බවට පත්වී තිබේ. ඇදහිලිවන්තයන් ජේසුස්වහන්සේ කරණකොටගෙන නිදහස් කරනු ලැබ ජයග්‍රාහකයන්ව සිටින නමුත් යුද්ධයේ භේවායන් ලෙස තවමත් සටනේ යෙදී සිටිති.

ඇදහිලිවතුන් වූ අපි ආත්මික බලවේග සමග පොරබදමින් සිටින බව එපිස 6:12 හි සඳහන් කර ඇත. පොරබැඳීම සඳහා පුද්ගලික මුණගැසීමක් අවශ්‍ය වේ. මෙම බලගැටුමෙන් කිසිවෙක් නිදහස් කර නැත. කිසිවෙකුට එය දුර සිට බලාගැනීමට ද නොහැකිය. ඔබ පිළිගත්තත් නැතත් ඔබ මෙම බලගැටුමට මැද වී සිටී. එම ගැටුම වඩා යහපත් වේයයි විශ්වාස කළොත් එය සාවද්‍යය. කිතුනු බලගැටුම නතරවන්නේ නැත.

## මෙම බලගැටුම සිදුවන්නේ කොහේද?

අදෘෂ්‍යමාන යුද්ධය සිදුවන්නේ පොළොව මතය.

> **සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10:10)**

ලෝකයේ රාජ්‍යයේ පාලනය තමන් යටතේ පවත්වාගෙන යාමට සාතන් සටන් කරයි. සාතන් ලෝකයේ රාජ්‍යයන් දෙවියන්වහන්සේගේ ආධිපත්‍යය යටතට පැමිණීම කෙරෙහි අකමැතිය. මෙම බලගැටුම පුරුෂ, ස්ත්‍රී සෑම දෙනාගේම සිත්වල, හදවත්වල සහ ප්‍රාණවල ක්‍රියාත්මක වේ.

සාතන් නොඇදහිලිවතුන්ගේ සිත් අන්ධකරන අතර ඇදහිලිවතුන්ට ඔවුන්ගේ දේව නමස්කාරයට, දේව වචනයට, දෙවියන්වහන්සේ සමග තිබෙන ගමනට සහ ඔවුන් කරන දෙවියන්වහන්සේගේ සේවයට පහර දෙයි. එමෙන්ම භෞතික ශරීරවලට විරුද්ධව ලෙඩ සහ රෝග ආකාරයෙන් ද සාතන්ගේ බලගැටුම ක්‍රියා කරයි.

## මෙම බලගැටුම ආරම්භ වූයේ කෙසේද?

මෙම අදෘෂ්‍යමාන බලගැටුම ස්වර්ගයේ ආරම්භ වූයේ දේව රාජ්‍යයට අයිතිව සිටි, දෙවියන්වහන්සේ විසින්ම මවන ලද ලුසිෆර් නම් වූ අලංකාර දූතයෙකු කරණකොටගෙනය. දේව රාජ්‍යයේ බලය තමන් යටතට ගැනීමට ලුසිෆර් තීරණය කළේය. ඔහුගේ කැරළිගැසීම පිළිබඳව යෙසායා 14:12-17 දක්වාත් එසෙකියෙල් 28:12-19 දක්වාත් ඇති දේව වචනයේ කොටස් කියවීමෙන් ඔබට දැනගත හැකිවේ. ඔහුගේ (අද සාතන් නමින් හඳුන්වන) එම කැරලිගැසීමේදී දූතයන් කණ්ඩායමක් ද ඔහු සමග එකතු විය. ලුසිෆර් සහ කැරලිකාර දූතයන් සමූහය දෙවියන්වහන්සේ විසින් ස්වර්ගයෙන් ඉවතට හෙළා දමන ලදී. ඔවුහු ඔවුන්ගේම රාජ්‍යය පොළොවේ ඇතිකරගත්හ.

**තවද ස්වර්ගයෙහි යුද්ධයක් විය. ඒ වනාහි මිකායෙල් සහ ඔහුගේ දූතයන් මහ සර්පයාට විරුද්ධව යුද්ධයට යාමය. මහ සර්පයා ද තමාගේ දූතයෝ ද සටන්කොට, . . .(එළිදරව් 12:7)**

**මුළු ලෝකයා රවටන්නා වන යක්ෂයාය, සාතන්යයි කියනලද මහ සර්පයා නමැති ඒ පුරාණ සර්පයා පහතට හෙළනු ලැබුවේය. ඔහු පොළොවට හෙළනු ලැබුවේය. ඔහුගේ දූතයෝ ද ඔහු සමග හෙළනු ලැබුවෝය. (එළිදරව් 12:9)**

ලූසිෆර් සාතන් නමිනුත් කැරලිකාරකමින් ඔහු අනුව ගිය දූතයන් යක්ෂයන් නමිනුත් හඳුන්වන ලදී. යක්ෂ ආත්මයන්ට සාතන්ගේ රාජ්‍යයට අයත් මනුෂ්‍යයන්ට ආවේශවීමටත්, ඔවුන් පීඩාවට පත්කිරීමටත්, පාලනය කිරීමටත් හැකිය. මනුෂ්‍යයන් විසින් කරනු ලබන නපුරු ක්‍රියාවන් සඳහා ඔවුන් පෙලඹවීම යක්ෂයන් විසින් සිදු කරනු ලබයි. සාතන් විසින් යක්ෂ ආත්මයන් නපුරු ක්‍රියාවන් කරවීමට මෙහෙයවනු ලබයි. ඔහු මෙම බලවේගයන් මනුෂ්‍යයන්ට එරෙහිව සටන්කිරීම පිණිස ලෝකය සහ මාංශය කරණකොටගෙන ක්‍රියා කරවයි.

## මෙම බලගැටුම පසුපස ඇති හේතු

දෙවියන්වහන්සේගේ මහිමය පිණිස ආරම්භයේ දී මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ සමානත්වයෙන් මවන ලදී (උත්පත්ති 2 පරිච්ඡේදය). ප්‍රථම පරීක්ෂාව සමග මෙම අදෘෂ්‍යමාන බලගැටුම ඒදන් උයනේ දී ආරම්භ විය (උත්පත්ති 3 වන පරිච්ඡේදය). සාතන් ආදම් සහ ඒව පව් කිරීමට සැලැස්වීය. මෙහි ප්‍රතිඵලය වූයේ සියලු මනුෂ්‍යයන් පාප ස්වභාවය උරුමකොට ගෙන ඒ ස්වභාවය නිසා පුද්ගලිකව පාපය කිරීමට යොමුවීමය.

**එහෙයින් එක් මනුෂ්‍යයෙක් කරණකොටගෙන පාපයත් පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක් මෙන්, සියලු මනුෂ්‍යයන් පව්කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණය ද පැමුණුණේය. (රෝම 5:12)**

එමෙන්ම මනුෂ්‍යයා නපුරු ආත්ම බලවේගයන් සමග අදෘෂ්‍යමාන බලගැටුමට ද පිවිසුනි.

**මම තා සහ ස්ත්‍රිය අතරෙහි ද තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි. ඒ වංශය තාගේ හිස පොඩිකරන්නේය. තෝ ඔහුගේ විලුඹ පොඩිකරන්නෙහියයි කීසේක. (උත්පත්ති 3:15)**

පාපය නිසා මනුෂ්‍යයා දෙවියන්වහන්සේගෙන් වෙන් කරනු ලැබ මරණයට නියමකරනු ලැබිය. මේ මරණය දෙවියන්වහන්සේගෙන් වෙන් කරනු ලැබීමේ ආත්මික මරණයයි. එමෙන්ම මනුෂ්‍යයා පව් කළ විට සාතන් ඔහුගේ ජාන පද්ධතියට ලෙඩ සහ රෝග, ශාපය කරණකොටගෙන ඇතුළුව ඔහුව ශාරීරික වශයෙන් මරණයට ද පත් කළේය. එහෙත් දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට කොතරම් ප්‍රේම කළේදයත් ඔහුව පාපයෙන් මුදවා ගැනීමට උන්වහන්සේ විශේෂ සැලසුමක් සාදා තිබිණි.

**මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. මක්නිසාද දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එවුවේ ලෝකයා විනශ්වය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණකොටගෙන ගළවනු ලබන පිණිසය (යොහන් 3:16,17)**

ජේසුස්වහන්සේ කෙරෙහි අදහාගෙන, තමාගේ පව් කියාදී පසුතැවිලිවීම කරණකොටගෙන මනුෂ්‍යයන්ටත් ස්ත්‍රීන්ටත් සතුරාගේ බලයෙන් නිදහස්වීමට හැකියාව තිබේ. ජේසුස්වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම තුළ මනුෂ්‍යයාට පාපයෙන් ගැළවීම පමණක් නොව සතුරා වූ සාතන් පරාජය කිරීමට ද හැකි වේ.

**පව්කරන තැනැත්තේ යක්ෂයාගෙන්ය. මක්නිසාද යක්ෂයා පටන්ගැන්මේ සිට පව්කරන්නේය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ප්‍රකාශ කරනු ලැබුවේ මේ පිණිසය. එනම් යක්ෂයාගේ ක්‍රියා විනාශ කරන පිණිසය. (1 යොහන් 3:8)**

නමුත්, සාතන් පරාජය කර ඇත්නම් තවමත් බලගැටුම පවතින්නේ ඇයි? අප වටා ලෝකය තුළ තවමත් නපුර අප දකින්නේ ඇයි? පාපයට අපව පොලඹවනු ලැබීම හා රෝගවලින් පහර ලැබීම අපට සිදුවන්නේ මන්ද?

ස්වාභාවික ලෝකයේ ඕනෑම යුද්ධයකට පසු, තැනින් තැන සතුරාගේ ප්‍රතිවිරෝධ කණ්ඩායම් හමුවේ. මෙම කණ්ඩායම් කෙරෙහි දැඩි බලපෑමක් ඇති කර මර්දනය කරන තුරු ඔවුන් කැරලිකාර ලෙස සටන්වදින කණ්ඩායම් වේ. ජේසුස්වහන්සේ විසින් සතුරාගේ බලය පරාජය කර තිබුණත්, සතුරාගේ ප්‍රතිරෝධී බලවේගයන් ක්‍රියාත්මක වන සතුරාගේ බල ප්‍රදේශය තුළ අප තවමත් ජීවත්වෙමින් පවති. ආත්මික සටනේ උපාය ක්‍රමයන් පිළිබඳව තේරුම්ගැනීමෙන් නපුරු ආත්ම බලයන් සමග ක්‍රියාකිරීමට අපට හැකියාව ලැබේ.

සාතන්ගේ උත්සාහය මනුෂ්‍යයන් පාපයේ ග්‍රහණයේ තබා ගැනීමය. මුළා කිරීමේ උපාය මාර්ග තුළින් පුරුෂයන් හා ස්ත්‍රීන් පාපයේ ජීවත්වන පිණිස යක්ෂයා විසින් මනුෂ්‍යයන්ගේ සිත් ආකර්ෂණය කරනු ලබන අතර දෙවියන්වහන්සේට නිත්‍යානුකූල ලෙස අයිති මනුෂ්‍ය ආත්මයේත්, ප්‍රාණයේත් ඇළුම්කම් කෙරෙහි ඔහු ඉලක්ක කරයි. ලෙඩ හා රෝග කරණකොටගෙන ශරීරය විනාශ කිරීමට ද ඔහු මාන බලයි.

> **සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10:10)**

සාතන් තවමත් උත්සාහ කරන්නේ පරමාධිපත්‍යයේ සිටීමටය. ඔහු මනුෂ්‍යයාගේ ශරීරයට, ආත්මයට හා ප්‍රාණයට විරුද්ධව ඉතා තියුණු බලගැටුමක නියුක්තව සිටී. ඔහුගේ උපායයන් දෙවියන්වහන්සේටත්, උන්වහන්සේගේ සැලැස්මටත් උන්වහන්සේගේ සෙනඟටත් විරුද්ධව ඇත.

## ආත්මික සටනේ අර්ථය

ආත්මික සටන යනු අදෘෂ්‍යමාන ආත්මික බලගැටුමේ ක්‍රියාකාරී සහභාගිවීම හා විශ්ලේෂණය කිරීමයි. යහපත් හා නපුරු විරුද්ධ බලවේගයන් ගැනත් සාතන්ගේ ක්‍රියාකිරීමේ උපායමාර්ග සහ සතුරා ජයගැනීමේ ආත්මික උපාය මාර්ගයන් අධ්‍යයනය කිරීමත් ආත්මික සටනට ඇතුළත් වේ.

ආත්මික සටන ආත්මික මූලධර්මයන් පිළිබඳ හුදු විශ්ලේෂණයකට වඩා වැඩි දෙයකි. ආත්මික සටන යනු මෙම උපායමාර්ගයන් ජීවිතයේ සහ සේවයේ අදාළ කර ගැනීමෙන් ආත්මික සටනේ ක්‍රියාකාරී වීමය. සාතන්ගේ වඩාත්ම සාර්ථක උපායයන්ගෙන් එකක් වන්නේ සාතන්ගේ ක්‍රියාකිරීමේ ක්‍රමයන් පිළිබඳව ඇදහිලිවතුන් නොදැනුවත්කම තුළ තබාගැනීමයි. එම නිසා සාතන්ගේ උපායයන් පිළිබඳව අප දැනසිටීම වැදගත් බව පාවුල්තුමා පවසා ඇත.

> **ක්‍රිස්තුස්වහන්සේ ඉදිරියෙහි නුඹලා උදෙසාය. මක්නිසාද ඔහුගේ උපායවල් අප විසින් නොදැන සිටිනවා නොවේ. (2 කොරින්ති 2:11)**

සාතන්ගේ පහරදීමේ සියලු උපායයන් පිළිබඳව දැනගත යුතු සියල්ල අප විසින් ඉගෙනගත යුතුය. එමෙන්ම නපුරු ආත්මවලට විරුද්ධවත් සාතන්ට විරුද්ධවත් ජයගැනීම සඳහා ශුද්ධ ලියවිල්ලේ පදනම අප විසින් තේරුම්ගත යුතුව තිබේ. අප කැඳවා ඇත්තේ ප්‍රඥාවන්ත සටනක් කිරීම පිණිසය.

ආත්මික සටන තේරුම් ගැනීම සඳහා ඇත්තාවූ ප්‍රධාන මූලධර්මය වන්නේ,

*ජීවිතයේ සියලුම ගැටුම්, භෞතික, ආත්මික, හැඟීම්මය, මානසිකමය, මූල්‍යමය හෝ මනුෂ්‍ය පෞරුෂයන් සමග වුවත් ඔබ හඳුනාගත යුතු කරුණ වන්නේ එය ආත්මික හේතුවක් බාහිරව ප්‍රකාශවීමක් ලෙසය.*

සාමාන්‍ය ලෝකයේ ඇතිවන ගැටලු, ජීවිතයේ විවිධ අවස්ථාවන්ට මුහුණදීම තුළ සිදුවන බව පෙනෙන්ට තිබුණත් මේ සියලුම ස්වභාවික බලගැටුම්වල පදනම ආත්මික ලෝකයේ තිබෙන බව තේරුම්ගත යුතුය. මෙම මූලධර්මය සනාථකරන යෝබ් පිළිබඳ කථා පුවත කියවා බලන්න (යෝබ් 1-2 පරිච්ඡේදය).

අප මේ ලෝකයේ නපුර ඖෂධ, අධ්‍යාපනය, නීතිය සහ පාරිසරික වර්ධනයන් තුළින් නිවැරදිකර ගැනීමට උත්සාහ කර ඇත. එහෙත් මේ ලෝකයේ අපට පෙනෙන නපුරට හේතුව ආත්මික හේතුවක ප්‍රතිඵලය වන බැවින් එය අසාර්ථක වී ඇත. ස්වභාවික ක්‍රියා මගින් මේවා නිවැරදි කළ නොහැකිය.

## ඔබ අයත් වන්නේ කුමන රාජ්‍යයටද?

ස්වභාවික ලෝකයේ රාජධානියක ස්වෛරී නායකයා රජුය. රාජ්‍යයේ මුළු බල ප්‍රදේශයත් රාජ්‍යය තුළ වසන සියලු ජනයාත් අයත්වන්නේ ඔහුටය. ඔහුට තම වැසියන්ගේ ජීවිතයත් මරණයත් පිළිබඳව බලය අයිතිය. ආත්මික ලෝකයේ කාරණාද මීට සමානය. ඔබ දේව රාජ්‍යයේ කොටසක් හෝ සාතන්ගේ රාජ්‍යයේ කොටසකි. ඔබගේ ජීවිතය පිළිබඳ බලය සාතන්ට හෝ දෙවියන්වහන්සේට ඇත.

ජේසුස්වහන්සේ විසින් පවසන ලද උපමා කථාවක් අනුව සෑම මිනිසෙක්ම සාතන්ගේ රාජ්‍යයට හෝ දෙවියන්වහන්සේගේ රාජ්‍යයට අයත්වන බව උදාහරණයකින් ප්‍රකාශ කර ඇත. ජේසුස්වහන්සේ ලෝකය කෙතකට සමාන කළ සේක. එම කෙතෙහි වපුරන ලද යහපත් බීජ දේව රාජ්‍යයේ දරුවන් වේ. නරක බීජ ලෙස වර්ධනය වූ කිරිඳි නපුරාගේ දරුවන්ය.

> **කෙත නම් ලෝකයය. හොඳ බීජ නම් රාජ්‍යයේ පුත්‍රයෝය. කිරිඳි නම් නපුරාගේ පුත්‍රයෝය. ඒවා වපුළ සතුරා නම් යක්ෂයාය. කපන කාලය නම් ලෝකාන්තිමයය. කපන්නෝ නම් දේවදූතයෝය. (මතෙව් 13:38,39)**

ස්වභාවික උපත්තියෙන් මනුෂ්‍යයෝ සාතන්ගේ රාජ්‍යයට උපත ලබති. සියලුම මනුෂ්‍යයන් පාපය සහිතව උපත ලබන බව බයිබලය උගන්වයි. එහි තේරුම නම්, මූලික පාප ස්වභාවය නැතහොත් පාප බීජය ඔවුන් තුළ ඇති බවය. ඔවුන්ගේ ස්වභාවික නැඹුරුව නපුර කිරීමටය.

> **බැලුව මැනව, මම අයුතුකම සහිතව සාදනු ලැබීමි. මාගේ මෑණියෝ පාප සහිතව මා ගැබ්ගත්තාය. (ගීතාවලිය 51:5)**
>
> **එහෙයින් එක් මනුෂ්‍යයෙක් කරණකොටගෙන පාපයත් පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක් මෙන්, සියලු මනුෂ්‍යයන් පව්කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණය ද පැමුණුණේය. (රෝම 5:12)**
>
> **මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. (රෝම 3:23)**

අප සෑම කෙනෙක්ම පාපි ස්වභාවය සහිතව උපත ලබා ඇති නිසා අප සෑම කෙනෙක්ම එක් කාලයක සාතන්ගේ රාජ්‍යයට අයත්ව සිටියහ. පව්කරුවන් ලෙස සිටින සෑම කෙනෙක්ම සාතන්ගේ රාජ්‍යයේ සිටිති. දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයේ නැතහොත් ශුද්ධ බයිබලයේ අඩංගු ප්‍රධානතම පණිවුඩය සාතන්ගේ නපුරු රාජ්‍යයෙන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුළුවන ලෙස සියලු මනුෂ්‍යයන්ට කරන ඉල්ලීමය. ස්වභාවික උපත කරණකොටගෙන මනුෂ්‍යයෝ සාතන්ගේ රාජ්‍යයට උපදිති. ආත්මික උපත තුළින් මනුෂ්‍යයන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට උත්පාදනය විය යුතුවේ. නව උත්පත්තිය තුළින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට පිවිසීම යොහන් 3 වන පරිච්ඡේදයේ පැහැදිලි කරයි.

අදෘෂ්‍යමාන සටනේ ඇත්තේ කොටස් දෙකක් පමණකි. “මා සමග නොසිටින තැනැත්තා මට විරුද්ධව සිටී” (ලූක් 11:23). මෙම සටන තුළ ඔබට මධ්‍යස්ථව සිටීමට නොහැකිය. මෙම ආත්මික සටන තුළ ඔබ එක් පක්ෂයක හෝ අනික් පක්ෂයේ සිටී. සමහර ඇදහිලිවන්තයෝ සතුරා සමග ගැටීමට ඇති බිය නිසා සටන අමතක කර සතුරා සමග සටන් විරාමයක් ඇති කරගැනීමට ක්‍රියා කරති. ඔවුන් සිතන්නේ, ඔවුන් සාතන් ගණන් නොගෙන සිටියොත් සාතන්ගෙන් ඔවුන්ට කරදරයක් සිදු නොවන බවය. මෙය සාතන්ගේ ප්‍රධාන උපාය මාර්ගයකි. ඔහුගේ බිය වැද්දීමේ උපක්‍රමයන්ගෙන් දෙවියන්වහන්සේගේ හමුදාවේ සාමාජිකයන් ඔහු විසින් අක්‍රිය ස්වභාවයට පත් කරයි.

එහෙත් මෙම බලගැටුම තුළ මධ්‍යස්ථව සිටීමක් නැත. ඔබ ජයග්‍රාහිකයෙක් හෝ පරාජිතයෙක් විය යුතුමය. ඔබ ප්‍රාණයෙන් හා ආත්මයෙන් ජයග්‍රාහිකයෙක්ව සිටී. එසේ නොමැතිනම් ඔබ පරාජිතයෙක්ව, අධෛර්යයට පත්වූවෙක්ව හෝ කලකිරීමකට පත්වූවෙක්ව සිටී. ඔබ ඔබේ භෞතික ශරීරයෙන් ජයග්‍රාහිකයෙක් හෝ දුර්වලව රෝගී වූවෙක්ව සිටී. මේවායින් කුමන දෙයක් ඔබ තුළ සිදුවන්නේද?

සන්නද්ධවීම සඳහා ආත්මික කැඳවීම නිකුත්වෙමින් පවතී. ඔබ සිටින්නේ යහපත් පක්ෂයේද? නපුරු පක්ෂයේද? ඔබ සාතන්ගේ රාජ්‍යයේ කොටසක්ද? දේවරාජ්‍යයේ කොටසක්ද? ඔබ අයිතිවන්නේ කුමන රාජ්‍යයටද? ඔබ අදෘෂ්‍යමාන බලගැටුමේ ගොදුරක් ද ජයග්‍රාහකයෙක්ද?

## ස්වයං පරීක්ෂණය

1. සුවවීමේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. 1 කොරින්ති 15:44-49 සඳහන් බෙදීම් දෙක මොනවාද?

3. අද ලෝකයේ ඇති අදෘශ්‍යමාන රාජ්‍යයන් දෙක මොනවාද?

4. නපුරු ආත්ම බලවේගයන්ගේ ලැයිස්තුව ලියන්න.

5. යහපත් ආත්ම බලවේගයන්ගේ ලයිස්තුව ලියන්න.

6. "රජ" යන වචනයේ අර්ථ විග්‍රහ කරන්න.

7. "රාජ්‍යය" යන වචනයේ අර්ථ විග්‍රහ කරන්න.

8. "ආත්මික සටන" යන පදයෙන් අර්ථවත් වන්නේ කුමක්ද?

9. මෙම ප්‍රබල ආත්මික සටන පසුපස ඇති හේතුව කුමක්ද?

---

---

10. ආත්මික සටන තේරුම්ගැනීමේ මූලික ප්‍රතිපත්තිය කුමක්ද?

---

---

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# එය ක්‍රියාත්මක කිරීම

1. **"... භයෙනුත් වෙවුලුමෙනුත් නුඹලාගේම ගැළවීම ඉෂ්ට කරගනිල්ලා" (පිලිප්පි 2:12)** යනුවෙන් බයිබලය පවසයි. සුවය ක්‍රිස්තුන් ජේසුස්වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම කරණකොටගෙන සපයා දී තිබෙන ගැළවීමේ කොටසකි. "සමගිකිරීම තුළ එය සපයා දී තිබේ නම්, එය ක්‍රියාත්මක කරගන්නේ කෙසේදැයි" ඔබට ඇසිය හැකිය.

   ඇදහිල්ලත් ක්‍රියාවත් එකට ගමන් කරයි. ක්‍රියා නැති ඇදහිල්ලෙන් ප්‍රයෝජනයක් නැතුවාක් මෙන්ම ඇදහිල්ල නැති ක්‍රියාවලින් ද ප්‍රයෝජනයක් නැත (යාකොබ් 2:17-26). ඔබ වචනය අසන්නෙක් පමණක් නොවී එය ක්‍රියාවට දමන්නෙක් ද විය යුතුය.

   මෙම පාඩම තුළින් එළිදරව් කරනු ලබන සුවයේ පොරොන්දුව ඔබගේ ශාරීරික සුවය පිණිස ඔබ විසින් දෙවියන්වහන්සේ සමග ක්‍රියා කළ යුතු බව අනාවරණය කරයි.

   **නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේගේ හඬට නුඹ ඕනැකමින් ඇහුම්කන්දී උන්වහන්සේගේ ඇස් හමුයෙහි හරිව තිබෙන දේ කොට උන්වහන්සේගේ ආඥාවලට කන්දෙමින් උන්වහන්සේගේ සියලු නියෝග රක්ෂාකරන්නෙහි නම් මිසරවරුන් පිට මා පැමිණෙවූ රෝගවලින් එකක්වත් නුඹ පිටට නොපමුණුවන්නෙමි. මක්නිසාද මම වනාහි නුඹ සුවකරන්නාවූ ස්වාමින්වහන්සේයයි කීසේක. (නික්මයාම 15:26)**

   මෙම උපදෙස් ග්‍රන්ථයේ හමුවන සෑම පාඩමක් සමගම ඇති "එය ක්‍රියාත්මක කිරීම" යන කොටස තුළ උගන්වන ලද සංකල්පයන් ඇදහිල්ලෙන් ඔබගේ ජීවිතය තුළ අදාළ කරගැනීමට අවස්ථාවක් උදාකර දෙයි. ඔබ අසන්නෙක් පමණක් නොකර වචනය ක්‍රියාත්මක කරන්නෙකු කිරීමට එය උපකාර කරයි.

   මෙම කොටස පාඩමේ ඉතා වැදගත් කොටසක් වේ. ඔබ රෝගීව සිටී නම් ඔබට පියවරෙන් පියවර සුවය ලබා ගැනීම පිණිස එය සැළසුම්කර තිබේ. ඔබ රෝගීව සිටින අයෙකුට උපදෙස් දෙමින් සිටී නම් ප්‍රථමයෙන් ඔහු සමග පාඩමේ අඩංගු දේ බෙදාගෙන ඉන්පසු ක්‍රියාත්මක කිරීම යන මේ කොටසේ අඩංගු දේ ද ඔවුන්ට කියා දී සුවය ලබාගැනීමට මගපෙන්වන්න.

2. මාක් 7:24-30 දක්වා ඇති සිරෝෆිනීසි ස්ත්‍රිය පිළිබඳ ජේසුස්වහන්සේගේ කථාව කියවන්න. එම කථාවෙන් සුවය "දරුවන්ගේ රොටි" ලෙස හෙළිකර දී ඇත. එහි අර්ථය නම් සුවය අයිති දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ දරුවන්ට බවයි. දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ට ඇති කරුණාව නිසා දෙවියන්වහන්සේ නොදන්නා මනුෂ්‍යයන් ගැළවීමට සමීප කරගන්නා පිණිස සුව කරන නමුත් සුවය සැබවින්ම අයිති දෙවියන්වහන්සේගේ දරුවන්ටය.

   ඔබට සුවය අවශ්‍ය නම් ඔබ විසින් ගත යුතු ප්‍රථම පියවර දෙවියන්වහන්සේගේ දරුවෙකු වීමය. ඔබ ඔබගේ පව් ගැන පසුතැවිලි වී ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙසත් සුවදායකයාණන් ලෙසත් පිළිගත යුතුය. ඔබ මේ දක්වා එසේ කර නොමැති නම් පහත යාච්ඤාව කරන්න.

   *ප්‍රේමණීය දෙව් ස්වාමිනි, මම පව්කාරයෙක් බව දනිමි. මාගේ පාපය පිළිගනිමි. ඒ ගැන පසුතැවිලි වෙමි. ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ සැබෑවූ, ජීවමාන වූ එකම දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බවත් උන්වහන්සේ මාර්ගය ද සත්‍යය ද ජීවනය ද බවත් අදහමි. මම ජේසුස්වහන්සේගේ කුරුසියේ පූජාව පිළිගන්නා අතර උන්වහන්සේ කුරුසියේ මැරුණේ මා උදෙසා බවත් විශ්වාස කරමි. මට කමාව ලබාදී මාගේ සියලු පාපවලින් මා පවිත්‍ර කළ මැනව. ජේසුස්වහන්සේගේ නාමයෙන්. ආමෙන්!*

3. ආත්මික සටන සාර්ථකව සිදුකරන පිණිස ඉතා හොඳ ආත්මික පදනමක් අත්‍යවශ්‍යය. ඔබ නව ඇදහිලිවන්තයෙක් නම් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයෙන් නිකුත් කර ඇති "ඇදහිල්ලේ අත්තිවාරම" නමැති ඉගැන්වීම ලබාගන්න.

4. ඔබ අදෘශ්‍යමාන බලගැටුමේ ගොදුරක් බවට පත්ව ඇතැයි ඔබට දැනෙනවාද? ඔබ ඔබගේ ජීවිතයේ හෝ සේවයේ කුමන අංශවලදී මෙම සටනින් පරාජය වී තිබේද? ඔබ මෙහි පහත සඳහන්ව ඇති කුමන තලයක අසාර්ථක වී තිබේද?
   - ආත්මික තලයේ
   - හැඟීම් තලයේ
   - ශාරීරික තලයේ
   - මානසික තලයේ

   ඔබ මෙම උපදේශ පොත අධ්‍යයනය කරමින් යනවිට මේ තලයන්හි දී ජයගැනීමට උපකාරවන උපාය මාර්ගයන් ඔබ ඉගෙන ගන්නවා ඇත.

5. මේ පාඩම තුළ සාකච්ජා කරන ලද 2 ලේකම් 6 පරිච්ජේදයේ කතාන්තරය නැවත බලන්න. ගෙහාසි හෝ දෝතාන්හි සිටි මනුෂ්‍යයන් මෙන් තමන්ගේ ස්වභාවික ශරීරයන්ට සාතන්ගේ පහරදීම් පිළිබඳව කිසිවක් නොදැන සිටින අය හෝ බියපත්ව සිටින අය ගැන දන්නවාද? ඔවුන්ට කුමන ආකාරයෙන් ඔබට උපකාර කළ හැකිද?

6. ආත්මික සටනට බොහෝ පැති තිබෙන නිසා ඔබ පුද්ගලිකව පාපයට විරුද්ධව සටන් කළ යුතුය. සමාජයම වශයෙන් ලෝකයේ පවතින නපුරට විරුද්ධවත් අධිස්වභාවික සුවකිරීමේ සහ මිදීමේ සේවාව තුළිනුත් සටන් කළ යුතුය. මෙම ආත්මික යුද්ධයේ ඔබ කළ යුතු කොටසට අදාළව යාච්ඤා කිරීම ආරම්භ කරන්න. ඔබට ආත්මික සටන පිළිබඳව තේරුමක් නැත්නම් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "ආත්මික උපාක්‍රම: ආත්මික සටන සඳහා අත්පොත" අධ්‍යයනය කරන්න.

7. ආත්මික සටන පිළිබඳ උපදේශ ග්‍රන්ථයක් ලෙස මුළු බයිබලයම අධ්‍යයනය කරන්න. එය පසුගිය ජයග්‍රහණයන් සහ පරාජයන් අඩංගු ආත්මික සටනට අදාළ ඓතිහාසික වාර්තාවයි. එමෙන්ම එය අනාගත වාක්‍යමය වන අතර අවසාන සටන දක්වා ඇති ආත්මික යුද්ධය හෙළිදරව් කරයි.

## දෙවන පරිච්ඡේදය

# සන්නද්ධ වීමට කැඳවීම

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවය ලැබීමේ පොරොන්දුව මතකයෙන් ලිවීමට
- සුවය පිළිබඳව භාවිත කර ඇති විවිධ පද හඳුනාගැනීමට
- දිව්‍යමය සුවය අර්ථ විග්‍රහ කිරීමට
- සුවය සහ මිදීම අතර වෙනස වටහාගැනීමට
- ලෝකයේ සීමාන්ත දක්වා ශුභාරංචිය ගෙනයාමේ ආඥාවට අදාළව සුවකිරීම සහ මිදීම සම්බන්ධවන ආකාරය විස්තර කර දීමට.

## සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **නුඹලා නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේට මෙහෙකරපල්ලා. උන්වහන්සේ නුඹේ භෝජනයටත් නුඹේ වතුරටත් ආශිර්වාද කරන සේක. මම නුඹේ මධ්‍යයෙන් රෝග ඉවත් කරන්නෙමි. (නික්මයාම 23:25)**

### හැඳින්වීම

පැරණි ගිවිසුම් සමයේ දේව සෙනඟ යුද්ධයට කැඳවීම පිණිස හොරණෑවක් භාවිත කර ඇත. අද ලෝකයේ සියලු ජාතීන් අතර ආත්මික කැඳවීමක් නාදවේ. එනම් අදෘශ්‍යමාන බලගැටුමට කැඳවීමකි. එය සන්නද්ධවීමට කැඳවීමකි. මේ පාඩම තුළින් ඔබට ලැබෙන කැඳවීම පරාජිත ස්වභාවයෙන් සහ බන්ධනයෙන් ඉවත්ව ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇති ජයග්‍රාහී සහ නිදහස් වූ ජීවිතයට කැඳවීමකි.

### පද අර්ථ විග්‍රහය

සුව කිරීම යන වචනය සඳහා ලෝකයේ බොහෝ විවිධ වූ පද භාවිත කරති.

**මනෝ සුවය** : ශරීරයේ අනෙක් අංග පාලනය කිරීමට මනසට ඇති හැකියාව, භූත බලපෑම්, මායාව, ශාමන්වාදය සහ නෙත් ලබ්ධිවාදයන්ගේ බලපෑමෙන් මනස සුව කිරීම පිළිබඳව භාවිත කරති.

**අධිස්වභාවික සුවය :** දෙවියන්වහන්සේගෙන් නොවූ අධිස්භාවික සුව කිරීම් මූලාශ්‍රයන් ඇත. එම නිසා මෙම පදය අපගේ අධ්‍යයනය තුළ භාවිත නොකෙරේ. අධිස්වභාවික ක්‍රියා කිරීමට සාතන්ට හැකියාව තිබේ. (නික්මයාම 7:8-13)

**වෛද්‍ය සුවය :** මෙම සුවය වෛද්‍යවරුන්, හෙදියන්, ආරෝග්‍යශාලා සහ ඖෂධ උපයෝගි කරගෙන ලබන සුවයකි. අප ඉගෙන ගන්ට යන ආකාරයට නිත්‍යනුකූල වෛද්‍යමය සුවය දේව වචනයට පටහැනි නොවන අතර එය දෙවියන්වහන්සේගේ යහපත් ගුණය දිගුකිරීමක් ලෙස සැලකේ.

**ස්වභාවික සුවය :** සාමාන්‍ය ශරීරයේ ක්‍රියාකාරිත්වය තුළින් ශරීරයට ලැබෙන සුවය එනම් දෙවියන්වහන්සේගේ ක්‍රියාකිරීම ලෙස දැක්විය හැකිය. සාමාන්‍ය ශරීරයේ ක්‍රියාකාරිත්වය දෙවියන්වහන්සේගේ ස්වභාවය ප්‍රදර්ශනය කරන අතර මනුෂ්‍ය ශරීරය තුළ දෙවිඳුන්ගේ මහත්වූ අලංකාර ක්‍රියාකිරීම පෙන්වයි. මෙම ස්වභාවික සුවයට සුදුසු ආහාර, ස්වභාවික විටමින් හා ඛනිජ, එමෙන්ම සෑහෙන විවේක ගැනීම ද ඇතුලු ස්වභාවික සුවය දෙන ක්‍රමයන් ද ඇතුළත් වේ.

**ඇදහිල්ලේ සුවය** : මෙම පදය නිතර භාවිත කරනු ලබන්නේ දෙවියන්වහන්සේගෙන් ලබන සුවය හැඳින්වීමටය. එහෙත් අප මෙම පදය ද භාවිත නොකරමු. ඊට හේතුව මෙම සුවය තුළ සුවකිරීමට භාවිත කරන පුද්ගලයාගේ ඇදහිල්ල කෙරෙහි නැතහොත් සුවය ලබන අයගේ ඇදහිල්ල කෙරෙහි වැඩි අවධානයක් යොමුවන හෙයිනි.

**දිව්‍යමය සුවය :** "දිව්‍යමය" යන වචනය දෙවියන්වහන්සේ කෙරෙහි අවධානය යොමු කරයි. මනුෂ්‍යයාගේ ඇදහිල්ලට එහි අවධානයක් යොමු නොකරයි. එමෙන්ම ලබ්ධි ක්‍රමයන් තුළින් ලබන චෛතසික හෝ අධිස්වභාවික සුවය යන දෙකෙන්ම වෙන් කර පෙන්නුම් කරන සුවයක් දිව්‍යමය සුවය වේ. "දිව්‍යමය" යන වචනය උන්වහන්සේගේ වචනය වන ශුද්ධ බයිබලයේ භාවිත කර ඇත්තේ සැබෑ වූ එකම දෙවියන්වහන්සේ උදෙසාය.

සුවකිරීම යනු රෝගය සුව කිරීම හෝ සම්පූර්ණත්වයට පත් කිරීමය. සුවකිරීම යන්නට ආත්මික, ශාරීරික, චිත්තවේගිය, මානසික හෝ භූතදෝෂවලින් නිදහස් කිරීම ද ඇතුළත් වේ. එය රෝගයට ප්‍රතිශක්තිකරණයක් නොවේ. මේ ලෝකයේ අප ජීවත්ව සිටිනතාක් අපගේ ශරීර දිරායෑමේ ක්‍රියාවලියට සහ සාතන්ගේ පහරදීමට විවෘතව පවති.

මෙම අධ්‍යයනය තුළ "දිව්‍යමය සුවය" යන වචනය අපි භාවිත කරමු. දිව්‍යමය සුවය නම් සැබෑවූ එකම දෙවියන්වහන්සේ තම ස්වභාවය එළිදරව් කර, තමන්වහන්සේගේ පොරොන්දු ඉෂ්ට කර ක්‍රිස්තුස්වහන්සේගේ සමගි කිරීමේ මෙහෙය තුළින් සපයා දී ඇති සියල්ල කරණකොටගෙන කෙනෙකකුගේ ආත්මය, ශරීරය, ප්‍රාණය වශයෙන් සම්පූර්ණයෙන් සුව කර සම්පූර්ණත්වයට පත්කිරීමය.

දිව්‍යමය සුවය ක්ෂණික (හාස්කමකින්) හෝ ක්‍රමානුකූල (ක්‍රියාවලියක් තුළින්) හෝ විය හැකිය. ක්ෂණිකව සිදුවන සුවයකදී දේව අභිමුඛයත් උන්වහන්සේගේ බලයත් මුළුමනින්ම ප්‍රකාශිත වන බව සත්‍යයකි. එහෙත් ක්‍රමානුකූලව සිදුවන සුවයක් ද හාස්කමකින් ලැබෙන සුවයට අඩු නොවන්නේය (මාක් 8:22-25 ට බලන්න). වෛද්‍ය සහ ස්වභාවික සුවයයන් ද එක් ආකාරයකින් දිව්‍යමය සුවයක් වන්නේය. හේතුව සුවය ඇති කරන්නේ දෙවියන්වහන්සේ වන බැවිනි.

## සුව කිරීම සහ මිදීම

මෙම පාඨමාලාව තුළ "සුව කිරීම සහ "මිදීම" යන පද දෙකම මාරුවෙන් මාරුවට භාවිත කෙරේ. සුවකිරීම යන පදය ශාරීරික, හැගීම් සහ මානසික රෝගවලට අනුකූලව භාවිත කරනු ලබන අතර "මිදීම" යන පදය යක්ෂ ආත්ම කරණකොටගෙන ඇතිවන මානසික සහ ශාරීරික තත්වයන් සුවකිරීමට අදාළව භාවිත කෙරේ.

මනුෂ්‍යයා ශරීරය, ප්‍රාණය සහ ආත්මය යන සංයුතිය සහිත බැවින් යක්ෂාත්ම කරණකොටගෙන ඇතිවන මානසික තත්වයන් ශාරීරික රෝග ස්වභාවයකින් මතුවීම සිදුවිය හැකි බව ඔබ මෙම අධ්‍යයනයේ පසු කොටස්වලදී ඉගෙන ගන්නවා ඇත. එමෙන්ම ශාරීරික රෝගී ස්වභාවයක් යක්ෂාකාර මානසික පීඩන තත්වයකට පත්වීමට හැකියාව ඇත. එබැවින් සුවකිරීම සහ මිදීම යම් ආකාරයකින් වෙනස් කාරණා දෙකක් වුවද මනුෂ්‍යයාගේ ත්‍රිවිධ ස්වභාවය නිසා මේවා එකිනෙකට සම්බන්ධතාවයක් දක්වයි.

## සන්නද්ධවීමට කැඳවීම

මුල් සභාව තම ආත්මික අත්දැකීම සැලකුවේ සටනක් ලෙසටය. නව ගිවිසුම තුළ දිගටම යුද්ධමය වචන මාලාවක් භාවිත කර ඇත. ආරක්ෂාව ඇත්තේ දෙවියන්වහන්සේගේ යුද්ධායුධ තුළය. දේව වචනය කඩුවකට සමාන කර ඇත. සාතන්ගේ පහරදීම් ගිනිමය ඊතල ලෙස හඳුන්වා තිබේ. ඇදහිල්ල යහපත් සටන ලෙස දක්වා ඇති අතර යහපත් සංග්‍රාමයක නියුක්තව සිටින ලෙස ඇදහිලිවතුන්ට පවසයි.

කිතුනු ජීවිතය, තවමත් යුද්ධයකි. සාතන් මනුෂ්‍යයාගේ ප්‍රාණය හා ආත්මය ලබාගැනීම උදෙසා සටන් කරයි. සාතන් තවමත් ස්වභාවික ශරීරයට ලෙඩ, රෝග හා බන්ධනය තුළින් පහර දෙයි. දෙවියන්වහන්සේ තම සෙනඟට ප්‍රඥාවන්ත සටනක නියුක්තවීමට ආරාධනය කරයි. දේව වචනයෙන් සන්නද්ධව සිටින පිණිසත් මෙම පරම්පරාවට සුවය හා මිදීම ලබාදීමටත් කැඳවීමක් ඇදහිලිවන්තයන් වෙත නිකුත්ව යයි.

නව ගිවිසුමේ ශුභාරංචි පොත් තුළ සුවය සහ මිදීමේ ආඥාව නොමැතිව කිසිවෙකුට ශුභාරංචිය දේශනා කිරීමේ ආඥාව ජේසුස්වහන්සේ නුදුන් සේක. “ඔබ ගොස් . . . රෝගීන් සුවකරන්න. යක්ෂයන් දුරු කරන්න” යයි උන්වහන්සේ පැවසූ සේක (මතෙව් 10:1, 7-8).

සමූහයා සුවය හා මිදීම ලබාගැනීම පිණිස පැමිණෙන විට ආත්මික අස්වැන්න සීඝ්‍රයෙන් ප්‍රගුණවීම ආරම්භ වූ නිසා නව සේවකයන් අවශ්‍ය විය. එමනිසා වැඩිකල් ගතවීමට ප්‍රථමයෙන් දේශනා කිරීම, ඉගැන්වීම, සුවකිරීම හා මිදීම පිණිස තව ගෝලයන් 70 ක් වැඩිපුර අවශ්‍ය විය.

ශුභාරංචිය ප්‍රචාරය කිරීම පිණිස උපකාර කරගත හැකි බොහෝ නව ක්‍රම තිබේ. මුද්‍රණ යන්ත්‍ර, පරිගණක, ගුවන් විදුලිය, රූපවාහිනිය, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය පටි සහ චන්ද්‍රිකා වැනි දේ මෙයට ඇතුළත් වේ. ශුභාරංචිය ප්‍රචාරය කිරීම පිණිස නව ප්‍රවාහන ක්‍රමයන්ද සෙනඟට උපකාරී වේ. මේ සෑම නව තාක්ෂණික ක්‍රම ප්‍රයෝජනවත් වන නමුත් ශුභාරංචියේ නියම බලය ඇත්තේ අභ්‍යන්තරිකවය. මෙයින් අදහස් කරන්නේ ශුභාරංචිය තුළම එහි බලය අන්තර්ගතව ඇති බවය. මුහුන් පිළිබඳ උපමාවෙන් මේ කරුණ විස්තර කෙරේ.

> **නැවතත් උන්වහන්සේ කියනසේක්: දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට සමාන කරම්ද? ස්ත්‍රියෙකු විසින් පිටි නැළි තුනක් සහමුලින්ම පිපෙන තෙක් එහි දමා තිබූ මුහුන්වලට එය සමානයයි කීසේක. (ලූක් 13:20-21)**

මෙම ඡේදයෙන් හෙළිදරව් වන කරුණ නම් දෙවියන්වහන්සේගේ කාර්යය අනවශ්‍ය කරදර සහ ප්‍රසිද්ධිය නොමැතිව සිදුවෙන බවය. දේව රාජ්‍යයේ ව්‍යාප්තිය, හමුදා යටත් කරගනිමින් මහාද්වීප ජයගනිමින් බාහිර ආකාරයට සිදුවන්නක් ලෙස ඔබ ඇතැම් විට අපේක්ෂා කරන්නට පුළුවන. එහෙත් දේව රාජ්‍යයේ ව්‍යාප්තවීම පාන් සඳහා අනන ලද පිටි ගුලියක මුහුන් වර්ධනයට සමානය. මුහුන් සැඟවී තිබෙන ඉතා ස්වල්ප දෙයක් නමුත් එයට අසීමිත හැකියාවක් ඇත. මුහුන්වල ආකාරයටම දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ බලය ද බාහිර එකක් නොව අභ්‍යන්තර එකකි. දේව රාජ්‍යයේ අභ්‍යන්තර බලය පිටි පිඬෙහි දැමූ මුහුන් මෙන් දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය ද ප්‍රගුණවෙමින් වර්ධනය වී ලෝකය නමැති මුළු පිඩ තුළ පැතිරයන්නේය.

ජේසුස්වහන්සේ ද අබ ඇටයේ වර්ධනය භාවිතයෙන් ශුභාරංචියේ අභ්‍යන්තරික බලය පෙන්නුම් කළ සේක.

> **එබැවින් උන්වහන්සේ කියනසේක්: දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට සමානද? ඒක කුමකට සමානකරම්ද? එක් මනුෂ්‍යයෙකු විසින් අරගෙන තමාගේ වත්තේ දැමූ අබ ඇටයකට සමානය: ඒක වැඩී ගසක් විය, ආකාශයේ පක්ෂීහු එහි අතුවල ලැග්ගෝයයි කීසේක. (ලූක් 13:18-19)**

මුහුන් ව්‍යාප්තවන ආකාරයටම ඉතා කුඩා අබ ඇටයක් විශාල ගසක් ලෙසට වර්ධනය වේ. මෙම උදාහරණයෙන් ද විස්තර කරන්නේ දේව රාජ්‍යයේ නිශ්ශබ්ද, එහෙත් බලවත් ඵලදායි ආකාරයෙන් පැතිරයාමයි.

ජේසුස්වහන්සේ වෙනත් උපමා කථාවකින්, එනම් අබ ඇටයක් වැනි ඉතා කුඩා ඇදහිල්ලක් හෝ තිබේ නම් කිසිම දෙයක් කිරීමට අපහසු නොවන බව පැවසූ සේක. මෙයින් තේරුම්ගත යුතු සත්‍යතාවය වන්නේ උසස් තාක්ෂණික ක්‍රමවේදයන් නොමැති ජනතාව අතර පවා දේව රාජ්‍යයේ නැතහොත් ශුභාරංචියේ ව්‍යාප්තියට සීමාවක් නොමැති බවය. ඉතාම කුඩා ඇදහිල්ලක් ඇතිව පවා දේවරාජ්‍යයේ ව්‍යාප්තිය සිදුවිය හැකිය. සභාවේ ඉතිහාසයේ පටන් පවතින ඉතා මහත්වූ ආත්මික අස්වැන්න නෙළාගැනීමට ඉතිරිව ඇත. නව ගිවිසුම් කාලයේ සිදුවූ ආකාරයෙන්ම සුව කිරීමේ සහ මිදීමේ දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කරමින් මෙම අස්වැන්න නෙළාගැනීම සිදු වන්නේය. එහෙයින් පාවුල් අපොස්තුළුවරයා මේ ලෙස පැවසුවේය.

> **මාගේ කථාවත් මාගේ දේශනා කිරීමත් ප්‍රඥාවේ සිත් පොලඹවන්නාවූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේ ද බලයේ ද ප්‍රකාශ කිරීමෙන් විය. එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය. (1 කොරින්ති 2:4-5)**

ජේසුස්වහන්සේ ස්වර්ගයට නැගුණු කල ලෝකයේ සියලු ජනතාවට ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේ වගකීම ඇදහිලිවතුන්ට දුන් සේක.

**උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා. (මාක් 16:15)**

ආධිපත්‍යයක් නොමැතිව කිසිවෙකුට වගකීමක් ඉටු කළ නොහැකිය. ජේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට තම වගකීම ඉටු කිරීමට අවශ්‍ය ආධිපත්‍යයද දුන් සේක.

**අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරු කරන්නෝය. අන් භාෂාවලින් කථා කරන්නෝය. සර්පයන් අල්ලාගන්නෝය, යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය. ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කීසේක. (මාක් 16:17-18)**

සන්නද්ධ වීම සඳහා ලැබී ඇති ආත්මික කැඳවීමට පිළිතුරු දීමටත් ලෙඩ හා රෝග සහිත සහ බන්ධනයෙන් යුත් ජීවිතයෙන් මිදී ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ජයග්‍රාහී ජීවිතයකට ඇතුළුවීමටත් ඔබ සූදානම්ද? දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කරන්නාවූ සේවයකට ඔබ සූදානම්ද? භෞතික ශරීරය සඳහා යුද්ධ කිරීමට ඔබ සූදානම්ද? රෝගී අය සුවය ලැබීමත් යක්ෂයන් විසින් බන්ධනයට හසුකරගෙන ඇති අය එයින් නිදහස්වීමත් දැකීමට ඔබට අවශ්‍යද? සුවකිරීමේ සහ මිදීමේ සේවය මෙය වේ. එය ආගමික නිකායයන්ගේ නායකයන්ට පමණක් ඇති සේවයක් නොවේ. එය පාලකවරුන්ටත් ශුභාරංචි ප්‍රකාශකයන්ටත් පමණක් ඇති සේවයන් ද නොවේ. “අදහන්නන්ට ඇති ලකුණු මේවාය”.

ඔබ ඇදහිලිවන්තයෙක්ද? එසේ නම් ඔබත් මෙම ආත්මික සන්නද්ධවීමේ කැඳවීමට පිළිතුරු දිය යුතුය.

## ස්වයං පරීක්ෂණය

1. සුවය ලැබීමේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

---

2. සුවකිරීමට අදාළ පහත සඳහන් පදවල අර්ථ විග්‍රහ කරන්න.

   මානසික සුවය

---

   අධිස්වභාවික සුවය

---

   වෛද්‍ය සුවය

---

   ස්වභාවික සුවය

---

   ඇදහිල්ලේ සුවය

---

3. දිව්‍යමය සුවය අර්ථ විග්‍රහ කරන්න.

---

4. සුවකිරීම සහ මිදීම අතර වෙනස අර්ථ නිරූපණය කරන්න.

---

5. ලෝකය පුරාම ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ ආඥාවට සුවකිරීම හා මිදීම අදාළවන්නේ කෙසේද?

---

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

**1. අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරු කරන්නෝය. අන් භාෂාවලින් කථා කරන්නෝය. සර්පයන් අල්ලාගන්නෝය, යම් මරණිය වස ජාතියක් බිව්ත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය. ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කීසේක. (මාක් 16:17-18)**

ඔබ ඇදහිලිවන්තයෙක්ද?

---

එසේනම් ලකුණු ඔබගේ සේවයේ සිදුවන්නේද? රෝගීන් සුවය ලැබීමත් යක්ෂ බලයෙන් පීඩාවට පත්වුවන් නිදහස්වීමත් සිදුවන්නේද?

---

එසේ සිදු නොවන්නේ නම්, මෙම අධ්‍යයන පාඨමාලාව ඔබ හදාරන අතර නිත්‍යානුකූලව ඔබට අයිති සුවකිරීමේ සහ මිදීමේ සේවය පිණිස දෙවියන්වහන්සේ ඔබගේ සිත විවෘත කරන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.

2. ඔබ පාලකවරයෙක්, ශුභාරංචි දේශකයෙක් හෝ ගුරුවරයෙක් නම් පාවුල්තුමාගේ මෙම වදන් සලකා බලන්න.

**මාගේ කථාවත් මාගේ දේශනා කිරීමත් ප්‍රඥාවේ සිත් පොලඹවන්නාවූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේ ද බලයේ ද ප්‍රකාශ කිරීමෙන් විය. එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය. (1 කොරින්ති 2:4-5)**

බලයෙන් යුක්ත නොවූ දේශන හා ඉගැන්වීමෙන් සිදුවන්නේ "මනුෂ්‍ය ප්‍රඥාවෙන් ලැබූ සිත් ඇදගන්නා වචනවලින් දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලට වඩා මනුෂ්‍යයා කෙරෙහි විශ්වාසය තැබීමට උනන්දු කරවීමය. පාවුල්තුමා තමාගේ දේශන සඳහා හාස්‍ය මුසු නිදසුන් සොයාගැනීම පිණිස ලියවිලි සෙවී යයි ඔබට සිතිය හැකිද? එමෙන්ම ඇතන්ස් නුවර හෝ කොරින්තියේ සිදුවූ අමුතු කථා රැස්කිරීමට තමාගේ සේවයේ කාලය වැය කළා යයි ඔබට සිතිය හැකිද? පාවුල් නාට්‍යාකාර වැඩසටහන් සැලසුම් කිරීමට ක්‍රියා කළ බව ඔබට සිතින් මවා ගත හැකිද? මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ වෙතට ඇදගන්නේ සිත් පිනවන මනුෂ්‍ය වචනවත්, මනුෂ්‍යයාගේ ප්‍රඥාවටත් විනෝදාත්මක ඉදිරිපත් කිරීම්වත් නොවන බව පාවුල්තුමා දැන සිටියේය. එහෙත් එය ආත්මයාණන් වහන්සේගේ සහ බලයේ ප්‍රදර්ශනය කිරීමත්ය. ඔබගේ මෙහෙය කුමන ගණයට අයත් වන්නේද?

3. ඔබට අවශ්‍ය සුවකිරීම ද මිදීම ද? නැවත සුව කිරීමේ අර්ථ විග්‍රහය අධ්‍යයනය කරන්න.

*"දිව්‍යමය සුවය යන සැබෑවූ එකම දෙවියන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේගේ සමගි කිරීම තුළින් සපයා දී ඇති දීමනා මත ක්‍රියා කරමින් මනුෂ්‍යයෙක් පූර්ණ වශයෙන් ශරීර, ප්‍රාණ හා ආත්ම වශයෙන් සුවයට පත්කිරීමෙන් තම පොරොන්දු ඉටුකරමින් තම ස්වභාවය එළිදරව් කිරීමය".*

*ඔබ ගැන අපගේ යාච්ඤාව නම් මෙම අධ්‍යයනය ඔබ නිමකිරීමට පෙර දෙවියන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේගේ සමගිකිරීම තුළින් සපයා දී ඇති දීමනාවෙන් ඔබගේ ශරීර, ප්‍රාණ සහ ආත්ම සම්පූර්ණත්වයට පත්කර උන්වහන්සේගේ ස්වභාවයත්, උන්වහන්සේගේ පොරොන්දුත් ඔබට එළිදරව් කරන පිණිසය.*

# තෙවන පරිච්ඡේදය

# බලගැටුමට පෙර

## අරමුණු

මෙම පරිච්ජේදය අවසන් වන විට ඔබට මේ දේවල් කළ හැකිවනු ඇත.

- සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලිවීමට
- සුවකිරීම සහ මිදීම සඳහා ඇති පොදු ප්‍රතිචාර හතර ලයිස්තුගත කිරීමට
- සුවකිරීමේ සේවාවේ නියුක්ත නැති නායකයන් සඳහා අවවාදයන් සාරාංශ කිරීමට
- සුවකිරීමේ හා මිදීමේ සේවයන් පිළිබඳව හරියාකාර ඉගැන්වීමක අවශ්‍යතාවය පැහැදිලි කිරීමට.

## සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **මාගේ පුත්‍රය, මාගේ වචනවලට ඇහුම්කන්දී, මාගේ කීම්වලට නුඹේ කන නමාපන්න. ඒවා නුඹේ ඇස් ඉඳිරියෙන් පහ නොවේවා, නුඹේ සිතු තුළ ඒවා තබාගනින්න. මක්නිසාද, ඒවා සම්බවන්නන්ට ඒවා ජීවනයත් ඔවුන්ගේ සකල ශරීරයට සුවයත් වේ. සියල්ලටම වඩා නුඹේ සිත ආරක්ෂාකරගනින්න. මක්නිසාද එයින් ජීවනය නික්මෙන්නේය. (හිතෝපදේශ 4:20-23)**

### හැඳින්වීම

ඔබ සුවකිරීම සහ මිදීම පිළිබඳ අධ්‍යයනය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් මෙම අංශයේ ඔබ දැනට යෙදී සිටින සේවාවට අදාළ යම් වර්තමාන ආකල්පයන් පිළිබඳව තේරුම්ගැනීම ඔබට උපකාරී වනු ඇත. සුවකිරීම සහ මිදීමට අදාළව බොහෝ ඇදහිලිවතුන් පහත දැක්වෙන කුමන හෝ ප්‍රතිචාරයන් දක්වා ඇත.

## ගණන් නොගෙන සිටීම:

එක් දේවධර්ම ආචාර්යවරයෙකු විසින් ඉවැන්ජලිස්ත පාසල්වල පුස්තකාලවල ඇති දේවධර්මය පිළිබඳව රචිත පිටු 87125 ක් පමණ අධීක්ෂණය කර තිබේ. මෙම පිටු අතරින් සුවකිරීම ගැන ලියා තිබුණේ පිටු 71 ක් පමණී. භාස්කම් පිළිබඳව පිටු 131 ක් ද පුදුම සහ ලකුණු පිළිබඳව පිටු 85 ක් ද ඔහුට හමුවීය. මෙම විෂයයන්ට අදාළව නව ගිවිසුම් පොත්වල ලියා ඇති ඉතා ඉහළ සංඛ්‍යාවක්වූ පද සමග වර්තමාන දේවධර්ම ලියවිලිවල මෙම විෂයයන්ට අදාළව ලියවී ඇති ඉතා අඩු සංඛ්‍යාවක්වූ පද සසඳා බලන කල පැහැදිලිවන කරුණ නම් වර්තමාන ශුභාරංචි ක්ෂේත්‍රයේ මෙම විෂයයන් ගණන් නොගෙන සිටීමේ ප්‍රවණතාවක් හමුවන බවයි.

බයිබලයේ සඳහන්වන බොරු භාස්කම් පිළිබඳව ඇති අනතුරු ඇඟවීම්, ඇතැම් අය සුවය ගණන් නොගෙන සිටීමට හේතුවී ඇත. මෙම  අනතුරු ඇඟවීම සියලුම භාස්කම් පිළිබඳව යයි ඔවුන් විශ්වාස කරයි (මාක් 13:22-23). ඇතැම් අය සුවකිරීම් න්‍යාය වශයෙන් පමණක් විශ්වාස කරන අතර ප්‍රායෝගික වශයෙන් නොසලකා හරිති. තවත් අය සුවය ගණන් නොගෙන සිටින හේතුව නම් රෝග සහ දුක්පීඩා විඳීම්වලට අදාළ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඔවුනට නොහැකි බැවිනි. තවත් සමහරෙක් අසාර්ථකවීමේ බිය නිසා සුවය ගණන් නොගෙන සිටි. ප්‍රමිතින් දෙකක අප සිටින බව පැහැදිලිය. අප නිසැකකමින් ආර්ථිකය, ප්‍රඥාව සහ මගපෙන්වීම පිළිබඳව යාච්ඤාකරන නමුත් සුවය උදෙසා යාච්ඤා කිරීමට බියක් දක්වයි. තවත් සමහරෙක් මෙසේ ගණන් නොගෙන සිටීමට හේතුව බුද්ධිවාදී සහ භෞතිකවාදී අදහස් තමන්ට කොපමණ දුරට බලපා තිබේදැයි අවබෝධකරගෙන නොමැති වීමයි. බොහෝ දෙනෙක් ස්වාභාවික භෞතික ලෝකයේ අදහස් නිසා ඇදහීමට නම් ඇසින් දැකිය යුතුය යන මතයේ සිටිති.

## ප්‍රතික්ෂේප කිරීම:

සමහර අය සුවකිරීම සහ මිදීම අදට අදාළ බව ප්‍රතික්ෂේප කිරීමට හේතුන් නම් ඊට අදාළ දේවධර්මයක්, ආදර්ශයක් ක්‍රියාකිරීමක් හෝ අත්දැකිමක් නොමැති වීමය.

නව ගිවිසුම් ශුභාරංචි පොත් තුළ ශාරීරික සුවයන් පිළිබඳ අවස්ථා 26ක් අඩංගු වේ. ක්‍රියා පොතේ 5 ක් සඳහන් වේ. 1 කොරින්ති 12:8-11 දක්වා සහ 28-30 දක්වා ශාරීරික සුවය පිළිබඳව සඳහන්කර ඇති අතර යාකොබ් පොතේ 5:13-16 දක්වා පදවල රෝගීන්ගේ සුවය සඳහා යාච්ඤාකිරීමේ විශේෂ උපදෙස් සඳහන්කර ඇත. යැවුම් පත්‍රවල ශුභාරංචි පොත්වල සුවකිරීමට අදාළ ඉගැන්වීම් පිළිබඳ කිසිදු වෙනස් කිරීමක් සඳහන් නොවේ. යැවුම් පත්‍ර ලියන ලද කාලයේ රෝගීන් උදෙසා යාච්ඤා කිරීම පිළිගෙන තිබුණ අතර දිව්‍යමය සුවය මතභේදයට ලක්කරන කිසිම ඉඟියක් හෝ මුල් සභා යුගය තුළ තිබුනේයයි සඳහන්ව නැත.

## සංකීර්ණ කරගැනීම :

දේව වචනයට පටහැනි මනුෂ්‍ය සම්ප්‍රදායන් නිසා බොහෝ දෙනෙක් සුවකිරීම හා මිදීම සංකීර්ණ බවට පත්කරගෙන ඇත. මෙහි එකළොස්වන පරිච්ඡේදය තුළ මෙවැනි සම්ප්‍රදායයන් කිපයක් ගැන ඔබට ඉගෙනගැනීමට හැකිවේ. අන් සමහරෙක් අත්දැකිමෙන් මෙය සංකීර්ණ කරගෙන ඇත. ඔවුන් සුවය උදෙසා යාච්ඤා කර ඇතැම්විට සුවය නොලබා සිටින්නට ඇත. එහෙත් ඔබගේ ඇදහිල්ලේ පදනම අත්දැකිම් මත නොව දෙවියන්වහන්සේගේ වචනය මතය විය යුතුය (අත්දැකීම දේව වචනය සනාථකරන විට පමණක් එය පිළිගත හැකිය). එමෙන්ම සුවය පිළිබඳව ඇති වැරදි ආදර්ශයන් ද මෙම සංකීර්ණ වීමට හේතුවී ඇත. බොහෝ අය පුද්ගලයන් වටා ගොඩනැගුණු සේවයන්, මුදල් සඳහා සුව නිරීම, රුවට්ලිකාර දේවල්, සම්පූර්ණ සුවය වෙනුවට ශාරීරික සුවයට අනවශ්‍ය ලෙස අවධාරණය දෙන සුවකිරීම් දැක තිබෙන්නට හැකිය. සමබරතාවය නොමැතිකමත් සුවකිරීම හා මිදීම සංකීර්ණ බවට පත්කිරීමට හේතුවී ඇත. ඕනෑම සත්‍යයක් අනිකුත් සත්‍යතාවයක් බැහැරකිරීම පිණිස අවධාරණය කරනු ලබන්නේද එය ප්‍රායෝගික වරදක් වේ.

## ප්‍රමාද කිරීම:

සියල්ලටම පිළිතුරු නොමැතිවීම හේතුවෙන් ඇතැම් අය සුවකිරීමේ හා මිදීමේ මෙහෙය ප්‍රමාද කිරීමට හේතුවී තිබේ. ඇතැමෙක් සුවය ලැබීමටත් ඇතැමෙක් සුවය නොලැබීමටත් හේතුව මේ අයට අවබෝධකර ගැනීමට නොහැකි වී ඇත (පරිච්ඡේද 13 හි මේ පිළිබඳව ඔබට අධ්‍යයනය කිරීමට හැකිවේ). ඔබ ගැළවීම ලැබූ අවස්ථාවේ ගැළවීමට අදාළ සියලුදේම තේරුම් නොගෙන අන්අයට සාක්ෂි දැරීම ඔබ විසින් ආරම්භ කළ ආකාරයටම සුවකිරීමේ මෙහෙය ආරම්භ කිරීමටත් සුවකිරීම ගැන සියලු දේම ඔබ දැනසිටීම අත්‍යවශ්‍ය නොවේ.

දෙවියන්වහන්සේගේ සුවකිරීමේ බලය ඔබ මෙහෙකිරීමේදී හා අත්දැකීමේදී ඇතැම් කරුණුවලට පිළිතුරු ඔබට ලබාගැනීමට හැකිවේ. සමහරක් ප්‍රශ්නවලට පිළිතුරු කිසිදාක නොලැබෙනු ඇත. ඔබ සියලු දේ ගැනම කෙසේද? කුමන හේතුවක් නිසාද? යන්න දැන සිටී නම් ඔබට දෙවියන්වහන්සේ අවශ්‍ය නොවනු ඇත. අපගේ දැනුම අඩු බව බයිබලය පවසයි. සුවය නිතරම රෝගයට සහ දුක්පීඩාවට සම්බන්ධව තිබෙන අතර ඒ සෑම දෙයකම අබිරහස් තිබිය හැකිය. ඊට හේතුව නොපනත්කමේ අබිරහස දැනටමත් ක්‍රියා කිරීමය (2 තෙසලෝනික 2:7).

## ක්‍රමානුකුල ඉගැන්වීමක අවශ්‍යතාවය

මේ විෂය පිළිබඳව ක්‍රමානුකුල ඉගැන්වීමක් අවශ්‍ය මන්ද යන කාරණය සුවකිරීම හා මිදීම පිළිබඳ දැනට පවතින ආකල්ප පිළිබඳ සමාලෝචනයෙන් විස්තර කර දෙයි. සුවය පිළිබඳව දේව වචනය උගන්වන්නේ කුමක්ද යන්න නොදන්නාකම නිසා බොහෝ දෙනෙක් ශාරීරිකවත් ආත්මිකවත් විනාශවෙති.

**"මාගේ සෙනඟ දැනගැන්ම නැතිකමෙන් නාස්ති වී සිටිති" (හොෂෙයා 4:6)**

සුවය (සම්පූර්ණත්වය) අපට ව්‍යාප්ත කිරීමට ආඥා කර ඇති දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචියේ කොටසකි (ලූක් 16:15-18). යේසුස්වහන්සේ මනුෂ්‍යයන්ට දේශනාකිරීමට, ඉගැන්වීමට, සුවකිරීමට සහ මිදීම පිණිස අප කැඳවූ සේක. සුවකිරීම සහ මිදීම අත්හැර දැමිය නොහැකිය. එමෙන්ම

ඉගැන්වීම සහ ශුභාරංචිය දේශනා කිරීම යන අංශයන් ඉවත්ව යන ආකාරයට සුවකිරීම හා නිදහස්කිරීම අවධාරණය කිරීම ද නොකළ යුතුය. අපගේ සභාවන් සුවකිරීමේ මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කළ යුතු බව බයිබලය හෙළිදරව් කරයි (ලූක් 14:16-24). මනුෂ්‍යයන් ආපසු හැරීයාමට වඩා ඔවුන් සුවය ලැබීම අප විසින් දැකිය යුතුය.

> **කොර කකුල් අහක්කරනු නොලැබ සුවවෙන පිණිස නුඹලාගේ පාදවලට සමතලා පාරවල් සාදාගනිල්ලා. (හෙබ්‍රෙව් 12:13)**

විනාශ වෙමින් සිටින මැරෙමින් සිටින ලෝකයාට අප විසින් සුවකිරීම හා මිදීම පිළිබඳ ශුභාරංචිය ප්‍රකාශ නොකරන්නේ නම් ඇදහිලිවන්තයන් ලෙස එය අපට පාපයක් වේ.

> **එබැවින් යමෙක් යහපත කරන්ට දැන එය නොකරන්නේ නම්, ඔහුට ඒක පාපයය. (යාකොබ් 4:17)**

ඉහත දැක්වෙන පදයෙන් සුවකිරීම සම්බන්ධයෙන් අපට අදාළ වන්නේ සුවකිරීමේ සේවයට අපට බලය දී එම සේවය සඳහා අප පත්කර තිබෙන බව දැනගැනීම යුතු බවත් ඉන්පසු එසේ නොකර සිටීම අපට පාපයක් වන බවත්ය. සුවය පිළිබඳ මෙහෙයේ නියුක්ත නොවන නායකයන් හට දෙවියන්වහන්සේ ප්‍රබල අනතුරු හැඟවීම් කර තිබේ.

> **මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායෙල්ගේ එඬේරුන්ට විරුද්ධව අනාගතවාක්‍ය කියාපන්න. අනාගතවාක්‍ය කියමින්: ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියනසේකැයි ඔවුන්ට, එනම් එඬේරුන්ට කියාපන්න. තමුන්ම පෝෂ්‍ය කරගන්න ඉශ්‍රායෙල් එඬේරුන්ට දුක්වේ! එඬේරුන් විසින් බැටළුවන් පෝෂ්‍ය කළ යුතු නොවේද?**
> **දුර්වල එවුන් නුඹලා විසින් ශක්තිමත්කළේවත්, ලෙඩවූ එකාට සුවකළේවත්, පොඩිවූ එකාගේ තුවාල බැන්දේවත්, පන්නාදමනු ලැබූ එකා නැවත ගෙනාවේවත්, නැතිවුණු එකා සෙව්වේවත් නැත. බලාත්කාරකමින්ද සැරකමින්ද නුඹලා උන් ආණ්ඩුකළහුය.**
> **මම නැතිවූ එකා සොයන්නෙමි. පන්නාදමනු ලැබූ එකා දෙවනු ගෙනෙන්නෙමි. පොඩිවූ එකාගේ තුවාල බඳින්නෙමි. ලෙඩවූ එකා ශක්තිමත් කරන්නෙමි. නුමුත් මම තරවූ එවුන්ද ශක්තිමත් එවුන්ද නැතිකර, විනිශ්චයෙන් උන් පෝෂ්‍යකරන්නෙමි.**
> **(එසෙකියෙල් 34:2,4,16)**

## හරි ආකල්පයෙන් ආරම්භකිරීම

සුවකිරීම හා මිදීමට අදාළ විෂයට ඔබ යොමුවන විට එය හරි ආකල්පයක් ඇතුව කිරීම වැදගත් වේ. නිරන්තරයෙන්ම ඔබ සිහි තබාගත යුතු කරුණක් නම් ශාරීරික සුවය සෙවීමත් එම සේවයේ යෙදීමත් ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන සිදුකරනු ලබන ආත්මික සමගිකිරීම වන ප්‍රබල භාස්කමට දෙවන බවයි.

මෙම අධ්‍යාපනයට ඔබ ළඟාවීම සමගම මිට කලින් මේ පිළිබඳව ඔබගේ අත්දැකීම් මෙන්ම ඔබ ඉගෙනගෙන තිබූ සම්ප්‍රදායයන් ද නොසලකා හැරිය යුතුවේ. ඔබට උගන්වන්නට පුලුවන් විය හැකි කෙනෙකු බවට පත්විය යුතුය. ඉහළින් ලැබෙන ප්‍රඥාවේ ලක්ෂණයක් නම් හේතු සහගත බවට විවෘතව තිබීමය (යාකොබ් 3:17). ඔබට ඉගැන්වීමට නොහැකි තත්වයකට පත්වීම ඔබ ආත්මිකව අනතුරු තත්වයට පත්කරයි. පූර්ව නිගමනය පිළිබඳ පාපය දෙවියන්වහන්සේ ඔබගේ කුඩා "අව්වුව"ට දමාගැනීම බව මතකයේ තබාගන්න. යෝබ්ගේ මිතුරන් කළේ ඒ ආකාරයේ පාපයකි. පුද්ගලික අත්දැකීමක් මුළු ලෝකයටම අදාළ කරන්නට තැත් කිරීම වැරදිය.

මෙම අධ්‍යයනය ආරම්භයේදීම මේ පිළිබඳව මනුෂ්‍ය සම්ප්‍රදායෙන් හෝ තම නිකාය ආශ්‍රයෙන් කිසිවක් නොඇසූ කෙනෙක් ලෙස අධ්‍යයනයට පිවිසෙන්න. දේව වචනය පවසන දෙය පිළිගන්න. ඔබ සුවය ලබා ඇත යයි දේව වචනය පවසයි නම් එය විශ්වාස කරන්න. රෝගීන් මත අත් තබන්නයයි දේව වචනය පවසන්නේ නම් එසේ කරන්න.

සුවය ලබාගැනීමේ හෝ සුවකිරීමේ මෙහෙයේදී භාවිත කිරීමට ක්‍රම හා විධි සොයාගැනීමේ අරමුණක් ඇතිව මෙම අධ්‍යයනයට නොපිවිසෙන්න. බයිබලය විශේෂිත ක්‍රමවේදයන් හඳුන්වා දී නැත. එහෙත් බොහෝ මූලධර්මයන් හෙළිදරව් කරදී ඇති හෙයින් අප ඒවා සමග ගනුදෙනු කරමු. ක්‍රමවේදයන් සෙවීම වෙනුවට සුවදායකයාණන් ඔබ තුළ සිටින බව තේරුම්ගන්න.

උන්වහන්සේ පිළිබඳ දැනගැන්ම වර්ධනය කරගැනිමටත් උන්වහන්සේ හා සමග ඉතා සමීප සබඳතාවයකතුත් වර්ධනය කරගන්න.

ජේසුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ තුළ වැඩවාසය කරන සේක. සුවය ඔබ බාහිරව අපේක්ෂා කළ යුතු දෙයක් විය යුතු නැත. එහෙත් ඔබ තුළින් නිදහස්කරන දෙයක් බව ඉගෙනගන්න. ඔබ සෙවිය යුත්තේ එම බලය ඔබ තුළින් නිදහස්කිරීමේ මූලික ප්‍රතිපත්තීන් පමණකි.

## සුවකිරීමේ මෙහෙය

සුවකිරීමේ හා මිදීමේ මෙහෙය ඔබ ආරම්භ කිරීමට පෙර ඔබ ජේසුස්වහන්සේගේ සුවකිරීමේ මෙහෙය ආදර්ශයක් ලෙස සත්‍යවශයෙන්ම අනුගමනය කරන්නේ නම් මේ දේවල් අත්දකිනු ඇත.

- ඔබ ස්වාමියෙකුට වඩා සේවකයෙක් වීම (මාක් 10:44).

- ඔබ වස්තුවලින් නොව වෙහෙසවීමෙන් වර්ධනය වන බව (මාක් 6:31, යොහන් 4:6, ක්‍රියා 3:6).

- අන් අයගේ අවිශ්වාසය සමග මුහුණට මුහුණ ගැටීම (මාක් 13:58),

- ආගමික නායකයන්ගෙන් පීඩාවට ඔබ ලක්වනු ඇත (ඔවුන්ගෙන් ඇතැම් අය ඵරිසිවරුන්මෙන් ජීවිතයට වඩා ව්‍යවස්ථාවටත් සම්ප්‍රදායටත් ගරුකරන අය වෙති) (ලූක් 6:6- 9).

- ඔබට ඉතාම සමීපව සිටින අයගේ පීඩාව අත්දකී (මාක් 6:4, මතෙව් 13:58)

- ප්‍රසිද්ධිය සොයන්නෙකුට වඩා එය ප්‍රතික්ෂේප කරන්නෙක් වේ (මාක් 17:36, 8:26, මතෙව් 8:4).

- දෙවියන්වහන්සේගේ බලයෙන් පුද්ගලික ලාභයන් හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභයන් ප්‍රතික්ෂේප කරන්නෙක් වේ (ක්‍රියා 8:18-24).

- තමාගේම මහිමය ප්‍රතික්ෂේප කරන්නෙක් වේ (ක්‍රියා 14:8-18).

## ස්වයං පරීක්ෂණය

1. සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. සුවකිරීම හා මිදීමට ඇති පොදු ප්‍රතිචාරයන් 4 ක් ලියන්න.

3. සුවකිරීමේ මෙහෙය නොකරන නායකයන් සඳහා දී ඇති අවවාද සාරාංශ කර ලියන්න.

4. සුවකිරීම හා මිදීමට අදාළ නියමානුකූල ඉගැන්වීමක අවශ්‍යතාව ඇත්තේ මක්නිසාද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. සුවකිරීම පිළිබඳ ඔබගේ ආකල්ප විභාගකරන්න. ඔබට කුමන අංශයන් අදාළවේදැයි පරීක්ෂාකරන බලන්න.

   - ගණන් නොගෙන සිටිම.
   - ප්‍රතික්ෂේප කිරීම.
   - සම්ප්‍රදායයන්, අත්දැකීම්, වැරදි ආදර්ශයන් සහ සමබරතාවය නොමැතිවීමෙන් සංකීර්ණ කරගැනිම.
   - ප්‍රමාදකිරීම.

2. ඔබේ ආකල්පය නිවැරදි කර ගැනිමේ සැලසුමක් ලියන්න.

___

___

___

___

3. ඔබ ආත්මික නායකයෙක් නම් ඔබ නිතරම සුවකිරීම ගැන දේශනාකරන්නෙක්ද? උගන්වන්නෙක්ද? සුවකිරීමේ මෙහෙයේ නියුක්ත අයෙක්ද? ............ එසේ නැත්නම්, මෙය නිවැරදි කිරීමට ඔබගේ සැලැස්ම ලියන්න.

___

___

___

___

4. ඔබ දැනටමත් සුවකිරීමේ මෙහෙයේ නියුක්තව සිටින අයෙක් නම් ජේසුස්වහන්සේගේ මෙහෙයේ පහත දැක්වෙන අවස්ථා සමග ඔබේ සේවය කෙසේ සංසංදනය කළ හැකිද?

   - ස්වාමියෙක් වීමට වඩා සේවකයෙක් වීම. මාක් 10:44
   - ධනයෙන් පොහොසත්වීමට වඩා වෙහෙසින් වර්ධනය වීම. මාක් 6:31, යොහන් 4:6, ක්‍රියා 3:6.
   - අන් අයගේ නොඇදහිලිකාරකම සමග ක්‍රියාකරන්නෙක්. මාක් 13:58
   - ආගමික නායකයන්ගෙන් පීඩා ලබන්නෙක්. ලූක් 6:6-9
   - තමාට ඉතාම සමීප අයගෙන් පීඩා විඳින්නෙක්. මාක් 6:4, මතෙව් 13:58,
   - ප්‍රසිද්ධිය සොයන්නෙකුට වඩා එය මගහරින්නෙක්. මාක් 17:36, 8:26, මතෙව් 8:4.
   - පුද්ගලික ලාභය හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභයන් දෙවියන්වහන්සේගේ බලයෙන් ලබාගැනිම ප්‍රතික්ෂේප කරන්නෙක්. ක්‍රියා 8:18-24.
   - පුද්ගලික මහිමය ප්‍රතික්ෂේප කරන්නෙක්. ක්‍රියා 14:8-18

5. මෙම පාඩමට අදාළ සුවකිරීමේ පොරොන්දුව අධ්‍යයනය කරන්න.

   **මාගේ පුත්‍රය, මාගේ වචනවලට ඇහුම්කන්දී, මාගේ කිම්වලට නුඹේ කන නමාපන්න. ඒවා නුඹේ ඇස් ඉදිරියෙන් පහ නොවේවා, නුඹේ සිතු තුළ ඒවා තබාගනින්න. මක්නිසාද ඒවා සම්බවන්නන්ට ඒවා ජිවනයත් ඔවුන්ගේ සකල ශරීරයට සුවයත් වේ. සියල්ලටම වඩා නුඹේ සිත ආරක්ෂාකරගනින්න. මක්නිසාද එයින් ජිවනය නික්මෙන්නේය.**
   **(හිතෝපදේශ 4:20-23)**

මේ දේවල් කිරීමට තීරණය කරන්න.

- දේව වචනයට යොමුවන්න.
- ඔබගේ සවන් දේවවචනයට යොමු කරන්න.
- උන්වහන්සේගේ වචනය ඔබේ ඇස් ඉදිරියේ තබාගන්න.
- එය ඔබේ සිත තුළ තබාගන්න.
- ඔබේ සිත උදෙය්ගිමත්ව තබාගන්න.

දේව වචනය ඔබගේ සෞඛ්‍යයට අදාළ වේ. උන්වහන්සේගේ ආඥාවන් නම්:

- එය සම්බවන්නන්ට ඒවා ජීවනයය.
- ඔවුන්ගේ මංශයට සුවයය.

23 වන පදයට අනුව ඔබගේ හදවතින් ජීවනය නික්මවීමට වචනය හේතුවන බව මතක තබාගන්න (ඔබගේ භෞතික ශරීරයේ ජීවන ක්‍රියාවලියට අදාළ බව).

6. නව යුග ව්‍යාපාරයේ (New Age Movement) නැගී ඒමත් සමග සත්‍යවූ දිව්‍යමය සුවයේ මූලාශ්‍රය ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ බව පිළිගැනීම ඉතා වැදගත්වේ. මන්ද මෙම ව්‍යාපාරය තුළ මානුෂික ක්‍රමවේදයන් සහ දේව අභක්තික වූ වෙනත් ආත්මික බලවේගයන්ගේ උපකාරය සොයන බැවින්ය. නව යුගවාදීන් විසින් ශුද්ධ ලියවිලිවලට පටහැනි වූ ආත්මයන්ගේ මගපෙන්වීම්, ස්ඵටික, ශාබ භාවිත වන චාරිත්‍රවලින් ද ශාරීරික සුවය සඳහා යොදාගනිති. ඒ සියලුම ක්‍රමවේදයන් දේව වචනය උල්ලංඝණය කරන බැවින් ප්‍රතික්ෂේප කළ යුතුය.

# දෙවන කොටස

# පහරදීම

පහරදීමක් යනු බලහත්කාරයෙන් සහ ප්‍රචණ්ඩත්වයෙන් කරන්නාවූ පහරදීමකි. මනුෂ්‍යයාගේ ආත්මයට සහ ප්‍රාණයට එරෙහි සාතන්ගේ පහරදීම පාපයයි. භෞතික ශරීරයට ඔහුගේ පහරදීම රෝගයයි.

ඔබගේ ශරීරයට එරෙහිව සාතන්ගේ පහරදීම සාර්ථකව ජයගැනීමට රෝගය කුමක්දැයි ඔබ අවබෝධ කරගත යුතුය. මෙම කොටස තුළ පහත සඳහන් දේ පිළිබඳව ඔබ ඉගෙන ගන්නවා ඇත.

- රෝගයේ මූලාශ්‍රය
- රෝගයට හේතූන්
- රෝග ප්‍රභේදයන්
- රෝගයේ අවසාන ප්‍රතිඵලය

# හතර වන පරිච්ඡේදය

# රෝගයේ මූලාශ්‍රය

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට මේ දේවල් කළ හැකිවනු ඇත.

- සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලිවීම.
- රෝගය සහ මරණය ලෝකයට පිවිසුණු ආකාරය පැහැදිලි කිරීමට.
- රෝගයේ මූලාශ්‍රය හඳුනාගැනීමට.
- රෝගයේ ඇති විනාශකාරී මූලද්‍රව්‍ය හඳුනාගැනීමට.
- රෝගය දෙවියන්වහන්සේ දකින ආකාරය පැහැදිලි කිරීම.
- රෝගයේ හා මරණයේ ශාපයෙන් ඔබ නිදහස්වන්නේ කෙසේදැයි පැහැදිලි කිරීම.

## සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **"ගසක එල්ලෙන සියල්ලෝ ශාපලද්දෝයයි ලියා තිබෙන ලෙස, ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා ශාපයක්වී, ව්‍යවස්ථාවේ ශාපයෙන් අප මුදාගත්සේක"** (ගලාති 3:13)

### හැඳින්වීම

කෙනෙක් රෝගීවීමට බොහෝ හේතූන් තිබුණ ද රෝගයට ඇත්තේ එකම මූලාශ්‍රයකි.
"මෙම කාරණය බොහෝ දෙනා රෝගීවීමට හේතුවේ" යනුවෙන් මෙය පාවුල්තුමා විසින් සනාථ කර ඇත (1 කොරින්ති 11:30). මෙම පරිච්ඡේදය තුළ රෝගයේ මූලාශ්‍රය පිළිබඳව ද පස්වන පරිච්ඡේදය තුළ රෝගයට හේතූන් පිළිබඳව ද සඳහන්වේ.

### රෝගය සහ මරණය ලෝකයට පිවිසි ආකාරය

මනුෂ්‍යයා මැවීම පිළිබඳ ඉතිහාස වාර්තාව උත්පත්ති 1 සහ 2 පරිච්ඡේදවල අඩංගු වේ. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ස්වරූපයෙන් මිනිසා මවා ජීවනයේ හුස්ම ඔහුට දෙන ලද අතර ඔහු ජීවමාන ප්‍රාණයක් බවට පත්විය. මනුෂ්‍යයා මවන ලද්දේ ශරීරය, ප්‍රාණය සහ ආත්මය යන ත්‍රිවිධ කොටස් තුනක් සහිතවය. මිනිසාගේ භෞතික කොටස ශරීරයය. මනුෂ්‍යයාට ක්‍රියාකිරීමට, සිතීමට, දැනීම ලබාගැනීමට හැඟීම්බරව ප්‍රතිචාර දැක්වීමට සහ ආත්මිකව දෙවියන්වහන්සේට ප්‍රතිචාර දැක්වීමට ප්‍රාණය සහ ආත්මය යන ආත්මික කොටස් දෙක උපකාරී වේ. ආරම්භක අවස්ථාවේදී මේ මනුෂ්‍යයාගේ ත්‍රිවිධ කොටසට අයත් සෑම කොටසක්ම අනිත් කොටස් දෙක සමග යහපත් සහජීවනයකින් සම්බන්ධව තිබුණ අතර මෙම මුළු ත්‍රිවිධ ස්වභාවයම දෙවියන්වහන්සේ සමග ද යහපත් සහජීවන සබඳතාවයෙන් බැඳී තිබුණි. මිනිසා පාප රහිතව සිටි අතර ඔහුගේ ශරීරය, ප්‍රාණය, ආත්මය යහපත් සුවයෙන් පසුවිය.

පළමු මිනිසා සහ ස්ත්‍රියවූ ආදම් සහ ඒව දේව වචනයට අකීකරුවීමෙන් දෙවියන්වහන්සේට විරුද්ධව පව්කිරීම උත්පත්ති තුන්වන පරිච්ඡේදයේ වාර්තාගත වේ. ඔවුන්ගේ පාපය සියලු මනුෂ්‍යයන් මත පාපයේත් මරණයේත් ශාපය ගෙනාවේය.

> **"එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණකොටගෙන පාපයත් පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක් මෙන්, සියලු මනුෂ්‍යයන් පව්කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමුණුණේය"** (රෝම 5:12)

මෙම මරණය පිළිබඳ ශාපය මනුෂ්‍යයා සහ දෙවියන්වහන්සේ අතර ආත්මික වෙන්වීමත් මනුෂ්‍යයෙකුගේ ජීවිතය අවසන් කරන ශාරීරික මරණයද විය. ශාපයේ ක්ෂණික ප්‍රතිඵල උත්පත්ති වාර්තාවේ අපට දැකිය හැකිය. මනුෂ්‍යයාගේ පාපය නිසා හටගත් ආත්මික රෝගී ස්වභාවය නිසා

ආදම් සහ ඒව දෙවියන්වහන්සේගෙන් සැඟවුනහ. සබඳතාවයන් බිඳීයාමේ ප්‍රතිඵලයක් ලෙස හැඟීම් තුළ ඇතිවූ රෝගී තත්වයේ ආරම්භය ආදම් ඒවට දොස් තැබීම තුළ හමුවේ. කායින් විසින් ආබෙල් මරාදැමීම සමාජයේ ඇති රෝගී ස්වභාවයට නිදර්ශනයකි. ශාරීරික රෝගී ස්වභාවය සාරාගේ වඳභාවය සහ අබිමෙලෙක් මත පැමිණි වසංගතය යන කරුණු වාර්තාවී තිබීමෙන් සනාථ වේ.

## මූලාශ්‍රය සාතන්ය

මනුෂ්‍යයා මත මරණයේ ශාපය පැමිණ කල තමන්ගේ විනාශකාරී මෙහෙය ආරම්භකරන පිණිස සාතන් මනුෂ්‍ය ශරීරයේ ජාන පද්ධතියට ඇතුළු විය. ලෝකය තුළ පවතින නපුරේ මූලාශ්‍රය සාතන් බව බයිබලය සනාථ කරයි. ඔහු සොරෙකු බවත් මේ කාරණාවලට පැමිණ සිටින බවත් යේසුස්වහන්සේ පැවසූ සේක.

> **සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10:10)**

පාපය ආත්මය විනාශකරන ආකාරයටම රෝගීබව ශරීරය විනාශ කරයි. රෝගී තත්වය කෙනෙකුගේ ප්‍රිතිය, මුදල්, කාලය, උත්සාහය සහ ශක්තිය සොරකම් කරයි. එය සැබවින්ම මරයි, විනාශකරයි. ශරීරයට අනතුරු ගෙනෙන "හදිසි අනතුරු" සාතන්ගේ විනාශකාරී කාරකයන්ය. පරීක්ෂාවන්ටත් පාපයටත් ඔබ විරුද්ධව සිටින ආකාරයෙන්ම රෝගයේ මූලාශ්‍රය සාතන් බැවින් එයටත් විරුද්ධව ඔබ සිටිය යුතුය. ඔබ පරීක්ෂාවටත් පාපයටත් විරුද්ධව සිටින විට ඔබේ ආත්මයටත් ප්‍රාණයටත් විරුද්ධව සාතන්ගේ පහරදීමට එරෙහිව ආත්මික සටනෙහි ඔබ නියුක්ත වන්නේය. එමෙන්ම රෝගයට විරුද්ධව ඔබ සිටින විට ශරීරයට විරුද්ධව සාතන්ගේ පහරදීමට එරෙහි ආත්මික සටනෙහි නියුක්ත වන්නේය.

## රෝගයේ විනාශකාරී කාරකයන්

ජීවී විෂබීජයක් කරණකොටගෙන සෑම රෝගයක්ම හටගනී. ඔබගේ ආත්මය ශරීරයට ජීවනය සපයන ආකාරයටම විනාශකාරී රෝග කාරකයන් සාතන් විසින් සපයනු ලබයි. ස්වාභාවික ලෝකයේ දෙවියන්වහන්සේ ජීවමාන එක සෛලයක් රැගෙන එය ප්‍රගුණකර නව ජීවයක් හටගැනීමට සලස්වා එයින් නව දරුවෙකුගේ උපත සිදුකරන සේක. සාතන් විසින් මෙම ශුභවාදී ක්‍රියාවලිය ඔහුගේම අශුභවාදී ක්‍රියාවලියක් මාර්ගයෙන් ව්‍යාජානුකරණයක් කරනු ලබයි. ඔහු (වෛරස්, පිලිකා ආදී) ජීවමාන සෛලයක් ප්‍රගුණකර එමගින් මරණය බිහි කරයි. ඔබ රෝගීවූ විට ඔබගේ ශරීරය තුළ ක්‍රියාකරන "දුර්වලකමේ ආත්මය" මෙයයි. දුර්වලකමේ ආත්මය ශරීරයෙන් දුරු කළ විට රෝගය මරණයට පත්වෙයි. එම විෂබීජය ඔබගේ ශරීරය තුළ තිබෙනතාක් රෝගය ශරීරය තුළ ජීවත්වෙමින් තම විනාශකාරී ක්‍රියාවලිය සිදුකරයි.

සෑම රෝගයක්ම සාතන්ගේ යක්ෂ ආත්මයක සෘජු පහරදීමක් නොවන නමුත් රෝගකාරකයන් ලෝකය තුළ තිබීමට හේතුව සාතන්ය. නිදසුනක් ලෙස අධික ශිත කාලගුණයක පාවහන් නොපැළඳ ගමන් කිරීම නිසා ඔබට සෙම්ප්‍රතිශ්‍යාව වැළඳේ. මෙය යක්ෂාත්මයක සෘජු පහරදීමක් නොවන නමුත් සෙම්ප්‍රතිශ්‍යාව ඇතිකරන රෝගකාරකයන් ලෝකයේ පවතින්නේ සාතන් නිසාය (ඔබ විසින් සාමාන්‍ය දැනීම භාවිත කළ යුතුව තිබුණි. මේ පිළිබඳව වැඩි විස්තර 20 වන පරිච්ඡේදයේ ඇත).

## රෝගය දෙවියන්වහන්සේ දකින්නේ කෙසේද?

රෝගය දෙවියන්වහන්සේ දකින ආකාරය ඔබ තේරුම්ගතහොත් ඔබ එහි මූලාශ්‍රය ගැන කිසිම සැකයක් ඇතිකර නොගනී. දෙවියන්වහන්සේ රෝගය හඳුන්වන්නේ බන්ධනයක් ලෙසින්ය.

> **"තවද යෝබ් තමාගේ මිත්‍රයන් උදෙසා යාච්ඤාකළ විට ස්වාමින්වහන්සේ ඔහුගේ වහල්කම පහකොට, පෙර තිබුණු සියල්ලට වඩා දෙගුණයක් වැඩිකොට ඔහුට දුන්සේක".**
> **(යෝබ් 42:10)**

යේසුස්වහන්සේ පැමිණියේ බැඳුම් නිදහස්කිරීම දේශනාකිරීම පිණිසය.

**"ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය, මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේපකළ සේක. වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරනට ද, මඩනාලද්දවුන් නිදහස්කර හරින්ට ද" (ලූක් 4:18)**

යේසුස්වහන්සේ රෝගය හැඳින්වූයේ බන්ධනයක් ලෙසින්ය.

**"එසේ නම්, දසඅට අවුරුද්දක් මුළුල්ලෙහි සාතන් විසින් බැඳ සිටි, ආබ්‍රහම්ගේ දුවෙක්වූ මේ ස්ත්‍රිය ඒ බැම්මෙන් සබත් දවසේදී මුදන්ට යුතුව තිබුණා නොවේදැයි කීසේක". (ලූක් 13:16)**

යේසුස්වහන්සේ පැමිණියේ සත්‍යයෙන් සෙනඟ නිදහස් කිරීමටය.

**"නුඹලා සැබෑව දැනගන්නවා ඇත. සැබෑවද නුඹලා නිදහස් කරන්නේයයි කීසේක" (යොහන් 8:32)**

සත්‍යය නම් යේසුස්වහන්සේ රෝගය දැක්කේ පීඩාවට පත්කිරීමක් ලෙසවූ අතර උන්වහන්සේ පීඩාවට පත්වූවන් සුවකළ සේක.

**"දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ ආලේපකළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරන ලද සියල්ලන් සුවකරමින්ද හැසුරුණු බවත්ය" (ක්‍රියා 10:38).**

මරණය සතුරෙක් ලෙස බයිබලය හඳුන්වයි.

**"නැතිකරනු ලබන්නාවූ අන්තිම සතුරා නම් මරණයය," (1 කොරින්ති 15:26)**

රෝගිබව ඉතා අප්‍රසන්න දෙයක් ලෙස හඳුන්වා ඇත.

**"මක්නිසාද මාගේ තුනටිය දැවිල්ලෙන් පිරී තිබේ. මාගේ මාංසයෙහි කිසි නිරෝගිබවක් නැත" (ගීතාවලිය 38:7)**

එසේම එය නපුරක් ආකාරයෙන් ද දැක ඇත.

**"නපුරු ලෙඩක් මොහුට වැළඳී තිබේ. ඔත්පළව ඉන්න මොහු ආයෙත් නොනැගිටින්නේයයි කියති" (ගීතාවලිය 41:8)**

දෙවියන්වහන්සේ වසංගතයක් හෝ රෝගයක් එවූ බවට බයිබලයේ සමහරක් පද ඇත. දෙවියන්වහන්සේ එවැනි නපුරු දේවල්වල ආරම්භකයා නොවන අතර සතුරා මත විනිශ්චය ක්‍රියාත්මක කර තම අභිප්‍රාය සම්පූර්ණ කරන පිණිස ඒවා භාවිත කරන සේක.

## ශාපයෙන් නිදහස් කිරීම

රෝගය සහ මරණය පාපයේ ශාපයක් ලෙස ඔබ මෙම පාඩම තුළ ඉගෙනගෙන තිබුණ ද "ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා ශාපයක් වී, ව්‍යවස්ථාවේ ශාපයෙන් අප මුදාගත්සේක" යි ගලාති 3:13 ප්‍රකාශ කරයි. යේසුස්වහන්සේ කුරුසිය මත මැරුණ අවස්ථාවේ, උන්වහන්සේ තමන්වහන්සේ මත පාපයේ ශාපය සහ මරණය ගත් බව සඳහන් වේ.

**"එබැවින් එක වරදක් කරණකොටගෙන දඬුවමට පත්කිරීම පිණිස විනිශ්චය සියලුම මනුෂ්‍යයන් කෙරෙහි පැමුණුණාක්මෙන්ම, එක ධර්මිෂ්ඨ ක්‍රියාවක් කරණකොටගෙන ජීවනයේ ධර්මිෂ්ඨකිරීම පිණිස දීමනාව සියලු මනුෂ්‍යයන් කෙරෙහි වුයේය. මක්නිසාද එක මනුෂ්‍යයාගේ අකීකරුකම කරණකොටගෙන බොහෝදෙනා පව්කාරයන් කරනු ලැබුවා සේම, එක්කෙනාගේ කීකරුකම කරණකොටගෙන බොහෝදෙනා ධර්මිෂ්ඨකරනු ලබන්නෝය." (රෝම 5:18-19)**

කල්වරියේ කුරුසිය මත යේසුස්වහන්සේ කරන ලද පාපයට වන්දි ගෙවීමේ පූජාවේ ප්‍රතිඵලයන් දෙකක් ලෙස ගැළවීම සහ සුවකිරීම පවතී. තමන්වහන්සේගේ මරණය නැවත නැගිටීම තුළින් ඔබ

වෙනුවෙන් යේසුස්වහන්සේ පාපයේ ශාපය සහ මරණය දරාගත් සේක. උන්වහන්සේ ඔබගේ පාපයේ දඬුවම දරාගත් බැවින් ඔබ එය දැරිය යුතු නැත. උන්වහන්සේ ඔබගේ රෝගය දරාගත් බැවින් ඔබ එය දැරිය යුතු නැත. උන්වහන්සේ නැවත නැගිටීමෙන් නැගිටුණු බැවින් ඔබත් නැවත නැගිටින්නේය. සාතන් පැමිණියේ මරන්ට සොරකම්කරන්ට සහ විනාශකරන්ට නමුත් යේසුස්වහන්සේ පැවසුවේ . . .

> **සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10:10)**

ඔබගේ ගැළවුම්කරුවාණන් ලෙස ඔබ යේසුස්වහන්සේ පිළිගන්නා විට පාපයේ ශාපය බිඳී යන්නේය. පාපයේ සහ රෝගයේ පහරදීම්වලට යටත්වූ මරණීය ශරීරයක ඔබ ජීවත්වුවත් ඔබ තවදුරටත් ශාපය නිසා විනාශයට පත්වන්නේ නැත. යේසුස්වහන්සේ ව්‍යවස්ථාවේ ශාපයෙන් ඔබ මුදවා ඇත. ඔබගේ ජීවිතයට පැමිණෙන රෝගයක (හෝ වෙන යම් දෙයක) මූලාශ්‍රය පිළිබඳව ප්‍රශ්නයක් ඔබට මතුවන විට "එය මරණය, සොරාගැනීම හෝ විනාශය ගෙනදේද?"යි ඔබගෙන්ම අසන්න. එසේනම් එහි මූලාශ්‍රය සාතන්ය. "එය මට අධික ජීවනය ගෙන ජීවිතයක් ලබා දෙන්නේද?" එසේනම් එහි මූලාශ්‍රය දෙවියන්වහන්සේය. එමෙන්ම මෙය මතකයේ තබාගන්න.

> **"සැම යහපත් දීමද සැම සම්පූර්ණ දීමනාවද කිසි වෙනස්වීමක්වත් හැරීමේ ඡායාවක්වත් නැත්තාවූ ආලෝකවල පියාණන්වහන්සේ කෙරෙන් ඉහළින් බැස එන්නේය" (යාකොබ් 1:17)**

ඔබගෙන්ම මෙසේ අසන්න. "මේ වේදනාව යහපත් හා සම්පූර්ණවූ ත්‍යාගයක්ද?" ඔබට අවංකව "ඔව්" යයි පිළිතුරු දීම අපහසුනම් දේව වචනය පවසන දෙය පිළිගන්න. . . රෝගය දෙවියන්වහන්සේගෙන් නොවේ.

## ස්වයං පරීක්ෂණය

1. සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. මරණය සහ රෝගය ලෝකයට ඇතුළු වූයේ කෙසේද?

3. රෝගයේ මූලාශ්‍රය කවුද?

4. දෙවියන්වහන්සේ රෝගය දකින්නේ කෙසේද?

5. රෝගයේ ඇති විනාශකාරී මුලද්‍රව්‍යයන් පිළිබඳව ඔබ මේ පාඩමෙන් ඉගෙනගත්තේ මොනවාද?

6. රෝගයේ සහ මරණයේ ශාපයන්ගෙන් ඔබට නිදහස්විය හැක්කේ කෙසේද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. රෝගය පිළිබඳව ඔබගේ ආකල්පය. ඒ පිළිබඳ දෙවියන්වහන්සේගේ ආකල්පයේ සමානත්වයට ගෙන අවොත් ඔබ රෝගය දකින්නේ කෙසේද?

____________________________________________________________

____________________________________________________________

2. දුක්වේදනාවේ මූලාශ්‍රය දෙවියන්වහන්සේ නොවන නමුත් උන්වහන්සේ තම අභිප්‍රායයන් ඉටුකරගැනීම පිණිස සමහර අවස්ථාවන්හිදි එය භාවිත කරන සේක. මෙය විස්තර කරන පහත දැක්වෙන නිදසුන් අධ්‍යයනය කරන්න.

| | |
|---|---|
| - ඊජිප්තුවේ වසංගත | නික්මයාම 7-11 |
| - මිරියම්ගේ කුෂ්ඨ රෝගය | ගණන්කථාව 12:10 |
| - ජෙහෝරාම් රජුගේ අසනීපය | 2 ලේකම් 21:18 |
| - ගෙහාසිගේ කුෂ්ඨය | 2 රාජාවලිය 5:27 |
| - දාවිත්ගේ දරුවාගේ මරණය | 2 සාමුවෙල් 12:18 |
| - ඒලිගේ පුත්‍රයන්ගේ මරණය | 1 සාමුවෙල් 2:34 |
| - යෝබ්ගේ දුක්විඳීම | යෝබ් පොත |
| - යෝසෙප්ට පැමිණි අවාසනාවන්ත සිද්ධීන් | උත්පත්ති 45:5-7 |
| - යේසුස්වහන්සේගේ කුරුසිපත් කිරීම | මාක්14:35-36,රෝම 5:6-12 |
| - පාවුල් සිරගත කිරීම | පිලිප්පි 1:12, 19 |
| - පාවුල්ගේ මාංශයේ කටුව | 2 කොරින්ති 12:7 |

3. ඔබ දුක්වේදනා වින්ද අවස්ථාවක් ගැන සිතන්න. එය දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ මහිමය උදෙසා භාවිත කළේ කෙසේද?

____________________________________________________________

____________________________________________________________

4. ඔබට දැනට තිබෙන දුක්වේදනාවේ මූලාශ්‍රය දෙවියන්වහන්සේ නොවන නමුත් එය දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා භාවිත කළ හැක්කේ කෙසේදැයි ඔබ සිතන්නේද? මේ ගැන යාච්ඤා කරන්න.

____________________________________________________________

____________________________________________________________

5. දුක්වේදනා විඳින තව කෙනෙක් දිරිමත් කිරීම පිණිස මෙම පාඩමේ ඔබ ඉගෙනගත් කුමන දේ භාවිත කළ හැකිද? ඊළඟ පාඩමට ඔබ පිවිසීමට කලින් ඔවුන් සමග එය බෙදාගන්න.

____________________________________________________________

6. ඔබගේ රෝගයක් පිළිබඳව හෝ ඔබ මෙහෙකරන අන් අයෙකුගේ රෝගයක් පිළිබඳව හෝ පහත දැක්වෙන ප්‍රශ්න අසන්න.

   - එය මරණය, සොරාගැනීම හෝ විනාශය ඇතිකරයිද? එසේනම් එහි මූලාශ්‍රය සාතන්ය (යොහන් 10:10)

- එය ඔබට අධික ජීවනය ඇතිව ජීවත්වීමට උපකාර කරන්නේද? එසේනම් එහි මූලාශ්‍රය දෙවියන්වහන්සේය (යොහන් 10:10)

- එය යහපත්වූත් සම්පූර්ණවූත් ත්‍යාගයක්ද? එසේ නොවේ නම් එය දෙවියන්වහන්සේගෙන් පැමිණි දෙයක් නොවේ. (යාකොබ් 1:17)

7. රෝගයේ හා මරණයේ ශාපයෙන් ඔබ මුදනු ලැබ ඇති බව ඔබ විශ්වාසකරන්නේද? . . . එසේ නොමැති නම් නැවතත් මෙම පරිච්ඡේදය හදාරන්න.

# පස්වන පරිච්ඡේදය

# රෝගයට හේතූන්

## අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලිවීම.
- රෝගයට හේතුවන කරුණු පහක් හඳුනාගැනිම.
- ආත්මික ව්‍යවස්ථාව කඩකිරීම නිසා රෝගය හටගන්නා ආකාරය විස්තර කිරීම.
- සාතනික ක්‍රියාවේ ප්‍රතිඵලක් ලෙස රෝගය ඇතිවන ආකාරය විස්තර කිරීම.
- දෙවියන්වහන්සේගේ ස්වභාවික නීතිය කඩකිරීම නිසා රෝගය ඇතිවන ආකාරය විස්තර කිරීම.
- ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නිසි ලෙස නොවිමසීම නිසා රෝගය හටගන්නා අකාරය විස්තර කිරීම.
- ආත්මය ආරක්ෂාකරගැනීම පිණිස මාංශය විනාශ කිරීමට ඇති බයිබලීය මගපෙන්වීම සාකච්ජා කිරීම.

## සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **මට විපත්ති පැමිණෙන්ට පළමුවෙන් මුළාව ගියෙමි. නුමුත් දැන් ඔබගේ වචනය පවත්වමි.**
> **ඔබගේ පනත් ඉගෙනගන්නා පිණිස මට විපත්ති පැමුණුණා යහපති.**
> **ඔබගේ නියෝග කිසිකලක සිහි නැති නොකරන්නෙමි. මක්නිසාද ඔබ එයින් මා ප්‍රාණවත් කළ සේක. (ගීතාවලිය 119:67, 71, 93)**

## හැඳින්වීම

රෝගයට ඇත්තේ එකම මූලාශ්‍රයකි. ඒ සාතන්ය. එහෙත් ඔබ මත රෝගය පැමිණීමට ඇති හේතූන් විවිධ වේ. රෝගය ඇතිවීමට හේතු සමහරක් මෙහි දක්වා ඇත.

## ආත්මික ව්‍යවස්ථාවන් කඩකිරීම

මනුෂ්‍යයා පව් කළ විට ශරීරය විනාශ කිරීමේ කාර්යය මරණය විසින් ආරම්භ කරන ලදී.

> **එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණකොටගෙන පාපයත් පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක් මෙන්, සියලු මනුෂ්‍යයන් පව්කළ බැවින් සියල්ලක් කෙරෙහි මරණයද පැමුණුණේය. (රෝම 5:12)**
>
> **මක්නිසාද පාපයේ කුළි නම් මරණයය. . . . (රෝම 6:23)**

රෝගය පාපයේ ප්‍රතිඵලයකි. එහෙත් කෙනෙකුගේ රෝගය ඔවුන්ගේ පුද්ගලික පාපය නිසා සැමවිටම ඇති නොවේ. උත්පත්තියේ සිටම අන්ධව සිටි මනුෂ්‍යයා පිළිබඳ නිදසුනෙන් යේසුස්වහන්සේ මේ බව පැහැදිලි කළ සේක (යොහන් 9:1-3). දෙවියන්වහන්සේ රෝගයෙන් පාපයට දඬුවම් කරන සේක් නම් සෑම පව්කරුවෙක් හා පව්කරන කිතුනුවෙකුත් රෝගී විය යුතුය. පාපය සමග සබඳතාවයන් රෝගයට ඇති බව සත්‍යයක් නමුත් ඔබ මේ සත්‍යතාවය පුද්ගලයන්ට අදාළ කිරීමේදී ප්‍රවේසම් විය යුතුය. රෝගීන් නොසලකා හැර තමාගේ බලරහිත බව හේතු සහිත බවට පත්කිරීමට මෙය නිදහසට කරුණක් ලෙස පහසුවෙන් භාවිත කළ හැකිය.

කෙනෙකුගේ පාපය හෝ නොඇදහිලිවන්තභාවය ඔහුගේ රෝගයට හේතුව ලෙස පෙන්වා දීම සඳහා ශුද්ධ ලියවිල්ල භාවිතා කිරීම ශුද්ධ ලියවිල්ල වැරදි ආකාරයට අදාළ කරගැනීමක් වේ.

ඔබ දේව නීතිය කඩකළ විට ඔබ දුක්වේදනාවට පත්වීම සත්‍යයකි. එය ඔබගේම පාපකාරී ක්‍රියාවලට ඔබ දුක්වේදනා විඳීමය. පව්කාරයාට එය විනිශ්චයයි. ඇදහිලිවන්තයාට එය දඬුවමකි. එහෙත් ඔබ දේව නීතිය පවත්වන්නෙක් වුවත් ඔබ පාපයෙන් පිරි ලෝකයක ජීවත්වන නිසා ඔබට දුක්වේදනා විඳීමට සිදුවිය හැකිය. ලෝකයේ පවතින පාපය හේතුවෙන් ධර්මිෂ්ඨ මෙන්ම අධර්මිෂ්ඨ අය ද දුක්වේදනා විඳිති.

තමාගේම පාපකාරී දුරාචාරී හැසිරීම නිසා ඒඩ්ස් රෝගයට ලක්වූ කෙනෙක් තමාගේම පුද්ගලික පාපය නිසා දුක්විඳින කෙනෙකුට නිදසුනකි. රුධිරය ශරීර ගත කරගැනීමකදී එමගින් ඒඩ්ස් රෝගයට ගොදුරු වන කෙනෙක් පාපය ලෝකයේ පැවතීම නිසා දුක්විඳීමට පත්වන කෙනෙකුට නිදසුනකි.

කෙනෙකුගේ පුද්ගලික පාපය රෝගයට හේතුව බව ස්ථිර කිරීමට සාධක සමහරක් බයිබලයේ ඇත. අපවිත්‍රතාවය (පාපය) නිසා දුර්වලකම් ඇතිවිය හැකි බව රෝම 6:19 සනාථ කරයි. ඔබ ආත්මික ව්‍යවස්ථාව කඩකරන විට ද්විතීය කථාවේ 28 පරිච්ඡේදයේ සඳහන් ශාපය තුළ ඔබ ගමන් කරයි (මාක් 2:1-12, යොහන් 5:1-11, 14, යාකොබ් 5:14-16 සහ ගීතාවලිය 38:3,7 බලන්න). සාමූහික පාපය හේතුවෙන්ද රෝගය ඇතිවිය හැකිය (ක්‍රියා 5:1-11 සහ 1 කොරින්ති 11:27-32 බලන්න).

පාපයට ආපසු හැරීයාමෙන් සුවය නැතිවිය හැකිය.

> **ඉන්පසු යේසුස්වහන්සේ දේවමාලිගාවේදී ඔහු දැක, බලාපන්න, නුඹ සුවය ලැබුවෙහිය. නුඹට මීට වඩා නරකක් සිදු නොවන පිණිස, තවත් පව් නොකරන්නැයි කීසේක. (යොහන් 5:14)**

## ස්වභාවික නීතීන් කඩකිරීම

දෙවියන්වහන්සේගේ ස්වභාවික නීතිය කඩ කළ විට ඇතැම් රෝග හටගනී. නිදසුන් කීපයක් පහත දැක්වේ.

- නුසුදුසු ආහාර (ශරීරය බර වැඩිවීම, අඩුවීම).
- අධික වෙහෙසවීම, දැරීමට අපහසු ක්‍රියාකාරී බව.
- විවේකය නිසිලෙස නොගැනීම.
- කෝපය, තිත්තකම වැනි හානිකර හැඟීම් ඇති කරවන ආත්ම පාලනය නොමැතිකම.
- අන් අය සමග යහපත් සබඳතා නොමැතිවීම (තිත්තකමේ හා සමාව නොදීම වැනි).
- ව්‍යායාමය (උවමනාවට වැඩි හෝ අඩු)
- මත්ද්‍රව්‍ය හෝ මත්පැන් භාවිතය. ශරීරය තුළට විෂ රසායනික ද්‍රව්‍ය ඇතුලත්කර ගැනීම.
- ගුරුත්වාකර්ෂණය වැනි ස්වභාවික නීතීන් කැඩීම (නිදසුනක් ලෙස ගොඩනැගිල්ලකින් බිමට පැනීමෙන් තුවාල සිදුකර ගැනීම).
- හිතාමතාම අනතුරුදායක ක්‍රියාකාරකම්වල නිරතවීමෙන් සහ ආරක්ෂක උපකරණ භාවිතය ප්‍රතික්ෂේප කරමින් අන්තරායකට පත්වීමේ අවදානමකට ඔබවම පත්කර ගැනීම. (ඔබේ වාහනයේ ආරක්ෂක පටි භාවිතා නොකිරීම, වැඩපලක් තුළ ආරක්ෂක කණ්ණාඩි භාවිත නොකිරීම, ඉදිකිරීම් ස්ථානයක ආරක්ෂක හිස්වැසුම් නොපැළඳීම වැනි දේ)

## සාතනික පහරදීම්

ඇතැම්විට රෝගය සාතන්ගේ ඍජු පහරදීමක් ලෙස ඇතිවිය හැකිය. මේ සඳහා යෝබ් නිදසුනකි (යෝබ් 1 හා 2 බලන්න). යෝබ් සාතනික පහරදීම් නිසා ශාරීරික, මානසික හා හැඟීම්මය රෝගී තත්වයට පත්විය. ඔහු දුක්වේදනා වින්දේ ඔහුගේම පුද්ගලික පාපය නිසා නොවේ. යෝබ් පිළිබඳ දෙවියන්වහන්සේගේම සාක්ෂිය වූයේ ඔහු ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකු බවටය.

ආත්මික මිනිසාට සාතන්ගේ පහරදීම පාපයයි. ස්වභාවික මනුෂ්‍යයාට ඔහුගේ පහරදීම රෝගයයි. නව ගිවිසුම් සමයේත් වර්තමාන කාලයේත්, ධර්මිෂ්ඨයාට වැඩි හරියක් සාතනික පහරදීම්වලට මුහුන දීමට සිදුවන්නේ සාතන් සමග සටනක් ධර්මිෂ්ඨයාට ඇති බැවින්ය. ඕනෑම යුද්ධයකදී තුවාල වන අය සිටිනවා ඇත.

ඔබේ ප්‍රාණයට හා ආත්මයට පහරදෙන ආකාරයෙන්ම සාතන් ඔබගේ ශරීරයට ද පහර දේ. ඔබගේ මනස, ශරීරය සහ "මාංශික" පැරණි මනුෂ්‍යයා යන මාර්ග කරණකොටගෙන (ඇසේ

තෘෂ්ණාව, මාංශයේ තෘෂ්ණාව, ජීවිතයේ අහංකාරකම, ලෝකය සහ ඔබගේ ඉන්ද්‍රියයන්) පහරදීම සිදුකරයි. සාතන් ආත්මිකව ඔබට පහරදෙන ආකාරයෙන්ම ශාරීරිකවත් පහරදෙන නමුත් ඔබේ ප්‍රාණයේ හා ආත්මයේ විසීමට අයිතිවාසිකමක් නැතිවා සේම භෞතික ශරීරයේ වාසයකිරීමට තරම් අයිතිවාසිකමක්ද ඔහුට නැත. සාතනික බලවේගයන් ඇදහිලිවන්තයෙකුගේ ශරීරයේ ක්‍රියා කිරීම ගරිල්ලා යුද්ධයකට සමාන කළ හැකිය. එම ප්‍රදේශයේ ක්‍රියාකිරීමට ඔවුන්ට නීතිමය අයිතියක් නැති නමුත් එහි ක්‍රියාකිරීමට කෙසේ හෝ ඉඩක් සොයා ගනිති. මේ ලෝකයේ පාපය නිතරම පවතින ආකාරයෙන් රෝගයද පවතින නමුත් ආත්මික යුද්ධයේදී පාපය හා සටන්කරන ආකාරයෙන්ම රෝගය හා සටන්කිරීම ද කළ හැකිය.

## ක්‍රිස්තු ශරීරය නිසි ලෙස නොවිමසීම

ක්‍රිස්තු ශරීරය නිසියාකාර නොවිමසා රාත්‍රි භෝජනයට පංගුකාරවන නිසා බොහෝදෙනෙක් දුර්වලව රෝගීව සිටින බව පාවුල්තුමා පවසා ඇත. රාත්‍රි භෝජනය නම් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයටත් රුධිරයටත් අඩයාලම් කරන රොටි සහ මිදියුසවලට පංගුකාර වීමය. පාවුල්තුමා මෙසේ අවවාද කළේය.

> **එහෙයින් නුසුදුසු ලෙස මේ රොටි කන්නාවූ නොහොත් ස්වාමින්වහන්සේගේ කුසලානෙන් බොන්නාවූ කවරෙකු නුමුත්, ස්වාමින්වහන්සේගේ ශරීරය ගැනත් ලේ ගැනත් වරදකාරයෙක් වන්නේය. නුමුත් එක් එක්කෙනා තම තමාම සෝදිසිකොට, ඒ රොටි කැවාවේ, ඒ කුසලානෙන් බිව්වාවේ, මක්නිසාද කන්නාවූ බොන්නාවූ තැනැත්තේ ශරීරය නොවිමසනවානම්, ඔහු තමාටම දඬුවම පැමිණෙන ලෙස කන්නේය. බොන්නේය. ඉන්නිසා නුඹලා අතරේ බොහෝ දෙනෙක් දුර්වලව ලෙඩව සිටිති, බොහෝ දෙනෙක්ද නින්දට පත්වෙති. (1 කොරින්ති 11:27-30)**

ක්‍රිස්තු ශරීරය නොවිමසීම ඔබට තුන් ආකාරයකින් කළ හැකිවේ.

### මාංශය හා රුධිරය යන්නෙහි අර්ථය :

මිදියුස හා රොටිවල අර්ථය ඔබ තේරුම් නොගන්නා විට ක්‍රිස්තුශරීරය විමසීමට ඔබ අපොහොසත් වේ. මෙම ස්වභාවික ද්‍රව්‍යයන් යේසුස්වහන්සේගේ රුධිරයේත් මාංශයේත් ආත්මික අඩයාලම් වේ. පාපය පහකිරීම පිණිස ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයේ වැදගත්කම බොහෝ දෙනෙකු තේරුම්ගන්නා නමුත් බොහෝවිට ඒ අය ක්‍රිස්තු ශරීරයේ නියම අර්ථය තේරුම් නොගනී. ඔබගේ සුවය පිණිස ක්‍රිස්තු ශරීරය කඩන ලදී (යොහන් 6:48-58 සහ ලූක් 6:48-51 බලන්න).

### ශරීරය තුළ භේදය :

ක්‍රිස්තුස්වහන්සේ තුළ සහෝදර සහෝදරියන් ලෙස අප අතර තිබිය යුතු සත්‍යවූ බැඳීම හඳුනා නොගැනීම නිසා ඇතැම්විට අප ක්‍රිස්තු ශරීරය විමසීමට අපොහොසත් වේ. සභාව තුළ බෙදීම් ඇතිවන විට අප ක්‍රිස්තු ශරීරය නිසි ලෙස විමසීම නොකරයි. අප ක්‍රිස්තුස්වහන්සේ තුළ සහෝදර සහෝදරියන් ලෙස අපගේ ආත්මික ඒකත්වය තේරුම් නොගන්නේ නම් අප නුසුදුසු ලෙස කන්නේය, බොන්නේය. භේදයන්ට පංගුකාරවන මාංශික කිතුනුවන්ට ඔවුන්ගේ මාංශික සම්භවය නිසා වචනයේ පංගුකාරකමක් නොමැති බව 1 කොරින්ති 3:1-13 දක්වා පාවුල්තුමා පැහැදිලි කරයි.

### නුසුදුසු ලෙස කෑම

අප ජීවිතය නොවිමසා රාත්‍රි භෝජනයට පංගුකාරවන විට අප නුසුදුසු ලෙස කන්නේය. මෙසේ කිරීම දුර්වලකමේ සහ රෝගී තත්වයකට හේතුවේ. රාත්‍රි භෝජනයට පංගුකාරවීමට කලින් ඔබව ආත්මිකව විමසා පසුතැවිලිව සහභාගිවන ලෙස පාවුල්තුමා පවසා ඇත්තේ මේ නිසාය.

### ආත්මයේ ගැළවීම පිණිස මාංශය විනාශ කිරීම

හික්මවීමේ හේතුන් උදෙසා මාංශය විනාශකිරීම පිණිස සාතන්ට භාරදීම ඇතැම් අය උදෙසා දෙවියන්වහන්සේ අවසර දී ඇත. දෙවියන්වහන්සේ රෝගය කෙනෙකු මත නොඑවන නමුත් එයට

ඉඩදීම සිදුකරන සේක. 1 කොරින්ති 5:1-7 දක්වා මේ ක්‍රියාවලිය ගැන ඔබට කියවා බැලිය හැකිය. මේ කොටස තුළ බයිබලය පහත දැක්වෙන කරුණු හෙළිදරව් කරයි.

**එය සිදු කළ යුත්තේ කෙසේද?** එය කළ යුත්තේ . . .

1. ඒකත්වයෙන්ම
2. ස්වාමින්වහන්සේගේ ආත්මයෙන් හා බලයෙන්
3. ස්වාමින්වහන්සේගේ නාමයෙන්

**එය සිදු කළ යුත්තේ ඇයි?** මේ හේතු නිසා එසේ කළ යුතුය.

1. වේශ්‍යාකම
2. හැසිරීම ලෝකයේ අයටත් වඩා නරකවීම
3. උඩඟුකම
4. පසුතැවිලි නොවීම
5. දේව සෙනඟ අතරේ නපුරක්ව සිටීම

**එහි පරමාර්ථයන් :** පුද්ගලික : ආත්මය ගැළවෙන පිණිස මාංශය විනාශ කිරීම.
සාමූහික : අන් අයට බලපෑමට කලින් නපුර බැහැරකිරීම.

## ස්වයං පරීක්ෂණය

1. සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

_______________________________________________

_______________________________________________

2. මේ පාඩම තුළ රෝගයට හේතූන් ලෙස දක්වා ඇති කරුණු පහ මොනවාද?

________________ ________________ ________________ ________________

________________

3. ආත්මික නිතීන් කඩකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රෝගය හටගත හැක්කේ කෙසේද?

_______________________________________________

4. සාතනික ක්‍රියාවන්ගෙන් රෝගය ඇති විය හැක්කේ කෙසේද?

_______________________________________________

5. දෙවියන්වහන්සේගේ ස්වභාවික නිතීන් කඩකිරීමෙන් රෝගය ඇතිවිය හැක්කේ කෙසේද?

_______________________________________________

6. ක්‍රිස්තු ශරීරය නිසි ලෙස නොවිමසීමෙන් රෝගය ඇති විය හැක්කේ කෙසේද?

_______________________________________________

7. ආත්මය ගැළවෙන පිණිස මාංශය විනාශයට භාරදීමට අදාළ බයිබලිය මගපෙන්වීම විග්‍රහ කරන්න.

එය සිදුකළ යුත්තේ කෙසේද? ______________________
එසේ කළ යුත්තේ ඇයි? ______________________
එසේ කිරීමේ පරමාර්ථය මොනවාද? ______________________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. ඔබගේ රෝගයට හේතුව හෝ ඔබ සේවය කරන කෙනෙකුගේ රෝගයට හේතුව සිතාබලන්න. එය කුමන පහත හේතුවක් නිසාද?

   - ආත්මික නිතීන් කඩකිරීම නිසාද?
   - දෙවියන්වහන්සේ තබා ඇති ස්වභාවික නිති කඩකිරීම නිසාද?
   - සාතනික පහරදීමක් නිසාද?
   - ක්‍රිස්තු ශරීරය නිසි ලෙස නොවිමසීම නිසාද?
   - ආත්මය ගැළවෙන පිණිස මාංශය විනාශ කිරීමද?

2. හික්මවීමේ ප්‍රතිඵලයක් ලෙස ඔබ රෝගිව (කවදා හෝ රෝගිව) සිටිද? ඔබ කළ යුත්තේ කුමක්ද? (හෝ කළ යුතුව තිබුණේ කුමක්ද?) යාකොබ් 5:14- 16 ට අනුව.

________________________________________

________________________________________

3. ඔබගේ හෝ ඔබ සේවය කරන කෙනෙකුගේ රෝගය ස්වභාවික නිතිය කඩකිරීම නිසා නම් එය නිවැරදි කිරීමට කළ හැක්කේ කුමක්ද?

________________________________________

________________________________________

4. ඔබගේ රෝගය හෝ ඔබ සේවය කරන යම් කෙනෙකුගේ රෝගය ආත්මීන නීතිය කඩකිරීම හේතුකොටගෙන නම් 1 යොහන් 1:8-9 අනුව පාප කියාදී පසුතැවිලිවන්න. නැතහොත් එසේ කිරීමට උපදෙස් දෙන්න.

________________________________________

________________________________________

5. ඔබ හෝ ඔබ සේවය කරන යම් කෙනෙක් ක්‍රිස්තු ශරීරය අනිසි ලෙස විමසා ඇත්ද? එසේ නම් පසුතැවිලිව දෙවියන්වහන්සේගෙන් සමාව අයදින්න. ඉන්පසු ශරීර සුවය පිළිබඳව යාච්ඤා කරන්න.

________________________________________

________________________________________

6. ඔබගේ රෝගය හෝ ඔබ සේවය කරන යම් කෙනෙකුගේ රෝගය යක්ෂාත්ම හේතුකොටගෙන සිදුවී ඇතැයි ඔබ විශ්වාස කරන්නේ නම් දුර්වලකමේ ආත්මය බැඳ යාච්ඤාවෙන් ශුද්ධාත්මයාණන් වහන්සේගේ සුවකිරීමේ බලය මුදාහරින්න.

________________________________________

________________________________________

7. මේ පාඩමට අදාළ සුවකිරීමේ පොරොන්දුව අධ්‍යයනය කරන්න.

   **මට විපත්ති පැමිණෙන්ට පළමුවෙන් මුළාව ගියෙමි. නුමුත් දැන් ඔබගේ වචනය පවත්වමි. ඔබගේ පනත් ඉගෙනගන්නා පිණිස මට විපත්ති පැමුණුණා යහපති.**

**ඔබගේ නියෝග කිසිකලක සිහි නැති නොකරන්නෙමි. මක්නිසාද ඔබ එයින් මා ප්‍රාණවත් කළ සේක. (ගීතාවලිය 119:67, 71, 93)**

ආත්මීක නීතිය කඩකිරීම නිසා පීඩාවට දාවිත් ලක්වූ බව මේ පදවලින් හෙළිවේ. මේ අත්දැකීමෙන් ඔහු උගත් පාඩම කුමක්ද? ඔහුගේ ස්වභාවයට සුවය ගෙන දුන්නේ කුමක්ද? දාවිත් උගත් දේ ඔබේ ජීවිතයට කෙසේ අදාළ කරගත හැකිද?

# හයවන පරිච්ඡේදය

# රෝග වර්ගයන්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරිමට හැකිවනු ඇත.

- සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලිවීමට
- ප්‍රධාන රෝග වර්ගයන් පහක් ලයිස්තුගත කිරීමට
- ආත්මික රෝගය නිර්වචනය කිරීමට
- භෞතික (ශාරීරික) රෝගය නිර්වචනය කිරීමට
- මානසික රෝගය නිර්වචනය කිරීමට
- හැඟීම් සම්බන්ධ රෝගය නිර්වචනය කිරීමට
- යක්ෂාත්ම හේතුවෙන් ඇතිවන තත්වයන් නිර්වචනය කිරීමට

**සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:**

> **ස්වාමිනි, මම මැලවී සිටිමි. එබැවින් මට කරුණාකළ මැනව. ස්වාමිනි මාගේ ඇට වලිතව තිබේ. එබැවින් මා සුවකළ මැනව. මාගේ ආත්මයද අතිශයින් කැලඹී තිබේ. ස්වාමිනි, ඔබ ප්‍රමාදවන්නේ කොපමණකල්ද?**
> **ස්වාමින්වහන්සේ මාගේ කන්නලව්ව ඇසුසේක. ස්වාමින්වහන්සේ මාගේ යාච්ඤාව පිළිගන්නා සේක. (ගීතාවලිය 6:2-3, 9)**

## හැඳින්වීම

අප "රෝගය හෝ ලෙඩ" ගැන කතාකරන කල දෙවියන්වහන්සේ විසින් මවන ලද නියමයට වෙනස්වූ ඕනෑම ආත්මික, මානසික, හැඟීම්මය හෝ ශාරීරික ස්වභාවයක් අදහස් කරයි. රෝග පස් වැදෑරුම් වේ. ඒවා නම්,

## ආත්මික රෝගිබව

ආත්මික රෝගය නම් පාපයයි. ඒ සමග නිසි ලෙස ගනුදෙනු නොකළ හොත් පාපය අපව විනාශ කළ හැකිය. වෛද්‍ය විද්‍යාවට හෝ ස්වභාවික සුවයට මේ පිළිබඳව කළ හැකි කිසිවක් නැත. සියල්ලෝම පව්කර ඇති බැවින් ආත්මික රෝගිබව සියලුදෙනාටම බලපා තිබේ. ආත්මික රෝගයට සුවය පැමිණෙන්නේ පසුතැවිලිවීමෙන්, පාපයට කමාව ලබාගැනිමෙන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනිමෙන්ය.

## ශාරීරික රෝගය

ශාරීරික රෝගය වෛද්‍යවරුන් විසින් පරීක්ෂණය කර හඳුනාගත හැකි ඉන්ද්‍රියමය විකෘතිතාවයන් නිසා ඇතිවිය හැකිය. ඉන්ද්‍රිය විකෘති භාවයන්හිදී නියමානුකූල සැකැස්ම හෝ ශරීර පටලයන් යම් ආකාරයකින් පළුදුවී තිබීම සිදුවේ. එමෙන්ම ඉන්ද්‍රියයක හෝ ශරීරයේ කොටසක අවිධිමත් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයන් ලෙස ශාරීරික රෝග ඇතිවිය හැකිය. ශරීරයේ එක් කොටසක ප්‍රශ්නය සම්පූර්ණ ශරීරයේ ක්‍රියාකාරිත්වය අවිධිමත් කරන විවිධ තත්වයන් ඇතිකරයි. හෘදය රෝග, අධික රුධිර පීඩනය, දියවැඩියාව, ආමාශයේ තුවාල සහ අසාත්මික ප්‍රතිචාරයන් (Allergies) මේ අතර පොදු වේ. මනුෂ්‍ය ශරීරයේ ඇති අනුබද්ධ ස්වභාවය නිසා එක් කොටසක රෝගී ස්වභාවයක් මුළු ශරීරයටම බලපෑම් ඇති කරයි. මෙයින් තේරුම්ගත යුත්තේ අත්හිටුවීමට ක්‍රියා නොකළ ක්‍රියාකාරිත්වයේ රෝගයක් ඉන්ද්‍රියමය රෝගයක් බවට පත්විය හැකි බවය.

## හැඟීම්මය රෝගය

හැඟීම්මය රෝග හානිකර හැඟීම් වන කෝපය, වෛරය, තිත්කතම ආදී හැඟීම් හේතුකොටගෙන ඇතිවේ. සුවය පැමිණෙන්නේ තිරස් සහ සිරස් සමාවදීමෙන් හා ලබාගැනීම කරණකොටගෙනය. පාපකාරී හැඟීම්වලට දෙවියන්වහන්සේගෙන් සමාව ලබාගැනීමෙන් සිරස් සමාව ලබාගැනීම සිදුවේ. ඔබ පසුතැවිලි වන විට මෙම අභ්‍යන්තර තත්වයන් දෙවියන්වහන්සේ සුවකරන සේක. ඔබට වරද කළ අයට ඔබ සමාව දෙන විට තිරස් සුවය හා සමාව ඔබට ලැබේ. ඇතැම් අය මෙය “අභ්‍යන්තර සුවය” වශයෙන් වැරදි ලෙස භාවිත කරයි. අභ්‍යන්තර සුවය යන වචනය බයිබලයේ උගන්වන්නේ නැති අත්දැකීම් ද අවධාරණය කිරීමට සමහරුන් භාවිත කරයි.

## මානසික රෝගය

දුර්වල මානසික සෞඛ්‍ය තත්වයන් ඇතිකරන මන්දනය, රෝගීබව, හදිසි අනතුරු, බිඳවැටීම්, උත්පත්තියෙන් ඇතිවන දුබලකම් සහ ඍජුව යක්ෂාත්මවල බලපෑමක් නොමැති මනෝවිද්‍යාත්මක තත්වයන් නිසා මානසික රෝග ඇතිවේ.

## යක්ෂාත්ම කරණකොටගෙන ඇතිවන තත්වයන්

යක්ෂාත්ම කරණකොටගෙන ඇතිවන තත්වයන්ට ආවේශවීම, යක්ෂයා බාහිරයෙන් සිට ඇති කරන පීඩන, සිතෙහි ඇතිවන තද අදහස් සහ යක්ෂාත්ම හේතුකොටගෙන ඇතිවන මානසික සහ ශාරීරික තත්වයන් බලපායි. යක්ෂාත්ම නිසා ඇතිවන තත්වයන් සුවකිරීම පිණිස මිදීම වශයෙන් හඳුන්වන විශේෂ සුවකිරීමේ ක්‍රමයක් අවශ්‍ය වේ. මිදීම හා සුවකිරීම යන දෙක අතර සබඳතාවයක් ඇති නමුත් ශුද්ධ ලියවිල්ල මේ දෙක අතර වෙනසක් පෙන්වා දෙයි.

> **එකල උන්වහන්සේ දොළොස් දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී. දෙවියන්වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශකරන්ටත් රෝගීන් සුවකරන්ටත් ඔවුන් යැවූ සේක. (ලූක් 9:1-2)**

මෙම පාඩමාලාවේ හයවන කොටසෙහි යක්ෂාත්ම කරණකොටගෙන ඇතිවන තත්වයන් පිළිබඳ වඩා ඉගෙනගැනීමට හැකිවනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. රෝග වර්ගයන්ගේ මූලික වර්ග පහ මොනවාද?

3. ආත්මික රෝගය කුමක්ද?

4. ශාරීරික රෝගය කුමක්ද?

5. හැඟීම්මය රෝගය කුමක්ද?

6. මානසික රෝගය කුමක්ද?

7. යක්ෂාත්ම කරණකොටගෙන ඇතිවන තත්වයන් කවරේද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. ඔබගේම හෝ ඔබ සේවය කරන අයෙකුගේ රෝගී තත්වයන් පිළිබඳව යාච්ඤා පූර්වක විශ්ලේෂණයක් කරන්න. ඔබ ගනුදෙනු කරන්නේ කුමන වර්ගයේ රෝගයක් සමගද? එය
   - ආත්මීකද?
   - ශාරීරිකද?
   - මානසිකද?
   - හැඟීම්මයද?
   - යක්ෂාත්ම හේතුකොට ගෙනද?

2. ඔබ එසේ විශ්වාස කිරිමට හේතු ලියන්න.

ආත්මීක රෝගය:

________________________________________

________________________________________

ශාරීරික රෝගය :

________________________________________

________________________________________

මානසික රෝගය:

________________________________________

________________________________________

හැඟීම්මය රෝගය:

________________________________________

________________________________________

යක්ෂාත්ම කරණකොටගෙන ඇතිවන තත්වයන් :

________________________________________

________________________________________

3. මනුෂ්‍ය ශරීරයේ ඇති ආනුබද්ධිත ස්වරූපය නිසා එක ශරීර කොටසක රෝගීබව මුළු ශරීරයටම බලපානු ඇත. මෙම ස්වභාවය ඔබගේම හෝ ඔබ සේවය කරන අයෙකුගේ රෝගී තත්වයක් පිළිබඳව සත්‍යවන්නේ කෙසේදැයි බලන්න.

ශාරීරික තත්වය ආත්ම, හැඟීම් සහ මානසිකව කෙසේ බලපාන්නේද?

________________________________________

ආත්මීක තත්වය ශරීර, හැඟීම්මය හා මානසිකව කෙසේ බලපාන්නේද?

________________________________________

හැඟීම්මය තත්වය ශරීර, මානසික සහ ආත්මිකව කෙසේ බලපාන්නේද?

---

මානසික තත්වය ශරීර, ආත්ම සහ හැඟීම්මයව කෙසේ බලපාන්නේද?

---

4. ගීතාවලිය 6 හි හමුවන මෙම පාඩමට අදාළ සුවකිරීමේ පොරොන්දුව අධ්‍යයනය කරන්න.

**ස්වාමිනි, මම මැලවී සිටිමි. එබැවින් මට කරුණාකළ මැනව. ස්වාමිනි මාගේ ඇට වලිතව තිබේ. එබැවින් මා සුවකළ මැනව. මාගේ ආත්මයද අතිශයින් කැලඹී තිබේ. ස්වාමිනි, ඔබ ප්‍රමාදවන්නේ කොපමණකල්ද?**
**ස්වාමින්වහන්සේ මාගේ කන්නලව්ව ඇසූසේක. ස්වාමින්වහන්සේ මාගේ යාච්ඤාව පිළිගන්නා සේක.**
**(ගීතාවලිය 6:2,3 සහ 9)**

**දෙවන පදයෙන්** ශාරීරික තත්වය හඟවා දෙයි මාගේ ඇට වලිතව තිබේ. **තුන්වන පදයෙන්** ආත්මික තත්වය හඟවා දෙයි මාගේ ආත්මයද අතිශයින් කැලඹී තිබේ. **තුන්වන පදයෙන්** ගිතිකාකරුට සුවය සඳහා බලා සිටිය යුතු බව කියවේ. ස්වාමිනි, ඔබ ප්‍රමාදවන්නේ කොපමණකල්ද? (ඔබ කවදා හෝ සුවයට අදාළව මෙම ප්‍රශ්නය අසා තිබේද?) **නවවන පදයෙන්** දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල පෙන්වා දෙයි. ස්වාමින්වහන්සේ මාගේ කන්නලව්ව ඇසූසේක. ("අසනු ලැබීය" යන්න අතිත කාලය ගනී) මාගේ යාච්ඤාව පිළිගන්නා සේක. ("අසන්නේය" යන්න අනාගත කාලයට අයත්ය) සුවය පිළිබඳව ඔහුගේ යාච්ඤාව අසා ඇති නමුත් එය ප්‍රකාශවීම අනාගතයට අයත් වේ.

# සත්වන පරිච්ඡේදය

# රෝගයේ අවසාන ප්‍රතිඵලය

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවකිරීම පිළිබඳ පොරොන්දුව මතකයෙන් ලිවීමට
- රෝගයේ අවසාන ප්‍රතිඵල දෙක හඳුනාගැනීමට
- මරණයේ වර්ග දෙක හඳුනාගැනීමට

## සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි. නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමින්වහන්සේ කියන සේක. (යෙරමියා 29:11)**

### හැඳින්වීම

රෝගයක අවසාන ප්‍රතිඵල ලෙස සිදුවිය හැකි කාරණා ඇත්තේ දෙකකි. එය දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා නැතහොත් එම රෝගය මරණය උදෙසා වේ. මේ අවස්ථා දෙකෙහිදීම දෙවියන්වහන්සේ මෙසේ පොරොන්දු වී ඇත.

> **මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි. නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමින්වහන්සේ කියන සේක. (යෙරමියා 29:11)**

### දෙවියන්වහන්සේගේ මහිමය පිණිසවූ රෝගය

දෙවියන්වහන්සේගේ මහිමය සඳහා රෝගයකදී එම තැනැත්තා තමන්ගේ ජීවිත සාක්ෂිය තුළින්, ජීවිතය තුළින් හෝ සේවය තුළින් දෙවියන්වහන්සේ මහිමයට පත්කරයි. උත්පත්තියෙන් අන්ධව සිටි මනුෂ්‍යයෙකු පිළිබඳ කථාන්තරය යොහන් නමවන පරිච්ඡේදයේ ඔබට කියවිය හැකිය.

> **යේසුස්වහන්සේ උත්තරදෙමින්: දෙවියන්වහන්සේගේ ක්‍රියා මොහු කෙරෙහි ප්‍රකාශවන පිණිස මිස මොහුවත් මොහුගේ මව්පියන්වත් පව්කළ නිසා නොවේ. (යොහන් 9:3)**

අන්ධ මනුෂ්‍යයා සුවය ලැබූ පසු ඔහුගේ සාක්ෂිය තුළින් දෙවියන්වහන්සේ මහිමය ලැබූ සේක. සියලුම නියමානුකුල සුවයන් උදෙසා සැමවිටම දෙවියන්වහන්සේ මහිමය ලැබිය යුතුය (මෙහි “නියමානුකුල” යන්නෙන් අදහස් කෙරෙන්නේ සාතන් විසින් ඇති කරන ලද සුවයක් නොවන අවස්ථා ගැනය).

## ස්වභාවික සුවය :

දිව්‍යමය සුවය සඳහා දෙවියන්වහන්සේ ගෞරවය ලබන නමුත් ශරීරයේ ක්‍රියාකාරීත්වය කරණකොටගෙන ඇතිවන ස්වභාවික සුවය පිළිබඳව ද උන්වහන්සේ ගෞරවය ලැබිය යුතුය. දෙවියන්වහන්සේ ශරීරය මැවූ අතර ස්වභාවික ශරීර ක්‍රියාකාරීත්වයන් කරණකොටගෙන උන්වහන්සේ තමන්වහන්සේගේ ස්වභාවයත් බලයත් ප්‍රකාශකරන සේක.

**වෛද්‍ය සුවය :**

වෛද්‍යමය කරුණු අනුසාරයෙන් සිදුවන සුවය පිළිබඳව ද දෙවියන්වහන්සේ ප්‍රශංසාව ලැබිය යුතුය. සෑම යහපත් දීමනාවක්ම ලැබෙන්නේ දෙවියන්වහන්සේගෙන් බව බයිබලය පවසයි (යාකොබ් 1:17). මේ සියල්ලට ඖෂධ, විටමින් වර්ග සහ ඔබේ ශරීරයට ප්‍රතිලාභ ගෙනදෙන අන් සියලු දේ ඇතුලත් වේ. බොහෝ ඖෂධ පැමිණෙන්නේ දෙවියන්වහන්සේ විසින් මවන ලද පැලෑටි හා ද්‍රව්‍යවල අඩංගු ස්වභාවික ද්‍රව්‍යවලින් බව මතක් කර ගත යුතු වේ.

**ක්ෂණිකවූ සහ ප්‍රමාදවූ සුවය :**

ඇතැම්විට රෝගියෙක් ක්ෂණිකව සුවය ලබයි. එහෙත් වෙනත් අවස්ථාවල සුවය ප්‍රමාදවී හෝ ක්‍රමානුකූලව පසුකාලයක සුවවීම සිදුවේ. මෙම නිදසුන් සලකා බලන්න.

- යොහන්ගේ උත්පත්තිය තෙක් සෙකරියා සුවය නොලැබීය (ලූක් 1:20)

- දෙවියන්වහන්සේගේ සම්පූර්ණ කාලය පැමිණෙන තෙක් හන්නාට දරුවෙක් නොලැබුණේය (1 සාමුවෙල් 1:5-19)

- ආබ්‍රහම්ට ඇදහිල්ල තිබුණත්, දෙවියන්වහන්සේගේ කාලය පැමිණෙන තෙක් ආබ්‍රහම්ට සහ සාරාට දරුවෙක් ලබාගැනීමට නොහැකි විය (හෙබ්‍රෙව් 11:11).

ක්ෂණිකව හෝ ක්‍රමානුකූලව සිදුවූවත් සියලුම සුවයන් සඳහා දෙවියන්වහන්සේ මහිමය ලැබිය යුතුය.

## මරණය සඳහාවූ රෝගය

යොහන් 11:4 ලාසරස්ගේ රෝගය මරණය උදෙසා නොවන බව යේසුස්වහන්සේ පැවසූ සේක. එයින් ගම්‍ය වන්නේ මරණය උදෙසාද රෝග තිබෙන බවයි. සුවයේ අවසාන එල්ලය අමරණීයභාවය නොවේ. බෙහෙත්වලින් ලබන සුවයට වඩා වැඩි දෙයක් දිව්‍යමය සුවයෙන් සිදු නොකෙරේ. ලාසරස් ඇතුළුව යේසුස්වහන්සේ විසින් මළවුන්ගෙන් නැගිටුවන ලද අන් සියලු දෙනා ද කල්ගතවීමෙන් සාමාන්‍ය මරණයට පත්වූහ.

බයිබලයේ මරණයේ ආකාර දෙකක් සඳහන් කර තිබේ. අකාල මරණයක් සිදුවන්නේ යම් පුද්ගලයෙකුගේ ආත්මය ගැළවෙන පිණිස මාංශය විනාශයට භාරදුන් අවස්ථාවලදීය (1 කොරින්ති 5:4-5). මේ පිළිබඳව ඔබ පරිච්ඡේද පහ තුළ ඉගෙනගත්තේය.

බයිබලයේ සඳහන්වන දෙවන ආකාරයේ මරණය කලින් නියමකරන ලද මරණයයි. සෑම මනුෂ්‍යයෙකුටම මරණය සඳහා කලින් නියමකරන ලද වේලාවක් ඇත (හෙබ්‍රෙව් 9:2, දේශනාකාරයා 3:2). බොහෝ සුවකිරීමේ හාස්කම්කළ දෙවියන්වහන්සේගේ ප්‍රබල ප්‍රෝපේතවරයෙක්වූ එලිෂා ද මරණයට පත්වන රෝගයකට ලක්විය (2 රාජාවලිය 13:14). ඔබගේ නියම කරන ලද මරණ වේලාවේදී රෝගයක් නොවැලදී හුස්ම ගැනීම නතර කිරීමෙන් මරණයට පත්වීම සිදුවිය හැකිය.

> **ඔබගේ මුහුණ සඟවන කල උන් කැළඹෙති. ඔබ උන්ගේ හුස්ම පැහැරගන්න කල උන් නැසී, දූවිල්ලට හැරීයෙති. (ගීතාවලිය 104:29)**

මහලු වයසටපත් කෙනෙක් ලෙස වයසේ බලපෑමක් මෝසෙස්ට නොතිබුණේය. මහලු බව සහ වයස්ගතවීම යොෂුවා අත්වින්දේය. දෙවියන්වහන්සේ එක් අයෙක් අධිස්වභාවිකව ආරක්ෂාකළ අතර අනික් කෙනා ස්වභාවික වයස්ගතවීම අත්දුටුවේය. ඔවුන්ගේ ආත්මික ස්වභාවය මෙම වෙනසට කිසිදු බලපෑමක් සිදු නොවීය. ඔවුන් දෙදෙනාම බලවත් ආත්මික නායකයන් විය. ඔබගේ ශරීරය වයසට යාමේ ස්වභාවික ක්‍රියාවලිය අනුව යටත්කර, රෝගයකින් මරණයට පත්වූවත්, ඔබව අධිස්වභාවික ලෙස ආරක්ෂාකරනු ලැබූවත් ඔබව ජීවත්කරන්නේ දෙවියන්වහන්සේම වන සේක.

අප බොහෝවිට කරන වරදක් නම් සදාකාලය අමතක කර කාලය පිළිබඳ සීමාවන්ගෙන් බැඳී ජීවත්වීමය. ඇදහිලිවන්තයෙක් ලෙස ඔබ මෙහි ජීවත්වූවත් මරණින් එහා ජීවත්වූවත් ඔබ

සදාකාලයේ ජිවත්වන අයෙකු වෙයි. ඇදහිලිවන්තයෙක් මැරෙන විට සදාකාල සීමාවන් අනුව සලකන විට එය ඔහුගේ අවසාන සුවය ලෙස ගණන්ගත හැකිවේ.

මතකතබාගන්න. ඔබට සුවය අත් දැකිය හැකිය. ඇතැම් අයට මරණින් මෙහා එය අත්දැකිය හැකි වෙයි. දෙවියන්වහන්සේ ඔබව රෝගයෙන් නැගිටුවා ඔබගේ සාක්ෂියෙන්, ජිවිතයෙන් හෝ සේවයෙන් දෙවියන්වහන්සේ මහිමයට පත්කරනු ඇත.

අනෙකුත් අය මරණය තුළින් ගමන් කරන අතර අවසාන සුවය ලබාගනිති. ඉන්පසු පූර්ණාකාරයෙන්ම ස්වාමින්වහන්සේගේ අභිමුඛයේ ශරීරය, ප්‍රාණය සහ ආත්මය වශයෙන් සම්පූර්ණත්වයට පත්වෙති.

## ස්වයං පරීක්ෂණය

1. සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. රෝගයේ දෙආකාර අවසාන ප්‍රතිඵලයන් මොනවාද?

3. ශුද්ධ ලියවිල්ලේ හඳුනාගෙන ඇති මරණ වර්ග දෙක මොනවාද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. ඔබට හෝ ඔබ සේවය කරන කෙනෙකුගේ රෝගයක් සුව කළ නොහැකි රෝගයක් ලෙස සලකන්නේ නම් මේ රෝගය "මරණය සඳහා වූ රෝගයක්" බව හෝ "දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා" වුවක්ද යන්න එළිදරව් කළ හැක්කේ දෙවියන්වහන්සේට පමණකි. යම් රෝගයක් මරණය උදෙසා වූ දෙයක් ද යන්න දෙවියන්වහන්සේ එළිදරව් කර නැත්නම් දේව කැමැත්තේ ප්‍රකාරයට සුවය සඳහා දිගටම යාච්ඤා කරන්න.

2. දිව්‍යමය සුවය දෙවියන්වහන්සේගෙන් මෙන්ම වෛද්‍ය විද්‍යාව අනුව සහ ස්වභාවිකව සිදුවන සුවයන්ද දෙවියන්වහන්සේගෙන් වේ. ප්‍රශ්නය මතුවන්නේ මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ සුවයේ මූලාශ්‍රය බව තේරුම් නොගෙන බෙහෙත්වලට සහ වෛද්‍යවරුන්ට ගෞරවය දෙන බැවින්ය. ඉශ්‍රායෙල් පිළිබඳව දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක.

   **... එහෙත් ඔවුන්ට සුව කළේ මා බව ඔව්හු නොදැන සිටියෝය. (හොෂියා 11:3)**

   ආසා රජතුමා මරණයට පත්වූයේ ඔහු වෛද්‍ය උපදේශය පමණක් සෙවූ නිසාය. ඔහු ඔහුගේ ආත්මික තත්වය නොසලකා හැර ඔහුගේ අවශ්‍යතාවයේදී ස්වාමින්වහන්සේ වෙතට හැරුණේ නැත (2 ලේකම් 16:12).

3. ඖෂධ භාවිතයෙන්, වෛද්‍යවරුන්ගෙන් හෝ ස්වභාවික ශරීර ක්‍රියාවලියෙන් ඔබගේ රෝගයක් සුවවූ අවස්ථාවක් ඔබට මතක්කරගත හැකිද? ඔබ මේ සුවය උදෙසා දෙවියන්වහන්සේට ස්තුති කළාද? ________________ එසේ කළේ නැත්නම් දැන් කරන්න.

4. ඔබ හෝ ඔබ සේවය කරන කෙනෙක් සුවය ලැබූ විට එම සුවය දෙවියන්වහන්සේට ගෞරවය ලැබෙන ලෙස ඔබ භාවිත කරන්නේ කෙසේද?

________________________________________________________________________

________________________________________________________________________

5. ඔබගේ රෝගය මරණය උදෙසා බවත් එය ඔබගේ ශරීරය මරණයට පත්වීමට නියමකරන ලද කාලයක් නම් ඔබ දැනටමත් සදාකාල සීමාවන්හි වාසය කරන බව මතක තබාගන්න. ඔබට සුවය ලැබෙනු ඇත. ඔබ පූර්ණ සුවය සමග රජතුමාගේ අභිමුඛයට ඇතුළු වනවා ඇත.

# තෙවන කොටස

# ප්‍රතිප්‍රහාරය

පසුගිය කොටසින් භෞතික ශරීරය කෙරෙහි සතුරාගේ පහරදීම පිළිබඳව ඔබ ඉගෙනගත් බොහෝ කරුණුවලට රෝගයක මූලාශ්‍රය, හේතූන්, වර්ග සහ අවසාන ප්‍රතිඵල ආදිය ඇතුළත් විය.

මෙම කොටස තුළින් භෞතික ශරීරයට විරුද්ධව සාතන් සහ ඔහුගේ බලගැටුමට විරුද්ධව ප්‍රතිප්‍රහාරය ආරම්භ කිරීම පිළිබඳව ඉගෙන ගන්නවා ඇත. ප්‍රතිප්‍රහාරයන් යනු සතුරාගේ ප්‍රහාරය පරාජය කිරීමට සැලසුම් කරන ප්‍රතිචාරයන්ය.

භෞතික ශරීරයට එරෙහිව සාතන්ගේ පහරදීමට ප්‍රතිචාරයන් දැක්වීමට ඔබ විසින් මෙම කරුණු අවබෝධ කරගත යුතුය.

- සුවයේ බයිබලීය පදනම
- සුවයේ පරමාර්ථය
- සුවකිරීමේ දීමනාවන්

මෙම පාඩමෙහි භාවිත කරුණු මේවාය.

## අටවෙනි පරිච්ඡේදය

# සුවකිරීමේ බයිබලීය පදනම

### අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරිමට හැකිවනු ඇත.

- සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලිවීම
- නව ගිවිසුමේ සඳහන් වපුරන්නාගේ උපමාව සුවකිරීමට අදාළ වන්නේ කෙසේදැයි විග්‍රහ කිරීම.
- නව ගිවිසුමේ සඳහන් සුවකිරීමට අදාළ ඉගැන්වීම සාරාංශ කිරීම.
- නව ගිවිසුමේ සඳහන් සුවකිරීම පිළිබඳ ඉගැන්වීම යේසුස්වහන්සේගේ සහ මුල් සභාවේ උදාහරණ මගින් සාරාංශ කිරීම.
- සුවකිරීම යේසුස්වහන්සේගේ සමගිකිරීමේ ප්‍රතිලාභයක් ලෙස හඳුනාගැනිම
- සුවකිරීමට සහ මිදිමට අදාළව මහා ආඥාව සාරාංශ කිරීම.
- සියලුම ඇදහිලිවතුන් සුවකිරීමේ සහ මිදිමේ සේවයේ නියුක්ත විය යුතු බව සනාථ කරන බයිබලීය උපුටන දැක්වීම.
- සුවකිරීමට අදාළ දේව රාජ්‍යයට ඇතුල්වීමේ යතුරු 3 ක් හඳුනාගැනිම.

### සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> ***නුමුත් උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය. පොඩිකරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය. අපට සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට පැමුණුණේය. උන්වහන්සේගේ පහරවලින් අපට සුවය ලැබී තිබේ. (යෙසායා 53:5)***

### හැඳින්වීම

සුවකිරීම සහ මිදිම පිළිබඳ ඇදහිල්ලේ ගමනට මේ පාඩමත් සමග ඔබ පිවිසෙනු ඇත. මෙම ගමනට ඔබ සතු ගමන් බලපත්‍රය බයිබලය වේ. සාමාන්‍ය ලෝකයේ ගමන් බලපත්‍රයකින් ඔබගේ පුරවැසිභාවය සනාථකර ඔබේ ජාතින් විසින් ඔබට ලබාදෙන වරප්‍රසාද ස්ථිර කරදෙයි.

ආත්මික ගමන් බලපත්‍රයන් ලෙස දේව වචනය දේව රාජ්‍යයේ ඔබගේ පුරවැසිභාවය සනාථ කරයි. දිව්‍යමය සුවය සහ මිදිමේ වරප්‍රසාද ඇතුළුව නව උත්පත්තිය ලැබූ ඇදහිලිවන්තයෙක් ලෙස ඔබගේ පුරවැසිභාවයට ඇතුළත් වරප්‍රසාදයන් දේව වචනය ඔබට සනාථ කර දෙයි.

### සුවකිරීම සහ දේවවචනය

මතෙව් 13:3-8, 18-23, මාර්ක් 4:3-8, 14-20 සහ ලූක් 8:5-8, 10-15 දක්වා සඳහන් වපුරන්නාගේ උපමාව කියවන්න. මෙම උපමාවේ “බීජය” දෙවියන්වහන්සේගේ වචනය ලෙස යේසුස්වහන්සේ විග්‍රහ කරයි. ස්වභාවික ලෝකයේ බීජයක් තුළ ජීවයක් ඇති කිරීමට අවශ්‍ය හැකියාව ඒ තුළම ගැබ්ව ඇති නමුත් එය පැලකර එයට සාත්තුකරන තුරු එය බලය නොමැතිව පවතී.

මේ කාරණය ආත්මික ලෝකයේද ඒ ආකාරම වේ. ආත්මික ජීවනය ඇතිකිරීමේ හැකියාව දේව වචනය නමැති බීජය තුළ පවතී. සුවය පිළිබද දේව වචනය නමැති බීජයට මිදිම ගෙන ආ හැකිය. එහෙත් සුවකිරීමේ වචනය ඔබේ ජිවිතය තුළ වපුරන තුරු ඔබ වැපිරීමක් නොමැතිව කපා ගැනිමකට උත්සාහ කරනු ඇත. ඔබ වැපිරීමක් නොකර ඔබට කැපීමක් කරගත නොහැකිය. සුවකිරීම සහ මිදිම පිළිබඳ බයිබලීය ඉගැන්වීමේ පදනම ඔබ අධ්‍යයනය කළ යුත්තේ මේ නිසාය. කපාගැනිමට අදාළ අස්වැන්න නෙලීමේ එක නීතියක් නම් ඔබ වැපිරිය යුතුය යන්නය.

අස්වැන්න නෙලීම පිළිබඳ තවත් නීතියක් නම් ඔබ වපුරන කාලයේදීම නෙලාගැනීම නොකිරීමයි. නෙලාගැනීම සුදුසු කාලයේදී සිදුකෙරෙනු ඇත. ඔබ දේව වචනය නමැති බීජය ඔබේ ජීවිතයේ වැපිරීම ආරම්භ කළ විට ක්ෂණිකවම සුවය ඔබ අත් නොදකිනු ඇත. එසේත් නැත්නම් ඔබ සේවය කරන අය තුළ ප්‍රතිඵල නොදකිනු ඇත. එහෙත් සුවකිරීමේ වචනය නොනවත්වාම වැපිරීම කරන විට කල්යාමේදී ඔබ නිසැකවම නෙලාගැනීම සිදුකළ යුතුය. අස්වැන්න නෙලාගැනීම පිළිබඳ දේව නීතිය මෙයයි.

බයිබලය තුළ සුවය පිළිබඳව ඇති ඉගැන්වීම ආරම්භ කරන විට වපුරන්නාගේ උපමා කථාව තුළම අන්තර්ගත යම් අනතරු ඇඟවීම් ඔබ දැන සිටීම වැදගත් වේ. දේව වචනය නමැති බීජය වපුරන විට නිතරම සාතන්ගේ ප්‍රති විරුද්ධ ක්‍රියාවන් තිබේ.

සමහර බීජ ඔබගේ ජීවිතයේ “මග අසල” වැටුන අතර ඒවා නපුරා විසින් ඔබගෙන් සොරාගනු ලැබීය. ඔබ දේව වචනයෙන් සුවය සහ මිදීම පිළිබඳව අසන අතර ඇතැම්විට සම්ප්‍රදාය, සැකය, විවේචනය සහ නොඇදහිල්ල නිසා එම වචනය සොරාගැනීමට ඉඩදෙනු ඇත.

ඇතැම් බීජ “ගල් පොළොව” මත වැටුන අතර ඔබ ඒවාට ඔබගේ සිතේ පැලවීමට ඉඩ දුන්නේ නැත. “ගල් පොළොව” යන්නෙන් අදහස් කරන්නේ දෙවියන්වහන්සේගේ වචනයට විවෘත නැති තදවූ සිතය. වචනය ඇසූ වහාම එය මහත් ප්‍රීතියෙන් පිළිගනියි. එහෙත් පීඩාවන් පැමිණුන විට (ඇතැම් විට ශාරීරික පහරදීම වැනි) හෝ හිරිහැර කිරීමක් පැමිණුන විට (ඇතැම්විට දිව්‍යමය සුවය ගැන විශ්වාසයක් නැති අයගෙන්) වචනය දුර්වලවී ඔබ බාධාවට පැමිණේ. එමෙන්ම සුවය පිළිබඳ දේව වචනයේ බීජය ඔබේ ජීවිතයේ “කටුවලින්” මිරිකීමකට පත්විය හැකිය. මේ ලෝකයට සම්බන්ධ කාරණා, වස්තුව, විනෝදාංශ සහ තෘෂ්ණාවන්ගෙන් බීජයේ වර්ධනය අත්හිටුවීම සිදුවිය හැකිය.

මනුෂ්‍යයා ආත්මය, ප්‍රාණය සහ ශරීරය යන කොටස් තුනකින් සෑදී ඇත. ශරීරය මනුෂ්‍යයාගේ භෞතික කොටසය. ආත්මය හා ප්‍රාණය යන කොටස් දෙක ඔහුට ක්‍රියා කිරීමට, සිතීමට, දැනීමට, හැඟීම්මය ප්‍රතිචාරයට සහ ආත්මිකව දෙවියන්වහන්සේට ප්‍රතිචාර දැක්වීම සඳහා ඇති ආත්මික කොටස්ය.

මේ සියල්ලම ආත්මික සත්‍යතාවය වැපිරීමේ හා කපාගැනීමේ නියුක්ත වේ. ප්‍රජනනය කිරීමේ බලය ඇති වචනය නමැති බීජය ඇසීම දැකීම වැනි ශාරීරික ඉන්ද්‍රිය මගින් ඔබ ලබාගන්නවා ඇත. ඔබ වචනය කියවන විට හෝ අසන විට එය ඔබගේ ආත්මයට ඇතුළු වේ. එහෙත් ප්‍රජනනයක් සිදුවීම පිණිස එම බීජය ඔබගේ ප්‍රාණයට ඇතුළු විය යුතුවේ. සාමාන්‍ය ලෝකයේ ජීවවිද්‍යාත්මක ප්‍රජනන ක්‍රියාවලියට සමාන එකක් වේ. මනුෂ්‍යයන්ට ප්‍රජනන කාර්ය සම්පූර්ණවීම සඳහා පුරුෂයෙක්, ස්ත්‍රියක් සහ ජීව විද්‍යාත්මක බීජයක්ද සම්ප්‍රේෂණය සඳහා සමීප සබඳතාවයක් ද අවශ්‍ය වේ.

මෙය ආත්මිකව අදාළ කිරීමේදී දේව වචනය බීජය වේ. ආත්මය ආත්මික ස්වභාවයේ “පුරුෂයාගේ” කොටස ක්‍රියාත්මක කරයි. ප්‍රාණය “ස්ත්‍රියගේ” කොටස ලෙස ක්‍රියාකරයි (ආත්මික ස්වභාවයේ ස්ත්‍රී කොටස ප්‍රාණය බව අප දනිමු. “මාගේ ප්‍රාණතොමෝ ස්වාමින්වහන්සේ පිළිබඳ පාරට්ටුව කළාය” යනුවෙන් දාවිත් පවසා ඇත). ප්‍රජනනය සඳහා බීජය ආත්මයට (පුරුෂ) ඇතුළුවී ප්‍රාණයට (ස්ත්‍රී) සම්ප්‍රේෂණය විය යුතුවේ.

බොහෝවිට දේව වචනය අප තුළ පරිවර්තනයක් ඇති නොකිරීමට හේතුවන්නේ අප බීජය අපගේ ආත්මයට පමණක් ඇතුළුවීමට ඉඩදීම නිසාය. අප එය අපගේ මනස, කැමැත්ත සහ හැඟීම යන ප්‍රාණයේ ගැඹුරු ස්ථානවලට විනිවිද ගමන් කිරීමට කිසිවිටෙකත් නිසි ලෙස ඉඩ නොදේ.

ස්වභාවික ලෝකයේ ස්ත්‍රී සහ පුරුෂ එකමුතුවෙන් ජීව විද්‍යාත්මක බීජය රෝපණය කළ විට එහි ප්‍රතිඵල පැහැදිලිව පෙනෙයි. නව ජීවිතයක සෛල නිෂ්පාදනය වී කල්යාමේදී දරුවෙක් උපත ලබයි. ආත්මික ලෝකයේත් මේ දෙයට සමානව සිදුවෙයි. සුවය පිළිබඳ දේව වචනය භෞතික ඇස් හෝ සවන් කරණකොටගෙන ආත්මය තුළට සම්ප්‍රේෂණය වී ඊළඟට ප්‍රාණය තුළ රෝපණය වී එහි ප්‍රතිඵල කල්යාමේදී ඔබේ භෞතික ශරීරයේ දෘශ්‍යමාන වේ.

# පැරණි ගිවිසුම් වාර්තාව

සුවය සහ මිදීමට අදාළ අධ්‍යයනයේ බයිබලීය පදනම ආරම්භවන්නේ පැරණි ගිවිසුම් වාර්තාවෙහිය (මේ පාඩමෙහි ඊට අදාළ බොහෝ සඳහන් කිරීම් සාකච්ඡා කෙරෙන අතර කරුණාකර ඔබේ බයිබලයෙන් ඒවා කියවාගන්න).

මුලාරම්භයේදී මනුෂ්‍යයා ශරීරය, ප්‍රාණය හා ආත්මයක් සහිතව පාප රහිතව නිරෝගීව මවන ලදී. මරණය ලෝකයට ඇතුළු වූයේ ප්‍රථම මනුෂ්‍යයාගේ හා ස්ත්‍රියගේ පාපයේ ප්‍රතිඵලයක් ලෙස බව දැනටම ඔබ හතරවන පරිච්ඡේදය තුළ ඉගෙනගෙන ඇත (උත්පත්ති 3). එමෙන්ම මරණයේ ශාපය මනුෂ්‍යා මත පැමිණි පසු මනුෂ්‍යයාගේ ප්‍රජනන පද්ධතියට සාතන් ඇතුළු වී ලෙඩ, රෝග, බන්ධන සහ මරණය සහිත විනාශකාරී මෙහෙය ආරම්භ කළ බවද ඔබ ඉගෙන ගෙන ඇත.

ආත්මික සහ ශාරීරික සුවය පිළිබඳ ප්‍රථම පොරොන්දුව අපගේ ඉතිහාසයේ අඳුරුම අවස්ථාවේදී දෙන ලදී. ස්ත්‍රියගේ "බීජය" සාතන්ගේ හිස පොඩිකරන බව උත්පත්ති 3:15 දෙවියන්වහන්සේ පැවසූ සේක. මෙම "බීජය" තමන්වහන්සේගේ පොළොවේ මෙහෙයේ උන්වහන්සේගේ මරණය හා නැවත නැගිටීමෙන් අනාගතවක්තෘමය පොරොන්දුව අනුව යේසුස්වහන්සේ විසින් සාතන් පරාජය කිරීමය.

දිව්‍යමය සුවය පිළිබඳ අවස්ථාවන් දෙකක් උත්පත්ති පොතේ සඳහන්ව ඇත. උත්පත්ති 17:18-19 පදවල සාරා වඳභාවයෙන් සුවකරන බවට දෙවියන්වහන්සේගේ පොරොන්දුව ඇත. උත්පත්ති 27:1-7 ට එම පොරොන්දුව සම්පූර්ණ කරයි. උත්පත්ති 20:17 අබිමෙලෙක්ගේ සුවය වාර්තා වේ.

නික්මයාම පොත තුළ රෝග සහ දිව්‍යමය සුවය වඩා පැහැදිලි ලෙස බයිබලය වාර්තා කරයි. ඉශ්‍රායෙල් සෙනඟ මිසරයෙන් නිදහස් කරගැනීමෙන් පසු සෙනඟ කීප දවසක් වතුර සොයමින් ගමන් කළහ. අවසානයේ ඔවුන් මාරාවලට පැමිණි කල තිත්ත නිසා වතුර බීමට නොහැකි විය.

ජලයට දැමූවිට ජලය මිහිරිවන ගසක් දෙවියන්වහන්සේ මෝසෙස්ට පෙන්වූ සේක. මේ සිද්ධියෙන් පසු තමන්වහන්සේගේ සෙනඟ සුවකරන දෙවියන්වහන්සේ ලෙස හෙළිරව්වූ සේක. උන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේගේ හඬට නුඹ ඕනෑකමින් ඇහුම්කන්දී උන්වහන්සේගේ ඇස් හමුයෙහි හරිව තිබෙන දේ කොට උන්වහන්සේගේ ආඥාවලට කන් දෙමින් උන්වහන්සේගේ සියලු නියෝග රක්ෂාකරන්නෙහි නම් මිසරවරුන් පිට මා පැමිණෙවූ රෝගවලින් එකක්වත් නුඹ පිටට නොපමුණුවන්නෙමි. මක්නිසාද මම වනාහි නුඹ සුවකරන්නාවූ ස්වාමින්වහන්සේයයි කීසේක. (නික්මයාම 15:26)**

මෙහි වඩා නිවැරදි පරිවර්තනයක් නම් "ඔබගේ වෛද්‍යවරයා වූ ස්වාමින්වහන්සේ මමය" යනුවෙන් වේ. මෙයින් පුරුද්දක් ලෙස දිගින් දිගටම කරන ක්‍රියාවන් ප්‍රකාශ වේ.

මෙම පොරොන්දුව ඉශ්‍රායෙල් සෙනඟට විශේෂ වූ අවස්ථාවකදී දී ඇති නිසා එය කිතුනුවන්ට අත්කර ගත නොහැකි යයිද ඒ අවස්ථාවට පමණක් අදාළ වූ පොරොන්දුවක් බව ඇතැමෙක් පවසති. කෙසේ නමුත් අප විසින් මතක තබාගත යුතු කරුණක් නම් දෙවියන්වහන්සේගේ නාමයන් උන්වහන්සේගේ චරිත ස්වභාවය ප්‍රකාශ කරන බවයි. දෙවියන්වහන්සේ වෙනස්වන්නේද නැත. දෙවියන්වහන්සේ ස්වභාවයෙන්ම වෛද්‍යවරයා නම් අදත් උන්වහන්සේ එසේමය. නික්මයාම පොතේ අනිකුත් සුවකිරීමේ සිද්ධීන් නම් මෝසෙස් අතෙහි කුෂ්ඨ රෝගය සුවකිරීම (නික්මයාම 4:1-7) සහ තමන්ගේ සෙනඟ වෙතින් රෝගය පහකිරීමේ පොරොන්දුවය (නික්මයාම 23:25).

ලෙවිකථා පොත බයිබලයේ ඇති "සෞඛ්‍යය පිළිබඳ අත්පොත" ලෙස හැඳින්වීමට පුළුවන. දෙවියන්වහන්සේ රෝග සුවය සඳහා නීතිරීති එහි එළිදරව් කර දී ඇත (ලෙවී කථාව 13:1-46, 14:1-32). එමෙන්ම සුවෙන් ජීවත්වීම සඳහා මගපෙන්වීම් එහි සපයා දී ඇත (නිදසුනක් ලෙස ලෙවී කථාව 15:1-33).

මිරියම්ගේ සහ ආරොන්ගේ කුෂ්ඨ රෝගයෙන් සුවවීම ගණන් කථාව පොතේ වාර්තාකර ඇත (ගණන් කථාව 12:1-15). ඉශ්‍රායෙල් ජනතාවට බලපැවැත්වූ වසංගතයෙන් සුවවීමද එහි වාර්තාකර ඇත (ගණන් 16:41-50 සහ 21:5-9).

ද්විතිය කථා පොතේ 28 වන පරිච්ඡේදය සුවයට අදාළ වැදගත් පරිච්ඡේදයකි. ශාරීරික සුවයට අදාළව කිකරුවීමේ අවශ්‍යතාවය පැහැදිලි කරයි. මේ සත්‍යතාවය සනාථ කරන ද්විතිය කථාවේ අනිත් ජේද මේවාය. 7:15, 29:22 සහ 30:20.

මානෝවාගේ භාර්යාව වඳභාවයෙන් සුවකිරීම විනිශ්චයකාරයා පොතේ 13:2-24 හි ඇත. 1 රාජාවලිය පොතෙහිද සුවය පිළිබඳ වාර්තා කීපයක්ම ඇත. වියලි අතක් ඇති මනුෂ්‍යයෙක් සුවවීම පිළිබඳ කථාවද (1 රාජාවලිය 13:4-6) ළමයෙක් මළවුන්ගෙන් නැගිටුවීම පිළිබඳ කථාවද ඇත (1 රාජාවලිය 17:17-24). 2 රාජාවලිය පොතෙහිද මෙවැනි වාර්තා ඉදිරියට සඳහන්ව ඇති අතර එලිෂා දරුවෙක් සුවකිරීම 2 රාජාවලිය 4:8-37 හිද, නාමන් සුවකිරීම 2 රාජාවලිය 5:1-14 හිද සඳහන් වේ. අසරියා රජු සුවකිරීම පිළිබඳ 2 රාජාවලිය 15:1-12 දක්වා ඇති සිද්ධිය ද අධ්‍යයනය කරන්න.

2 රාජාවලිය පොතේ 20:1-11 දක්වා සඳහන්ව ඇති හෙසෙකියාගේ සුවකිරීමෙන් මාරාන්තික රෝග දෙවියන්වහන්සේට සුව කළ හැකි බවත් ජිවිතයට අවුරුදු එකතු කළ හැකි බවත් ඉගෙන ගත හැකිය (2 ලේකම් 32:24-26 දක්වාද යෙසායා 38:1-12 සහ 16 ද බලන්න). 2 රාජාවලිය 13:14 සහ 21 සඳහන් කරුණුවලින් සියලු මනුෂ්‍යයන්ට මරණය පැමිණෙන බවත් සුවකිරීමේ දීමනාව සහිත අයටත් එය එසේම බවත් අපට ඉගෙන ගත හැකිය.

සුවකිරීමට අදාළ බලවත් යාච්ඤාවන් 2 ලේකම් 6:21-31 හි වාර්තා කර ඇත. 2 ලේකම් 20:9 හි අප පීඩාවේ මොරගසන කල සවන් දෙන බවට දෙවියන්වහන්සේගේ පොරොන්දුවක් තිබේ. ආසා රජතුමා දෙවියන්වහන්සේගෙන් සුවය නෙසෙවූ නිසා ඔහු මරණයට පත්වූ බව 2 ලේකම් 16 හි එන කථාන්තරයෙන් ඔබට කියවිය හැකිය. ඔහුගේ පාපය වෛද්‍යවරුන් වෙත යාම නොව දෙවියන්වහන්සේත් උන්වහන්සේගේ සුවයත් නොසලකා හැරීමය. උස්සියාගේ කුෂ්ඨ රෝගය පිළිබඳ 2 ලේකම් 26 සඳහන් වන අතර හෙසකියාගේ යාච්ඤාව කරණකොටගෙන සෙනඟ සුවවීම 2 ලේකම් 30:20 සඳහන් වේ.

යෝබ්ගේ රෝගීභාවය සහ අනෙකුත් ප්‍රශ්නවල මූලාශ්‍රය සිද්ධීන්ට පිටුපසින් හඳුනාගැනීමට යෝබ් පොතත් විශේෂයෙන්ම එහි 1 හා 2 පරිච්ඡේදත් අපට ඉඩ සලසා දෙයි. තමාගේ රෝගී තත්වය තුළ ඔහුගේ ප්‍රතිචාරයත් ඔහුගේ මිතුරන්ට දැක්වූ ප්‍රතිචාරයත් දෙවියන්වහන්සේ ඔහු සුවකර නිදහස් කළ ආකාරයත් ඉගෙන ගැනීම පිණිස යෝබ් පොත අධ්‍යයනය කරන්න.

සුවකිරීමට අදාළ බොහෝ පොරොන්දු, එළිදරව් සහ යාච්ඤාවන් ගීතාවලිය පොතේ අඩංගු වේ. පහත දැක්වෙන් ජේදයන් අධ්‍යයනය කරන්න.

6:2-3. “අහෝ ස්වාමිනි, මා සුව කළ මැනව”

27:1- “මාගේ ජිවනයේ ශක්තිය ස්වාමින්වහන්සේය”

30:2 - “මම මොරගැසීමි. ඔබ මා සුව කළ සේක”

32:3-5 - “පාපය පිළිගැනීමේ ප්‍රතිඵලය සුවය විය”

34:19-20 - “ධර්මිෂ්ඨයාට පීඩා බොහෝය. නමුත් ස්වාමින්වහන්සේ ඒ සියල්ලෙන් ඔහු මුදන සේක”

38:3,7 - “කෝපය සහ පාපය ඔබේ සෞඛ්‍යයට බලපාන බව සහ රෝගී බව “දැවිල්ලක්” ලෙස දක්වයි.

41:1-8 - “මා ඔබට විරුද්ධව පව් කළ බැවින් මාගේ ප්‍රාණය සුවකළ මැනව” රෝගය නපුර ලෙස දක්වා ඇත.

42:11, 43:5 - “අපගේ මලානික බවට සුවය දෙවියන්වහන්සේය.

42:1-5 - මලානිකවූ ආත්මයට සුවය

55:1-2 - යාච්ඤාවෙන් කන්නලව්ව සහ සුවය

67:2 - “පොළොවේ ඔබගේ මාර්ගය ද සියලු ජාතීන් අතරේ ගැළවීමද ප්‍රකාශවන පිණිස . . .”

72:13 - “අප දුර්වල අයට අනුකම්පා කළ යුතුය.

91:9,10 - “නුඹේ කූඩාරමට වසංගතයක් ළං නොවන්නේය”

103:1-5 - "උන්වහන්සේගේ උපකාර සියල්ල සිහි නැති නොකරව් . . . උන්වහන්සේ නුඹේ සියලු රෝග සුවකරන සේක" මේ ජේදයෙන් දෙවියන්වහන්සේ අපේ සියලු පාපවලට කමාව දෙන අපගේ සියලු රෝග සුවකරන වෛද්‍යවරයාණෝ ලෙස එළිදරව් වී සිටින සේක.

105:37 - "ඉශ්‍රායෙල් තමන් අතර එකම දුර්වලයෙක් හෝ නොමැතිව පැමිණියහ. දස ලක්ෂ තුනක් වූ මේ ජනයා ශක්තිමත්ව සුවයෙන් සිටියහ.

107:17-20 - "උන්වහන්සේ ස්වකීය වචනය එවා ඔවුන් සුවකොට . . . ."

119:25-28 - "මට විපත්ති පැමිණෙන්ට පළමුවෙන් මම මුළාව ගියෙමි"

147:3 - "උන්වහන්සේ බිඳුණු සිත් ඇත්තන් සුවකරන සේක. ඔවුන්ගේ තුවාල බිඳන සේක".

105:37 - "උන්වහන්සේ ඔවුන් පිටතට ගෙනෙන සේක . . . උන්වහන්සේගේ ගෝත්‍රවල කිසි දුර්වලයෙක්ද නොසිටි සේක"

සුවදායක ජීවිතයක් සඳහා අවශ්‍ය ප්‍රඥාව හිතෝපදේශ පොත සපයයි. හිතෝපදේශ 3:7-8 දක්වා සුවයෙන් ජීවත්වන ආකාරය පැහැදිලි කරයි. සිතෙහි ආකල්ප ජීවිතයේ ප්‍රශ්නවලට බලපාන බවත් දේව පොරොන්දු සකල ශරීරයට සුවයත් ජීවනයත් වන බව හිතෝපදේශ 4:20-23 දක්වා හෙළිදරව් කරයි.

ශාන්තිදායක වචනවලින් සුවය ඇතිවන බව හිතෝපදේශ 15:4 සහ 30 සනාථකරන අතර හිතෝපදේශ 16:24 දේව වචනය සුවය ගෙනදෙන බව පෙන්වයි. හිතෝපදේශ 16:24 දේවවචනය ඇටවලට සුවය දෙන බව දක්වන අතර හිතෝපදේශ 17:22 ශාරීරික ස්වභාවයට ආත්මික ප්‍රශ්න බලපාන බව හෙළිදරව් කරයි.

දේශනාකාරයා 3:3 සුවකිරීමට කාලයක් ඇති බව ස්ථිර කරන අතර දේශනාකාරයා 5:17 කනගාටුව සහ කෝපය රෝගී තත්වයට හේතුවන්නේ කෙසේදැයි ප්‍රකාශ කරයි.

යෙසායා 6:10 ආත්මික අවබෝධය, හැරීම සහ සුවය අතර සම්බන්ධතාවය පැහැදිලි කරයි. යෙසායා 19:22 "කන්නලව්ව අසා සුවකරන බව" ස්ථිර කරයි. (කන්නලව්ව නම් ඉතා ඕනෑකමින් බලකර ඉල්ලීමක්ය).

දේව රාජ්‍යයට අයත් බලවත් ප්‍රොජේතමය පොරොන්දුවක් ලෙස සුවකිරීම යෙසායා 32:3-4 සඳහන් කරයි. යෙසායා 33:24 සහ 35:5-6 දහස් අවුරුදු පාලන සමයේ වැසියන් "මට රෝගයක් නැත" යනුවෙන් පවසන බව සඳහන් කරයි.

සමගිකිරීමේ පූජාව අපට රෝගයෙන් නිදහස සනාථ කිරීම යෙසායා 53:5 පොරොන්දු වී ඇත. රෝග සුවය පිණිස සමීපවන ලෙස යෙසායා 57:18-19 උනන්දුකරන අතර යෙසායා 58:8 "නුඹේ සුවයද ඉක්මනින් හටගන්නේය" යනුවෙන් ස්ථිර කරයි.

යේසුස්වහන්සේ එවනු ලැබුවේ බිඳුණු සිත් ඇත්තන් සුව කරන පිණිස බව යෙසායා 61:1 හි අපි ඉගෙන ගනිමු. මෙහි පවසන්නේ ඇතුළාන්ත හැඟීම්වලට අදාළ සුවයකි.

ශාරීරික සුවය හා බැඳී තිබෙන දෙයක් ලෙස තිත්තකම නමැති පාපය බව යෙරමියා 8:14-15 සහ 20-22 දක්වා හඳුන්වා ඇති අතර සුව කළ නොහැකි රෝගයක් උදෙසා ක්‍රියා කළ යුතු ආකාරය යෙරමියා 15:18 පැහැදිලි කර දෙයි. දෙවියන්වහන්සේ සුවයේ මූලාශ්‍රය බව යෙරමියා 17:14, 30:12-17 සහ 33:6 සනාථ කරයි.

"උන්වහන්සේ කැමැත්තෙන් පීඩා නොකරන සේක" යන්න විලාප ගී හි 3:33 සනාථ කරයි. දෙවියන්වහන්සේට සුවකිරීමටත් සුවය නැවත පිහිටුවීමටත් හැකි බව එසෙකියෙල් 17:14, 30:17 සහ 33:6 සනාථ කරයි.

"ඖෂධවලින් සුව කළ නොහැකි අසාධ්‍ය තුවාල ගැන එසෙකියෙල් 30:12-13 කථා කරයි. මේ ආකාරයේ තුවාල සුව කළ හැක්කේ ආත්මික සුවයට පමණි. එසෙකියෙල් 34:4, 16, 21 සහ

සෙකරියා 11:16 හි එඬේරුන්ට (ආත්මික නායකයන්ට) තම රෝගී බැටළුවන් (සෙනඟ) නොසලකා සිටීම ගැන අවවාදයන් අඩංගු වේ.

නෙබුකද්නෙශර් රජුගේ රෝගය සහ සුවවීම ගැන දානියෙල් 4 පරිච්ඡේදයේ වාර්තා වේ. සුවය සඳහා වෙනත් අය වෙත යාමේ අනතුරුදායක තත්වය හොෂියා 5:13 අවවාද කරයි. ශාරීරික සහ ආත්මික තත්වයන් දෙකම සුවකිරීමට දෙවියන්වහන්සේට හැකි බව හොෂියා 6:1 සහ 7:1 සනාථ කරයි. "ඔවුන්ට සුව කළේ මා බව ඔවුහු නොදැන සිටියෝය" යන දෙවියන්වහන්සේගේ ශෝක වචන හොෂියා 11:3 වාර්තා වේ. "ස්වකීය පියාපත්වල සුවකිරීම ඇතිව උදාවන්නේය" යනුවෙන් යේසුස්වහන්සේ පිළිබඳව මලාකි 4:2 සඳහන් පොරොන්දුව සමග පැරණි ගිවිසුමේ සුවය ගැන ඇති වාර්තාව අවසන් වේ.

## නව ගිවිසුම් වාර්තාව

යේසුස්වහන්සේගේ සහ මුල් සභාවේ උදාහරණ කරණකොටගෙන සුවකිරීම හා මිදීම නව ගිවිසුම් වාර්තාව තුළ අලුත්ම මානයකට විස්තීර්ණ කර ඇත.

### යේසුස්වහන්සේගේ නිදසුන් :

නව ගිවිසුම තුළ ඇදහිලිවතුන්ට ඇදහිල්ල සහ ක්‍රියාකිරීම පිළිබඳව ඇති ආදර්ශය යේසුස්වහන්සේය. ඔබගේ සේවයේ සුවකිරීමේ සහ මිදීමේ සේවයන් තුළ අනුගමනය කළ යුත්තේ යේසුස්වහන්සේගේ ආදර්ශයයි. නව ගිවිසුමේ ශුභාරංචි පොත් 4 තුළ ඇති පද 3774 න් 484 ක්ම විශේෂිතව අදාළ වී ඇත්තේ ශාරීරික සහ මානසික සුවකිරීම් සහ මළවුන් නැගිටුවීම්වලටය. මාක් ශුභාරංචියේ පද 666 කින් 209 ක්ම යේසුස්වහන්සේගේ හාස්කම්වලට අදාළ වේ. ශුභාරංචි පොත්වල එන කථාන්තර පෙන්නුම් කර ඇති පද 1257 කින් 484 ක් (38.5%) ම කැපකර ඇත්තේ හාස්කමේ සුවයන් විස්තර කිරීමටය.

යේසුස්වහන්සේ තම මෙහෙය තුළ භාවිත කළේ දෙවියන්වහන්සේගේ වචනයය.

> **එබැවින් යේසුස්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා මනුෂ්‍ය පුත්‍රයා එසවූ කල, මා ඔහුම බවත් මාගේම කැමැත්තෙන් මා කිසිවක් නොකර මාගේ පියාණන්වහන්සේ මට ඉගැන්වූ ලෙස මේ දේවල් කියන බවත් නුඹලා දැනගන්නවා ඇත (යොහන් 8:28).**

යේසුස්වහන්සේ කළේ දෙවියන්වහන්සේගේ කැමැත්ත සහ ක්‍රියාවන්ය.

> **මක්නිසාද, මා ස්වර්ගයෙන් බැස ආවේ මාගේ කැමැත්ත නොව මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත කරන පිණිසය. (යොහන් 6:38)**
>
> **දහවල්ව තිබියදී මා එවූ තැනැන්වහන්සේගේ වැඩ අප විසින් කටයුතුය. රාත්‍රිය පැමිණෙයි, එවිට කිසිවෙකුට වැඩකරන්ට නුපුළුවන. (යොහන් 9:4)**
>
> **යේසුස්වහන්සේද: මාගේ කෑම නම් මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත කොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය. (යොහන් 4:34)**

යේසුස්වහන්සේගේ පරමාර්ථ වූයේ පාපයට, රෝගය සහ බන්ධනය ඇතුළු සතුරාගේ ක්‍රියා විනාශ කිරීමය.

> **පව්කරන තැනැත්තේ යක්ෂයාගෙන්ය. මක්නිසාද යක්ෂයා පටන්ගැන්මේ සිට පව්කරන්නේය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ප්‍රකාශකරනු ලැබුවේ මේ පිණිසය, එනම් යක්ෂයාගේ ක්‍රියා විනාශකරන පිණිසය. (1 යොහන් 3:8)**

යේසුස්වහන්සේගේ ක්‍රියා පියාණන්වහන්සේට ප්‍රසන්න විය.

> **මා එවූ තැනැන්වහන්සේ මා සමග සිටිනසේක. උන්වහන්සේ මා තනියම සිටින්ට නෑරිය සේක. මක්නිසාද උන්වහන්සේට ප්‍රසන්නවූ දේවල් මම නිතරම කරමියි කීසේක**
> **(යොහන් 8:29).**

මෙහි තේරුම නම් ඔබ සුවකිරීම හා මිදීම යේසුස්වහන්සේ කළ ආකාරයෙන් කරන විට ඔබ පියාණන්වහන්සේ ප්‍රසන්න කරන බවයි. එම ක්‍රියාවන්ට උන්වහන්සේගේ වචන ප්‍රකාශ කිරීම, උන්වහන්සේගේ කැමැත්ත කිරීම සහ සතුරාගේ ක්‍රියා විනාශ කිරීම අයත් වේ.

පැමිණ සිටි සියලු අය සුවකළ බවට නව ගිවිසුමේ අවස්ථා බොහෝ ඇත.

- ක්‍රියා 10:38
- ලූක් 4:40, 6:17-19, 9:11
- මතෙව් 4:23-25, 9:6, 35, 10:1, 12:15, 14:14,34-36

යේසුස්වහන්සේ විවිධාකාර රෝග සුව කළ සේක.

- මී මැස්මොරය
- දිය උදර රෝගය
- ගොළු බිහිරි
- අංශභාගය
- ලේ ගැලීම
- යක්ෂාවේෂය
- වියළි අත් (විකෘති හෝ අංශභාගී)
- අන්ධයන්
- දුර්වලකම්
- කපා දමන ලද කනක්
- මළවුන් නැගිටුවීම
- අත් පා නැති (මාක් 9:43 එන පරිදි, මෙයින් පැහැදිලිව දැක්වෙන්නේ අවයවයක් නැතිව සිටීමය)

යේසුස්වහන්සේගේ සුවකිරීමේ මෙහෙයේ පෙලඹවීම මනුෂ්‍යයන් කෙරෙහි දැක්වූ කරුණාව විය (නිදසුන් සඳහා මතෙව් 9:36, 12:9-13, 14:14, 18:27, 20:29-34, 29:34, මාක් 1:41, 3:1-5, 5:19, ලූක් 6:6-10, 7:12-15, 10:33, 14:1-6 සහ යොහන් 11:38-44 බලන්න). සුවකිරීමේදී යේසුස්වහන්සේ ප්‍රකාශ කළ හැඟීම් ශෝකය, කෝපය, සුසුම්ලෑම සහ හැඬීම ආදිය විය.

සුවකිරීමේදී යේසුස්වහන්සේ විවිධ ක්‍රම භාවිත කළ සේක. ඇතැම් විට යේසුස්වහන්සේ රෝගියා තමන්වහන්සේ වෙතට කැඳවූ සේක (මාර්ක් 3:1-6). අනෙකුත් අවස්ථාවල රෝගීහු උන්වහන්සේ කැඳවූහ (මතෙව් 8:5-13, ලූක් 7:1-10 සියයකට මුලාදෑනියාගේ දාසයා පිළිබඳ කතාව සහ මතෙව් 9:18-19, 23-26 හි යායිරස්ගේ දුව සුවකිරීම).

යේසුස්වහන්සේ ගනුදෙනු කළේ සම්පූර්ණ මනුෂ්‍යයා සමගය. ශාරීරික තත්වය සමග පමණක් නොවේ. උන්වහන්සේ සුවයත් පාප කමාවත් දෙකම ඉගැන්වූ සේක. අතැම්විට උන්වහන්සේ ප්‍රථමයෙන් සුවකර ඉන්පසු පාපයට කමා කළ සේක (ලූක් 17:9 සහ යොහන් 5:14 බලන්න) අනෙක් අවස්ථාවල ප්‍රථමයෙන් පාපයට කමාවදී ඉන්පසු සුව කළ සේක (මාර්ක් 2:1-12 බලන්න).

ඇතැම්විට රෝගියාගේ ඇදහිල්ලක් නොමැතිව සුවය ලබාදුන් සේක (ඇදහිල්ල පිළිබඳව එම ස්ථානයේ සඳහන් නොවේ)

- ලාසරස් : යොහන් 11:1-44
- මල්කස්ගේ කන : ලූක් 22:50-51
- ගෙරසේනයේ යක්ෂාවේෂවූ මනුෂ්‍යයා : මාක් 5:1-20
- ගොළු බිහිරි මනුෂ්‍යයා : මාක් 7:32-35
- පේදුරුගේ නැන්දම්මා : ලූක් 4:38-39
- වැන්දඹුවගේ පුත්‍රයා : ලූක් 7:12-15
- වියළි අතක් ඇති මනුෂ්‍යයා : මාක් 3:1-5
- උත්පත්තියෙන් අන්ධ මිනිසා : යොහන් 9:1-7
- ආබ්‍රහම්ගේ දියණිය : ලූක් 13:10-13
- වංශාධිපතියාගේ පුත්‍රයා : යොහන් 4:46-50
- ශතාධිපතියාගේ සේවකයා : මතෙව් 8:5-13
- සීරෝපිනීසියානු ස්ත්‍රියගේ දුව : මතෙව් 15:21-28

! - යායිරස්ගේ දුව : මාක් 5:35-43

ඇතැම් අවස්ථාවල පුද්ගලයෙකුගේ ඇදහිල්ල නිසා සුවය ලැබීම සිදුවිය.

- අන්ධයන් දෙදෙනා : මතෙව් 9:27-31
- ලාදුරු රෝගියා : මතෙව් 8:2-4, 20:29-34 මාක් 1:40-44
- කුෂ්ඨ රෝගීන් දස දෙනා : ලූක් 17:11-19
- අන්ධයන් දෙදෙනා : මතෙව් 20:29-34
- අන්ධ බර්තිමේයුස් : මාක් 10:46-52, ලූක් 18:35-43
- රුධිර වහනය ඇති ස්ත්‍රිය : මතෙව් 9:20-22, මාක් 5:25-34, ලූක් 8:43-48,

ඇතැම් අවස්ථාවල අන් අයගේ ඇදහිල්ල නිසා සුවය සිදුවිය.

- ශතාධිපතියාගේ සේවකයා : මතෙව් 8:5-13
- වංශාධිපතියාගේ පුත්‍රයා : යොහන් 4:46-53
- හතරදෙනා ගෙන ආ අංශභාග රෝගියා : මතෙව් 9:1-8, මාක් 2:1-12, ලූක් 5:17-26.
- සිරෝෆිනීසියානු ස්ත්‍රියගේ දියණිය : මතෙව් 15:21-28
- යක්ෂාවේශ ගොළුවා : මතෙව් 9:32-33
- ගොළු බිහිරි යක්ෂාවේශ වූ අය : මතෙව් 12:22-23
- යායිරස්ගේ දියණිය : මාක් 5:35-43
- ගොළු බිහිරි මනුෂ්‍යයා : මාක් 7:32
- අන්ධ මනුෂ්‍යයා : මාක් 8:22-26

යේසුස්වහන්සේ සුවකිරීම පිණිස විවිධ වාචික ක්‍රම භාවිත කළ සේක. උන්වහන්සේ වචනය ප්‍රකාශ කිරීමෙන් පමණක් සුව කළ සේක.

ශරීරය මනුෂ්‍යයාගේ භෞතික කොටසය. ආත්මය හා ප්‍රාණය යන කොටස් දෙක ඔහුට ක්‍රියා කිරීමට, සිතීමට, දැනීමට, හැඟීම්මය ප්‍රතිචාරයට සහ ආත්මිකව දෙවියන්වහන්සේට ප්‍රතිචාර දැක්වීම සඳහා ඇති ආත්මික කොටස්ය.

මේ සියල්ලම ආත්මික සත්‍යතාවය වැපිරීමේ හා කපාගැනීමේ නියුක්ත වේ.

- ආබ්‍රහම්ගේ දියණිය. ලූක් 13: 10-13
- වංශාධිපතියාගේ පුත්‍රයා. යොහන් 4:46-50
- අන්ධ බර්තිමේයුස්. මාක් 10:46-52
- අන්ධ මිනිසුන් දෙදෙනා. මතෙව් 9:27-31
- ශතාධිපතියාගේ සේවකයා. මතෙව් 8:5-13

ඇතැම් අවස්ථාවල උන්වහන්සේ වචනයෙන් විධාන කළ සේක.

- අංශභාග රෝගියා : ලූක් 5:17-26
- යායිරස්ගේ දුවණිය : මාක් 5:22-24, 35-43

ඇතැම් අවස්ථාවල යේසුස්වහන්සේ විධානය සමග ස්පර්ශය එකට භාවිත කළ සේක.

- ලාදුරු රෝගියා : මතෙව් 8:2-4
- අන්ධයන් දෙදෙනා : මතෙව් 9:27-31
- පේතෘස්ගේ නැන්දණිය : ලූක් 1:38-39
- ගොළු බිහිරි මනුෂ්‍යයා : ලූක් 7:32-35
- වැන්දඹුවගේ පුත්‍රයා : ලූක් 7:12-15
- ආබ්‍රහම්ගේ දියණිය : ලූක් 13:10-13

ඇතැම් අවස්ථාවල යේසුස්වහන්සේ යාච්ඤා කළ සේක.

- පේතෘස්ගේ නැන්දණිය : ලූක් 4:38-39
- ගොළු බිහිරි මනුෂ්‍යයා : මාක් 7:32-35

- වැන්දඹු ස්ත්‍රියගේ පුත්‍රයා : ලූක් 7:12-15
- ලාසරස් : යොහන් 11:38-44
- වියළි අතක් ඇති මනුෂ්‍යයා : මාක් 3:1-5

තමා සුවකරන අය සමග ශාරීරිකව සිටීම යේසුස්වහන්සේට අවශ්‍ය නොවිය. උන්වහන්සේ දුරස්ථ ස්ථානයක සිටිමින්ද සුව කළ සේක.

- ශතාධිපතියාගේ සේවකයා : මතෙව් 8:5-13
- වංශාධිපතියාගේ පුත්‍රයා : යොහන් 4:46-50
- සිරෝෆිනීසියානු ස්ත්‍රිය : මතෙව් 15:21-28

සුවකිරීමේ කොටසක් ලෙස රෝගී අයට යමක් කිරීමට යේසුස්වහන්සේ අණ කළ සේක.

- වියළි අතක් ඇති මනුෂ්‍යයාට "අත දිග හරින්න"යි කීසේක ලූක් 6:6-11
- බෙත්සයිදාවේ අංශභාගී මනුෂ්‍යයාට "නැගිට ඇඳ රැගෙන යන්නයි කීසේක" යොහන් 5:1-9
- රෝගී පුත්‍රයෙක් සිටි වංශාධිපතියාට "ආපසු හැරී යන්න"යි කීසේක. යොහන් 4:46-54
- ලාදුරු රෝගීන් දස දෙනාට පූජකයාට තමන් පෙන්වන ලෙස දැක්වීය. ලූක් 17:11-19
- අන්ධ මනුෂ්‍යයාට සිලෝවම් පොකුණෙන් සෝදාගන්ට කී සේක. යොහන් 9:7

යේසුස්වහන්සේ ප්‍රසිද්ධ ස්ථානවල කණ්ඩායම් සහ සිනගෝග තුළ මෙන්ම පුද්ගලකිවද සුව කළ සේක (නිවෙස්වල සහ පුද්ගලිකව හමුවී)

යේසුස්වහන්සේ අසාමාන්‍ය ද්‍රව්‍ය භාවිත කළ සේක.

- කෙළ
- මඩ
- කන්වල ඇඟිලි දැමීම
- තම වස්ත්‍රයේ දාවල්ල
- වතුරෙන් සේදීම

ඇතැම් අවස්ථාවල රෝගීන් යේසුස්වහන්සේ ස්පර්ශ කළ සේක.

- යායිරස්ගේ දුවණිය : මාක් 5:23-24
- සමූහයා : ලූක් 6:17-19
- සමූහයා : මාක් 3:10
- තමන් ඇතගැසූ කවුරු නමුත් : මාක් 6:56

ඇතැම් අවස්ථාවල රෝගීහු උන්වහන්සේ ස්පර්ශ කළහ.

- අන්ධයන් දෙදෙනා : මතෙව් 9:7-31
- විවිධ රෝග ඇති සෙනඟ : ලූක් 4:40
- ලාදුරු රෝගියා : ලූක් 5:13
- දුර්වලකමක් ඇති ස්ත්‍රිය : ලූක් 13:10-13

සුවකිරීමෙන් පසු යේසුස්වහන්සේ දුන් උපදෙස් විවිධාකාර විය. නිදසුනක් ලෙස පේතෘස්ගේ නැන්දනිය තම ඇඳෙන් නැගිට පැමිණ සිටි අයට උපස්ථාන කළාය. යායිරස්ගේ දියණියට ආහාර දෙන ලෙස යේසුස්වහන්සේ කීසේක.

යේසුස්වහන්සේ කළ සුවකිරීම් විවිධ ස්ථානවලදී කළ සේක.

- නිවෙස් තුළ හා අසල
- විවෘත රැස්වීම්වල, මාර්ගවල, පොකුණු අසල, කඳු අසල, බෝට්ටුවල
- මළගෙවල්වල
- සොහොන්පිටිවල
- දේව මාලිගාවේ
- කෑමට රැස්වූ අවස්ථාවල

- අන් ස්ථාන කරා යන අතර
- පිට්ටනිවල

උන්වහන්සේගේ හාස්කම් හා සුවයන්ට විවිධ ප්‍රතිචාර විය.

- පුදුමයට පත්වීම
- දෙවියන්වහන්සේට භය වීම
- විරුද්ධ මත
- පවුලේ අය සහ ආගමික නායකයන් විසින් ප්‍රතික්ෂේප කිරීම
- යක්ෂාත්ම කෑගැසීම
- කෝපය
- ජනප්‍රියත්වය
- දෙවියන්වහන්සේට මහිමය
- "මේ කුමක්ද?" යනාදි ප්‍රශ්න
- සාකච්ඡා (වාර්තා සහ දූෂමාන ආරංචි)
- මුළු පවුලම ගැළවීමට පැමිණීම

සාරංශයක් ලෙස අප යේසුස්වහන්සේගේ සුවකිරීමේ සේවාව අද අපගේ සේවය සඳහා ආදර්ශයක් කොට සැලකීමේදී යේසුස්වහන්සේ උන්වහන්සේගේ පොළොවේ සේවය තුළ දෙවියන්වහන්සේගේ වචන ප්‍රකශ කළ බවත් දෙවියන්වහන්සේගේ වැඩ කළ බවත් අපට සොයාගත හැකිවේ. සුවකිරීම සහ මිදීම උන්වහන්සේගේ වචනවල සහ වැඩවල කොටසක් විය.

ඇතැම්විට යේසුස්වහන්සේ පැමිණ සිටි සෑම දෙනාම සුව කළ සේක. අනෙක් අවස්ථාවල විශේෂිතවූ පුද්ගලයන් උන්වහන්සේ සුව කළ සේක. උන්වහන්සේ විවිධ වර්ගවල රෝග සුව කළ අතර එම සේවයේදී විවිධාකාර ක්‍රම භාවිත කළ සේක. ඇතැම් අවස්ථාවල රෝගියාගේ පාර්ශවයෙන් ඇදහිල්ලක් නැතිව සුවකිරීම සිදුවිය. අනෙක් අවස්ථාවන්හිදී රෝගියාගේ මිතුරන් හෝ නෑදෑයන්ගේ ඇදහිල්ල නිසා සුවකිරීම සිදුවිය. යේසුස්වහන්සේ ගිය ඕනෑම තැනක සුවකිරීම සිදුකරන ලද අතර උන්වහන්සේගේ සේවය දයානුකම්පාවෙන් යුක්ත විය. උන්වහන්සේගේ සුවකිරීමේ සේවයට ඒ කාලයේ සිටි මනුෂ්‍යයන්ගෙන් ආගමික හා දේශපාලන නායකයන්ගෙන් විවිධාකාර ප්‍රතිචාර ලැබුවේය.

මේ යේසුස්වහන්සේම අද සුවකිරීමටත් ගැළවීමටත් අප අතර සැරිසරන සේක. "යම් පමණ දෙනෙක් උන්වහන්සේ අදහාගත්තේද . . . ඔව්හු දෙවියන්වහන්සේගේ දරුවන් වීමට බලය ලැබූහ" යන්න මතකයේ තබාගන්න (යොහන් 1:12-13). එසේම "උන්වහන්සේව ස්පර්ශ කළ යම් පමණ දෙනෙක් වීද ඔව්හු සම්පූර්ණ කරනු ලැබුවෝය" (මාක් 6:56) යන්නද මතක තබාගන්න.

## මුල් සභාවේ ආදර්ශය :

මුල් සභාවේ ආදර්ශයද අපගේ සුවකිරීමේ හා මිදීමේ සේවයට පූර්වාදර්ශයක් සපයයි. යේසුස්වහන්සේ විසින් තම ගෝලයන් අධිකාරිබලයෙන් පත්කර යවනු ලැබීය. ගෝලයන් තමන්ට දුන් අධිකාරී බලයෙන් ක්‍රියා කළ අතර යේසුස්වහන්සේ පොරොන්දු වූ දේ ඉටුකිරීම අපේක්ෂා කළේය (නිදසුන් සඳහා ක්‍රියා 3:4-7, 8:4-8 සහ 28:3-6  බලන්න).

ගෝලයෝ, සුවකිරීමට බලය හා ආධිපත්‍යය තමන්ගෙන්ම නොවූ බවත් ක්‍රිස්තුස්වහන්සේගෙන් බවත් අවබෝධකර ගත්හ (ක්‍රියා 3:4-7, 9:17-18). යාච්ඤාව ඔවුන්ගේ සුවකිරීමේ සේවයේ කොටසක් විය (ක්‍රියා 4:23-31, 9:40-41, 28:8 සහ යාකොබ් 5:16). සුවය සඳහා මැදහත්කාර සහ ආත්මයෙන් යන දෙආකාර යාච්ඤාවන් විය (ක්‍රියා 3:4-7 සහ යාකොබ් 5:14-16).

ප්‍රමාදවී සිදුවන සුවයන් ගෝලයන් විසින් අත්දකින ලදී. මෙම නිදසුන් අධ්‍යයනය කරන්න. පිලිප්පි 2:25-30. එපප්‍රොදිතස්ගේ සුවය. 1 තිමෝති 5:23, තිමෝති: සහ 2 කොරින්ති 8:18-22 ත්‍රොපිමස්:

යේසුස්වහන්සේ මෙන්ම ගෝලයෝද තම සුවකිරීමේ සේවය නිසා පීඩාව අත් දුටුවෝය (ක්‍රියා 4:3. 29, 5:17-18, 6:9-15, 7:1-60).

මෙහි පහත දැක්වෙන ක්‍රමයන් සමග සුවකිරීමේදී භාවිත කරන ලද විවිධ ක්‍රම ක්‍රියා පොතේ වාර්තා කර ඇත.

- අත් තැබීම: 5:12, 14:3, 19:11, 28:8
- අත් තැබීම සමග වචන ප්‍රකාශ කිරීම: කොර මනුෂ්‍යයා 3:1-10
- අතින් එසවීම සමග වචන ප්‍රකාශ කිරීම: 3:1-42 පාවුල්ගේ ඇස් 9:36-43
- වචනය ප්‍රකාශ කිරීම (ආධිපත්‍යයෙන් අණ කිරීම): වහල් තරුණිය 16:18, ලුස්ත්‍රාවේ කොරා 14:10.
- යාච්ඤාව : පාවුල්ගේ ඇස් 9:36-43, පබ්ලියස්ගේ පියා 28:8-9
- යාච්ඤා රෙදි : 19:11-15
- ඡායාව : 5:12-16
- වැළඳගැනීම : 19:12
- වට කිරීම : 14:19-20
- කිසිම ක්‍රමයක් නොමැතිව : 14:19-20
- වචනය සහ ක්‍රියා කිරීමට අණක්. අයිනෙයස් 9:33-34, කොර මිනිසා, පරිච්ජේද 3

ඇතැම් අවස්ථාවල සුවකිරීම මේ හේතුවෙන් සිදුවිය.

- රෝගියා පළමු පියවර ගැනීම : දේවමාලිගාවේ දොරටුව ළඟ කොරා ක්‍රියා 3:3
- මිත්‍රයන් විසින් පළමු පියවර ගැනීම : තබීතා ක්‍රියා 9:38
- අපොස්තුළුවරයා පළමු පියවර ගැනීම :

| | | |
|---|---|---|
| - පේතෘස් | ලිද්දායෙහි අයිනෙයස් | ක්‍රියා 9:34 |
| - පාවුල් | ලුස්ත්‍රාවේ කොරා | ක්‍රියා 14:9 |
| - පාවුල් | පිලිප්පියේ වහල් තරුණිය | ක්‍රියා 16:18 |
| - පාවුල් | යුතිකස් | ක්‍රියා 20:10 |
| - පාවුල් | පබ්ලියස්ගේ පියා | ක්‍රියා 28:8 |

ගෝලයන් පුද්ගලයන්ට සුවකිරීමේ සේවය කළේය. පහත දැක්වෙන සටහන අධ්‍යයනය කරන්න.

**ගෝලයන් විසින් තනි පුද්ගලයන් සුව කිරීම**

| **සිද්ධිය** | **ක්‍රියා** | **වර්ගය** |
|---|---|---|
| කොරවු සිඟන්නා සුවකිරීම | 3:1-4, 22 | ශාරීරික |
| පාවුල්ගේ ඇස් | 9:10-19, 22:10-21 | ශාරීරික |
| පේතෘස් විසින් අයිනෙයස් සුවකිරීම | 9:32-35 | ශාරීරික |
| පේතෘස් විසින් දොර්කස් (තබීතා) සුවකිරීම | 9:36-43 | මළවුන් නැගිටුවීම |
| ලුස්ත්‍රාවේ කොරා | 14:8-18 | ශාරීරික |
| ලුස්ත්‍රාවේදී පාවුල් එසවීම | 14:19-20 | ශාරීරික |
| පිලිප්පියේ වහල් තරුණිය | 16:16-40 | යක්ෂාවේශ |
| යුතිකස් නිදහස් කිරීම | 20:7-12 | මළවුන් නැගිටුවීම |
| පාවුල්ට සර්පයා දෂ්ට කිරීම | 28:3-6 | ශාරීරික |
| පබ්ලියස්ගේ පියා | 28:8-9 | ශාරීරික |

ගෝලයෝ කණ්ඩායම් වශයෙන් මනුෂ්‍යයන්ට මෙහෙ කළහ. පහත දැක්වෙන සටහන අධ්‍යයනය කරන්න.

## ගෝලයන් විසින් කරන ලද සාමූහික සුවකිරීම්

| | ක්‍රියා පොත |
|---|---|
| බොහෝ පුදුම සහ ලකුණු | 2:42-47 |
| නිසැකකම හා සුවයේ ලකුණු පිණිස යාච්ඤාව | 4:23-31 |
| යෙරුසලමෙහි බොහෝ අයගේ සුවවීම් | 5:12-16 |
| ස්තේපන් විසින් කරන ලද බෙහෝ හාස්කම් | 6:8-15 |
| සමාරියේ පිලිප් කළ බොහෝ සුවකිරීම් | 8:5-25 |
| පාවුල් සහ බාර්ණබස් කළ පුදුම හා ලකුණු | 14:3 |
| එපීසයේ පාවුල්ගේ රෝගීන් සුවකිරීම් | 19:11-12 |
| මෙලිතයේ රෝගී අයගේ සුවකිරීම් | 28:8-9 |

විවිධ වර්ගවල ලෙඩ සුවකරනු ලැබීය. පහත සටහන අධ්‍යයනය කරන්න.

## සුව කරන ලද ලෙඩ වර්ගයන්

| | | ක්‍රියා පොත |
|---|---|---|
| උණ සහ රත්නාතිසාරය | පබ්ලියස්ගේ පියා | 28:8 |
| අන්ධභාවය | පාවුල් | 9:8 |
| හිසෙහි තුවාලය (මළ) | යුතිකස් | 20:9 |
| මාරාන්තික රෝගය | තබීතා | 9:37 |
| අංශභාගය | අයිනෙයස් | 9:33 |
| කොරභාවය | බොහෝ කොරුන් | 3:2, 8:7, 14:8 |
| යක්ෂ ආවේශය | පිලිප්පියේ | 16:16-40 |
| සර්ප දෂ්ටකිරීම | පාවුල් | 28:3-6 |

(හඳුනා නොගත් බොහෝ රෝගයන් සමූහයන් මැද සුවකරනු ලැබීය)

ඇතැම් අවස්ථාවල ඉල්ලීමකට ප්‍රතිචාරයක් වශයෙන් සුවකරනු ලැබීය:

- කොරවූ මනුෂ්‍යයෙකුගේ ඉල්ලීමෙන් : ක්‍රියා 3:2
- මිතුරන්ගේ ඉල්ලීමෙන් (තබීතා) : ක්‍රියා 9:38

අවශ්‍යතාවයකට ප්‍රතිචාර ලෙස සුවකරනු ලැබීය.

- අංශභාග රෝගිවූ අයිනේයස් : ක්‍රියා 9:33
- යුතිකස් : ක්‍රියා 20:10
- පබ්ලියස්ගේ පියා : ක්‍රියා 28:8
- මෙලිතයේ රෝගීන් : ක්‍රියා 28:9

ඇදහිල්ලට ප්‍රතිචාරයක් ලෙස සුවකරනු ලැබීම

- ලුස්ත්‍රාවේ කොරා : ක්‍රියා 14:9

බලවත් කරදර කිරීමට ප්‍රතිචාරයක් ලෙස සුවකරනු ලැබීම

- පිලිප්පියේ වහල් තරුණිය : ක්‍රියා 16:18

ගෝලයන්ගේ නිදසුන්වලින් ඔවුන් යේසුස්වහන්සේ විසින් ආධිපත්‍යය දී යවනු ලදුව සුවකිරීම් කළ බව අපි ඉගෙන ගතිමු. තමන්ගේ බලය හා ආධිපත්‍යය ක්‍රිස්තුස්වහන්සේගෙන් බව ඔව්හු අවබෝධ කරගත්හ. යාච්ඤාව ඔවුන්ගේ සේවයේ කොටසක් වූ අතර ඔවුන් විසින් ක්ෂණික සුවයන් මෙන්ම ප්‍රමාද වූ සුවයන්ද අත්දකින ලදී.

යේසුස්වහන්සේ මෙන්ම ඔවුන්ද තමන්ගේ සුවකිරීමේ සේවය නිසා පීඩාව අත්දැක්කේය. සුවකිරීම පිණිස විවිධ වූ ක්‍රම භාවිත කරන ලද අතර විවිධවූ රෝග වර්ග සමග ඔව්හු ගනුදෙනු කළහ. ඇතැම් අවස්ථාවල සුවය රෝගීන් විසින් මුල් පියවර ගැනීමෙන්ද මිතුරන් විසින් මුල් පියවර ගැනීමෙන්ද අපොස්තුළුවරුන් විසින් මුල් පියවර ගැනීමෙන්ද සිදුවිය. ගෝලයෝ තනි පුද්ගලයන්ට මෙන්ම පුද්ගල කණ්ඩායම්වලටද මෙහෙ කළහ.

නව ගිවිසුමේ වාර්තාවෙන් භාස්කම්, සුවකිරීම් සහ මිදීම් යේසුස්වහන්සේගේ මෙහෙයෙන් අවසන් නොවූ බව පැහැදිලිය. "අදහන අය සමග" ලකුණු සිදුවිය.

## සුවකිරීම සහ ශාන්තිකර පූජාව

සුවකිරීමට අදාළ වඩාත්ම වැදගත් වූ බයිබලිය සඳහන් කිරීමක් පිළිබඳ අපි මෙහිදී සවිස්තරව සලකා බලමු.

> **සැබවින්ම උන්වහන්සේ උසුලාගත්තේ අපේ දුක්ය. දරාගත්තේ අපේ ශෝකය. එසේවී නුමුත් උන්වහන්සේ දඬුවමද දෙවියන්වහන්සේගෙන් පහරද පීඩාවද ලැබූ කෙනෙකැයි අපි සිතිමුව. නුමුත් උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය. පොඩිකරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය. අපට සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට පැමුණුණේය. උන්වහන්සේගේ පහරවලින් අපට සුවය ලැබී තිබේ. (යෙසායා 53:4-5)**

යෙසායා 53 යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අනාගතවාක්‍යයන් ප්‍රකාශ කරන පරිච්ඡේදයකි. එහි 4 සහ 5 වෙනි පද සුවකිරීමට අදාළ නිසැක සබඳතාවයක් යේසුස්වහන්සේගේ කුරුසියේ මරණයෙන් කරන ලද ශාන්තිකර පූජාවට දක්වයි. එම පරිච්ඡේදයේ භාවිත කර ඇති අවධාරණය කිරීමේ අර්ථය දක්වන "සැබවින්ම" යන පදය අපගේ ගැළවීමට හා සුවයට මාර්ගය සලසන විස්තරයට ප්‍රථමයෙන් සඳහන් කර තිබීම වැදගත්ය.

පාපය සහ රෝගය සාතන්ගේ නපුරු යුගලයයි. ගැළවීම සහ සුවය දෙවියන්වහන්සේ අපගේ නිදහස සඳහා සූදානම් කර තැබූ මාර්ග යුගලයයි. කල්වාරියට ප්‍රථමයෙන් ඉදිරියේ පැමිණෙන්ට තිබූ දේ ගැන අදහා මනුෂ්‍යයන් සුවයත් ගැළවීමත් ලබාගත්හ. නමුත් එයින් පසුව ඒ දෙස ඇදහිල්ලෙන් ආපසු හැරී බැලීමෙන් සුවයත් ගැළවීමත් ලබාගත හැකිය.

පාපය කරණකොටගෙන රෝගයත් මරණයත් පාපයට දඬුවමක් ලෙස පැමිණියේය. එමනිසා ඊට විසඳුම යේසුස්වහන්සේගේ ශාන්තිකර පූජාව තුළ හමුවිය යුතුය. යේසුස්වහන්සේ යම්සේ අපගේ පාපය දැරූ සේක්ද එම අකාරයෙන්ම එම අවස්ථාවේම අපගේ ලෙඩ සහ රෝගද දැරූ සේක.

> **මෙසේ වූයේ උන්වහන්සේම අපේ දුර්වලකම් ගත් සේක. අපේ රෝග උසුලාගත්සේකැයි අනාගතවක්තෘ යෙසායා කරණකොටගෙන කියන ලද කාරණාව සම්පූර්ණවන පිණිසය. (මතෙව් 8:17)**

දෙවියන්වහන්සේ එම ශාන්තිකර පූජාවේදීම අපගේ රෝග සහ පාප යේසුස්වහන්සේ මත පැවරූ සේක. පේතෘස් ගැළවීම සහ සුවය, සම්පූර්ණ කරන ලද දෙයක් ලෙස කථා කරයි.

> **අප පාපවලට නැසී ධර්මිෂ්ඨකමට පිවත්වන පිණිස, උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් ගස පිටදී අපගේ පාපයන් ඉසුලූ සේක. උන්වහන්සේගේ තුවාල වලින් නුඹලා සුවකරනු ලැබුවහුය. (1 පේතෘස් 2:24)**

යේසුස්වහන්සේ ඔබගේ පාප දැරූ නිසා ඔබ උන්වහන්සේ වෙතට පැමිණි විට ඔබව ගැළවීම දෙවියන්වහන්සේගේ කැමැත්ත විය යුතුය. යේසුස්වහන්සේ ඔබගේ රෝග දැරූ නිසා ඔබ උන්වහන්සේ වෙතට පැමිණි විට ඔබව සුවකිරීමද දෙවියන්වහන්සේගේ කැමැත්ත විය යුතුය. ඔබගේ පාපවලට සමාව දුන් දෙවියන්වහන්සේම ඔබගේ සියලු රෝගද සුව කරන සේක.

> **මාගේ ආත්මය, ස්වාමින්ට ප්‍රශංසා කරව, උන්වහන්සේගේ උපකාර සියල්ල සිහිනැති නොකරව, උන්වහන්සේ තාගේ සියලු අයුතුකම් කමාකරනසේක. තාගේ සියලු රෝග සුවකරන සේක. (ගීතාවලිය 103:2-3)**

දෙවියන්වහන්සේගේ ගැළවීමේ නාමය ලෙස හැඳින්වෙන "යොහෝවා සිද්කේනු" යන නාමයෙන් අපගේ ආත්ම ගැළවීම එළිදරව් කරයි. එසේම දෙවියන්වහන්සේගේ සුවකිරීමේ නාමය ලෙස හැඳින්වෙන "යෙහෝවා රාෆා" යන නාමය අපගේ ශරීරවලට ගැළවීම වූ සුවය එළිදරව් කරයි.

රෝම 10:9 භාවිත කර ඇති "ගැළවීම" යන පදය මාක් විසින් පවසා ඇති "යම් පමණ දෙනෙක් උන්වහන්සේ ස්පර්ශ කළෝද ඔව්හු සම්පූර්ණ කරනු ලැබූහ" යන වාක්‍යයේ අර්ථයට සමාන වේ. මෙම ඡේදයන්හි භාවිත කර ඇති "සෝ සෝ" යන ග්‍රීක් වචනයේ අර්ථය පාපයෙන් ගැළවීම සහ එහි දඬුවම යන්නය. රෝගය දඬුවමේ කොටසක් වී ඇති නිසා ගැළවීම පාපයට වන්දිය ලෙස වූ ශාන්තිකර පූජාවේ කොටසකි.

ක්‍රිස්තුස්වහන්සේගේ ශාන්තිකර පූජාවෙන් ඇදහිලිවතුන්ගේ අවසාන සම්පූර්ණත්වය සහතික කර තිබුනත් මනුෂ්‍යයන්ගේ ශාරීරික මෙන්ම ආත්මික අසම්පූර්ණත්වයන් අඛණ්ඩව පවතී. ඇදහිලිවන්තයා අඛණ්ඩව පාපයෙත් රෝගයේත් පහරවලට ලක්වේ. ක්‍රිස්තුස්වහන්සේගේ ශාන්තිකර පූජාවේ අවසාන ප්‍රතිලාභ තවමත් ඉදිරියට එළිදරව් වීමට ඇත.

> **පහනොවන්නාවූ උරුමයක් ගැන, ජීවන බලාපොරොත්තුවක් ලැබෙන පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන උන්වහන්සේ තමන්ගේ මහත් දයාව ලෙස අප නැවත උත්පාදකළ සේක. (1 පේතෘස් 1:5)**

සාදාකාලයේ එළිදරව්වීමට තිබෙන ගැළවීමේ ප්‍රතිලාභයන් ලෙස ශාරීරික හා ආත්මික සම්පූර්ණත්වයන් තිබේ.

යේසුස්වහන්සේ කුරුසියේ මැරුණ අවස්ථාවේ උන්වහන්සේ ඔබගේ පාප ඉවතට ගත්තාද? ඇදහිලිවන්තයෙන් ලෙස ඔබ තවමත් පාපයට විරුද්ධව පොරබදිමින් සිටිනවාද? රෝගය පිළිබඳවත් සත්‍යතාවය එයම වේ. යේසුස්වහන්සේ ඔබේ රෝගය උදෙසා මළ සේක. නමුත් සාතන් තවමත් බැඳ නොමැති නිසා අසම්පූර්ණවූ ලෝකයක ඔබ ජීවත්ව සිටිනතාක් කල් රෝගයට විරුද්ධවද ඔබ පොරබදමින් සිටිය යුතුය.

ගැළවීමේ අතීත, වර්තමාන හා අනාගත කාල ක්‍රියාවක් ඇත :

- අතීත : ඔබ අතීතයේ කරන ලද පාපවලට ඇති දඬුවමින් ඔබ ගැළවී සිටී.
- වර්තමාන : වර්තමානයේ ඔබ පාපයේ බලයෙන් ගැළවී සිටී.
- අනාගත : අනාගතයේ ඔබ පාපයේ පැවැත්මෙන් ගැළවීම ලබනු ඇත (සදාකාලයේ)

සුවය පිළිබඳවද සත්‍යය එයාකාරම වේ. ඔබගේ පාපයට දඬුවම වූ රෝගයෙන් ඔබ ගැලවී සිටී. රෝගයට ඇති බලයෙන් වර්තමානයේ ඔබට ජයගෙන සිටිය හැකිවන අතර රෝගයට ගොදුරුවීමෙන් ඔබ සදාකාලයේ ගැලවී සිටින්නේය.

සුවය ශාන්තිකර පූජාවේ ප්‍රතිලාභයක්ව තිබෙන නිසා ඔබ යේසුස්වහන්සේ පිළිගත යුත්තේ ගැළවුම්කාරයාණන් ලෙස පමණක් නොව සුවදායකයාණන් ලෙසත්ය. ඔබ උන්වහන්සේ ඔබගේ ගැළවුම්කාරයාණන් ලෙස පිළිගෙන නැත්නම් උන්වහන්සේ ඔබව පාපයෙන් නිදහස්කර තබන්නේ කෙසේද? ඔබ උන්වහන්සේ ඔබගේ සුවදායකයාණන් ලෙස පිළිගෙන නැත්නම් උන්වහන්සේ ඔබව රෝගයෙන් නිදහස්කර තබන්නේ කෙසේද?

## සුවකිරීම සඳහා ආධිපත්‍යය පැවරීම

යේසුස්වහන්සේ තමන්වහන්සේගේ අනුගාමිකයන්ට දේව රාජ්‍යයේ ශුභාරංචිය දේශනාකරන්ටත්, උගන්වන්ටත් සුවකිරීමෙන් සහ මිදීමෙන් එහි බලය ප්‍රදර්ශනය කිරීමටත් ආධිපත්‍යය පැවරූ සේක. පහත දැක්වෙන සටහන අධ්‍යයනය කර ඒ සෑම සඳහනක්ම බයිබලයේ සොයා බලන්න.

| | මතෙව් | මාක් | ලූක් | ක්‍රියා |
|---|---|---|---|---|
| දොළොස්දෙනා පිටත්කර හැරීම | 10:1-42 | - | 6:7-13 | 9:1-6 |
| 70 දෙනා පිටත්කර යැවීම | - | - | 10:1-24 | - |
| බැඳීමට හා නිදහස් කිරීමට බලය | 16:17-19 | | | |
| අවසාන ආඥාව | 28:16-20 | 16:14-20 | 24:44-53 | 1:1-11 |

මතෙව් 10:1-42, මාක් 6:7-13 සහ ලූක් 9:1-6 ඇති විස්තර අනුව ප්‍රථම ගෝලයන් දොළොස්දෙනාට පොදුවේ දෙනලද උපදෙස් ලැයිස්තුවක් පහත දී ඇත.

- දෙදෙනා බැගින් යන්න
- ඉශ්‍රායෙල්වරුන් වෙත යන්න
- පසුතැවිල්ල සමග රාජ්‍යයේ පණිවුඩය දේශනා කරන්න
- රෝගීන් සුවකරන්න, සෑම ආකාරයකම ලෙඩ සුවකරන්න
- මළවුන් නැගිටුවන්න
- යක්ෂයන් දුරු කරන්න
- ලාදුරු රෝගීන් පවිත්‍ර කරන්න
- ගමනට ඇඳුම්වත් මුදල්වත් සූදානම් කර නොගන්න
- නොමිලේ නුඹලා ලැබුවහුය. නොමිලේ දෙන්න
- සාතන්ට සහ නපුරු ආත්මයන්ට ඉහළින් බලය හා ආධිපත්‍යය දී ඇත.

ලූක් 9:6 සහ මාක් 6:12-13 ඔවුන්ගේ මෙහෙයේ ප්‍රතිඵල වාර්තා වේ.

ලූක් 10:1-24, 70 දෙනාට ආධිපත්‍යය පැවරීම අපට කියවිය හැකිය. එහිදී දුන් උපදේශයන් නම්:

- ඔබේ මාර්ගයේ යන්න : ඔවුන්ගේ මෙහෙය ඉශ්‍රායෙල්වරුන්ට පමණක් සීමා නොවීය. ඔවුන්ට හැකි සෑම නගරයකට යාමට හැකියාව තිබුණි.
- රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කරන්න.
- රෝගීන් සුව කරන්න.
- ගමනට ඇඳුම් හෝ මුදල් සූදානම් කිරීමට නොනවතින්න
- සර්පයන් පෑගීමට බලය ඔවුන්ට දෙන ලදී, සතුරාට විරුද්ධව සිටීමට මුළු බලය දුන් අතර කිසිවකින් ඔවුන්ට හානි සිදුවේ.

ඔවුන්ගේ මෙහෙයේ ප්‍රතිඵල ලූක් 10:17 වාර්තා කර ඇති අතර ඊට යේසුස්වහන්සේගේ ප්‍රතිචාරය ලූක් 10:18-20 ඇත.

අවසානවරට යේසුස්වහන්සේ විසින් ගෝලයන්ට ආධිපත්‍යය පැවරීම මතෙව් 28:18-20, මාක් 16:16-20 (මහා ආඥාව නමින් හඳුන්වන) සහ ලූක් 24:44-53 හි වාර්තාකර ඇත. මෙම ආඥාව සියලුම ඇදහිලිවතුන් විසින් සම්පූර්ණ කළ යුතුය. මේ සියලුම සඳහන් කිරීම් ඇසුරෙන් එහිදී දෙන ලද උපදේශයන් සාරාංශගත කොට පහත දැක්වේ.

- නුඹලා ගොස් සියලු ජාතීන්ට උගන්වන්න : මුළු ලෝකයට යන්න, සෑම ජාතීන් අතරට යන්න, යෙරුසලමෙන් ආරම්භ කර, සෑම පුද්ගලයෙකු වෙතට යන්න.

- උන්වහන්සේගේ නාමයෙන් ඇති පාප කමාවත්, පසුතැවිල්ලත් දේශනා කරන්න.

- ශුභාරංචිය උගන්වන්න, ඔවුන් හැරුණු පසු යේසුස්වහන්සේ ආඥා කරන ලද සියල්ල පවත්වන්ට හැරුණ අයට උගන්වන්න.

- මෙම කාර්යය සඳහා අවශ්‍ය බලය පොරොන්දු වී ඇත. අදහාගත් අය සමග මේ ලකුණු සිදුවේ: යක්ෂයන් දුරුකිරීම, නව භාෂාවන් කථා කිරීම, හානියක් නොවී සර්පයන් ඇල්ලීමට හැකිවීම, හානියක් නොවී මරණීය විෂ පානය කිරීම සහ රෝගීන් පිට අත් තැබූ කල ඔවුන් සුවය ලැබීම.

- මේ ආඥාව සම්පූර්ණකරන අය සමග යේසුස්වහන්සේ සිටිනු ඇත.

සෑම සැබෑ නව උත්පත්තිය ලැබූ ඇදහිලිවන්තයෙක්ම මෙම ආඥාව සම්පූර්ණ කිරීමේ සෑම ජාතීන් අතරට ගැළවීමේ, සුවකිරීමේ හා මිදීමේ ශුභාරංචිය ගෙනයාමේ කාර්යයේ නියුක්ත විය

යුතුය. සුවකිරීමේ මිදිමේ සේවය සභාවට තෝරාගැනීමට ඇති සේවාවක් නොවේ. එය මහා ආඥාවේ ඉතා වැදගත් කොටසකි.

## රාජ්‍යයට යතුරු

දේව රජ්‍යය තේරුම් ගැනීමට අවශ්‍ය "යතුරු" වූ බොහෝ සත්‍යතාවයන් නව ගිවිසුමේ ඉගැන්වීම් තුළ යේසුස්වහන්සේ විසින් දී තිබේ. මේවායින් තුනක් සුවය පිළිබඳ සේවය කිරීම සහ සුවය ලබාගැනීම පිළිබඳව ඉතා වැදගත් වේ. එයින් **පළමුවැන්න** නම්, ඔබගේ ප්‍රධානතම අවධානය දේව රාජ්‍යය පිළිබඳව නම් ඔබගේ අනිකුත් සියලුම අවශ්‍යතාවයන් (සුව වීම ඇතුළත්ව) සපයන බවට ඇති පොරොන්දුවය.

> **නුමුත් පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද ධර්මිෂ්ඨකමද සොයාපල්ලා. මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය. (මතෙව් 6:33)**

**දෙවැන්න**, ලැබීම සඳහා ඔබ විසින් දිය යුතුවීමය.

> **දීපල්ලා, එවිට නුඹලාටත් දෙනු ලැබෙන්නේය. ඔව්හු ඔබමින් සොලවමින් උතුරවමින් නුඹලාගේ ඔඩොක්කුවලට හොඳාකාර මැන දෙන්නෝය. මක්නිසාද නුඹලා යම් මිම්මකින් මැනදෙන්නහුද එයින්ම නැවත නුඹලාටත් මැනදෙනු ලැබෙන්නේයයි කීසේක. (ලූක් 6:38)**

ඔබට සුවය ලබන්ට අවශ්‍ය නම්, සුවකිරීමේ සේවය ආරම්භ කරන්න. ඔබ දෙන විට ඔබට ලැබේ. අබිමෙලෙක්ගේ වඳ භාර්යාවට ආබ්‍රහම් යාච්ඤා කළ විට, තමාගේම භාර්යාවවූ සාරා වඳව සිටියදීම (අබිමෙලෙක්ගේ භාර්යාව) සුවය ලැබුවාය. ඉන්පසු සාරා ගර්භණීව ඊසාක් බිහි කළාය.

**තෙවන** වැදගත් මූලධර්මය නම් දෙවියන්වහන්සේ සමග කිසිවක් අපහසු නොවන බවය.

> **උන්වහන්සේද: මනුෂ්‍යයන්ට නුපුළුවන් දේ දෙවියන්වහන්සේට පුළුවනැයි කීසේක. (ලූක් 18:27)**

## ස්වයං පරීක්ෂණය

1. සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. සුවය පිළිබඳව පැරණි ගිවිසුම් ඉගැන්වීම සාරාංශ කරන්න.

3. යේසුස්වහන්සේගේ සහ මුල් සභාවේ නිදසුන් උපයෝගිකර ගනිමින් සුවය පිළිබඳ නව ගිවිසුම් ඉගැන්වීම සාරාංශ කරන්න.

4. සුවය යේසුස්වහන්සේගේ ශාන්තිකර පූජාවේ ප්‍රතිලාභයක් බව ශුද්ධ ලියවිලිවලින් ඔප්පු කරන්න.

5. සුවය සහ නිදහස්කිරීමට අදාළව මහා ආඥාව සාරාංශ කරන්න.

6. සියලුම ඇදහිලිවතුන් සුවකිරීමේ සහ මිදීමේ නියුක්ත විය යුතු

7. මේ පාඩමෙහි සාකච්ඡා කරන ලද සුවකිරීමට අදාළ රාජ්‍යයේ යතුරු තුනවූ සත්‍යතාවයන් මොනවාද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. සුවය පිළිබඳ බයිබලිය පදනමට අදාළ අධ්‍යයනය මේ අත්පොතෙහි ඇමුණුම භාවිත කරමින් දිගටම කරගෙන යන්න. ඇමුණුමෙහි සඳහන් පර්යේෂණ සටහන් අවසන් කළ පසු ඔබගේම අධ්‍යයන සටහන් ඇමුණුමට එකතු කරගනිමින් ඔබගේ අධ්‍යයනය ව්‍යාප්ත කර ගන්න.

2. සුවකිරීමේ සේවයේ නියුක්ත වූවන්ගේ අසාර්ථක වීම් පිළිබඳ වාර්තාවලින් තොරව අපගේ සුවය පිළිබඳ බයිබලිය පදනමට අදාළ අධ්‍යයනය අසම්පූර්ණය. එවැනි අවස්ථා සමග අප ගනුදෙනු කරන විට මතක තබාගත යුතු කරුණක් නම් ශුද්ධ ලියවිලි විග්‍රහ කිරීමේදී එහි ඇති පොරොන්දු සහ ඉගැන්වීම් මත මිස පුද්ගලික අත්දැකීම් මත පදනම් නොවන බවය. සෑමවිටම මනුෂ්‍යයාගේ පැත්තෙන් අසාර්ථකවීම් සිදුවිය හැකිය.

එපප්‍රොදිතස් (පිලිප්පි 2:25-27) ඔහුගේ රෝගයේදී මරණාසන්නව සිටියේය. පාවුල්තුමා ඔහුට මෙහෙකරන්ට ඇති නමුත් ඔහු ඉක්මන් සුවයක් අත් නොදැක සිටියේය. නමුත් එපප්‍රොදිතස් පසුව සුවය ලැබුවේය. ක්‍රමවත්ව සුවය ලැබුවත් ක්ෂණිකව සුවය ලැබුවත් ස්වභාවිකව සුවය ලැබුවත් සියලුම හරියාකාර සුවයන් දෙවියන්වහන්සේගෙන් පැමිණෙන බව අප විසින් මතක තබාගත යුතුය. ක්ෂණික දිව්‍යමය සුවය අත්නොදකින නමුත් ඔබ අසාර්ථක වී නැත.

ත්‍රොපිමස් නම් රෝගී අයෙක් එහි නවත්වා ඒමට සිදුවීමක් පිළිබඳව 2 තිමෝති 4:20 කථාකරයි. ඔහු පිළිබඳ විස්තරය ඉතා කෙටි එකක් බැවින් එයින් රැස්කර ගත හැකි කරුණු නැත. පාවුල් ඔහු රෝගීව තබා ගිය අතර පසු දිනයක ඔහු සුවය ලැබුවේද යන්න අපට පවසා නැත.

මතෙව් 17:14-21, මාක් 9:14-29 සහ ලූක් 9:37-45 යක්ෂාත්මයක් විසින් පීඩාවට පත්කරනු ලැබූ තරුණයෙකු නිදහස් කිරීමට ගෝලයන් අසමත්වූ බව වාර්තාකර ඇත. මේ ස්ථාන තුනෙහිම සඳහන් බයිබලිය විස්තර ඔහු ගැන මෙම කරුණු හෙළිදරව් කරයි.

- සිහි නැතිවීම
- තද වේදනාවට පත්වීම
- ගින්නේ සහ ජලයේ නිතර වැටීම
- ආත්මය විසින් තුවාල සිදු කිරීම
- ගොළුභාවය
- ආත්මය විසින් ඉරා දමනු ලැබීම
- දත්මිටි කෑම
- කුඩාකල පටන් බලපෑම තිබීම

යේසුස්වහන්සේට අනුව මේ කාරණයේදී ගෝලයන් අසමර්ථ වූයේ ඔවුන්ගේ නොඇදහිල්ල නිසාත් විශේෂයෙන් ඒ ආකාරයේ යක්ෂාත්ම දුරුකිරීමට බලය ලබාගත යුත්තේ යාච්ඤාවෙන් සහ නිරාහාරයෙන් නිසාත්ය. ඒ සමගම ඔවුන් අවට පැවති නොඇදහිල්ලේ වාතාවරණයත් ඊට හේතුවන්ට වූවා විය හැක. මන්ද ඔවුන් වටකර සිටි ආගමික නායකයන් හා සමග විවාදයට පිවිසීමට සිදුවීම සාක්ෂියක් වේ. එමෙන්ම මෙම කථාන්තරයෙන් ප්‍රදර්ශනය කෙරෙන තවත් කරුණක් නම් සමහර යක්ෂාත්ම වඩා ප්‍රබල බවයි. මෙම යක්ෂාත්ම සමග ක්‍රියාකිරීම පිණිස විශේෂ ආත්මික සූදානමක් අවශ්‍ය වන බවත් මේ සිද්ධිය සනාථ කරයි.

මෙම සිද්ධියේදී යේසුස්වහන්සේ ක්‍රියා කළ ආකාරය මෙසේය. ප්‍රථමයෙන්ම උන්වහන්සේ "මේ දරුවා කොතරම් කලක පටන් මෙසේ සිටින්නේද?" යි පියාගෙන් ඇසූ සේක. පියා ප්‍රතිචාර දක්වමින් ඔහුට මේ බලපෑම කුඩාකල පටන් තිබුණ බව පැවසීය. යේසුස්වහන්සේ නපුරු ආත්මයට තරවටුකරමින් එලියට එන ලෙසත් ආපසු ඇතුල් නොවන ලෙසත් පැවසූ සේක. ආත්මය තරුණයා ඉරා දමා පොළොවේ වැටුණ අතර බිම පෙරළෙමින් පෙණ දැමීමට පටන්ගත්තේය. යේසුස්වහන්සේ ඒ ආත්මය හැඳින්වූයේ අශුද්ධ, ගොළුබිහිරි ආත්මය ලෙසින්ය. ඇතැම් අය තරුණයා මැරුණේයයි සිතූ නමුත් යේසුස්වහන්සේ ඔහුව අතින් ගෙන නැගිටුවා සිටවූ සේක. ආත්මය ඔහු අත්හැර ගිය අතර ඒ පැයේදීම ඔහු සුවය ලැබුවේය.

මෙම සිද්ධිය පිළිබඳව ප්‍රවේශම් විය යුතු එක් කරුණක් : සෑම ගොළුබිහිරි රෝගීන් හා අපස්මාර රෝගීන් යක්ෂාවේශ වූවන් වශයෙන් වර්ග නොකිරීමට ප්‍රවේසම් විය යුතුය. සෑම ගොළු බිහිරි

වුවන් යක්ෂාත්ම ආවේශවූ අය නොවෙති. එම තත්වය ඇතිවීමට අදාළ යම් රෝගී තත්වයන්ගෙන් පෙලී සිටීම හෝ අනතුරුවලට භාජනය වීම නිසා සිදුවන්නට පුළුවන.

එමෙන්ම යක්ෂාවේශයක් නොවූ "අපස්මාර" රෝගී තත්වයන්ද ඇත. අපස්මාර රෝගී ලක්ෂණ සමාන වේ (පහත සටහන බලන්න) අපස්මාර රෝගී ලක්ෂණ මොළයේ ඇති ස්නායු සෛලවලින් හදිසියේ ශක්තිය නිකුත්කිරීම නිසා ඇතිවේ. ඒ සඳහා බොහෝ හේතු තිබෙන්ට පුළුවන. ඇතැම් අපස්මාර රෝගීන්ගේ රෝග හේතුව සොයාගැනීමට හැකිය (එය නිදසුනක් ලෙස මොළයේ ගෙඩියක් වන්ට පුළුවන) එය වෛද්‍ය ප්‍රතිකාරයෙන් සුව කළ හැකිවේ. අන් අවස්ථාවල හේතුව දැනගැනීමට නොහැකිය.

| අපස්මාර සිහි මුර්ජාව | තරුණයාගේ සිහි මුර්ජාව |
|---|---|
| සාමාන්‍යයෙන් කුඩා කල සිට විය හැකිය | කුඩා කාලයේ ආරම්භ විය |
| හදිසියේ මතුවේ | හදිසියේ මතුවේ |
| සිහිය නැතිවේ | තරුණයා සිහි නැති විය |
| නිතර තුවාල සිදුවේ | ගින්නෙන් හා ජලයෙන් අනතුරු |
| පසුව නිදිමත හා වෙහෙස | තරුණයා වෙහෙසට පත්විය |
| | ඇතැම් අය ඔහු මළා යයි සිතුහ |

3. සුවය තිබෙන්නේ ශාරීරික තත්වයන් සඳහා පමණක් නොවේ. බයිබලිය වාර්තාවේ මේ දේ අපට හමුවේ:

   - බිඳුණු සිත් සුවකිරීම. ගීතාවලිය 147:3
   - පාපකාරී ප්‍රාණය සුවකිරීම. ගිතාවලිය 41:4
   - පසුබටවූවන් සුවකිරීම. යෙරමියා 3:22, හොෂියා 14:4
   - ජලය සුවකිරීම, 2 රාජාවලිය 2:21, 22, එසෙකියෙල් 47:8,9
   - ඉශ්‍රායෙල් සෙනඟ සහ යෙරුසලමේ නගරය සුවකිරීම. 2 ලේකම් 7:14, 30:20, යෙසායා 30:26, 57:18, හොෂියා 11:3
   - ඊජිප්තුව සහ අන්‍යජාතින් සුවකිරීමේ පොරොන්දුව. යෙසායා 19:22, 57:19.

4. ශරීර, ප්‍රාණ සහ ආත්ම නම් මිනිසාගේ ත්‍රිවිධ ස්වභාවය ගැන මේ පාඩමේ සැකෙවින් සාකච්ජාකර ඇත. මේ විෂය පිළිබඳව වඩා ඉගෙනගැනීමට බයිබලයේ "ශරීරය, ප්‍රාණය සහ ආත්මය" ගැන තිබෙන වචනය අධ්‍යයනය කරන්න. සුවය පිළිබඳව සේවයේදීත් සුවය ලබාගැනීමටත් ශරීරය, ප්‍රාණය සහ ආත්මය සහ ඒවායේ ක්‍රියාකාරිත්වයක් තේරුම්ගැනීම ඔබට වැදගත් වේ.

5. සුවකිරීම සහ මිදීමට අදාළ ශුද්ධ ලියවිලි පාඨ ලයිස්තුවක් මෙහි ඇත.

**පැරණි ගිවිසුමේ පද**

| | |
|---|---|
| උත්පත්ති 17:18-19 | සාරාගේ වඳභාවය සුවකිරීමට දෙවියන්වහන්සේ පොරොන්දු වූ සේක. |
| උත්පත්ති 21:1-7 | සාරාගේ වඳභාවය සුවකරනු ලැබීය. |
| උත්පත්ති 20:17 | දෙවියන්වහන්සේ අබිමෙලෙක් සුව කළ සේක. |
| නික්මයාම 4:1-18 | මෝසෙස් අතෙහි කුෂ්ඨය සුව කළ සේක. |
| නික්මයාම 15:25-26 | "ස්වාමින්වහන්සේ ඔබගේ වෛද්‍යවරයාණෝය" යන අර්ථ ඇති "ජෙහෝවා රාෆා" නමින් දෙවියන්වහන්සේ |

| | |
|---|---|
| | එළිදරව් වීම. ඉශ්‍රායෙල්වරුන් මත මිසරයේ කිසිම රෝගයක් නොඑවීමට උන්වහන්සේ පොරොන්දු වූ සේක. |
| නික්මයාම 23:25 | තමන්වහන්සේගේ සෙනඟ වෙතින් සියලු රෝග පහකිරීමට දෙවියන්වහන්සේ පොරොන්දු වූ සේක. |
| ලෙවී කථාව 13:1-46, 14:1-32 | ලාදුරු රෝගය පිළිබඳ නීති |
| ලෙවී කථාව 15:1-33 | සෞඛ්‍ය නීතීන් |
| ලෙවී කථාව 16:29-30 | පාප සුවකිරීම |
| ගණන් කථාව 12:1-15 | මිරියම්ගේ සහ ආරොන්ගේ කුෂ්ඨයන් |
| ගණන් කථාව 16:41-50 | ඉශ්‍රායෙල් වෙත රෝග පීඩාව පැමිණීම |
| ගණන් කථාව 21:4-9 | සංකේතාත්මක පිත්තල සර්පයා තුළින් සුවය |
| ද්විතිය කථාව 7:15 | දෙවියන්වහන්සේට කීකරුවීමෙන් සුවය ලැබීම |
| ද්විතිය කථාව 28:1-68 | දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට අප කීකරු නොවීමේ ප්‍රතිඵලය රෝගී වීම. |
| ද්විතිය කථාව 29:22 | දේශය මත ස්වාමින්වහන්සේ රෝගය එවීම |
| ද්විතිය කථාව 30:20 | දෙවියන්වහන්සේ ජීවනයයි දීර්ඝ ආයුෂයි |
| ද්විතිය කථාව 32:29 | තුවාල සිදුකිරීමත් සුවකිරීමත් දෙවියන්වහන්සේගෙන්ය |
| ද්විතිය කථාව 7:15, 28:60 | මිසරයේ රෝග |
| යෝෂුවා 5:8 | චර්මඡේදයේ තුවාල ස්වභාවික සුවය |
| විනිශ්චයකාරයා 13:2-24 | මානෝවාගේ භාර්යාව “දේව මනුෂ්‍යයා” විසින් සුවකරනු ලැබීම. |
| 1 සාමුවෙල් 6:3 | අපරාධ පූජාවකින් සුවය ලැබිය |
| 1 සාමුවෙල් 16:14-23 | නපුරු ආත්මයක් සාවුල්ට කරදර කිරීම |
| 1 රාජාවලිය 5:23, 2 ලේකම් 16:12 | පාදවල රෝග |
| 1 රාජාවලිය 8:37-40 | දේශයේ වසංගතය |
| 1 රාජාවලිය 13:4-6 | වියළි අතක් සහිත මනුෂ්‍යයෙක් |
| 1 රාජාවලිය 17:17-24 | එලියා දරුවෙක් මළවුන්ගෙන් නැගිටුවීම (පණිවුඩය හා පණිවුඩකරු සුවයෙන් හඳුනාගැනීම) |
| 2 රාජාවලිය 1:2, 8:8-9 | මා මේ රෝගයෙන් සුවය ලබයිද? |
| 2 රාජාවලිය 2:19-22 | එලිෂා විසින් ජලය සුවකිරීම |
| 2 රාජාවලිය 4:8-37 | ෂුනෙම්මීය ස්ත්‍රියගේ පුත්‍රයා නැගිටුවීම |
| 2 රාජාවලිය 5:1-14 | නාමන් සුවකිරීම |
| 2 රාජාවලිය 13:14,21 | එලිෂා මරණය පිණිස රෝගාතුරවීම |
| 2 රාජාවලිය 20:1-11 | හෙසකියාගේ රෝගය (යෙසායා 38:1-8 ද බලන්න) |
| 2 ලේකම් 6:26-31 | පසුතැවිල්ල සහ සුවය සඳහා යාච්ඤාව |
| 2 ලේකම් 7:14 | “මම දේශය සුවකරන්නෙමි” |

| | |
|---|---|
| 2 ලේකම් 16:12 | බරපතල රෝගයක් ඇති මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේ නොසෙවීම |
| 2 ලේකම් 20:9 | අප වේදනාවෙන් කෑගසන විට දෙවියන්වහන්සේ සවන් දෙන සේක. |
| 2 ලේකම් 21:12-30 | බඩවැල්වල අසාමාන්‍ය රෝගයක් |
| 2 ලේකම් 24:25 | රෝගය බරපතලයයි පැවසීම |
| 2 ලේකම් 26:19 | උස්සියාගේ ලාදුරු රෝගය |
| 2 ලේකම් 30:20 | හෙසකියාගේ යාච්ඤාවෙන් සෙනඟ සුවවීම |
| 2 ලේකම් 32:24-26 | හෙසෙකියාගේ රෝගය |
| යෝබ් 1-2 | මේ පරිච්ඡේදවලින් යෝබ්ගේ රෝගය ඇතුළු ඔහුගේ ප්‍රශ්නවල මූලාශ්‍රය හෙළිදරව් කරයි. |
| යෝබ් 5:18, 30:18 | යෝබ් තමාගේ රෝගය ගැන කථා කරයි |
| ගීතාවලිය 6:2-3 | "අහෝ ස්වාමිනි මා සුවකළ මැනව" |
| ගීතාවලිය 27:1 | "මගේ ජීවිතයේ ශක්තිය ස්වාමින්වහන්සේය" |
| ගීතාවලිය 30:2 | "මම මොරගැසීමි ඔබ මා සුව කළ සේක" |
| ගීතාවලිය 32:3-5 | පාපය පිළිගැනීමේ ප්‍රතිඵලය සුවය විය. |
| ගීතාවලිය 34:19-20 : | "ධර්මිෂ්ඨයාගේ පීඩා බොහෝය. නමුත් ස්වාමින්වහන්සේ ඒ සියල්ලෙන් ඔහු ගළවන සේක." |
| ගීතාවලිය 38:37 | කෝපය හා පාපය ඔබගේ සෞඛ්‍යයට බලපායි. රෝගය "දැවිල්ලක්" ලෙස සඳහන් කර ඇත. |
| ගීතාවලිය 41:7-8 | "මාගේ ප්‍රාණය සුව කළ මැනව. මන්ද මම ඔබට විරුද්ධව පව් කළෙමි" රෝගය නපුරු ලෙස සඳහන් කර ඇත. |
| ගීතාවලිය 42:11, 43:5 | අපගේ මුහුණේ සුවදායක බව දෙවියන්වහන්සේය. |
| ගීතාවලිය 42:1-5 | මලානිකවූ ආත්මයට සුවය |
| ගීතාවලිය 55:1-2 | දරා සිටීමේ යාච්ඤාව හා සුවය |
| ගීතාවලිය 60:2 | පොළොවේ බිඳුම් සුවකළ මැනව |
| ගීතාවලිය 67:2 | "පොළොවේ ඔබගේ මාර්ගය ප්‍රකාශවන පිණිස, සියලු ජාතීන් අතරේ ගැළවීම ප්‍රකාශවන පිණිස" |
| ගීතාවලිය 72:13 | දුප්පතුන් හා දිළින්දන් කෙරෙහි අනුකම්පා කරන සේක. |
| ගීතාවලිය 91:9,10 | "නුඹේ කූඩාරමට වසංගතයක් ළං නොවන්නේය" |
| ගීතාවලිය 103:1-5 | "උන්වහන්සේගේ උපකාර සියල්ල සිහි නැති නොකරව. උන්වහන්සේ නුඹේ සියලු රෝග සුව කරන සේක. |
| ගීතාවලිය 105:37 | එකම දුර්වලයෙක්වත් ඔවුන් අතර නොමැතිව ඉශ්‍රායෙල්වරුන් පිටතට ගෙනන සේක. මිලියන 3 ක් |

| | |
|---|---|
| | සෙනඟ සියලු දෙනාම යහපත්ව ශක්තිමත්ව සිටියහ. |
| ගීතාවලිය 107:17-20 | උන්වහන්සේගේ වචනය යවා ඔවුන් සුවකළ සේක. |
| ගීතාවලිය 119:25-28 | වචනයෙන් අප ශක්තිමත්ව සිටිමු |
| ගීතාවලිය 119:67 | "විපත්ති පැමිණෙන්ට පළමුවෙන් මම මුළාව ගියෙමි" |
| ගීතාවලිය 147:3 | උන්වහන්සේ බිඳුණු සිත් ඇත්තන් සුවකරන සේක. ඔවුන්ගේ තුවාල සුව කරන සේක. |
| ගීතාවලිය 105:37 | උන්වහන්සේ ඔවුන් එළියට ගෙනා සේක . . . එකම දුර්වලයෙක්වත් ඔවුන් අතර නොවීය. |
| ගීතාවලිය 4:20-23 | ජීවනය නික්මෙන්නට සිතෙහි ආකල්ප බලපායි. දෙවියන්වහන්සේගේ වචනය ජීවනයයි. ඒවා සම්බවන්නන්ට ඒවා ජීවනයත් සකල ශරීරයට සුවයත් වේ. |
| හිතෝපදේශ 12:18 | ප්‍රඥාවතුන්ගේ දිව සුවය ගෙන දෙන්නේය. |
| හිතෝපදේශ 13:17 | විශ්වාස තානාපතියා සුවය උපදවයි. |
| හිතෝපදේශ 15:4, 30 | ශාන්තිදායක ජීවන වෘක්ෂයක්ය. යහපත් ආරංචියක් සුවයට හේතුවෙයි. |
| හිතෝපදේශ 16:24 | දෙවියන්වහන්සේගේ වචනය ඇටවලට සුවය ගෙන දේ. |
| හිතෝපදේශ 17:22 | බිඳුනාවූ සිත ඇටවලට බලපායි |
| දේශනාකාරයා 3:3 | සුවකිරීමට වේලාවක් ඇත. |
| දේශනාකාරයා 5:17 | කනගාටුව හා උදහස සුවයට සම්බන්ධය |
| යෙසායා 6:10 | තේරුම්ගැනීම, හැරීම, සුවයයි. |
| යෙසායා 19:22 | දෙවියන්වහන්සේට බලකර ඉල්ලනවිට උන්වහන්සේ සුවකරන සේක. |
| යෙසායා 32:3-4 | සුවකිරීම දේවරාජ්‍යයේ කොටසකි |
| යෙසායා 33:24 | "එහි පදිංචිකරුවන්" මට කිසිරෝගයක් නැතැයි කියයි |
| යෙසායා 35:5-6 | දහස් අවුරුදු පාලන සමයේ සුවය |
| යෙසායා 38:1-12, 16 | හෙසකියාගේ රෝගය සහ ඔහුගේ සුවපත්වීම |
| යෙසායා 53:5 | ශාන්තිකර පූජාවෙන් අපට සුවයත් නිදහසත් පොරොන්දුවී ඇත. |
| යෙසායා 57:18-19 | සුවය ලබාගැනීම පිණිස ළංවන්න |
| යෙසායා 58:8 | සුවය නික්මවනු ඇත. |
| යෙසායා 61:1 | බිඳුණු සිත් සුවකිරීමට යේසුස්වහන්සේ එවන ලදී (සිත් සුවකිරීමට) |
| යෙසායා 58:8 | වේගයෙන් සුවය නික්ම එනු ඇත. |
| යෙරමියා 3:22 | අප උන්වහන්සේ වෙතට හැරී ආවිට පසුබටවූවන් |

| | |
|---|---|
| | දෙවියන්වහන්සේ සුවකරනු ඇත. |
| යෙරමියා 8:14-15, 20-22 | සුවකිරීමට කාලයකි. තිත්තකමේ පාපය ශරීර සුවය හා බැඳී පවතී. |
| යෙරමියා 15:18 | සුවකළ නොහැකි තුවාලයක් සමග ගනුදෙනු කරන ආකාරය |
| යෙරමියා 14:19 | අපට සුවයක් නැද්ද? |
| යෙරමියා 17:14 | “මා සුව කළ මැනව එවිට මා සුවවන්නේය” |
| යෙරමියා 30:12-17 | දෙවියන්වහන්සේ ඔවුන්ගේ සුවය නැවත ලබා දෙන සේක. |
| යෙරමියා 33:6 | මම ඔවුන් සුවකරන්නෙමි. |
| යෙරමියා 46:11 | “නුඹ සුවනොකරනු ඇත” |
| යෙරමියා 51:8-9 | බැබිලෝනිය සුවපත් කිරීම |
| විලාප ගී 2:13 | “ඔබ සුවකළ හැක්කේ කාටද?” |
| විලාප ගී 3:33 | දෙවියන්වහන්සේ හිතාමතා පීඩාව නොපමුණුවන සේක” |
| එසකියෙල් 14:19 | “අපට සුවකිරීමක් නැද්ද?” |
| එසකියෙල් 17:14 | “මා සුව කළ මැනව. එවිට මා සුව වන්නේය.” |
| එසකියෙල් 30:17 | “මම සුවය ප්‍රතිස්ථාපනය කරන්නෙමි” |
| එසකියෙල් 30:12-13 | සුවකළ නොහැකි තුවාල ඖෂධවලින් ද සුවකළ නොහැක |
| එසකියෙල් 30:21 | දෙවියන්වහන්සේ බිඳ දමන දේ සුවකළ නොහැකිය. |
| එසකියෙල් 33:6 | “මම ඔවුන් සුවකරන්නෙමි” |
| එසකියෙල් 34:4, 16, 21 | සුව නොකරන ලද එඬේරුන්ට අවවාදයක් |
| එසකියෙල් 46:11 | “නුඹ සුවකරනු නොලබන්නෙහිය” |
| එසකියෙල් 47:8-12 | ජලය සුවකිරීම |
| දානියෙල් 4:34, 36 | නෙබුකද්නෙශර්ගේ සුවය |
| හොෂියා 5:13 | සුවය සඳහා වෙනත් ස්ථානයකට යාම දෙවියන්වහන්සේ විසින් කරන ලද තුවාලයක් මිනිසෙකුට සුවකළ නොහැකිය. |
| හොෂියා 6:1 | උන්වහන්සේ ඉරා දමා ඇත. උන්වහන්සේම සුවකරනුද ඇත. |
| හොෂියා 7:1 | ඉශ්‍රායෙල්ට සුවය |
| හොෂියා 11:3 | “මා ඔවුන් සුවකළ බව ඔව්හු නොදකින්නෝය” |
| හොෂියා 14:4 | “මම ඔවුන්ගේ පසුබටවීම් සුවකරන්නෙමි” |
| නාහුම් 3:19 | මාරාන්තික අවස්ථාවන් |
| සෙකරියා 11:16 | සුවකිරීම නොකළ එඬේරුන්ට අවවාදයක් |
| මලාකි 4:2 | උන්වහන්සේගේ පියාපත්වල සුවය |

## නව ගිවිසුමේ පද

| | |
|---|---|
| මතෙව් 8:13 | හමුවූ අවස්ථාව කාලය නිර්ණය කිරීම |
| මතෙව් 8:17 | යේසුස්වහන්සේ අපගේ පාප දැරූ සේක |
| මතෙව් 10:1 | රෝගවලට හා යක්ෂාත්මවලට ඉහළින් බලය ගෝලයන්ට දුන්සේක |
| මතෙව් 18:19-21 | දෙදෙනෙක් එකඟව ඉල්ලන දේ ලැබෙන්නේය. |
| මාක් 2:17 | ක්‍රිස්තුස්වහන්සේ පැමිණියේ පව්කරුවන් සුවකරන පිණිසය |
| මාක් 3:15-17 | ක්‍රිස්තුස්වහන්සේ රෝග සුවකිරීමට බලය දෙන සේක |
| මාක් 4918-19 | සුවය ආලේපයේ කොටසකි. යේසුස්වහන්සේ එවනු ලැබුවේ සුවකිරීම පිණිසය. |
| මාක් 11:24 | ඔබ ඇදහිල්ලෙන් යාච්ඥා කරන විට (යාච්ඥා කිරිමෙන් පසුව නොව) ඔබට ලැබේ. |
| මාක් 16:18 | යේසුස්වහන්සේගේ නාමයෙන් ඇදහිලිවන්තයන් රෝගීන් සුවකරයි. යක්ෂාත්ම දුරු කරයි. |
| ලූක් 5:31 | රෝගීන්ට වෛද්‍යවරයෙක් අවශ්‍යයි |
| ලූක් 7:6 | තමාගේ නොවටිනා බව පිළිගැනීම යේසුස්වහන්සේ ඇදහිල්ල ලෙස දුටු සේක. |
| ලූක් 7:22-23 | වඩාත්ම ඒත්තුගන්වන තර්කය අත්දැකීමය |
| ලූක් 17:6 | කුඩාම ඇදහිල්ලටත් මහත් ප්‍රතිඵල ලැබිය හැකිය |
| ලූක් 18:7-8 | ඔබට පිළිතුර ලැබෙන් තුරු අත් නොහරින්න. |
| (පැරණි ගිවිසුමේ දානියෙල්ගේ කටාවේ දිගින් දිගටම යාච්ඥා කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි. දානියෙල් යාච්ඥාව ආරම්භ කළ දිනයේම දෙවියන්වහන්සේ ඇසූ නමුත් දින 21ක් සාතන් බාධා කළේය) | |
| යොහන් 6:53-58 | යේසුස්වහන්සේගේ ශරීරයත්, රුධිරයත් ජීවනය ගෙන දේ |
| යොහන් 10:10 | අප ජීවනය ලබන පිණිස යේසුස්වහන්සේ පැමිණි සේක. සාතන් පැමිණියේ සොරකම් කිරීමටත් මැරීමටත් විනාශ කිරීමටත්ය |
| යොහන් 11:1-45 | ඒ මොහොතේ සුව නොකරන ලද රෝගයක් මහා බලවත් භාස්කමකට හේතුවෙයි |
| යොහන් 14:12-13 | යේසුස්වහන්සේ කල වැඩ අප කළ යුතුය |
| යොහන් 15:7 | ඉල්ලීම සහ ලැබීමට අදාළව ක්‍රිස්තුස්වහන්සේ තුළ පැවතීමේ වැදගත්කම |
| යොහන් 16:24 | උන්වහන්සේගේ නාමයෙන් ඉල්ලන්න එවිට ඔබට ලැබේ. |
| රෝම 2:4 | දෙවියන්වහන්සේගේ යහපත්කම පසුතැවීමට මගපෙන්වයි (පසුතැවීමට මගපෙන්වන්නේ රෝගය නොවන බවත් දෙවියන්වහන්සේගේ යහපත්කම බවත් දැනගන්න) |
| රෝම 8:19-23 | මුළු ලෝකය දිරායාමේ ක්‍රියාවලිය තුළ පවති |
| 2 කොරින්ති 4:16 | අපගේ බාහිර මනුෂ්‍යයා දිරායන නමුත් අභ්‍යන්තර මනුෂ්‍යයා |

| | |
|---|---|
| | අලුත්කරනු ලබයි |
| එපිස 3:20-21 | අප ඉල්ලනවාටත් හිතනවාටත් ඉතා අධිකව ක්‍රියාකිරීමට දෙවියන්වහන්සේට හැකිය |
| පිලිප්පි 2:25-27 | එපප්‍රොදිතස්ගේ රෝගය |
| කොලොස්සි 4:14 | වෛද්‍යවරයෙක් වූ ලූක්, පාවුල්තුමාගේ ශුභාරංචි කණ්ඩායමේ පංගුකාරයෙක් විය. |
| 2 තිමෝති 4:20 | ත්‍රොපිමස්ගේ රෝගය |
| හෙබ්‍රෙව් 4:15 | අපගේ දුර්වලකම් උන්වහන්සේ දන්නා සේක |
| හෙබ්‍රෙව් 11:1 | නොපෙනෙන දේවලට (සුවය) ඇති සාක්ෂිය ඇදහිල්ලය |
| යාකොබ් 1:8 | අප චංචල නොවී ඇදහිල්ලෙන් ඉල්ලිය යුතුය |
| යාකොබ් 1:17 | සෑම යහපත් දීමනාවත්ම (සුවය) දෙවියන්වහන්සේගෙන්ය |
| යාකොබ් 5:14-15 | තෙල් ආලේපකිරීමට වැඩිමහල්ලන් කැඳවීම, ඇදහිල්ලේ යාච්ඥාව, සුවකිරීම සහ කමාවදීම |
| 1 පේතෘස් 2:24 | උන්වහන්සේගේ පහරවලින් අපි සුවය ලැබුවෙමු |
| 1 යොහන් 3:22 | අප කිකරුනම් අප ඉල්ලන ඕනෑම දෙයක් අපට ලැබිය හැකිය |
| 3 යොහන් 1:2 | ඔබේ ප්‍රාණයේ තත්වයට සුවය අදාළය |
| මාක් 7:36, 8:26, මතෙව් 8:4 | සුවය ප්‍රචාරය නොකරන්න |
| එළිදරව් 20:2-3 | සාතන් බඳිනු ලැබූ කල, රෝගයත් මරණයත් තවදුරටත් නොවන්නේය. |
| එළිදරව් 21:4 | අවසාන සුවය: මරණය හා රෝගය තවදුරටත් නොවන්නේය. |
| | |

6. සුවය සහ නිදහස්කිරීම දෙවියන්වහන්සේ විසින් පොරොන්දුවී තිබේ. දෙවියන්වහන්සේගේ පොරොන්දුවට අදාළ පද කීපයක් මෙහි ඇත. රෝම 1:16, 1 රාජාවලිය 8:56, හිතෝපදේශ 4:22, 2 කොරින්ති 1:20.

# නව වන පරිච්ඡේදය

# සුවකිරීමේ පරමාර්ථයන්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලිවීම
- සුවකිරීමේ පරමාර්ථ නවය හඳුනාගැනීම

**සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:**

> **සවස්වූ කල යක්ෂාවේශ වූ බොහෝ දෙනෙක් උන්වහන්සේ වෙතට ගෙනෙන ලද්දෝය. උන්වහන්සේ වචන මාත්‍රයකින් ආත්මයන් දුරුකළ සේක. රෝගාතුරවූ සියල්ලන් සුවපත් කළ සේක. මෙසේ වූයේ උන්වහන්සේම අපේ දුර්වලකම් ගත් සේක. අපේ රෝග උසුලාගත්සේකැයි අනාගතවක්තෘ යෙසායා කරණකොටගෙන කියන ලද කාරණාව සම්පූර්ණවන පිණිසය. (මතෙව් 8:16-17)**

### හැඳින්වීම

සුවකිරීමේ ඉතාම පැහැදිලි අරමුණ නම් රෝගියෙක් සුවකිරීමයි. මනුෂ්‍යයන් සම්පූර්ණත්වයට ගෙන ඒම හැර තවත් අරමුණු සුවකිරීමට හා නිදහස් කිරීමට ඇත. සුවය තවදුරටත්,

### දෙවියන්වහන්සේගේ චරිතය ප්‍රදර්ශනය කරයි.

සුවකිරීම දෙවියන්වහන්සේ කරුණාවන්ත, යහපත්, කරුණාවෙන් පූර්ණ සහ අනුකම්පා සහිත බව ප්‍රදර්ශනය කරයි.

> **ඔවුන්ගේ රජුන් යදමින්ද ඔවුන්ගේ අධිපතීන් විලංගුවලින්ද බඳින පිණිසත් ලියන ලද විනිශ්චය ඔවුන් කෙරෙහි ඉෂ්ට කරන පිණිසත්ය. මේ ගෞරවය උන්වහන්සේගේ සියලු ශුද්ධවන්තයන්ට ඇත්තේය. ස්වාමින්ට ප්‍රශංසා කරව්. (ගීතාවලිය 149:8-9)**
>
> **උන්වහන්සේ අනුකම්පාවෙන් යුක්තව අත දිගුකොට ඔහු පිට තබා, කැමැත්තෙමි පවිත්‍ර වෙයන්නැයි ඔහුට කීසේක. (මාක් 1:41)**

### දෙවියන්වහන්සේ මහිමයට පත් කරයි

සුවයෙන් දෙවියන්වහන්සේ පැසසීම සහ මහිමයට පත්කිරීම ප්‍රතිඵල ලෙස ඇතිවේ.

> **බොහෝ සමූහයෝ කොරුන්, අන්ධයන්, ගොළුවන්, අබ්බගාතයන් හ වෙනත් බොහෝ දෙනා රැගෙන යේසුස්වහන්සේ ළඟට ඇවිත් උන්වහන්සේ පාමුල ඔවුන් තැබුවෝය. උන්වහන්සේ ඔවුන්ට සුවකළ සේක. ඒ නිසා ගොළුවන් කතාකරන බවත් අබ්බගාතයන් සුවව් ඉන්න බවත් කොරුන් ඇවිදින බවත් අන්ධයන්ට ඇස් පෙනෙන බවත් සමූහයෝ දැක පුදුමව ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේට ප්‍රශංසා කළෝය. (මතෙව් 15:30-31)**
>
> **සිද්ධවුනු දේ ගැන සියල්ලන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කළ බැවින් සෙනඟ නිසා දඬුවම් කරන්ට අන්දමක් නොදැක ඔව්හු ඔවුන්ට තවදුරටත් තර්ජනය කොට යන්ට හැරියෝය. (ක්‍රියා 4:21)**

## යේසුස්වහන්සේ ගැළවුම්කරුවාණන් සහ මෙසියස්වහන්සේ බව සනාථ කරයි

ඔබේ බයිබලයේ මතෙව් 8:14-17 ට කියවන්න. මෙහි වාර්තාකර ඇති සුවකිරීම් යේසුස්වහන්සේ පිළිබඳව ප්‍රොපේතවරයාගේ වචන සනාථ කරයි.

> **මෙසේ වූයේ උන්වහන්සේම අපේ දුර්වලකම් ගත් සේක. අපේ රෝග උසුලාගත්සේකැයි අනාගතවක්තෘ යෙසායා කරණකොටගෙන කියන ලද කාරණාව සම්පූර්ණවන පිණිසය. (මතෙව් 8:17)**

සුවකිරීම සහ මිදීම යේසුස්වහන්සේ ගැළවුම්කරුවාණන් බව සනාථ කරයි. කොර මනුෂ්‍යයෙකු සුවකිරීම සහ ඔහුට පාප කමාවදීම යේසුස්වහන්සේ ගැළවුම්කරුවාණන් මෙන්ම සුවදායකයාණන්ද බව සනාථ කළේය (ලූක් 5:18-26).

> **මම මාගේ පියාණන්වහන්සේගේ ක්‍රියා නොකරම් නම් මා විශ්වාස නොකරල්ලා. නුමුත් ඒවා කරම් නම් නුඹලා මා විශ්වාස නොකරතත් පියාණන්වහන්සේ මා තුළෙහිද මා පියාණන්වහන්සේ තුළෙහිද සිටින බව දැන තේරුම්ගන්නා පිණිස ක්‍රියා විශ්වාසකරපල්ලා යයි කීසේක. (යොහන් 10:37-38)**

> **මේ පොතේ ලියා නැති වෙනත් බොහෝ හාස්කම් යේසුස්වහන්සේ ගෝලයන් ඉදිරියෙහි කළ සේක. නුමුත් මේවා ලියන ලද්දේ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ක්‍රිස්තුස්වහන්සේ බව නුඹලා විශ්වාස කරන පිණිසත් විශ්වාස කොට උන්වහන්සේගේ නාමයෙන් ජීවනය ලබන පිණිසත්ය. (යොහන් 20:30-31)**

## පණිවුඩය හා පණිවුඩකරුවා ස්ථිරකර දෙයි.

1 රාජාවලිය 17 තරුණයා සුවකිරීමේ කථාව කියවන්න. මෙම තරුණයා සුවය ලැබූ විට ඔහුගේ මව ප්‍රොපේත එලියාට මෙසේ පැවසුවාය.

> **ස්ත්‍රීද: ඔබ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙකු බවත් ඔබගේ මුඛයෙහි තිබෙන ස්වාමින්වහන්සේගේ වචනය සැබෑ බවත් දැන් දනිමියි එලියාට කීවාය. (1 රාජාවලිය 17:24)**

සුවකිරීම පණිවුඩය ද පණිවුඩකරුවා ද ස්ථිර කළේය.

> **එහෙයින් ඔව්හු ස්වාමින්වහන්සේ තුළ නිර්භිත ලෙස කථා කරමින් බොහෝ කලක් නැවති සිටියෝය. උන්වහන්සේ ඔවුන්ගේ අත්වලින් හාස්කම්ද පුදුමද කරවමින් ස්වකීය අනුග්‍රහයේ වචනයට සාක්ෂි දැරූ සේක. (ක්‍රියා 14:3)**

එක් බලවත් හාස්කමේ සුවකිරීමකින් පසු ආත්මික සහ දේශපාලන නායකයන්ගේ ප්‍රතිචාරය වාර්තා කර ඇත්තේ මෙසේය.

> **එවිට ඔව්හු පේතෘස්ගේද යොහන්ගේද නිර්භිතකම දැක, ඔවුන් අපණ්ඩිතවූ නුගත් මනුෂ්‍යයන් බව දැන මවිතවූවෝය. ඔවුන් යේසුස්වහන්සේ සමග සිටි බව ඔව්හු ඇඳින්නෝය. (ක්‍රියා 4:13)**

## ශුභාරංචිය පිළිගැනීම දිරිගන්වයි

මනුෂ්‍යයන් සුවකරනු ලැබූ පසු ඔවුන්ට ශුභාරංචිය ප්‍රකාශ කිරීම පහසුය. මේ පිළිබඳව නිදසුන් බොහෝමයක් ක්‍රියා පොතේ තිබේ. ගැළවීමේ පණිවුඩයටත්, ශුද්ධාත්මයෙන් පූර්ණවීම පිණිසත් එමෙන්ම සභාවේ වර්ධනයටත් සුවකිරීමෙන් දොරවල් හැරුණේය (උදා. ක්‍රියා 2:42-47 සහ 5:14 බලන්න). සුවකිරීම ශුභාරංචිය පිළිගැනීමට දිරිමත් කරන නමුත් නිතරම මතක තබාගත යුතු කරුණක් නම් ගැළවීමේ ශුභාරංචිය දේශනාකිරීම වෙනුවට සුවකිරීම භාවිත කළ නොහැකි බවය. මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ සමග නිවැරදි සබඳතාවයකට ගෙනඒමට බලය ප්‍රදර්ශනය කිරීමත් සමග වචනය ඉගැන්වීම කළ යුතුය. ගැළවීම, සුවය සහ මිදීම පිණිස ඇදහිල්ල ඇතිකරන්නේ

දේව වචනයයි. සුවකිරීම ශුභාරංචිය දේශනා කිරීමේ බලවත් මෙවලමකි. ශුද්ධ ලියවිලිවල වාර්තා එය සනාථ කරයි.

1. ශුභාරංචිය දේශනා කරන පසුබිමක සුවය සිදුවූ අවස්ථා 17ක් ඇත.

   - මතෙව් 4:24, 8:16, 9:2-8, 9:32-33
   - මාක් 1:23-28, 9:14-27, 10:46-52
   - ලූක් 8:42-48, 13:10-13, 16, 14:1-4, 17:11-19
   - යොහන් 4:28-30, 5:1-9, 14, 9:1-7,
   - ක්‍රියා 3:1-10, 8:5-8, 14:8-10.

2. අවස්ථා 16 කදී සුවය ශුභාරංචියට උපකාරී විය.

   - මතෙව් 9:2-8, 9:32-33, 12:9-13,
   - මාක් 1:23-28, 5:1-13, 18-20, 7:32-37, 9:14-27
   - ලූක් 5:12-14, 13:10-13, 16, 17:11-19
   - යොහන් 4:28-30, 9:1-7
   - ක්‍රියා 3:1-8, 8:5-8, 9:32-35, 14:8-10

3. අවස්ථා 26 කින් 21 කදී සුවය ශුභාරංචි පසුබිමක හෝ ශුභාරංචියේ ප්‍රතිඵලයක් ලෙස සිදුවී ඇත.

## දේව රාජ්‍යය ස්ථාපනය කරයි

ස්වාමින්වහන්සේ සහ ගෝලයන් විසින් කරන ලද සුවයන් සහ මිදීම දේව රාජ්‍යය ස්ථාපනය කිරීමේ ප්‍රථම අදියර විය.

> **එහි ඉන්න රෝගීන් සුවකරපල්ලා. දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලා ළඟට පැමිණුණේයයි ඔවුන්ට කියාපල්ලා. (ලූක් 10:9)**
>
> **නුමුත් මම දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන යක්ෂයන් දුරුකරම් නම්, සැබවින්ම දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලා කරා පැමිණ තිබේ. (මතෙව් 12:28)**

ඔබ සුවකිරීමේ මෙහෙයේ නියුක්තව සිටින විට දේව රාජ්‍යය එහි සම්පූර්ණත්වයට පැමිණ නැති බව මතක තබාගන්න. දේව රාජ්‍යයේ සම්පූර්ණත්වයේදී රෝග සහ මරණය සම්පූර්ණ වශයෙන්ම නැතිව ගොස් තිබේ. රාජ්‍යයේ සම්පූර්ණත්වයේදී මෙන් ශරීරය සහ ප්‍රාණය නිදහස්වී නැත. ඔබගේ අතීත පාපයට තිබුණ දඬුවමින් ඔබ ගැළවී සිටින අතර පාපයෙහි බලයෙන් වර්තමානයේ නිදහස්ව සිටීමට ඔබට හැකියාව ඇත. අනාගතයේදී පාපයේ අභිමුඛයෙන් ගළවනු ලබන්නේය. රෝගය පිළිබඳවත් සත්‍යතාවය එයමය. රෝගය ඔබගේ අතීත පාපවලට දඬුවමක් නොවේ. ඔබට එහි බලයෙන් වර්තමානයේ නිදහස්වීමට පුළුවන. නමුත් සදාකාලය තෙක් රෝගය අප අතර පවතී.

## සතුරා කෙරෙහි විනිශ්චය ප්‍රදර්ශනය කරයි

ඔබ රෝගීන් පිට අත්තැබීමේදී මේ ලෝකයේ දෙවියා විනිශ්චය කර ඇති බවත් රෝගයේ සහ ලෙඩවල බල විනාශකර ඇති බවත් ප්‍රකාශ කරයි (යොහන් 16:11). විනාශ කර ඇත්තේ රෝගයේ බලය මිස එහි පැවැත්ම නොවන බව මතක තබාගන්න. ඔබ රෝගයේ පැවැත්මෙන් නිදහස් වන්නේ දේවරාජ්‍යයේ සම්පූර්ණත්වයට පැමිණි විට පමණි.

## ආත්මික නායකයන් ඇතිකරයි

බලවත් ආත්මික නායකයන් නැගිටුවීමට සුවකිරීම හේතුවී ඇත. පාවුල්ගේ සුවවීම සිදුවන විට ශුභාරංචියේ අපොස්තුළුවරයා ලෙස ඔහුට කැඳවීම ලැබුනි (ක්‍රියා 9).

## මහත් ප්‍රීතියේ ප්‍රතිඵල අතිකරයි

සුවකිරීම් හා මිදීම් කරන ලද අවස්ථාවලදී මහත්වූ ප්‍රීතියක් පුද්ගලයන් හා ජන සමූහයන් අතර ඇතිවූ බව ක්‍රියා 8:5-25 පවසයි.

## ස්වයං පරීක්ෂණය

1. සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. ශාරීරික සම්පූර්ණත්වයට අමතරව මේ පාඩමේ සාකච්ඡා කරන ලද සුවකිරීමේ අනිකුත් අරමුණු නවය මොනවාද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

ශාරීරික සම්පූර්ණත්වයට අමතර සුවකිරීම සඳහා වෙනත් අරමුණු දෙවියන්වහන්සේට තිබේ. සුවය ගැන නිසැකකමින් ඉල්ලීමටත් එය දෙවියන්වහන්සේගේ කැමැත්ත බව දැනගැනීමත් මෙම අරමුණු අවබෝධ කරගැනීමට උපකාරී වේ. ඔබගේ සුවකිරීමෙන් කුමක් සිදුවන්නේදැයි සිතන්න.

දෙවියන්වහන්සේගේ චරිතය ප්‍රදර්ශනය වීම

---

දෙවියන්වහන්සේ මහිමයට පත්කිරීම

---

යේසුස්වහන්සේ ගැළවුම්කරුවාණන් සහ මෙසියස්වහන්සේ බව ස්ථිර කිරීම

---

ඔබ උගන්වන පණිවුඩය හා පණිවුඩකරුව සහතික කිරීම

---

ශුභාරංචිය පිළිගැනීමට උනන්දු කිරීම

---

දේව රාජ්‍යය ස්ථාපනය කිරීම

---

සතුරා කෙරෙහි විනිශ්චය ප්‍රදර්ශනය කිරීම

---

මහත් ප්‍රීතියක් ප්‍රතිඵලය ලෙස ලබාදීම

---

# දසවෙනි පරිච්ඡේදය

# සුවකිරීමේ දීමනාවන්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලිවීමට
- ශුද්ධාත්මයාණන්වහන්සේ, ත්‍රිත්වයක්වූ දෙවියන්වහන්සේගේ කොටසක් බව හඳුනාගැනීම
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය සාරාංශකර දැක්වීම
- "ආත්මික දීමනා" විග්‍රහ කිරීම
- "සුවකිරීමේ දීමනාව" විග්‍රහ කිරීම
- සුවකිරීමේ දීමනාවට සමාන්තරවූ විශේෂිත ආත්මික දීමනා ලයිස්තුගත කිරීම
- සුවකිරීමේ දීමනාව සමග සම්බන්ධ විය යුතු අය කවුද යන්න හඳුනාගැනීම

**සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:**

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. කෙසේදයත්: ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන එක්කෙනෙකුට දැනගැනීමේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන වෙන කෙනෙකුට ඇදහිල්ලද, එම ආත්මයාණන්වහන්සේ තුළ තවත් කෙනෙකුට සුවකිරීමේ දීමනාවද, තවත් කෙනෙකුට ආශ්චර්ය කිරීමද තවත් කෙනෙකුට ධර්මවාක්‍ය කීමද, (1 කොරින්ති 12:7-9)**

## හැඳින්වීම

සුවකිරීමේ සහ මිදීමේ සේවයට සම්බන්ධව සිටින ලෙස සියලුම ඇදහිලිවතුන්ට බයිබලයේ ආඥාකර ඇති අතර ඇතැම් ඇදහිලිවතුන්ට ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් සුවකිරීමේ විශේෂ දීමනා දී ඇති බව ශුද්ධ වචනය සනාථ කරයි. මෙම පාඩමෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ ශුද්ධවූ ත්‍රිත්වයේ කොටසක් ලෙස හඳුන්වාදීම, උන්වහන්සේගේ මෙහෙය සාරාංශකර දැක්වීම, ආත්මික දීමනා විග්‍රහකර දැක්වීම මෙන්ම සුවකිරීමේ දීමනාවන් ගැන විශේෂ අවධානයක් සහිතව අදාළ අනික් ආත්මික දීමනාවන් ගැන හඳුන්වා දෙනු ඇත.

## ශුද්ධාත්මයාණන්වහන්සේ

පියවූ දෙවියන්වහන්සේද පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේද ශුද්ධාත්මයාණන්වහන්සේද වූ දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයේ එක් පුද්ගලයෙක් ශුද්ධාත්මයාණන්වහන්සේ වන සේක. පහත දැක්වෙන ජේදයන්හි දෙවියන්වහන්සේගේ ත්‍රිත්ව ස්වභාවය එළිදරව් කරදී ඇත. මතෙව් 3:16-17, යොහන් 15:26, රෝම 8:2-3, 2 කොරින්ති 13:14, එපීස 2:18, 1 පේත්‍රුස් 4:14 සහ ක්‍රියා 2:33. ශුද්ධාත්මයාණන්වහන්සේ සර්වවාසී වේ. එහි අර්ථය උන්වහන්සේ සෑම තැනකම වැඩසිටින බවයි (ගීතාවලිය 139:7). උන්වහන්සේ සර්වඥානී වේ. එහි අර්ථය සියලු දේ දන්නේය යන්නයි (1 කොරින්ති 2:10-11). උන්වහන්සේ සර්වබලධාරී වේ. එහි අර්ථය සියලු බලයෙන් යුක්තය යනුයි (ගීතාවලිය 62:11). උන්වහන්සේ සදාකාලිකය. එහි අර්ථය සෑම කාලයටම වැඩ වසන බවයි (හෙබ්‍රෙව් 9:14).

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය

ශුද්ධාත්මයාණන්වහන්සේට බොහෝ මෙහෙයන් ඇත. උන්වහන්සේගේ භූමිකාව පිළිබඳව බයිබලය පවසන දේවල සාරාංශයක් මෙසේය.
**මැවීම :** පොළොව මැවීමේ කාර්යයේ උන්වහන්සේ ක්‍රියාකාරීව සිටි සේක.

**ශුද්ධ ලියවිලි :** උන්වහන්සේ ආරම්භයේදී ශුද්ධ ලියවිලි එළිදරව්කිරීම හා දේවානුභාවය දීමේ මෙහෙයේ නියුක්තවූ අතර දේව වචනය අවබෝධ කරගැනීමට අවශ්‍ය ආලෝකවත් කිරීමේ මෙහෙය දිගටම කරගෙන යන සේක.

**ඉශ්‍රායෙල් :** ශුද්ධාත්මයාණන්වහන්සේ ඉශ්‍රායෙල් නායකයන් මත පැමිණ ඔවුන්ට පොරොන්දු දේශයට මගපෙන්වූ සේක. ඔවුන්ගේ නමස්කාර ස්ථාන පිරවූ සේක. එමෙන්ම අනාගතයේ මහත් පීඩාකාලයේදීත් දහස් අවුරුදු පාලන සමයේදීත් ඔවුන් මත පැමිණෙන සේක.

**යේසුස්වහන්සේ :** යේසුස්වහන්සේ පිළිසිඳ ගැනීම, ආලේප කිරීම, මුද්‍රා කිරීම, මගපෙන්වීම, බලයෙන් පූර්ණ කිරීම, ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණ කිරීම. මරණයට කැපකිරීම සහ මළවුන්ගෙන් නැගිටුවීම ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් කරනු ලැබිය.

**පව්කරුවන් :** පව්කරුවන්ට පාපය පිළිබඳව අඟවා දී ශුභාරංචිය වෙතට යොමුකිරීම ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් කරනු ලබයි.

**සාතන් :** සාතන්ගේ බලය අත්හිටුවා තැබීම ශුද්ධාත්මයාණන්වහන්සේ කරයි.

**සභාව :** සභාව ආරම්භ කරන ලද්දේ ශුද්ධාත්මයාණන්වහන්සේ විසිනි. උන්වහන්සේ සභාවේ නමස්කාරයට ආනුභාවය සපයන සේක. එහි මිෂනාරි සේවයට මගපෙන්වීම, සේවකයන් තේරීම, දේශකයන් ආලේප කිරීම, එහි තීරණ සඳහා මගපෙන්වීම සහ බලයෙන් බෞතිස්ම කිරීම සිදුකරන සේක.

**ඇදහිලිවතුන් :** ඇදහිලිවතුන් පාපය අඟවාදීම, පවිත්‍ර කිරීම, බලයෙන් බෞතිස්ම කිරීම, ඔවුන් තුළ පැවතීම, ශක්තිමත් කිරීම, එකමුතුකිරීම, මැදිහත්කාරකම් කිරීම. මගපෙන්වීම ප්‍රේමය ප්‍රදර්ශනය කිරීම, ක්‍රිස්තුස්වහන්සේගේ ස්වභාවයට සමාන කිරීම, සත්‍යය එළිදරව් කරදීම. ඉගැන්වීම, ගැළවීම පිළිබඳව නිසැකකම ලබාදීම, නිදහස ලබාදීම, අස්වැසිල්ල ලබාදීම, ප්‍රබෝධමත් කිරීම, ඔවුන්ට කථාකිරීම ඔවුන් තුළින් කථාකිරීම, දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ කිරීම, නමස්කාරය ආලේප කිරීම, සාක්ෂිදීමට බලවත් කිරීම, ආත්මික පල වර්ධනය සහ ආත්මික දීමනා වර්ධනය ශුද්ධාත්මයාණන්වහන්සේ කරන සේක.

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා

ක්‍රිස්තු ශරීර තුළ සේවය කිරීම පිණිස එම ශරීරයේ අවයවයන් ලෙස ඇදහිලිවන්තයෙකුට ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් දෙනු ලබන අධිස්වභාවික හැකියාවන් වේ. ශුද්ධාත්ම "දීමනාව" හා ශුද්ධාත්ම "දීමනාවන්" අතර වෙනසක් ඇත. ක්‍රියා 2 වන පරිච්ඡේදයේ වාර්තාවන පෙන්තකොස්ත දිනයේ ශුද්ධාත්ම "දීමනාව" දෙන ලද්දේය. ශුද්ධාත්ම දීමනාව ලැබූ අයට දෙන අධිස්වභාවික හැකියාවන් ශුද්ධාත්ම "දීමනාවන්" වේ. මෙම දීමනාවන් ඇදහිලිවන්තයෙකුට ක්‍රිස්තු ශරීරය තුළත් නොඇදහිලිවතුන්ටත් පලදායි ලෙස මෙහෙකිරීමටත් හැකියාව ලබා දෙයි.

ආත්මික දීමනාවක් යනු ස්වභාවික දක්ෂතාවයක් හෝ හැකියාවක් නොවේ. එය ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ලබා දෙනු ලැබූ අධිස්වභාවික හැකියාවකි. යමෙකු විසින් තමාගේම ආත්මික දීමනාවන් තමා විසින්ම ක්‍රියාකිරීම හෝ වර්ධනය කරගැනීම සිදුකර නොගනී. මෙම දීමනාවන් ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් කෙනෙක් මත එවීමත් ක්‍රියාත්මක කිරීමක් කරනු ලබන අධිස්වභාවික හැකියාවන්ය.

පහත දැක්වන ජේදයන් තුළ ආත්මික දීමනාවන් ගැන ඔබට කියවීමට පුළුවන,

- රෝම 12:1-8
- 1 කොරින්ති 12:1-31
- එපීස 4:1-16
- 1 පේතෘස් 4:7-11

මේ පදවලින් ඔබට සොයාගත හැකි පරිදි සභාවට දෙන ලද ආත්මික දීමනා බොහෝය. කෙසේ නමුත් අපගේ වර්තමාන අධ්‍යයනයේ ප්‍රධාන අවධානය සුවකිරීමේ දීමනාව පිළිබඳවය.

## සුවකිරීමේ දීමනාවන්

සැම මනුෂ්‍යයෙකුගේම ගෙඩනැංවීම පිණිස ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම දී තිබේ.

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. කෙසේදයත්: ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන එක්කෙනෙකුට දැනගැනීමේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන වෙන කෙනෙකුට ඇදහිල්ලද, එම ආත්මයාණන්වහන්සේ තුළ තවත් කෙනෙකුට සුවකිරීමේ දීමනාවද, තවත් කෙනෙකුට ආශ්වර්ය කිරීමද, තවත් කෙනෙකුට ධර්මවාක්‍ය කීමද, (1 කොරින්ති 12:7-9)**

දෙවියන්වහන්සේගේ බලය තමන් තුළින් ගලායාමට ඉඩදීමෙන් ස්වභාවික ක්‍රමයට අමතරව තවත් අයෙකුව සුවකිරීම පිණිස සුවකිරීමේ දීමනාවන් මගින් ඇදහිලිවන්තයෙකුට හැකියාව දී තිබේ. සියලුම ඇදහිලිවතුන්ට රෝගීන් උදෙසා යාච්ඤා කිරීමට ආඥාකර ඇති නමුත් දෙවියන්වහන්සේ සුවකිරීමේ දීමනාවන් සහිත ඇදහිලිවන්තයෙකු විශේෂිත ආකාරයටත් නිරන්තරයෙනුත් සුවයේ මෙහෙය සඳහා භාවිත කරන සේක.

"දීමනාවන්" යන වචනය බහු වචනාර්ථ නිසා සුවකිරීමේ දීමනාවන් විවිධ වේ. සුවය පැමිණෙන ආකාර විවිධ වන අතර ඒ සඳහා විවිධවූ මාර්ග ද භාවිත කෙරේ. කෙනෙකුට ගැළවීමට එන පිණිස දෙවියන්වහන්සේ ක්‍රියාකරන විවිධ ආකාරයන් ගැන සිතා බලන්න. එසේම උන්වහන්සේට සුවය ගෙනදීමටත් විවිධ ආකාරයෙන් ක්‍රියා කළ නොහැකිද? ක්‍රම හෝ දීමනාවන්වලට ගැළවීම ලබා දිය නොහැකිසේම සුවය ලබා දීමද කළ නොහැකිවේ. ක්‍රම හෝ දීමනාවන් දෙවියන්වහන්සේගේ බලය ගලායන්නාවූ මාර්ග පමණකි.

සුවකිරීමේ දීමනාව ක්‍රියාත්මකවීමේ ආකාර බයිබලයේ හමුවේ.

1. සුවකරන තැනැත්තා (සේවකයා) රෝගියා ස්පර්ශ කිරීම.

2. සෙනඟ විසින් සේවකයා ස්පර්ශ කිරීම.

3. දුරක සිට සුවකිරීමේ වචනය ප්‍රකාශ කිරීම.

4. රෝගියා ඉදිරිපිට සිට සුවකිරීමේ වචනය ප්‍රකාශ කිරීම.

5. කෙනෙකු සමග සෘජුවම ගනුදෙනු කිරීම.

6. වෙනත් කෙනෙකුගේ මැදිහත්කාරකමෙන් සුවකිරීම.

7. යාච්ඤාකිරීම.

8. රෝගියාගේ ඇදහිල්ලේ ක්‍රියාවක් කරණකොටගෙන සුවවීම.

9. විවිධ අකාරවල ඇදහිල්ල

   - සේවකයාගේ ඇදහිල්ල
   - සුවය අපේක්ෂා කරන්නාගේ ඇදහිල්ල
   - මිත්‍රයන්ගේ ඇදහිල්ල
   - නෑදෑයන්ගේ ඇදහිල්ල

10. සුවකිරීමේ විවිධාකාර දේ, එම ද්‍රව්‍යයන්ගේ ශුද්ධභාවයක් නැති නමුත් රෝගියා සමග සම්බන්ධවීමේ මාධ්‍යයක් ලෙස භාවිතකර තිබේ.

    - කෙල
    - මඩ
    - යාච්ඤා රෙදිකඩ
    - කොළ අතු
    - සේවකයාගේ ඇඳුමේ කෙළවර

- සේවකයාගේ සෙවනැල්ල
- තෙල්
- ඇගිලි කන්වල දැමීම
- ජලය

11. විශේෂ භාස්කම් :

විශේෂිතවූ සුවකිරීම් සඳහා දෙවියන්වහන්සේ ඇතැම් අය ඇදහිල්ලෙන් ආලේපකරන සේක. නිදසුනක් ලෙස දෙවියන්වහන්සේ ඇතැම් අය විශේෂිතවම පිලිකා රෝගීන් සුවකිරීම සඳහා භාවිත කරන සේක. මෙයින් අදහස් කරන්නේ ඔබ සෑම අංශයකම සුවකිරීම් නොකළ යුතු බව නොවේ. මක්නිසාද ආඥාව ඇත්තේ සාමාන්‍ය ලෙස සියල්ලන් සුවකිරීමටය. නමුත් එක් විශේෂිතවූ රෝගයක් සුවකිරීම පිණිස ශුද්ධාත්මයාණන්වහන්සේට ඔබ තුළින් ක්‍රියාකිරීමට හැකියාව ඇත.

## අදාළ අතිකූත් ආත්මික දීමනාවන්

සියලුම ආත්මික දීමනාවන් ක්‍රිස්තු ශරීරයේ වැදගත් මෙන්ම අවශ්‍ය ද වේ. නමුත් විශේෂිතවම සුවකිරීමේ දීමනාවන් හා සමගාමීව ක්‍රියාත්මකවන ඇතැම් ආත්මික දීමනාවන් ලැයිස්තුවක් මෙහි දැක්වේ.

**ඉගැන්වීමේ හා දිරිමත්කිරීමේ** : දේව වචනයේ පදනම මත සුවයට අවශ්‍ය ඇදහිල්ල වර්ධනය කරයි.

**ධර්ම වාක්‍ය, අන් භාෂා සහ භාෂා පරිවර්තනය** : සුවය හෝ රෝගය පිළිබඳව සෘජු වචනයක් දෙවියන්වහන්සේගෙන් පැමිණේ.

**ආත්ම විමසීම** : සුවකිරීම හෝ මිදීම අවශ්‍යද නැද්ද යන්න තීරණය කිරීමට සහ ක්‍රියාකාරීවන ආත්මයන් පිළිබඳව දැනගැනීම.

**ඇදහිල්ලේ දීමනාව** : ආත්ම විමසීමේ දීමනාවෙන් ලබාගන්නා ලද දැනුමෙන් ක්‍රියාකිරීමට විශේෂිත නිසැකතාවයක් ලැබීම සහ ඇදහිල්ලේ යාච්ඤාවක් කිරීම.

**දැනගැන්මේ වචනය** : රෝගයේ මුල් හේතුව පිළිබඳ දැනගැනීමක් ලබා දෙයි. හැඟීම්මය සුවයක් හෝ ශාරීරික රෝගී බව යක්ෂාත්මයකට සම්බන්ධ ප්‍රශ්නයක් හේතුකොටගෙන වන විට මෙය විශේෂයෙන් උපකාරී වේ. එයින් පාපොච්චාරණය කළ යුතුවූ පාපයන් ගැන තේරුම්ගැනීමක් ද සම්බන්ධ යක්ෂාත්ම බලවේගයන් ගැනද සුවය වළක්වන මානසික ආකල්පයන් පිළිබඳව ද දැනගැන්මක් දෙයි.

**ප්‍රඥාවේ වචනය** : දෙවියන්වහන්සේ ඔබට දෙන ප්‍රඥාවෙන් රෝගියාට "ප්‍රඥාවේ වචනයක්" (උපදේශයක්) දීමට හැකියාව ලැබේ.

**භාස්කම් කිරීමේ දීමනාව** : අවයවයක් වර්ධනය වීම ආදී ක්ෂණිකවූත් මැවීමක්වූත් සුවයන් මේවාය. කිසිම ආකාරයකින් ස්වභාවික ආකාරයෙන් සිදුවිය නොහැකිවූ ස්වභාවික වශයෙන් පැහැදිලි කිරීමක් කළ නොහැකිවූ අවස්ථාවන් මේ ගණයට අයත් වේ. *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"* නමැති හාවස්ට්ටයිම් ඉන්ටර්නැෂනල් ආයතනයේ පාඩම් මාලාවේදී මෙම දීමනාවන් ගැන වැඩිදුරට ඉගෙන ගැනීමට හැකිවේ.

## ආත්මික දීමනා සෙවීම

අවම වශයෙන් එක් ආත්මික දීමනාවක්වත් එක ඇදහිලිවන්තයෙකුට තිබෙන බව බයිබලය පවසයි.

> **දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවේ යහපත් ගබඩාකාරයන් මෙන් එකිනෙකාට ලැබුණු දීමනාවේ හැටියට එයින් එකිනෙකාට සේවය කරපල්ලා. (1 පේතෘස් 4:10)**
>
> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. කෙසේදයත්:**

**නුමුත් ඒ එකමවූ ආත්මයාණන්වහන්සේ තමන් කැමති ලෙස එකිනෙකාට වෙන වෙනම බෙදාදෙමින්, මේ සියල්ල කරවන සේක.**
**(1 කොරින්ති 12:7,11)**

එක් ඇදහිලිවන්තයෙකුට අවම වශයෙන් එක ආත්මික දීමනාවක්වත් තිබෙන නිසා එම දීමනාව සොයාගැනීමටත් භාවිත කිරීමටත් සෑම කෙනෙකුටම වගකීමක් ඇත. අප විසින් ආත්මික දීමනාවලට ආශා විය යුතු බව බයිබලය පවසයි.

**නුමුත් වඩා උතුම් දීමනාවලට ආශාවෙයල්ලා. තවද ඊටත් වඩා උතුම් මාර්ගයක් මම නුඹලාට පෙන්වමි. (1 කොරින්ති 12:31)**

ඔබ සුවකිරීමේ දීමනාවන් ඉල්ලා යාච්ඤා කරන විට ඔබ කරන්නේ දැනටමත් ඔබ තුළ තිබෙන දෙයක් වර්ධනය කර ගැනීමටය. ඊට හේතුව, සෑම ඇදහිලිවන්තයෙකුටම රෝගීන් පිට අත් තබා සුවකිරීමේ බලය සහ හැකියාව තිබෙන බැවින්ය. යේසුස්වහන්සේ උන්වහන්සේ විසින් දී ඇති මූලාශ්‍රයන් වර්ධනය කර ගත් අතර (ලූක් 5:22) තිමෝතිට තමා තුළ ඇති දීමනාව දල්වා ගන්නා ලෙස පවසා ඇත (2 තිමෝති 1:6).

## සභාවේ සේවය

සියලුම ඇදහිලිවතුන්ට රෝගීන් සුවකිරීමට ආඥා කර තිබේ. දෙවියන්වහන්සේ ඇතැම් අය තුළින් විශේෂාකාර සුවකිරීමේ දීමනා තුළින් ක්‍රියා කළ ද සියලුම ඇදහිලිවතුන් සුවකිරීමේ මෙහෙය සමග සම්බන්ධ විය යුතුය. සුවකිරීමේ දීමනාව තුළින් ක්‍රියා කළ යුතුයයි බයිබලය පවසන අයගේ ලයිස්තුවක් මෙහි දක්වා ඇත.

- පාලකවරු සහ එල්ඩේරුන් (ආත්මික නායකයන්) — එසකියෙල් 34
- වැඩිහිටියන්/උපස්ථායකයන් — යාකොබ් 5:4
- සාමාන්‍ය ඇදහිලිවතුන් — ලූක් 16:15-18, යාකොබ් 5:16
- විශේෂ සුවකිරීමේ දීමනා ඇති අය තුළින් — 1 කොරින්ති 12:9
- සම්පූර්ණ සභාව තුළින් (සභාව සුවකිරීමේ මධ්‍යස්ථානයක් විය යුතුය) ලූක් 14:16-24

## ස්වයං පරීක්ෂණය

1. සුවකිරීමේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. ශුද්ධාත්මයාණන්වහන්සේ කවුද?

3. මේ පාඩමෙන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය පිළිබඳව ඉගෙනගත්තේ කුමක්දැයි සාරාංශ කර ලියන්න.

4. ආත්මික දීමනාවක් යනු කුමක්ද?

5. "සුවකිරීමේ දීමනාවන්" විග්‍රහ කරන්න.

6. සුවකිරීමේ දීමනාව සමග විශේෂයෙන් සමගාමීව ක්‍රියා කරන විශේෂිත ආත්මික දීමනාවන් මොනවාද?

7. සුවකිරීමේ දීමනාව සමග සම්බන්ධ විය යුත්තේ කවුද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. ඔබගේම හෝ ඔබ සේවය කරන අයෙකුගේ ශාරීරික තත්වය සඳහා හාස්කමක් සිදුවීම විශ්වාස කිරීමට ඔබට දුෂ්කරතාවයක් තිබේද? දෙවියන්වහන්සේ ස්වභාවික ක්‍රියාවලියක් මවා තිබෙන නමුත් උන්වහන්සේ එයට බැඳී නොසිටින සේක. හාස්කම් සිදුවන්නේ දෙවියන්වහන්සේ ස්වභාවික ක්‍රියාවලිය අභිභවා අධිස්වභාවික ලෙස ක්‍රියාකරන විටය. හාස්කමේ සුවය ඇත්තවශයෙන් සාමාන්‍ය තත්වයට නැවත පැමිණවීමය. රෝගය සහ යක්ෂාවේශය දෙවියන්වහන්සේගේ මුල්ම ව්‍යවස්ථාවට පටහැනි අධිස්වභාවික තත්වයයි. එමනිසා, හාස්කමකින් සුවවීම සහ මිදීම ලබා ගැනීම සාමාන්‍ය ස්වභාවයට නැවත පත්කිරීමකි. සත්‍ය වශයෙන් අසාමාන්‍ය වන්නේ හාස්කම් නොව, සේවය තුළ ඒවා නොමැතිවීමය.

2. ක්‍රියා පොතේ, සුවකිරීමේ දීමනාවන් සඳහා දෙවියන්වහන්සේ භාවිත කළ විවිධ මනුෂ්‍යයන් සලකා බලන්න.

| | |
|---|---|
| - ක්‍රියා 3:1-11 | පේතෘස් සහ යොහන් (අපොස්තුළුවරු) |
| - ක්‍රියා 5:15, 9:32-34 | පේතෘස් (අපොස්තුළු) |
| - ක්‍රියා 8:5-7 | පිලිප් (ඉවැන්ජලිස්ත සහ උපස්ථායක) |
| - ක්‍රියා 9:17-18 | අනනියස් (නොදන්නා ඇදහිලිවන්තයෙක්) |
| - ක්‍රියා 14:8-10, 28, 7-9 | පාවුල් (අපොස්තුළු) |

3. ආත්මික දීමනා දෙන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේය. ශුද්ධාත්ම බෞතිස්මය ලබාගන්නා ආකාරය මෙසේය.

| | |
|---|---|
| - පසුතැවිලිව බෞතිස්මය ලැබීම. | ක්‍රියා 2:38 |
| - අදහන්න එවිට එය ඔබ සතුවේ | ක්‍රියා 2:39 |
| - ඊට අගාවන්න | යොහන් 7:37-39 |
| - දීමනාවක් ලෙස එය පිළිපදින්න | ක්‍රියා 2:38 |
| - දෙවියන්වහන්සේට යටත්වෙන්න | යෙසායා 28:11, ක්‍රියා 2:4 |
| - අනිකුත් ඇදහිලිවතුන්ගේ යාච්ඤාව ඉල්ලා සිටින්න | ක්‍රියා 2, 4, 10 |

4. ආත්මික දීමනාවන් පිළිබඳ ඡේදයන් නැවත සමාලෝචනය කරන්න.

රෝම 12:1-8, 1 කොරින්ති 12:1-31, එපිස 4:1-16, 1 පේතෘස් 4:7-11

ඔබ ඔබගේ ආත්මික දීමනාවන් සොයාගෙන තිබේද? ........................................
එසේනම් ඔබ ඒවා අන් අයට මෙහෙකිරීමට භාවිත කරනවාද? .....................................
ඔබ ඒවා භාවිත නොකරන්නේ නම් ඔබ ඒවා භාවිත කිරීම ආරම්භ කරන්නේ කෙසේද?

---

5. ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව සහ ආත්මීක දීමනාවන් පිළිබඳව වැඩිදුර අධ්‍යයනය සඳහා *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"* නමැති හාවස්ට්ටයිම් ඉන්ටර්නැෂනල් ජාලයේ පාඨමාලාව ලබාගන්න.

# සිව්වන කොටස

# අභියෝග ජයගැනීම

දෙවියන්වහන්සේ විසින් අපේක්ෂාකරන සම්පූර්ණත්වය උදෙසා ඔබගේ ශරීරය උදෙසා කරන සටනට අදාළ භෞතික පොරබැදීම තුළ පහත දැක්වෙන දේ ඇතුළත් ප්‍රධාන වූ අභියෝගයන් ඔබට මුහුණදීමට තිබේ.

- මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායයන්
- මාංශයේ කටුවක් වැනි දේ
- පිළිතුරු නොලැබූ ප්‍රශ්න

මේ අභියෝගයන්ට එරෙහිව නැගී සිටීමවත් ඒවායින් ජයගැනීමටත් සුදුසු ලෙසට ඔබව දේව වචනයෙන් සන්නද්ධ කිරීම මේ කොටස තුළ සිදුවේ.

## එකළොස් වන පරිච්ඡේදය

# මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායයන්

**අරමුණු**

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවයේ පොරොන්දුව කටපාඩමෙන් ලිවීමට
- සුවය පිළිබඳ පහත දැක්වෙන මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායන්ට ප්‍රතිචාර දැක්වීමට
    - සුවය හා භාස්කම් අද දවසට නොවේ.
    - මියගිය සියලු දෙනාම මළවුන්ගෙන් නැගුටුවන්නේ නැත්තේ මන්ද?
    - කිතුනුවන් මියයන්නේ මන්ද?
    - නවීන ඖෂධ නිසා දිව්‍යමය සුවය අනවශ්‍යය.
    - දිව්‍යමය සුවය උගන්වන්නේ ව්‍යාජ ලබ්ධින් විසිනි.
    - ආත්මයට වඩා ශරීරය ගැන අවධානය යොමු කෙරේ.
    - ඔබ රෝගීව සිටින්නේ ඔබගේ පාපය නිසාය.
    - ඔබ රෝගාතුරවීම දේව කැමැත්ත වේ.
    - මෙය ධර්මිෂ්ඨයන්ට සිදුවන පිඩාවකි.
    - දිව්‍යමය සුවය විරලය.
    - ඔබගේ රෝගය ඔබගේ කුරුසිය වේ.

## සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **මාගේ ආත්මය ධූලියට ඇලේ. ඔබගේ වචනය ලෙස මා ප්‍රාණවත් කළ මැනව. මාගේ මාර්ග කියා දුනිමි. ඔබ මට උත්තරදුන්සේක. ඔබගේ පනත් මට ඉගැන්වුව මැනව. ඔබගේ නියෝග මාර්ගය මට තේරුම්කර දුන මැනව. එවිට ඔබගේ ආශ්චර්ය ක්‍රියා ගැන භාවනා කරන්නෙමි. ශෝකය නිසා මාගේ ආත්මය දියවේ. ඔබගේ වචනය පරිද්දෙන් මා ශක්තිමත් කළ මැනව. (ගීතාවලිය 119:25-28)**

### හැඳින්වීම

මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායයන් යනු දෙවියන්වහන්සේගේ වැඩවලට බාධා කෙරෙන විශ්වාසයන්, නීති හා ප්‍රතිපත්ති වේ. යේසුස්වහන්සේ එම කාලයේ සිටි ආගමික නායකයන්ට මෙසේ කීසේක.

> **. . . මෙසේ නුඹලා නුඹලාගේ පරම්පරාගත නියෝග නිසා දෙවියන්වහන්සේගේ වචනය අවලංගු කළහුය (මතෙව් 15:6).**

ඇදහිල්ල ලැබෙන්නේ දේව වචනයට සවන් දීමෙන් නම්, ඇදහිල්ල විනාශ කරන මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායන්ට සවන් දීමෙන් හා පිළිගැනීමෙන් ඇදහිල්ල ඉවත් විය හැකිය.

මෙම පාඩමෙන් සාකච්ඡා කෙරෙන්නේ සුවය පිළිබඳ මනුෂ්‍යයන්ගේ පොදු සම්ප්‍රදායන් වේ. වැරැද්දට එරෙහි හොඳම ප්‍රතිකර්මය නිශ්ශබ්දතාව නොව, දේව වචනයේ සත්‍යය ප්‍රකාශ කිරීම බැවින් සෑම සම්ප්‍රදායයකටම බයිබලීය ප්‍රතිචාරයක් ඉදිරිපත් කර ඇත. සුවය පිළිබඳ සම්ප්‍රදායන් හා විරෝධතා අප ඉවත් කරන විට දිව්‍යමය සුවය ලබාගැනීමට ඇති බාධක අපි ඉවත් කරන්නෙමු.

ගීතිකාකාර දාවිත් සඳහන් කරන්නේ තමා කලින් තමාගේම මාර්ග ප්‍රකාශ කළ ද දැන් ඔහුට අවශ්‍ය වන්නේ දෙවියන්වහන්සේගේ මාර්ග ඉගෙන ගැනීමට බවය.

**මාගේ ආත්මය ධූලියට ඇලේ. ඔබගේ වචනය ලෙස මා ප්‍රාණවත් කළ මැනව. මාගේ මාර්ග කියා දුනිමි. ඔබ මට උත්තරදුන්සේක. ඔබගේ පනත් මට ඉගැන්වුව මැනව. ඔබගේ නියෝග මාර්ගය මට තේරුම්කර දුන මැනව. එවිට ඔබගේ ආශ්චර්ය ක්‍රියා ගැන භාවනා කරන්නෙමි. ශෝකය නිසා මාගේ ආත්මය දියවේ. ඔබගේ වචනය පරිද්දෙන් මා ශක්තිමත් කළ මැනව. (ගීතාවලිය 119:25-28)**

දාවිත් දේව වචනය මගින් සම්පදායයන් ප්‍රතිස්ථාපනය කළ අතර එසේ කිරීමේදී ඔහුගේ ආත්මය ප්‍රාණවත් විය (සුව වී අලුත් විය).

## "සුවය හා හාස්කම් අද දවසට නොවේ"

ඇතැම් අය පවසන්නේ සුවය අයත් වන්නේ, බයිබලිය කාලයට හෝ අනාගතයේ දි යේසුස්වහන්සේ පැමිණි පසු හෝ සඳහා බවය.

## අපගේ ප්‍රතිචාරය:

දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක.

**". . . මම වනාහි නුඹ සුවකරන්නාවූ ස්වාමින්වහන්සේය" (නික්මයාම 15:26)**

"මමය" යනු වර්තමාන කාලය වේ. එය "මම වූයෙමි" ලෙස අතීතයට හෝ "මම වන්නෙමි" ලෙස අනාගතයට හෝ අප වෙනස් කරන්නේ කෙසේද? දෙවියන්වහන්සේ වෙනස් නොවන බව බයිබලය අපට උගන්වයි.

**සෑම යහපත් දීමද සෑම සම්පූර්ණ දීමනාව ද කිසි වෙනස්වීමක්වත් හැරීමේ ඡායාවක්වත් නැත්තාවූ ආලෝකවල පියාණන්වහන්සේ කෙරෙන් ඉහළින් බැස එන්නේය. (යාකොබ් 1:17)**

**ස්වාමින්වහන්සේ වන මම වෙනස්නොවෙමි. (මලාකි 3:6)**

කාලයේ පටන්ගැන්මේ සිටම දෙවියන්වහන්සේ වෙනස් වී නැත.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයෙත් අදත් සදහටමත් ඒකාකාරමය (හෙබ්‍රෙව් 13:8)**

හාස්කම්වල දවස පසු වී ඇත්නම් ගැළවීමේ දවස ද එසේමය. මන්ද ගැළවීම තරම් වෙනත් හාස්කමක් නොමැති බැවිනි. සුවය, යේසුස්වහන්සේ නැවත පොළොවට පැමිණි පසු අනාගතය සඳහා නම්, එවිට ගුරුවරුන්ගේ, පාලකවරුන්ගේ හා අනෙකුත් නායකයන්ගේ සේවය ද එම අනාගත කාලය සඳහා වේ. මන්ද සුව කිරීමේ දීමනාව මේ සේවාවන් මෙන්ම ආත්මික දීමනාවකි.

හාස්කම් අදට නොවේ යන්නට එරෙහි බලවත්ම තර්කය වන්නේ අත්දැකීම් වාර්තාවන් වේ. දෙවියන්වහන්සේ මනුෂ්‍යයා සමග විශේෂ ආකාරයන්ට ක්‍රියා කරන "කාල පරිච්ඡේදයන්" හෝ "යුගයන්" හතක් ඇත. ඒවා මෙසේ වේ.

| | |
|---|---|
| - නිදොස්කමේ යුගය | උත්පත්ති 1:28 |
| - හෘදයසාක්ෂියේ යුගය | උත්පත්ති 3:23 |
| - මනුෂ්‍ය රාජ්‍යයේ යුගය | උත්පත්ති 8:20 |
| - පොරොන්දු යුගය | උත්පත්ති 12:1 |
| - ව්‍යවස්ථාවේ යුගය | උත්පත්ති 19:8 |
| - අනුග්‍රහයේ යුගය | යොහන් 1:17 |
| - දේව රාජ්‍යයේ යුගය | එපිස 1:10 |

යේසුස්වහන්සේගේ පැමිණීම තුළින් අවසාන දේව රාජ්‍යයේ යුගය ඉදිරිපත් කෙළේය. මෙම යුගය ආරම්භයේදී යේසුස්වහන්සේ හාස්කම් හා සුවකිරීම් කළ සේක.

**උන්වහන්සේ උත්තර දෙමින්: නුඹලා ඇසූ දුටු දේ ගොස් යොහන්ට දන්වාපල්ලා, බිහිරන්ට ඇසෙයි, මළාහු නැගිටුවනු ලබති. අන්ධයෝ පෙනීම ලබති. කොරු ඇවිදිති. කුෂ්ඨ රෝගීහු පවිත්‍රකරනු ලබති. දිළිඳුන්ට ශුභාරංචිය ප්‍රකාශකරනු ලැබේ. (ලූක් 7:22)**

දේව රාජ්‍ය යුගය දිගටම පැවතෙද්දී, මුල් සභාවේ සිදු වූ හාස්කම් හා සුවකිරීම් ක්‍රියා පොතේ සඳහන් වේ. නවීන සභාවේ ඉතිහාසයේ වාර්තාවලින් ද බොහෝ හාස්කම් හා සුවකිරීම් සනාථ කර ඇත.

### **"මියගිය සියලූ දෙනාම මළවුන්ගෙන් නැගුටුවන්නේ නැත්තේ මන්ද"?**

සමහරු මෙසේ අසති. "සුවය අද දවසට නම්, රෝගාතුරව මියගිය සියලූ දෙනා ඇදහිලිවතුන් විසින් නැගුටුවමින් තැන් තැන්වලට නොයන්නේ මන්ද?"

## **අපගේ ප්‍රතිචාරය:**

මළවුන් නැගුටුවීම සභාවට දෙන ලද මහා පැවරුමේ කොටසක් නොවේ. එය, දේව රාජ්‍යය ප්‍රකාශ කිරීම සඳහා ගෝලයන්ව යවන ලද පළමු ගමනේදී, ගෝලයන්ට දුන් ආඥාවකි. මළවුන් නැගුටුවීම පැමිණීමට නියමිත යේසුස්වහන්සේගේ උත්ථානවීමේ "නාඹුල් ඵලය" වේ.

විශේෂ හාස්කම් හා ගිවිසුම් හාස්කම් අතර වෙනසක් තිබේ. විශේෂ හාස්කම් කරන ලද්දේ විශේෂ අවස්ථාවන්හි සලකුණක් වශයෙනි. වතුර මිදි යුෂ බවට පත්කිරීම, මුහුද මත ඇවිදීම. රොටි සහ මසුන් වැඩි කිරීම හා රතු මුහුද දෙබෑ කිරීම ආදිය මීට නිදසුන් වේ.

සුවකිරීම පැරණි ගිවිසුමේ ගිවිසුම් හාස්කමක් මිස විශේෂ හාස්කමක් නොවේ. දෙවියන්වහන්සේ තවමත් මළවුන් නැගුටුවන සේක. එහෙත් එය තීරණය කරන්නේ උන්වහන්සේගේ සර්වබලධාරීත්වයෙන් වන අතර එය සුව කිරීම සඳහා අපට දී ඇති පැවරුමේ පොදු කොටසක් නොවේ.

### **"කිතුනුවන් මියයන්නේ මන්ද?"**

මිය යෑම පිළිබඳව අප කතාකරන මේ අවස්ථාවේ, ඇතැම් සංදේහවාදීන් පවසන්නේ, දිව්‍යමය සුවය සෑම විටම ක්‍රියාත්මක වේ නම් කිතුනුවෙකු කෙදිනකවත් මිය නොයන බවය.

## **අපගේ ප්‍රතිචාරය:**

එවැනි දෙයක් ශුද්ධ ලියවිල්ල නොපවසයි. බයිබලය පවසන්නේ සාමාන්‍ය ජීවිත කාලය තුළ අපට ලබා දෙන දිව්‍යමය සුවය පිළිබඳව පමණි. ක්‍රිස්තුස්වහන්සේගේ සමගි කිරීමේ පූජාව අපට මරණයෙන් සදාතන මිදීම ලබා දුන්න ද යේසුස්වහන්සේ පළමුව පැමිණ ඔසවාගැනීම සිදුවනතුරු මෙම මැරෙන සුළු ශරීර මිය යනු ඇත. සුවය ගැන උගන්වන බයිබලයම මිනිසාගේ ජීවිත කාලය පිළිබඳව සඳහන් කර ඇත.

**අපේ ජීවිතයේ දවස් අවුරුදු හැත්තෑවක්ය . . . (ගීතාවලිය 90:10)**

**තවද එක වරක් මරණයත්, ඉන්පසු විනිශ්වයත් මනුෂ්‍යයන්ට නියමව තිබෙන්නාක් මෙන්ම . . . (හෙබ්‍රෙව් 9:27)**

## "නවීන ඖෂධ නිසා දිව්‍යමය සුවය අනවශ්‍යය"

සම්ප්‍රදාය මෙසේ පවසයි. "යේසුස්වහන්සේගේ කාලයේ කාර්යක්ෂම වෛද්‍ය ප්‍රතිකාර නොතිබිණි. දැන් උචිත ප්‍රතිකාර ඇති බැවින් සුවය සඳහා යාච්ඤා කිරීම වෙනුවට ඒවා භාවිතය බලාපොරොත්තු වේ".

### අපගේ ප්‍රතිචාරය:

ක්‍රි.පු. 400 දී පමණ ඈත කාලයක සුවය ගෙන දීමේ වෛද්‍ය විද්‍යාවක් තිබිණි. වෛද්‍ය විද්‍යාවේ පියා වූ හිපොක්‍රටීස් නම් මිනිසෙක් වෛද්‍ය විද්‍යාව ඉතා ඉහළ මට්ටමකට දියුණු කළේය (ක්‍රි.පු. 460-370). ඔහු භාවිත කළ ඇතැම් තාක්ෂණයන් අද වුවද භාවිත කෙරේ. යේසුස්වහන්සේගේ කාලයේ ග්‍රීසියේ, මිසරයේ හා රෝමයේ දක්ෂ වෛද්‍යවරු සිටියහ.

වෛද්‍ය විද්‍යාවේ කාර්යක්ෂමතාව හෝ අකාර්යක්ෂමතාව හෝ සමග කිසිදු සම්බන්ධතාවක් දිව්‍යමය සුවයට නොමැත. එය ශාන්තිකර පූජාව මගින් සැපයූ ආශිර්වාදයකි. සෑම යහපත් දීමනාවක්ම දෙවියන්වහන්සේගෙන් ලැබෙන්නකි. එබැවින් නීත්‍යනුකූල වෛද්‍ය සහාය ලබාගැනීම වරදක් නොවේ. කෙසේවුවද වෛද්‍ය විද්‍යාව සුව කිරීමේ ගිවිසුම් පොරොන්දුවට ආදේශයක් නොවන බව මතක තබාගන්න.

වෛද්‍ය විද්‍යාව මෙතරම් දියුණු වී තිබියදීත් සුව කළ නොහැකි රෝග තිබේ. එබැවින් දිව්‍යමය සුවය තවමත් අවශ්‍ය වේ. තවද බොහෝ අයට වෛද්‍ය උපකාර ලබාගත නොහැකි තත්වයක පසුවෙති. නිදසුනක් ලෙස අප්‍රිකාවේ 80% ක පමණ සෙනඟට මූලික වෛද්‍ය පහසුකම් නොමැති බව පෙනේ.

## "දිව්‍යමය සුවය උගන්වන්නේ ව්‍යාජ ලබ්ධීන් විසිනි"

සම්ප්‍රදාය මෙසේ පවසයි "දිව්‍යමය සුවය උගන්වන්නේ ව්‍යාජ ලබ්ධීන් විසින් පමණි"

### අපගේ ප්‍රතිචාරය:

වෙස්ලි, ලූතර් හා සින්සන්ඩෝර්ෆ් - මෙතෝදිස්ත, ලූතරන් හා මොරේවියන් නායකයෝ සියලු දෙනම දිව්‍යමය සුවය ඉගැන්වූහ. යේසුස්වහන්සේගේ රුධිරයේ ගැළවීමේ බලය හා ක්‍රිස්තුන්වහන්සේගේ දිව්‍යත්වය සමග අද දිව්‍යමය සුවය උගන්වන අය මේ නායකයන්ට වඩා වෙනස් නොවේ.

ඇතැම් ව්‍යාජ ලබ්ධීන් සුවය උගන්වයි, එහෙත් එය සත්‍ය බයිබලීය සුවය නොවේ. එය ක්‍රිස්තුන්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ දෙන සුවය නොව "මනෝ විද්‍යාත්මක" සුවයකි. සාතන් රැවටිලිකාරයෙකු මෙන්ම අනුකරණය කරන්නෙකි. ඔහු රවටන නිසා හා දුෂ්ට බලවේග තුළින් සුව කරන නිසා අපි දිව්‍යමය සුවය අත් නොහරින්නෙමු.

ඉන්දියාවේ ගංගා නම් ගඟෙන් නෑම තුළින් පාපයෙන් පිරිසිදු වන බව විශ්වාස කිරීමට සාතන් බොහෝ අය රවටා ඇත. සාතන්ගේ අනුකරණය නිසා අපි ගැළවීම දේශනා කිරීම නවත්වන්නෙමුද? ව්‍යාජ වෛද්‍යවරුන් ටිකදෙනෙක් සිටින නිසා වෛද්‍ය වෘත්තිය ඔබ විශ්වාස නොකරන්නෙහිද? දිව්‍යමය සුවය අනුකරණය කිරීමට සාතන්ගේ වෙහෙසවීම තුළින් සැබෑ සුවයක් ඇති බව පෙන්වයි.

## " ආත්මයට වඩා ශරීරය ගැන අවධානය යොමු කෙරේ".

සම්ප්‍රදාය මෙසේ පවසයි. "දිව්‍යමය සුවය ආත්මයට වඩා ශරීරය කෙරෙහි අවධානය යොමු කරයි".

## අපගේ ප්‍රතිචාරය:

සුවකිරීමේ සේවයේ යෙදෙන ඇතැම් ඇදහිලිවන්තයන් මෙලෙස අවධාරණය කරති. එහෙත් එය සුවය සඳහා ඇති බයිබලීය සැලැස්ම නොවේ. බයිබලීය සුවය මුළු මනුෂ්‍යයා ගැනම එනම් ආත්මය, ප්‍රාණය හා ශරීරය ගැනම කටයුතු කරයි.

සුවකිරීම ශුභාරංචිය නොවේ. එය ක්‍රිස්තුන්වහන්සේගේ ශුභාරංචියේ කොටසකි. එය පව්කාර මනුෂ්‍යයන්ගේ ආත්මයේ ගැළවීමෙන් පරිබාහිරව දේශනා නොකළ යුතුය. සභාව ආත්මය ගැන පමණක් අවධානය යොමු කිරීම තුළින් හා වෛද්‍ය ප්‍රතිකාර ශරීරය කෙරෙහි අවධානය යොමු කිරීම තුළින් බයිබලයේ ඉදිරිපත් කර ඇති පූර්ණ පුද්ගලයා යන සංකල්පය අමතක කර ඇත.

## "ඔබ රෝගීව සිටින්නේ ඔබගේ පාපය නිසාය"

අපට බොහෝ විට ඇසෙන දෙයක් නම්, "ඔබ රෝගීව සිටින්නේ ඔබ පව් කළ නිසාය නැතහොත් ඔබගේ ජීවිතයේ පාපය තිබෙන නිසා ඔබ රෝගීව සිටි යන්නය."

## අපගේ ප්‍රතිචාරය:

හතරවන හා පස්වන පරිච්ජේදවල රෝගාතුරවීමට හේතු හා ප්‍රභව පිළිබඳ සාකච්ඡාවේදී අප මෙම විෂය පිළිබඳව දැනටමත් කරුණු ඉදිරිපත් කර ඇත. සියලුම රෝගාබාධ ලෝකය තුළ ඇති වුයේ පාපය නිසා වුවත් යම් කෙනෙක් රෝගාතුර වන්නේ අවශ්‍යයෙන්ම ඔහුගේ පෞද්ගලික පාපය නිසාම නොවිය හැකි බවද අපි පැවසුවෙමු.

## "ඔබ රෝගාතුර වීම දේව කැමැත්ත වේ"

"ඔබ රෝගාතුර වීම දේව කැමැත්ත වේ. එය උන්වහන්සේගේ මහිමය පිණිසය". ඔබ මෙවැනි ප්‍රකාශයක් අසා තිබේද?

## අපගේ ප්‍රතිචාරය:

දෙවියන්වහන්සේට සුව කළ හැකිද නොහැකිදැයි යන්න බොහෝ අයගේ ප්‍රශ්නය නොවේ. එහෙත් උන්වහන්සේ කැමති ද යන්න ප්‍රශ්නයකි. අපට දෙවියන්වහන්සේගේ කැමැත්ත අවබෝධ නොවන්නේ නම් අප අඥානයන් බව බයිබලය පවසයි.

> **"නුඹලා අනුවණයෝ නොවී, ස්වාමින්වහන්සේගේ කැමැත්ත කිමෙක්ද කියා තේරුම් ගන්න" (එපීස 5:17)**

රෝගාතුරවීම පිළිබඳව දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීම, ඇදහිල්ල වර්ධනය කෙරෙන සශ්‍රික භූමියක් සපයයි. රෝගීන්ට සුවය ලැබීමේ ඵලදායි වන එකම යාච්ඤාව ඇදහිල්ලේ යාච්ඤාව වේ. සුවකිරීම දෙවියන්වහන්සේගේ කැමැත්තද යන්න පිළිබඳව ඔබ දෙගිඩියාවෙන් සිටින තාක්කල් ඔබට ඒ යාච්ඤාව කළ නොහැකිය..

ඔබ රෝගාතුරවීම දෙවියන්වහන්සේගේ කැමැත්ත බව ඔබ විශ්වාස කරන්නේ නම්, ඔබගේ සුවය සඳහා යාච්ඤා කරන ලෙස යම් කෙනෙකුගෙන් ඉල්ලීම වැරදි වේ. ඇදහිලිවන්තයෙක් අසනීප වන්නේ දෙවියන්වහන්සේ නිසා නම් වෛද්‍යවරු යක්ෂයාගෙන් වෙති, මන්ද ඔවුන් අසනීපය නැති කිරීමට වෙහෙසෙන බැවිනි. එමෙන්ම රෝහල් තිබීම ද වැරදි වේ. මන්ද ඒවා දෙවියන්වහන්සේගේ කැමැත්තට එරෙහිව රෝග සුව කිරීමට කැරලි ගසන බැවිනි. සෑම හෙදියක්ම දෙවියන්වහන්සේගේ කැමැත්තට විරුද්ධව ක්‍රියා කරයි. මන්ද දුක්විඳීම නැවැත්වීමට ඇය ක්‍රියා කරන බැවිනි.

අසනීප වන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් බව සිතන අය ඉන් සුවය ලැබීමට වෛද්‍ය ප්‍රතිකාර නොසෙවිය යුතුය. ශෛල්‍යකර්මයකට ඔවුන් භාජනය කර දෙවියන්වහන්සේගේ කැමැත්ත ශරීරයෙන් ඉවත් කිරීමට ඔවුන් ඉඩ නොදිය යුතුය. රෝගාතුරවීම දෙවියන්වහන්සේගේ කැමැත්ත

යයි ඇදහිලිවන්තයෙකු ලෙස ඔබ සැබවින්ම සිතන්නෙහි නම් ඔබ වෛද්‍යවරුන් බැහැදැකීම සහ බෙහෙත් ගැනීම නැවැත්විය යුතුය, මන්ද ඔබ සටන් කරන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්තට එරෙහිව වේ.

එහෙත් රෝගාබාධවලට හේතුව සාතන් බව අප දන්නා නිසා, නීත්‍යනුකූල වෛද්‍යවරුන්, ඖෂධ, රෝහල් හා වෛද්‍ය විද්‍යාව දෙවියන්වහන්සේගේ යහපත්කම හරහා ලැබෙන්නාවූ දේවල් වේ. අසනීපකම් සාතන්ගෙන් නිසා දුක්විඳීමෙන් නිදහස්වීමට තැත් කරන සෑම ක්‍රමයක්ම දෙවියන්වහන්සේගෙන් වේ (නීත්‍යනුකූල යනුවෙන් අප අදහස් කරන්නේ සාතනික ක්‍රම අයත් නොවන හෝ දේව වචනයට පටහැනි නොවන ක්‍රම වේ).

ඔබගේ ශරීරය මහත් මිලයකට ගත් දෙයක් බැවින් ඔබ අසනීපයෙන් සිටියද සුවයෙන් සිටියද ඔබ එය තුළින් දෙවියන්වහන්සේ මහිමයට පත්කිරීමට වග බලා ගත යුතුය. එහෙත් බයිබලීය වාර්තාවන් අනුව මිනිසුන් සුවය ලැබූ විට දෙවියන්වහන්සේ මහිමයට පත් කෙරේණි. අසනීප, දෙවියන්වහන්සේ මහිමයට පත්කරන්නේ නම්, යේසුස්වහන්සේ රෝගීන් සුව කිරීම මගින් දෙවියන්වහන්සේගෙන් මහිමය සොරාගෙන ඇත. අසනීප දෙවියන්වහන්සේ මහිමයට පත්කරන්නේ නම් අසනීප වන ලෙසට අප යාච්ඤා කළ යුතුය. ආත්මය තුළ ඇති පාපය දෙවියන්වහන්සේ මහිමයට පත් නොකරනවා සේම ශාරීරික අසනීපවලින් ද දෙවියන්වහන්සේ මහිමයට පත් නොකෙර්.

ඇතැම් අවස්ථාවල ඇදහිලිවන්තයෙකු අසනීප වීමට දෙවියන්වහන්සේ ඉඩ දෙන සේක. එහෙත් ලෙඩ රෝගවල ප්‍රභවය සාතන් බව මතක තබාගන්න. ජෝබ් පිළිබඳ නිදසුනෙන් මෙය පැහැදිලි වේ.

ඇදහිලිවන්තයෙකු අසනීප වීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවේ. සාතන්ගේ ප්‍රහාරයන් පිළිබඳව දෙවියන්වහන්සේ දන්නා අතර උන්වහන්සේ ඔබගේ යහපත සඳහා සියල්ල (නරක දේ වුවද) භාවිත කරන සේක. අසනීපයෙන් සිටියදී වුවද ඔබට දෙවියන්වහන්සේට වඩාත් ළං විය හැක්කේ එබැවිනි. නපුරෙන් යහපත ගෙන ඒමට දෙවියන්වහන්සේ සෑම විටම ක්‍රියා කරන සේක. යේසුස්වහන්සේගේ මරණය පාපයේ ඵලවලට පිළියමක් ලෙස ක්‍රියා කිරීමට භාවිත කළ සේක. ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ රෝගවල ප්‍රභවය දෙවියන්වහන්සේ නොවේ. එහෙත් සාතන් නපුර සඳහා යෙදීමට බලාපොරොත්තු වූ දෙයක් දෙවියන්වහන්සේ ගෙන, ඔබ ඒ ප්‍රහාරයට භාජනය වෙද්දී ඔබ තුළ ආත්මික ජයග්‍රහණ ලබා දීමට ක්‍රියා කරන සේක.

පාවුලුතුමා පළමුවරට ගලාතියේ දේශනා කළේ ශරීරාබාධයක් නිසා ඔහුට ඔහුගේ වැඩසටහන වෙනස් කිරීමට සිදුවූ නිසාය (ගලාති 4:13-15). ත්‍රොපිමස්ගේ අසනීපය නිසා ඔහුට පාවුලුතුමා සමග රෝමයට යෑමට නොහැකි විය. එබැවින් ඔහු පීඩාවලින් බෙරිනි (2 තිමෝති 4:20). පාපයෙන් වැළැක්වීම උදෙසා උත්පත්ති 12 හා 20 හි අසනීප භාවිත කර ඇත. මෙම නිදසුන්වලින් දෙවියන්වහන්සේ ලෙඩ රෝග භාවිත කරන අන්දම පෙන්නුවද,

> **" . . . උන්වහන්සේ මනුෂ්‍ය පුත්‍රයන්ට කැමැත්තෙන් පීඩා නොකරන සේක"**
> **(විලාප ගී 3:33)**

අසනීපවලින් පමණක් දෙවියන්වහන්සේ මහිමයට පත්කරන සාන්තුවරුන් බිහි නොවේ. ඒ වෙනුවට තිත්ත, චෝදනා කරන, නොඇදහිලිවන්ත අය බිහි කළ හැකිය. වර්ධනය ඇති කරන්නේත් පවිත්‍ර කරන්නේත් දේව වචනය වේ (යොහ. 17:17). අසනීපව සිටිද්දී යමෙක් දේව වචනය වෙත වඩ වඩා යොමු විම සත්‍ය වුවත් ආත්මික වර්ධනය සඳහා ලෙඩ රෝග අවශ්‍ය නැත.

මේ දෙය මතක තබා ගැනීම වැදගත්ය. ඇදහිලිවතුන් සඳහා දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ ක්‍රිස්තුන්වහන්සේ හා සමාන චරිතයක් තිබීමය. අසනීප හා සෞඛ්‍යය ඇතුලු අනෙකුත් සියල්ලට වැදගත්කම ලැබෙන්නේ මෙම දිව්‍යමය ඉලක්කය හා සම්බන්ධව වේ (රෝම 8:28-29).

නොඇදහිලිවතුන් ගැන පැවසිය හැක්කේ, ඔවුන් අසනීප වන්නේ පාපය නිසා හා පාපය නිසා පැමිණෙන දෙවියන්වහන්සේගේ ආවේණික විනිශ්චය නිසා බවය. එහෙත් මෙය වුවද දෙවියන්වහන්සේට ඔවුන්ගේ යහපත උදෙසා භාවිත කළ හැකිය, මන්ද ඔවුන්ට සුවය හා මිදීම පිළිබඳ කරන සේවයේ ප්‍රතිඵලයක් වශයෙන් ගැළවීම ලැබිය හැකි බැවිනි. සුවය හා මිදීම පිළිබඳව දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයෙන් බෙහෝ පොරොන්දු දී ඇත. ඔබ රෝගාතුරවීම උන්වහන්සේගේ කැමැත්ත නම් උන්වහන්සේ මේවා උන්වහන්සේගේ වචනයෙන්

දෙන්නේ මන්ද? “මා සුව කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්තදැයි මා දන්නේ නැහැ”යි ඇදහිලිවන්තයෙකු පැවසුවහොත් “තමන්වහන්සේගේ පොරොන්දු ඉටු කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්තදැ”යි උන්වහන්සේගෙන් අසන්න.

“මා දුටු තැනැත්තේ, පියාණන්වහන්සේ දුටුවේය”යි යේසුස්වහන්සේ පැවසූ සේක. උන්වහන්සේ එසේ පැවසුවේ උන්වහන්සේ පියාණන්වහන්සේගේ ක්‍රියා හා කැමැත්ත කළ නිසාය (යොහ. 14:9). දෙවියන්වහන්සේ ඔබ සුව කිරීමට කැමතිද යන්න ඔබට ප්‍රශ්නයක් නම් ඔබ කළ යුත්තේ අප සමිඳුණන්ගේ ක්‍රියා දෙස බැලීම පමණි.

ඔබ සුවය සඳහා යාච්ඤා කරන විට “ඔබගේ කැමැත්ත වේවා හෝ “ඔබගේ කැමැත්ත අනුව” හෝ යනුවෙන් යාච්ඤා කරන්න. සුවය හා මිදීම ගැන යාච්ඤා කරන විට “එය ඔබගේ කැමැත්ත නම්” යනුවෙන් නොපවසන්න. “ස්වාමිනි, ඔබවහන්සේ කැමති සේක් නම් මා ගළවා ගත මැනව” යි පව්කරුවෙකු යාච්ඤා කරන්නේ නැත. ගැළවීම මෙන්ම සුවය ද සමගි කිරීමේ පූජාවේ කොටසකි.

ඔබ සුව කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍ය බවට අවිශ්වාසයක් ගම්‍ය වන්නේ නම්, “ඔබගේ කැමැත්ත අනුව” යන්නෙන් ඇදහිල්ලේ විශ්වාසය ප්‍රකාශ කෙරෙන අතරම ක්‍රමය, ප්‍රමාණය හා කාලය උන්වහන්සේට දෙනු ලබයි. මරණය දක්වා අසනීපව සිටින විට වුවද “ඔබගේ කැමැත්ත අනුව” යනුවෙන් යාච්ඤා කරන්න. “එය ඔබගේ කැමැත්ත නම්” යනුවෙන් නොපවසන්න. “ඔබගේ කැමැත්ත අනුව” යන්න සුවකිරීමේ කාලය හා තත්වය දෙවියන්වහන්සේට ලබා දෙයි. ඇදහිලිවන්තයෙකුට සදහටම අසනීපවලින් තොර සදාතන සුවය ලබාදීම මරණය තුළින් දෙවියන්වහන්සේට තෝරාගත හැකිය.

“ස්වර්ගයෙහි මෙන් පොළොවෙහි ද ඔබගේ කැමැත්ත වේවා” යනුවෙන් යාච්ඤා කිරීමට යේසුස්වහන්සේ අපට ඉගැන්වූ සේක. අසනීපකම් හා රෝග ස්වර්ගයේ නොමැත. එබැවින් එය උන්වහන්සේගේ කැමැත්ත නොවන බව දැනගෙන පොළොවේදී ඊට විරුද්ධව අපට නොබියව යාච්ඤා කළ හැකිය. “දෙවියන්වහන්ස ඔබගේ කැමැත්ත නම් සුව කළ මැනව” යනුවෙන් යේසුස්වහන්සේ කිසි දිනක යාච්ඤා කළේ නැත. “ඔබ කැමතිසේක් නම්” කියා උන්වහන්සේ යාච්ඤා කළ එකම අවස්ථාව, තම ජීවිතය පිළිබඳව දෙවියන්වහන්සේගේ සැලැස්මට යටත්වීම පිණිස වේ. සුව කිරීම පිළිබඳව නොවේ. “ඔබගේ කැමැත්ත නම්” යන්න ඇදහිල්ල විනාශ කරයි. සුව කිරීම පිළිබඳව යේසුස්වහන්සේගේ කැමැත්ත නොදන්නා ලාදුරු රෝගියෙකු එසේ පැවසූ විට, ඔහුගේ අස්ථිරත්වය නිවැරදි කරමින් යේසුස්වහන්සේ “මම එසේ කරමි” යි පැවසූ සේක. කිසිදිනෙක දෙවියන්වහන්සේගේ සත්‍යයන් බලාපොරොත්තු හෝ ප්‍රශ්න හෝ බවට හරවන්න එපා. ඒවා සත්‍යතාවන් බව පිළිගෙන ක්‍රියා කරන්න. එවිට ඒවා බලවත් බව ඔබට පෙනෙනු ඇත.

යම් කෙනෙකු ක්ෂණයකින් සුව නොවූ නිසා හෝ “මාරාන්තික රෝගයකින්” මිය ගිය නිසා හෝ ඔහු සුවකිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවේයයි නොසිතන්න. අප දේවල් දෙස බලන්නේ කාලය අනුව වන අතර දෙවියන්වහන්සේ බලන්නේ සදාතනය අනුවය. ප්‍රමාදවී සිදුවන සුවකිරීම් ඇති බව මතක තබාගන්න. ඇතැම් ඒවා:

**මනුෂ්‍ය කාලයට අනුව ප්‍රමාදය :** සාරාගේ වඳ භාවය සැණෙකින් සුව වූයේ නැත. ජෝබ් සැණෙකින් සුව වූයේ නැත. යොහන් බව්තිස්තගේ පියාගේ ගොළු භාවය නියමිත කාලය පැමිණෙන තුරු සුව වූයේ නැත. අන්ධ මිනිසෙකු වෙනුවෙන් යේසුස්වහන්සේ දෙවරක් යාච්ඤා කළ සේක. පළමුවර ලැබුණේ අර්ධ සුවයක් පමණි. සුවවීම් ඇතැම් විට ප්‍රමාද වන්නේ දෙවියන්වහන්සේ වඩාත් මහිමයට පත් කිරීම පිණිසය. ලාසරස් මලවුන්ගෙන් නැගුටුවීමේ කතාව මීට හොඳ නිදසුනකි.

**සදාතනයේදී ප්‍රමාද වීම :** මරණය යනු ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ සදාතන ක්ෂේත්‍රය තුළ තවත් සිදුවීමක් පමණි. “මරණය දක්වා අසනීපයක්” වුවද ජයග්‍රහණයක් වේ. මන්ද ඇදහිලිවන්තයෙකුට මරණය අවසාන සුවය වේ. ඔබ සමිඳුණන්ගේ අභිමුවට ඇතුළු වන විට ඔබ සම්පූර්ණ වන අතර තවදුරටත් ඔබ පාපයෙන් හෝ රෝගාබාධවලින් හෝ දුක්විඳින්නේ නැත. මරණය පිළිබඳව කතා කරන විට පාවුලුතුමා පවසන්නේ ඔහු මේ සඳහා සූදානම්ව සිටින බවය. “ශරීරය නමැති නිවාසයෙන් ඈත්වී සමිඳුණන්වහන්සේ තුළ වසන්නෙමු” (2 කොරි. 5:6-9).

සුවය සියල්ලන්ට යන්න ඔබ විශ්වාස නොකරන්නෙහි නම්, ඔබ විශ්වාස කළ යුත්තේ එක් එක් අවස්ථාවල සුව කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත ද නැද්ද යන්න ඍජු එළිදරව්වීමකින් පාලනය වන බවය. එවිට ඔබ විශ්වාසය තබන්නේ මිනිසා වෙත කෙරෙන ඍජු එළිදරව්ව මත මිස

දේව වචනය මත නොවේ. රෝගී තැනැත්තා සුව කිරීමට “තෝරාගෙන” සිටින අය අතුරින් කෙනෙක් ද යන්න විශේෂ එළිදරව්වකින් ලැබෙන තුරු ඔබට ඇදහිල්ල සඳහා පදනමක් නැත.

## “මෙය ධර්මිෂ්ඨයන්ට සිදුවන පීඩාවකි”

ඇතැම්මු මෙසේ පවසති: “ධර්මිෂ්ඨයන්ට පීඩා බොහෝ වේ. ඔබ ධර්මිෂ්ඨ බැවින් මෙම පීඩා ඔබ දරාගත යුතුය ”.

### අපගේ ප්‍රතිචාරය:

ගීතාවලිය 34:19 හි භාවිත කර ඇති “පීඩා” යන වචනයෙහි තේරුමෙහි රෝග හා සම්බන්ධයක් නැත. එය යොමු කෙරෙන්නේ පරීක්ෂාවන්, කරදර, පීඩාවන් ආදියට වේ. එය රෝග කෙරෙහි යොමු කළ ද එම පදයේ ඉතිරි කොටසින් පෙන්නුම් කෙරෙන්නේ සමිඳුණන්ට අප මුදාහැරීමට අවශ්‍ය බවය.

යාකොබ් 5:13-16 හි පීඩා හා රෝග අතර වෙනසක් සඳහන් වේ. ඔබ පරීක්ෂාවන් හා පීඩාවන්ගෙන් දුක්විඳින්නේ නම් ඔබ, ඔබ වෙනුවෙන්ම යාච්ඤා කළ යුතුය (5:13). ඔබ සමග යාච්ඤා කිරීමට අන් අයගෙන් ඉල්ලිය හැකි වුවද ඔබගේ සියලු කරදර ඉවත් කිරීමට යාච්ඤා කිරීම ඔවුන්ගේ කැඳවීම නොවේ. ඔබ දුක්විඳින විට යාච්ඤා කරන ලෙස ශුද්ධ ලියවිල්ල ඔබට උපදෙස් දෙයි. මන්ද පරීක්ෂාවන් මධ්‍යයේ යාච්ඤා කිරීම තුළින් ජයග්‍රහණය කරන ආකාරය ඔබ උගත යුතු බැවිනි. කෙසේවුවද රෝගීව සිටින විට යාච්ඤා කිරීම සඳහා සභා මූලිකයන් කැඳවිය යුතුය (යාකොබ් 5:14). රෝගීන් ගළවා ගත යුතුය (ඔවුන්ගෙන් ශාරීරික රෝගවලින්) නැගුටුවිය යුතුය (ශක්තිය නැවත ලැබීම) පාපයෙන් කමාව ලැබිය යුතුය (ආත්මික සුවය).

## “දිව්‍යමය සුවය විරලය“

ඇතැමුන් දිව්‍යමය සුවයට විරුද්ධ වන්නේ සුවකිරීම් විරල යයි කියමිනි. ඔව්හු මෙසේ අසති, “බලාපොරොත්තු කඩ කිරීම පිණිස මිනිසුන්ට බලාපොරොත්තු දෙන්නේ මන්ද?”

### අපගේ ප්‍රතිචාරය:

දිව්‍යමය සුව කිරීම් විරල නැත. නව ගිවිසුමේ පිටු පිරී ඇත්තේ සුව කිරීම් හා මුදාගැනීමේ කතාවලිනි. සභා ඉතිහාසයේ වාර්තාවල ද වෛද්‍ය ලේඛණවල සඳහන් දිව්‍යමය සුවකිරීම් ඇත.

## “ඔබගේ රෝගය ඔබගේ කුරුසිය වේ”

“ඔබගේ රෝගය ඔබගේ කුරුසිය වේ. එය සමග ජීවත්වීමට ඔබ උගත යුතුය”. ඔබ මේ ප්‍රකාශය කවදා හෝ අසා තිබේද?

### අපගේ ප්‍රතිචාරය:

රෝගය ඔබගේ “කුරුසියය” යන ප්‍රකාශය ගැන පහසුවෙන්ම කටයුතු කළ හැකිය. “කුරුසිය” ඔබගේ කිසිම තෝරා ගැනීමක් නොමැතිව ඔබ වෙත පැමිණෙන ගැටලු, රෝග හා පීඩා නොවේ. “කුරුසිය දරා ගැනීම” ස්වේච්ඡාවෙන් කරන දෙයක් බවත් ඔබට විකල්පයක් නොමැති නිසා ඔබ පිළිගන්නා දෙයක් නොවන බවත් යේසුස්වහන්සේ පැහැදිලි කළ සේක. රෝග හා මරණය දෙවියන්වහන්සේ විසින් එවන ලද කුරුසියක් ලෙස යේසුස්වහන්සේ සැලකුවේ නැත. උන්වහන්සේ ඒවා සතුරන් ලෙස සැලකූ සේක. රෝගය ඔබගේ කුරුසිය ලෙස ඔබ විශ්වාස කරන්නෙහි නම්, ඉන් සුවය ලැබීමට ඔබ වෛද්‍ය ප්‍රතිකාර සොයන්නේ මන්ද?

## ස්වයං පරීක්ෂණය

1. සුවවීමේ පොරොන්දුව කටපාඩමෙන් ලියන්න.

2. පහත දැක්වෙන මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායන් සඳහා ඔබගේ ප්‍රතිචාරය ලියන්න.

 සුවය හා හාස්කම් අද දවසට නොවේ.

 මියගිය සියලු දෙනාම මළවුන්ගෙන් නැගුටුවන්නේ නැත්තේ මන්ද?

 කිතුනුවන් මියයන්නේ මන්ද?

 නවීන ඖෂධ නිසා දිව්‍යමය සුවය අනවශ්‍යය.

 දිව්‍යමය සුවය උගන්වන්නේ ව්‍යාජ ලබ්ධින් විසිනි.

 ආත්මයට වඩා ශරීරය ගැන අවධානය යොමු කෙරේ.

 ඔබ රෝගීව සිටින්නේ ඔබගේ පාපය නිසාය.

 ඔබ රෝගාතුරවීම දේව කැමැත්ත වේ.

 මෙය ධර්මිෂ්ඨයන්ට සිදුවන පිඩාවකි.

 දිව්‍යමය සුවය විරලය.

 ඔබගේ රෝගය ඔබගේ කුරුසිය වේ.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

ඔබගේ හෝ ඔබ සේවය කරන කෙනෙකුගේ හෝ රෝගයක් පිළිබඳව පහත දැක්වෙන කුමන සම්ප්‍රදායක් ප්‍රකාශ කරනු ඔබට ඇසී තිබේද?

- සුවය හා හාස්කම් අද දවසට නොවේ.
- මියගිය සියලු දෙනාම මළවුන්ගෙන් නැගුටුවන්නේ නැත්තේ මන්ද?
- කිතුනුවන් මියයන්නේ මන්ද?
- නවීන ඖෂධ නිසා දිව්‍යමය සුවය අනවශ්‍යය.
- දිව්‍යමය සුවය උගන්වන්නේ ව්‍යාජ ලබ්ධින් විසිනි.
- ආත්මයට වඩා ශරීරය ගැන අවධානය යොමු කෙරේ.
- ඔබ රෝගීව සිටින්නේ ඔබගේ පාපය නිසාය.
- ඔබ රෝගාතුරවීම දේව කැමැත්ත වේ.
- මෙය ධර්මිෂ්ඨයන්ට සිදුවන පීඩාවකි.
- දිව්‍යමය සුවය විරලය.
- ඔබගේ රෝගය ඔබගේ කුරුසිය වේ.

මෙම අභියෝග අනාගතයේදී නැවතත් ප්‍රකාශ කළ විට ඒවාට මුහුණ දීමට ඔබ භාවිත කරන ප්‍රතිචාරය ලියන්න.

# දොළොස්වන පරිච්ඡේදය

# මාංසයෙහි කටුව (උල)

## අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවයේ පොරොන්දුව කටපාඩමෙන් ලිවීමට
- පාවුලුතුමාගේ මාංසයෙහි කටුව කවුරුන්ගෙන්ද යන්න හඳුනාගැනීමට
- කටුව කවරක්ද යන්න බයිබලය පවසන දෙය හඳුනාගැනීමට
- එය පාවුලුතුමාගේ ජිවිතයට ඒමට ඉඩ දුන්නේ මන්ද යන්න පැහැදිලි කිරීමට
- එය කළ දේ විස්තර කිරීමට
- එය විද්‍යමාන වු ආකාරය සාරාංශ කිරීමට
- පාවුලුතුමාගේ මාංසයෙහි කටුව ප්‍රතිඵල පැහැදිලි කිරීමට

## සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **". . . උන්වහන්සේ ද ඔවුන්ගේ කන්නලව්ව පිළිගෙන ඔවුන් සුවපත් කරනවා ඇත." (යෙසායා 19:22)**

## හැඳින්වීම

පසුගිය පාඩමෙන් ඔබ අධ්‍යයනය කළේ සුවය හා මිදීම සොයන ඇදහිලිවතුන්ට ගැටලු ඇතිකරන මනුෂ්‍යයන්ගේ ඇතැම් සම්ප්‍රදායන් පිළිබඳව වේ. මෙම පාඩමෙන් සලකා බැලෙනුයේ, 2 කොරින්ති 12 හි විස්තර කර ඇති පාවුලුතුමාගේ මාංසයෙහි කටුව කේන්ද්‍ර කරගත් සම්ප්‍රදායක් පිළිබඳව වේ. එය බොහෝ සේ විවාදයට ලක් වී ඇති නිසාත් සුවය පිළිබඳ ප්‍රශ්නයට ඉතා වැදගත් නිසාත් ඒ සඳහා අපි මුළු පාඩමක්ම කැප කළෙමු.

බොහෝ අයට උගන්වා ඇත්තේ පාවුලුතුමාගේ කටුව රෝගයක් බවත් එය ඉවත් කරන ලෙස තුන්වරක් යාච්ඤා කළ ද ප්‍රතිඵලයක් නොලද බවත් ඔවුන්ට ද "මාංසයෙහි කටුවක්" වන රෝගයක් තිබීම ඔවුන්ගේ ඉරණම වනු ඇති බවය. සම්ප්‍රදාය පවසන්නේ "ඔබගේ රෝගය පාවුලුතුමාගේ වැනි මාංසයෙහි කටුවකි. එය සමග ජිවත්වීමට ඔබ උගත යුතුය" යනුවෙනි.

"ශරීරයේ කාවැදුණු කටුව" සම්ප්‍රදාය බොහෝ අයට සුවය ලැබීම වළක්වාලන ප්‍රධාන බාධකයකි. මනුෂ්‍යයන්ට දෘශ්‍යමාන සුවයක් නොලැබීමට හේතුව පැහැදිලි කිරීමටත් අපගේ බලරහිත භාවය සඳහා නිදහසට කරුණක් ලෙසත් එය සාවද්‍ය ලෙස භාවිත කර ඇත. මෙම පාඩම ඔබ පටන්ගන්නා විට, මේ කරුණ පිළිබඳව මිනිසා විසින් උගන්වා ඇති සියලුම දේ අහක තබන්න. මේ පිළිබඳව ශුද්ධ ලියවිල්ල නිවැරදිව උගන්වන දේ අපි විමසා බලමු.

## "පාවුලුතුමාගේ මාංසයෙහි කටුව"

පාවුලුතුමාගේ මාංසයෙහි කාවැදුණු කටුව පිළිබඳ බයිබලය උගන්වන දේ මෙසේ වේ.

## එය කුමක්ද?

පාවුලුතුමාගේ කටුව දූතයෙකු බව බයිබලය පවසයි. "දූතයෙකු" යන ග්‍රීක් වචනය නව ගිවිසුමේ සත්වරක් සඳහන්ව ඇත. එය "දූතයා" ලෙස 181 වරක් පරිවර්තනය කර ඇත. මේ සියලුම 188

වාරයේ එය කතා කරන්නේ පෞරුෂත්වය ගැන මිස අසනීපයක් ගැන හෝ රෝගයක් ගැන හෝ නොවේ. දූතයෙකු පුද්ගලයෙක් වේ.

පැරණි ගිවිසුමේ "කටු" යන වචනයේ භාවිතය ද මෙයට අනුබල දෙයි. "කටුව" යන්න ගණන් කථාව 35:55 හිද යෝෂුවා 23:13 හි ද කානාන් දේශයේ වාසය කරන්නන් විස්තර කිරීමට භාවිත කර ඇත. මේ අවස්ථා දෙකෙහිම එය ශාරීරික ආපදාවක් නොව සතුරා විසින් කරන ලද පහරදීමක් ගැන සඳහන් කර ඇත.

### එය කාගෙන්ද?

බයිබලය පවසන්නේ එය සාතන්ගේ දූතයෙකු බවය. ". . . මට දෙන ලද්දේය"යි පාවුලුතුමා පවසයි. එහෙත් එය දෙවියන්වහන්සේගෙන් බව ඔහු පවසා නැත.

### ඊට ඉඩ දුන්නේ මන්ද?

කටුවට ඉඩ දුන්නේ ප්‍රධාන කරුණු තුනක් සඳහා වේ.

**1. ඉන් පාපය වැළකිණි.**

පාවුලුතුමා පවසන්නේ කටුවට ඉඩ දෙන ලද්දේ ඔහු ලද බොහෝ එළිදරව්වන් නිසාත් අහංකාරය වෙත තැබූ ඔහුගේ ප්‍රවණතාව නිසාත් බවය.

මාංසයෙහි කටුවක් ඇති බවට ඕනෑම කෙනෙක් පැවසීමට පෙර ඔහුට කෙතරම් එළිදරව් හා දර්ශන ලැබුණේදැයි සිතා බැලිය යුතුය. කටුවක් තිබීමට ඔහු සුදුසුකම් ලබා තිබේද? තම මාංසයෙහි කටුවක් කා වැදී ඇති බවට පවසන බොහෝ දෙනෙකුට කිසිම ආකාරයේ එළිදරව්වීමක් හෝ දර්ශනයක් හෝ ලැබී තිබේ.

**2. එය අනාවැකි සම්පූර්ණ කළේය.**

එම කටුව අනාවැකි සම්පූර්ණ කළේය. පාවුලුතුමා ගැළවීම ලැබූ අවස්ථාවේ දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **"ඔහු මාගේ නාමය නිසා කොපමණ දුක් විඳින්න ඕනෑ ද කියා ඔහුට දක්වන්නෙමි" (ක්‍රියා 9:16)**

**3. එය ශක්තිය සැපයිය**

"කටුව" ඇති කළ ගැටලුව නිසා දෙවියන්වහන්සේගේ ශක්තිය විදෘමාන කිරීමට අවස්ථාවක් සැපයිණි.

## එය කෙළේ කුමක්ද?

කටුව පාවුලුතුමා පහර දෙන ලදී. "පහර දීම" යනුවෙන් අදහස් කෙරෙන්නේ නැවත නැවත නොනැවති පහර පිට පහර දීම බවකි. "පහර දීම" යන වචනයෙන් සාදාකාලික රෝගී තත්වයක් අදහස් නොකෙරේ. ඉන් අදහස් කෙරෙන්නේ නැවත නැවත පහර දීමය. පාවුලුතුමාට පහර දීමට දූතයෙකු එවන ලද්දේ දේව වචනය දේශනා කිරීම නැවැත්වීමට වේ.

### එය විදෘමාන වූයේ කෙසේද?

පාවුලුතුමාට පහර දීම සඳහා මෙම කටුව විවිධාකාරයෙන් ඇති කළ විරෝධතා පිළිබඳ නිදසුන් කිපයක් පහත දැක්වේ.

(1) පාවුලුතුමා ගැළවීම ලැබූ විගසම ජුදෙව්වරු ඔහු මරන්නට තීරණය කළහ. (ක්‍රියා 9:23)
(2) ඇදහිලිවතුන් හා එක්වීමට පාවුලුතුමාට බාධා කෙරිණි. (ක්‍රියා 9:26-29)
(3) සාතන් ඔහුට විරුද්ධ විය. (ක්‍රියා 13:6-12)

(4) ජුදෙව්වරු කණ්ඩායමක් ඔහුට විරුද්ධ වූහ. (ක්‍රියා 13:44-49)
(5) පිසිදියේ අන්තියෝකියෙන් ඔහු නෙරපා දමන ලදී. (ක්‍රියා 13:50)
(6) ඉකෝනියාවෙන් ඔහු නෙරපා දමන ලදී. (ක්‍රියා 14:1-5)
(7) ඔහු ලුස්ත්‍රාවට ද දර්බයට ද පලා ගිය අතර එහිදී ඔහුට ගල් ගසා ඔහු මැරෙන පිණිස දමා ගියේය. (ක්‍රියා 14:6-19)
(8) ව්‍යාජ සහෝදරවරුන් සමග ඔහු දිගටම වාද කළේය. (ක්‍රියා 19:8)
(9) පිලිප්පියේ දී ඔහුට තලා ඔහු සිරගත කෙරිණි. (ක්‍රියා 16:12-40)
(10) තෙසලෝනිකයේ දී ඔහුට හිරිහැර කර ඔහු නෙරපා හැරිණි. (ක්‍රියා 17:1-10)
(11) බෙරියාවේදී ඔහුට හිරිහැර කර ඔහු නෙරපා හැරණි. (17:10-14)
(12) කොරින්තියේ දී ඔහුට හිරිහැර කෙරණි. (ක්‍රියා 18:1-23)
(13) එපිසයේදී ඔහුට හිරිහැර කෙරිණි. (ක්‍රියා 19:23-31)
(14) ජුදෙව්වරු ඔහු මරා දැමීමට කුමන්ත්‍රණ කළහ. (ක්‍රියා 20:3)
(15) ජුදෙව්වරු ඔහු අල්ලාගෙන, හිරිහැර කර, පස් වතාවක් උසාවියේ නඩු අසා විවිධ කරදර කළහ. (2 කොරි. 11:23-33)

රෝගය, ඔහු දුක්විඳිමට පත් කළ පහර දීමක් ලෙස පාවුලුතුමා තම ලියවිල්ලෙහි කොතැනකවත් සඳහන් නොකරයි. 1 කොරින්ති 4:11 හි පාවුලුතුමා පෙන්නුම් කරන්නේ පහරදීම පිළිබඳ ඔහුගේ අදහස නිත්‍ය රෝගයක් නොවන බවය. ඔහු මෙසේ පවසයි, “මේ මොහොත දක්වාම අපි කුසගින්නෙන් හා පිපාසයෙන් පෙළෙමු. වැරහැලි අඳිමු, පහර ලබමු. ගෙයක් දොරක් අපට නැත”.

ගලාති 4:13-16 හි පෙන්වා ඇති පරිදි පාවුලුතුමා රෝගාබාධවලින් පෙළිණි. එහෙත් එය නිත්‍ය තත්වයක් නුවූ නිසා එය ඔහුගේ කටුව නොවේ. එය “පළමු කොට” තිබූ බව ඔහු පවසයි. පාවුලුතුමගේ කටුව ඇස් පෙනීමේ දුර්වලතාවක් යයි සමහරු පවසති. එහෙත් ඔහුගේ අන්ධභාවය සුව කරනු ලැබීය (ක්‍රියා 9:18). ඔහුට තවමත් ඇස් ආබාධ තිබුණු බව විශ්වාස කිරීමෙන් දෙවියන්වහන්සේගේ සුවකිරීමේ බලය අවතක්සේරුවට පත් කරයි. තවද දෙවියන්වහන්සේගේ මහිමය දැකීමෙන් ඇති වූ ඇස් ආබාධය සාතන්ගේ දූතයෙකු යයි පැවසීම නිවැරදිද? පාවුලුතුමාම අපට පවසන්නේ, ඔහු මෙම හසුන 60 වන අවුරුද්දේ ලියුවිට,“ශරීරයේ කාවැදුණු කටුව” ඇතිවීමට හේතු වූයේ “අවුරුදු 14කට පමණ පෙර” ඔහුට “බොහෝ එළිදරව්” ලැබීම බව යයි සඳහන් වේ. එය ඔහුගේ හැරීමෙන් අවුරුදු 12 කට පසුවය. ඒ අවස්ථාවේ ඔහු දෙවියන්වහන්සේගේ මහිමය දුටුවේය.

පාවුලුතුමා ගලාති 4:15 හි “ඔබගේ ඇස් උගුළා මට දෙන තරමට වුවද” යන වාක්‍ය ඛණ්ඩය භාවිත කරද්දී, එය හෙබ්‍රෙව් වාක්‍යාලංකාරයකි. අද අධිකතර ආශාවන් පෙන්නුම් කිරීමට භාවිත කෙරෙන වාක්‍ය ඛණ්ඩ හා සමානය. නිදසුන් වශයෙන් “මම මාගේ දකුණු අත දෙන්නෙමි” වැනි ඒවා දැක්විය හැකියි. ඇතැමුන් පවසන පරිදි, පාවුලුතුමාට, තම ඇස්වලින් සැරව වැගිරෙන ඇස් රෝගයක් තිබිණි නම්, විශේෂ භාස්කම් කෙරෙහි මිනිසුන් උනන්දු කිරීම පාවුල්ට අපහසු කාරණයක් විය හැකිය.

## එහි ප්‍රතිඵල

පාවුලුතුමා ඔහුගේ දුර්වලතා ගැන කතා කරන්නේ එය “ශක්තිය අවශ්‍ය වීම, දුර්වලකම, තමාගේම ස්වභාවික හැකියා තුළින් ප්‍රතිඵල පෙන්වීමට නොහැකි වීම” ආදිය වේ. මෙම දුර්වලතාව තුළින් දෙවියන්වහන්සේගේ බලය හා ශක්තිය විද්‍යමාන විය.

## නිගමනය

පාවුලුතුමාගේ කටුව පිළිබඳ නිගමනය කල හැකි වන්නේ, කටුව කුමක්දැයි අපට ස්ථිරව කිව නොහැකි වුවත් එය රෝගාබාධයක් බවට ඔබට උගන්වා ඇත්නම් පහත සඳහන් දෙය මතක තබාගන්න.

පාවුලුතුමාගේ කටුවේ ප්‍රතිඵලය වූයේ ඔහුගේ ජීවිතය තුළින් දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ වීමය. සමහරක් අය පාවුලුතුමාගේ කටුව ලෙඩ රෝගීව සිටීමට හේතුවක් ලෙස යොදා ගනිති. ශරීරයේ කාවැදුණු කටුව යන එකම බයිබලීය නිදසුන, දේව සේවයේ ඔහුගේ සියලු සහකරුවන් ලිවීමෙන්ද, දේශනා කිරීමෙන්ද, ගමන් බිමන් යෑමෙන් ද අබිබවා ගිය බව ඔවුන් මතක තබාගත යුතුය. දේව රාජ්‍යය වෙනුවෙන් ඔහු කළ ප්‍රාණවත් සේවයට කටුව නිසා බාධාවන් ඇති නොවීය. එමෙන්ම ඔහු තුළින් දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමට ද බාධාවක් නොවීය.

## ස්වයං පරීක්ෂණය

1. සුවයේ පොරොන්දුව කටපාඩමෙන් ලියන්න.

______________________________________________

______________________________________________

______________________________________________

2. පාවුලුතුමාගේ මාංසයෙහි කටුව ලැබුණේ කාගෙන්ද?

______________________________________________

3. බයිබලයට අනුව පාවුලුතුමාගේ ශරීරයට කාවැදුණු කටුව කුමක්ද?

______________________________________________

4. මාංසයෙහි මෙම කටුවට ඉඩ දුන්නේ මන්ද?

______________________________________________

5. කටුව පාවුලුතුමාට කුමක් කළේද?

______________________________________________

6. පාවුලුතුමාගේ මාංසයෙහි කටුව විද්‍යමාන වූයේ කෙසේද?

______________________________________________

7. පාවුලුතුමාගේ මාංසයෙහි කටුවේ ප්‍රතිඵල කුමක්ද?

______________________________________________

______________________________________________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. ඔබ මෙම පාඩමෙන් උගත් දේ භාවිත කරමින්, තම රෝගය දෙවියන්වහන්සේගෙන් ආ මාංසයෙහි කටුවක්ය යන්නට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?

2. සුවයේ පොරොන්දුව අධ්‍යයනය කරන්න.

**" . . . උන්වහන්සේ ද ඔවුන්ගේ කන්නලව්ව පිළිගෙන ඔවුන් සුවපත් කරනු ඇත" (යෙසායා 19:22)**

"කන්නලව්" යනුවෙන් අදහස් කරන්නේ ඕනෑකමින් ඉල්ලීම හා ප්‍රබල ලෙස අයැදීම වේ. උන්වහන්සේට කන්නලව් කරන අයට උන්වහන්සේ සුවය දෙන බවට පොරොන්දු විය.

3. පාවුලුතුමාගේ කටුව රෝගයක් නොවුව ද දෙවියන්වහන්සේ ඔහුට දුන්නාවූ එම ශක්තියම, බාහිර පහර දීමක දී වුවද ශාරීරික දුර්වලතාවකදී වුවද පූර්ණ සුවය බලාපොරොත්තුවෙන් සිටින විට ඔබට දෙවියන්වහන්සේ දෙනු ඇත. දෙවියන්වහන්සේ පාවුලුතුමාට මෙසේ පැවසූ සේක.

**"මක්නිසාද, දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවෙන්නේය" (2 කොරින්ති 12:9)**

මීට පාවුලුතුමා දැක්වූ ප්‍රතිචාරය මෙසේය.

**". . .ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස, මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි.**
**එහෙයින් ක්‍රිස්තුන්වහන්සේ උදෙසා පැමිණෙන දුර්වලකම්වලටත් අන්තරායවලටත් හිඟකම්වලටත් පීඩාවලටත් විපත්තිවලටත් ප්‍රසන්නව සිටිමි. මක්නිසාද, මම දුර්වලව සිටින කලම ශක්තිමත්ව සිටිමි" (2 කොරින්ති 12:9-10).**

4. ඔබගේම ශාරීරික තත්වය හෝ ඔබ සුවය සඳහා සේවය කරන වෙනත් කෙනෙකුගේ ශාරීරික තත්වය ගැන සිතන්න.

ඔබගේ වර්තමාන දුර්වලතා කවරේද?

මෙම දුර්වලකම් තුළ දෙවියන්වහන්සේගේ ශක්තිය විදෘමාන කළ හැක්කේ කෙසේද?

සුවය බලාපොරොත්තුවෙන් සිටින විට දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා කුමක් කළ හැකිද? (ඇඳේ හෝ රෝද පුටුවක හෝ සිටින කෙනෙකුට වුවද යමක් කළ හැකිය - ඔවුන්ට යාච්ඤාවේ මැදිහත්කරුවෙකු විය හැකිය).

5. ඔබගේ ශාරීරික ගැටලුවලට අතිරේකව සාතන්ගෙන් ඔබ බාහිර පහරදීම් අත්දකින්නෙහිද? දැන් ඔබ අත්දකින්නේ කවර ගැටලුද?

___

___

මේ අවස්ථාන් තුළ දෙවියන්වහන්සේගේ මහිමය විද්‍යමාන කරන්නේ කෙසේද?

___

___

# දහතුන් වන පරිච්ඡේදය

# පිළිතුරු නොලත් ප්‍රශ්න

## අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවයේ පොරොන්දුව කටපාඩමෙන් ලිවීමට
- "විචල්‍යයන්" නිර්වචනය කිරීමට
- සුවය සඳහා බලපාන පහත දැක්වෙන විචල්‍යයන් සාකච්ජා කිරීමට
  - ඉගැන්වීමක් නොමැති වීම
  - අවිශ්වාසය
  - ඇදහිල්ලක් නොමැති වීම
  - බලය නොමැති වීම
  - පාපොච්චාරණය නොකළ පෞද්ගලික පාප
  - සුව කරනු ලැබීම ප්‍රතික්ෂේප කිරීම
  - තීරණයන් හා ආශාවන් නොමැති වීම
  - ඉල්ලීම පිළිබඳ ගැටලු
  - නොපසුබට උත්සාහය නොමැති වීම
  - සුවවීමේ ක්‍රියාවලියේ අකීකරුකම
  - ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය අනිසි ලෙස භාවිත කිරීම
  - අශුද්ධ ආත්මය පලවා නොහැරීම
  - දෙවියන්වහන්සේගේ ක්‍රියාවන්ට විරුද්ධ වීම
  - ස්වභාවික නීති උල්ලංඝණය කිරීම
  - මියයෑම සඳහා නියමිත වේලාව

- මෙම විචල්‍යයන්ට ප්‍රතිචාර දැක්වීමට හැකිවනු ඇත.

## සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **රහස්වූ දේ අපේ දෙවිවූ ස්වාමින්වහන්සේට අයිතිය. එහෙත් මේ ව්‍යවස්ථාවේ සියලු වචන අප විසින් පවත්වන පිණිස එළිදරව්කර තිබෙන දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලයටම අයිතිය. (ද්විතිය කථාව 29:29)**

## හැඳින්වීම

තවත් සෙනඟ විශාල සංඛාවක් සුවය නොලබන්නේ මන්ද? ඇතැමුන් සුවය ලබන්නේත් ඇතැමුන් සුවය නොලබන්නේත් මන්ද? ලෞකික හා එතරම් ගැඹුරු ඇදහිල්ලක් නොමැති කිතුනුවන් සුවවන්නේත් වඩාත් අවංක හා කැපවීමක් සහිත කිතුනුවන් තවමත් සුවය නොලබා සිටින්නේත් මන්ද?

සුවය හා මිදීම පිළිබඳ සේවයේ ඔබ යෙදෙන විට ඔබට මුහුණ දීමට සිදුවන ප්‍රශ්න සමහරක් මේවා විය හැකිය. මෙම පාඩමෙන් සලකා බැලෙන්නේ සුවය කෙරෙහි බලපාන විචල්‍යයන් පිළිබඳව වේ. "විචල්‍යයක්" යනු වෙනස්කම් හෝ වෙනස් ප්‍රතිඵල ගෙන දෙන සාධකයකි.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයේ සුවය පොරොන්දු වී ඇත. කෙසේවුවද අප මතක තබාගත යුතු දෙයක් වන්නේ දෙවියන්වහන්සේගේ සෑම පොරොන්දුවකටම කොන්දේසි ඇති අතර මනුෂ්‍යයාගේ ප්‍රතිචාරය මත එය රඳා පවත්නා බවය. සුවය කෙරෙහි බලපාන විචල්‍යයන් අප අවබෝධ කරගැනීම වැදගත් වන්නේ එබැවිනි.

## විචල්‍යයන් අවබෝධ කරගැනීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීම

සුවකිරීමේ සේවයේ විචල්‍යයන් යනු ඇතැම් අය සුවවීමටත් තවත් අය සුව නොවීමටත් හේතු වේ. ඔබ මෙම අධ්‍යයනය ආරම්භ කිරීමට පෙර මතක තබාගත යුතු වැදගත් දෙයක් වන්නේ සුවය හා මිදීම පිළිබඳ සේවයේදී ඔබ මුහුණ දෙන සියලුම ප්‍රශ්න හා ගැටලුවලට කිසි දිනෙක පිළිතුරු ඔබට නොලැබෙන බවය.

සියලු දේ අවබෝධ කරගැනීමට අවශ්‍යවීම මනුෂ්‍ය ස්වභාවය වේ. ඒව මුහුණ දුන් සාතන්ගේ පළමු පරීක්ෂාව මෙම කරුණ හා සම්බන්ධ වේ. සියලුම දේ අවබෝධ කරගැනීමේ ආශාව ඇතිවන්නේ පිළිතුරු නොලද ප්‍රශ්න සම්බන්ධව ඇති වන කැරලිගැසීම නිසාය. සුව කිරීමේ හා මිදීමේ සේවය ඵලදායිව කිරීම සඳහා මනුෂ්‍ය ස්වභාවය පිළිබඳ මෙම ගැටලුව ජයගත යුතුවේ.

සුවය හා මිදීම කෙරෙහි බලපාන විචල්‍යයන් සමහරක් බයිබලය එළිදරව් කරයි. එහෙත් මේ ක්ෂේත්‍රයේ සෑම ප්‍රශ්නයකටම පිළිතුරක් ඔබට කිසිදා නොලැබෙනු ඇත. එසේ ලැබෙන්නේ නම් ඔබට ඇදහිල්ලක් අවශ්‍ය වන්නේ නැත. ඇතැම් දේ අපට එළිදරව් කරන බවත් ඇතැම් ඒවා එසේ නොවන බවත් බයිබලය පැහැදිලි කරයි.

> **රහස්වූ දේ අපේ දෙවිවූ ස්වාමින්වහන්සේට අයිතිය. එහෙත් මේ ව්‍යවස්ථාවේ සියලු වචන අප විසින් පවත්වන පිණිස එළිදරව්කර තිබෙන දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලයටම අයිතිය. (ද්විතීය කථාව 29:29)**

සුවයේදීත් මිදීමේදීත් පිළිතුරු නොලත් ප්‍රශ්න පැත්තකින් තබා, රහස් දේ ස්වාමීන් අත තැබීමට අප ඉගෙන ගත යුතුය.

ගැළවීම මෙන්ම සුවය හා මිදීම ශුභාරංචියේ කොටසකි. සුවය හා මිදීම පිළිබඳ සේවයේ යෙදී සිටින විට ඇතැම් අයට සුවය හා මිදීම නොලැබුණු අවස්ථාවේදී එම සේවය අත්හැර දැම්මට ඔබ පෙලඹීමට ඉඩ ඇත. එහෙත් මේ ගැන සිතන්න. ගැළවීම පිළිබඳ පණිවුඩය අසන සෑම කෙනෙක්ම ගැළවීම නොලබන බැවින් ඔබ ගැළවීම පිළිබඳව දේශනා කිරීම නවත්වන්නෙහිද?

එසේනම් සුවයේ හා මිදීමේ සේවය, සෑම කෙනෙකුටම එය නොලබෙන නිසා, මෙතරම් ඉක්මනින් නැවැත්වීමට ඔබ සිතන්නේ මන්ද? ඊට ප්‍රධානතම හේතුව මේ සේවයට අහංකාරය ඇතුළු වන නිසා විය හැකිය. සෑම කෙනෙකුටම පෙනෙන්නාවූ අසනීපයෙන් පෙළෙන කෙනෙකු වෙනුවෙන් ඔබ යාච්ඤා කළ විට ඔහුට සුවය නොලැබුණහොත් ඔබ අපහසුතාවට පත්වීමට ඉඩ තිබේ. මන්ද එය අන් අයට පෙනෙන බැවිනි. එහෙත් යම් කෙනෙකු ගැළවීම සඳහා ප්‍රතිචාර දැක්වුවද ඔහු ගැළවීම නොලදහොත් එය කිසිවෙකුට නොපෙනේ. මන්ද එය අභ්‍යන්තර දෙයකි. ඔබගේ අහංකාරයට බලපාන්නේ මිනිසුන්ට බාහිරව පෙනෙන දෙය වේ.

ගැළවීමේ ප්‍රතිචාර කෙරෙහි බලපාන සියලු සාධකවලට ඔබට පිළිතුරු නොලැබෙන්නා සේම සුවය කෙරෙහි බලපාන සියලු විචල්‍යයන්ට පිළිතුරු ද ඔබට නොලැබෙනු ඇත. ඇතැම්හු ගැළවීම ලබති. ඇතැම්හු නොලබති. ඇතැම්හු සුවය ලබති. ඇතැම්හු නොලබති. කෙසේවුවව සුවය හා මිදීම කෙරෙහි බලපාන ඇතැම් විචල්‍යයන් බයිබලය එළිදරව් කරයි. මේවා ඔබ අවබෝධ කරගැනීම වැදගත්ය. එවිට ඒවා තුළින් සුවය ලබාගැනීමට අන් අයට උපකාර කිරීමට ඔබට පුළුවන.

පොදු විචල්‍යයන් කීපයක් පහත දැක්වේ.

### ඉගැන්වීමක් නොමැතිකම

සුවය, එහි මුලධර්ම, ප්‍රභවය, ඇදහිල්ල ක්‍රියාත්මක කරන්නේ කෙසේද හා එය ලබාගන්නේ කෙසේද පිළිබඳ දැනුමක් නොමැති වීම සුවය කෙරෙහි බලපෑමට ඉඩ තිබේ. දෙවියන්වහන්සේ මෙසේ කීසේක.

> **මාගේ සෙනඟ දැනගැන්ම නැතිකමෙන් නාස්තිවී සිටිති. (හොෂෙයා 4:6)**

යේසුස්වහන්සේ මෙසේ කී සේක.

**නුඹලා ශුද්ධ ලියවිලිවත් දෙවියන්වහන්සේගේ බලයවත් නොදැන, වරද්දාගනිහුය. (මතෙ. 22:29)**

ඇතැම් අයට සුවය නොලැබෙන්නේ ඔවුන් දේව වචනය හෝ උන්වහන්සේගේ බලය ගැන හෝ අවබෝධයක් නොමැති බැවිනි.

සුවය සඳහා ඇදහිල්ල ලැබෙන්නේ සුවය පිළිබඳ දේව වචනයට සවන් දීමෙනි (රෝම 10:17). බයිබලය, දේව වචනය හඳුන්වන්නේ බීජය නමිනි. ඇතැම්හු සුවය පිළිබඳ දේව වචනය තම සිත් තුළ රෝපණය නොකර සුවයේ අස්වැන්න නෙළා ගැනීමට උත්සාහ කරති. බීජය තමා තුළ නොමැති නම් ඊට ක්‍රියාත්මක විය නොහැකිය. "ඔබ සුව කරන සමිඳාණෝ මම වෙමි"යි පැවසීමට පෙර දෙවියන්වහන්සේ පැවසුවේ "ඔබ මාගේ වචනයට ඕනෑකමින් සවන් දෙන්නෙහි නම්" යනුවෙනි. සුවවීමට පෙර දේව වචනය ඇත.

ගැළවීම පිළිබඳ පණිවුඩය කිසි දිනෙක නොඇසුවේ නම් කොපමණ දෙනෙක් නම් ගැළවීම ලබත්ද? ගැළවීම පිළිබඳ පණිවුඩයේ ප්‍රධාන කරුණු මෙසේ වුනි නම් කොපමණ දෙනෙක් ගැළවීම ලබත්ද?

- ඔබ ගැළවීම, දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවිය හැකිය.
- ඔබගේ පාපය දෙවියන්වහන්සේගේ මහිමය සඳහා වේ.
- ගැළවීමේ කාලය දැන් පසුවී ඇත.

එසේවුවද මෙවැනි ප්‍රකාශන අප අසා තිබේ.

- ඔබ සුව කිරිම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවිය හැකිය.
- ඔබගේ අසනීපය දෙවියන්වහන්සේගේ මහිමය පිණිසය.
- සුවකිරීමේ කාලය පසුවී ඇත.

ගැළවීම පිළිබඳව උගන්වන්නා සේම මිනිසුන්ට සුවකිරීම පිළිබඳවද දේව වචනය ඉගැන්විය යුතුය. සුවයේ අස්වැන්න ගෙන එනු ලබන්නේ සුවය පිළිබඳ දේව වචනයේ බීජයෙනි.

## අවිශ්වාසය

අවිශ්වාසය පහත පෙන්වන කාරණාවලින් බිහිවිය හැකිය.

1. දෙවියන්වහන්සේට සුව කළ නොහැකි බව සිතීමෙන්
2. දෙවියන්වහන්සේට සුව කළ හැකි වුවද උන්වහන්සේ සුවකිරීම සඳහා මා තෝරාගන්නේ නැතැයි සිතීමෙන්
3. දෙවියන්වහන්සේට සුව කළ හැකිය. උන්වහන්සේ මා සුවකරනු ඇත. එහෙත් දැන් නොවේ යයි සිතීමෙන්.
4. සුවය වළක්වන අවිශ්වාසයේ වාතාවරණයක් තිබීම.

අවිශ්වාසය දෙවියන්වහන්සේගේ වැඩ අවහිර කිරීමේ නිදසුන් බොහෝමයක් බයිබලයේ ඇත. නාසරෙත් නගරයේ දෙවියන්වහන්සේ,

**". . . ඔවුන්ගේ අවිශ්වාසය නිසා . . . බොහෝ හාස්කම් නොකළ සේක" (මතෙ. 13:58)** (නව අනුවාදය)

මිනිසුන් විශ්වාස නොකිරීම ගැන යේසුස්වහන්සේ විස්මිත වූ සේක.

**"ඔවුන්ගේ අවිශ්වාසය ගැන උන්වහන්සේ මවිත වූ සේක" (මාක් 6:6)**(නව අනුවාදය)

බයිබලය මෙසේ පවසයි :

**නුමුත් අනුමාන නොකරම ඇදහිල්ලෙන් ඉල්ලාවා. මක්නිසාද අනුමානකරන්නා සුළඟින් ගෙනයන්නාවූ, සෙලවෙන්නාවූ මුහුදේ රැළට සමානය. එබැවින් එබඳු මනුෂ්‍යයා තමාට**

**ස්වාමින්වහන්සේගෙන් යමක් ලැබේයයි නොසිතාවා. ඔහු දෙසිත් ඇති මනුෂ්‍යයෙක්ව, තමාගේ සියලු මාර්ගවලදී අස්ථිරව සිටින්නේය. (යාකොබ් 1:6-8)**

යායිරස්ගේ දුව සුව කිරීම පිළිබඳ කතාන්දරය මාක් 5:35-40 න් කියවන්න. යේසුස්වහන්සේ සුවකිරීමේ මෙහෙයේ යෙදී සිටියදී ඇදහිල්ලේ වාතාවරණයට බාධා ඇති කළ අය, කාමරයෙන් පිට කළ බව ඔබට පෙනෙනු ඇත.

අපගේ සභාවල දෙවියන්වහන්සේ බලාපොරොත්තු වූ පරිදි සුවකිරීම් දක්නට නොලැබෙන එක් ප්‍රධාන හේතුවක් වන්නේ සමූහයාගේ අවිශ්වාසය වේ. අපි එකිනෙකා සමග සාමාජිකයෝ වෙමු. අපගේ ආත්මික ශරීරයේ කොටසක් සුවකිරීම විශ්වාස නොකරයි නම්, මෙම අවිශ්වාසය සුව කිරීමට බාධා පමුණුවයි.

"මෙම ලකුණු *අදහන්නන්* අනුගමනය කරනු ඇතැ"යි බයිබලය පවසයි. මෙම පදය කතා කරන්නේ ඇදහිලිවතුන් (සභාව) ගැනය. බයිබලය "අදහන තැනැත්තා" ලෙස එක් පුද්ගලයෙකු ගැන කතා නොකරයි. ක්‍රියා පොතේ සඳහන් සුවවීම්, ඉවැන්ජලිස්තවරුන් එක් කෙනෙකු හෝ දෙදෙනෙකුගේ ඇදහිල්ලේ ප්‍රතිඵලයක් නොවේ. එය සමස්තයක් වශයෙන් ආත්මයාණන්ගෙන් පූර්ණ වූ සභාවක ඇදහිල්ල වේ.

යේසුස්වහන්සේට නාසරෙත් නුවර දී මහත් දේ කරන්නට නොහැකි වූයේ ඔවුන්ගේ (සමූහයේ) අවිශ්වාසය නිසා නම්, සමූහ අවිශ්වාසය අපගේ සුවකිරීම්වලට බාධා පැමිණවීම අසත්‍යයක්ද? අද සභාවේ විශාල කොටසක්, මුල් සභාව යාච්ඤාවෙන් දිනාගත් දේට විරුද්ධ වෙති. රෝග කෙරෙහි දක්වන බයිබලීය ආකල්ප ඔව්හු නොපිළිගනිති. ඔවුන්ට සුවකිරීම පිළිබඳ දේව වචනය උගන්වා නැත. සුවය ලබාගැනීමට නොහැකි වූ අය, සුවකිරීමේ සේවයේ යෙදී සිටින අයට විරුද්ධව චෝදනාවක් ලෙස ඔව්හු පෙන්වති. එහෙත් එය ඔවුන්ද සමූහයක් වශයෙන් වගකිව යුතු අසාර්ථක වීමකි.

අපට බොහෝ සේ ගැළවීම දැකගත හැක්කේ සභාවල ගැළවීම පිළිබඳ දේවධර්මයේ විශ්ව්‍ය පිළිගැනීමක් ඇති බැවිනි. එහෙත් සුව කිරීම් අපට එතරම්ම දැකගත නොහැක්කේ අපට සම්ප්‍රදායන්, ප්‍රතික්ෂේප කිරීම් හා අවිශ්වාසයනට බොහෝ විට මුහුණ දීමට සිදුවන බැවිනි.

සුවය හා මිදීම සහිතව ගැළවීමේ පූර්ණ ශුභාරංචිය දේශනා කරන අයට බොහෝ විට "නාසරේතිය" අවිශ්වාසය මධ්‍යයේ වෙහෙස වීමට සිදුවී ඇත. දෙවියන්වහන්සේගේ සෙනඟක් ලෙස, යේසුස්වහන්සේ වෙතට පැමිණි රෝගියා මෙන් අප ද "මම අදහමි, මාගේ ඇදහිල්ල මදිකම ගැන පිහිටවුව මැනවැ"යි කියා මොරගැසිය යුතුය (මාක් 9:24). සමූහ අවිශ්වාසය සුවකිරීමේ මෙහෙය කෙරෙහි බලනොපාන්නේ නම්, යේසුස්වහන්සේ නාසරෙත් නුවර පූර්ණ සේවයක් නොකළේ මක්නිසාද?

## ඇදහිල්ල නොමැති වීම

දෙවියන්වහන්සේට කිසිවක් කළ නොහැකි බවට හෝ කිසිවක් නොකරන ආකල්පය නොඇදහිල්ල වේ. අවිශ්වාසය නොමැතිකම අවශ්‍යයෙන්ම ඇදහිල්ලක් ඇති බව අදහස් නොකරයි. නිදසුනක් ලෙස අදේවවාදියෙක් දෙවියන්වහන්සේ විශ්වාස නොකරයි. අඥෙයයෙක් (agnostic) මධ්‍යස්ථය. එහෙත් අඥෙයයෙකුට අවිශ්වාසයක් නොතිබීමෙන් ඔහුට දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලක් ඇතැයි කිව නොහැකිය.

අවිශ්වාසය දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ප්‍රතිස්ථාපනය කළ යුතුය. මන්ද රොගීන් නැගිටුවනු ලබන්නේ ඇදහිල්ලෙන් පුදන යාච්ඤාවෙනි (යාකොබ් 5:15). ඔබ ඇදහිල්ල ඇතිව ඉල්ලිය යුතුය. ඇදහිල්ලේ වචන කතා කළ යුතුය. එමෙන්ම ඇදහිල්ලෙන් ක්‍රියා කළ යුතුය. ඔබ ගමන් කළ යුත්තේ ඇදහිල්ලෙන් මිස පෙනීමෙන් නොවේ. "පෙනීමෙන් ගමන් කිරීම" යනු ඔබගේ ශරීරයේ හෝ ලක්ෂණවල හෝ තත්වය බැලීමකි. සාතන් සුව කිරීම වළක්වන්ට උත්සාහ කරන්නේ සුවය ඉල්ලූ එහෙත් නොලද අය හා රෝග ලක්ෂණ දෙස බැලීමට ඔබ යොමු කිරීමෙනි.

එය ඔබගේ ඇදහිල්ල කෙරෙහි ඇදහිල්ල හෝ වෙනත් කෙනෙකුගේ ඇදහිල්ල කෙරෙහි ඇදහිල්ල හෝ නොවේ. ඇදහිල්ල සුව නොකරයි. සුව කරන්නේ දෙවියන්වහන්සේය. කොරවූ මනුෂ්‍යයාට සුවය ලබන්නට තරම් ඇදහිල්ලක් ඇති බව පාවුලුතුමාට වැටහිණි (ක්‍රියා 14:8-10). සුවය ලැබීමට "අති මහත්" ඇදහිල්ලක් අවශ්‍ය නැත. අබ ඇටයක් තරම්වූ ඇදහිල්ලක් ඉතා බලවත් බව

යේසුස්වහන්සේ පැවසූ සේක. යේසුස්වහන්සේ මනුෂ්‍යයන් මුණ ගැසුණේ ඔවුන්ගේ ඇදහිල්ලේ මට්ටමෙනි. යේසුස්වහන්සේ පෞද්ගලිකවම පෙනී සිටිය යුතු යයි සිතුනාවූ තැන්වලට උන්වහන්සේ වැඩිය සේක. එවැනි අවශ්‍යතාවක් නොතිබුණු අවස්ථාවල උන්වහන්සේ ඈතක සිට කතා කළ අතර සුවය ලැබිණි.

රෝගීන් සුවය නොලැබූ විට මිනිසුන් සාමාන්‍යයෙන් උත්සාහ කරන්නේ ඊට හේතුව ඇදහිල්ලක් නොමැති වීම බව පැවසීමටය. එහෙත් ඔබ මෙම පාඩමෙන් ඉගෙනගන්නා පරිදි, සලකා බැලිය යුතු වෙනත් විචල්‍යයන් රාශියක් තිබේ. සුවය සොයා ආ අයට ඔවුන්ගේ ඇදහිල්ල නොමැතිකම ගැන යේසුස්වහන්සේ කිසිදිනෙක දෝෂාරෝපණය කළේ නැත. බයිබලීය වාර්තාවන් අනුව ඇතැම් අවස්ථාවල සුවවීමේ සාධකය ඇදහිල්ල වූ අතර තවත් අවස්ථාවල එසේ නොවීය.

## බලය නොමැති වීම

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ලැබෙන තුරු ජෙරුසලමේ නැවතී සිටින ලෙස යේසුස්වහන්සේ සිය ගෝලයන්ට පැවසූ සේක. ඇතැම්විට සුවය නොලැබෙන්නේ සේවය කරන තැනැත්තාට බලය නොමැති බැවිනි. ඇතැම්විට ක්‍රියා 4 හි විස්තර කර ඇති ශුද්ධාත්ම බලය ඔවුන්ට නොලැබී තිබෙන්නට පුළුවන. නැතහොත් බලය වෙනුවට ඔවුන් රෝගියාට ඇති ප්‍රේමය හා අනුකම්පාව පෙන්නුම් කරනවා විය හැකිය. ඔවුන් සුවයේ යාච්ඤාවන් නොව සැනසිල්ලේ යාච්ඤාවන් කරන්නට ඉඩ තිබේ. ඔවුන්ට බලය නොමැති වීමට හේතුව දේවධර්මය වැරදි ලෙස තේරුම් ගැනීම හෝ සම්ප්‍රදායේ හෝ ප්‍රතිඵලයක් විය හැකිය.

## පාපොච්චාරණය නොකළ පෞද්ගලික පාප

ඇතැම් අවස්ථාවල පෞද්ගලික පාප හා රෝග අතර සෘජු සබඳතාවක් බයිබලය පෙන්වයි.

> **එබැවින් නුඹලාගේ වරද එකිනෙකාට කියාදී, සුව ලබන පිණිස එකිනෙකා උදෙසා යාච්ඤා කරපල්ලා. ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඔජ්පු කරන කන්නලව්ව කරණකොටගෙන මහත් දේ ඉෂ්ටවෙයි. (යාකොබ් 5:16)**

"දුෂ්ටකම මාගේ සිතෙහි පවතී නම්, සමිඳුණන් මට සවන් නොදෙනු ඇතැ"යි දාවිත් පැවසීය.

යමෙක් තම ප්‍රාණයෙන් යක්ෂයාගේ ක්‍රියාවන්හි එල්ලී සිටියදී ඔහුගේ ශරීරයේ ඇති සාතන්ගේ ක්‍රියා විනාශ කිරීමට දෙවියන්වහන්සේ පොරොන්දු වී නැත. රෝගියාගේ සිතෙහි දුෂ්ටකම් ඇත්නම් ඔහුට සුවය නොලැබීමට ඉඩ තිබේ. සේවය කරන තැනැත්තාගේ සිතෙහි දුෂ්ටකම් ඇත්නම්, රෝගියා සුව නොවීමට ඉඩ තිබේ. හේතුව ස්වාමින්වහන්සේ ඔහුට සවන් නොදෙන බැවින්ය.

කමාව නොදෙන ආත්මයක් හෝ ඊර්ෂ්‍යාව සිත්හි තබාගැනීම හෝ සුවය ලැබීමට බාධා කරයි. යේසුස්වහන්සේ මෙසේ කී සේක. "ඔබට වරද කරන අයට ඔබ කමා නුවුවහොත් ඔබගේ වරදවලට ස්වර්ගීය පියාණන්වහන්සේ කමා නොකරන සේක". ඔබ අන් අයට කමාව නොදෙන විට ඔබට කමාව දීමට දෙවියන්වහන්සේට නුපුළුවන් නම් ඔබට පූර්ණ සුවය දීමට ද උන්වහන්සේට නුපුළුවන. මන්ද ප්‍රාණය, ආත්මය හා ශරීරය යන සියල්ල සුවයට අන්තර්ගත බැවිනි.

## සුවය ලැබීම ප්‍රතික්ෂේප කිරීම

බෙතෙස්දා පොකුණ ළඟ සිටි කොර මිනිසාගෙන් යේසුස්වහන්සේ මෙසේ ඇසූ සේක.

> **ඔබ සුවවීමට කැමතිද? (යොහන් 5:6)** (නව අනුවාදය)

අප බොහෝවිට සොයන්නේ සුවය හෝ මිදීම පමණකි. දෙවියන්වහන්සේට අවශ්‍ය සම්පූර්ණ මනුෂ්‍යයා සමග කටයුතු කර ශරීරය, ප්‍රාණය හා ආත්මය සුවකිරීමට වේ.

මනුෂ්‍යයා ශරීරය, ප්‍රාණය හා ආත්මය බැවින් සුවවීම යනුවෙන් ගම්‍යවන්නේ මේ සියලුම අංග සමග ගනුදෙනු කිරීම වේ. අපට ශාරීරික සුවය අපගේ ප්‍රාණයෙන් හා ආත්මයෙන් බැහැරව හෝ සුවය ගැළවීමෙන් බැහැරව හෝ අවධාරණය කළ නොහැකිය. දෙවියන්වහන්සේ ආත්මයකි. උන්වහන්සේ ඔබට සම්බන්ධ වන්නේ ඔබගේ ආත්මය තුළිනි. ඔබගේ කායික, මානසික, ආත්මික හා

හැඟීම් ජීවිතය පාලනය කරනු ලබන්නේ ඔබගේ ආත්මයෙනි. ඔබගේ මුළු ජීවිතයම ඇත්තේ ආත්මික පදනමක් යටතේය. ඔබ ආත්මික පදනමක් යටතේ කෙනෙකු බැවින් ශාරීරික සුවය ඇරඹෙන්නේ ආත්මය තුළ වේ.

දෙවියන්වහන්සේ මිනිසා මැවූ විට, පෘථිවිය මත ඔහුගේ ජීවිතයේ පාලන බලය විය යුතු වූයේ මනුෂ්‍යයාගේ ආත්මය වේ. ඊට මනස හා ශරීරය කෙරෙහි ආධිපත්‍යය තිබිය යුතුවූ අතර ඒවා එකට එක්සත් කර දෙවියන්වහන්සේ ජීවත් වන පූර්ණ මිනිසෙකු කිරීම උන්වහන්සේගේ බලාපොරොත්තුව විය. පටන්ගැන්මෙහිදී, ඒදන් උයනේ, මනුෂ්‍යයා දෙවියන්වහන්සේ සමග සමීප ආත්මික සබඳතාවක සිටියේය.

ඒදන් උයනේ යහපත හා නපුර දැනගැනීමේ ගසින් කෑම තහනම් කිරීමෙන්, දෙවියන්වහන්සේ තහනම් කළේ මනුෂ්‍යයාට ශාරීරික හා බුද්ධිමය මට්ටමින් පමණක් ජීවත්වීම වේ. මනුෂ්‍යයා පව් කළ විට ඔහුගේ ආත්මය යටපත් වූ අතර ඔහු බුද්ධියෙන් ජීවත්වීම තෝරාගත්තේය. ඔහුගේ මනස ආත්මය අභිබවා ගොස් පාලනය අතට ගත් විට, මනුෂ්‍යයාගේ ආත්මික කොටස මිය ගියේය (නැතහොත් දෙවියන්වහන්සේට හා ජීවිතයට සිය ප්‍රතිචාර දක්වන ප්‍රභවය ලෙස ක්‍රියා කිරීම නැවතිණි). එතැන් පටන් ආත්මය, මනස හා ශරීරය අතර වෙන්වීමක් විය. එහි ප්‍රතිඵලය වූයේ, මිනිසා ඔහුගේ පරිසරය හා ඔහුගේ මැවුම්කරු අතර තිබූ සුසංගතය නැතිවීම වේ.

සුවය යනු රෝගයක් නොමැතිවීමට වඩා වැඩිමනත් දෙයකි. එය සෞඛ්‍ය සම්පන්න ශරීරයකට වඩා වැඩි දෙයකි. එය සෑම කොටසක්ම (ශරීරය, ප්‍රාණය, ආත්මය, මනස, හැඟීම් ආදිය ද ඇතුළුව) අනෙකුත් සෑම කොටසක්ම ද පරිසරය ද මැවුම්කරු ද සමග සුසංගතව, නියම ආකාරයෙන් නැවත ක්‍රියා කිරීම වේ.

## පැහැදිලි තීරණයන් හා ආශාවන් නොමැති වීම

බෙතෙස්දා පොකුණ අසල සිටි කොර මිනිසාගෙන් යේසුස්වහන්සේ මෙසේ ඇසූ සේක.

> **ඔබ සුවවීමට කැමතිද? (යොහන් 5:6)** (නව අනුවාදය)

මේ අවස්ථාවේ කොර මිනිසා තීරණයක් ගත යුතු විය. ඇතැම් අයට සුවවීම අවශ්‍ය නැත. රෝගීව සිටීමෙන් ලැබෙන අනුකම්පාව හා සැලකිල්ල භුක්ති විඳීමට ඔව්හු කැමති වෙති. ඇතැම් අයට විශ්‍රාම වැටුප මගින් වෛද්‍ය ප්‍රතිලාභ හෝ නීතිමය විසඳුම් හෝ ලැබෙන බැවින් ඒවා නැති කරගැනීමට අකමැති වෙති. තවත් සමහර අය ස්වාමින්වහන්සේ වෙතට යෑමේ මහත් ආශාවක් ඇති නිසා සුවය ලැබීමට අකමැති වෙති. සමහරු ඔවුන්ගේ රෝගී තත්වය වැඩ නොකර සිටීමට හා අන් අය පාලනය කිරීමට යොදා ගනිති.

මෙවැනි හැඟීම් ඇති අය සමග අනුකම්පාවෙන් යුතුව කටයුතු කරන්න. මෙම හැඟීම් තිබීමෙන් තමා වරදකරුවෙකු බවට හැඟීමක් මනුෂ්‍යයන් තුළ ඇති නොකිරීමට වගබලා ගන්න. ඔවුන්ට වඩාත් යහපත් ජීවිතයකට මගපෙන්වීමට හැකිවන තෙක් හැඟීම් තුළ ජීවත්වීමට ඔවුන්ගේ රෝගය ඉඩ සලසා ඇත.

## ඉල්ලීම් පිළිබඳ ගැටලු

ඇතැම් අවස්ථාවල සුවය ඉල්ලීම පිළිබඳ, එය විද්‍යමානවීමට බාධා කෙරෙන ගැටලු තිබේ:

### නොඉල්ලීම:

ඇතැම් විට ප්‍රථම හා ඉතාමත් මූලික වන්නේ අප සුවය නොඉල්ලීම වේ. අපි උපකාරයක් සඳහා වෛද්‍ය පහසුකම් වෙත හෝ සහනය සඳහා මිතුරන් වෙත හෝ හැරෙන්නෙමු.

> **. . . නොඉල්ලන නිසා ඔබට ලැබෙන්නේ නැත. (යාකොබ් 4:2)** (නව අනුවාදය)

### සුවිශේෂිව නොඉල්ලීම:

ඇතැම්විට යාච්ඤාවනට බාධා පැමිණෙන්නේ ඒවා සුවිශේෂි නොවන නිසාය.

. . . **ඔබ ඉල්ලුවත් වැරදි ලෙසය (යාකොබ් 4:3)** (නව අනුවාදය)

ඔබ "වැරදි ලෙස" ඉල්ලූ විට ඔබ ඔබගේ යාච්ඤාවේදී සුවිශේෂී නොවන්නෙහිය. ඔබට ඉලක්කය වැරදී ඇත.

## වැරදි චේතනාවෙන් ඉල්ලීම:

ඇතැම්විට අප යාච්ඤා කරන්නේ වැරදි චේතනාවෙනි.

> **ඔබ ඉල්ලුවත් වැරදි ලෙස ද ආත්මාර්ථකාමී තෘප්තිය සඳහා ද ඉල්ලන බැවින් එය නොලැබෙන්නේය (යාකොබ් 4:3)** (නව අනුවාදය)

ඇතැම් අයට සුවවීම අවශ්‍යය, එහෙත් ඔවුන්ගේ පාපි, ලෞකික, කැප නොවූ ජීවිත ශෛලිය වෙනස් කරගැනීමට අකමැතිය. ඔවුන්ට සනීපය අවශ්‍ය වන්නේ ඔවුන්ගේම දේවල් නැවත කිරීම පිණිසය.

මනුෂ්‍යයන් මෙම ප්‍රශ්න ගැන සැලකිලිමත් විය යුතුය. සුවය අවශ්‍ය වීමේ ඔබගේ චේතනාව කුමක්ද? ඔබගේ ආත්මාර්ථකාමී ජීවිතයට නැවත යෑම පිණිසද? ඔබ වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සුවිශේෂී පරමාර්ථයන් ඉටු නොකර ඒ වෙනුවට යහපත් ක්‍රියාවන්වල යෙදීමටද?

## ඔබගේ යාච්ඤාවට බාධා ඇතිවේ:

ඔබගේ යාච්ඤාවලට පිළිතුරු ලැබීම බාධා කෙරෙන බොහෝ කරුණු බයිබලයේ සඳහන් වේ.

- ඕනෑම ආකාරයේ පාපයක්. ගීතා. 66:18, හිතෝ. 28:9, යෙසා. 1:15, 59:1-2
- සිත්වල ඇති ප්‍රතිමාවන්, එසකි. 14:1-3
- කමාව නොදීමේ ආත්මය. මාක් 11:25, මතෙ. 5:23.
- ආත්මාර්ථකාමීත්වය, වැරදි චේතනාවන්. හිතෝ. 21:13, යාකො. 4:3
- බලයට ලැදි හැසිරවීමේ යාච්ඤා. යාකො. 4:2-3
- ඔබගේ විවාහක සහකරු/සහකාරියට වැරදි ලෙස සැලකීම. 1 පේතෘ. 3:7
- තමා ධර්මිෂ්ඨයයි සිතීම. ලූක් 18:10-14.
- අවිශ්වාසය. යාකො. 1:6--7
- ක්‍රිස්තුස්වහන්සේ හා උන්වහන්සේගේ වචනය තුළ නොපැවතීම. යොහ. 15:17
- දයාව නොමැතිකම. හිතෝ. 21:13
- කෛරාටිකකම, අහංකාරය, තේරුමක් නැති පුනරුක්තිය, මතෙ. 6:5, යෝබ් 35:12-13
- දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව නොඉල්ලීම. යාකො. 4:3
- යේසුස්වහන්සේගේ නාමයෙන් නොඉල්ලීම. යොහ. 16:24
- සාතන්ගේ බාධා. දානි. 10:10-13, එපීස 6:12
- පළමුව දේවරාජ්‍යය නොසෙවීම. මතෙ. 6:33

## නොපසුබට උත්සාහයක් නොමැති වීම

ඇතැම්විට අපි නොපසුබටව (අඛණ්ඩව) ප්‍රමාණවත් තරම් කාලයක් යාච්ඤාවේ රැඳී නොසිටින්නෙමු. පාවුල්තුමා අසනීපයෙන් සිටියදී පළමුව දේශනා කල අතර (ගලා. 4:13-14), පසුව ඔහුට සුවය ලැබිණි. එපප්‍රොදිතස් මරණාසන්න වන තරමට රෝගාතුරව සිටියදීත් යාච්ඤාවෙන් ක්ෂණික පිළිතුරක් ලැබුණේ නැත (පිලි. 2:27). අසනීපව සිටි ත්‍රොපිමස් මිලේතස්හි නවතා ගියේය (2 තිමෝ. 4:20). එසේවුවද මේ දෙදෙනාම අවසානයේ සුවය ලැබූහ (මේ අවස්ථාවල ක්ෂණික සුවයක් නොලැබුණද පාවුලුතුමා නොනවත්වාම යාච්ඤා කළේය).

සුවය සඳහා එක් වරකට වැඩි ප්‍රමාණයක් ඉල්ලුවහොත් එය ඇදහිල්ල නොමැතිකම යයි සමහරු සිතති. නොකඩවා යාච්ඤා කිරීම ඇදහිල්ලේ හිඟකමක් ලෙස යේසුස්වහන්සේ සිතුවේ නැත. උන්වහන්සේ නොපසුබට උත්සාහය දිරිගැන්වූ සේක. අඛණ්ඩ යාච්ඤාවේ වැදගත්කම. ලූක් 11:1-3 හි අපහසුතාවකට පත් මිත්‍රයා (5-8), වැන්දඹුව හා විනිශ්චයකරු (1-8) ද පිළිබඳ උපමා

කතාවලින් අපට උගන්වයි. දානියෙල් පිළිබඳ උදාහරණයෙන්ද නොපසුබට උත්සාහය දිරිගන්වයි. ඔහු යාච්ඤා කළ පළමු වතාවේම දෙවියන්වහන්සේට ඔහුගේ යාච්ඤාව ඇසුණි. එහෙත් පිළිතුරක් ඇතිව එවන ලද දේවදූතයාට සාතන් බාධා කළේය.

ස්වර්ගයෙන් ගිනි එවීම සඳහා එලියා දිවැසිවරයා යාච්ඤා කළේ එක් වරකි. එහෙත් වර්ෂාව පතිත වීමට ඔහුට සත්වරක් යාච්ඤා කිරීමට සිදුවිය. ඔබ යාච්ඤා කළ පළමු වතාවේම සුවය නොලැබීම නිසා යාච්ඤාව අත් නොහරින්න. "ඉල්ලන්න, සොයන්න හා තට්ටුකරන්න" යනුවෙන් යාච්ඤාවට මට්ටම් තුනක් ඇති බව අමතක නොකරන්න. ඇතැම්විට ඔබ ඉල්ලූ සැණෙකින් පිළිතුරක් ලැබේ. අනෙක් අවස්ථාවල පිළිතුරක් ලැබීම සඳහා නොනවත්වාම සොයමින් තට්ටු කළ යුතුය.

ස්වභාවික ලෝකයේ මනුෂ්‍යයෝ තම රෝගාබාධවලට විසඳුමක් ලබා ගැනීමට කිප වතාවක්ම වෛද්‍යවරුන් හා රෝහල් වෙත යති. එසේ නම් දෙවියන්වහන්සේගෙන් දිව්‍ය සුවය ලබාගැනීමට නොපසුබට උත්සාහයක් නොමැත්තේ මන්ද?

මතක තබාගන්න. ශරීරය සඳහා සටන වන්නේ භෞතික ක්ෂේත්‍රයේ විද්‍යමාන වන ආත්මික යුද්ධයය. ඔබගේ ඉල්ලීම ඇසුණු බව ඔබ දන්නා තුරු නොකඩවා යාච්ඤා කරන්න. ඔබගේ ආත්මය තුළ එය සිදුවූ බවට සහතිකයක් ඇති වූ විට දෘෂ්‍යමාන ප්‍රතිඵලයක් නොපෙණුනද දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම ආරම්භ කරන්න.

- ජෙහෝෂාපාට් හා ඉශ්‍රායෙල්හි දරුවෝ, ඔවුන්ගේ යාච්ඤාවලට පිළිතුරු දැකීමටත් පෙර මහත් හඬින් දෙවියන්වහන්සේට ප්‍රශංසා කළහ.

- ලාසරුස් නැගිටුවීමට පෙර ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේට ස්තුති කළ සේක.

- පුත්‍රයෙකු පිළිබඳ පොරොන්දුව ආබ්‍රහම්ට සහතික වූ විට ඔහු දිගටම යාච්ඤා කළේ නැත. ඔහු එය විශ්වාස කර දෙවියන්වහන්සේ මහිමයට පත් කළේය.

## සුවවීමේ ක්‍රියාවලියේ අකීකරුකම

සුවවීමේ ක්‍රියාවලියේදී ඇතැම්විට දෙවියන්වහන්සේ ස්වභාවික මනසට මෝඩ ලෙස පෙනෙන සුවිශේෂී උපදෙස් දෙන සේක. නිදසුනක් ලෙස දෙවියන්වහන්සේ නාමන්ට පැවසුවේ සුවය ලැබීමට මඩ සහිත ගඟේ නාන ලෙසටය (2 රාජා. 5:1-14). ඇතැම්විට ඔබ හා හාස්කම අතර ඇති බාධාව වන්නේ කීකරුවීමේ සරල ක්‍රියාවකි.

## ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නිසියාකාර ලෙස නිර්ණය නොකිරීම

දුර්වලතා හා රෝගාබාධ ඇතිවන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය අප නිසියාකාර ලෙස නිර්ණය නොකිරීම නිසාවේ. "නිර්ණය" කිරීම යනු යම් දෙයක් පරීක්ෂා කිරීමෙන් විමර්ශනය කිරීමෙන් හා වෙනස්කම් සලකා බැලීමෙන් අවබෝධ කරගැනීම හා ඉගෙනීම වේ (1 කොරි. 11:27-30 බලන්න). අතිරේක පසුබිමක් සඳහා ලූක් 22:2-20, මතෙ. 26:27-29 හා මාක් 14:22-25 කියවන්න. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නිසියාකාර ලෙස නිර්ණය කිරීමට අසමත් වන ක්‍රම තුනක් ඇත.

### රුධිරයේ හා මාංශයේ තේරුම:

උන්වහන්සේගේ රුධිරය හා මාංශය සංකේතවත් කෙරෙන මිදියුෂ හා රොටියේ එලවල තේරුම අවබෝධ කරගැනීමට අපට නොහැකි වූ විට අපි ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නිසියාකාර ලෙස නිර්ණය කිරීමට අසමත් වෙමු. යේසුස්වහන්සේ මෙය යොහන් 6:66 න් පළමු වතාවට ඉගැන්වූ විට සිදුවූයේ මේ දෙයම වූ අතර, බොහෝ අය උන්වහන්සේ අනුව නොගියහ. උන්වහන්සේ ඉගැන්වූ දෙයෙහි ආත්මික තේරුම ඔවුන්ට අවබෝධ නොවීය. රුධිරය පාප කමාව සඳහා බව බොහෝ අය නිර්ණය කළ ද ශරීරයේ සැබෑ අදහස බොහෝවිට ඔවුන්ට අවබෝධ නොවෙයි. ශරීරය සුවකිරීම සඳහා වන අතර එය වැළඳීමෙන් අපට සුවය ලැබෙනු ඇත (යොහන් 6:48-58 හා ලූක් 6:48-51 බලන්න).

### ශරීරයේ බෙදීම:

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ කොටස්කරුවන් වන සහෝදර සහෝදරියන් වෙත ඇති අපගේ සබඳතාව නිර්ණය කිරීමට ඇතැම් විට අපි අපොහොසත් වෙමු. සමිඳුණන්වහන්සේ තුළ අපගේ සහෝදර සහෝදරියන් සමග සබඳතාවය අපි පවත්වාගෙන නොයන්නෙමු නම්, අප අනුභව කරන්නේත් පානය කරන්නේත් නොවටිනා ආකාරයෙනි. 1 කොරි. 3:1-13 න් පාවුලුතුමා පැහැදිලි කරන්නේ බෙදීමට සම්බන්ධ වන මාංශික කිතුනුවන්ට වචනයේ මාංශය (ශරීරය), අනුභව කළ නොහැකි බවය. මන්ද ඔවුන් මාංශික බැවිනි.

### නොවටිනා ලෙස අනුභව කිරීම:

අප පරීක්ෂා නොකරන ලද ජීවිතයක් සහිතව ශුද්ධවූ සහභාගිකම ගන්නා විට අපි නොවටිනා ලෙස අනුභව කරන්නෙමු. ශුද්ධවූ සහභාගිකම ගැනීමට පෙර ආත්මික ලෙස තමාවම පරීක්ෂා කරගෙන පසුතැවිලි වන ලෙස පාවුලුතුමා පවසන්නේ එබැවිනි.

## අශුද්ධ ආත්මය පළවා නොහැරීම

ඇතැම් අයට සුවය නොලැබෙන්නේ ඔවුන්ගේ රෝගය අශුද්ධ ආත්මයක ක්‍රියාවක් බැවිනි. එම ආත්මය පලවා හැරිය යුතුය. සුවවීම සඳහා ඔවුන්ට යාච්ඤාවට වඩා දෙයක් අවශ්‍ය වේ. රෝගයට හේතුව ආත්මයක් වූ අවස්ථාවල සුවය ලැබීමට පෙර සතුරා පලවා හැරිය බව බයිබලයේ සඳහන් වේ.

## දෙවියන්වහන්සේගේ ක්‍රියා ව්‍යර්ථ කිරීම

ඔබ හානිකර ක්‍රියාවල යෙදී සිටිමින් සුවය සඳහා යාච්ඤා කරන්නෙහි නම් ඔබ දෙවියන්වහන්සේගේ ක්‍රියා ව්‍යර්ථ කරනවා විය හැකිය. නිදසුනක් ලෙස ඔබ තුළ තිත්තකම හා කෝපය පවතින්නේ නම් වණ, රුධිර පීඩනය, ස්නායු ආතති ආදි එකිනෙකට සම්බන්ධ කායික රෝගාබාධ සුවවීමට විරුද්ධව එය බලපානු ඇත.

## ස්වභාවික නීති උල්ලංඝණය කිරීම

"ඔබ සුව කරන සමිඳුණන් වහන්සේ මම වෙමි" යි පැවසූ මෙම දෙවියන්වහන්සේම, සිය සෙනඟගේ සෞඛ්‍ය හා පිරිසිදුකම ගැන බොහෝ ස්වභාවික නීති දුන් සේක. ඇතැම් අයට සුවය නොලැබෙන්නේ මෙම ස්වභාවික නීති උල්ලංඝණය කරන බැවිනි. නිදසුනක් ලෙස නොනවත්වාම මත්පැන් පානය කරමින් තමාගේ අක්මාව සුව අතට නොහැරෙන්නේ මන්දැයි සිතිය හැකිය. ඔවුන් දුම්බීම නවත්වන්නේ නැතිව පෙණහැල්ලේ පිළිකාව දෙවියන්වහන්සේ සුව නොකරන්නේ මන්දැයි සිතනු ඇත.

## මියයෑම සඳහා නියමිත වේලාව

මියයෑම සඳහා නියමිත කාලයක් ඇති බව බයිබලයේ සඳහන් වේ (දේශනා. 3:2. හෙබ්‍රෙ. 9:27). මිදීමේ හා සුවකිරීමේ බොහෝ හාස්කම් කළ ශ්‍රේෂ්ඨ දිවැසිවර එලිෂාට වුවද, "තමා මරණයට පත් කරන රෝගයක්" වැළඳිණි (2 රාජා. 13:14).

සුවය ලබාදීම පිළිබඳ 14 වන පරිච්ජේදයේ උපදෙස්වල කොටසක් ලෙස සුවකළ නොහැකි රෝග ඇති අයට සේවය කරන්නේ කෙසේද යන්න ඔබ ඉගෙනගන්නා විට මෙම ව්‍යවල්‍යය පිළිබඳව කටයුතු කරන ආකාරය ඉගෙන ගන්නවා ඇත.

## අවසාන මතක් කිරීමක්

අප මෙම පරිච්ජේදය ආරම්භ කළේ ප්‍රශ්න කිපයකිනි.

> සුවය කෙරෙහි බලපාන විචල්‍යයන් කවරේද? විශාල සංඛ්‍යාවක සෙනඟ අද සුව නොවන්නේ මන්ද? ඇතැමුන් සුවය ලබන්නේත් ඇතැමුන් සුවය නොලබන්නේත් මන්ද? ලෞකික හා එතරම් ගැඹුරු ඇදහිල්ලක් නොමැති කිතුනුවන් සුවවන්නේත් වඩාත් අවංක හා කැපවීමක් සහිත කිතුනුවන් තවමත් සුවය නොලබා ඇත්තේත් මන්ද?

ඔබ මෙම පාඩමෙන් උගත් විචල්‍යයන්, සුවය හා මිදීම කෙරෙහි බලපාන ඇතැම් සාධක වේ. කෙසේවුවද සැමවිටම මෙය මතක තබාගන්න.

> **රහස්වූ දේ අපේ දෙවිවූ ස්වාමින්වහන්සේට අයිතිය. එහෙත් මේ ව්‍යවස්ථාවේ සියලු වචන අප විසින් පවත්වන පිණිස එළිදරව්කර තිබෙන දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලයටම අයිතිය. (ද්විතිය කථාව 29:29)**

ඇදහිල්ලට අවශ්‍ය එය වේ. ඇදහිල්ලය, ඔබට පිළිතුරු සියල්ලම ඇත්නම් ඇදහිල්ලක් අවශ්‍ය වන්නේ නැත. දෙවියන්වහන්සේ ඉල්ලන්නේ ඔබ උන්වහන්සේගේ වචනය මත ක්‍රියා කිරීම විනා, පිළිතුරු සැපයීම නොවේ. ලූක් 4:27 හි සඳහන් වන්නේ එලියාගේ කාලයේ ලාදුරු රෝගීන් බොහෝ සිටියද සුවය ලැබුණේ එක් කෙනෙකුට පමණි යනුවෙනි. ඊට හේතුවක් අපට දී නැත.

අපගේ ආකල්පය විය යුත්තේ බොහෝ කලක් මිදීම හා සුවය පිළිබඳ සේවයේ නිරත වී සිටි සුප්‍රසිද්ධ ඉවැන්ජලිස්තවරයෙකු වන එෆ්.එෆ්. බොස්වර්ත් දේවගැතිතුමාගේ ආකල්පය වේ. ඔහු මෙසේ පවසා ඇත.

> *"තවත් කෙනෙක් සුවය හෝ ගැළවීම හෝ ලැබූ බව මා නුදුටුව ද මම මුළු ශුභාරංචියම මා ජීවත්ව සිටිනතුරු දේශනා කරන්නෙමි. මම, මාගේ ධර්මය දෙවියන්වහන්සේගේ වෙනස් නොවන වචනය මත මිස සංසිද්ධි (අත්දැකීම්) මත පදනම් නොකිරීමට අධිෂ්ඨාන කරගෙන සිටිමි"*

## ස්වයං පරීක්ෂණය

1. සුවයේ පොරොන්දුව කාටපාඩමෙන් ලියන්න.

2. “විවලයය” යන්න නිර්වචනය කරන්න.

3. සුවය කෙරෙහි බලපාන විවලයයන් සාරාංශ කරන්න.
   ඉගැන්වීමක් නොමැති වීම
   අවිශ්වාසය
   ඇදහිල්ලක් නොමැතිවීම
   බලය නොමැති වීම
   පාපොච්චාරණය නොකළ පෞද්ගලික පාප
   සුව කරනු ලැබීම ප්‍රතික්ෂේප කිරීම
   පැහැදිලි තීරණයන් හා ආශාවන් නොමැති වීම
   ඉල්ලීම පිළිබඳ ගැටලු
   නොපසුබට උත්සාහය නොමැති වීම
   සුවවීමේ ක්‍රියාවලියේ අකීකරුකම
   ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නිසි ලෙස නිර්ණය කිරීම
   අශුද්ධ ආත්මය පලවා නොහැරීම
   දෙවියන්වහන්සේගේ ක්‍රියා ව්‍යර්ථ කිරීම
   ස්වභාවික නීති උල්ලංඝණය කිරීම
   මියයෑම සඳහා නියමිත වේලාව

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# එය ක්‍රියාත්මක කිරීම

1. මිනිසාගේ සියලු අංගයන් පිළිබඳ (සම්පූර්ණ මනුෂ්‍යයා) බයිබලිය අදහස් තවදුරටත් ඉගෙන ගන්න.

   - මනුෂ්‍යයන්ට අවශ්‍ය වූයේ සුවය පමණක් වුවද යේසුස්වහන්සේට සම්පූර්ණ මිනිසා සමග කටයුතු කිරීම අවශ්‍ය විය. "ඔබ සුව වීමට කැමතිද?" (යොහ. 5:6) යයි බෙතෙස්දා පොකුණ අසල සිටි කොර මිනිසාගෙන් යේසුස්වහන්සේ මෙසේ ඇසූ සේක.

   - යේසුස්වහන්සේ පැමිණියේ සම්පූර්ණ නොවූ මනුෂ්‍යයන්ට එනම් රෝගින්ට, පීඩාවට පත් අයට සේවය කිරීමටය. මතෙ. 9:12, මාක් 2:17, ලූක් 5:31

   - මනුෂ්‍යයා සම්පූර්ණ කිරීමේ ප්‍රභවය යේසුස්වහන්සේ විය. ජොහ. 5:15, ක්‍රියා 9:34

   - යේසුස්වහන්සේට අත ගැසූ අය සම්පූර්ණ සුවය ලැබූහ. මතෙ. 9:21-22, මාක් 5:28-34

   - මරණාසන්නව සිටි සේවකයාව යේසුස්වහන්සේ සුවපත් කළ සේක. ලූක් 7:10

   - උන්වහන්සේ කොර මිනිසා සම්පූර්ණයෙන් සුව කළ සේක. ජොහ. 5:9

   - දෙවියන්වහන්සේගේ බලය තුළින් ගෝලයෝ කොර මිනිසා සම්පූර්ණයෙන් සුව කළහ. ක්‍රියා 9:34

   - යේසුස්වහන්සේ අංග විකල මිනිසා සුව කළ සේක. මතෙ.5:31

   - උන්වහන්සේ අතක් පණ නැති මිනිසා සම්පූර්ණයෙන් සුවකළ සේක. මතෙ. 12:13, මාක් 3:5, ලූක් 6:10

   - රෝගය කුමක් වුවත් උන්වහන්සේ සම්පූර්ණයෙන් සුව කළ සේක. ජොහ. 5:6

   - ඔවුන් සම්පූර්ණයෙන්ම සුව කළ සේක. ජොහ. 7:23

   - ඔවුන් සුවය ලැබීමේ ක්‍රියාකාරී කොටසක් ලෙස ඔවුන්ගේ ඇදහිල්ල ගැන යේසුස්වහන්සේ ප්‍රශංසා කළ සේක. "ඔබේ ඇදහිල්ල ඔබ සුවපත් කළේය" මතෙ. 9:22, මාක් 5:34, 10:52, ලූක් 8:48-50, 17:19.

2. "සුවය" (whole) යන තේරුම ඇති අලුත් ගිවිසුමේ ග්‍රීක් වචනය අධ්‍යයනය කරන්න.

**නාම විශේෂණ**

Holos : සියල්ල, සියල්ල එකවර, සම්පූර්ණයෙන්ම.

Pas : සියල්ල.

Hapas : සියලු දෙනා සම්පූර්ණ.

Holokleros : සම්පූර්ණ, මුළුමණින්ම.

Hugies : රෝගීන් සම්පූර්ණයෙන් සුව කිරීම. මතෙ. 12:13, 15:31, මාක් 3:5, මාක් 5:34, ලූක් 6:10, ජොහ. 5:4, 6, 9, 11, 14, 15, 7:23, ක්‍රියා 4:10.

Holoteles : සම්පූර්ණයෙන්ම, මුළුමණින්ම, සම්පූර්ණ. 1 තෙස. 5:23, ශරීරයේ සියලු කොටස්වලට පැතිරීම.

## ක්‍රියාපද

Hugiaino : හොඳ සෞඛ්‍ය තත්වයකින් සිටීම, සුවය ලැබූ අය, මුළුමනින්ම සෞඛ්‍ය සම්පන්න.

Sozo : ගැළවීම ලැබීමට, සුවය ලැබීමට.

Iaomai: සුවවීමට.

Ischuo: ශක්තිමත් වීමට.

Diasozo: මුළුමනින්ම ගළවා ගැනීමට.

3. මෙම ප්‍රශ්නය ගැන සිතන්න. ශරීරයේ, මනසේ හා ආත්මයේ පූර්ණත්වය නොලැබෙන්නේ කුමක් නිසාද?

---

4. පහත දැක්වෙන විචල්‍යයන්ගෙන් කුමක් හෝ ඔබගේ සුවකිරීම් හෝ ඔබ සේවය කරන යමෙකුට හෝ බලපෑ බව ඔබ සිතන්නෙහිද? අදාළ ඒවා ලකුණු කරන්න.

-ඉගැන්වීමක් නොමැති වීම
-අවිශ්වාසය
-ඇදහිල්ලක් නොමැතිවීම
-බලය නොමැති වීම
-පාපොච්චාරණය නොකළ පෞද්ගලික පාප
-සුව කරනු ලැබීම ප්‍රතික්ෂේප කිරීම
-පැහැදිලි තීරණයන් හා ආශාවන් නොමැති වීම
-ඉල්ලීම පිළිබඳ ගැටලු
-නොපසුබට උත්සාහය නොමැති වීම
-සුවවීමේ ක්‍රියාවලියේ අකීකරුකම
-ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නිසි ලෙස නිර්ණය නොකිරීම
-අශුද්ධ ආත්මය පලවා නොහැරීම
-දෙවියන්වහන්සේගේ ක්‍රියා ව්‍යර්ථ කිරීම
-ස්වභාවික නීති උල්ලංඝණය කිරීම
-මියයෑම සඳහා නියමිත වේලාව

5. මෙම පාඩමෙන් උගත් දේ පදනම් කරගනිමින් ඔබ ඉහත # 4 හි ලකුණු කළ විචල්‍යයන් සෑම එකකටම ප්‍රතිචාර දක්වන්නේ කෙසේදැයි සඳහන් කරන්න.

6. සුවය හෝ මිදීම හෝ පිළිබඳව පිළිතුරු නොලද ප්‍රශ්නයක් ඔබට කිසි දිනෙක තිබිණිද? එය කුමක්ද?

---

පසුව එය අවබෝධ කරගැනීමට ඔබට හැකි වුණිද? _____________ එසේ නම් ඔබ එම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ ආකාරය විස්තර කරන්න.

---

---

එසේ නොමැති නම් හා/හෝ ඔබගේ ශාරීරික තත්වය පිළිබඳව කිසියම් ප්‍රශ්නයක් ඇත්නම් මෙම පාඩමේ පොරොන්දුව සිහි කරන්න.

**රහස්වූ දේ අපේ දෙවිවූ ස්වාමින්වහන්සේට අයිතිය. එහෙත් මේ ව්‍යවස්ථාවේ සියලු වචන අප විසින් පවත්වන පිණිස එළිදරව්කර තිබෙන දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලයටම අයිතිය. (ද්විතිය කථාව 29:29)**

7. පහත දැක්වෙන කිසිවක් ඔබගේ සුවකිරීමේ යාච්ඤාවනට බාධා කරයිද? අදාළ ඒවා ලකුණු කරන්න.

- ඕනෑම ආකාරයේ පාපයක්
- සිතෙහි ඇති පිළිරුවක්
- කමාව නොදෙන ආත්මයක්
- ආත්මාර්ථකාමී බව, වැරදි චේතනා
- බලලෝභි, හැසිරවීමේ යාච්ඤා
- විවාහක සහකරුට/කාරියට වැරදි ලෙස සැලකීම
- ස්වයං ධර්මිෂ්ඨකම
- අවිශ්වාසය
- ක්‍රිස්තුස්වහන්සේ හා උන්වහන්සේගේ වචනය මත නොපැවතීම
- අනුකම්පාව නොමැතිවීම
- කෛරාටිකකම, අහංකාරය, තේරුමක් නැති පුනරුක්තිය
- දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව නොඉල්ලීම
- යේසුස්වහන්සේගේ නාමයෙන් නොඉල්ලීම
- යක්ෂයාගේ බාධාවන්
- පළමුව දේව රාජ්‍යය නොසෙවීම

මෙම ගැටලු නිවැරදි කිරීමට ඔබට කුමක් කළ හැකිද?

________________________________________

________________________________________

## පස්වන කොටස

# සුවකිරීම සඳහා උපක්‍රම

සුවය ලැබීමේ හා ඒ සඳහා සේවය කිරීමේ උපක්‍රමික ඔබ මෙම පාඩමෙන් ඉගෙන ගනු ඇත.

- සුවය ලබන්නේත් ඒ සඳහා සේවය කරන්නේත් කෙසේද?
- සුවකිරීමෙන් පසුව කෙරෙන සේවය
- අවසාන සුවය

මෙම පාඩමාලාව ආරම්භයේදී දේවරාජ්‍යය පිළිබඳව ඔබ උගත් විරුද්ධාභාසය සිහි කරන්න. ඔබ සුව කිරීමේ සේවය ආරම්භ කරන විට ඔබට සුවය ලැබෙනු ඇත.

## දහහතරවන පරිච්ඡේදය

# සුවය සඳහා සේවය කිරීම

### අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවයේ පොරොන්දුව මතකයෙන් ලිවීමට
- සුවකිරීමේ සේවය සඳහා මූලික සූදානම සාකච්ඡා කිරීමට
- සුවය සඳහා සේවයේ මාර්ගනිර්දේශ සාරාංශ කිරීමට

### සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **නුඹලා යමින් ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනා කරපල්ලා. රෝගීන් සුවකරපල්ලා. මළවුන් නැගිටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරපල්ලා. යක්ෂයන් දුරුකරපල්ලා, නුඹලා නොමිලයේ ලැබුවහුය. නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:7-8)**

### හැඳින්වීම

ඔබ මෙම පරිච්ඡේදයෙන් සුව කිරීමේ මෙහෙයේ යෙදෙන්නේ කෙසේදැයි ඉගෙනගන්නා විට ශරීරය සඳහා වන සටන තිව්‍ර වනු ඇත. මිදීම ලබා දෙන්නේ කෙසේදැයි ඔබ දහ අටවන පරිච්ඡේදයෙන් ඉගෙනගන්නෙහිය.

### මූලික සූදානම

සුවකිරීමේ සේවය ආරම්භ කිරීමට පෙර, ඉතා වැදගත් සූදානම්වීම් කීපයක් තිබේ. මේවා අතර දෙවියන්වහන්සේගේ සුවකිරීමේ බලය ගෙන යන මාර්ගය ලෙස ඔබද, ඔබ සුව කිරීමේ මෙහෙයේ යෙදෙන තැනැත්තාද සූදානම් කිරීමට තිබේ.

### ඔබ සූදානම්වීම :

ඇදහිල්ල ලැබෙන්නේ සුවය පිළිබඳ දේව වචනයට සවන් දීමෙනි. ඔබගේම ඇදහිල්ල වර්ධනය කරගැනීමට සුවය පිළිබඳව බයිබලයේ ඇති සෑමදෙයක්ම කියවන්න. අලුත් ගිවිසුම අලුත් ආකල්පයක් ඇතිව කියවන්න. යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට කරන්නට කියූ දේ ඔබද කරන්න. උන්වහන්සේ යමක් කරන බව පැවසූ සේක්ද එය උන්වහන්සේ කරන බවට බලාපොරොත්තුවන්න.

උන්වහන්සේගේ බලය තුළින් රෝගීන් සුව කිරීමට ඔබට හැකියයි උන්වහන්සේ පැවසූ සේක් නම්, ඔවුන්ගේ සුවවීම බලාපොරොත්තුවන්න. යක්ෂයන් පලවා හැරීමට උන්වහන්සේ පැවසූ සේක් නම් උන්වහන්සේගේ නාමයෙන් එය කරන්න. යක්ෂයන් කීකරුවීම ඔබ බලාපොරොත්තුවන්න. දැනට ඔබ ලබා ඇති මිනිසාගේ සියලු ඉගැන්වීම් හා ඔබගේ පුද්ගලික අත්දැකීම් අමතක කරන්න. නව ගිවිසුම පවසන දේ එලෙසම නිවැරදි බව පිළිගන්න. එය සත්‍ය බව පිළිගෙන ඒ අනුව කටයුතු කරන්න. ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ තානාපතිවරයෙකි (2 කොරි. 5:20). තානාපතිවරයෙක් තමා කතා කරන වචන තමා නියෝජනය කරන රට පිළිනොගනිද කියා අවිශ්වාස කරන්නේ නැත.

ඔබ සේවය කිරීමට පෙර නිරාහාරව සිට යාච්ඤා කරන්න. පාවුලුතුමාගේ ආදර්ශය ක්‍රියා 28:8 හි බලන්න. සුවකිරීම සඳහා බලයත් ආධිපත්‍යයත් ලැබෙන්නේ දෙවියන්වහන්සේගෙන් බැවින් ඒ ගැන විමසිල්ලෙන් සිටින්න. සමහර දුෂ්ටාත්මික විපත්ති සුවවන්නේ යාච්ඤා කිරීමෙන් හා නිරාහාරව සිටීමෙනි. යෙසායා 58 හි සඳහන්ව ඇත්තේ අන් අයගේ අවශ්‍යතාවන් වෙනුවෙන් කෙරෙන සේවයක් කෙරෙහි අවධානය යොමු කරන නිරාහාරව සිටීමකට දෙවියන්වහන්සේ ගරු කරන බවය.

ඔබට කිතුනු ජීවිතය ගැන ඉගෙනීමට බොහෝ දේ තිබියදීත් ඔබ ගැළවීම ලද වහාම සාක්ෂිදීම ආරම්භ කළාක් මෙන්, දිව්‍යමය සුවකිරීම පිළිබඳ සියලු දේ ගැන ඔබට අවබෝධයක් නොතිබුණද රොගීන්ට සේවය කිරීම අරඹන්න. සුවකිරීම පිළිබඳ ඔබ දන්නා දේ පදනම් කරගෙන ඔබගේ සේවය අරඹන්න. ඔබට දී ඇති ආලෝකයේ ඔබ ගමන් කරන විට ඔබට වඩාත් ආලෝකය ලැබෙනු ඇත. බලාපොරොත්තු රහිත අවස්ථාවන් නොමැතිය යන ආකල්පය යොදාගන්න. තමාට හමුවන්නේ තමා පිළිබඳව බලාපොරොත්තු සුන් කරගත් අය පමණි.

## අන් අය තුළ තිබිය යුතු මූලික සූදානම

සුදුසු උපදෙස් නොමැතිව රෝගීන් වෙනුවෙන් යාච්ඤා කිරීම දිරිගැන්වීම, යේසුස්වහන්සේ කවුරුන්දැයි නොදැන හා තම පාපය හා ගැළවීමේ අවශ්‍යතාව හඳුනා නොගෙන ගැළවීම නොලද අයට යේසුස්වහන්සේ සිය ගැළවුම්කරු ලෙස පිළිගැනීමට දිරිගැන්වීමක් මෙන් වේ.

ඇතැම්විට එවැනි උපදෙස් නොමැතිව දෙවියන්වහන්සේ සුව කරන සේක. එහෙත් මෙය මතක තබාගන්න. සුවය ලබාදීමට සේවය කරන විට, එම කාර්යය ඉටුවන බව දැකීමට දේව වචනයේ නිර්දේශ කර ඇති සියලුම මාර්ග භාවිත කිරීම ඔබට අවශ්‍ය වේ. දෙවියන්වහන්සේගේ සුවකිරීමේ බලය ලබාගන්නා එක් මාර්ගයක් වන්නේ ඇදහිල්ල වන අතර එය පැමිණෙන්නේ දේව වචනයට සවන් දීමෙන් බැවින් උපදෙස් වැදගත්ය. යේසුස්වහන්සේ දේශනා කිරීම ද ඉගැන්වීමද එකට සම්බන්ධ කළ අතර උන්වහන්සේගේ අනුගාමිකයන්ට ද එසේ කිරීමට උපදෙස් දුන් සේක.

ඇදහිල්ල ලැබෙන්නේ සුවය පිළිබඳ දේව වචනයට සවන් දීමෙනි. එය සම්ප්‍රදාය හෝ අත්දැකීම් හෝ මත නොව දෙවියන්වහන්සේ පවසන දේ මත පදනම් කරගෙන දේශනා කරන්න. සාක්ෂිවලින් පමණක් ඇදහිල්ල ගොඩනැගෙන්නේ නැත. සාක්ෂි මගින් දේව වචනය සනාථ කෙරෙන අතර ඇදහිල්ලද දිරිගැන්වෙනු ඇත. එහෙත් ඇදහිල්ල ලැබෙන්නේ දේව වචනයට සවන් දීමෙන් බව බයිබලයේ සඳහන් වේ (බිහිරි අයෙකුට දේශනාවන් නොඇසුණද බිහිරි ආත්මයට එය ඇසේ). සුවකිරීමේ ප්‍රභවය, රෝගීවීමට හේතුව හා ප්‍රභවය ද සුවයේ පොරොන්දුව හා සුවය ලබාගැනීමේ හා පවත්වාගැනීමේ බයිබලීය මාර්ග නිර්දේශ පිළිබඳ බයිබලය පවසන දේද මිනිසුන් දැනගත යුතුය.

ඇදහිලිවතුන් වෙනුවෙන් කෙරෙන සුවකිරීමේ මෙහෙයකදී රෝගීන් නිරාහාරව සිටීම හා යාච්ඤා කිරීම උපකාරී විය හැකිය. සුවවීම සඳහා මෙය අත්‍යවශ්‍ය නැත. එහෙත් මෙය මතක තබාගන්න. ලබාගත හැකි සියලුම බයිබලීය මාර්ග භාවිත කිරීම අපට අවශ්‍යය. අපගේ ඉල්ලීම දෙවියන්වහන්සේ අවධාරණය කරන අතර යෙසායා 58:6-8 න් අවධාරණය කෙරෙන්නේ සෞඛ්‍ය හා සම්බන්ධව නිරාහාරව සිටීමේ හා යාච්ඤාවේ වැදගත්කම වේ.

## සේවය කිරීමේ කාලය

රෝගීන් සඳහා සේවය කිරීමේ කාලය පිළිබඳව යෝජනා කීපයක් පහත දැක්වේ. මේවා පොදු මාර්ග නිර්දේශ බව මතක තබාගන්න. ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේගේ විවිධ මාර්ග නිර්දේශ ගැන විවෘතව සිටින්න. එමෙන්ම මෙම යෝජනාවලින් සමහරක් යොදා ගත හැක්කේ පුද්ගලික සේවයේදී පමණක් වන අතර අනෙක්වා විශාල කණ්ඩායම් සඳහා භාවිත කළ හැකිය.

### ඇදහිල්ලේ වාතාවරණයක් නිර්මාණය කරන්න:

ඇදහිල්ලේ වාතාවරණයක් නිර්මාණය කරන්න. ඔබ සුවය පිළිබඳ දේව වචනය අනුව සේවය කරන විට ඔබ මෙය දැනටමත් ආරම්භ කර ඇත. එහෙත් ඇදහිල්ලේ වාතාවරණයක් නිර්මාණය කිරීමට ඔබට අතිරේක පියවර ගැනීමට සිදුවීමට ඉඩ තිබේ. රෝගීන්ව ඇදහිල්ලෙන් හා ස්ථිර විශ්වාසයෙන් වටකරන්න. සුවය ලැබූ අයගේ සාක්ෂිවලට සවන්දීමට ඉඩ හරින්න. අවිශ්වාසය යේසුස්වහන්සේගේ සේවයට වුවත් නාසරෙත්හිදී බාධා ඇති කළ බව මතක තබාගන්න.

ඇදහිල්ලේ වාතාවරණයක් යනු නමස්කාර කිරීමේ හා ප්‍රශංසා කිරීමේ වාතාවරණයකි. දෙවියන්වහන්සේගේ වැඩසිටීම වෙත අප ළංවන්නේ (සුව කිරීම ඇති තැන) නමස්කාරයෙන් හා ප්‍රශංසාවෙනි. සුවකිරීමේ යාච්ඤාවක් නොමැතිව වුවද නමස්කාරයෙන් හා ප්‍රශංසාවෙන් සුවය ලැබීමට පුළුවන. මන්ද දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟගේ ප්‍රශංසාවේ වැඩ සිටින බැවිනි. අප ප්‍රශංසා කරන විට සුවකිරීම සඳහා උන්වහන්සේ වැඩ සිටින සේක. ගැළවීම පිළිබඳව

කරන අයුරින්ම සිය සුවය පිළිබඳව තීරණයක් ගැනීමේ තැනකට සෙනඟ පත් කරන්න. යේසුස්වහන්සේ කොර මිනිසාගෙන් ඇසූ දෙය සිහිකරන්න. “ඔබ සුවවීමට කැමතිද?” (යොහ. 5:6).

සුවවීම සඳහා සිය කැමැත්ත ප්‍රදර්ශනය කරන මෙන් එම පුද්ගලයාට පවසන්න. සමූහයක් තුළ නම් ඔවුන්ට සිටගන්න, ඉදිරියට එන්න, අත් ඔසවන්න හා රෝගය ඇති තැන අත් තබාගන්න ආදිය කිව හැකිය. සුව වීමට ඇති ආශාව ඉන් පෙන්වීමට පුළුවන. එය ඔවුන්ට ඇදහිල්ල දක්වන ක්‍රියාවක් වන අතර සේවය අවශ්‍ය අය හඳුනාගැනීමට ඉන් ඔබට හැකිවන්නේය.

## විමසිලිමත්භාවය (Discernment) සඳහා යාච්ඤා කරන්න

සුව කිරීමේ සේවය ආරම්භ කිරීමට පෙර ප්‍රඥාව හා විමසිලිමත්භාවය සඳහා යාච්ඤා කරන්න. උන්වහන්සේ ඔබට දෙන යම් දිව්‍යමය ප්‍රඥාවක් අන් අය සමග බෙදාගන්න. දෙවියන්වහන්සේ ඔබට පහත දැක්වෙන දේ එළිදරව් කළ හැකිය.

**දැනගැනීමේ වචනයක් :** දැනගැනීමේ වචනයක් තුළින් ඔබට යම් පුද්ගලයෙකු පිළිබඳව හෝ තත්වයක් පිළිබඳව හෝ සුවිශේෂී කරුණු සපයනු ඇත. එවිට යාච්ඤා කරන්නේ කෙසේදැයි ඔබට දැනගත හැකිය. දැනගැනීමේ වචනයක්, දැනුම පිළිබඳ ගැඹුරු හැඟීමක් හෝ ඔබගේ ආත්මයේ, සිතිවිල්ලේ, වචනයේ හෝ හැඟීමේ හෝ අදහසක් අන්තර්ගත කිරීමට පුළුවන. දැනගැනීමේ වචනයක් මගින් රෝගය කුමක්ද හෝ එම තත්වය එම පුද්ගලයාට ඇත්තේ මන්ද හෝ යන්න එළිදරව් කිරීමට ඉඩ ඇත.

**ශුද්ධ ලියවිලි පදයක් :** දෙවියන්වහන්සේ ඔබට එම තත්වය, රෝගය, පුද්ගලයා හෝ කණ්ඩායම හෝ ගැන “රේමා” (සුවිශේෂී) දේව වචනයක් දීමට ඉඩ තිබේ.

**දර්ශනයක්:** මෙය ඔබ සේවය කරන තැනැත්තා පිළිබඳව ඔබගේ මනසේ ඇති වන පින්තූරු වේ.

**ඇදහිල්ලේ වචන** මේ සුවිශේෂීව එම පුද්ගලයා සඳහා දෙනු ලබන දිරි ගැන්වීමේ හා ඇදහිල්ලේ විශේෂ වචන වේ.

**විශේෂ ආලේප කිරීමක්.**
වෙව්ලීමක්, උණුසුමක් හෝ අධිස්වභාවික ආත්ම විශ්වාසයක් ලෙස දැනෙන ක්ෂණික සිත් කාවැදුණු බලයක් වේ. ඇතැම්විට විශේෂ ආලේප කිරීමක් පැමිණෙන අතර එසේ වුවහොත් ඒ සමග ක්‍රියාකරන්න. එහෙත් රෝගීන් වෙනුවෙන් යාච්ඤා කිරීමට විශේෂ ආලේප කිරීමක් එනතුරු බලා නොසිටින්න. ඔබට හැඟීමක් ඇති වුවද නුවූවද යේසුස්වහන්සේගේ උපදෙස් අනුගමනය කරන්න.

**ඇදහිල්ලේ විශේෂ ක්‍රියාවක්** සමහර විට සුවය ලබා දෙන ඇදහිල්ලේ විශේෂ ක්‍රියාවක් කරන ලෙස එම පුද්ගලයාට පැවසීමට දෙවියන්වහන්සේ ඔබට මගපෙන්වනු ඇත.

## සම්මුඛ සාකච්ඡාවක් පවත්වන්න (අනිවාර්ය නැත)

ඔබ යම් පුද්ගලයෙකු සමග තනිවම කටයුතු කරන්නෙහි නම්, ඔබට කෙටි සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට අවශ්‍ය විය හැකිය. රෝගය ගැන දෙවියන්වහන්සේ ප්‍රඥාවේ සුවිශේෂී වචන දෙන සේක් නම් මෙය අවශ්‍ය නැත. එහෙත් අධිස්වභාවික ලෙස රෝගය එළිදරව් නොකළහොත් සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට නොපැකිළෙන්න.

සුවකිරීමේ සේවය සැපයීමට සම්මුඛ සාකච්ඡාවක් අවශ්‍යම නැත. එහෙත් ඔබට සුවිශේෂීව යාච්ඤා කිරීම සඳහා තොරතුරු ලබාගැනීමට එය උපකාරී වනු ඇත. එමෙන්ම යාච්ඤා කිරීමට පෙර යම් පුද්ගලයෙකුට තවදුරටත් උපදෙස් දිය යුතුද යන්න තීරණය කිරීමට ද එය උපකාරී වේ. යේසුස්වහන්සේ සම්මුඛ සාකච්ඡා පැවැත්වූ සේක. යේසුස්වහන්සේ මනුෂ්‍යයන්ගෙන් ඔවුන්ට අවශ්‍ය කුමක්දැයි ඇසූ සේක. ඔවුන්ගේ ඇදහිල්ල ගැන විමසූ සේක. එමෙන්ම ඔවුන්ට සේවය කිරීමට පෙර අවිශ්වාසයේ ඍණාත්මක බලවේග ගැන කටයුතු කළ සේක.

“ගැටලුව කුමක්ද,”යි එම තැනැත්තාගෙන් අසන්න. සුවය ලැබීම සඳහා පැමිණි බොහෝ දෙනෙකුගෙන් මෙවැනිම ප්‍රශ්නයක් යේසුස්වහන්සේ ඇසූ සේක. යාච්ඤා ඉල්ලීම වාචිකව පැවසීම රෝගියාට වැදගත් වේ. සුවය ලබාදීම සඳහා වැඩිහිටියන් කැඳවන ලෙස රෝගීන්ට පවසා ඇත. බයිබලය නිර්දේශයක් දෙනු ලබන්නේ හේතුවක් ඇතිවය. ඉල්ලීම, සුවවීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ආරම්භක ඇදහිල්ලේ ක්‍රියාවකි (යාකොබ් 5:14-15).

(මීට විකල්පයක් වන්නේ පුද්ගලයෙකුට ඉල්ලිය නොහැකි වූ විටය. නිදසුනක් ලෙස යේසුස්වහන්සේ නැගිටුවාවූ මියගිය දරුවා වේ. එහෙත් ඒ අවස්ථාවේ වුවද ඔහුගේ මව්පියෝ දරුවා සුව කරන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටියහ).

සුවිශේෂී ප්‍රකාශනයක් ඉල්ලන්න. ඉල්ලීම බොහෝ සේ සාමාන්‍ය නම් යාච්ඤා කළ යුත්තේ කුමක් සඳහාද යන්න ඔබ නොදන්නා අතර සුවය ලැබුණු විට ඒ බව රෝගියා නොදන්නවා ඇත. ඔබට අවශ්‍ය වන්නේ කරුණු කෙටියෙන් වේ. උදා: “මට ආමාශයේ පිළිකාවක් තිබේ”. ඔබට සම්පූර්ණ වෛද්‍ය ඉතිහාසයක් අවශ්‍ය නැත. ඔබ ලද උපදෙස් විශ්ලේෂණය කිරීම අවශ්‍ය නොවේ. ඔබගේ වගකීම යාච්ඤා කිරීමයි. උපදෙස් දීම නොවේ. ඇතැම් සුවිශේෂී අවස්ථාවල රහසිගතව පුහුණු උපදේශකයෙකු සමග උපදෙස් දීමට වඩාත් කාලයක් අවශ්‍ය විය හැකිය. මේ සඳහා උපදේශකවරු ලබාගන්න.

යාච්ඤා කළ යුතු තැනැත්තාගෙන් “යේසුස්වහන්සේට ඔබ සුවකළ හැකි බව ඔබ විශ්වාස කරන්නෙහිද,”යි අසන්න. පිළිතුරු ශුභදායක නම් මෙසේ අසන්න. “යේසුස්වහන්සේ එය දැන් කරන බව ඔබ විශ්වාස කරන්නෙහිද?” මේ ඕනෑම ප්‍රශ්නයකටම පිළිතුර “නැත” යන්න නම් දේව වචනයෙන් තවදුරටත් උපදෙස් අවශ්‍ය වේ.

විශාල සමූහයකට සේවය කරන විට ඔබට සෑම පුද්ගලයෙකුටම කතා කිරීමට නොහැකිය. ප්‍රේක්ෂකයන් අතර සිටින සුවිශේෂී රෝග සහිත අය දෙවියන්වහන්සේ එළිදරව් කරනු ඇත. නැතහොත් බිහිරිකම, අන්ධබව ආදී ඇතැම් රෝගාබාධ සඳහා සමූහ යාච්ඤාවනට ඔබට මගපෙන්වනු ඇත. ඇතැම්විට ඔබට පොදු යාච්ඤාවක් කිරීමේ හැඟීමක් ඇතිවිය හැකිය. නැතහොත් ප්‍රේක්ෂකයන් අතර සිටින ඇදහිලිවතුන්ට රෝගීන් වෙනුවෙන් පෞද්ගලිකව යාච්ඤා කිරීමට මගපෙන්වීම සිදුවිය හැකිය.

සියලුම සේවාවන් ඔබ කරනවාට වඩා සේවය කරන ආකාරය ඇදහිලිවතුන්ට ඉගැන්වීම වඩාත් යෝග්‍ය වේ. යේසුස්වහන්සේගේ පැවරීම වූයේ අදහන අයට මෙම ලකුණු පහළ වන බවය. සේවයෙහි නිරත විය යුත්තේ මුළු ශරීරයම මිස ඇදහිලිවතුන් එක් කෙනෙක් හෝ දෙදෙනෙක් හෝ නොවේ.

## ගැටලුව නිර්ණය කරන්න.

සම්මුඛ සාකච්ඡාවෙන් ලද තොරතුරුවලින් හා දෙවියන්වහන්සේ ඔබට දෙන ප්‍රඥාවෙන් ගැටලුව පහත සඳහන් කුමන ක්ෂේත්‍රයේදැයි නිර්ණය කරන්න.

**ආත්මික ක්ෂේත්‍රය** මේවා පාපය හා සම්බන්ධ ගැටලු වන අතර ඒවාට ආත්මික ක්ෂේත්‍රයේ සේවයක් අවශ්‍ය වේ (ගැළවීම, පසුතැවීම හා පාපයට කමාව).

පාපය හා රෝගය අතර සබඳතාවක් තිබේ නම් (එසේ ඇති බව අප දැක ඇත) කමාව හා සුවය අතර ද සබඳතාවක් තිබේ. බොහෝ අයට පාපය සඳහා කමාව ඉල්ලූ විට ශාරීරික සුවය ලැබේ.

රෝගය පාපය නිසා යයි තීරණය කිරීමට ඉක්මන් නොවන්න. සෑම රෝගයක්ම පෞද්ගලික පාපයක් නිසා නොවන බව මතක තබාගන්න. පාපයක් ඇත්නම් එය දැනගැනීමට සැලැස්වීම ශුද්ධාත්මයාණන්ගේ වගකීමකි. මන්ද උන්වහන්සේගේ කාර්යය වරදකරු කොට නිවැරදි කිරීම වේ.

**ශාරීරික ක්ෂේත්‍රය** මෙය ශාරීරික ආබාධ, තුවාල හෝ අසනීපයන් වේ. ශාරීරික සුවය සඳහා යාච්ඤා කරන්න.

**හැඟීම් ක්ෂේත්‍රය :** කනස්සල්ල, බිය, කෝපය, තිත්තකම, අමනාපය, වරදකරු බව හැඟීම, අවිශ්වාසය, අසාර්ථකත්වය, ඊර්ෂ්‍යාව, ආත්මාර්ථකාමීබව, ව්‍යාකූලත්වය, ඉච්ඡාභංගය, කමාව නොදීම හා අතීත ගැටලු පිළිබඳ හැඟීම් තුළ බලපෑම මීට ඇතුළත් වේ. මොවුනට අවශ්‍ය වන්නේ

හැගීම් ක්ෂේත්‍රයේ සුවවීමිය. මෙය බොහෝවිට හැඳින්වෙන්නේ "අභ්‍යන්තර සුවය" ලෙස වුවද එම පදය ඇතැම් අය වැරදි ලෙස භාවිත කරති. මුල් හැගීම්වල අත්දැකීම සඳහා ඒවා නැවත කිරීම අවශ්‍ය නැත. මෙවැනි සිත්තැවුල්වලින් මිදීමට සති, මාස හෝ අවුරුදු ගණනාවක් ගත කිරීම ද අවශ්‍ය නැත. ඔබ එසේ කළහොත් ඔබ උත්සාහ කරන්නේ ඔවුන්ට ක්‍රිස්තුන්වහන්සේ තුළ අලුත් මැවීමක් වීමට උපකාර කිරීම වෙනුවට පැරණි පුද්ගලයා සුව කිරීමට උත්සාහ කිරීමකි.

හැගීම් ක්ෂේත්‍රයේ ගැටලු බොහෝ විට කෙනෙකුගේ ජීවිතයේ සමාජය ක්ෂේත්‍රය හා සම්බන්ධය. ඒවා පවුල් හා සමාජ සම්බන්ධතාවලට බලපෑම් ඇති කරයි. සුවය ලැබෙන්නේ ගැටලුව හැඳිනගැනිමෙන්, කමාව ඉල්ලීමෙන් හා ඒ හා සම්බන්ධ අනෙකුත් අයට කමාව දීමෙනි.

හැගීම්වල සුවය සඳහා මහත්ම බාධකය සාමාන්‍යයෙන් කමාව දීම වේ. එබැවින් හැගීම්වල සුවයෙහි, සමාජ සම්බන්ධතා සුවය ද අන්තර්ගතය. සමගිකිරීමේ සේවකයන් වීමට අප කැඳවා තිබේ (2 කොරින්ති 5:18-21). මිනිසා, දෙවියන්වහන්සේ සමගත් මිනිසා සමගත් සමගි වීම අවශ්‍ය වන අතර හැගීම්හි, මානසික හෝ අභ්‍යන්තර සුවය ඇත්තේ මෙහිදී වේ. මේ සියල්ල එකම ආකාරයේ සුවයක් සඳහා දෙනු ලබන එක හා සමාන මාතෘකා වේ.

පහත දැක්වෙන ප්‍රශ්න ඇසීමෙන් හැඟීම්හි තත්වයන් හඳුනාගත හැකිය.

- ඔබට තවමත් මහත් වේදනාවන් ගෙන දෙන මතකයන් සිත තුළ කැකෑරේද? එසේ ඇත්නම් මෙම හානිකර හැඟීම් වලින් සුවය අවශ්‍ය වේ.

- ඔබට නිදහස් කළ නොහැකි පූර්ව මත ඔබට තිබේද? මේවා හැගීම් තුළ ඇති වේදනාවන්හි මුල්බැසගෙන තිබිය හැකිය.

- ඇතැම් දේ පිළිබඳ මහත් බියක් ඔබට තිබේද? හැඟීම්හි සුවය මගින් මෙවැනි බියවලින් නිදහසක් ඔබට ලැබෙනු ඇත.

- ඔබට මහත් අදක්ෂතාවන් තිබේද? ඔබට තමා පිළිබදව පහත් ආත්ම ආකල්පයක් තිබේද? ඔබට හැඟෙන්නේ ඔබ අසාර්ථකවූවෙකු ලෙසද? මේවා ඇතිවීමට හේතුව අතීතයේ සිදුවූ කාරණා නිසා හැඟීම් තුළ ඇති වේදනාවන් විය හැකිය.

- ඇතැම් අය හෝ දේ හෝ පිළිබඳව ඔබට ඇති මහත් ආකර්ෂණයක් හෝ විකර්ෂණයක් හෝ තිබේද? මෙවැනි අසාමාන්‍ය ප්‍රතික්‍රියා සඳහා හේතුව විය හැක්කේ අතීත අත්දැකීම් වේ.

කමාවදීම පිළිබඳව එම තැනැත්තාට ඉගැන්විය යුතු වනු ඇත. කමාව යනු මේවා නොවේ.

- යම් කෙනෙක් ඔබට කළ වරදක් සාධාරණීකරණය කිරීම නොවී. (නිදසුනක් ලෙස "ඔවුන් සිටියේ මහත් පීඩනයක් යටතේය"යි පැවසීම)

- පළමුවෙන් ඔබට වේදනාවක් ගෙන දුන් බව ප්‍රතික්ෂේප කිරීම

- ඔබට කළ දෙය ඉවසීමෙන් යුතුව දරාගැනීම.

- වේදනාව කාලයත් සමග සුවවේයයි සිතීම (එසේ සුව නොවේ)

සැබෑ කමාව පැමිණෙන්නේ මේවායිනි.

(1) පාපි ලෝකයක පාපි මිනිසුන් නිසා ඔබට සිදුවූ දෙය වැරැද්දක් ලෙස හඳුනාගැනීම. ආපස්සට ගොස් මානසිකව ඒ සිද්ධියෙහි නැවත ජීවත්වීම අවශ්‍ය නැත. එහෙත් එය ප්‍රතික්ෂේප කිරීමෙන් ඒ ගැන කටයුතු කිරීමට ද ඔබට නොහැකිය. සිදුවූ දෙයත් එය ඔබට බලපෑ ආකාරයත් පිළිගන්න.

(2) ඊදිම් දෙවියන්වහන්සේට පාපොච්චාරණය කර එයින් ඇතිවූ හානිකර හැඟීම්වලින් ඔබ සුවකරන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලන්න. මේ සිද්ධියේ කරුණු ඔබට කිසිදා අමතක නොවිය හැකිය. එහෙත් ඔබට අවශ්‍ය වන්නේ ඒ හා සම්බන්ධ ඇතිවූ හානිකර හැඟීම් සඳහා සුවය වේ.

(3) ඒ හා සම්බන්ධ අනෙක් අයට කමාව දීමට ඔබට උපකාරී වන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. ඉන්පසු ක්‍රිස්තුස්වහන්සේ ඔබට කමාව දුන් ලෙස ඔබත් ඔවුන්ට කමාව දෙන්න. ඔබ අන් අයට කමාව දෙන විට දෙවියන්වහන්සේ ඔබට කමාව දෙන බව මතක තබාගන්න. "අපට වැරදිකරන අයට අප කමාවන්නාක් මෙන් අපේ වරදවලටද කමාවුව මැනව". ඒ තැනැත්තා තමාටම කමාව දීම අවශ්‍ය විය හැකිය (කළ වැරදිවලට වරදකරු බැවින්). හැඟීම්වල සුවය සඳහා ස්ථිර වශයෙන්ම යාච්ඤා කිරීම අවශ්‍ය වේ. ඔබටම කමා කරගන්නා ආකාරය මෙසේය.

- වරදකාරිත්වයට හා පාපි හැඟීම් සඳහා හේතුවන පාපය පිළිගෙන, දෙවියන්වහන්සේට පාපොච්චාරණය කර පසුතැවිලිවන්න. ඔබගේ පාපවලට කමාවන ලෙසත් හැඟීම් සුව කරන ලෙසත් උන්වහන්සේගෙන් ඉල්ලන්න.

- දෙවියන්වහන්සේ කමාව දුන් විට උන්වහන්සේ අමතක කරන බව මතක තබාගන්න. (උන්වහන්සේ නැගෙනහිර බස්නාහිරින් දුරස්ව සිටින්නේ කෙසේද එලෙසම උන්වහන්සේ අපගේ පාප පහ කරන සේක)

- 1 යොහන් 1:8-9 හා රෝම 8:1 අයිතිය ඉල්ලන්න.

- ඔබගේම කැමැත්තේ ක්‍රියාවක් මගින් දෝෂාරෝපණයෙන් ඔබවම නිදහස් කරගන්න. "බොරු පරිකල්පනාවන්" ඉවත් කිරීමෙන් හා "පසුගිය දේ අමතක කිරීමෙන්" අනාගත සිතිවිලි රටා පාලනය කරන්න.

**මානසික ක්ෂේත්‍රය :** මේවා සෘණාත්මක සිතිවිලි, මනස වෙත සාතන්ගෙන් කෙරෙන ප්‍රහාරයන්, මානසික මන්දනයන් ආදිය නිසා ඇතිවන ගැටලු වේ. සුවය සඳහා යාච්ඤා කරන්න.

**යක්ෂාත්මික ක්ෂේත්‍රය :** මේවා යක්ෂාවේෂවීම් වැනි සෘජු දුෂ්ටාත්මික ක්‍රියාවන් නිසා ඇතිවන තත්වයන් වේ. මිදීම ලබාදීම සඳහා මේ ගැන කටයුතු කරන ආකාරය ඊළඟ පාඩමෙන් ඔබ ඉගෙන ගන්නවා ඇත. එක් ක්ෂේත්‍රයක ගැටලුවලින් සම්පූර්ණ පුද්ගලයා කෙරෙහි බලපෑම් ඇතිවන බව මතක තබාගන්න. ඔබ සේවය කරන විට යේසුස්වහන්සේ මෙන් රෝගය ගැන පමණක් නොව සම්පූර්ණ පුද්ගලයා ගැනම කටයුතු කරන්න. මනුෂ්‍යයා ශරීරය, ප්‍රාණය හා ආත්මය වේ. සම්පූර්ණත්වයෙන් ගම්‍ය වන්නේ මේ සියල්ල සමග කටයුතු කිරීමය.

## සුවවීමේ යාච්ඤාව යාච්ඤා කරන්න.

ඔබ තත්වය නිර්ණය කළ පසු, සුවවීමේ යාච්ඤාව කරන්න. එහෙත් ඇතැම් අවස්ථාවල ස්වාමින්වහන්සේ යාච්ඤා නොකිරීමට හෝ ප්‍රමාද කිරීමට හෝ පැවසුවහොත් පුදුම නොවන්න. නිදසුනක් ලෙස, සම්මුඛ සාකච්ඡාවෙන් යම් කෙනෙකුව සුව වීම නිසා ආබාධිත විශ්‍රාම වැටුප අහිමි වන බැවින් සුවය අනවශ්‍ය බව, ඔබට දැනගැනීමට ලැබිය හැකිය (එක් සුවවීමේ දේව මෙහෙයකදී මෙය සැබවින්ම සිදුවිය).

තවදුරටත් උපදෙස් දෙනතුරු හෝ පාප ගැටලුව පිළිබඳව කටයුතු කරනතුරු හෝ ශාරීරික සුවය පිළිබඳව යාච්ඤා කිරීම ප්‍රමාද කිරීමට ස්වාමින්වහන්සේ ඔබට මගපෙන්විය හැකිය. ඔබ යාච්ඤා කරන විට, සුවිශේෂිව ගැටලුව කෙරෙහි අවධානය යොමු කෙරෙන ඇදහිල්ලේ යාච්ඤාවක් කරන්න. දිග හෝ මහත් සේ ශබ්දනගා කරන යාච්ඤාවක් මගින් දෙවියන්වහන්සේ පෙලඹවීමට නොහැකි බව මතක තබාගන්න. ගැළවීම දැනටමත් ලැබී තිබෙන්නාක් මෙන් සුවය ද එසේම වේ. ගැළවීම ඇදහිල්ලේ තත්වය මත පදනම් වනවා සේම සුවය ද එසේම වේ. දෙවියන්වහන්සේට ගැළවීම ලබාදීම අවශ්‍ය වන්නාසේම සුවය ද අවශ්‍යය වේ.

සුවය ලබාදීමේදී ඇතැම් අවස්ථාවල දෙවියන්වහන්සේගේ බලය විශේෂාකාරයෙන් තිබුණද (ලූක් 5:17) විශේෂ ආලේපයක් නොමැතිව ඔබට සුවය සඳහා යාච්ඤා කිරීමට පුළුවන, මන්ද යේසුස්වහන්සේ ශුභාරංචිය පැතිරීමට ඔබට පැවසූ ආකාරයෙන්ම මෙයද පවසා ඇති බැවිනි.

පිළිතුරු ලැබීමේ යාච්ඤාවට ප්‍රධාන වන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව යාච්ඤා කිරීම වේ. "ඔබවහන්සේගේ කැමැත්ත නම්" යනුවෙන් යාච්ඤා නොකරන්න. "ඔබ කැමති සේක් නම් සුව කරන්නැ"යි යේසුස්වහන්සේ කිසිදා යාච්ඤා කළේ නැත. "ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද උන්වහන්සේගේ කැමැත්ත කරන ලෙස" හෝ "ඔබවහන්සේගේ කැමැත්ත කරන ලෙස" හෝ ධනාත්මක යාච්ඤාවක් කරන්න. දෙවියන්වහන්සේගේ සර්වබලධාරීත්වය තවමත් මෙයින් පිළිගැනේ.

හැකි අවස්ථාවල ඔබ සමග සේවය කිරීමට අනෙකුත් ඇදහිලිවතුන්ද යොදාගන්න. වැඩි දෙනෙක් යාච්ඤා කරන විට ආත්මික බලය දෙගුණ-තෙගුණ වේ (මතෙව් 18:19 බලන්න). “සමූහ සේවය” සුවකිරීමේ දීමනාව සාර්ථකව අත්දකින පුද්ගලයන් හා සුවය ලබන අය තමාටම හෝ මනුෂ්‍යයන්ට හෝ මහිමය දීම අධෛර්ය කරයි. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ සෑම සාමාජිකයෙකුටම අවම වශයෙන් එක් ආත්මික දීමනාවක්වත් ඇත. ඉතාමත් ඵලදායි සේවය මෙසේ වූ විට සිදුවේ.

> **දෙවියන්වහන්සේගේ විවිධාකාර වරප්‍රසාදවල විශ්වාසී ගබඩාකාරයන් මෙන් එකිනෙකා ලබා ඇති කුසලතා එකිනෙකාට සේවය කිරීම පිණිස යොදන්න (1 පේතෘස් 4:10).** (නව අනුවාදය)

ඔබගේ සුවකිරීමේ යාච්ඤාවන් මින් එකක් විය හැකිය.

- ඉල්ලීමක් — මාක් 7:32-35
- ආඥාවක් — ලූක් 4:38-39, මාක් 7:32-35, යොහ. 5:8, ක්‍රියා 3:6, 9:40
- මැදිහත්වීමක් — නික්මයාම 32
- තරවටු කර පලවා හැරීමක් — මාක් 9:25

ස්වාමින්වහන්සේ මගපෙන්වන පරිදි සුවිශේෂී ක්‍රියාවක් කිරීමට ඔබගේ යාච්ඤාවේ තිබිය හැකිය (යොහ. 9:1-7 බලන්න) (සටහන : බෙහෙත්ගැනීම නැවැත්වීමට කිසිදා කිසිවෙකුට නොකියන්න. දෙවියන්වහන්සේට ඔවුන්ට මගපෙන්වීමට ඉඩ හරින්න). සෑමවිටම යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරන්න. එක් වරකට වඩා යාච්ඤා කිරීම ඇදහිල්ලේ මදකමක් නොවන බව මතක තබාගන්න (නොපසුබට උත්සාහය පිළිබඳව යේසුස්වහන්සේ ඉගැන්වූ දේ නැවත බලන්න).

## පිළිතුර සඳහා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න

යාච්ඤාවෙන් පසු සුවකිරීම ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. යේසුස්වහන්සේ සුවය ලබාදීමට ක්‍රියා කළ ලාදුරු රෝගීන් දස දෙනා ගැන සිතන්න. සියලු දෙනාම සුවය ලැබුවද ප්‍රශංසා කිරීමට පැමිණි තැනැත්තා පමණක් පූර්ණ කෙරිණි. දැකීමෙන් නොව ඇදහිල්ලෙන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. ඔබ කර ඇත්තේ දේව වචනයෙන් ඔබට අණ කළ දේ වේ. උන්වහන්සේ කරන බවට පැවසූ දේ උන්වහන්සේ කර ඇති බව විශ්වාස කරන්න. ඒ වෙනුවෙන් උන්වහන්සේට ස්තුති කරන්න. ලාසරස් සොහොනෙන් එළියට පැමිණීමට පෙර යේසුස්වහන්සේ තම යාච්ඤාවට සවන් දීම ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

# ස්වයං පරීක්ෂණය

1. සුවයේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. සුවකිරීමේ සේවයේ මූලික සූදානම සාකච්ඡා කරන්න.

3. සුවය ලබාදීම පිළිබඳ මාර්ග නිර්දේශ සාරාංශ කරන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. සුව කිරීමට පෙර රෝගීන් සමග යේසුස්වහන්සේ කළ සම්මුඛ සාකච්ජා පිළිබඳ මෙම නිදසුන් අධ්‍යයනය කරන්න.

   - මාක් 5:1-20 — අශුද්ධාත්ම ආවේශ වූ මිනිසාගෙන් යේසුස්වහන්සේ ප්‍රශ්න අසයි.
   - මාක් 8:22-26 — අන්ධ මිනිසාගෙන් ප්‍රශ්න ඇසීම
   - මාක් 9:14-27 — අශුද්ධාත්මයක් ඇති ළමයා ගැන සම්මුඛ සාකච්ජාව
   - මාක් 10:46-52 — අන්ධ බර්තිමේයුස්ගෙන් ප්‍රශ්න ඇසීම

2. සුවකිරීමේ සේවය පිළිබඳව යේසුස්වහන්සේ සිය අනුගාමිකයන් පුහුණු කළ සේක (මතෙ. 10:18) ඔබ සමග සුවකිරීමේ මෙහෙයෙහි යෙදීමට සේවක කණ්ඩායමක් සූදානම් කරගන්නේ මෙසේ වේ.

- සේවක කණ්ඩායමක් තෝරාගන්න. ඔවුන් ඉගෙනීමට විවෘතවූ සේවය කිරීමට ආශාවක් ඇති, උපදෙස් පිළිගන්නා, ප්‍රේමය හා දයාව සහිත හා යහපත් ආත්මික හා හැඟීම් ජීවිතයක් සහිත අය විය යුතුය.

- මෙම අත්පොතේ හා දේව වචනයේ ඇති පාඩම්, උපදෙස් දීමට හා ඇදහිල්ල ගොඩනැගීමට යොදාගන්න.

- නිරාහාර යාච්ඤාවෙන් කාලය ගත කරන්න.

- කණ්ඩායමේ සාමාජිකයන්ට එකිනෙකා සමග සුහදව කටයුතු කිරීමට හැකිවීම පිණිස කවුරු කවරක් කළ යුතුදැයි තීරණය කරන්න. ව්‍යාකූල නොවීම පිණිස එක් කෙනෙක් සේවය සම්බන්ධීකරණය කරන්න.

- සුවකිරීමේ සේවය සඳහා අන් අය සන්නද්ධ කිරීමට කණ්ඩායම් සාමාජිකයන්ගේ උපකාරය ලබාගන්න. දෙවියන්වහන්සේගේ බලය ක්‍රිස්තුන්වහන්සේගේ මුළු ශරීරයටම ලබාගත හැකිවීමට සලස්වා ඇත්තේ කෙසේද යන්න අන් අයට ඉගෙනීම සඳහා සන්නද්ධ කිරීමේ සේවාවන් තරම් සුවකිරීමේ සේවා නොපවත්වන්න.

3. ඔබගේ සභාවට සුවකිරීමේ සේවයක් හඳුන්වා දෙන්නේ කෙසේදැයි පිළිබඳ යෝජනා සමහරක් මෙසේ වේ.

**උගන්වන්න.** සුවය පිළිබඳ පණිවුඩ දේශනා කරන්න. ඉරිදා පාසලේදී හා බයිබල් අධ්‍යයනවලදී සුවකිරීම ගැන උගන්වන්න. මෙම විෂය ගැන කතා කිරීමට බාහිර කථිකයන්ට ආරාධනා කරන්න. *"ශරීරය සඳහා ඇති බලගැටුම"* නමැති මෙම අත්පොත භාවිත කරන්න.

**පැහැදිලි කරන්න.** සුවය ලද අය සාක්ෂි දීම සඳහා යොදාගන්න. දෘශ්‍ය හා අදෘශ්‍ය සුවය ලැබූවන්ගේද, ක්‍රම ක්‍රමයෙන් හා ක්ෂණික සුවය ලැබූවන්ගේද, බරපතල හා සාමාන්‍ය රෝගාබාධවලින් සුවය ලැබූවන්ගේ ද අත්දැකීම් ඇතුළත් කරන්න.

**කාවද්දන්න:** සභා ජීවිතයේ සියලුම ක්ෂේත්‍ර හා සුවකිරීමේ සේවය සමෝධාන කරන්න. රෝහල්වලට හා නිවෙස්වලට සුවකිරීමේ සේවා කණ්ඩායම් යවන්න. පළමුව වැඩිහිටියන් හා නායකයන් සුවකිරීමේ සේවය සඳහා යොදාගෙන පසුව මුළු සමූහයම ඒ සඳහා යොදාගන්න.

**ආදර්ශනය කරන්න.** දෙවියන්වහන්සේගේ බලය ආදර්ශනය කිරීම සඳහා අවස්ථාවන් සපයන්න. සුවකිරීමේ හා මිදීමේ සේවයන් සැලසුම් කර පවත්වන්න.

4. සුවය ලබාදීම සඳහා ඔබට භාවිත කිරීම පිණිස මෙම පාඩම පිළිබඳ සාකච්ජා තුළින් පහත දැක්වෙන හරි වැරදි බැලීමේ ලයිස්තුව සකස් කෙරිණි.

## මූලික සුදානම

**ඔබ තුළ**

- සුවකිරීම පිළිබඳ දේව වචනය අධ්‍යයනය කරන්න
- මූලික නිරාහාරව සිටීම හා යාච්ඤා කිරීම

**අන් අය තුළ**

- සුව කිරීම පිළිබඳ නිවැරදි උපදෙස්
- සුව කිරීම පිළිබඳ දේව වචනය අධ්‍යයනය කරන්න
- මූලික නිරාහාරව සිටීම හා යාච්ඤා කිරීම

**සේවය කිරීමේ කාලය**

- ඇදහිල්ලේ වාතාවරණයක් නිර්මාණය කරන්න
- විමසිමේ ආත්මයක් සඳහා යාච්ඤා කරන්න. ඔබට මේ දේ දෙවියන්වහන්සේ දෙනු ඇත.
    - දැනගැනීමේ වචනයක්
    - ශුද්ධ ලියවිලි පදයක්
    - දර්ශනයක්
    - ඇදහිල්ල පිළිබඳ වචනයක්
    - විශේෂ ආලේපයක්
    - ඇදහිල්ලේ විශේෂ ක්‍රියාවක්
- සම්මුඛ සාකච්ඡාවක් පවත්වන්න. (වෛකල්පිත)
- ගැටලුව තීරණය කරන්න. ගැටලුව මින් කුමන ක්ෂේත්‍රයේද?
    - ආත්මික
    - ශාරීරික
    - හැඟීම්
    - මානසික
    - දුෂ්ටාත්ම
- සුවයේ යාච්ඤාව යාච්ඤා කරන්න.
- පිළිතුර වෙනුවෙන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

## පහළොස්වන පරිච්ඡේදය

# සුවකිරීමෙන් පසු සේවය ( Follow up Ministry)

### අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවයේ පොරොන්දුව මතකයෙන් ලිවීමට
- සුවය ලැබූ අය වෙනුවෙන් කෙරෙන පසු සේවය සාකච්ඡා කිරීමට
- තවමත් සුවය නොලැබූ අය වෙනුවෙන් කෙරෙන පසු සේවය සාකච්ඡා කිරීමට

### සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **මක්නිසාද, අපට සිටින්නේ අපේ දුර්වලකම්වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව් කිරීමක් නැතුව, සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂාකරනු ලැබූ උත්තම පූජකයෙක්ය. එබැවින් අපට දයාව ලැබෙන පිණිසද අපේ ඕනෑකම්වලදී අපට උපකාරයට අනුග්‍රහය සම්බවන පිණිසද නිසැකකමින් කරුණාවේ සිංහාසනයට ළඟාවෙමු. (හෙබ්‍රෙව් 4:15-16)**

### හැඳින්වීම

සුවය ලැබූ අයට පසු සේවයක් කිරීම අත්‍යවශ්‍ය වේ. සුවය හා මිදීම අත්දුටුවන්ට යේසුස්වහන්සේ උපදෙස් දුන් සේක.
ලාදුරු රෝගයෙන් සුවය ලැබූ මිනිසාට උන්වහන්සේ මෙසේ කතා කළ සේක.

> **කාටවත් එය නොකියන්ට උන්වහන්සේ ඔහුට අණකොට, නුඹ ගොස් පූජකයාට පෙනී, මෝසෙස් විසින් අණකළ දේවල් ඔවුන්ට සාක්ෂි පිණිස නුඹේ පවිත්‍රවීම සඳහා ඔප්පුකරපන්නැයි කීසේක. (ලූක් 5:14)**

සුවය ලැබූ පාපී ස්ත්‍රියකට උන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **ඔබේ ගෙදරට හැරී ගොස්, දෙවියන්වහන්සේ ඔබට කොපමණ මහත් දේවල් කළසේක්ද කියා ප්‍රකාශකරන්න . . . (ලූක් 8:39)**

බෙතෙස්දා පොකුණ අසල සිටි මිනිසාට උන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **බලන්න, ඔබ සුවය ලැබුවෙහිය. ඔබට මීට වඩා නරකක් සිදු නොවන පිණිස තවත් පව් නොකරන්න (යොහන් 5:14)**

කාම්මිථ්‍යාචාරයේ හැසිරී අසුවූ ස්ත්‍රියට උන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **මමත් නුඹ වරදට පත් නොකරමි. යන්න මෙතැන් පටන් තවත් පව් නොකරන්න. (යොහන් 8:11)**

ඔබ යම් පුද්ගලයෙකුට පෞද්ගලිකව සේවයක් කරන්නෙහි නම් ඔහුට පසු සේවයේ උපදෙස් දීම ඔබට කළ හැකිය. ඔබ සමූහ රැස්වීමක සේවය කරන්නෙහි නම් මෙහෙයෙන් පසු හෝ පසුදා උදයේ හෝ පසු සේවයේ උපදෙස් සපයන්න. ඔබ යම් ප්‍රදේශයක සභාවකට සේවය සපයන්නෙහි නම් සුවය ලැබූ අයට පසු සේවයක් සපයන ලෙස සභාපාලක තුමාගෙන් ඉල්ලන්න.

එම සේවයේ උපදෙස් පහත දැක්වෙන දේ පිළිබඳව විය යුතුය.

- සුවය දිගටම තබාගැනීමට කළ යුතු දෙය කුමක්ද?
- ඔවුන්ට සුවය නොලැබුණි නම් කළ යුතු දෙය කුමක්ද?

## සුවය දිගටම තබාගැනීමට කළ යුතු දෙය කුමක්ද?

සුවය ලැබූ අයට මේවා උගන්වන්න.

### සාතන්ගෙන් පැමිණෙන ප්‍රහාරයන් හඳුනාගන්න :

ගැළවීම ලැබූ සෑම කෙනෙකුම සාතන් පරීක්ෂා කරන්නාසේම සුවය ලැබූ සෑම කෙනෙකුම ද සාතන් පරීක්ෂා කරනු ඇත. ආත්මික ජයග්‍රහණයන් නැතිවන්නා සේම ශාරීරික ජයග්‍රහණයන් ද නැති විය හැකිය. ඔබගේ ආත්මික ගමනේදී ඔබ දෙවියන්වහන්සේ විශ්වාස කළ යම් දෙයක් ඇත්ද, ඔබව එම ක්ෂේත්‍රයේදී පරීක්ෂා කෙරෙනු ඇත. සාතන් ඔබව මේ දේවලින් පරීක්ෂා කරනු ඇත.

**- රෝග ලක්ෂණ** ඇතැම් අවස්ථාවල සුවය ලැබෙන්නේ ක්‍රමයෙනි. ක්ෂණිකව රෝග ලක්ෂණ සියල්ල නැති නොවීමට ඉඩ තිබේ. රෝග ලක්ෂණ සමහර විට වැඩි විය හැකිය. ඔබට උණ තිබිය හැකිය. එහෙත් මෙය සුවවීමේ ක්‍රියාවලියේ ආසාදනය හා සටන් කෙරෙන කායික ක්‍රියාවලිය විය හැකිය. ඔබගේ ස්වභාවික හැඟීම් සමග නොව ආත්මික හැඟීම් සමග ගමන් කරන්න. ඔබගේ රෝග ලක්ෂණ නැවත ඇතිවුවහොත්, ස්වේච්ඡාවෙන් ඒ තොරතුරු තැන් තැන්වල නොපවසන්න. අනෙක් අයට ඒ පිළිබඳ බොරු නොකියන්න. ඔබෙන් ප්‍රශ්න කළහොත් මෙසේ පිළිතුරු දෙන්න "ඔව් මට ....... රෝග ලක්ෂණ තිබේ. එහෙත් උන්වහන්සේගේ කසපහරවලින් මා සුවය ලබන්නේය". රෝග ලක්ෂණ ඔබව දේව වචනයෙන්ද, උන්වහන්සේගේ වැඩ සිටීමෙන්ද, පොරොන්දුවලින් හා බලයෙන්ද ඉවත් කිරීමට තැත් කරනු ඇත. ඔබගේ ශරීරයට පහරදීමට සාතන්ට ඇති හැකියාව මහිමවත් කෙරෙන ඍණාත්මක වචන නොපවසන්න. ඔබ වඩාත්ම දිරි ගැන්වෙන්නේ රෝග ලක්ෂණ නොමැති කමින්ද නැතහොත් ඔබ සුවකරන්නේ දෙවියන්වහන්සේ බව සඳහන් උන්වහන්සේගේ වචනයෙන්ද? ඔබගේ අවධානය ඇත්තේ කොතැනකටද?

- **අන් අය දෙස බැලීමට ඔබ යොමු කිරීම.** සුවය ලැබී ඇති බව සිතුවද නැවතත් රෝගී වුවන් සාතන් ඔබට පෙන්වනු ඇත. ගැළවීම ලැබූ බව පැවසුවද දැන් නැවතත් පාපයේ ජීවත්වන අය දෙස බලමින්, ගැළවීමේ සත්‍යතාව ප්‍රතික්ෂේප කිරීමට එය ඔබ නිදර්ශනයක් ලෙස ගන්නෙහිද?

**- බිය.** ඔබ නැවත රෝගී වනු ඇතැයි යන බිය සාතන් ඔබ තුළ ඇති කරයි.

**- ඔබ වටා සිටින අශුභවාදී අය.** ඔබගේ සිතෙහි අවිශ්වාසය රෝපණය කරන අවිශ්වාසය පිරුණු අය.

### සාතන්ගේ ප්‍රහාරයන්ට විරුද්ධව සිටින්න :

සුවය පිළිබඳ දේව වචනය අධ්‍යයනය කරමින් ඇදහිල්ලේ වාතාවරණයක සිටින්න. ඔබ සුව කිරීම ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. ඔබට සුවය දුන් තැනැන්වහන්සේ සමග සම්බන්ධතාව පවත්වන්න. දෙවියන්වහන්සේට මහිමය දෙමින් ඔබගේ සුවය ගැන සාක්ෂි දරන්න. සාතන් පරාජය කිරීමේ එක් මාර්ගයක් වන්නේ ඔබගේ සාක්ෂියේ වචනයය. සුවකිරීම පිළිබඳ සුවිශේෂී පද උපුටා දක්වමින් "රේමා" දේව වචනය මගින් සාතන්ගේ ප්‍රහාරයන්ට විරුද්ධව සිටින්න. ඔබේ ඇදහිල්ලේ ස්ථිරව සිටින්න. සැක කරන තැනැත්තන්ට දෙවියන්වහන්සේගෙන් කිසිවක් නොලැබේ (යාකොබ් 1:6-8). ඔබට සුවය ලැබීම ගැන ඉතා ඕනෑකමින් ඇදහිල්ල තුළ සටන් කරන්න (පොර බදන්න) (රෝම 10:9).

ඇදහිල්ලේ ධනාත්මක වාතාවරණයකින්, සුවකිරීම ගැන ඔබ සමග අඛණ්ඩව සිට දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන හා සතුරාගේ ප්‍රහාරයන්ට විරුද්ධව සිටීමට ඔබට උපකාර කරන අයගෙන්, ඔබවම වට කරගන්න. සභා සහභාගිත්වයක කොටසක් වන්න.

ඔබ සාතන්ගේ ප්‍රහාරයන්ට විරුද්ධව සිටීම දක්වන්නේ පහත සඳහන් දේ ඇතුළත් ඔබගේ ආත්මික ආධිපත්‍යය ඔබ භාවිත කරන විට වේ.

- දේව වචනය
- යේසුස්වහන්සේගේ රුධිරය
- ඔබගේම සාක්ෂියේ වචනය
- බැඳීමේ හා නිදහස් කිරීමේ ආධිපත්‍යය
- යාච්ඤාව හා ප්‍රශංසා කිරීම
- එපීස 6:10-18 හි සඳහන් යුද්ධායුධ
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආධිපත්‍යය හා බලය

(ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය අත්දැක නොමැති නම් ඔබ එය සෙවිය යුතුය. ඔබගේ සුවය පවත්වාගෙන යෑමට උපකාරීවන බලය ශුද්ධාත්මයාණන්වහන්සේ සපයන සේක.)

## ඔබගේ ජීවිත ශෛලිය වෙනස් කරන්න :

පාපි පුරුදුවල නැවත යෑම යනු නැවත රෝගි වීමය (යොහන් 8:11). දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ වචනයට කීකරුව හැසිරෙන්න. ඕනෑකමින් පව් කිරීමෙන් සිදුවන්නේ සුවය නැතිකර ගැනීමය (යොහ. 5:14). සෞඛ්‍ය සම්පන්න නොවන පුරුදුවල නැවත නියැලීමෙන් නැවත රෝගි විය හැකිය. සෞඛ්‍ය සම්පන්න නොවන පුරුදු සැබවින්ම පාපය වේ. මන්ද ඔබ දෙවියන්වහන්සේගේ මාලිගාව අපවිත්‍ර කරන බැවිනි.

## සෞඛ්‍යය හා සුවය සඳහා බයිබලීය උපදෙස් අනුගමනය කරන්න :

මෙම අත් පොතේ විසිවන පරිච්ඡේදයේ එම උපදෙස් සපයා ඇත.

### වෛද්‍ය පිරික්සුම් නැවත කරන්න :

ඔබ වෛද්‍ය රැකවරණය තුළ සිටියෙහි නම් නිසැකවම සුවය ලැබී ඇත්දැයි පරීක්ෂා කර බැලීමට නැවත වෛද්‍යවරයා වෙත යන්න. පැරණි ගිවිසුම් ව්‍යවස්ථාව යටතේ වෛද්‍යවරු පූජකයෝ මෙන් වූහ. ඔව්හු රෝගය විනිශ්චයකර සුවය ලැබීම ප්‍රකාශ කළහ. යේසුස්වහන්සේ තමා සුව කළ ලාදුරු රෝගියාට මෙසේ කී සේක.

> **. . . ඔබ ගොස් පූජකයාට පෙනී, ඔබේ පවිත්‍රවීම සඳහා ඔවුන්ට සාක්ෂියක් වන පිණිස මෝසෙස් අණ කළ දේවල් ඔප්පු කරන්න (ලූක් 5:14).** (නව අනුවාදය)

## ඔවුන් සුවය නොලැබුවහොත් කළ යුත්තේ කුමක්ද?

සුවය නොලැබීම නිසා අධෛර්යයට පත්වීමට හෝ වරදකරුවෙක්ය යන හැඟීම ඇතිවීමට හෝ ඉඩ නොතබන්න. සුවය නොලැබීමට හේතුවක් නිර්මාණය කිරීමේ පරීක්ෂාවට වැටීම වළක්වන්න (දෙවියන්වහන්සේ සුවිශේෂි එළිදරව්වක් කළහොත් මිස). ඔවුන් පිටව යෑමට පෙර, දෘශ්‍ය ප්‍රතිඵලයක් නොලැබූ නිසා සුවය නොලැබුණේ යයි නොසිතන ලෙසට අවවාද කරන්න. සුවවීම ආරම්භ වන්නේ ආත්මයෙනි. ප්‍රමාදව සුවය ලැබීම සිදුවන අවස්ථා ඇත. ආබ්‍රහම්ගේ හා සාරාගේ වඳභාවය එයට උදාහරණයකි. පොරොන්දුව දී තිබුණේ බොහෝ කලකට පෙර වේ.

නියමිත කාලයක්ද ඇත. ක්‍රියා 5 සඳහන් දේවමාලිගාවේ දොරටුව අසල සිටි කොර මිනිසා ගැන සිතන්න. යේසුස්වහන්සේ මෙම දොරටුව තුළින් බොහෝ අවස්ථාවල ගමන් ගත් සේක. එහෙත් වසර ගණනාවක් එතැන සිටි මේ මිනිසාව උන්වහන්සේ සුවපත් නොකළ සේක. පසුව ඔහුව ජේදුරු තුමා හා යොහන් තුමා සුව කරන ලදී (ක්‍රියා 5:15-16). යෝබ් හා ලාසරස් මිදීම ලැබීම සඳහාද නියමිත කාලයක් තිබිණ.

රෝගියා සමග පසු කටයුතු කිරීම සඳහා යම් කෙනෙකුට පැවරීම ඔබට අවශ්‍ය විය හැකිය.

1. සුවය ලබාදීම සඳහා අඛණ්ඩව යාච්ඤා කරන්න. අධෛර්ය නොවී දිගටම කරන යාච්ඤාවන් ගැන යේසුස්වහන්සේ ඉගැන්වූ සේක. උන්වහන්සේ එය පිළිබඳව අධෛර්ය කළේ නැත. ඔබ උදෙසා යාච්ඤා කිරීමට සභාවේ නායකයන්ට කියන්න.

2. ඔබගේ ඇදහිල්ල අඛණ්ඩව ගොඩනගාගන්න. ඔබට මෙය කළ හැක්කේ සුවකිරීම පිළිබඳ “රේමා” දේව වචනය අධ්‍යයනය කිරීමෙනි.

3. නිරන්තරයෙන්ම ඔබගේ පාප පාපොච්චාරණය කරන්න. දෛනික පදනම යටතේ ඔබගේ පාප පාපොච්චාරණය කරන්න. එවිට ඔබගේ කායික තත්වය උග්‍ර නොවනු ඇත. දේව වචනය අනුකූලව හැසිරෙමින් ජිවත් වන්න.

4. ඔබගේ ආත්මික බලය භාවිත කරන්න. සෑම ඇදහිලිවන්තයෙකුටම මිදීමේ හා සුවකිරීමේ මූලික සේවයක් තිබේ. ඒවා මෙසේ වේ.
   - දේව වචනය
   - යේසුස්වහන්සේගේ රුධිරය
   - ඔබගේම සාක්ෂිය
   - බැඳීමේ හා නිදහස් කිරීමේ ආධිපත්‍යය
   - යාච්ඤාව හා ප්‍රශංසා කිරීම
   - එපිස 6:10-18 හි සඳහන් යුද්ධායුධ
   - ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආධිපත්‍යය හා බලය

5. හැකි අවස්ථාවලදී ඔබගේ ජිවිත ශෛලිය වෙනස් කරන්න. පාපි හා දූෂිත පුරුදු අත්හරින්න. සුවය සාමාන්‍යයෙන් ලැබෙන්නේ ඔබ ඔබගේ ජිවිතය දේව වචනය හා සුසංගත වන සේ වෙනස් කළ විටය.

6. ජිවිතය හා සෞඛ්‍යය උදෙසා ශුද්ධ ලියවිල්ලේ උපදෙස් පිළිපදින්න. මේවා මෙම අත්පොතේ විසිවන පරිච්ජේදයේ සඳහන් කර ඇත.

7. ඇදහිල්ලේ වාතාවරණයක් නිර්මාණය කරන්න: ඇදහිලිවතුන්ගේ සහභාගිත්වයක කොටස්කරුවන් වීමෙන් ඔබ වටා ඇදහිල්ලේ වාතාවරණයක් ඇති කරගන්න.

8. දෙවියන්වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසයක් සඳහා කැපවෙන්න. පූර්ණ විශ්වාසය යන්නෙන් අදහස් වන්නේ, ජිවනයේදිත් මරණයේදිත් රෝගිව හෝ නිරෝගිව සිටියදිත්, ඔබ උන්වහන්සේගේ හස්තයෙහි බව දන්නෙහිය. යොහ. 10:29; යෝබ් 13:15, 19:26.

9. දුක්විඳින විට ශුභවාදිව ක්‍රියා කරන්න. සම්පූර්ණ සුවය ලැබෙන තෙක් ඔබ බලා සිටින විට, අන් අයට ධනාත්මක බලපෑමක් ඇතිවන පරිදි ඔබගේ දුක්විඳීම්වලට ප්‍රතිචාර දක්වන්න. එය මෙසේ කළ හැකිය.

   - තුති පිදීමෙන් 1 තෙස. 5:16-18

   - දුර්වලකමේදී උන්වහන්සේගේ බලය පරිපූර්ණ කිරීමට උන්වහන්සේට ඉඩ දීමෙන් 2 කොරි. 12:9-10

   - ඔබ බලා සිටින විට ඉවසීම ප්‍රදර්ශනය කිරීමෙන් : මනුෂ්‍යයෝ වෛද්‍ය පරීක්ෂණවල ප්‍රතිඵල ලැබෙන තෙක් වෛද්‍යවරයාගේ කාමරයේ නැවතී සිටිති. බෙහෙත් ක්‍රියාකාරී වන තෙක් අපි බලා සිටී. දෙවියන්වහන්සේ ගැන බලා සිටීමට අපට නොහැක්කේ මන්ද? ඉවසීම ඇති අයට පොරොන්දුව උරුම වේ. හෙබ්‍රෙ. 6:12, 12:2-3, යාකො. 1:2-4, 5:10-11, ගීතා. 27:14, 37:34, යෙසා. 40:31, රෝම 5:3-5.

   - සියලුම දුක්විඳීම්හි පරමාර්ථයක් ඇති බව පිළිගැනීම: මෙය වාර්තාකර ඇති දුක්විඳි අය පිළිබඳ බයිබලීය වාර්තාවන් අධ්‍යයනය කරන්න.

10. දෙවියන්වහන්සේගේ පොරොන්දු අත්පත් කරගන්න. දෙවියන්වහන්සේ ඔබ අත්හැර ගියා සේ ඔබට දැනුණ ද මෙම පොරොන්දු අත් පත් කරගැනීමට හා යාච්ඤා කිරීමට නොකඩවා කටයුතු කරන්න. මෙම යාච්ඤාවන් කරන්න. ගීතා. 5:1-3, 6:2-9, 13:1-6, 22:19, 27:7, 31:21-22, 42:9-11, 54:1-2, 55:1-2, 70:1, 71:9-21, 86:6-7, 94:19, 102:1-7, 2 කොරි. 4:17-18.

11. දෙන්න එවිට ඔබට ලැබේ : දේව රාජ්‍යයේ ප්‍රධාන මූලධර්මයක් බයිබලය උගන්වයි. එනම් අප දුන් විට අපට ලැබෙන බවය. ඔබ ඇදහිලිවන්තයෙක් නම් දෙවියන්වහන්සේගේ සුවකිරීමේ බලය අන් අයට දෙන්න පටන්ගන්න. ඔබ දෙන විට ඔබට ලැබෙනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. සුවයේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. සුවය ලැබූ අය වෙනුවෙන් කෙරෙන පසු සේවය සාකච්ඡා කරන්න.

3. තවමත් සුවය නොලැබූ අය වෙනුවෙන් කෙරෙන පසු සේවය සාකච්ඡා කරන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. ඔබ වෙනුවෙන් හෝ ඔබ යම් කෙනෙකු ගැන හෝ යාච්ඤා කරතත් තවමත් සුවය විද්‍යමාන වී නොමැතිද? පහත දැක්වෙන එක් එක් පියවර වෙනුවෙන් ඔබේ සැලසුම් ලියන්න.

සුවය ලැබීමට නොකඩවා උත්සාහ කිරීම

___

ඔබගේ ඇදහිල්ල නොකඩවා ගොඩනැගීම

___

ඔබගේ පාප නොකඩවා පාපොච්චාරණය කිරීම

___

ඔබගේ ආත්මික බලය භාවිත කිරීම

___

ඔබගේ ජීවිත ශෛලිය වෙනස් කිරීම

___

සුවය සඳහා ආත්මික මගපෙන්වීම් අනුගමනය කිරීම

___

ඇදහිල්ලේ වාතාවරණයක් නිර්මාණය කිරීම

___

සම්පූර්ණයෙන් දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට කැපවීම

___

දුක්විඳීම ගැන ශුභවාදීව ක්‍රියා කිරීම

___

දෙවියන්වහන්සේගේ පොරොන්දු අත්පත් කර සිටීම

___

දෙන්න, එවිට ඔබටත් ලැබේ.

---

2. ඔබට තවමත් සුවය ලැබී නොමැති නම් යොහන් 11 අධ්‍යයනය කරන්න. ලාසරස් මළවුන්ගෙන් නැගුටුවීමෙන් එළිදරව් වන්නේ සුවය පරක්කු වීමෙන් දෙවියන්වහන්සේගේ බලය මහත්සේ වැඩිකර පෙන්වීමට අවස්ථාවක් ලැබෙන බවය.

3. ඔබට සුවය ලැබී තිබේද? නැතහොත් සුවය ලැබූ කෙනෙකු වෙනුවෙන් ඔබ යාච්ඤා කර තිබේද? එම සුවය පිළිබඳ පසු සේවය සඳහා පහත දැක්වෙන සෑම පියවරක් වෙනුවෙන්ම ඔබේ සැලසුම් ලියන්න.

සාතන්ගේ ප්‍රහාරයන් හඳුනාගැනීම

---

සාතන්ගේ ප්‍රහාරයන්ට විරුද්ධව සිටිම.

---

## දහසය වන පරිච්ඡේදය

# අවසාන සුවය

### අරමුණු

මෙම පරිච්ජේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවයේ පොරොන්දුව මතකයෙන් ලිවීමට
- අසාධ්‍ය රෝගීන්ට සේවය කිරීම සඳහා සුවිශේෂී උපදේශ සැපයීමට හැකිවනු ඇත.

### සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **එහෙයින් අපි ක්ලාන්ත නොවෙමුව. අපේ පිටත මනුෂ්‍යයා ක්ෂයවෙන නමුත්, අපේ ඇතුල් මනුෂ්‍යයා දවසින් දවස අලුත්කරනු ලබන්නේය. මොහොතකට පවතින අපේ සැහැල්ලුවූ දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලා සිටින්නාවූ අපට, ඉතාමත්ම වැඩි වශයෙන් සදාකාල තේජස් භාරයක් සාදාදෙන්නේය. මක්නිසාද, පෙනෙන දේ කාලිකය. නොපෙනෙන දේ සදාකාලිකය. (2 කොරින්ති 4:16-18)**

### හැඳින්වීම

සෑම පුද්ගලයෙකුටම මියයෑම සඳහා නියමිත වේලාවක් ඇති බව බයිබලයේ සඳහන් වෙයි.

> **තවද, එක් වරක් මරණයත් ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයාට නියමව තිබෙන්නාක් මෙන්. (හෙබ්‍රෙව් 9:27)**

ඔබට අසාධ්‍ය රෝගයක් ඇත්නම් හා/හෝ අසාධ්‍ය රෝගියෙකුට සේවය කිරීම සඳහා හෝ පහත දැක්වෙන සැකිල්ල අධ්‍යයනය කරන්න.

### අසාධ්‍ය රෝගීන්ට සේවය කිරීම

I. මරණයෙන් කෙළවරවන රෝග තිබේ. යොහන් 11:4 හි යේසුස්වහන්සේ පැවසුවේ ලාසරස්ගේ රෝගය මරණයෙන් කෙළවර නොවන්නක් බවය. මින් අදහස වන්නේ මරණයෙන් කෙළවර වන රෝග ද ඇති බවය.

II. ස්වභාවික මරණ දෙයාකාරය :

A. අකාල මරණ : ආත්මය ගැළවෙන පිණිස මාංසය විනාශ වීම (1 කොරි. 5:4-5)

B. නියමිත මරණ : ජීවිතයේ ස්වභාවික ක්‍රියාවලිය නිසා (හෙබ්‍රෙ. 9:27, දේශනාකාරයා 3:2, 2 රාජා. 13:14, යෙසා. 38, 2 රාජා. 20)

III. සුව කිරීමේ ඉලක්කය අමරණීයත්වය නොවේ.

A. යේසුස්වහන්සේ විසින් මරණින් නැගිටුවූවෝ වුවද අවසානයේ මියයති.

B. මෝසෙස් මෙන් ඇතැම් අය අධිස්වභාවික ලෙස මහලුවියේ බලපෑම්වලින් ඉවත් කර ඇත. අනෙක් අය යෝෂුවා මෙන් ස්වභාවික ලෙස මහලු වියට පත්වෙති.

C. සුවයේ ගිවිසුමේ කොටසක් ලෙස බයිබලය මෙලොව අමරණීයත්වයක් පොරොන්දු නොවේ. සුවකිරීම ගැන විශ්වාස කරන හා දිව්‍යමය සුවය ලබා දුන් කිතුනුවන් රෝගාබාධවලින් මියයන විට කලබල නොවන්න. මෙය එලිෂාට සිදුවිය. එහෙත් වසර

ගණනාවකට පසු මනුෂ්‍යයෙකු මළවුන් නැගුටුවිය හැකි බලයක් ඔහුගේ ඇටකටුවලට තිබිණි. මින් සනාථ වන්නේ ඔහු මිය ගියේ ඇදහිල්ලේ හිඟකම නිසා නොවන බවය.

IV. දෙවියන්වහන්සේට ප්‍රඥාව ද විමසිල්ලේ ආත්මයක්ද දීමට පුළුවන. මියයෑම පිණිස මෙය නියමිත වේලාවද නැද්ද යන්න දැනගැනීම සඳහා ප්‍රඥාව දීමට දෙවියන්වහන්සේට පුළුවන.

A. මරණය සඳහා එම පුද්ගලයාගේ නියමිත වේලාව බව දෙවියන්වහන්සේ එළිදරව් කළහොත් ඔවුන්ට, යේසුස්වහන්සේ සමග කුරුසියේ සිටි සොරාට කළාක් මෙන්, සූදානම්වීමට උපකාර කරන්න.

1. යේසුස්වහන්සේ ඔවුන්ගේ ගැළවුම්කාරයාණන් බව ඔවුන් දන්නා බවට සහතික වන්න.
2. ඔව්හු ඇදහිලිවන්තයෝ නම්, පාපොච්චාරණය නොකළ පාප නොමැති බවට සහතික වන්න.
3. ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු ක්‍රමවත් කිරීමට දිරිගන්වන්න.
4. ඔවුන් හා අනෙක් අය අතර ගැටලු ඇත්නම්, සාමදාන කරගැනීමට දිරිගන්වන්න.
5. මරණය සියලු දෙනාටම පැමිණෙන බව අවබෝධ කරගැනීමට ඔවුන්ට උපකාර කරන්න. ඇදහිලිවන්තයෙකුට මරණය සදාතන ජීවිතයේ පරාමිතිය තුළ එක් සිදුවීමක් පමණි. ඒ පිළිබඳ අපගේ ආකල්පය වෙනස් කළ යුතුව ඇත. අප මරණය සෙවිය යුතු නැත. එහෙත් අපට පැමිණීමට ඇති ජීවිතයට වඩා වර්තමාන ජීවිතයට කැමැත්තක් දක්වන්නාවූ වර්තමාන ජීවිතය ගැන අනවශ්‍ය අවධාරණයක් නොකළ යුතුය. ශරීරයෙන් ඈත්වීම යනු සමිඳුණන්වහන්සේ සමග විසීම වේ (2 කොරි. 5:8). මරණය සතුරෙකු වන අතර විනාශ කෙරෙන අන්තිම සතුරා එයයි (1 කොරි. 15:26). යේසුස්වහන්සේගේ උත්ථාන වීම, මරණය තවමත් නැති කර නොමැති වුවද එය පරාජය කර ඇති බව පෙන්වන "පළමු ඵලය" වේ. එය සතුරා බියගන්වන්නක් වන අතර සතුරා නිරායුධ කිරීමකි (1 කොරි. 15:55). එය ඇදහිලිවන්තයාගේ මරණයේ වේලාව වුවද එහි බිය, ශෝකය හා සන්තාපය අන්තර්ගත විය යුතු නැත. දෙවියන්වහන්සේ ජීවත්වීමේ කරුණාව දෙන්නා සේම මියයෑමේ කරුණාව ද දෙන සේක.

6. දෙවියන්වහන්සේ සර්වබලධාරී බව අවබෝධකර ගැනීමට ඔවුන්ට උපකාර කරන්න. ඔවුන්ට තව දිගු කලක් ජීවත්වීමට ඉඩදීම සඳහා උන්වහන්සේ තවදුරටත් මැදිහත් විය හැකිය.

7. උත්ථානවීමේ හා සදාකාලය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරන්න. මෙම යොමු භාවිත කරන්න. යෝබ් 19:25-27, යොහ. 11:5-6, රෝම 8:10-11, 17-18, 22-23, 10:11, 1 කොරි. 15:42-44, 54-58, 2 කොරි. 4:16-18, 5:1, 1 තෙස. 4:13-18.

B. මෙය මරණයේ නියමිත කාලය බවට දෙවියන්වහන්සේගෙන් දැනුම නොලදහොත්

1. දෙවියන්වහන්සේගේ කැමැත්ත පරිදි සුවය සඳහා නොකඩවා යාච්ඤා කරන්න. මෙසේ යාච්ඤා කිරීම ඔබගේ කැමැත්ත ඉල්ලා බල කිරීමක් නොවේ. එහෙත් දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව ඔවුන් ගැනීම හෝ නැගිටුවීම හෝ කිරීමට දෙවියන්වහන්සේට ඉඩදීමකි.

2. ආත්මයාණන් උදෙසා යාච්ඤා කරන්න. මන්ද ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත දන්නා අතර ඇතැම්විට මැදිහත්වීම් කළ හැකිය (රෝම 8:26).

3. දෙවියන්වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසය තැබීමට කැපවන ලෙස රෝගී තැනැත්තාව දිරිගන්වන්න. එවිට ජීවත්වුවද මිය ගියද තමා දෙවියන්වහන්සේගේ හස්තයෙහි බව ඔව්හු දනිති. යෝබ් 13:15, 19:16, යොහ. 10:29.

4. මරණයට සූදානම්වීමත් කායික සුවයත් සඳහා සේවයේ අවධානය යොමු කරන්න.

V. අවසාන සුවය මරණය වේ. ඇදහිලිවන්තයාට මරණය, අවසාන සුවය වේ. තවදුරටත් වේදනාවක් හෝ රෝගයක් හෝ නොමැති අතර ඔබ දෙවියන්වහන්සේගේ අබිමුවට සම්පූර්ණව ඇතුළු වෙයි. රෝග හා පාප එක හා සමානය. අප යේසුස්වහන්සේ අපගේ ගැළවුම්කරු හා සුවකරන තැනැන්වහන්සේ ලෙස පිළිගත් විට අපි පාපයේ (රෝගී බවේ) දඬුවමෙන් මිදීම ලබන්නෙමු. ඇදහිලිවතුන් ලෙස එහි බලයෙන් නොකඩවා මිදීම ලැබීමට අපට හැකිය. එහෙත් එහි පැවැත්මෙන් අප ගැළවීම ලබන්නේ අනාගතයේදී අප ස්වාමින්වහන්සේ වෙතට ගිය විට පමණි.

සාතන් නපුර සඳහා භාවිත කිරීමට බලාපොරොත්තු වන දේ යහපතට හැරවීමේ ක්‍රමයක් දෙවියන්වහන්සේ සතුව ඇත. පාපය සඳහා දඬුවම මරණය වූ අතර ක්‍රිස්තුස්වහන්සේ මරණයෙන් ජීවනයට පැමිණියේය. මරණය ජයග්‍රහණය මගින් ගිලගනු ලබන්නේ එබැවිනි. මරණයෙන්, දෙවියන්වහන්සේ අන්තිම සුවය දෙන සේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මිය ගිය අය නැවත නැගිටින නිසා මරණය ජයග්‍රහණය මගින් ගිලගනු ලැබේ.

**මෙන්න, නුඹලාට රහසක් කියමි. අපි සියල්ලෝම නොසැතපෙන්නෙමුව. නුමුත් අන්තිම හොරණෑව පිඹින කල මොහොතකින්, ඇසිපිය හෙළන ක්ෂණයකින්, අපි සියල්ලෝම වෙනස්කරනු ලබන්නෙමුව. මක්නිසාද හොරණෑව පිඹිනු ලබන්නේය. එකළ මළාහු නොදිරන ස්වභාවයෙන් යුක්තව නැගිටුවනු ලබන්නෝය. අපිද වෙනස් කරනු ලබන්නෙමුව. මක්නිසාද දිරන සුලුවූ මේක නොදරන බවට පැමිණෙන්ට ඕනෑය. මරණියවූ මේක අමරණ භාවයට පැමිණෙන්ට ඕනෑය. දිරන සුලුවූ මේක නොදරන භාවයටත් මරණිය වූ මේක අමරණ භාවයටත් පැමිණි කල්හි. මරණය ජයෙන් ගිලිනා ලද්දේයයි ලියා තිබෙන වචනය සම්පූර්ණ වේ. එම්බා මරණය, තාගේ ජය කොයිද? එම්බා මරණය, තාගේ කටුව කොයිද?**
**(1 කොරි. 15:51-55)**

ඇදහිලිවන්තයෙකු මිය ගිය විට ප්‍රිතිවන්න. මන්ද යම් අගනා දෙයක් සිදුවී ඇත.

**ස්වාමින්ගේ ශුද්ධවන්තයන්ගේ මරණය උන්වහන්සේ ඉදිරියෙහි අනර්ඝය.**
**(ගීතාවලිය 116:15)**

ඇදහිලිවන්තයෙකුට මරණය පැමිණෙන්නේ මෙම පාපි ලෝකයෙන් නිදහස්වීමක් ලෙසය.

**කූඩාරමක් වූ අපේ භූමික ගෙය කඩාවැටුණත් දෙවියන්වහන්සේගෙන්වූ ගොඩනැගිල්ලක් වන අතින් නොසෑදුවාවූ සදාකාලිකවූ ගෘහයක් ස්වර්ගවල අපට ඇති බව දනිමුව. මක්නිසාද මේකේදී අපි කෙඳිරිගාමින් අපගේ ස්වර්ගීය වාසස්ථානය පැළඳගන්ට ආශාවමුව.**

**එසේය, මේ කූඩාරමේ සිටින්නාවූ අපි බර උසුලමින් කෙඳිරිගාමුව. මක්නිසාද පැළඳීම අහක දමන්ට නොව, මරණියවූ ඒක ජීවනයෙන් ගිලිනු ලබන පිණිස, අපි පළඳිනු ලබන්ට කැමැත්තෙමුව. (2 කොරින්ති 5:1-2, 4)**

මරණයේදී ඇදහිලිවන්තයා දෙවියන්වහන්සේගේ අබිමුවට ඇතුළු වී ඇත.

**එසේය, අපි ධෛර්යවත්ව, ශරීරයෙන් ඈත්ව ස්වාමින්වහන්සේ සමග සිටින්ට වඩා කැමතිවෙමුව. (2 කොරින්ති 5:8)**

ආතර් බ්‍රිස්බේන් නැමැත්තෙක්, ඇදහිලිවන්තයෙකුගේ අවමගුල පෙන්නුම් කළේ ශෝකයට පත් කලුපාට ඇඳුමින් සැරසුණු දළඹුවන් සමූහයක්, කෝෂයක් රැගෙන එය අවසානයේ තැන්පත් කරන තැනට ගෙනයන්නාක් මෙනි. උන්ගේ ඉහළින් අලංකාර සමනළයෙක් තටුගසමින් සිටියේය.

## ස්වයං පරීක්ෂණය

1. සුවයේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. අසාධ්‍ය රෝගියෙකුට සේවය කිරීම සඳහා මෙම පාඩමෙන් දී ඇති උපදෙස් සාකච්චා කරන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. මෙම පාඩමේ සුවයේ පොරොන්දුව අධ්‍යයනය කරන්න.

**එහෙයින් අපි ක්ලාන්ත නොවෙමුව. අපේ පිටත මනුෂ්‍යයා ක්ෂයවෙන නමුත්, අපේ ඇතුල් මනුෂ්‍යයා දවසින් දවස අලුත්කරනු ලබන්නේය. මොහොතකට පවතින අපේ සැහැල්ලුවූ දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලා සිටින්නාවූ අපට, ඉතාමත්ම වැඩි වශයෙන් සදාකාල තේජස් භාරයක් සාදාදෙන්නේය. මක්නිසාද පෙනෙන දේ කාලිකය. නොපෙනෙන දේ සදාකාලිකය. (2 කොරින්ති 4:16-18)**

ඔබ අසාධ්‍ය රෝගියෙකුට සේවය කළෙහි නම් හෝ කරන්නෙහි නම් හෝ පහත දැක්වෙන ප්‍රශ්න අසන්න.

මෙම තත්වය ඔබ ආත්මිකව අධෛර්යට පත්කරන්නෙහිද?

_______________________________________________

බාහිරව ඔබ දිරාපත්වුවත් අභ්‍යන්තරිකව ඔබ දිනෙන් දින අලුත් වන්නෙහිද?

_______________________________________________

අභ්‍යන්තරව ඔබ අලුත් වන්නේ කෙසේද?

_______________________________________________

ඔබ ඔබගේ අවධානය යොමු කර ඇත්තේ ඔබගේ තාවකාලික තත්වය කෙරෙහිද නැතහොත් සදාතන අගයයන් කෙරෙහිද?

_______________________________________________

තාවකාලික දෙයින් සදාතනය වෙත ඔබ ඔබගේ අවධානය වෙනස් කරන්නේ කෙසේද?

_______________________________________________

2. ඔබ අසාධ්‍ය රෝගියෙකුට සේවය කරන්නෙහි නම් හා මෙය මරණය සඳහා ඔහුගේ නියමිත වේලාව බව දෙවියන්වහන්සේ ඔබට එළිදරව් කර ඇත්නම්, මෙම පියවර අනුගමනය කරන්න. ඔබ, යේසුස්වහන්සේ ඔබගේ ගැළවුම්කාරයාණන් ලෙස දන්නෙහිද?

_______________________________________________

ඔබ ඇදහිලිවන්තයෙක් නම් පාපොච්චාරණය නොකළ පාප ඔබට තිබේද? පාපොච්චාරණය නොකළ පාප ගැන යාච්ඥා කරන්න. කෝපය, තිත්තකම ආදිය විය හැකිය. පාපොච්චාරණය කර කමාව ලබාගන්න (1 යොහ. 1:8-9).

_______________________________________________

ඔබ ඔබගේ ව්‍යාපාරික කටයුතු ක්‍රමවත් කර තිබේද? එසේ නොමැති නම් අවශ්‍ය දේ පිළිබඳව ලයිස්තුවක් සකස් කරන්න.

_______________________________________________

ඔබට හරි සම්බන්ධතාවයක් ඇති කරගත යුතු අය හෝ කමාව ඉල්ලිය යුතු අය හෝ ගැටලු විසඳ ගත යුතු අය හෝ සිටින්ද? එසේ සිටින්නම් ඔවුන්ගේ නම් ලියන්න.

---

3. මෙය මරණය සඳහා නියමිත වේලාව බවට ඔබට දෙවියන්වහන්සේ එළිදරව් නොකළේ නම් පහත පියවර අනුගමනය කරන්න.

- දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව සුවය සඳහා නොකඩවා යාච්ඤා කරන්න.
- ආත්මයාණන් තුළින් යාච්ඤා කරන්න, මන්ද දෙවියන්වහන්සේගේ කැමැත්ත උන්වහන්සේ දන්නා බැවින් සුදුසු ලෙස මැදිහත්කම් කිරීමට ඉඩ ඇති බැවිනි.
- දෙවියන්වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසය තැබීමට කැපවන ලෙස රෝගියා දිරිගන්වන්න. එවිට ජීවත් වුවද, මිය ගියද, තමා දෙවියන්වහන්සේගේ හස්තයෙහි බව ඔහු දන්නවා ඇත.

4. ඔබ හෝ ඔබ සේවය කරන යම් කෙනෙකු හෝ අසාධ්‍ය රෝගයකින් පෙළෙන්නේ නම් මෙම පොරොන්දුව ඉල්ලන්න.

**යේසුස්වහන්සේ ඔවුන් දෙස බලමින්: ඒක මනුෂ්‍යයන්ට නම් නුපුළුවන. නුමුත් දෙවියන්වහන්සේට සියල්ලම පුළුවනැයි කීසේක.**

5. දෙවියන්වහන්සේ සර්වබලධාරීය. එබැවින් යම් කෙනෙකුට අසාධ්‍ය රෝගයක් තිබුණද, ඕනෑම වේලාවක උන්වහන්සේට මැදිහත්වී ඔහුගේ ජීවිතය දීර්ඝ කළ හැකිය. යෙසායා 37:1 සිට 38:22 දක්වා ඇති හෙසකියා රජුගේ කතාව කියවන්න. හෙසකියා රජු මියයමින් සිටින විට ඔහු දෙවියන්වහන්සේ වෙතට හැරුණු බැවින් ඔහුට සුවය ලැබිණි. මෙම කතාවේ පහත දැක්වෙන දේ බලන්න.

| | |
|---|---|
| - ඔහු සිටින තත්වය | යෙසා. 38:1 |
| - යාච්ඤාව | යෙසා. 38:2-3 |
| - පොරොන්දුව | යෙසා. 38:4-6 |
| - ප්‍රශංසාව | යෙසා. 38:9-20 |

# හයවන කොටස

# මිදීම සඳහා උපාය මාර්ග

මෙම කොටසින් ඔබ මිදීම ලබාදීමේ හා ලබාගැනීමේ උපාය මාර්ග ඉගෙන ගන්නවා ඇත. ඔබ

- සාතන් බැඳ ඇති අය
- මිදීම ලබා දීම
- මිදීම පිළිබඳ පසු සේවය

ගැන ඉගෙන ගන්නෙහිය.

# දහ හත්වන පරිච්ඡේදය

# සාතන් මගින් බැඳ ඇති අය

## අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවයේ පොරොන්දුව කටපාඩමෙන් ලිවීමට
- මනුෂ්‍යයාගේ ශරීරයට, ප්‍රාණයට හා ආත්මයට පහර දෙන ප්‍රධාන වර්ගයේ යක්ෂයන් තුන් දෙනෙකු හඳුනාගැනීමට
- යක්ෂාත්ම බලයන් සමග කටයුතු කිරීමේදී ආත්ම විමසීමේ දීමනාවේ වටිනාකම පැහැදිලි කිරීමට
- යක්ෂාත්මයෙන් පීඩිතවීම යන්නෙන් අදහස්වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට
- යක්ෂාත්මයෙන් පීඩිතවූවෙකුගේ ලක්ෂණ හඳුනාගැනීමට
- යක්ෂාත්ම මගින් වසඟකර ගැනීම ( Obsessed) යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට
- යක්ෂාත්ම මගින් වසඟකර (Obsessed) ගත් කෙනෙකුගේ ලක්ෂණ හඳුනාගැනීමට
- යක්ෂාත්මයෙන් ආවේශ වීම යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට
- යක්ෂාත්මයෙන් ආවේශ වුවෙකුගේ ලක්ෂණ හඳුනාගැනීමට
- යක්ෂාත්මයනට පාලනය ලැබෙන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට.

## සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **එකල උන්වහන්සේ දොළොස්දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී (ලූක් 9:1)**

### හැඳින්වීම

යක්ෂාත්මවල ක්‍රියාවන් මිථ්‍යාදෘෂ්ටි සංස්කෘතිවල කුතුහලය දනවන පුරුද්දක් ලෙස සලකා බොහෝ අය දිගු කලක් තුළ එය නොසලකා හැර ඇත. එය ජීවිත, නිවෙස්, සභාවන් හා ජාතීන් ආක්‍රමණය කරන ගැටලුවක් ලෙස සැලකිල්ලක් දක්වා නැත. එහෙත් යක්ෂාාත්ම ලෙස හැඳින්වෙන අඳුරු බලවේගවලින් වධ හිංසා විඳින, කරදරයට පත්වූ හා ආවේශ වූ අය බොහොමයක් ඔබ වටා සිටිය හැකිය. යක්ෂාත්ම බලයන්ගෙන් පීඩිතවූවන්ට යේසුස්වහන්සේ සේවය කර ඇති අතර (ක්‍රියා 10:38) රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය පැතිරවීමේදී ඒ ආකාරයෙන්ම කටයුතු කිරීම සඳහා උන්වහන්සේ සිය අනුගාමිකයන්ට, බලය පැවරූ සේක (මතෙ. 10:1).

යක්ෂාත්ම බලවේගවලින් දුක්විඳින අයට සේවය කිරීම පිණිස උපදෙස් මෙම පරිච්ඡේදයෙන් ඔබට සැපයේ. ශුභාරංචිය පිළිගන්නා පිණිස මේ අය පළමුව ඔවුන්ගේ බැඳුම්වලින් නිදහස් විය යුතුය. (*"ආත්මික උපායමාර්ග: ආත්මික සටන පිළිබඳ අත්පොත"* නමැති හාවස්ට්ටයිම් ආයතනයේ හි පාඨමාලාව, සාතන් හා ඔහුගේ යක්ෂාත්ම බලවේගවල ක්‍රියාකාරකම් විස්තර කරයි. ඔබ ආත්මික සටන පිළිබඳව එතරම් නොදන්නෙහි නම් මිදීමේ සේවය ආරම්භ කිරීමට පෙර ඔබ මෙම පාඨමාලාව ලබාගත යුතුය).

### යේසුස්වහ්සේ සහ යක්ෂාත්ම

යේසුස්වහන්සේගේ ඉගැන්වීම්වලින් හා සේවයෙන් පෙන්වා දී ඇත්තේ යක්ෂාත්ම සැබෑ නපුරු බලවේගයක් බවය. යේසුස්වහන්සේ යක්ෂාත්ම ගැන ඉගැන්වූ දේ හා උන්වහන්සේ ඔවුන් සමග ක්‍රියාකළ අන්දම, සාතන්ගේ උපායමාර්ගයන් පිළිබඳ වැදගත් තොරතුරු සපයයි.

යක්ෂාත්ම සේනාවන්හි පාලකයා සාතන් බව යේසුස්වහන්සේ පිළිගත් සේක. යක්ෂාත්මවල සත්‍යතාව හා බලය පිළිබඳව උන්වහන්සේ ඉගැන්වූ සේක. යක්ෂාත්ම පලවා හැරීම දේව රාජ්‍යයේ පැමිණීම පිළිබඳ ලකුණක් බව උන්වහන්සේ පැවසූ සේක. මතෙ. 12:22-30, මාක් 3:22-27 හා ලූක් 11:14-23, යේසුස්වහන්සේ යක්ෂාත්ම පිළිබඳව ඉගැන්වූ දෙයෙහි සාරාංශයක් සඳහා කියවන්න.

යේසුස්වහන්සේගේ සේවයේ විශාල කොටසක් යක්ෂාත්ම හා කටයුතු කිරීම සඳහා වෙන් විය. යක්ෂාත්ම බලවේග සමග කටයුතු කිරීමේ ශුද්ධ ලියවිලි පදනම සපයන්නේ යේසුස්වහන්සේගේ ආදර්ශයෙන් හා උන්වහන්සේගේ නාමයේ අධිකාරිත්වයෙනි. යක්ෂාත්ම ගැටලු සහිතව පැමිණි සියලු දෙනාටම උන්වහන්සේ සේවය කළ සේක. පේතෘස් යේසුස්වහන්සේ ගැන මෙසේ කීවේය.

> **දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ ආලේප කළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරන ලද සියල්ලන් සුවකරමින් ද හැසිරුණු බවත්ය. (ක්‍රියා 10:38)**

## යක්ෂාත්ම ක්‍රියාකරන අන්දම

සාතන් යක්ෂාත්ම යොදාගන්නේ දෙවියන්වහන්සේටත්, උන්වහන්සේගේ සැලසුම් හා පරමාර්ථවලටත් හා උන්වහන්සේගේ සෙනඟටත් විරුද්ධ වීම සඳහාය. ශුභාරංචියේ සත්‍යතාවය නොඇදහිලිවන්තයන්ගෙන් සැඟවීම සඳහා යක්ෂාත්ම ඔවුන්ට විරුද්ධ වේ. එසේම යක්ෂාත්ම දානියෙල් 10:12-13 හි සඳහන් කර ඇති පර්සියා රාජ්‍යයේ අධිපතියා මෙන් සුවිශේෂී ප්‍රදේශ තුළින් සාතන්ගේ අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියා කරයි. යක්ෂාත්ම ලෝකය තුළ ඔවුන්ගේ අරමුණු ඉටුකරගැනීම සඳහා පුරුෂයන් හා ස්ත්‍රීන් තුළින් ක්‍රියා කරයි.

සාතන්ගේ ප්‍රධාන අරමුණ වන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්තට විරුද්ධ වීමය. “සාතන්” යන වචනයේ තේරුම “සතුරා” වේ. සාතන් මූලිකවම දෙවියන්වහන්සේගේ සතුරාය (යෝබ් 1:6, මතෙ. 13:39). දෙවනුව ඔහු මිනිසාගේ සතුරා වේ (සෙකරි. 3:1, 1 පේතෘස් 5:8).

යක්ෂාත්මවලට විවිධ ස්වභාවයන් ඇත. එක් යක්ෂාත්මයක් තමාව 1 රාජාවලිය 22:23 හි හඳුන්වා ඇත්තේ “මුසා දොඩන ආත්මයක්” ලෙසය. මාක් 9:25 හි “ගොළු බිහිරි” ආත්මයක් ගැන සඳහන් වේ. විවිධාකාර යක්ෂාත්ම දුර්වලතාවේ ආත්ම, දූෂිත ආත්ම හා අශුද්ධාත්ම ලෙස ක්‍රියා කරයි. සාතන් මෙම ආත්ම මිනිසාගේ ශරීරය, ප්‍රාණය හා ආත්මයට එරෙහිව භාවිත කරයි.

### දුර්වලතාවේ ආත්ම:

මේවා ඇදහිලිවන්තයන්ගේ මෙන්ම නොඇදහිලිවන්තයන්ගේ ශරීරයට පීඩා ගෙන දෙන ආත්ම වේ. ලූක් 13:10-17 කියවන්න. මෙම ස්ත්‍රිය දුර්වලතා ආත්මයකින් පීඩා විඳි තැනැත්තියකි. ඇය සබත් දින දේව මෙහෙයකට පැමිණි අතර යේසුස්වහන්සේ ඇය හැඳින්වූයේ “ආබ්‍රහම්ගේ දියණිය” ලෙසය. මෙම කරුණු දෙකෙන්ම පෙන්නුම් කෙරෙන්නේ ඇය දෙවියන්වහන්සේ අනුගමනය කළ කෙනෙකු බවය. එසේ වුවද සාතන් විසින් ඇගේ ශරීරය දහ අට වයස් තිස්සේ බැඳ තබා තිබිණි.

ශරීරයට යක්ෂාත්ම මගින් පීඩා ගෙන දුන් තවත් නිදසුන් සඳහා මතෙ. 12:22, 17:15-18, ක්‍රියා 10:38, 2 කොරි. 12:7 බලන්න.

### දූෂිත ආත්ම

මෙම ආත්ම, ධර්මනියාමක පිළිබඳ බොරු විශ්වාස කිරීමට මිනිසා දූෂණය කරමින් ඔහුගේ ආත්මයට පීඩා ගෙන දෙන අතර සදාතනික දඬුවමට ඔහු වැරදිකරු කරයි. මේවා ව්‍යාජ ධර්මයන්, ලබ්ධි භේද, ව්‍යාජ ක්‍රිස්තුවරුන් හා ව්‍යාජ ගුරුවරුන්ගේ ආත්මයන් වේ.

> **එහෙත් පසු කාලවලදී සමහරු මුළාකරවන ආත්මයන්ද යක්ෂයන්ගේ ගුරුකම්ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන්වහන්සේ පැහැදිලි ලෙස කියන සේක. (1 තිමෝති 4:1)**

මෙම දූෂිත ආත්ම රැවටිලිකාරය. ඒවා සැබවින්ම හාස්කම් කරන අතර ඇතැම් අය ඒවා දෙවියන්වහන්සේගෙන් බවට විශ්වාස කරති.

> **මක්නිසාද, ඔව්හු සර්වපරාක්‍රමවූ දෙවියන්වහන්සේගේ මහත් දවසේ යුද්ධයට මුළු ලෝකයේ රජුන් රැස්කරන පිණිස, ඔවුන් ළඟට යන්නාවූ හාස්කම් කරන්නාවූ යක්ෂයින්ගේ ආත්මයෝය. (එළිදරව් 16:14)**

> **ඔහුගේ ඊම සාතන්ගේ ක්‍රියාකිරීමේ හැටියට බොරුවූ සියලු ආකාර ආශ්චර්ය වලින්ද ලකුණුවලින්ද පුදුමවලින්ද, විනාශවෙන්නවුන්ට අධර්මිෂ්ඨකමේ සියලු රැවටිලිවලින්ද යුක්ත වේ. මක්නිසාද ගැළවෙන පිණිස ඔව්හු සැබෑකමට ප්‍රේමවීම පිළිනොගත්තෝය. (2 තෙසලෝනික 2:9-10)**

ක්‍රියා පොතේ සඳහන් "පේන කියන ආත්ම" ද දූෂිත ආත්මවලට අයත්ය.

> **අප යාච්ඤාකරන තැනට යද්දී, ශාස්ත්‍ර කියන ආත්මයක් ඇත්තාවූ, පේනකීමෙන් ස්වකීය ස්වාමිවරුන්ට බොහෝ ලාබ ඉපදෙව්වාවූ එක්තරා තරුණියක් අපට සම්බවූවාය. (ක්‍රියා 16:16)**

මෙවැනි පේන කියන ආත්ම හෙවත් "ආත්ම බන්ධනයන්" සාස්තර කියන්නන්, මායාකාරීන් හා අත බලා හෝ අංජනම් එළිවලින් හෝ තේ කොළ බැලීමෙන් හෝ ශාස්ත්‍ර කියන්නන් තුළ ක්‍රියා කරයි. ශුද්ධ ලියවිල්ලෙන් බැහැර ක්‍රම මගින් මෙම පේන කියන ආත්ම, ස්වභාවිකව නොදන්නා දේ හෝ අනාගතය පිළිබඳව හෝ අනාවැකි කියති. මෙම ආත්මවලට එරෙහිව අනතුරු ඇඟවීම් ලෙවි. 19:31, 20:6, ද්වි. 5:9, 18:10, ලෙවි. 20:27 හා 1 සාමුවෙල් 28:3 හි සඳහන් වේ.

දූෂිත ආත්ම හෘදය සාක්ෂිය දවාලයි. දූෂණය කරයි. පොලඹවයි. පරීක්ෂාවට ලක් කරයි. සිත් ඇද ගනී. උනන්දු කරවයි, සිත පිනවයි, පුබුදුවයි, ආකර්ෂණය කරයි හා රවටයි. "උසස් ස්ථානයන්හි ආත්මික දුෂ්ටකම" ඇති කිරීමට දූෂිත ආත්ම ක්‍රියාකාරී වෙයි. ඒවා සෑම ලබ්ධියකම හා දේව ධාර්මික වැරදි පවතින තැන්වල ක්‍රියාත්මක වේ. සාතන් නමස්කාරයට දැඩි ආශාවක් දක්වන බව හා ඔහුට හැකි ආකාරයකට ඔහු එය ගන්නා බව මතක තබාගන්න. පිළිමවලට මෙන්ම සාතන්ටම වුවද නමස්කාර කිරීමට දූෂිත ආත්ම ස්ත්‍රී-පුරුෂයන් පොලඹවයි.

## අශුද්ධාත්ම

මෙම යක්ෂාත්ම බලවේග මිනිසාගේ ප්‍රාණයට පීඩා කරයි. මේවා දුරාචාර, අපිරිසිදු සිතිවිලි, පරීක්ෂාවන් හා මිනිසුන් බැඳ තැබීමට සාතන් යොදාගන්නා අනෙකුත් උපායමාර්ග ආදිය සඳහා වගකිව යුතුය. අශුද්ධාත්ම සහිත පුද්ගලයන්ව සාතන් පාලනය කරන විට, ඔහුට නිවාස, සභාවන් හා මුළු ජාතියම තුළ වුවද ක්‍රියා කිරීමට හැකියාවක් ඇත. මක්නිසාද, මෙම කණ්ඩායම් පුද්ගලයන්ගෙන් සමන්විත වන බැවිනි. සමාජයේ ව්‍යුහයන්හි විවිධ මට්ටම් තුළ සාතන් ක්‍රියා කරන්නේ මෙසේ වේ. අශුද්ධාත්මවලට නිදසුන් සඳහා මතෙ. 10:1, 12:43, හා මාක් 1:23-26 බලන්න.

## පීඩාවන්, වසඟයට ගැනීම්, ආවේශවීම්

මිනිසුන්ට පීඩා කිරීමේ හැකියාවක් නපුරු ආත්මවලට ඇත. පීඩාකිරීම යනු විරුද්ධව සිටීම, පිටස්තරයෙන් බැඳීම් ගෙනඒම වේ. මෙම පීඩා කිරීම නපුරු ආත්ම විසින් විවිධාකාරයෙන් කරනු ලැබේ. ඒවා දොම්නසට හේතුවේ. ඍණාත්මක අවස්ථාවන් නිර්මාණය කරයි. එමෙන්ම සිය දිවි නසාගැනීම්, දුරාචාරයන්, අවිශ්වාසයන්, බිය ආදි සිතිවිලි මනසට ඇතුළු කරයි. මිනිසුන් පාපයට පොලඹවන සාතනික අවස්ථා හා වාතාවරණ යක්ෂාත්ම විසින් නිර්මාණය කරනු ලැබේ.

> **දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ ආලේප කළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරන ලද සියල්ලන් සුවකරමින් ද හැසිරුණු බවත්ය. (ක්‍රියා 10:38)**

මිනිසුන්ට ආවේශවීමට යක්ෂාත්මයන්ට පුළුවන. ආවේශවීම යනු නපුරු ආත්ම එකක් හෝ දෙකක් හෝ මනුෂ්‍යයෙකුගේ ශරීරයේ වාසය කරමින් ඔවුන්ට අවශ්‍ය ආකාරයට ඒ තැනැත්තාව සම්පූර්ණයෙන්ම පාලනය කිරීම වේ. ආවේශ වූ තැනැත්තා යක්ෂයන්ගේ සත්කාරකයාය. "ආවේශවීම" යන්නෙන්, තමාගේ පාපවලට තමා වගකිව යුතු නැතැයි අදහස් නොවේ. ඔහුගේ වගකීම, එම තත්වයට ඔහු පත්වීමට තුඩු දුන් කරුණු මත රඳා පවතී.

ආවේශවීම ඕනෑකමින් සිදුවිය හැකිය. යම් තැනැත්තෙක් උපවිෂ්ටයන් පැවැත්වීමට, සාප කිරීමට, මායාකාරියක් වීමට හෝ වෙනත් අධිස්වභාවික බලයක් ලබාගැනීමට අවශ්‍ය බැවින් ආත්මික බලයන්ගෙන් පාලනය වීමට කැමති විය හැකිය. ආවේශවීම අකමැත්තෙන් වුවද සිදු වීමට ඉඩ තිබේ. ආවේශවීම සඳහා යමෙක් ඉල්ලීමක් නොකරනවා විය හැකිය. එහෙත් පාපී සිතිවිලි, ක්‍රියා හෝ ගුප්ත දේ සමග සම්බන්ධවීම නිසා ආවේශ විය හැකිය.

මව්පියන් තුළ ක්‍රියා කරන යක්ෂාත්ම නිසා හා මව්පියන්ගේ පාප නිසා ඊළඟ පරම්පරාවටද බලපෑම් ඇතිවිය හැකිය (නික්ම. 20:5, 34:7, ද්වි. 5:9 බලන්න). මාක් 7:24-30 හා 9:17-21 හි සඳහන් වන ළමයින්ට යක්ෂාත්ම ආවේශ වීම හෝ පීඩා ගෙන ඒම හෝ සිදුවීමට හේතුව මින් පැහැදිලි වේ.

යක්ෂාත්ම ගැන වසඟවීම යනුවෙන් දෙයක් ද ඇත. මෙම තත්වය ඇති වන්නේ යම් කෙනෙක් යක්ෂාත්ම ගැන විශාල උනන්දුවක් දැක්වීම නිසා හෝ යක්ෂාත්ම සමග කටයුතු කරන නිසා හෝ විය හැකිය. මෙය ගුප්ත දෙයක් හෝ යක්ෂාත්ම වෙත ඇති වන අසාමාන්‍ය උනන්දුවක් වන අතර උනන්දු පාලනය කරන සාතන් ඒකාධිපතියෙකු ලෙස කටයුතු කරයි. දුෂ්ට බලවේග සමග වසඟවීම නිසා ඒවා ආවේශවීමට වුවද පුළුවන.

## ඇදහිලිවතුන්ට බලපෑම් කිරීමට යක්ෂාත්මයන්ට හැකිවේද?

සැබෑ ඇදහිලිවන්තයෙකුට යක්ෂාත්ම ආවේශ විය නොහැකිය. මන්ද ශුද්ධාත්මයාණන්වහන්සේට නපුරු ආත්ම සමග එකම මාලිගාවේ විසිය නොහැකි බැවිනි.

> **නොහොත් නුඹලාගේ ශරීරය දෙවියන්වහන්සේගෙන් ලැබූ, නුඹලා තුළ ඇත්තාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාලිගාව බව නොදනිවුද? නුඹලා නුඹලාටම අයිති නැත. මක්නිසාද, නුඹලා මිලේටගනු ලැබුවහුය. එබැවින් නුඹලාගේ ශරීරයෙන් දෙවියන්වහන්සේට ගෞරව කරන්න. (1 කොරින්ති 6:19-20)**

ඔබ දෙවියන්වහන්සේට අයත් වූ විට හා ශුද්ධාත්මයෙන් පිරුණු විට ඒ අවස්ථාවේම ඔබ සාතන්ට අයත්වීමට හා ඔහුගේ ආත්මවලින් පූර්ණවීමට නොහැකිය. ශුද්ධාත්මයාණන්වහන්සේ සාතන් සමග එකම "මාලිගාවේ" වසන්නේ නැත.

එහෙත් යක්ෂාත්ම බලවේගවලින් ඇදහිලිවතුන්ට බලපෑමක් නැතැයි මින් අදහස් නොකෙරේ. අප පොර බදන්නේ මෙම බලවේගවලට විරුද්ධවය. පීඩාවන් තුළින් ඇදහිලිවතුන්ට බාහිරින් පහරදීමට සාතන් යක්ෂාත්ම බලවේග යොදාගනී. මේවායේ ගති ලක්ෂණ අපි මීට පෙර සාකච්ඡා කළෙමු. එහෙත් ඔහුට සැබෑ ඇදහිලිවන්තයෙකුට ආවේශ විය නොහැකිය. "ආවේශ වීමෙන්" පෙන්නුම් කෙරෙන්නේ අභ්‍යන්තරයේ වාසය කිරීමකි. "පීඩා කිරීම" හෝ බන්ධනයෙන් පෙන්නුම් කෙරෙන්නේ බාහිරින් සිදුවන පාලනයකි. තමාට පීඩා කිරීමට යක්ෂාත්ම බලවේගවලට ඉඩදුනහොත් ඇදහිලිවන්තයෙකු හැසිරෙන්නේ සාතන්ට අවශ්‍ය ආකාරයට විය හැකිය. එවැනි පීඩාවන් හෝ නපුරු බලවේග හෝ මගින් කෙරෙන බන්ධනයන් මගින් සිදුවන්නේ ඔවුන් දුෂ්ට පරමාර්ථ සඳහා යොදාගැනීමට සාතන්ට ඉඩදීමකි.

සියලු මනුෂ්‍ය වර්ගයාගේ පව් උදෙසා යේසුස්වහන්සේ දුක්විඳීම වැළැක්වීමට සාතන්, පේතෘස්තුමා යොදාගත් විට සිදුවූයේ මෙය වේ. යේසුස්වහන්සේ තමාට විඳින්නට සිදුවන දුක්විඳීම් ගැන පැවසූ විට පේතෘස් මෙසේ කිය.

> **ස්වාමිනි, එය දුරින්ම දුරු වේවා! එවැන්නක් ඔබට කවදාවත් සිදු නොවේවා! (මතෙව් 16:22)** (නව අනුවාදය)

එවිට, යේසුස්වහන්සේ පේතෘස්ට මෙසේ කී සේක.

> **සාතන් අහකට යව, නුඹ මට බාධාවකි. නුඹ සිතන්නේ මිනිසුන් සිතන විධියට මිස දෙවියන්වහන්සේ සිතන විධියට නොවේ (මතෙව් 16:23).** (නව අනුවාදය)

පේතෘස් තුමා සැබවින්ම සාතන් යයි යේසුස්වහන්සේ අදහස් කළේ නැත. ඒ අවස්ථාවේ පේතෘස්තුමා තමා තුළින් සාතන්ට ක්‍රියා කිරීමට ඉඩ දුන්නේය. ඔහු ආවේශව නොසිටියේය. එහෙත්

සාතනික ආත්මවලට බලපෑම් කිරීමට ඔහු ඉඩ දුන්නේය. තමාගේම ක්‍රියා මගින් සාතන්ට ක්‍රියා කිරීමට “ඉඩ දීමට” ඇදහිලිවතුන්ට පුළුවන (එපීස 4:27).

යම් තැනැත්තෙක් නැවත ඉපදුණු විට ඔහුගේ නම ජීවන පොත නමින් හැඳින්වෙන ස්වර්ගයේ, ඇති විශේෂ පොතක ලියනු ලැබේ. මෙම පොතේ නම ඇති අය පමණක් සදාතනය සඳහා ස්වර්ගයෙහි වැසියෝ වන්නාහුය.

> **යමෙකුගේ නම ජීවන පොතෙහි ලියා නැති බව සම්බවිද, ඔහු ගිනිවිලට හෙළනු ලැබුවේය. (එළිදරව් 20:15)**

ඔබගේ නම ජීවන පොතෙහි ලියවී තිබිය හැකි වුවද පසුව නැවතත් පාපී ජීවිතය වෙත හැරුණු බැවින් එය මකා දමන්නට ඇත.

> **ජයගන්නා නම් මෙසේ සුදු වස්ත්‍රයෙන් පළඳවනු ලැබේ. ඔහුගේ නම ජීවන-පොතෙන් කිසිසේත් මකා නොහැර, මාගේ පියාණන්වහන්සේද උන්වහන්සේගේ දූතයන්ද ඉදිරියෙහි ඔහුගේ නාමය පිළිගන්නෙමි. (එළිදරව් 3:5)**

ඇදහිලිවන්තයෙක් පාපය බවට දන්නා පාපොච්චාරණය නොකළ පාපයෙහි නිරතුරුවම ගැලී සිටී නම්, ඔහු කිතුනුවෙකු නොවන අවස්ථාවකට පත්වනු ඇත. අන්‍යයන්ට දේශනා කළ පසු තමා “ප්‍රතික්ෂේප කරනු නොලබන” පිණිස පාවුලුතුමා දැඩි සැලකිල්ලක් දැක්විය.

> **නුමුත් මාගේ ශරීරය දමනයකර වහල්කමට පුමුණුවමි. එසේ කරන්නේ අනුන්ට දේශනාකළාට පසු කොයිලෙසකින්වත් මාම එපාකරනු නොලබන පිණිසය. (1 කොරින්ති 9:27)**

තමා අන් අයට දේශනා කළද පාපයට, විශේෂයෙන්ම පාපොච්චාරණය නොකළ මාංසයේ පාපයට, තමාගේම ප්‍රාණය නැති කළ හැකි බව පාවුලුතුමාට අවබෝධ විය.

නිරතුරුවම පාපයේ ජීවත්වීමෙන් ඔබ පසුබට තත්වයකට පත්වන අතර ඔබ තවදුරටත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ අනුගාමිකයෙකු නොවනු ඇත. ඔබ පාපොච්චාරණය නොකළ පාපයේ දැන දැනම ඇලී සිටින්නෙහි නම්, ඔබ යේසුස් වහන්සේගේ අනුගාමිකයෙකු බවින් ඉවත්ව සාතන්ගේ රාජ්‍යයේ කොටස් කරුවෙකු වන්නේ කොයි මොහොතේදැයි කිසිවෙකුටත් කිව නොහැකිය. ඒ අවස්ථාව තීරණය කරන්නේ දෙවියන්වහන්සේය. එහෙත් එය සිදුවූ විට, ඔබ සතුරාගේ මහත් ප්‍රහාරවලට විවෘත වන අතර යක්ෂාවේශ වීමේ හැකියාවක් වුවද ඇත. ඔබ පව් කළහොත් ඒ සැණෙකින් එම පව් පාපොච්චාරණය කර අඳමිටුකමින් ආපසු හැරීම වැදගත් වන්නේ එබැවිනි.

> **අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. අපි පව්කළේ නැතැයි කියමු නම්, අපි උන්වහන්සේ බොරුකාරයෙක් කරමුව. උන්වහන්සේගේ වචනද අප තුළ නැත. (1 යොහන් 1:9-10)**

ශුද්ධ ලියවිල්ලේ බොහෝ තැන්වල යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ වචනය ලෙස හඳුන්වා ඇත. දේව වචනය ඔබ තුළ නොපවතී නම් යේසුස්වහන්සේ ඔබ තුළ පවතින්නේද නැත.

## යක්ෂාත්ම පාලනය ලබාගන්නා ආකාරය

විවිධ ක්‍රමවලින් යක්ෂාත්ම පාලනය ලබා ගනිති.

1. **පරම්පරා තුළින්** යම් තැනැත්තෙකුට යක්ෂාත්ම ආවේශවීම හෝ පීඩා කිරීම හෝ සිදුවන්නේ මව්පියන්ට ආවේශව සිටි නිසා හෝ පීඩා කළ නිසා හෝ වේ. ළමයින් කෙරෙහි යක්ෂාත්මයන්ගේ බලපෑම මින් පෙන්නුම් කෙරේ (නික්ම. 20:5, 34:7, ද්වි. 5:9).

2. **මනස තුළින් :** මනස සාතන්ගේ ප්‍රධාන සටන් බිමක් වේ. සාතන් ඔබගේ සිතිවිලි පාලනය කරයි නම්, අවසානයේ ඔහු ඔබගේ ක්‍රියාවන්ද පාලනය කරනු ඇත. මානසික පාලනය නොමැති වීම, කැමැත්ත පාලනය නොමැති වීමට මග පාදයි. එමගින් පාපී ක්‍රියාවනට මග පෑදේ. පාපී සිතිවිලි හා ක්‍රියාවල නොකඩවා යෙදීමෙන් පීඩාවන්ද ඉන්පසු ආවේශවීම්ද

අවසානයේ රෝම 1 හි විස්තර කර ඇති ආකාරයේ දුරාචාරී මනසක්ද ඇතිවීමට ඉඩ තිබේ. ඒ මනස සම්පූර්ණයෙන්ම නපුරු සිතිවිලි මගින් පාලනය කෙරේ.

මනස විකෘති කෙරෙන ඖෂධවලින් ද යක්ෂාත්මයන්ට මනසට ඇතුළුවීමට ඉඩකඩ සැලසේ. ඒවා මගින් යක්ෂාත්මයන්ට විරුද්ධවීමේ හැකියාව අඩු කෙරෙන අතර යක්ෂාත්මයන්ට පිවිසීමේ හැකියාව වැඩි කෙරේ. "බුද්ධි ශෝධන" හෝ "මනස පාලන" ඉගැන්වීම්ද ඇතුළුවීමේ අවස්ථා සපයයි.

3. **පාපී ක්‍රියා තුළින් :** පාපී සිතිවිලි ඉක්මනින්ම පාපී ක්‍රියා බවට පත්වේ. නිදසුනක් ලෙස කාමමිථ්‍යාචාරය පිළිබඳ සිතිවිලි සැබවින්ම කාමමිථ්‍යාචාරයේ යෙදීමෙන් සාක්ෂාත් වේ. පාපය යනු කැරැල්ලකි. කැරලිකාර සිතිවිලි හා ක්‍රියා දුරාචාර ක්‍රියාවලට මග පාදයි.

   ඇදහිලිවන්තයෙක් නිරන්තරයෙන්ම පාපී සිතිවිලි හා ක්‍රියාවන්හි යෙදුණු විට එමගින් යක්ෂයාට ක්‍රියාකිරීමට ඉඩ ලැබේ (එපීස 4:27). එමෙන්ම සතුරාට ක්‍රියා කිරීම සඳහා වඩාත් ආත්මික ඉඩ කඩ සැලසේ. භාණ්ඩ, ලියකියවිලි, උපචිෂ්ට ආදිය ඇතළුව ගුප්ත දේ සමග සම්බන්ධවීමේ පාපය මහත් භයානක වන අතර ඒවා යක්ෂාත්ම ආකර්ෂණය කරයි.

   පාපයේ ජීවත්වන නොඇදහිලිවන්තයෙකු යක්ෂාත්ම බලවේගයන්හි පීඩනයන්ට පමණක් නොව ආවේගවීම්වලටද විවෘතය. ආත්මික සටනෙහි මධ්‍යස්ථ භූමියක් නොමැත. ඔබ යහපත් පැත්තෙහිය. නැතහොත් දුෂ්ට පැත්තෙහිය. ඔබ දෙවියන්වහන්සේට හෝ සාතන්ට හෝ අයත් වේ. ඔබ සාතන්ට අයත් නම් හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ අලුත් ඉපදීම අත්දැක නොමැති නම්, එවිට ඔබ ඔහුගේ ප්‍රයෝජනය සඳහා වේ. ඔහු කැමති ආකාරයකට ඔබව ප්‍රයෝජනයට ගත හැකි අතර ඔබට පීඩා කිරීමට හෝ ආවේගවීමට හෝ ඔහුට හැකිය.

4. **ආශාව තුළින් :** ඇතැම් අය සාතන්ගෙන් යක්ෂාත්ම බලය ඉල්ලයි. මන්ද ඔවුන්ට අධිස්වභාවික ක්‍රියා කිරීමට හැකිවීම පිණිසය.

5. **හිස් නිවෙසක් තුළින් :** තමා වාසය කරන පුද්ගලයාගේ ශරීරය තමාගේම නිවෙස ලෙස යක්ෂාත්ම සලකති (මතෙ. 12:44). යක්ෂාත්ම බලවේගවලින් මිදුණු පුද්ගලයෙකු තම නිවෙස අලුත් ඉපදීමේ අත්දැකීම්වලින් හා ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් නොපිරෙවුවහොත් යක්ෂයා නැවත ඇතුලු වනු ඇත.

6. **අවසරය තුළින් :** විශේෂ පරමාර්ථයන් සාක්ෂාත් කරගැනීම සඳහා ඇතැම්විට දෙවියන්වහන්සේ යක්ෂාත්මවලට අවසර දෙන සේක. ජෝබ්ගේ සිද්ධියේදී මෙන් පරීක්ෂා කර බැලීමෙන්ද සාවුල් රජතුමාගේ නිදර්ශනයේ දී මෙන් පාපයට විනිශ්චයක් ලෙසද මෙය දැකගත හැකිය.

## යක්ෂාත්ම සමග කටයුතු කළ යුත්තේ කවුරුන්ද?

යක්ෂාත්ම සමග කටයුතු කිරීම දේවගැතිවරුන්ටම බාරදිය යුතු දෙයක් නොවේ. යක්ෂාත්ම ජය ගැනීමට සෑම ඇදහිලිවන්තයෙකුට හැකියාව ඇතැයි යේසුස්වහන්සේ පැවසූ සේක.

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්, මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය. අන් භාෂාවලින් කථාකරන්නෝය. (මාක් 16:17)**

යක්ෂාත්ම සමග කටයුතු කිරීමේ හැකියාව යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට දී තිබේ. උන්වහන්සේ පළමුවෙන්ම එවැනි බලයක් දුන්නේ ගෝලයන්ටය.

> **තවද උන්වහන්සේ තමන් ගෝලයන් දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, අශුද්ධාත්මයන් දුරු කරන්ට ඔවුන් කෙරෙහිද සියලු ආකාර ලෙඩ සහ සියලු ආකාර රෝග සුවකිරීමට ද ඔවුන්ට බලය දුන්සේක. (මතෙව් 10:1)**

> **එකල උන්වහන්සේ දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, ඔවුන් දෙදෙන දෙදෙනා බැගින් යවන්ට පටන්ගෙන, අශුද්ධාත්මයන් කෙරෙහි ඔවුන්ට බලයදී, (මාක් 6:7)**

උන්වහන්සේ එම බලයම සියලු ඇදහිලිවතුන්ට දුන් සේක.

**අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්, මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය. අන් භාෂාවලින් කථාකරන්නෝය. (මාක් 16:17)**

**රෝගීන් සුවකරන්න. මළවුන් නැගිටුවන්න. කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරන්න. යක්ෂයන් දුරු කරන්න. නුඹලා නොමිලයේ ලැබුවහුය. නොමිලයේ දෙන්න. (මතෙව් 10:8)**

මෙම වැදගත් සේවය එක් සෙනඟ කණ්ඩායමකට පමණක් පැවරූ බවට කිසිදු බයිබලීය පදනමක් නොමැත. පිලිප් නම්වූ ගිහියෙකුව සමාරියේදී යක්ෂාත්ම දුරු කිරීම සඳහා දෙවියන්වහන්සේ යොදාගත් සේක (ක්‍රියා 8). ස්කේවාගේ පුත්‍රයන් මෙන් සුදුසු සූදානමක් නොමැතිව යක්ෂාත්ම හමුවීමට ඇදහිලිවතුන් කලබලයෙන් දිවගිය යුතු බවක් මින් අදහස් නොකෙරේ (ක්‍රියා 19).

ඇදහිලිවතුන් යක්ෂාත්ම පිළිබඳව ඕනෑවට වඩා අවධානය යෙදිම වැදගත් නැක. “යක්ෂාත්ම පලවා හැරීමේ” ආත්මික දීමනාවක් නැත. එහෙත් ඔබ යක්ෂාත්මවලට බිය විය යුතු නැත. යක්ෂාත්මයන්ගේ බලපෑම්වලට ලක්වුවන් මුණගැසුණු විට ඔබට දෙවියන්වහන්සේගෙන් මිදීම ගෙන ඒමේ බලය තිබිය යුතුය.

## යක්ෂාත්ම සිටින බව සොයාගැනීම

යක්ෂාත්ම බලයන් පරාජය කිරීම සඳහා ඔවුන් සිටින බව හා ඔවුන්ගේ උපක්‍රම හඳුනාගැනීම වැදගත් වේ. මේ සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ විශේෂ ආත්මික දීමනාවක් දී ඇත. මෙම දීමනාව “ආත්ම විමසීම” ලෙස හැඳින්වේ (1 කොරි. 12:10).

විමසීම යනුවෙන් අදහස් වන්නේ “සොයා ගැනීමට, තක්සේරු කිරීමට හා වෙනස දැකගැනීමට” හැකිවීමය. ආත්ම විමසීමේ දීමනාව මගින් ඇදහිලිවන්තයෙකුට අන් අය තුළ ක්‍රියා කරන ආත්මයන් විමසීමට හැකිවේ. යක්ෂාත්ම සොයාගැනීමට, තක්සේරු කිරීමට හා හඳුනාගැනීමට එය ඔහුට ඉඩ සලසයි.

යක්ෂාත්ම සමග කටයුතු කරන විට ආත්ම විමසීමේ දීමනාව ඉතා වැදගත් වේ. නපුරු ආත්මයක් යමෙකු තුළ හෝ ඔහුට එරෙහිව හෝ ක්‍රියා කරන්නේද නැද්ද යන්න සැණෙකින් විමසීමට ඉන් ඔබට හැකිවේ. එය දූෂිත හෝ බොරු කීමේ ආත්ම මගින් රැවටීම වළකාලයි. මෙම දීමනාව ඇති අයෙකුට යක්ෂාත්ම බලවේගවල උපක්‍රම හා චේතනාවන් හඳුනාගත හැකිය.

නිදසුනක් ලෙස ඇතැම් ගොළු, බිහිරිකම් (බයිබලයට අනුව) ඇතිවන්නේ ආත්මයක් මගිනි. අනෙකුත් ගොළුවීම් හා බිහිරිවීම් අනතුරක් නිසා හෝ අසනීපයක් නිසා හෝ සිදුවිය හැකිය. මෙම තත්වයට හේතුව දැනගැනීමට විමසීම උපකාරී වේ.

සියලුම ඇදහිලිවතුන්ට මෙම විශේෂ දීමනා නොමැත. යම් ඇදහිලිවන්තයෙකුට මෙම දීමනාව නොමැති වුවද යක්ෂාත්ම ඇත්දැයි දැනගැනීමේ නිරීක්ෂණය කළ හැකි ලකුණු තිබේ. තම දියණියගෙන් අශුද්ධාත්මයක් පහ කරන ලෙස ඉල්ලමින් පැමිණි කානානි ස්ත්‍රිය “මගේ දුව බලවත් සේ යක්ෂාවේශව සිටින්නිය”යි පැවසුවාය (මතෙ. 15:22). ඇය මේ බව දැනගත්තේ කෙසේද? ඇය ඒ බව දැනගත්තේ රෝග ලක්ෂණ මගිනි. සොයාගැනීම යනු යක්ෂාත්මයන් යම් කෙනෙකුට කරන දෙය නිරීක්ෂණය කිරීම වේ.

යක්ෂාත්මවල ක්‍රියාකාරකම්වල ඇතැම් ලක්ෂණ පහත දැක්වේ.

**යක්ෂාත්මවලට ග්‍රහණය** වීම හඳුනාගත හැක්කේ පාලනය කළ නොහැකි හා අසාමාන්‍ය යක්ෂාත්ම, සාතන් හෝ ගුප්ත දේ සමග හැසිරීම මගිනි. එවැනි කෙනෙකු ගුප්ත පුරුදු සමග නිතරම කටයුතු කරයි. සියලුම දේ සාතන් හෝ යක්ෂාත්ම හෝ කළ බව පවසයි.

**යක්ෂාත්ම මගින් පීඩනය** පහත ලකුණුවලින් හඳුනාගත හැකිය.

1. ශාරීරික බන්ධනය : යේසුස්වහන්සේ සුව කළ අශුද්ධාත්මයක් නිසා දුර්වලකමින් පෙළුණු “ආබ්‍රහම්ගේ දියණිය” ශාරීරිකව බඳිනු ලැබ සිටි කෙනෙකි. ලූක් 13:10-17 බලන්න. නිදන්ගත රෝග යක්ෂාත්ම පීඩනයන් විය හැකිය. සියලුම රෝග යක්ෂාත්ම නිසා වැළඳුණු ඒවා නොවේ. ඇතැම් රෝග නියමාකාරයෙන් ආහාර නොගැනීම, අපිරිසිදු ජලය පානය කිරීම වැනි

ස්වභාවික නීති කඩ කිරීම නිසා ඇතිවේ. ඇතැම් රෝග දඬුවමකි. දෙවියන්වහන්සේට මහිමය නුදුන් එක් රජ කෙනෙක් ආන්ත්‍රික පණු රෝගයක් වැළඳී මිය ගියේය.

2. මානසික පීඩනය : මානසික හිරිහැර, ව්‍යාකූලත්වය, අවිශ්වාසය, මතක නැතිවීම වැනි මනසේ සිදුවන කැළඹීම් වේ. අවිවේකී භාවය, සවන් දීමට හෝ සාධාරණ වීමට හෝ නොහැකි වීම, අසාමාන්‍ය ලෙස කතා කිරීම හෝ කතා නොකර සිටීම ආදිය ප්‍රදර්ශනය කෙරෙනු ඇත. සියලුම මානසික ගැටලු සාතන් විසින් නිර්මාණය නොකරයි. ඇතැම් ආහාර ශරීරයට එකග නොවීම හෝ මනසේ රසායනික අසමතුලිතතාව හෝ මගින් අධෛර්යවීම, දොම්නස හා වියවුල් බව ඇතිවිය හැකිය. යක්ෂාත්ම බලවේග මගින් ඇති නොකෙරෙන මානසික ගැටලු හා රෝග සුවකිරීමට මෙන්ම යක්ෂාත්ම නිසා සිදුවන දේවලින් මිදීම ගෙන ඒමටද දෙවියන්වහන්සේට පුළුවන. සියලුම රෝග හෝ මානසික ගැටලු යක්ෂාත්ම මගින් සිදුවේයයි තීරණය නොකිරීමට වගබලා ගත යුතුය. ඇතැම් විට ආහාර හෝ ජීවිත ශෛලිය හෝ වෙනස් කිරීමෙන් ශාරීරික හේතූන් නිසා ඇතිවන රෝග සුව වේ.

3. හැඟීම් සම්බන්ධ ගැටලු : අමනාපය, වෛරය, කෝපය, බිය, ප්‍රතික්ෂේප කිරීම, ස්වයං තාපය, ඊර්ෂ්‍යාව, දොම්නස, කරදර, අනාරක්ෂිත බව, හීනමානය ආදිය ද ඇතුළු නිරන්තරයෙන් පවතින හැඟීම්වල කැළඹීම් මීට ඇතුළත්ය.

4. ආත්මික ගැටලු : පාපි පුරුදු ඇතුළු පාපය පරාජය කිරීමේ ප්‍රබල අසීරුතාවන්, ගැටලුවලට ආත්මික විසඳුම් ප්‍රතික්ෂේප කිරීම. වස්තුවලට ඇති බන්ධනය හා ලබ්ධි ලිපි ලේඛනවලට ඇති බැඳීම් ඇතුළු දේවධාර්මික වැරදි හෝ රැවටීම්.

5. බාහිර අවස්ථාවන් : පීඩනයන් ගෙන දෙන අසීරු අවස්ථා යක්ෂාත්මවලට ඇති කළ හැකිය. එවැනි අවස්ථාවනට සාමාන්‍යයෙන් ව්‍යාකූලත්වය සම්බන්ධ අතර දෙවියන්වහන්සේ ව්‍යාකූලත්වයේ නිර්මාතෘ නොවන නිසා එය යක්ෂාත්මයන්ගෙන් බව සැණෙකින් හඳුනා ගැනීමට පුළුවන (1 කොරි. 14:33, යාකොබ් 3:16).

**ආවේශවීම** පහත දැක්වෙන ලකුණුවලින් හඳුනාගත හැකිය.

1. අශුද්ධාත්මයන් වාසය කිරීම : මූලික සදාචාරාත්මක අපිරිසිදුතාවයෙන් හා අපවිත්‍රබවින් මෙය පෙන්නුම් කෙරේ. ඇතැම් විට නිර්වස්ත්‍රව සිටීම මීට ඇතුළත් විය හැකිය. නිදසුන් සඳහා මාක් 5:2 හා ලූක් 8:27 බලන්න.

2. අසාමාන්‍ය ශාරීරික ශක්තිය : සමාන්‍ය තත්වයට වඩා වැඩි ශක්තියක් පෙන්වීමට යම් කෙනෙකුට හැකිවේ. නිදසුන් සඳහා මාක් 5:3 හා ලූක් 8:29 බලන්න.

3. වියරුවීම සිහි මූර්ජාවීම: මෙම අවස්ථාවල කටින් පෙණ දැමීම සිදුවිය හැකිය. මාක් 9:14-29 හා ලූක් 8:26-39 බලන්න.

4. ආත්මික දෙයට විරුද්ධත්වය දැක්වීම : මාක් 6:7 හා 1:21-28 හි වාර්තාවලට අනුව යක්ෂාත්ම එකෙණෙහිම ජේසුස්වහන්සේ හැඳිනගත්හ. ඔවුන්ට කරදර නොකරන ලෙස උන්වහන්සේගෙන් ඔව්හු ඉල්ලා සිටියහ. යේසුස්වහන්සේගේ නමට, යාච්ඤාවට හා දේව වචනයට බිය වීම සහ ආත්මික දෙයට අපහාස කිරීම යන සියල්ල ආවේශ වීමේ ලකුණු වේ. ආත්මික දේ සඳහන් කළ විට බොහෝ සේ දේවාපහාස කිරීම, විකෘති වූ ශාරීරික ලක්ෂණ හෝ ක්ෂණික හැසිරීමේ වෙනස් ඇතිවිය හැකිය.

5. පෞරුෂත්වයේ හා හෝ හඬේ වෙනස්වීම්: සාමාන්‍යයෙන් ලජ්ජා සහගත කෙනෙක් කලහකාරී හෝ ප්‍රචණ්ඩකාරී හෝ විය හැකිය. ක්‍රියාවන්ට මෙන්ම පෙනීමට ද බලපෑම් තිබිය හැකිය. සාදාචාරාත්මක ගති ලක්ෂණ හා බුද්ධිය වෙනස් විය හැකිය. හඬද වෙනස්වීමට පුළුවන. මාක් 5:9 බලන්න.

6. ශාරීරික විපත්ති තිබීම : ආවේශ අවස්ථාවලදී එය මානසික හා ස්නායු පද්ධතියේ විපත්ති ලෙස බොහෝ විට පෙන්නුම් කෙරේ (මතෙ. 9:33, 12:22, මාක් 5:4-5 බලන්න). ශාරීරික ක්ෂයවීමක් මෙහිදී පෙනෙන්නට පුළුවන (මාක් 9:14-29 බලන්න).

7. තමාම ඇති කරගත් ශාරීරික තුවාල: ගින්නට පනින ළමයෙකු ගැන මතෙව් 17:14-21 හි සඳහන් වේ. ලූක් 8:26-39 හි තුවාල කරගැනීම සඳහා ගල්වලින් තමාවම කපා ගන්නා ආවේශ වූවෙකු ගැන සඳහන් වේ.

8. ප්‍රබල සන්තාපය : ආවේශ වූ මේ මිනිසාට ඇතිවූ ඇතුළාන්තයේ වධ හිංසා සනිසා මොරගසමින් දිව ගිය බව ලූක් 8:28 හි සඳහන් වේ.

9. සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට නොහැකි වීම. මේ මිනිසාට සමාජයේ ජීවත්වීමට නොහැකි වූ අතර ඔහු ජීවත්වූයේ සුසාන භූමියේ සොහොන් ගෙවල වේ. ලූක් 8:27 බලන්න.

10. ශුද්ධ ලියවිල්ලට අදාළ නොවන ක්‍රම මගින් අනාගතය පිළිබඳ අනාවැකි කීමට හැකිවීම හෝ නොදන්නා දේ සොයාගැනීමට හැකිවීම. ක්‍රියා 16:16 හි සඳහන් ස්ත්‍රියට පේනකීමේ ආත්මයක් ආවේශව තිබිණි.

පහත දැක්වෙන දේ යක්ෂාත්ම පීඩනය, ආවේශය හා සිත වසඟ කරගැනීම පෙන්වනු ඇත.

1. අශ්ශීල රචනයන්, කාමිමථ්‍යාචාරය, වේශ්‍යාකම, ස්වයං සම්භෝගය, සමලිංගිකත්වය හා අනෙකුත් ලිංගික පාප ආදි සිත වසඟවීමේ දුෂ්චරිත. ආහාර ගැනීමේ අක්‍රමවත් බව, සිය දිවි නසාගැනීම හා තුවාල කර ගැනීම හා මිනී මැරීම ආදිය කෙරෙහි ප්‍රබල ආශාව.

2. මත්ද්‍රව්‍ය හා මත්පැන් කෙරෙහි ඇබ්බැහි වීම.

3. එකම සැබෑ දෙවියන්වහන්සේ කෙරෙහි අවධානය යොමු නොකළ කැගැසීම හා වෙව්ලීම් හැසිරීම්, දර්ශන හා භාවනාවන්.

4. හැඟීම් කෙරෙහි බැඳීම් : බිය, සංකාව, අහංකාරය, තිත්තකම, අශුභවාදය, විවේචනය.

## ස්වයං පරීක්ෂණය

1. සුවයේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. මිනිසෙකුගේ ශරීරය, ප්‍රාණය හා ආත්මයට පහර දෙන යක්ෂාත්ම ප්‍රධාන ආකාර තුන කවරේද?

3. යක්ෂාත්ම සමග කටයුතු කරන විමසීමේ දීමනාවේ වටිනාකම කුමක්ද?

4. යක්ෂාත්මයන්ගෙන් පීඩාවිඳීම යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

5. යක්ෂාත්මයන්ගෙන් පීඩනයට භාජනයවූ තැනැත්තෙකුගේ ගති ලක්ෂණ සමහරක් මොනවාද?

6. යක්ෂාත්මයන්ට වසඟවීම යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

7. යක්ෂාත්මයන්ට වසඟවූවෙකුගේ ගතිලක්ෂණ සමහරක් මොනවාද?

8. ආවේශවීම යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

9. ආවේශ වූවෙකුගේ දැකිය හැකි ගති ලක්ෂණ සමහරක් මොනවාද?

10. යක්ෂාත්ම පාලනය ලබාගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

ඔබගේ තත්වය හෝ ඔබ සේවය කරන කෙනෙකුගේ තත්වය හෝ යාච්ඤාවෙන් යුක්තව විශ්ලේෂණය කරන්න.

1. දූෂණය කිරීමේ ආත්ම ක්‍රියා කරන බවට සාක්ෂි තිබේද? ඔබ එසේ සිතන්නේ මන්ද?

________________________________________

________________________________________

2. දුර්වලතා ආත්ම ක්‍රියා කරන බවට සාක්ෂි තිබේද? ඔබ එසේ සිතන්නේ මන්ද?

________________________________________

________________________________________

3. අශුද්ධාත්ම ක්‍රියා කරන බවට සාක්ෂි තිබේද? ඔබ එසේ සිතන්නේ මන්ද?

________________________________________

________________________________________

4. යක්ෂාත්මයන්ගේ පීඩාවන්ගේ ලක්ෂණ සමහරක් මෙසේ වේ.
   - ශාරීරික බන්ධන
   - මානසික පීඩා
   - හැඟීම්වල ගැටලු
   - ආත්මික ගැටලු
   - බාහිර අවස්ථාවන්

මේවායේ යක්ෂාත්මයන්ගෙන් පීඩනයන් ඇති බවක් පෙනේද? ඔබ එසේ සිතන්නේ මන්ද?

________________________________________

________________________________________

5. යක්ෂාත්මවලට වසඟවීම මෙසේ හඳුනාගැනීමට පුළුවන.

   - යක්ෂාත්මවලට, සාතන් හෝ ගුප්ත දේ සමග අසාමාන්‍ය ලෙස හා පාලනය නොකළ හැකි ලෙස සිත යොමු කිරීම.
   - ගුප්ත කටයුතුවල යෙදීම.
   - නිරන්තරයෙන් සෑම දෙයක්ම සාතන් හෝ යක්ෂාත්ම හෝ කරන බව කීම.
   - යක්ෂාත්ම හා සාතන් ගැන අධ්‍යයනයට සිත යොමු කිරීම.

යක්ෂාත්මවලට වසඟවීම් ඇති බව පෙනේද? ඔබ එසේ සිතන්නේ මන්ද?

________________________________________

6. ආවේශවීමේ ලක්ෂණ පහත දැක්වේ.

- අශුද්ධාත්මයක් වාසය කිරීම
- අසාමාන්‍ය ශාරීරික ශක්තිය
- වියරුවීම සිහි මූර්ජාවීම
- ආත්මික දෙයට විරෝධය දැක්වීම
- පෞරුෂත්වයේ හා, හෝ හඬෙහි වෙනස් වීම්
- ශරීරයේ රෝග
- ශරීරයට තුවාල සිදු කරගැනීම.
- ප්‍රබල ලෙස සිත සන්තාව වීම
- සාමාන්‍ය ජීවිතයක් ගතකිරීමට නොහැකි වීම
- ශුද්ධ ලියවිලි නොවන ක්‍රම මගින් අනාගතය ගැන අනාවැකි කීමේ හෝ නොදන්නා දේ සොයාගැනීමේ හැකියාව.

ආවේශවීම ඇතිබව පෙනේද? ඔබ එසේ සිතන්නේ මන්ද?

---

7. මතක තබාගන්න : පහත දැක්වෙන දෙයින්ද යක්ෂාත්ම පීඩාවන්, වසඟවීම් හා ආවේශයන් පෙන්විය හැකිය.

- අශ්ගිල රචනයන්, කාමමිථ්‍යාචාරය, වේශ්‍යාකම, ස්වයංසම්භෝගය, සමලිංගිකත්වය ආදී සිත වසඟවීමේ දුෂ්චරිත, අක්‍රමවත් ලෙස ආහාර ගැනීම, සිය දිවි නසාගැනීම, තමාටම තුවාළ කර ගැනීම, මිනී මැරීම ආදිය කෙරෙහි ප්‍රබල ආශාව.

- මත්ද්‍රව්‍ය හා මත්පැන් කෙරෙහි ඇබ්බැහි වීම

- එකම සැබෑ දෙවියන්වහන්සේ කෙරෙහි අවධානය යොමු නොකළ කැගැසීම හා වෙව්ලීම් හැසිරීම්, දර්ශන හා භාවනාවන්.

- හැඟීම් කෙරෙහි බැඳීම් : බිය, සංකාව, අහංකාරය, තිත්කම, අශුභවාදය, විවේචනය.

# දහ අටවන පරිච්ඡේදය

# මිදීම ලබා ගැනීම සඳහා සේවය

## අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවයේ පොරොන්දුව මතකයෙන් ලිවීමට
- යක්ෂාත්ම බලවේග සමග කටයුතු කළ යුත්තේ කවුරුන්දැයි හඳුනාගැනීමට
- මිදීම ලබාදීම සඳහා මූලික සූදානම සාකච්ඡා කිරීමට
- මිදීම ලබාදීමේ මාර්ග නිර්දේශ සාරාංශ කිරීමට

## සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **තවද උන්වහන්සේ තමන් ගෝලයන් දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, අශුද්ධාත්මයන් දුරුකරන්ට ඔවුන් කෙරෙහිද සියලු ආකාර ලෙඩ සහ සියලු ආකාර රෝග සුවකිරීමටද ඔවුන්ට බලය දුන් සේක. (මතෙව් 10:1)**

## හැඳින්වීම

යක්ෂාත්ම හේතුවෙන් සාතන් විසින් බඳිනු ලැබ රෝගිවූ සෙනඟ සිය ගණනක් වෙති. එමෙන්ම සතුරා නිසා පීඩනයෙන්, වසඟවීමෙන් හා අවේශවීමෙන් දුක්විඳින අයද සිය ගණනක් සිටිති. මෙම පාඩමෙන් ඔබ ඉගෙන ගන්නේ යක්ෂාත්ම බලවේග සමග කටයුතු කරන ආකාරය, මිදීමේ සේවය සඳහා සූදානම් වන ආකාරය හා මිදීම ලබාදෙන ආකාරය පිළිබඳව වේ.

## යක්ෂාත්ම බලවේග සමග කටයුතු කළ යුත්තේ කවුරුන්ද?

යක්ෂාත්ම බලවේග සමග කටයුතු කිරීම වෘත්තිමය දේවගැතිවරුන්ට පමණක් පැවරිය යුතු නැත. යක්ෂාත්ම බලවේග පරාජය කිරීමට සියලුම ඇදහිලිවතුන්ට හැකියාව ඇතැයි යේසුස්වහන්සේ පැවසූ සේක.

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්, ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය. . . . (මාක් 16:17)**

යක්ෂාත්ම බලවේග සමග කටයුතු කිරීමේ හැකියාව යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට දුන් සේක. පළමුව උන්වහන්සේ එම බලය දෙන ලද්දේ ගෝලයන්ට වේ.

> **තවද උන්වහන්සේ තමන් ගෝලයන් දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, අශුද්ධාත්මයන් දුරුකරන්ට ඔවුන් කෙරෙහිද සියලු ආකාර ලෙඩ සහ සියලු ආකාර රෝග සුවකිරීමටද ඔවුන්ට බලය දුන් සේක. (මතෙව් 10:1)**
>
> **එකල උන්වහන්සේ දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, ඔවුන් දෙදෙනා දෙදෙනා බැගින් යවන්ට පටන්ගෙන, අශුද්ධාත්මයන් කෙරෙහි ඔවුන්ට බලයදී, (මාර්ක් 6:7)**

සියලුම ඇදහිලිවතුන්ට උන්වහන්සේ එම බලය පැවරූ සේක.

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්, ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය. . . (ලූක් 16:17)**
>
> **රෝගීන් සුවකරපල්ලා, මළවුන් නැගුටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා, නුඹලා නොමිලයේ ලැබුවහුය. නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:8)**

මෙම වැදගත් සේවය එක් සෙනඟ කණ්ඩායමකට පමණක් සීමා කිරීමට දෙවියන්වහන්සේ අදහස් කළ බවට විශ්වාස කිරීමට බයිබලිය පදනමක් නැත. නිදසුනක් ලෙස සමාරියේදී නපුරු ආත්ම පහ කිරීමට දෙවියන්වහන්සේ පිලිප් නමැති ගිහියෙකු භාවිත කළ සේක (ක්‍රියා 8).

ස්කේවාගේ පුත්‍රයන් මෙන් නිසි සූදානමක් නොමැතිව යක්ෂාත්ම බලවේග සමග කටයුතු කිරීමට ඇදහිලිවතුන් ඉක්මන් විය යුතු බවක් මින් අදහස් නොකෙරේ (ක්‍රියා 19). එමෙන්ම ඇදහිලිවතුන් ඕනෑවට වඩා යක්ෂයන් ගැන නොසිතිමද වැදගත් වේ. අපට යක්ෂයන් ගැන අවධානයක් යෙදිම අවශ්‍ය නැත. "යක්ෂයන් පහ කිරීමේ" ආත්මික දීමනාවක් නැත. එහෙත් ඔබ යක්ෂ බලවේගවලට බිය විය යුතු නැත. භූතයන්ගේ බලපෑම්වලට ලක්වූවන් හමුවූ විට ඔවුන් වෙත දෙවියන්වහන්සේගෙන් මිදීම ගෙන ඒමේ බලය ඔබට තිබිය යුතුය.

## මිදීම ලබා දීමට මෙහෙකිරීම

යක්ෂබලවේගවලට ලක්වූවන්ට මිදීම ලබා දීම සඳහා මාර්ග නිර්දේශ සමහරක් මෙසේ වේ.

### ඔබගේ මූලික සූදානම:

ඇදහිල්ල ලැබෙන්නේ දෙවියන්වහන්සේගේ වචනයට, සුවිශේෂ හෙවත් "රේමා" වචනයට හෝ සවන් දීමෙනි. අලුත් ආකල්පයක් ඇතිව නව ගිවිසුම කියවීම මගින් ඔබගේම සිත තුළ ඇදහිල්ල ගොඩනගාගැනිම ආරම්භ කරන්න.

- යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට කරන්ට කීවේ කුමක්ද? එය කරන්න.

- උන්වහන්සේ යමක් කරන බව කීසේක් නම් එය කරන බවට බලපොරොත්තුවන්න.

- සාතන් විසින් පිඩා කරන ලද අය මුදාගැනීමට ඔබට හැකි යයි උන්වහන්සේ පැවසූ සේක් නම් ඔවුන් මිදීම ලබන බව දැකීමට බලාපොරොත්තු වන්න.

- යක්ෂයන් පලවා හරින ලෙස උන්වහන්සේ පැවසූ සේක් නම්, උන්වහන්සේගේ නාමයෙන් එසේ කරන්න. ඔවුන් ඔබට අවනත වීම බලාපොරොත්තු වන්න.

මනුෂ්‍යයාගේ ඉගැන්වීම් හා ඔබගේ පෞද්ගලික අත්දැකීම් සියල්ල නොසලකා හරින්න. නව ගිවිසුම පවසන දෙයම එය අදහස් කරන බව පිළිගන්න. එය සත්‍ය බව පිළිගෙන ඒ අනුව ක්‍රියා කරන්න. ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ තානාපතියෙකි (2 කොරි. 5:20). තමා නියෝජනය කරන රට පැවසූ වචනයකට අනුව තම රට ක්‍රියා නොකරන්නේ යයි අවිශ්වාසයක් තානාපතියෙකු තුළ නැත.

මිදීමේ සේවය ආරම්භ කිරීමට පෙර නිරාහාරව සිටිමින් යාච්ඤා කරන්න. මිදීම සඳහා බලය හා අධිකාරිය ලැබෙන්නේ දෙවියන්වහන්සේගෙන් බැවින් ඒ ගැන විමසිල්ලෙන් සිටීම යහපත්ය. ඇතැම් යක්ෂයන් පලවා හැරිය හැක්කේ නිරාහාරව සිටීමෙන් හා යාච්ඤා කිරීමෙන් පමණි. අන් අයගේ අවශ්‍යතාවන් සඳහා සේවය කිරීම වෙත අවධානය යොමු කරන නිරාහාර යාච්ඤාවට දෙවියන්වහන්සේ ගරු කරන බව යෙසායා 58 අපට උගන්වයි.

### අන් අයගේ මූලික සූදානම:

යක්ෂයන් පලවා හරින විට හෝ බැඳ තබන විට හෝ හැකි සෑම අවස්ථාවකම ඇදහිලිවතුන් කණ්ඩායමක් යොදා ගත යුතුය. යේසුස්වහන්සේ සේවය කිරීම සඳහා ගෝලයන් යැවුවේ දෙදෙනා දෙදෙනා බැගිනි.

> **එකල උන්වහන්සේ දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, ඔවුන් දෙදෙනා දෙදෙනා බැගින් යවන්ට පටන්ගෙන, අශුද්ධාත්මයන් කෙරෙහි ඔවුන්ට බලයදී, (මාර්ක් 6:7)**

යක්ෂාවේශවූවෙකු හමුවුවහොත් ඔහුට තනිවම සේවය කිරීමට ඔබට නොහැකි යයි මින් අදහස් නොකෙරේ. එහෙත් තවත් ඇදහිලිවන්තයෙකු සමග එක්ව කරන යාච්ඤාවට මහත් බලයක් තිබේ. බලය ලැබෙන්නේ එක්සත් බවින් නිසා මිදීමේ සේවයට ඔබ හා එක්වන අයද ඔබ මෙන්ම නිරාහාරයෙන් හා යාච්ඤාවෙන් සූදානම් විය යුතුය.

පීඩා හා වසඟවීම් අවස්ථාවලදී (දොම්නස, යක්ෂාත්ම නිසා වැළදුනු රෝග ආදිය) සේවය ලැබීමට යන පුද්ගලයාව සූදානම් කරන්න. ඔවුන්ට මිදීම පිළිබඳ "රේමා" දේව වචනය තුළින් ඔවුන්ගේ ඇදහිල්ල ගොඩනගාගැනීම අවශ්‍ය වේ (අවේග වූ අවස්ථාවලදී මෙය කළ නොහැකි වීමට ඉඩ තිබේ).

සුදුසු උපදෙස් නොමැතිව, යක්ෂාත්ම බලපෑම් ඇති කෙනෙකු වෙනුවෙන් යාච්ඤා කිරීම යේසුස්වහන්සේ කවුරුන්දැයි නොදැන, තම පාපය හා ගැළවීම ලැබීමට ඇති අවශ්‍යතාව හැඳින නොගෙන යේසුස්වහන්සේ පිළිගන්නා ලෙස ගැළවීම නොලද කෙනෙකුට දිරිගන්වනවා වැනිය. ශුභාරංචිය බෙදාගන්නා විට ප්‍රඥාවන්ත ආත්ම දිනන්නකු ඉක්මන් තීරණයක් දෙන ලෙස බලකරන්නේ නැත. මෙහිදී කළ යුතු පෙර සූදානමක් ඇත. තවද නිවැරදි උපදෙස් දිය යුතුය.

මිදීම සඳහා ද මෙය සත්‍ය වේ. උපදෙස් නොමැතිව දෙවියන්වහන්සේට මිදීම ගෙන දෙන්නට පුළුවන. එහෙත් මිදීම ලබා දෙන විට, දේව වචනයේ සඳහන් සියලුම මාර්ග නියමාකාරයෙන් භාවිත කළ යුතුවේ. දෙවියන්වහන්සේගේ මුදාගැනීමේ බලයේ එක් මාර්ගයක් වන්නේ ඇදහිල්ල වන අතර එය ලැබෙන්නේ දේව වචනයට සවන් දීමෙනි. එබැවින් උපදෙස් වැදගත්ය. යේසුස්වහන්සේ දේශනා කිරීම ද, ඉගැන්වීම ද, සුව කිරීම හා මුදාගැනීම ද ඒකාබද්ධ කළ සේක. එමෙන්ම එසේ කරන ලෙස සිය අනුගාමිකයන්ට උපදෙස් ද දුන් සේක.

## සේවය කිරීමේ ස්ථානය:

සාමාන්‍ය දේව මෙහෙයේ කොටසක් තුළ යක්ෂාත්ම බලවේගවලින් පීඩිත වුවන්ට සේවය කළ හැකිය. එවැනි සේවයක් පුද්ගලිකව කිරීම අවශ්‍ය නැත. එය සභාවේ වලංගුතාවක් ඇති සේවයකි.

යක්ෂාවේශවූවන්ට යේසුස්වහන්සේ සේවය කළේ සාමාන්‍ය දේව මෙහෙයක කොටසක් ලෙස වේ (මාක් 1:21-25). කෙසේවුවද යක්ෂ බලවේග වෙනුවෙන් කටයුතු කිරීමට සාමාන්‍ය දේව මෙහෙයක් පවත්වන තුරු බලා සිටීම අනවශ්‍යය. යේසුස්වහන්සේ මිදීම ගෙන එනු ලැබුවේ තැනක් වේලාවක් බලා නොවේ, යක්ෂාත්ම හමුවූ ඕනෑම අවස්ථාවක ඕනෑම තැනකදී වේ.

## සේවය කරන වේලාව:

ඔබ මිදීම ලබාදීමට සූදානම්ව සිටින විට,

### 1. නමස්කාරයෙන් හා ප්‍රශංසා කිරීමෙන් ආරම්භ කරන්න.

අප උන්වහන්සේ අබිමුවට පැමිණෙන්නේ (මිදීම හා සුවය ලබා දිය යුතු වූ විට) නමස්කාරයෙන් හා ප්‍රශංසාවෙනි. යාච්ඤා නොකර වුවද නමස්කාරයෙන් හා ප්‍රශංසාවෙන් මිදීම ලැබිය හැකිය. මන්ද දෙවියන්වහන්සේ සිය සෙනඟගේ ප්‍රශංසාව තුළ වැඩවාසය කරන බැවිනි. අප ප්‍රශංසා කරන විට සුව කිරීමට හා මුදා ගැනීමට උන්වහන්සේ සිටින සේක.

### 2. ඇදහිල්ලේ වාතාවරණයක් නිර්මාණය කරන්න.

මිදීම පිළිබඳ දේව වචනය දුන් අවස්ථාවේ ඔබ මේ දෙය ආරම්භ කළෙහිය. එහෙත් ඇදහිල්ලේ වාතාවරණයක් නිර්මාණය කිරීමට ඇතැම් විට ඔබට අතිරේක පියවර ගැනීමට ද සිදුවිය හැකිය.

අවිශ්වාසය, යේසුස්වහන්සේගේ සේවයට ද බාධා කළේය. ඇතැම් අවස්ථාවල යේසුස්වහන්සේ තමා සේවය කරන විට නොඇදහිලිවතුන් පිට මං කළ සේක (මාක් 5:35-40). අනෙක් අවස්ථාවල උන්වහන්සේ ඔවුන්ට සේවය කිරීම උදෙසා ඔවුන්ව ගමෙන් (නොඇදහිලිවන්ත වාතාවරණයකින්) බැහැරට ගෙන ගිය සේක (මාක් 8:23). තවත් අවස්ථාවල දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම අනුව අවිශ්වාසයෙන් බියෙන් ආදියෙන් පොර බදන අයට පිටව යන ලෙස කීමට සිදුවේ.

### 3. පළමුව යාච්ඤා කරන්න.

මිදීම ලබා දීම ආරම්භ කිරීමට පෙර ප්‍රඥාව හා අවබෝධය ඉල්ලන්න. යාච්ඤා කරන අතරතුර දෙවියන්වහන්සේ ඔබට මේවා එළිදරව් කිරීමට ඉඩ තිබේ.

දැනුමේ වචනයක්: යම් පුද්ගලයෙක් හෝ තත්වයක් හෝ පිළිබඳව සුවිශේෂී කරුණු හෝ තොරතුරු එළිදරව් කෙරෙනු ඇත. එවිට යාච්ඤා කළ යුත්තේ කෙසේදැයි ඔබට දැනගැනීමට පුළුවන. දැනුමේ වචනයක් ගැඹුරු හැඟීමක් නැතහොත් ඔබගේ ආත්මයේ සිතිවිල්ලක් වචනයක් හෝ හැඟීමක් ලෙස සිතට කාවදින අදහසක් අන්තර්ගත විය හැකිය. දැනුමේ වචනයකින් රෝගය කුමක්ද හෝ ඒ තත්වය එම තැනැත්තාට ඇත්තේ මන්ද යන්න හෝ එළිදරව් විය හැකිය.

ශුද්ධ ලියවිලි පදයක් : ඒ අවස්ථාව, තත්වය, පුද්ගලයා හෝ කණ්ඩායම පිළිබඳ රේමා වචනයක්.

දර්ශනයක් : ඔබ සේවය කිරීමට යන තැනැත්තා පිළිබඳ සිතේ ඇතිවන පින්තූරයක්.

ඇදහිල්ලේ වචන : එම පුද්ගලයාටම සුවිශේෂී වූ දිරිගැන්වීමේ හෝ ඇදහිල්ලේ සුවිශේෂී වචන.

විශේෂ ආලේප කිරීමක් : බලය ක්ෂණිකව සිතට කාවැද්දීමක්, ඇතැම්විට වෙව්ලීමක්, රත්වීමක් හෝ අධිස්වභාවික ආත්ම විශ්වාසයක් ඇතිවීම.

ඇදහිල්ලේ විශේෂ ක්‍රියාවක් : ඒ තැනැත්තා විසින් කරන ලද්දේ නම් එම පුද්ගලයා මුදනු ලබනු ඇත.

## 4. කෙටි සම්මුඛ සාකච්ඡාවක් පවත්වන්න.

මෙය අවශ්‍යම නැත. එය අනිවාර්ය නොවේ. ස්වාමින්වහන්සේගේ මගපෙන්වීම අනුව කළ යුතුය. ඒ තැනැත්තාගේ තත්වය පිළිබඳව ප්‍රඥාවන්ත සුවිශේෂී වචන දෙවියන්වහන්සේ ඔබට දිය හැකිය. එවිට සම්මුඛ සාකච්ඡාවක් අවශ්‍ය නොවේ.

එහෙත් දෙවියන්වහන්සේ අධිස්වභාවිකව යමක් ඔබට එළිදරව් නොකළ හොත් සම්මුඛ සාකච්ඡාවක් කිරීමට නොපැකිළෙන්න. යේසුස්වහන්සේ ස්වභාවික මෙන්ම අධි ස්වභාවික ක්‍රමද භාවිත කළ සේක. ඇතැම් අවස්ථාවල උන්වහන්සේ මනුෂ්‍යයන්ගේ තත්වය නිර්ණය කළේ ශුද්ධාත්මයාණන්වහන්සේ මගිනි. අනෙක් අවස්ථාවල ඔවුන්ට අවශ්‍ය කුමක්දැයි උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක.

සම්මුඛ සාකච්ඡාවක් ඔබට තොරතුරු ලබා ගැනීමට උපකාරී වේ. එවිට ඔබට සුවිශේෂව යාච්ඤා කළ හැකිය. එමෙන්ම යාච්ඤා කිරීමට පෙර තවදුරටත් ඔහුට උපදෙස් අවශ්‍යදැයි දැනගැනීමට එය උපකාරී වේ. යේසුස්වහන්සේ බොහෝ විට එසේ කළ සේක. උන්වහන්සේ ඔවුන්ගේ ඇදහිල්ල පිළිබඳව ඔවුන්ගෙන් ප්‍රශ්න ඇසූ සේක. ඉන්පසු සේවය කිරීමට පෙර අවිශ්වාසයේ සෘණාත්මක බලවේග ගැන කටයුතු කළ සේක. පහත දැක්වෙන නිදසුන් අධ්‍යයනය කරන්න.

- මාක් 5:1-20 යේසුස්වහන්සේ යක්ෂාවේශවූ මිනිසාගෙන් ප්‍රශ්න ඇසූ සේක.
- මාක් 8:22-26 අන්ධ මිනිසාගෙන් ප්‍රශ්න කිරීම
- මාක් 9:14-27 නපුරු ආත්මයක් සහිත ළමයා
- මාක් 10:46-52 අන්ධ බාතිමියස් ප්‍රශ්න කිරීම

“ගැටලුව කුමක්ද,”යි ඒ පුද්ගලයාගෙන් අසන්න. යාච්ඤාව සඳහා ඉල්ලීම වැදගත්ය. යේසුස්වහන්සේ තමා වෙතට පැමිණි අවශ්‍යතාව පැවසූ බොහෝ දෙනෙකුව සුව කළ සේක. ඉල්ලීම ඇදහිල්ලේ ක්‍රියාවක් වන අතර මිදීමේ ක්‍රියාවලිය ඉන් ආරම්භ වේ (යකො. 5:14-15). නිශ්චිත ප්‍රකාශනයක් ලබාගන්න. ඔබට අවශ්‍ය සංක්ෂිප්ත කරුණු වේ. ඔබට සම්පූර්ණ ඉතිහාසය හෝ ජීවිත කතාව හෝ අවශ්‍ය නැත.

ඔබට දෙන ලද තොරතුරු මනෝවිද්‍යාත්මකව විශ්ලේෂණය කිරීමට උත්සාහ නොකරන්න. ඔබගේ කටයුත්ත මිදීම ලබා දීමය. ඇතැම් සුවිශේෂී අවස්ථාවල රහසිගතබව අවශ්‍ය විය හැකි අතර පුහුණු උපදේශකයෙකු සමග වැඩි කාලයක් ගත කිරීමට සිදුවිය හැකිය. මේ සඳහා උපදේශකවරුන් දැන හැඳිනගෙන සිටින්න.

“ඔබ මුදාගැනීමට යේසුස්වහන්සේට හැකි බව ඔබ විශ්වාස කරන්නෙහිද,”යි යාච්ඤාව අවශ්‍ය තැනැත්තාගෙන් අසන්න. ඔවුන් ධනාත්මකව පිළිතුරු සැපයුවහොත් “යේසුස්වහන්සේ එය දැන් කරන බව ඔබ විශ්වාස කරන්නෙහිද,”යි අසන්න. මේ ප්‍රශ්න දෙකෙන් ඕනෑම එකකට පිළිතුර “නැත” යන්න නම් තවදුරටත් දේව වචනයෙන් උපදෙස් අවශ්‍යය.

ඔබ විශාල සෙනඟකට සේවය කරන විට සැම කෙනෙකුටම පුද්ගලිකව කතා කිරීමට නොහැකිය. ඇතැම් විට දෙවියන්වහන්සේ ඔවුන් අතරින් සුවිශේෂී ලෙස යක්ෂාත්ම වේශවූවන් පෙන්වීමට ඉඩ තිබේ. නැතහොත් ඇතැම් අයට සුවිශේෂී යාච්ඤාවන් කිරීමට දෙවියන්වහන්සේ මගපෙන්වනු ඇත.

ඔබ මිදීමේ සේවය ලබා දෙන්නේ සෙනඟකට නම් තනිවම සේවය කිරීමට වඩා ඔබ සමග සේවය කිරීමට තවත් අය පුහුණු කිරීම වඩාත් යහපත්ය. යේසුස්වහන්සේගේ පැවරීම වූයේ අදහන **අය** වෙත මෙම ලකුණු පහළ වෙන බවය. සේවය මුළු කණ්ඩායම තුළින් මිස එක් කෙනෙක් හෝ දෙදෙනෙක් හෝ ඉවැන්ජලිස්ත වරයෙකු තුළින් නොවේ.

## 5. නිශ්චිත ගැටලුව නිර්ණය කරන්න.

සම්මුඛ පරීක්ෂණයෙන් හා/හෝ දෙවියන්වහන්සේ දෙන්නාවූ ප්‍රඥාවෙන් හෝ ලද තොරතුරු මගින් ගැටලුව මේ කුමන ක්ෂේත්‍රයේදැයි නිර්ණය කරන්න.

**ආත්මික ක්ෂේත්‍රය :** ගැටලුව පාපයට සම්බන්ධය. මේවා සඳහා ආත්මික සුවකිරීමේ සේවයක් අවශ්‍ය වේ (ගැළවීම, පශ්චාතාපවීම හා පාපයට කමාව ලැබීම).

**ශාරීරික ක්ෂේත්‍රය :** දුර්වලතාවේවූ යක්ෂ ආත්මයන් මගින් හටගත් ශාරීරික රෝග වේ.

**හැඟීම් ක්ෂේත්‍රය :** සාංකාව, බිය, කෝපය, තිත්තකම, අමනාපය, වරදකාරී බව, අවිශ්වාසය, අසාර්ථකවීම, ඊර්ෂ්‍යාව, ආත්මාර්ථකාමීබව, ව්‍යාකූලත්වය, කලකිරීම, මාංසයේ ශක්තියේ පරිපූර්ණත්වය, කමාව නොදීම, අතීත සිද්ධීන් ආදිය පිළිබඳ ගැටලු.

**මානසික ක්ෂේත්‍රය :** සෘණාත්මකව සිතීම, මනස වෙත කෙරෙන සාතන්ගේ ප්‍රහාර, මානසික මන්දනය ආදියෙන් පැනනගින ගැටලු විය හැකිය. මනුෂ්‍යයා ත්‍රිත්ව පුද්ගලයෙකු බැවින් එක් ක්ෂේත්‍රයක ගැටලු මුළු පුද්ගලයා කෙරෙහිම බලපානු ඇත. ඔබ සේවය කරන විට සම්පූර්ණ පුද්ගලයා ගැන සිතන්න. එක් ක්ෂේත්‍රයක් ගැන පමණක් නොසිතන්න. මිනිසා ශරීරය, ප්‍රාණය හා ආත්මය වේ. සම්පූර්ණත්වයෙන් ගම්‍ය වන්නේ මේ සියල්ල සමග කටයුතු කිරීමය.

## 6. මෙය යාච්ඤා කිරීම සඳහා උචිත කාලයදැයි තීරණය කරන්න.

මෙය මිදීමේ යාච්ඤාව කිරීමේ මොහොතද නැත්දැයි තීරණය කරන්න. බොහෝ අවස්ථාවල ඔබ යාච්ඤා කරනු ඇත. එහෙත් යාච්ඤා නොකිරීමට හෝ යාච්ඤාව ප්‍රමාද කිරීමට හෝ ස්වාමින්වහන්සේ ඔබට මගපෙන්වුවහොත් ඒ ගැන පුදුම නොවන්න.

සිරෝෆිනිය ස්ත්‍රියගේ දියණිය හා ලාසරස් සුවකිරීම යේසුස්වහන්සේ ප්‍රමාද කළ සේක. අවිශ්වාසය නිසා යේසුස්වහන්සේ නාසරෙත්හිදී බොහෝ වැඩ කළේ නැත. එමෙන්ම තවත් උපදෙස් දෙන තුරු ප්‍රමාද කිරීමට ස්වාමින්වහන්සේ ඔබට මගපෙන්වීමට පුළුවන. එනම් පාපය පිළිබඳ ගැටලුවක් ගැන කටයුතු කිරීමට අවශ්‍යතාවක් තිබිය හැකිය. මිදීම පිළිබඳව තවදුරටත් උපදෙස් අවශ්‍ය විය හැකිය.

## 7. මිදීමේ යාච්ඤාව යාච්ඤා කරන්න.

ඔබ හඳුනාගත් යක්ෂාත්ම බලපෑම් පිළිබඳ සුවිශේෂී ගැටලුව වෙත අවධානය යොමු කෙරෙන යාච්ඤාවක් යාච්ඤා කරන්න. ඔබගේ යාච්ඤාව මගින් මිදීම ලබාදීමට දෙවියන්වහන්සේට බලකිරීම අවශ්‍ය නැත. ගැළවීම දැනටමත් ලැබී තිබෙන්නාසේම මිදීම ද ලැබී ඇත. ගැළවීම මෙන්ම මිදීම ද පදනම් වන්නේ ඇදහිල්ලේ තත්වය මතය. දෙවියන්වහන්සේට ගැළවීම ලබාදීම අවශ්‍යසේම මිදීම ලබා දීමද අවශ්‍යය. මිදීම ලබා දීම සඳහා විශේෂ ආකාරයකට ඇතැම් අවස්ථාවල දෙවියන්වහන්සේගේ බලය අවශ්‍ය වුවද (ලූක් 5:17) විශේෂ ආලේප කිරීමක් නොමැතිව ඔබට යාච්ඤා කිරීමට පුළුවන. මන්ද ශුභාරංචිය පැතිරවීමට උන්වහන්සේ අණ කළ ආකාරයෙන්ම මිදීම ලබාදීමටද අණ කර ඇති බැවිනි.

ඔබ කණ්ඩායමකට සේවය කරන්නෙහි නම් අන් අයගේ උපකාරය ලබාගන්න. බොහෝ දෙනෙක් යාච්ඤා කරන විට ආත්මික බලය දෙගුණ, තෙගුණ වේ (මතෙ. 18:19). කණ්ඩායම් සේවයේදී මිදීමේදී සාර්ථකත්වය අත්දකින පුද්ගලයන්ට හා මිනිසාට මහිමය දීමෙන් එය ලබාගන්නන්ට අධෛර්ය කරනු ලැබේ.

පළමුව සතුරා බැඳ තැබිය යුතු බවත්, ඉන්පසු ඔහු කෙරෙහි බලය යෙදිය හැකි බවත් යේසුස්වහන්සේ ඉගැන්වූ සේක.

> **නොහොත් බලවන්තයා පළමුකොට නොබැඳ, යමෙකුට ඔහුගේ ගෙට වැද ඔහුගේ වස්තු කොල්ලකන්ට කෙසේ හැකිවේද? බැඳලාම ඔහුගේ ගෙය කොල්ලකන්නේය. (මතෙව් 12:29)**

යක්ෂාත්ම බලවේග බාහිරින් පීඩා කරන්නේ නම්, ඔවුන්ගේ බන්ධනයන් ලිහිල් කරන ලෙසටත් ඔවුන්ගේ බලය බැඳ දමන ලෙසටත් යාච්ඤා කරන්න. නිදසුනක් ලෙස සිනගෝගයේ සිටි ස්ත්‍රියව දුර්වලතාවේ ආත්මයෙන් යේසුස්වහන්සේ නිදහස් කළ සේක. ඇට තිබුණේ පීඩාවක් මිස ආවේශ වීමක් නොවේ. පහකිරීමක් අවශ්‍ය නොවීය.

යක්ෂාවේශවූ අවස්ථාවල යේසුස්වහන්සේගේ නාමයෙන් යක්ෂයන් පළවා හැරීමේ අධිකාරී බලය ඔබට ඇත. එය ඔබගේම බලයේ හෝ හැකියාවේ හෝ අධිකාරී බලයක් නොවේ, එය උන්වහන්සේගේ නාමයෙන් කෙරෙන්නකි. යක්ෂයන් පහකිරීමේ යාච්ඤාවේදී යේසුස්වහන්සේගේ නාමය භාවිත කිරීම වැදගත් වේ.

යක්ෂයන් පහකිරීමට ඇදහිල්ල, නිරාහාරව සිටීම හා යාච්ඤාව අවශ්‍ය වේ (මතෙ. 17:14-21 හි විස්තරය කියවන්න). මෙම ක්ෂේත්‍රවල මූලික සූදානම අවශ්‍ය වන්නේ ඒ නිසාය. දේව වචනය (එපීස 5:17, හෙබ්‍රෙ. 4:12), යේසුස්වහන්සේගේ ලේ (එළිද. 12:11) හා ශුද්ධාත්ම බලයෙන් පූර්ණවීම (ක්‍රියා 1:8, 2:38) ආදියද මිදීම සඳහා දෙවියන්වහන්සේ ඔබට දී ඇති ආම්පන්න වේ.

යක්ෂයන්ට කෑගැසීම හෝ මොරදීම හෝ අවශ්‍ය නැත. ඔවුන්ව පලවා හරින්නේ යේසුස්වහන්සේගේ නාමයෙන් ඔබට ලැබී ඇති අධිකාරී බලයෙන් මිස යාච්ඤා කිරීමේ හඬෙහි ශබ්දයෙන් නොවේ. යක්ෂයන්ට නැවත ඇතුලුවීම සැමවිටම තහනම් කරන්න. මෙය මිදීමේ යාච්ඤාවේ වැදගත් කොටසකි.

> **සමූහයක් දුවඑමින් රැස්වෙන බව යේසුස්වහන්සේ දුටු කල, උන්වහන්සේ අශුද්ධාත්මයට තරවටුකර, ගොළු බිහිරි ආත්මය, මොහු කෙරෙන් පහව යව, තවත් මොහුට ආවේශ නොවන්ට තට අණකරමියි කීසේක. (මාක් 9:25)**

කතා කිරීමේ වචන තුළින් යක්ෂයා විද්‍යමාන වුවහොත් ඔවුන් සමග කතා කිරීමට කාලය ගත නොකරන්න. යේසුස්වහන්සේ යක්ෂයන්ට තරවටු කර නිශ්ශබ්දව සිටින්නට අණ කළ සේක (ලූක් 4:34-35). යක්ෂයන් සමග සාකච්ඡා කිරීම භයානක වේ, මන්ද ඔවුන් බොරුකීමේ ආත්ම වන බැවිනි.

මිදීමේ යාච්ඤාවේදී ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට මගපෙන්වනු ඇත. එහෙත් ඔබ මෙම සේවයට නවකයෙක් නම් පහත දැක්වෙන යාච්ඤා රටාව අනුගමනය කරන්න.

*"යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන්ද උන්වහන්සේගේ බලයේ අධිකාරීත්වයේ පදනම මතද උන්වහන්සේගේ වචනය, උන්වහන්සේගේ ලේ හා ශුද්ධාත්මයාණන්වහන්සේගෙන්ද . . . "*

**. . . මෙමගින් මිදීම සඳහා බලයේ අඩිතාලම පිහිටුවයි. . .**

"මම ඔබ බැඳ තබමි"

**. . . බලවන්තයා පහ කිරීමට පෙර බැඳ තබන ලෙස යේසුස්වහන්සේ ඉගැන්වූ සේක"**

"මම ඔබට අණ කරමි"

**මිදීම ලබාදීම අධිකාරී බලයේ යාච්ඤාවක් මිස බැගෑපත් වීමක් නොවේ. ඔබට සෙමින් කතා කළ හැකිය. එහෙත් යේසුස්වහන්සේගේ නාමයෙන් නපුරු බලවේගවලට විරුද්ධව අධිකාරී බලය ඔබ ගත යුතුය. ඔබ කතා කරන විට ඒ තැනැත්තාගේ ඇස් දෙක දෙස බලමින් කතා කරන්න.**

**".......................... ගේ ආත්මය" හෝ "සාතන්ගේ නපුරු ආත්මයක් වන ඔබ . . ."**
**ආත්මික හෝ ස්වභාවික හෝ මාර්ගයකින් ආත්මය හඳුනාගෙන ඇත්නම් එය නිශ්චිතව නම් කරන්න. නැතහොත් පොදුවේ යාච්ඤා කරන්න".**

". . . පිටවෙව. . ."

**. . . මෙය පහ කිරීමේ ක්‍රියාවලිය වේ.**

" ................. (මුදා ගනු ලබන්නා නම් කරන්න) හෝ මෙම නිවසේ වෙන කෙනෙකුට හෝ කිසිදු හානියක් නොකර හා ශබ්දයක් හෝ කලබලයක් හෝ නොකර"

**. . . ඇතැම් විට එම පුද්ගලයාට හානියක් කිරීමට හෝ කලබලයක් ඇති කිරීමට හෝ යක්ෂයා උත්සාහ ගනී.**

"මෙම පුද්ගලයා තුළට නැවත ඇතුළු වීම මම තහනම් කරමි"

**. . . යේසුස්වහන්සේ, මෙසේ අණ කළ බව මතක තබාගන්න.**

". . . මෙම පුද්ගලයා පවිත්‍ර කිරීමට යේසුස්වහන්සේගේ රුධිරයේ මිදීමේ බලයෙන් පුරවාලීමට මම ශුද්ධාත්මයාණන්වහන්සේ නිදහස් කරමි"

**. . . බැඳීමට මෙන්ම නිදහස් කිරීමට ද අපට පවසා තිබේ. නිශ්චිත ආත්මයක් ක්‍රියා කරන බව ඔබ හඳුනා ගත්තෙහි නම්, ප්‍රතිවිරුද්ධ ආත්මය නිදහස් කරන්න. නිදසුනක් ලෙස අහංකාරයේ ආත්මය බැඳ තබා නිහතමානී ආත්මය නිදහස් කරන්න.**

පුරසාරම් දොඩවමින් සෙනඟ ආකර්ෂණය කිරීමට මෙවැනි සේවයක් නොයොදවන්න. යක්ෂයෙකුගේ ක්‍රියාවන් මගින් සෙනඟ ආකර්ෂණය කෙරෙන බව යේසුස්වහන්සේ දුටු විගස නපුරු ආත්මයේ ක්‍රියාවන් එකෙණෙහිම නවතා එය පහ කළ සේක.

**සමූහයක් දුවඑමින් රැස්වෙන බව යේසුස්වහන්සේ දුටු කල, උන්වහන්සේ අශුද්ධාත්මයට තරවටුකර, ගොළු බිහිරි ආත්මය, මොහු කෙරෙන් පහව යව, තවත් මොහුට ආවේශ නොවන්ට තට අණකරමියි කීසේක. (මාක් 9:25)**

යක්ෂයන් නිරයට යැවීමට උත්සාහ නොකරන්න. යේසුස්වහන්සේ හා උන්වහන්සේගේ ගෝලයන් එසේ කළේ නැත. අපට බලය ඇත්තේ බැඳීමට, නිදහස් කිරීමට හා පහකිරීමට පමණි. යක්ෂයන්ගේ අවසාන විනිශ්චය සඳහා අනාගතයේ නිශ්චිත කාලයක් ඇත. යක්ෂයෝ යේසුස්වහන්සේට මෙසේ කීවෝය.

**බලව, ඔව්හු මොරගසමින්: දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෙනි, ඔබට අපෙන් කම මොකද? කාලයට ප්‍රථමයෙන් අපට වදදෙන්ට ඔබ මෙහි ආසේක්දැයි කීවෝය. (මතෙව් 8:29)**

යක්ෂයන්ගෙන් බලපෑම් ඇතිවූ අය වෙනුවෙන් යාච්ඤා කරන විට අත් තැබීම අවශ්‍යම නැත. ලූක් 13:11-13 හි දුර්වලකමේ ආත්මයකින් පීඩා විඳි ස්ත්‍රියට යේසුස්වහන්සේ අත් තැබූ සේක. අනෙක් අවස්ථාවල උන්වහන්සේ අත නොතබා යක්ෂයන්ට කතා කළ සේක (ලූක් 9:42).

## 8. පිළිතුරු සඳහා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

යාච්ඤාවෙන් පසු මිදීම පිළිබඳව දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. ලාදුරු රෝගීන් දස දෙනා පිළිබඳ බයිබලීය නිදර්ශනයේ සියලු දෙනා සුවය ලැබූ නමුත් ප්‍රශංසා කිරීමට ආපසු පැමිණි තැනැත්තා පමණක් පූර්ණ කරනු ලැබීය. දැකීමෙන් නොව ඇදහිල්ලෙන් ප්‍රශංසා කරන්න. ඔබ කර

ඇත්තේ දෙවියන්වහන්සේගේ වචනය පැවසූ දේ වේ. උන්වහන්සේ කරනවා යයි කියූ දේම උන්වහන්සේ කළ බව විශ්වාස කරන්න. ඒ ගැන උන්වහන්සේට ස්තුති කරන්න.

## මිදීමේ ලකුණු හඳුනාගැනීම :

යක්ෂාවේශවූ ඇතැම් අවස්ථාවල යක්ෂයන් එළියට එන්නේ පොර බැදීමක් සමගය. මොරගැසීමක් හෝ බිම දැමීමක් හෝ සිදුවිය හැකිය. භූතයන් පිටව ගිය කල (ආවේශ වී සිටියත්, පීඩා ගෙන දුන්නත්) බරක් ඉවත් වූවාක් වැනි නිදහස් වීමක්, ප්‍රීතියක් වැනි හැඟීමක් ඇති වේ.

## ස්වයං පරීක්ෂණය

1. සුවයේ පොරොන්දුව මතකයෙන් ලිවීමට

2. ශුද්ධ ලියවිල්ලට අනුව යක්ෂාත්ම බලවේග සමග කටයුතු කළ යුත්තේ කවුද?

3. මිදීම ලබාදීම සඳහා ඔබ සූදානම් විය යුතු ආකාරය පිළිබඳ මාර්ග නිර්දේශ සාරාංශ කරන්න.

4. මිදීම ලබාදීම සඳහා අන් අය සූදානම් විය යුතු ආකාරය පිළිබඳ මාර්ග නිර්දේශ සාරාංශ කරන්න.

5. මිදීම ලබා දීම සඳහා මෙම පාඩමෙන් දි ඇති මාර්ග නිර්දේශ සාරාංශ කරන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

1. යක්ෂාත්ම බලපෑම්වල හේතුවෙන් ඇතිවූ තත්වයන් සහිත අයට යේසුස්වහන්සේ සේවය කළ ආකාරය පිළිබඳ බයිබලිය වාර්තා අධ්‍යයනය කරන්න.

   - කුදු ස්ත්‍රිය ලූක් 13:10-17.

   - සිනගෝගයේ සිටි අශුද්ධාත්මයක් ආවේශ වූ මිනිසා: මාක් 1:23-28, ලූක් 4:31-37,

   - ගදරීන රටේ යකුන් වැහී සිටි අය: මතෙ. 8:28-32, මාක් 5:1-13, ලූක් 8:26-33,

   - මහලේ රෝගයෙන් පෙළුණාවූ ස්ත්‍රිය: මතෙ. 9:20-23, මාක් 5:25-34, ලූක් 8:43-48.

   - කානානිය ස්ත්‍රියගේ දියණිය: මතෙ. 15:21-28, මාක් 7:24-30,

   - නපුරු ආත්මයක් සහිත ළමයා. මතෙ. 17:14-21, මාක් 9:14-29, ලූක් 9:37-45,

   - යක්ෂාවේශ ගොළුවා: මතෙ. 9:32-33.

   - යක්ෂාවේශ වූ අන්ධ ගොළුවා: මතෙ. 12:22-30, මාක් 3:22-27, ලූක් 11:14-26,

අනෙක් අවස්ථාවන්: යේසුස්වහන්සේගේ මෙම සුවිශේෂි අවස්ථාවන්ට අමතරව යක්ෂාත්ම බලවේගවලින් පීඩා විඳි අයට උන්වහන්සේ කළ සේවාවන් පිළිබඳව පොදු යොමු කිරීම් බයිබලයේ සඳහන් වේ.

- යේසුස්වහන්සේ යක්ෂයන් සමග කටයුතු කළ ආකාරය විස්තර කිරීමට "සුව කිරීම" යන වචනය මෙම යොමුවන්හි සඳහන් වේ. මතෙ. 4:24, ලූක් 6:18,

- පහත දැක්වෙන අවස්ථාවල "දුරු කළ සේක" යන්න උන්වහන්සේගේ උපක්‍රමික විස්තර කිරීමට භාවිත කර ඇත. මාක් 1:32-34. 39, 6:13,

- ලූක් 4-41 හි සඳහන් වන්නේ "යක්ෂයෝ . . දුරුවුණෝය" යනුවෙනි ලූක් 7:21 හි උන්වහන්සේ බොහෝ දෙනෙකු . . . "සුවකර" . . . යයි සඳහන් වේ. මතෙව් 8:16 හි "උන්වහන්සේ වචන මාත්‍රයකින් ආත්මයන් දුරු කළ සේක" යයි සඳහන් කර ඇත. මාක් 16:9 හා ලූක් 8:2-3 හි සඳහන්ව ඇත්තේ යේසුස්වහන්සේ මග්දලායේ මරියාගෙන් යක්ෂයන් හත් දෙනෙකු දුරු කළ බවය. විශාල සෙනඟක් සිටි විට යේසුස්වහන්සේ යක්ෂයන්ට කතාකරන්ට ඉඩ නුදුන් සේක. මාක් 1:32-34.

2. පසුගිය පාඩමෙන් ඔබ නිර්ණය කළේ ඔබගේ හෝ ඔබ සේවය කරන තැනැත්තාගේ හෝ තත්වය යක්ෂාත්මයක් නිසා ඇතිවූයේද යන්නය. මෙම පරිච්ඡේදයෙන් ඔබ උගත් දේ පදනම් කරගනිමින්, මිදීම ලබාදීමට ඔබ කටයුතු කළ යුත්තේ කෙසේදැයි විමසන්න.

---

3. පහත දැක්වෙන හරි වැරදි බැලීමේ ලයිස්තුව මිදීම ලබා දීමේදී ඔබට භාවිත කිරීම සඳහා මෙම පාඩමෙන් ගොඩනඟන ලද්දකි.

## මූලික සූදානම

### ඔබ තුළ

- මිදීම පිළිබඳ දේව වචනය අධ්‍යයනය කරන්න.
- මූලිකව නිරාහාරව සිටීම හා යාච්ඤාව

**අනෙක් අය තුළ**

යක්ෂාවේශවූ තැනැත්තාගේ තත්වය ඉඩ දෙන්නේ නම් පහත දැක්වෙන පියවර අනුගමනය කරන්න.

-මිදීම පිළිබඳ නිවැරදි උපදෙස්
-මිදීම පිළිබඳ දේව වචනය අධ්‍යයනය කරන්න
-මූලිකව නිරාහාරව සිටීම හා යාච්ඤාව

## සේවය කිරීමේ කාලය :

-ඇදහිල්ලේ වාතාවරණයක් නිර්මාණය කරන්න.
-නිර්ණය කිරීම සඳහා යාච්ඤා කරන්න. ඔබට පහත දැක්වෙන දේ දෙවියන්වහන්සේ දෙනු ඇත.
- දැනුම පිළිබඳ වචනයක්
- ශුද්ධලියවිලි පාඨයක්
- දර්ශනයක්
- ඇදහිල්ලේ වචන
- විශේෂ ආලේප කිරීමක්
- ඇදහිල්ලේ විශේෂ ක්‍රියාවක්

- කෙටි සම්මුඛ සාකච්ඡාවක් පවත්වන්න.
- ගැටලුව නිර්ණය කැරන්න. ගැටලුව
  - ආත්මික ක්ෂේත්‍රයේද
  - ශාරීරික ක්ෂේත්‍රයේද
  - චිත්තවේගී ක්ෂේත්‍රයේද
  - මානසික ක්ෂේත්‍රයේද
- මෙම යාච්ඤා කිරීමට කාලයදැයි නිර්ණය කරන්න.
- මිදීමේ යාච්ඤාව යාච්ඤා කරන්න.
- පිළිතුර ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.
- මිදීමේ ලකුණු හඳුනාගන්න.

## දහ නව වන පරිච්ඡේදය

# මිදීම පිළිබඳ පසු කටයුතු සේවය

### අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරීමට හැකිවනු ඇත.

- සුවයේ පොරොන්දුව මතකයෙන් ලිවීමට
- මිදීම ලද අය පිළිබඳ පසු කටයුතු සඳහා මාර්ග නිර්දේශ සාරාංශ කිරීමට
- යක්ෂවේශ බලවේගවලින් ආරක්ෂාවීම සඳහා මාර්ග නිර්දේශ සාරාංශ කිරීමට

### සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:

> **රෝගීන් සුවකරපල්ලා, මළවුන් නැගිටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා, නුඹලා නොමිලයේ ලැබුවහුය. නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:8)**

### හැඳින්වීම

යක්ෂාත්ම බලපෑම්වලින් මුදාගත් අය රැකබලා ගැනීමේ පසු කටයුතු ඉතා වැදගත් බව යේසුස්වහන්සේ පෙන්වූ සේක.

> **අපිරිසිදු ආත්මය මනුෂ්‍යයෙකුගෙන් දුරුව ගිය කල්හි, ඔහු දිය නැති තැන්වල ඇවිදිමින් විශ්‍රාම සොයා නොලැබ, මම පිටත්ව ආ මාගේ ගෙට හැරියෙමියි කියයි, ඔහු එහි පැමිණි කල, ඒ ගෙය හිස්ව, අතුගා සරහා තිබෙන බව දකියි. එවිට ඔහු ගොස් තමාට වඩා දුෂ්ටවූ වෙන ආත්මයන් සත් දෙනෙකු තමා කැටුව ගෙන එන්නේය. ඔව්හු ඇතුල්ව එහි වාසයකරති. එසේ ඒ මනුෂ්‍යයාගේ පළමු ස්වභාවයට වඩා අන්තිම ස්වභාව නපුරුවන්නේය. මේ නපුරු පරම්පරාවටද එසේම වන්නේයයි කීසේක. (මතෙව් 12:43-45)**

නපුරු ආත්ම පහ කළ විට ආත්මික හිදැසක් ඇතිවේ. එම හිදැස් නොපිරුවහොත් හා සුදුසු රැකබලාගැනීමේ පසු කටයුතු නොකළහොත් යක්ෂාත්ම බලවේග වඩා ප්‍රබල ආකාරයකින් ආපසු පැමිණෙනු ඇත.

### රැකබලා ගැනීමේ පසු කටයුතු

මිදීම අත්දුටු අය රැකබලා ගැනීමේ පසු කටයුතු පිළිබඳ වැදගත් පියවර කීපයක් පහත දැක්වේ.

### 1. අත්හැර දැමීමේ යාච්ඤාවක් කරන්න.

මුදාගත් පසු, යක්ෂාවේශවූවන්ට පාපොච්චාරණයේ, පශ්චාතාපවීමේ හා ඔවුන් කළ පාප හෝ යක්ෂාත්ම කටයුතු හෝ අත්හැර දැමීමේ යාච්ඤාවකට යොමු කළ යුතුය.

### 2. ගුප්ත ද්‍රව්‍ය විනාශ කරන්න.

එම තැනැත්තාට ගුප්ත ද්‍රව්‍ය ඇත්නම් (පිළිරූ, හූනියම් ද්‍රව්‍ය, පොත්පත් ආදිය) ඒවා විනාශ කළ යුතුය.

## 3. ආත්මික හිදැස පුරවන්න.

යක්ෂයෙකු පලවා හැරිය විට ඔහු ක්‍රියා කිරීමට තවත් ශරිරයක් සොයනු ඇත. මනුෂ්‍ය ශරීරයෙන් බාහිරව යක්ෂයෙකු අවිවේකිය, අතෘප්තිමත්ය. සාතන්ගේ දුෂ්ට පරමාර්ථ යක්ෂයෙකුට ඉටු කළ හැක්කේ මනුෂ්‍යයෙකු තුළ පිවත්වීමෙන් හා මනුෂ්‍ය ජීවිත පාලනය කිරීමෙනි.

යක්ෂාත්මයන් පළමු තැනැත්තා තුළටම නැවත ඇතුලුවීමේ අවදානම නිසා, ආත්මික හිදැස පිරවිය යුතුය. එම තැනැත්තා තම ගැළවුම්කරු ලෙස යේසුස්වහන්සේ පිළිගෙන ශුද්ධාත්මයෙන් පූර්ණ විය යුතුය. ඔහු නිරන්තරයෙන්ම යාච්ඤාවේ ගිලී සිටිමින් දේව වචනයෙන් පිරෙමින් සැණෙකින් ඇදහිලිවතුන්ගේ සමූහයේ කොටසක් විය යුතුය.

## 4. ඔබගේ සාක්ෂිය ප්‍රකාශ කරන්න.

යක්ෂාත්ම බලවේගවලින් මුදනු ලැබූ අය ඔවුන්ගේ මිදීමේ අත්දැකීම් ගැන සාක්ෂි දැරිය යුතුය. ගෙරසේනයේ යාක්ෂාවේශවූවෙකුට යේසුස්වහන්සේ මෙසේ කී සේක.

> **නුමුත් උන්වහන්සේ ඔහුට අවසර නොදී, නුඹ ගෙදර නුඹේ නෑ මිතුරන් ළඟට ගොස්, ස්වාමින්වහන්සේ නුඹට කොපමණ මහත් දේවල් කළසේක්ද කියාත් උන්වහන්සේ නුඹට කරුණාකළ හැටිත් ඔවුන්ට දන්වාන්නැයි ඔහුට කීසේක. ඔහු පිටත්ව ගොස්, යේසුස්වහන්සේ තමාට කොපමණ මහත් දේවල් කළසේක්ද කියා දෙකාපොලිසෙහි ප්‍රකාශ කරන්ට පටන්ගත්තේය. සියල්ලෝ මවිත වූවෝය (මාක් 5:19-20).**

සාතන්ගේ බලය පරාජය කරන්නේ අපගේ සාක්ෂියේ වචනයෙන් බව එළිදරව් 12:11 සහතික කරයි.

## 5. යක්ෂාවේශ බලවේගවලින් තමාවම ආරක්ෂා කරගන්න.

යක්ෂාවේශ බලවේගවල ක්‍රියාවලින් ඔබවම ආරක්ෂා කරගැනීමේ සුවිශේෂි ක්‍රම පහත දැක්වේ.

-ඉතාමත්ම වැදගත් ක්‍රමය වන්නේ තම ගැළවුම්කාරයාණන් ලෙස යේසුස්වහන්සේ පිළිගැනිම වේ. මන්ද යළි ඉපදුණු ඇදහිලිවන්තයෙකුට ආවේශවීමට යක්ෂාත්මවලට නොහැකිය. ඔබ ගැළවීම ලැබූ පසු පාපයෙන් ඈත් වන්න. මන්ද පාපය තුළින් ඔබ "යක්ෂයාට තැනක් දෙන්නෙහිය" - ඔබට විරුද්ධව පීඩා කිරීම සඳහා යක්ෂාත්ම ක්‍රියාකාරකම්වල යෙදීමට ඔබ ඔහුට අවස්ථාවක් ලබා දෙන්නෙහිය.

- ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන්න. යක්ෂාත්මවලට හා දෙවියන්වහන්සේගේ ආත්මයට එකම ආත්මික භාජනයක වෙසෙන්නට නොහැකිය.

- යක්ෂයන් කෙරෙහි සිත වසඟ කර නොගන්න. ඔවුන් ගැන දේව වචනය පවසන දෙය හෝ දේව වචනය පදනම් කරගත් මෙවැනි පාඨමාලා හෝ අධ්‍යයනය කිරීම වැරදි නැත. එහෙත් ලෞකික පොත් නොකියවන්න. යක්ෂයන් ගැන ඉගෙන ගැනීමට විවිධ පන්තිවලට නොයන්න.

- ගුප්ත දේ සමග කිසිදු සම්බන්ධතාවක් නොපවත්වන්න. මායාකරුවන්, ජේනකියන්නන්, දෛවඥයන්, අත බලා ශාස්ත්‍ර කියන්නන්, හඳහන් බලන්නන් ආදීන් ඇසුරු නොකරන්න. ව්‍යාජ දෙවිවරුන්ට සේවය නොකරන්න. ඔබගේ නිවෙසට ප්‍රතිමා නොගෙනෙන්න (ද්වි. 7:25-26).

## ස්වයං පරීක්ෂණය

1. සුවයේ පොරොන්දුව මතකයෙන් ලියන්න.

2. මිදීම ලැබූ අය රැකබලා ගැනීමේ පසු කටයුතු සඳහා වන මාර්ග නිර්දේශ සාරාංශ කරන්න.

3. යක්ෂාවේශ බලවේගවලින් ආරක්ෂාවීම සඳහා වන මාර්ග නිර්දේශ සාරාංශ කරන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## එය ක්‍රියාත්මක කිරීම

**ඔබ හෝ ඔබ සේවය කරන කෙනෙකු හෝ මිදීම අත්දැක තිබේ නම්, ඔබ පහත දැක්වෙන දේ කරන අන්දම සුවිශේෂිව ලියන්න.**

**ගුප්ත දේ අත්හැරීමේ යාච්ඤාවක් යාච්ඤා කිරීම :**

______________________________________________

______________________________________________

**ගුප්ත දේ විනාශ කිරීම :**

______________________________________________

______________________________________________

**ආත්මික හිදැස පිරවීම :**

______________________________________________

______________________________________________

**ඔබගේ සාක්ෂිය ප්‍රකාශ කිරීම :**

______________________________________________

______________________________________________

**යක්ෂාත්ම බලවේගවලින් ඔබ ආරක්ෂා වීම :**

______________________________________________

______________________________________________

# හත්වැනි කොටස

# රාජ්‍යයට අනුකූලව ජීවත්වීම

මෙම පාඨමාලාව ආරම්භයේදී ඔබ දෙවියන් වහන්සේගේ රාජ්‍යය හා සාතන්ගේ රාජ්‍යය අතර පවතින්නාවූ මහත් සටන පිළිබඳව, එනම් ආත්මය හා ප්‍රාණය යන ආත්මික තලයෙහි මෙන්ම භෞතිකව ශාරීරික තලයෙහි විදහා දැක්වෙන සටන පිළිබඳව අධ්‍යයනය කර ඇත.

සතුරා විසින් ශරීරයට රෝග ඇසුරින් පහර දීම පිළිබඳව සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පාපයට වන්දි ගෙවීමේ මරණය තුළින් එයට පෙරලා පහරදීම මගින් ලබන දිව්‍ය සුවය පිළිබඳව ඉගෙන ගෙන ඇත. එසේම ඔබ සුවය හා මිදීම ලබාදීමට මෙහෙ කිරීමටත් එය ලබාගැනීමටත් ශිල්පීය උපක්‍රම ඉගෙන ගෙන ඇත.

මෙම අවසාන කොටසෙහි දී ඔබ දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි නිරෝගි_සටන්කරුවෙකු ලෙස ජීවත්වන ක්‍රමය ඉගෙන ගනු ඇත.

# විසිවෙනි පරිච්ඡේදය
# නිරෝගි සටන්කරුවෝ

**අරමුණු**

මෙම පරිච්ඡේදය අවසන් වන විට ඔබට පහත දේවල් කිරිමට හැකිවනු ඇත.

- සුවයෙහි පොරොන්දුව මතකයෙන් ලිවීමට
- දිව්‍යමය නිරෝගිකමෙහි හැසිරීම පිණිස බයිබලිය උපදෙස් සාරාංශ කොට දැක්වීමට
- යහපත් සටන්කරුවකු ලෙස දිව්‍යමය නිරෝගී බව තුළ හැසිරීම

**සුවය ලැබීම සඳහා අත්පත් කරගත යුතු පොරොන්දුව:**

**ස්වාමින් කෙරෙහි ප්‍රීතිමත්වෙව: උන්වහන්සේද ඔබගේ සිතෙහි ආශාවන් ඉෂ්ටකරනසේක. ඔබගේ මාර්ගය ස්වාමින්ට භාරදෙව: උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබව. උන්වහන්සේ එය ඉෂ්ටකරන සේක. (ගීතාවලිය 37:4-5)**

## හැඳින්වීම

ඔබ දුර්වලව, රෝගීව සහ ශාරීරිකව වේදනාවෙන් පෙළෙන කල සාතන්ට හා ඔහුගේ දුෂ්ඨ බලවේගවලට එරෙහිව ආත්මික සටනක් දියත් කිරීම අපහසුය. සාතන් ඔබගේ භෞතික ශරීරයට එරෙහිව පහර දීමට හේතුව එය වේ. ඔබ රොගාතුරව සිටින කළ ආත්මිකව සටන්කාමියෙකු වීම කාර්යක්ෂමව කළ නොහැකි බව සාතන් දනී.

ඔබ සුවය ලබාගැනිමට සේවය කිරීම මෙන්ම සුවය අත්පත්කරගැනිමට ශිල්පිය උපක්‍රම ඉගෙන ගෙන ඇත. එසේම ඔබගේ සිරුර යක්ෂයාගේ පහරදීමෙන් ආරක්ෂා කර ගත හැකි ක්‍රමය පිළිබඳවද බයිබලය බොහෝ කරුණු පවසයි. බයිබලය, දේව රාජ්‍යයෙහි ශාරීරිකව මෙන්ම ඇත්මිකව ජීවත්වීම සඳහා ප්‍රතිපත්ති උගන්වා දෙයි.

ස්භාවික ලෝකයෙහි රෝග වළක්වාලිමට මෙන්ම සුවකිරීමට සමත් බෙහෙත් පවතින්නාක් සේම, දේව වචනයෙහිද වළකාලිමේ හා සුවකිරීමෙහි හැකියාව සහිත කරුණු ඇතුලත් වේ. වළකාලිමේ හැකියාව ඇති කාරණා මගින් රෝගී වීම "වලකාලයි" කිසියම් අයුරකින් රෝගී වූ කළ "සුවපත් කිරීමේ" කාරණා මගින් සුවය ලැබේ.

පහත සඳහන් ප්‍රතිපත්ති සුවය ලබාගැනිමටත් යහපත් නිරෝගිබවින් යුතුව ජීවත්වීමටත් උපදෙස් සහිත මගපෙන්වීම් වේ. එහි වළක්වාලිමේ මෙන්ම සුවකිරීමේ කරුණු ඇතුලත්ය. ශාරීරික නිරෝගිකම පිළිබඳව ද අනෙක් අය හට කරුණු බෙදා දීම සඳහාත් එවැනි කාරණාවලදී බුද්ධිමත් අයුරින් දෙවියන් වහන්සේ හා සමග එකමුතුව ක්‍රියාකිරීම සඳහාත් ඔබ මෙම ප්‍රතිපත්ති දැන සිටිම ඉතා වැදගත් වේ. දෙවියන් වහන්සේට නිරෝගි සටන්කාමීන් අවශ්‍ය වේ.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තමාගේ ගැළවුම්කරු ලෙස පිළිගන්න:**

ඔබ මෙය කළ විට නැවත උපත ලැබූ කිතුබැතියෙකු එනම් දෙවියන් වහන්සේගේ දරුවකු වනු ඇත. බයිබලය සිරෝෆිනිය කන්තාවගේ කතාව ඇසුරින් උගන්වන්නේ සුවය දරුවන්ට අයිති ආහාරයක් බවය. එය දේව දරුවනට අයත් බවය. (මාර්ක් 7:24-30)

දෙවියන් වහන්සේගේ අනුග්‍රහයෙන් යුතුව අන්‍ය භක්තිකයන්වද සුවකොට එය ඔවුන්ව ගැළවීම වෙත දිනා ගැනිමට භාවිත කරන සේක. එනමුත් සැබවින්ම සුවය "දරුවන්ට අයත් ආහාරය" වේ. එබැවින්ම ඔබ යේසුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනිමෙන් ශාරීරික සුවය හිමි කරගැනිම උදෙසා නිසි ලෙස ඇත්මිකව සනාථගත වනු ඇත.

ඔබ දැනටමත් ඇදහිලිවන්තයෙකු නම් පව් කොට ඇත්නම්, පාප සමාව උදෙසා ඔබ සතු වරප්‍රසාද ක්‍රියාත්මක කරමින් පව් සමාව ඉල්ලා සිට එය හිමි කරගන්න (1 යොහාන් 1:8-9). ඔබ නිරතුරුව පවිත්‍ර වී සිටිමෙන්, ඔබගේම පාපය නිසා රෝගාතුර වීමෙන් වැළකී සිටිනු ඇත.

**දෙවියන් වහන්සේගේ මාළිගාව නැවත එතුමාටම දෙන්න:**

ඔබගේ ශරීරය දෙවියන් වහන්සේගේ මාළිගාවය. එබැවින් ඔබගේ භෞතික ශරීරය එතුමාගේ පරමාර්ථය උදෙසා පුදන්න: 1 කොරින්ති 6:13, 19-20, රෝම 12:1

**පළමුව දේව රාජ්‍යය සොයන්න :**

ඔබ පළමුකොට දේව රාජ්‍යය සොයන කළ, අත් සියලු දේ ඔබට එකතු කරනු ලැබේ (සුවය ද ඇතුළුව): මතෙව් 6:33.

**ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන්න:**

යේසුස් වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණවන තුරු කිසිවිටකත් හාස්කමක් සිදු නොකළ සේක. මුල් කාලීන සභාවෙහි ශුද්ධාත්මයාණන් ඔවුන් වෙත පැමිණි කල බලය ලද බව බයිබලය උගන්වයි. ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ තුළ වාසය කරයි නම්, උන්වහන්සේ ඔබගේ මෙම මරණීය සිරුර දැන් සහ නැවත නැගිටීමෙහිදී ප්‍රාණවත් කරණු ඇත. ශුද්ධාත්ම බලයෙහි කොටසක් නම් සුවකිරීමට ඇති බලය වේ. ශුද්ධාත්ම බලයෙන් පූර්ණව සිටීමෙන් ඔබ හට නිරෝගිකමෙහි හැසිරීමටත් සුවය රැකගැනීමටත් උපකාරී වේ. ජීවනය ලබාදෙන්නේත් ඔබව ප්‍රාණවත් කරවන්නේත් ආත්මයාණන් වහන්සේ සහ ආත්මයාණන් වහන්සේගේ වචනයයි. ගීතාවලිය 119:25-50. ගීතාවලිය 119 අධ්‍යයනය කරන්න. එහි ආත්මයාණන්ගේ ප්‍රාණවත් කිරීම පිළිබඳව 11 වතාවක් සඳහන් වී ඇත.

## දෙවියන් වහන්සේට භයවන්න:

දෙවියන් වහන්සේට භය ඇත්තන් හට සුවය ඇති බව බයිබලය පොරොන්දු වෙයි. මලාකි 4:2 ; රෝම 8:15

## දෙවියන් වහන්සේ සමග සමීප සම්බන්ධතාවක් ගොඩනගා ගන්න :

සුවය "උන්වහන්සේගේ පියාපතෙහි" පවත්නා බැවින් ඔබ සුවය සොයන කෙනෙකු හෝ වෙනත් පුද්ගලයෙකුගේ සුවය සඳහා මෙහෙයෙහි යෙදී සිටින්නෙකු ලෙසම එතුමාගේ පියාපත් යටතෙහි සිටිය යුතු වේ (මලාකි 4:2). මිදි අත්තක් මිදි වැලට යාවී පවතින්නාක් සේ ස්වාමීන් වහන්සේ "තුළ පැවතීම" සමීප සම්බන්ධතාවක් දැරීමකි. එමගින් ජීවනයෙහි සහ සුවයෙහි "සාරය" ගලාබසින මිදි වැලට ඔබව සවි කොට තබයි.

## ඔබගේ ජීවිතයෙහි වචනයට ප්‍රමුඛතාවය දෙන්න :

හිතෝපදේශ 4:20-23 දක්වා අධ්‍යයනය කරන්න. ඔබ දේව වචනයට ප්‍රමුඛතාවය දෙමින් ඔබගේ මනසින්, ඇසින්, කනින් හා හදවතින් ඒ කෙරෙහි යොමු විය යුතු බව සලකන්න. මුළු ශරීරයටම ඉන් බලපෑම් ඇතිවේ.

**මාගේ වචනවලට ඇහුම්කන් දී** : යනු වචනයට නොබෙදුනු අවධානය යොමු කරන්න යනු වේ.

**මාගේ කීම්වලට නුඹේ කන යොමා** : ගතානුගතික අයුරින් ඇසීම සිදු නොකරන්න. දෙවියන්වහන්සේගේ වචනය පිළිබඳ අනෙක් මනුෂ්‍යයන් දෙන්නාවූ පරිවර්තනවලට ඇහුම්කන් දීම සිදු නොකරන්න. එය ඔබගේම කනින් අසන්න.

**ඒවා නුඹේ ඇස් ඉදිරියෙන් පහ නොවේවා :** ඔබගේ දෑස දේව වචනයෙහි පුහුණුකොට තබාගන්න. ප්‍රතිවිරුද්ධ වාතාවරණයන් දෙස නොබලන්න. මාංශික හැඟීම් අනුසාරයෙන් නොබලන්න. මාංශය ආත්මය සමග ප්‍රතිවිරුද්ධ වන කල, ආත්මික සංවේදිතාවය මත යැපෙන්න.

**නුඹේ සිත තුළ ඒවා තබාගන්න :** දේව වචනය ඔබ හද තුළ සජීවීව පවත්වාගන්න. ඔබගේ භෞතික මනුෂ්‍යයාට ආහාර සපයන අයුරින්ම ආත්මික මනුෂ්‍යයාව ද පෝෂණය කරන්න.

**මක්නිසාද ඒවා සම්බවන්නන්ට ඒවා ජීවනයත් ඔවුන්ගේ සකල ශරීරයට සුවයත් වේ :** දේව වචනය ඖෂධ වැනිය. එය සුවය ගෙන දෙයි (ගීතා 107:17-20). ශක්තිය සපයයි (ගීතා 119:25-28). නිරෝගිකම කෙරෙහි දේව වචනයෙහි බලපෑම සොයා බැලීමට හිතෝපදේශ 3 පරිච්ඡේදය බලන්න.

වෛද්‍යවරයෙකු බෙහෙත් වට්ටෝරුවක් නියම කළ විට, සුව වීම සඳහා ඉන් දිනකට වාර ගණනක් ගැනීමට උපදෙස් දෙයි. ඔහු ඔබට එම බෙහෙත් ශරීරයෙහි අභ්‍යන්තරයට ගත යුතු බව පැවසූ නමුත් ඔබ එය පපුවෙහි ගා පිරිමැදීමට තීරණය කළහොත් ඉන් පලක් නොවේ. ඔබ සුවවීම සඳහා වෛද්‍යවරයාගේ උපදෙස් අනුගමනය කළ යුතුවේ. දෙවියන්වහන්සේගේ වට්ටෝරුව මෙයයි. ජීවනය සහ නිරෝගීබව උදෙසා රෝග වළකාලීමට හා සුවපත් කිරීමට නියමිත බෙහෙත වනුයේ එතුමාගේ වචනයයි. එබැවින් ඔබ එය රැගෙන නිවැරදි අයුරින් භාවිත කොට අදාළ කරගත යුතු වේ.

වෛද්‍යවරයා ඔබ අමතා ඔබගේ තත්වය භයානක බවත් ශල්‍යකර්මයක් කළ යුතු බවත් පැවසූවහොත්මට ශල්‍යකර්මය සඳහා කාල වේලාවක් නැහැ යැයි ඔබට පැවසිය නොහැකිය. ඔබට ඔබගේ රැකියාව අහිමි වුවත් කෙසේ හෝ ඒ සඳහා ඔබ කාලයක් සොයා ගනු ඇත. ඔබ ඔබගේ වැඩසටහන් කාලසටහන් සියල්ල නැවත අලුතින් සකසා ගනු ඇත. ඔබ එවැනි අයුරින්ම දේව වචනයෙහි බෙහෙත් කෙරෙහිත් ඥානාන්විත ලෙස ක්‍රියාකරන කළ එමගින් ඔබගේ සිරුරට සුවය ගෙන දෙනු ඇත. ඔබගේ තත්වය අයහපත් සේ දැනේ නම් බයිබලය කියවීමේ කාලය දෙගුණ කරන්න. එතුමාගේ වචනය ආත්මය හා ජීවනයයි. එමගින් සුවය ගෙන දෙයි.

## දේව වචනයට කීකරු කමින් හැසිරෙන්න :

ඔබ දේව වචනයට කීකරු කමින් ජීවත් වුවහොත් පාපයෙහි ඔබ නොහැසිරෙන බැවින් පෞද්ගලික පාපයෙහි ප්‍රතිඵලයක් ලෙස රෝගාතුර වීම ඔබට වළක්වා ගත හැකි වනු ඇත. දාවිත්ගේ

පෞද්ගලික පාපයෙහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ මානසික, ශාරීරික, ආත්මික හා හැඟීම් තත්වය ගීතාවලියෙහි 38 හි වාර්තා කර ඇත.

දෙවියන්වහන්සේ ඔබට ප්‍රතිචාර දක්වනුයේ කීකරුකමේ පදනම මත වේ (1 යොහන් 3:24). ඔබගේම පෞද්ගලික පාපය හේතුකොට ගෙන රෝගාතුර වීමෙන් වැළකී සිටීමට, ධර්මිෂ්ඨ ලෙස ජීවත් වීම ඔබට උපකාරී වනු ඇත. දේව වචනයට අනුකූලව ජීවත් වීම මගින් සමහර ලෙඩ රෝග වැලඳීමෙන් ඔබව ආරක්ෂා කරයි. ලිංගිකව සම්ප්‍රේෂණය වන්නාවූ ලෙඩ රෝග වැනි දෑ වලින් ආරක්ෂා කරයි.

දේව වචනයට කීකරුව හැසිරීම සඳහා යාච්ඤාව, අධ්‍යනය හා වචනය අදාළ කරගැනීම ඇතුළත් වේ. දේව වචනයට කීකරුව ජීවත්වන්නන් සඳහා ශාරීරික නිරෝගිකම සපයන බවට පවතින පොරොන්දුවලට උදාහරණ ලෙස ගීතාවලිය 128, ද්විතිය කථාව 28, නික්මයාම 15:26 බලන්න.

## ඔබගේ හදවත සහ ආත්මය ආරක්ෂා කරගන්න :

නිරෝගිකම සහ ප්‍රාණය අතර සම්බන්ධතාවයක් පවතී (3 යොහන් 2). හදවතින් ගලා එන ජීවනයේ බලවේගයන් සුවකිරීමේ බලය ගෙන දෙයි. ජීවනයේ බලවේගයන් නිකුත්වනුයේ ඔබගේ ආත්මයෙනි. ඔබ තුළ තිත්ත, කෝපයෙන් යුත් ආත්මයක් පවතී නම් එය ඔබ හට ශාරීරිකව බලපානු ඇත. තැතිගැන්මෙන් යුතුව අසහනකාරීව හැසිරීමට බොහෝ සේ මුල් වනුයේ අනාගතයෙහි ජීවත් වීම තුළය. දෝෂාරෝපණය හා අමනාපය අතීතයෙහි ජීවත් වීමෙන් හටගනී. දෙවියන්වහන්සේ පවසන්නේ අතීතයෙහි ඇති දෑ අමතක කිරීමට මෙන්ම අනාගතය පිළිබඳව කනස්සලු නොවන්න යනුවෙනි.

දෙවියන්වහන්සේ විශ්වයෙහි ආකෘතිය සාදා ඇත්තේ දිනපතා ක්‍රියාත්මක වන්නාවූ රටාවකටය. යේසුස්වහන්සේ අපට යාච්ඤා කිරීමේදීඅද දවසෙහි අපගේ අවශ්‍යතාවය අපට දුන මැනව යනුවෙන් ඉගැන්වූයේ එබැවිනි. අප එම රටාව අපගේ හදවතෙන් සහ ආත්මයෙන් බිඳ දමමින් අතීතයෙහි හෝ අනාගතයෙහි ජීවත් වන කළ අපව රෝග වෙත යොමු කරන්නාවූ හැඟීම් ඇතිවේ.

මිනිස් සිරුර තුළ වාසය කරන්නාවූ මිනිස් ආත්මය සිරුරට ජීවනය හා ශක්තිය සපයා දෙයි. ආත්මය සිරුර හැර ගිය විට, කෙතරම් ශක්තිමත් සිරුරක වුවද ජීවනය තුරන් වී දිරා යෑමට පටන් ගනී. ආත්මය ශරීරයට නැවත ඇතුල් වූ කල නැවත ශරීරය ප්‍රාණවත් වේ. එබැවින් ආත්මයෙහි පලුදුවීමක් (හිඩැසක්) මගින් යක්ෂයාගේ බලවේගයකට, එනම් රෝගයකට පවා ඇතුල්වීමට ඉඩ සැපයේ, තිත්තකම, කෝපය, කනස්සල්ල, තරගය යනාදී සියල්ල මාංශයෙහි ක්‍රියාවන්ය (ගලාති 5:19-21).

මනුෂ්‍යයෙකුගේ තුවාලවූ ආත්මය ඔහුගේ ශරීරය කෙරෙහි බලපාන බව හිතෝපදේශ 18:14 පෙන්වා දෙයි. හිතෝපදේශ 17:22හි තුවාලවූ ආත්මය ශරීරය කෙරෙහි බලපාන අන්දම පෙන්වා දෙයි. ගීතාවලිය 38, පාපය ඔබගේ ශාරීරික හා හැඟීම් කෙරෙහි දක්වන සම්බන්ධතාවය පෙන්වා දෙයි. එසේම හිතෝපදේශ 16:24 සහ 12:18 පෙන්වා දෙන්නේ ඔබගේ කතාබහ ඔබගේ භෞතික ශරීරය කෙරෙහි ඇති කරන බලපෑමය. ඔබගේ හැඟීම් ශුද්ධාත්මයාණන්ගේ පාලනය යටතට ගෙන එන්න. මෙය කළ හැක්කේ ඔබ තුළ ශුද්ධාත්මයාණන්ගේ ඵල වර්ධනය කිරීමට දෙවියන්වහන්සේට ඉඩ හැරීම මගින්ය. සුව වීම ආත්මයෙන් ඇරඹෙන බැවින්, ශුද්ධාත්ම ඵල මගින් සුවය ළඟාකර දිය හැකිය (ගලාති 5:22-25; රෝම 8:26).

## සුවය හා සම්බන්ධ ස්වභාවික නීති අනුගමනය කරන්න :

මනුෂ්‍යයන්ගේ රෝගාබාධවලින් 60% ක් සෞඛ්‍ය සම්පන්න නොවන ජීවිත රටාවන් හේතු කොට ගෙන වැළඳෙන රෝග බවට වෛද්‍යවරු සොයාගෙන තිබේ. බයිබලයෙහි නිරෝගී ජීවිතයක් උදෙසා අනුගමනය කළ යුතු ස්වභාවික නීතිරීති පිළිබඳ උදාහරණ බොහෝ ඇතුලත්ව පවතී. “ඔබ සුව කරන්නාවූ දෙවිඳුන් මම වෙමි” යි පැවසූ දෙවියන්වහන්සේම පැරණි ගිවිසුමෙහි නීතිරීතිවල නිරෝගිකම උදෙසා ප්‍රායෝගික අණ පනත් සපයා දුන් සේක. පාවුල් නැවෙහි සිටි මනුෂ්‍යයන් හට ඔවුන්ගේ නිරෝගිකම සඳහා කෑම ගත යුතු බව පැවසීය (ක්‍රියා 27:34). අපවිත්‍ර ජලය වෙනුවට මුද්‍රික පානය බොන ලෙස ඔහු තිමෝතිට පැවසුවේය (1 තිමෝති 5:23).

ශරීරය, ආත්මය මෙන්ම ශුද්ධ වන්නේ එය දෙවියන්වහන්සේගේ මාළිගාව බැවිනි. ඔබ දෙවියන්වහන්සේගේ ස්වභාවික නීති සමග එකඟ වෙමින් සුදුසු ලෙස විවේකය ගැනීම, ව්‍යායාමයෙහි යෙදීම හා ආහාර පාන නිසි ලෙස ගැනීමෙන් දිව්‍යමය නිරෝගී බවින් ජීවත් වීමට ඔබට එය උපකාරී වනු ඇත. ඔබගේ ශරීරය දෙවියන්වහන්සේගේ මාළිගාව බැවින් ඒ තුළට විනාශකාරී ද්‍රව්‍ය අඩංගු මධ්‍යසාර, සිගරට් හෝ ඇබ්බැහි විය හැකි ඖෂධ යනාදිය ඇතුලත් නොකරන්න.

## ක්‍රිස්තුස් වහන්සේගේ සිරුර නිසියාකාරව විමසා බලා දැනගන්න :

ශුද්ධ සහභාගිකමෙහිදි ක්‍රිස්තුස්වහන්සේගේ සිරුර නිසියාකාරව විමසා බලා දැන ගැනීම ඔබ දැනටමත් ඉගෙන ගෙන තිබේ. බොහෝ දෙනෙකු එසේ නොකිරීම නිසා දැනටම රෝගාතුරව දුර්වලව සිටින බව බයිබලය පවසයි.

## ඔබ රෝගාතුරව සිටින කල දෙවියන් වහන්සේ ඔබ සුවකිරීමට අපේක්ෂා කරන බව විශ්වාස කරන්න :

ඔබ තවමත් සුවය අත්විඳ නොමැති වුවත් දෙවියන් වහන්සේට ඔබව සුවකිරීමට අවශ්‍ය බව විශ්වාස කරන්න. සැපයීම සහ බලය විදහා දැක්වීම එකිනෙකට වෙනස් වේ. ගැළවීම පිණිස සැපයීම ඔබ ඉපදීමටත් වසර සිය ගණනකට පෙර දෙන ලද්දකි. එය ඔබ තුළ විදහා දක්වන ලදී. විශ්වාස කිරීම යනු සැපයීම තවමත් අත්දැක නැති නමුත් (සුවය) කෙරෙහි නිසැකකමින් යුතුව සිටීමය. විශ්වාස කිරීම, අයිතිය ප්‍රකාශ කිරීමට වඩා වෙනස් දෙයකි. මනුෂ්‍යයෝ රෝගයක රෝග ලක්ෂණ බැරෑරුම් ලෙස පෙන්නුම් කරන අතරම තමුන් සුවවී ඇතැයි ප්‍රකාශ කිරීම නිසා බොහෝ මනුෂ්‍යයෝ දිව්‍යමය සුවයෙන් ඉවත්වීමට යොමු වී ඇත.

විශ්වාසකිරීමේදි දේව වචනය විශ්වාස කරමු. නමුත් ස්වභාවිකව පෙනෙන්නාවූ රෝග ලක්ෂණ ඇති බවට ප්‍රතික්ෂේප නොකරමු. ඔබගේ ශරීරයට සාතන් පහර දී ඇති බවට තැනින් තැනට ගොස් ස්වේච්ඡාවෙන්ම ප්‍රචාරය කරමින් යක්ෂයා මහිමයට පත් කිරීමට ඉදිරිපත් නොවන්න. එනමුත් කවුරු හෝ ඔබගෙන් විමසුවහොත් සැමවිටම සත්‍ය පවසන්න. "මට හෘදයාබාධ රෝග ලක්ෂණ තිබෙනවා" හෝ "වෛද්‍යවරු මට හෘදරෝග තත්වයක් ඇති බව රෝග විශ්වාස කොට පවසා ඇත". යයි කියන පුද්ගලයා හට දේව වචනය තුළින් පිළිතුරු සපයන්න. "නමුත් උන්වහන්සේගේ කස පහර තුළින් මට සුවය ලැබී තිබේ".

මෙය යේසුස්වහන්සේගේ උදාහරණ අනුගමනය කිරීමකි. උන්වහන්සේ යථාර්ථය මඟහැර හෝ නොමැති බව හෝ ප්‍රකාශ කළේ නැත. යේසුස්වහන්සේ පැහැදිළිව ප්‍රකාශ කළේලාසරස් මිය ගොස් ඇත. නමුත් මම ඔහු නැවත නැගිටවීමට යන්නෙමි කියාය. එය සත්‍ය සාධක හා ඇදහිල්ල අතර ඉතා සියුම් සමබරතාවයක කාරණාවකි.

## යේසුස්වහන්සේ තුළින් දෙවියන් වහන්සේ ඔබගේ සුව කරන තැනැත්වහන්සේ ලෙසට පිළිගන්න :

නික්මයාම 15:26; ගිතාවලිය 147:3; මතෙව් 8:17 බලන්න.

පාපය සහ රෝගය සාතන්ගේ දුෂ්ඨකම් යුවලකි. ගැළවීම සහ සුවය දෙවියන් වහන්සේගේ සැපයීමය. කල්වරියට පෙර විසූ ජනතාව, ඇදහිල්ලෙන් කල්වරිය දෙස බැලීමෙන් ගැළවීම ලබා සුවය අත්වින්දෝය. ඉන්පසුව ජීවත් වන අය කල්වාරිය දෙසට නැවත හැරී බලා ඇදහිල්ලෙන් අත්පත් කරගනිති. ඔබ යේසුස්වහන්සේ ඔබගේ ගැළවුම්කරු ලෙස පමණක් පිළිගත්තේද? නැත්නම් සුවකරන්නා ලෙසත් පිළිගත්තේද? ඔබ කිසිම දිනක එතුමාව ගැළවුම්කරු ලෙස පිළිගෙන නැතිනම්, එතුමා ඔබව පාපයෙන් ගළවාගන්නේ කෙසේද? ඔබ කිසිම දිනක එතුමාව සුවකරන්නා ලෙස පිළිගන්නේ නැත්නම් එතුමා ඔබව රෝගයෙන් ඉවත්කොට තබන්නේ කෙසේද?

යේසුස්වහන්සේ ඔබගේ පාපය උසුලාගත් අයුරින්ම එකවරම ඔබගේ ලෙඩ රෝගද උසුලාගත් සේක (මතෙව් 8:17). එහි වරප්‍රසාද සුවයද ඇතුලත්ව අප අමතක නොකළ යුතුය (ගීතා 103:1-3). යේසුස්වහන්සේගේ පූජාවීමේ ආදේශ මරණය මත දෙවියන්වහන්සේ එකවරම පාපය හා ලෙඩ රෝග උසුලාගැනීමට එතුමාට සැලසුසේක. එසේ හෙයින් ඉන් කොටසක් අපට අයිති වන බවත් අනෙක් කොටස අයිති නොවන බවත් පැවසිය හැක්කේ කෙසේද?

රෝම 10:9 හි ගළවනු ලැබූ යනුවෙන් භාවිත කර ඇති පදයත්, මාර්ක් පොතෙහි උන්වහන්සේට අත ගැසූ සියලු දෙන සම්පූර්ණයෙන්ම සුව කරනු ලැබූහ යන කොටසෙහිත් යොදා ඇති පදයත් එකම වේ. ගැළවීම නම් පාපය හා එහි වන්දියෙන් මිදීම ලැබීමය. රෝගය එම වන්දියෙහි කොටසකි. ග්‍රීක බසින් sozo යන වදනෙහි ශාරීරික මෙන්ම ආත්මික සුවයද අන්තර්ගත වේ. මිදීමෙහි පරිච්ජේදය වන යෙසායා 53 හි සුවය සඳහා අපහට සැපයීම පිළිබඳව නිසැක (අවධාරණය කරන ලද වචනය) වචනය ඇතුලත් කිරීමෙන් එය තහවුරු කර දෙයි.

ඔබ හට පාපයෙහි සහ රෝගයෙහි බැඳුම්වලින් නිදහස් විය හැකිය. උන්වහන්සේ ඔබගේ සියලු අයුතුකම්වලට කමා කරන සේක. රෝග සුවකරන සේක (ගීතාවලිය 103:3). යේසුස්වහන්සේ කතාකොට,වඩා පහසු කුමක්ද? පව් සමාව දීමද නැතහොත් සුවකිරීමද? කියා පැවසුවේ එබැවිනි (මාර්ක් 2:9).

## ඔබගේ සුවය උදෙසා ඇදහිල්ල වැඩි කර ගන්න :

ඇදහිල්ල නොමැති වීම සුවවීමට බාධා පමුණුවයි. එබැවින් ඔබගේ සුවය පිණිස ඇදහිල්ල වැඩි කරගත යුතු වේ. එය ඇදහිල්ලේ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු වීමට ඇති අවශ්‍යතාවයක් නොව, ශ්‍රේෂ්ඨ දෙවියන් වහන්සේ කෙරෙහි සුළු ඇදහිල්ලක් ඇති සාමාන්‍ය පුද්ගලයෙකු වීමකි. ඇදහිල්ල නම්

දෙවියන් වහන්සේට සුව *කළ හැකි බව* විශ්වාස කිරීම නොව, එතුමා ඔබව *සුව කරන බවට* විශ්වාස කිරීමය. දෙවියන්වහන්සේට සුව කළ හැකි බව සාතන් විශ්වාස කරයි: එහෙත් එතුමා සුව කරන බවට ඇති සත්‍යය ඔබගෙන් වසන් කර තබයි.
සුවය සඳහා ඔබගේ ඇදහිල්ල අත්‍යාවශ්‍යයෙන්ම තිබීම අවශ්‍ය නොවේ. එය තිබීම යහපත් වුවත් සෑම සුව කිරීමක් සඳහාම එය පූර්ව අවශ්‍යතාවක් නොවේ. යේසුස්වහන්සේ සුව කිරීමේ මෙහෙය ඉටු කළ අවස්ථාවන්හිදී ඇදහිල්ල තිබිමට නොහැකි වූ බොහෝ දෙනෙකු සුවය ලැබූහ. ඒ අතර සමහරු මියගොස් සිටියහ. සමහරු සුවය ලැබුවේ ඔවුන්ව දෙවියන් වහන්සේ වෙතට රැගෙන ආ තම නෑයන්ගේ හෝ මිතුරන්ගේ ඇදහිල්ල අනුවය.
ඔබගේ ඇදහිල්ල සුව වීම උදෙසා එක් මාධ්‍යයක් පමණි, නමුත් එම මාධ්‍යය දෙවියන්වහන්සේ භාවිත කරන මාධ්‍යය බැවින් ඔබ එය වර්ධනය කර ගැනීම වැදගත්ය.

අ. සුවකිරීමේ ඇදහිල්ල නොවන්නේ :

1. ඔබ ගැලවීමට පැමිණි ඇදහිල්ල
2. අපගේ පියවරුන්ගේ ඇදහිල්ල
3. ඔබගේම ඇදහිල්ල කෙරෙහි රදවන ලද ඇදහිල්ල, ඔබගේ විශ්වාසවන්තකමේ ප්‍රතිචාරය. උදා : "මම මගේ කොටස කළා. දැන් ඔබගේ කොටස ඉටු කරන්න".

ආ. සුවකිරීමේ ඇදහිල්ල නම් :

1. බලාපොරොත්තු වන කාරණාවල අන්තර්ගතයය. නොදන්නා දේ පිළිබඳ සාක්ෂිය.
2. දෙවියන් වහන්සේ පොරොන්දු වී ඇති දෙය එතුමා කරනු ඇතැයි අපේක්ෂා කිරීම.

ඇ. සුවකිරීමේ ඇදහිල්ල විය හැකි වන්නේ :

1. යාච්ඤා කරන පුද්ගලයන්ගේ ඇදහිල්ල
2. සුවය සොයන්නාවූ පුද්ගලයන්ගේ ඇදහිල්ල
3. යහළුවන්ගේ ඇදහිල්ල
4. නෑදෑයින්ගේ ඇදහිල්ල

සුවකිරීම සඳහා ඇදහිල්ල පැමිණෙනුයේ සුවකිරීම පිළිබඳව දේව වචනය ඇසීමෙනි. අත්දැකීම් ප්‍රකාශකිරීමෙන් ඔබගේ ඇදහිල්ල දිරිගැන්වෙනු ඇත. නුමුත් ඔබගේ ඇදහිල්ල වැඩි කර දෙනුයේ දේව වචනයට සවන් දීමෙන් පමණකි. යෙසායා මිදීමේ පරිච්ජේදය අරඹනුයේඅප විසින් දැන්වූ දේ (වාර්තාව) විශ්වාස කළේ කව්ද? වාර්තාව විශ්වාස කිරීමට නම් එය ඔවුන් ඇසිය යුතුය. රෝම 10:17 හි පවසන්නේ ඇදහිල්ල පැමිණෙනුයේ දේව වචනය ඇසීමෙන් බවය. මෙම පදයෙහි වචනය යනුවෙන් අර්ථ දක්වන්නේ දෙවියන්වහන්සේගේ නිශ්චිත ප්‍රකාශයන්ය. සුවය සම්බන්ධයෙන් ගත් කල ඒවා සුවය පිළිබඳව සැලකිලිමත් වන පරිච්ජේදයන්ය.

යේසුස්වහන්සේ මනුෂ්‍යයන්ගේ ඇදහිල්ලෙහි තත්වය පිළිබඳ ඔවුන්ව සුළු කොට තැකුවේ නැත. උන්වහන්සේ තම වචන තුළින් ඔවුන්ව දිරිගන්වා ඇදහිල්ල වැඩි කිරීමට සැලසූ සේක. ඔබ යාච්ඤා කරන කල විශ්වාස කරන්න (ලූක් 11:24). බොහෝ දෙනා තම යාච්ඤාවලට පිළිතුරු ලබා නොගන්නේ ඔව්හු ඇදහිල්ල වෙනුවට බලාපොරොත්තුව (අනාගතය පිළිබඳව) ඇතුව සිටින බැවිනි. ඇදහිල්ල නම්, එය වර්තමාන කාලයට අයිති පදයකි. ඔබගේ යාච්ඤාවත් ශාරීරිකව ප්‍රදර්ශනය වීමත් අතරතුර කාලයෙහි ඔබ රෝග ලක්ෂණ දෙස නොව දෙවියන් වහන්සේ දෙස බලන්න.

## ඇදහිල්ලෙන් ක්‍රියා කරන්න :

ඔබ දේව වචනය කෙරෙහි ඇදහිල්ල විදහා දැක්වෙන පරිදි ක්‍රියා කරන්න බලාපොරොත්තු තුළ නිශ්ක්‍රිය වන අතර ඇදහිල්ල සක්‍රිය වේ. ක්‍රියාවෙන් තොර ඇදහිල්ල අප්‍රාණිකය. ඇදහිල්ල නාම පදයකි: විශ්වාසය ක්‍රියා පදයකි. ඇදහිල්ල විශ්වාසය සමග මුසු කොට ඇදහිල්ලෙන් ක්‍රියා කිරීමට අරඹන්න. මනුෂ්‍යයෝ ඇදහිල්ලෙන් ක්‍රියා කරන කළ දෙවියන්වහන්සේ සැමවිටම ක්‍රියාත්මක වී තිබේ.

– නෝවා නැවක් සෑදුවේය : දෙවියන්වහන්සේ ජලගැල්ම එව්ය
– මෝසෙස් සැරයටිය දිගු කළේය : දෙවියන්වහන්සේ ජලය දෙබෑ කළ සේක.
– යොෂුවා යෙරිකෝව වටා ගමන් කළේය : පවුර බිද වැටුනි

- එළියා වතුරට ගැසීය : දෙවියන්වහන්සේ එය දෙබෑ කළ සේක
- එළියා වතුරට කෝටුවක් දැමීය : දෙවියන්වහන්සේ යකඩය පාවීමට සැලසූ සේක.
- නාමන් සත් වරක් ගිලුනේය : දෙවියන්වහන්සේ ලාදුරු රෝගය සුව කළ සේක.

දෙවියන්වහන්සේගේ වචනය සත්‍ය බවට පිළිගෙන, ඒ අනුව ක්‍රියා කරන කළ දේව වචනය සරල බවට පත් වෙයි. පළමුවන ක්‍රියාව නම් ඔබ ඇදහිල්ලේ පදනම මත සුව වීමට ඉල්ලුම් කිරීමය. බොහෝ ඇදහිලිවන්තයෝ සමහරක් අය දෙවියන්වහන්සේගේ වඩා ප්‍රියජනක අය ලෙසට සලකමින් ඔවුන්ගේ ඇදහිල්ල හා යාච්ඤාව මත යැපෙමින් ඔවුන් තම ජීවිතය ගත කරයි. ගැළවීම ලැබීම සඳහා ඔබ ඔබගේ පාපයට පසුතැවිලි වීම, විශ්වාස කිරීම, පාපොච්චාරණය, යේසුස්වහන්සේ පිළිගැනීම හා සදාකාල ජීවනය ලබාගැනීම කරයි. එසේම ඔබගේ සුවයේදී ද ඔබට ඉල්ලා සිටීමට, විශ්වාස කිරීමට, සුවය ලබා ගැනීමට අයිතිය පවතී. අනෙක් අය ඔබ උදෙසා යාච්ඤා කළ හැකිය. එනමුත් කිසි විටකත් ඔබගේ යාච්ඤාව අනෙක් අයගේ යාච්ඤාවෙන් ආදේශ කිරීමට ඉඩ නාරින්න. මන්ද යේසුස්වහන්සේ පැවසූයේ ඉල්ලන හැමට ලැබෙන බවය. එබැවින් ඔබම ඉල්ලන්න. ඇදහිල්ලෙන් ඔබම ඉල්ලම් කර සිටින්න (ගීතාවලිය 6:2-3).

ඇදහිලෙන් සුවය ඉල්ලුම් කර සිටීමෙන් පසුව ඇදහිල්ලෙන් එය පිළිගන්න. මරියා කතාකොට. ඔබගේ වචනය පරිදි මට සිදුවේවායි පැවසුවාය. ඔබ යාච්ඤා කළ විට ඔබගේ සුවය හිමි කරගත් බව විශ්වාස කරන්න؛ ඔබට හොඳ බව වැටහෙන තුරු නොසිටින්න. ඔබ ගැළවීම ලබාගත් ලෙසම ඇදහිල්ලෙන් සුවය ලබාගන්න. ඔබ ගැළවීම ලැබූ විට. සමහර අවස්ථාවලදී හැඟීම් ඇතිවිය හැකිය. තව සමහර විට එසේ නොවීය හැක. එනමුදු ඔබ ඇදහිල්ලෙන් යුතුව ගැළවීම ලබාගනී. සුවය ලැබීමෙහිදීද මෙය සැබෑවකි.

කෙනෙකු විශ්වාස කරන තුරු ඔබට එම පුද්ගලයාව ගැළවීම ලැබීමට මග පෙන්විය නොහැක. සුව වීම සම්බන්ධයෙන්ද එය එලෙසමය. දෙවියන් වහන්සේට ගැළවිය හැකි බව ඔප්පු කිරීමටද කෙනෙකු ගලවා ගැනීම අවශ්‍ය නොවන්නාක් සේම දෙවියන් වහන්සේට සුව කළ හැකි බව ඔප්පු කිරීමට කෙනෙකු සුවකිරීමට අවශ්‍ය නොවේ.

සුවය ලැබීම ක්‍රම ක්‍රමයෙන් හෝ ක්ෂණිකවම සිදුවිය හැකිය. යේසුස්වහන්සේ විසින් සුවකරනු ලැබූ අන්ධ මිනිසාගේ හා ලාදුරු රෝගියාගේ සුවය ක්‍රමයෙන් අත්විඳි සුවවීමක් විය. යේසුස්වහන්සේ දිනක් අත්තික්කා ගසකට ශාප කළ අතර එහි මුල් මියැදිනි. නමුත් එය වියලීගිය බව ඊළග දිනය තෙක් පෙන්නුම් නොවීය. එම ගස මුල සිට මියගිය නමුත් බාහිරයෙන් දැකිය හැකි අතු හා කොළවලින් එය වියලීම මුලින් පෙන්නුම් වුයේ නැත. සුවයෙහිදී ද මෙම මූලධර්මය සත්‍යතාවයක් විය හැකිය.

ඔබ සුවවී ඇතිදැයි දැනගැනීම සඳහා ඔබගේ ශරීරය දෙස බැලීම අත්වැරැද්දකි. දෙවියන්වහන්සේ සුව කරනුයේ ඔබගේ ආත්මය තුළිනි. උන්වහන්සේගේ වචන පවා 'ආත්මය හා ජීවනය වේ. අප උන්වහන්සේ ආත්මයෙන් නමස්කාර කළ යුතුය. ඔබගේ ආත්මය සමඟ සාතන් සටන් වදින්නේ එබැවිනි (ආත්මික සටන).

ඔබ ඇදහිල්ලෙන් සුවය ඉල්ලා දෙවියන්වහන්සේට අයදුම් කොට, ඔබගේ සුවය පිළිගත් පසුව, දෙවියන්වහන්සේගේ පොරොන්දු මත ඇදහිල්ලෙන් ක්‍රියා කරන්න. ඇදහිල්ල දේව වචනයෙහි පදනම මත ඉදිරියට යමින් ක්‍රියා කරයි. හේතු සාධක කරදර වෙයි, උද්වේග කරවයි, සහ තැති ගනී. හේතු සාධක තර්ක කරන කල, ඇදහිල්ල ඍජුව තදින් නැගී සිටී.

ඇදහිල්ලට වාද කිරීම අනවශ්‍යය. එයට අවශ්‍ය වන්නේ දේව වචනයට අනුකූලව ඉල්ලීමක් ඉදිරිපත් කළ විට, දෘශ්‍යමාන අයුරින් එය විදහා දැක්වීමටත් පෙර, එම කාර්යය ඉටු වී ඇති බව විශ්වාස කිරීමය. ඇදහිල්ල අපේක්ෂිත ප්‍රතිඵලවල ආලෝකයෙහි ජීවත් වේ. එය දැනට පවතින තත්ත්වය හේතුවෙන් බයෙන් වෙලී මිරිකී නොසිටියි. ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයට ගොස් එහි උරුමය හිමි කර ගැනීමේදී වූ ලෙසම ඔබගේ උරුමයෙහි විශාලත්වය රැඳී පවතිනුයේ ඔබ පා තබන, ගමන් කරන සහ අයිතිය ප්‍රකාශ කරන "භූමියේ" ප්‍රමාණය මත වේ.
ඔබ ඇදහිල්ලේ වචන කතා කිරීමට ආරම්භ කරන්න. අපගේ මුඛයේ ප්‍රකාශන (හෝ දේව වචනය ප්‍රකාශ කිරීම, Confession) නම් දෙවියන්වහන්සේ කියන දේ අපද පැවසීමය (හෙබ්‍රෙව් 3:1). දේව වචනය ප්‍රකාශ කිරීම නම් දෙවියන්වහන්සේ පවසන දෙයම ඔබත් පැවසීම සහ ඔබ විශ්වාස කරන දෙය තහවුරු කිරීමකි. දේව වචනයෙහි දෙවියන්වහන්සේ පවසා ඇති කරුණ හදවතින් විශ්වාස කොට මුවින් ප්‍රකාශ කිරීමය. යේසුස්වහන්සේ ඔබ උදෙසා කර ඇති කාරණ සහ එතුමාගේ

අවසන් වුණාවූ ක්‍රියාවෙහි ප්‍රතිඵලයක් ලෙස බයිබලයෙහි පොරොන්දු වී ඇති කාරණා ප්‍රකාශ කරන්න.

දේව වචනය ප්‍රකාශ කිරීම බයිබලයේ ලියා ඇති සත්‍ය සාධක නැවත ප්‍රකාශ කර සිටී. අපගේ එම ප්‍රකාශ කිරීමේ උත්තම පූජක තැන යේසුස්වහන්සේය. උන්වහන්සේ අපගේ ප්‍රකාශ කිරීම උදෙසා ක්‍රියා කරන සේක. එය නිකම්ම "මනසෙන් කරන ක්‍රියාවක්" නොවේ. එසේම එය "ඉල්ලන්න, අත්පත් කරගන්න" යයි වැරදියට භාවිත කරන දෙයක් ද නොවේ. ඇදහිල්ල, විශ්වාස කිරීම සඳහා දකින තුරු බලා නොසිටියි. මන්ද ඇදහිල්ල පැමිණෙන්නේ ඇසීමෙන් මිස දැකීමෙන් නොවන බැවිනි. යේසුස්වහන්සේ ලාසරුස්ගේ සොහොනින් පිටත සිටගෙන යාච්ඤා කළ විට, "ඔබවහන්සේට මාව ඇසුණ බැවින් ඔබට ස්තුති කරමි" යි පැවසූ සේක. උන්වහන්සේ මෙලෙස පැවසුයේ ලාසරුස් තවමත් මියගොස් සිටි තත්ත්වයෙහි සිටියදීමය.

දේව වචනය ප්‍රකාශ කිරීම යනු යථාර්ථය පිළිනොගැනීම නොවේ. ඒ වෙනුවට දේව වචනයෙහි ප්‍රකාශන මඟින් එයට නොබියව මුහුණ දීමය. ඇදහිල්ල වගකීමෙන් තොරව කරන්නාවූ තර්කානුකූල නොවන ක්‍රියාවක් නොවේ. එය ලෝකයෙහි පවතින වඩාත්ම තර්කානුකූල ක්‍රියාව වේ. එය දේව වචනය මත පදනම් වී තිබේ. දැක නොමැති කාරණා පිළිබඳ ඉහළම සාක්ෂිය වන "ස්වර්ගයෙහි සදාකාලයටම බේරුම් කොට ස්ථිර කරන ලද කාරණා" පිළිබඳ දේව වචනය මත පදනම් වූ සාක්ෂිය වේ.

ඔබ හට දේව වචනයට පටහැනි හැඟීම් පැවතියත් එවිටද දේව වචනය ප්‍රකාශ කරන්න. ගැළවීම පිණිස හැඟීම් ඇතිව හෝ නොමැතිව දේව වචනය ප්‍රකාශ කිරීම කරනු ලැබේ. සුවය පිළිබඳවද මෙය සත්‍යයකි. පළමුකොට දේව වචනය ප්‍රකාශ කරන්න, එවිට යේසුස්වහන්සේ ඔබගේ දේව වචනය ප්‍රකාශ කිරීම මත ක්‍රියා කරනු ඇත. ඔබ ජයගනු ඇත්තේ යේසුස්වහන්සේගේ රුධිරය තුළින් හා ඔබගේ මුවේ ප්‍රකාශනය තුළිනි (එළිදරව් 12:11).

ඔබගේ සුවවීම උදෙසා දුක සිතීම (ඔබ සමඟ දුක් විඳීම) අවශ්‍ය නොවන අතර අවශ්‍ය වන්නේ ආදේශකයකි (ඔබ වෙනුවෙන් දුක් විඳීම). යේසුස්වහන්සේ මෙය දැනටම ඉටු කර අවසානය. අසුබවාදී වචන ප්‍රකාශන මඟින් සාතන් හට මහිමය ගෙන දෙයි. ඔබ ඔබගේ කරදර පිළිබඳව පවසන විට, ඔබව කරදරයෙහි දැමීමට සාතන්ට ඇති හැකියාව පිළිබඳව සාක්ෂි දරයි. ඔබ ඔබගේ මුඛයේ වචනවලින් උගුලට හසුවී සිටියි (හිතෝපදේශ 6:2). ඔබගේ මුවේ ප්‍රකාශනය දේව වචනයද නැත්නම් රෝග ලක්ෂණද? දේව වචනය සුවය ප්‍රකාශ කරයි: රෝග ලක්ෂණ රෝගය ප්‍රකාශ කරයි. ඔබ ප්‍රකාශ කර සිටින්නේ කුමක්ද?

ඔබගේ ඇදහිල්ලේ ප්‍රකාශනයෙහි කොටසක් ලෙසට දෙවියන්වහන්සේට ස්තුති කිරීමට අරඹන්න. යෝනා තල්මසාගේ කුස තුළ සිටියදීම තම මිදීම පිළිබඳව දෙවියන්වහන්සේට ස්තුති කළේය. හෙබ්‍රෙව් 13:15හි "ප්‍රශංසාවේ පූජාවක්" පිළිබඳව පවසයි. අප දොරටුවෙන් ඇතුල් වන කල මිස ප්‍රශංසාව රැගෙන ආ යුතු වන්නේ අපගේ ඉල්ලීම සම්පූර්ණ වී දොරටුවෙන් පිටවී යන විට නොවේ.

ගීතාවලිය 50:14-15, පෙන්වාදෙනුයේ ගැළවීමෙහි තාප්පයෙහි ඇති දොරටුව නම් ප්‍රශංසාව බවය. ප්‍රශංසාව මඟින් ඔබට ඔබගේම දොරටුව ස්ථාපනය කොට ඒ තුළින් ගැළවීමේ ප්‍රයෝජන අත්පත් කර ගැනීම සඳහා ඇතුලට ඇවිද යාමට හැකිය. ඔබ යේසුස්වහන්සේ ඔබගේ ස්වාමීන්වහන්සේ ලෙස ප්‍රකාශ කොට නොඇදහිලිවන්තයෙක් මෙන් ක්‍රියා නොකරනු ඇත. උන්වහන්සේ ඔබව සුව කරන්නා ලෙස ප්‍රකාශ කොට, නොඇදහිලිවන්තයෙක් ලෙස ක්‍රියා නොකරන්න.

දේව වචනයෙහි බල රහිත කිසිම වචනයක් නොමැත. පේතෘස්ට දැල් හෙළන්න යයි කී විට ඔහු වාද කළේ නැත. එසේම මුළු රාත්‍රියෙහිම වෙහෙසවුවත් මසුන් කිසිවක් අල්ලා ගැනීමට නොහැකි වූ බව ඔහු ප්‍රතික්ෂේප කළේ නැත. එනමුත් ඔහු දේව වචනයට කීකරුව ක්‍රියා කළේය. ඔබ ඇදහිල්ලෙන් ක්‍රියා කරන කල, ඔබගේ හැඟීම් කෙරෙහි රැඳී නොසිටියි. ඔබ යාච්ඤාව ඉල්ලා සිටිය යුතු යයි නොහැඟෙන්නට හැකිය. ඔබට යාච්ඤා කළ විට පවා කිසිවක් හැඟෙන්නට නැතිව ඇත. මුලින්ම ඔබට කිසිම හොඳක් නොදැනෙන්නට පුළුවන.

ඔබට අවශ්‍ය සුවයද හැඟීම්ද? සුවය හැඟීම්වලට වඩා යහපත්ය. ඔබ සුවය ලබා කිසිවක් නොහැඟී සිටිය හැක. එනිසා ඔබගේ ඇදහිල්ල ඔබගේ හැඟීම් මත නොව දේව වචනය මත පදනම් කර ගන්න. ඇදහිල්ල නම් නොදක්නා දේ පිළිබඳව ඔප්පුවය (හෙබ්‍රෙව් 11:1). ඔබට දැනටම සුව වී ඇතැයි හැඟෙනවා නම්, ඇදහිල්ල අවශ්‍ය නොවේ.

ආත්මික කෙනෙකුට මඟ පෙන්වනු ඇත්තේ දේව වචනය සහ ඇදහිල්ල තුළිනි. සාමාන්‍ය මිනිසා සාමාන්‍ය සංවේදී පංචේන්ද්‍රිය භාවිතයෙන් හැසිරෙයි. ආත්මික මිනිසා ආත්මික සංවේදී ඉන්ද්‍රිය භාවිතයෙන් හැසිරෙයි. ස්වාභාවික සාමාන්‍ය සාක්ෂි දේව වචනයට පටහැනි වන කල, ආත්මික සංවේදී ඉන්ද්‍රිය භාවිතයෙන් ජීවත් වන්න. ඔබගේ ස්වාභාවික සංවේදී ඉන්ද්‍රියයන් පවස දේ සත්‍ය විය හැක. එනමුත් දේව වචනය එයට වෙනස් දෙයක් පවසන කල, ඒ වචනය අනුව ක්‍රියා කරන්න.

ආබ්‍රහම්ගේ ශාරීරික සංවේදී ඉන්ද්‍රිය පැවසුයේ ඔහුට පුතෙක් ලැබීම කොහෙත්ම සිදුවිය නොහැකි බවය. නුමුත් ඔහු දෙවියන්වහන්සේ විශ්වාස කළේය. ඔහු දෙවියන්වහන්සේ පැවසූ කාරණාව

සිදුවන ලෙසට ක්‍රියා කළේය. ආබ්‍රහම් "තමාගේම සිරුර ගැන නොතැකුවේය" (රෝම 4:19). ඒ වෙනුවට, "අපේ ඇදහිල්ලේ ප්‍රේරිතයාණන් සහ උත්තම පූජකයාණන්වූ යේසුස්වහන්සේ කල්පනා කරන්න" (හෙබ්‍රෙව් 3:1).
ඔබගේ සිරුර පිළිබඳව සලකා නොබැලීම නොසැහේ. ස්වාමින්වහන්සේ ඔබට යම්කිසි දෙයක් ඉවත් කිරීමට පවසන විට, ඒ වෙනුවට යමක් ඇතුල් කිරීමටද පවසයි. උන්වහන්සේ ඔබට යක්ෂයන් දුරු කිරීමට පවසන කළ ඉන් ඇතිවන හිඩැස පිරවිය යුතුය. ඔබ යමක් බඳින කල ඒ වෙනුවට යමක් නිදහස් කළ යුතුය. මෙම රටාව මෙහිදීද අදාළ වේ. ඔබගේ සිරුරේ පවතින රෝග ලක්ෂණ "සැලකිල්ලට නොගන්නා" විට ඔබ "උන්වහන්සේ කෙරෙහි සැලකීමට" එනම් එතුමා කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
මනුෂ්‍යයන් ඉතා ස්ථිර ලෙස රෝගවල පවතින බලය කෙරෙහි විශ්වාස කරති. කිසියම් රෝගයක් පිළිබඳව එහි බලපෑම් ගැන වෛද්‍යවරයා ඔවුනට පැවසූ කල එම රෝග ලක්ෂණ මතුවීමටත් පෙර ඔවුහු එය පිළිගනිති. නමුත් සුවය සම්බන්ධයෙන් නම් අප පවසන්නේ, "මම නම් එය දකින තුරු විශ්වාස කරන්නේ නැහැ" යනුවෙනි. එවිට ඇදහිල්ල පිළිතුරු දී පවසනුයේ, "ඔබ එය විශ්වාස කරන තුරු කිසිවක් නොදකිනු ඇත" යනුවෙනි. ඇදහිල්ල නම් නොදක්නා දේ පිළිබඳව සාක්ෂිය (හෙබ්‍රෙව් 11:1). දාවිත් පවසන්නේ, "ස්වාමින්ගේ යහපත්කම දකින්ට ලැබේයයි විශ්වාස කළෙමි" (ගීතාවලිය 27:13). "මම විශ්වාස කිරීමට පෙරමට දකින්නට අවශ්‍ය වී යැ"යි ඔහු නොපැවසුවේය. ඔහු සාක්ෂිය දකින්ට පෙර ඇදහිල්ලෙන් ක්‍රියා කළේය. දේව වචනය අපේක්ෂා කරනුයේ ඔබ ඇදහිල්ලෙන් හැසිරෙන ලෙසටය. එනම් ඔබට පෙනෙන රෝග ලක්ෂණ නොමැති බවට පැවසීම නොව, ඒ වෙනුවට නොදක්නා දෙය කෙරෙහි අවධානය යොමු කිරීමය (2 ලේකම් 4:16-18, 5:1).
නොඇදහිල්ලේ පරීක්ෂාකිරීම්වලට ඇදහිල්ලෙන් යුතුව මුහුණ දෙන්න. සාතන් සෑම නැවත උත්පාදනය ලද ඇදහිලිවන්තයෙකුම පාපයෙන් පරීක්ෂාවට ලක් කරයි. ඔබට නැවතත් එම රෝගය වැළඳේවි යයි බය ඇතිකර පරීක්ෂාවට ලක් කරාවි. තමුන්ගේ සුවය අහිමි වූ පුද්ගලයන් දුටු කල ඔහු ඔබව අධෛර්යයට පත් කරයි. ඔබ සැබවින්ම සුවවූවාදැයි සැකයෙන් ඔබව පුරවයි.
මනුෂ්‍යයාගේ පළමු පාපය ඇතිවූයේ දෙවියන්වහන්සේ පැවසූ දෙය එලෙසම සිදුවන බව විශ්වාස නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙසට බව මතක තබා ගන්න! එබැවින් එවැනි පරීක්ෂාවට ඔබ පාපයට මුහුණ දෙන ආකාරයෙන්ම මුහුණ දෙන්න. යේසුස්වහන්සේ කළ ආකාරයට එයට දේව වචනයෙන් පිළිතුරු සපයන්න.

**ආත්මික සටනෙහි යුද්ධායුධ භාවිත කරන්න :**

සාතන් ඔබගේ ප්‍රාණයට පහර දීම පාපය වන ලෙසම, ඔහු ඔබගේ ශරීරයට පහරදීම රෝගය වන බව මතක තබා ගන්න. එබැවින් මෙයට එරෙහිව ඔබගේ ආත්මික යුද්ධායුධ භාවිත කොට සටන් කරන්න (එපීස 6:10-18). මෙම ආයුධවලට නිරාහාරය සහ යාච්ඤාව ඇතුලත්ය (යෙසායා 58:6-8). ආත්මික යුද්ධායුධ පිළිබඳව වැඩි විස්තර සඳහා හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයෙහි *"ආත්මික උපක්‍රම: ආත්මික සටන සඳහා අත්පොත"* බලන්න.

**වෛද්‍ය ක්‍රම සහ ස්වාභාවික ක්‍රම පිළිගන්න :**

ගින්නක් හටගත් කළ ඔබ ගිනි නිවන හමුදාවට කතා කිරීම පමණක් සිදු නොකරයි. එම ගින්න නිවා දැමීමට සිදු කළ හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම උපයෝගී කරගනු ඇත (බාල්දි, වතුර, පයිප්ප බට, වහළය තෙත් කිරීම යනාදී ලෙසට . . .).
ඔබ රෝගාතුර වී සිටින කල ඔබට දෙවියන්වහන්සේට කතා කිරීම පමණක් නොව රෝගයට එරෙහිව සටන් වැදීමට භාවිත කළ හැකි සියලු නීත්‍යනුකූල කාරණා උපයෝගී කර ගත හැකිය. එනම්: වෛද්‍යවරු, බෙහෙත්, විවේකය, ආහාර, ව්‍යායාමය යනාදී ලෙස. මේ සියල්ල දෙවියන්වහන්සේගෙන් ලද යහපත් කාරණා වේ. සුවය ගලා එන ගමන් මඟ ගැන ස්තුති පූර්වකවන්න. එනමුත් මහිමය දෙවියන්වහන්සේටම පුදන්න!

මෙම අන්ත දෙකින් වැළකී සිටින්න.

**1. සුව වීමට යාච්ඤාව පමණක් භාවිත කිරීම :**

සමහර කිතු බැතියෝ දෙවියන්වහන්සේගේ යහපත්කමෙහි එක් මාධ්‍යයක් වන නවීන වෛද්‍ය විද්‍යාවෙන් සහාය ලබාගැනීම ප්‍රතික්ෂේප කොට සුවය උදෙසා යාච්ඤාව පමණක් ක්‍රියාත්මක කරති. යෙසායා සුවය සඳහා අත්තික්කා කැටියක් එනම් ස්වාභාවික බෙහෙතක් භාවිත කළේය (යෙසායා 38:10-21). යේසුස්වහන්සේ, "රෝගීන්ට වෛද්‍යවරයෙකු අවශ්‍යයයි" පැවසූ සේක (ලූක් 5:31). ලූක් වෛද්‍යවරයෙක් වූ අතර ඔහු පාවුල්ගේ කණ්ඩායම් සාමාජිකයෙක් විය (කොලොස්සි 4:14).
සමහර කිතු බැතියෝ 2 ලේකම් 16:12-13 උපුටා දක්වමින්, ආසා වෛද්‍යවරුන් වෙත ගොස් මිය ගිය බැවින්, තමුන්ද වෛද්‍යවරුන් වෙත නොයා යුතු බව සලකති. නමුත් මෙම පරිච්ඡේදයෙහි

ප්‍රධාන වචනය නම් “පමණක්” යන්නය. ආසාගේ පාපය වූයේ ස්වාමීන්වහන්සේ නොසෙවීමය. ඉතා බැරෑරුම් පෞද්ගලික අවශ්‍යතාවයක් පවතින අවස්ථාවෙහි ඔහු මනුෂ්‍යයා දෙස පමණක් බැලීය. ඔහුගේ මූලික ස්ථිරතාවය රැඳී තිබුණේ මනුෂ්‍යයා කෙරෙහිය. ඔහු කළ වරද එයයි.

වෛද්‍යවරයා දෙවියන්වහන්සේගේ යහපත්කමෙහි කොටසක් පමණකි. වෛද්‍යවරයෙකුට අස්ථියක් නිසි ස්ථානයෙහි තබා නිවැරදි කළ හැකිය. නමුත් එය දිව්‍යමය අයුරින් සුවවන තුරු ඔහු බලා සිටිය යුතුය. ශල්‍ය වෛද්‍යවරයෙකු ඉතා දක්ෂ ලෙස අසීරු ශල්‍ය කර්මයක් ඉටු කළ හැක. එහෙත් ඔහු කැපූ සෑම අංගයක්ම නිවැරදි ලෙස සුව කරනුයේ දෙවියන්වහන්සේය. වෛද්‍යවරයා එය අවබෝධ කරගත්තත් නැතත් සැබවින්ම ඔහු දෙවියන්වහන්සේට එරෙහිව නොව දෙවියන්වහන්සේ සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි. වෛද්‍යවරු සුව වීමට ඇති බාධාවන් ඉවත් කොට එයට උපකාර වීමට බෙහෙත් සපයති. ක්‍රිස්තියානි වෛද්‍යවරුන් හට දෙවියන්වහන්සේ සමඟ සහයෝගයෙන් ඉතාමත්ම කාර්යක්ෂම ලෙස ක්‍රියා කළ හැකිය.

බොහෝ බෙහෙත් වර්ග නිපදවා ඇත්තේ දෙවියන්වහන්සේ විසින් මවන ලද ගස් කොළ, ස්වාභාවික අමුද්‍රව්‍ය ඇසුරිනි. බෙහෙත් වශයෙන් ලබා දෙනුයේ එහි සාන්ද්‍ර තත්ත්වයකි. බෙහෙත් ගැනීමට පෙර එයට යාච්ඤා කිරීමෙන් එහි බලපෑම තව වැඩිවෙයි. දෙවියන්වහන්සේ විසින් වෛද්‍ය විද්‍යානුකූලව හා නීත්‍යානුකූලව ඉතා කාරුණිකව අපට සපයා දී ඇති ඖෂධ ප්‍රතිකාර අප අත්හැර දැමිය යුතු ඇයි? ඔබගේ රුධිර වාහිනියක් කැපුණු විට එයින් ලේ වහනය නතර කිරීමට යමක් නොකොට යාච්ඤා කිරීම පමණක් සිදු කිරීම වැනිය. එසේම ඇඟිල්ලේ ලී පතුරක් ඇණුන විට එය ඉවත් කිරීම ප්‍රතික්ෂේප කොට වැඩිමහල්ලන්ට යාච්ඤා කිරීමට කැඳවීමක් වැනිය. දිනපතා ශරීර සෞඛ්‍යය රැක ගැනීමට ජීවිතයට අවශ්‍ය ආහාර මඟ හැරීම කෙතරම් අනුවණ කමක් වේද? රෝගියෙකු හට නීත්‍යානුකූලවූ වෛද්‍ය උපකාර හෝ ස්වාභාවික උපකාර නොකර සිටීමද එලෙසම අනුවණකමකි.

සටහන : වෛද්‍යවරයෙකු තෝරා ගැනීමෙහිදී, විශේෂයෙන්ම අසාධ්‍ය රෝගයක් සඳහා ඉතා ප්‍රවේශමෙන් කළ යුතුය. මෙහිදී දිව්‍යමය මැදිහත්වීම නම් යථාර්ථය හඳුනාගෙන සිටින වෛද්‍යවරයෙකු මිස රෝගියාව අසුබවාදී වාතාවරණයකට ගෙන යන වෛද්‍යවරයෙකු සුදුසු නොවේ.

**2. දෙවියන්වහන්සේ සුවකරන ක්‍රමය නවීන වෛද්‍ය විද්‍යාවට පමණක් සීමා කිරීම :**

වෛද්‍යවරුන්ට හා ඖෂධවලට විශේෂ රෝග සහ මානසික හෝ හැඟීම් රෝගාබාධ සුව කිරීමට සහාය දැක්විය හැකි නමුත් ආත්මිකවූත්, යක්ෂයන් සම්බන්ධවූත් රෝගාබාධ සුව කළ නොහැක. සමහර අවස්ථාවලදී ඖෂධ මඟින් නියම රෝගී තත්ත්වය මඳකට වසන් කර තබනු මිස ගැටලුව නිරාකරණය නොකරයි. දිව්‍යමය සුවය මුළුමනින්ම සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වෙයි.

## ස්වයං පරීක්ෂණය

1. සුවවීමේ පොරොන්දුව කට පාඩමින් ලියන්න.

2. දිව්‍යමය සුවයෙන් යුතුව ජීවත් වීම උදෙසා මෙම පරිච්ඡේදයෙහි සාකච්ජා කළ බයිබලීය උපදෙස් සාරාංශ කොට දක්වන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.

## එය ක්‍රියාත්මක කිරීම.

1. දෙවියන්වහන්සේ දුෂ්ඨ බලවේගවලින් මිනිසා නිදහස් කිරීමට ක්‍රියාකළ ආකාර පිළිබඳ උදාහරණ කිහිපයක් පහතින් දැක්වේ. එය ආත්මික ලෙස සුව කිරීම කෙරෙහිද අදාළ කරගත හැකිය.

**දිව්‍යමය මැදිහත්වීම :** ප්‍රේරිතයෝ සිර ගෙදරින් නිදහස් කිරීමට දේව දූතයෙක් පැමිණියේය. මෙය දිව්‍ය සුවයට සමානය. ක්‍රියා 5:17-21, 12:1-11.
**දෙවියන්වහන්සේ විසින් ස්වභාව ධර්මය ක්‍රියාත්මක වීමට සැලසීම:** පාවුල් සහ සිලස් හිරගෙයින් නිදහස් කිරීමට භූමි කම්පාවක් සිදුවිය. මෙය දෙවියන්වහන්සේ විසින් සිදුකරන ස්වාභාවික ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් ලෙස සුවවීමෙහි උදාහරණයක් වේ. ක්‍රියා 16:25-40.
**වෘත්තිකයන්ගේ මැදිහත්වීම:** සිරගෙයින් නිදහස් වීම සිරගෙයි නිලධාරීන් මගින් සිදුවිය. මෙය සුවයට අදාළ කරගතහොත් මෙය වෘත්තිමය වෛද්‍ය සහාය සැපයීම හා සමානය. ක්‍රියා 16:35-39.
**මිය යාමට කාලය :** ඉතිහාසය වාර්තා කරනුයේ ක්‍රි.ව. 67 පමණ වන විට පේතෘස් හා පාවුල් යන දෙදෙනාම රෝමයෙහි සිරගත කරනු ලැබූ බවය. මෙවර ඔවුන් උදෙසා දිව්‍යමය, ස්වාභාවික හෝ වෘත්තිමය මැදිහත් වීමක් නොවීය. ඔවුහු වේද සාක්ෂික මරණය ලැබුවෝය. මෙය රෝගයට අදාළ කරගත් විට එය මරණය වෙත යන්නාවූ රෝගයකි.
ඉහත සඳහන් සියලු සිද්ධීන් අපහට සමාන්තර සත්‍යයක් අවබෝධ කර ගැනීමට උපකාර කරයි. දෙවියන්වහන්සේ සැමවිටම ජනතාව සිරෙන් නිදහස් කර ගැනීමට ආශාවන ලෙසම සුව කිරීමටද ආශා වෙයි. එය සමහරවිට දිව්‍යමය සුවය, දෙවියන්වහන්සේ විසින් මෙහෙයවන ස්වාභාවික ක්‍රියාදාමයක්, වෘත්තිමය සහායක් තුළින් හෝ අවසාන නිදහස වූ මරණය තුළින් සිදුවිය හැකිය. ජීවත්වීමට ඇති ඇදහිල්ල මියයාමට ඇති ඇදහිල්ල තරමටම ශක්තිමත්ව පවතින කල එහි ක්‍රමය පිළිබඳ පරස්පර වෙනසක් ඇති නොවේ.
සියලු නිත්‍යානුකූල සුවය පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙනි. එය යාච්ඤාව තුළින්, ඖෂධ ඇසුරින් හෝ ස්වාභාවික ක්‍රියාදාමයකින් විය හැක. ශුද්ධ ලියවිල්ල අපට උගන්වන්නේ දෙවියන්වහන්සේ භාස්කම් කරන ලෙසටම සාමාන්‍ය එදිනෙදා සිදුවීම්, එනම් අපට පැහැදිලි කළ

හැකි මෙන්ම සිදුවිය හැකියැයි අනුමාන කළ හැකි කාරණා කෙරෙහිද එතුමා ක්‍රියාශීලි වන බවය. (ගීතාවලිය 65 බලන්න. එහි ලොවෙහි ස්වාභාවික ක්‍රියාදාමය කෙරෙහි දෙවියන්වහන්සේගේ ක්‍රියා කිරීම පෙන්වා දෙයි). එබැවින් වැදගත් කාර්යය වනුයේ මෙය වටහාගෙන සියලු සුවයන් පිළිබඳව දෙවියන්වහන්සේට මහිමය දීමය.

**. . . එහෙත් ඔවුන්ට සුව කළේ මා බව ඔවුහු නොදැන සිටියෝය. (හොෂෙයා 11:3).**

2. මෙම පාඩමෙහි ඇතුළත් දේව රාජ්‍යයෙහි ජීවත්වීමේ මූලධර්ම පුනරීක්ෂණය කරන්න. ඔබගේ ජීවිතයෙහි ක්‍රියාත්මක කළ යුතු වූ මඟ පෙන්වීම් සලකුණු කරන්න.
   - යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මාගේ ගැළවුම්කරු ලෙස පිළිගැනීම.
   - දෙවියන්වහන්සේගේ මාළිගාව නැවත එතුමාට භාර දීම.
   - පළමුව දේව රාජ්‍යය සෙවීම.
   - ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම.
   - දෙවියන්වහන්සේට බිය වීම.
   - දෙවියන්වහන්සේ සමඟ සමීප ඇසුරක් වර්ධනය කර ගැනීම.
   - දේව වචනයට ඔබ ජීවිතයෙහි ප්‍රමුඛතාවය දීම.
   - දෙවියන්වහන්සේට කීකරුව හැසිරීම.
   - ඔබගේ හදවත සහ ආත්මය ආරක්ෂා කර ගන්න.
   - සෞඛ්‍යයෙහි ස්වාභාවික නීති පිළිපදින්න.
   - ක්‍රිස්තුස්වහන්සේගේ සිරුර නිසියාකාරව විමර්ශනය කරන්න.
   - ඔබ රෝගීව සිටින විට, දෙවියන්වහන්සේට ඔබව සුව කිරීමට අවශ්‍ය බව විශ්වාස කරන්න.
   - යේසුස්වහන්සේ තුළින් ඔබගේ සුව කරන්නා ලෙසට දෙවියන්වහන්සේව පිළිගන්න.
   - සුව කිරීම සඳහා ඔබගේ ඇදහිල්ල වැඩි කර ගන්න.
   - ඇදහිල්ලෙන් ක්‍රියා කරන්න.
   - ඔබගේ ආත්මික යුද්ධායුධ භාවිත කරන්න.
   - වෛද්‍ය විද්‍යාත්මක මෙන්ම ස්වාභාවික ක්‍රමද පිළිගන්න.

3. ඔබ ඉහතින් සලකුණු කළාවූ එක් එක් මඟ පෙන්වීම ක්‍රියාත්මක කිරීමට සැලසුමක් ලියන්න.

# නිගමනය

ඔබගේ ශරීරය උදෙසා පවතින සටන පිළිබඳ අධ්‍යයනයෙහි අවසානයට ඔබ පැමිණ සිටියි. එනමුත් පාපය, රෝග හා මරණය ඇතුළත් මෙලොවින් තුරන් වී යේසුස් රජාණෝ ඉදිරියට පැමිණෙන තුරු සටන දිගටම පැවතෙනු ඇත.
මෙම අධ්‍යයනය ආරම්භයෙහිදී ඔබ ශාරීරික පහර දීමට ලක්ව් සිටියා නම්, මෙම ඉගැන්වීම් දැනටමත් ඔබව සුවපත් කොට හෝ සුවය හිමිකර ගැනීමට ඔබව සූදානම් කොට ඇතැයි අප විශ්වාස කරමු. ඔබ මතක තබාගත යුතු කරුණ නම්, එක්කෝ ක්ෂණයකින් ඔබ සුවය ලබාවි, නැත්නම් ක්‍රමානුකූලව දිගු කාලයකින් සුවපත් වේවි. එසේත් නොමැතිනම් අවසාන සුවය වන ස්වාමින්වහන්සේගේ අභිමුවට ඇතුළුවේවි.
එසේම දුක් විඳින්නාවූ ලොවකට සුවය හා මිදීම අත්පත් කරදීම සඳහා මෙහෙකිරීමට මෙම වචන ඔබට අභියෝගයක් වන්නට ඇතැයි අප යාච්ඤා කර සිටිමු. මුලින් ඔබ සුව කිරීමේ සේවාවට ඇතුළු වීමට අදිමදි කරාවි. භය වේවි. නමුත් මතක තබා ගත යුතු කරුණ නම් සුව කිරීමේ සේවාව අයිති තමා පසු පස ඇති නොඇදහිල්ලේ සහ බියෙහි පාලම් පුළුස්සා දමන පුද්ගලයින් හට බවය.
ඉතා ප්‍රකට ජුලියස් සීසර් නම් නායකයෙක් පිළිබඳ කතාවක් පවති. ඔහු බ්‍රිතාන්‍යය යටත් කර ගැනීමට අධිෂ්ඨානය කර තම හට සේනාව සමඟ ප්‍රංශයේ සිට එංගලන්තයට රුවල් නැව්වලින් ළඟා විය. එංගලන්තයට ගොඩ බැස්ස විගසම ඔහු ඉංග්‍රිසි දිය මග තරණය කළාවූ සියලු නැව් ගිනිබත් කළේය. මෙලෙස පසුබා පලායාමට ක්‍රමයක් නොවීය. තිබූ එකම විකල්පය නම් ඉදිරියට ගොස් ජයගැනීම හෝ මරණයයි. ඔබගේ සුව කිරීමේ සේවාවේදි ඔබ දැරිය යුතු වන ආකල්පය මෙය වේ.
ඔබ මෙම අධ්‍යයනයෙහිදී ඉගෙන ගත් කාරණා සම්බන්ධයෙන් පහත සඳහන් අයුරින් ගත හැකි ප්‍රවේශ දෙකක් තිබේ. එනම් :

- ඔබට නව ගිවිසුමෙහි සඳහන් ගමාලියෙල් නායකතුමා මෙන් පැත්තක සිට අනතුරු අඟවමින්, ආගමික නායකයින්ට "ටිකක් ඉඳ බලන්න . . . " යයි යෝජනා කරන කෙනෙකු විය හැක.

- නැතිනම්, ප්‍රේරිත වූ පේත්‍රුස් මෙන්, ක්‍රියා කිරීමේ අවදානම ගත හැකිය. ඔහු කොර පුද්ගලයා සුවපත් කළේය. ආත්මික නායකයන්ගේ කෝපය ඇවිස්සිය. යේසුස්වහන්සේගේ නාමයෙන් දේශනා කිරීමට හා සුව කිරීමට ඔහුට තහනම් කළාවූ අධිපතීන්ට එරෙහිව නැඟී සිටියේය.

නිරතුරුවම මතක තබා ගත යුතු කාරණාව නම්, ඔබ සුව කරන්නා නොව සුවය අත්පත් කර ගැනීමට සහාය සපයා දෙන්නාය (සත්කාරකයාය). ඔබ තුළ සිටින්නාවූ සුවකරන්නා හට ඔබ තුළින් ගලා යාමට ඔබ ගලා යන නල මාර්ගයක් පමණකි. එම ගලා යාම . . .
. . . අසාධ්‍යව රෝගාතුරව දරුණු වේදනා අත්විඳින ජනතාව උදෙසා
. . . අසහනයට, අපේක්ෂා භංගත්වයට පත්වී ජීවිතය අත්හැරීමට සූදානම්ව සිටින අය උදෙසා
. . . තම ප්‍රේමණීයයන් අහිමි වීමෙන් හෝ අනුන් විසින් වේදනාවට පත් කරන ලද හෝ බැවින්
. . . තම හදවත වේදනාවෙන් පිරී හඬා වැටෙන අය උදෙසා
. . . පාපයේ හා යක්ෂයාගේ පීඩා කිරීමේ යදම්වලින් බැඳී සිටින අය උදෙසා
. . . මරණයට මුහුණ දී සිටින අය උදෙසා.

ඔබව කැඳවා ඇත්තේ සුව කිරීමේ මෙහෙයෙහිදී මුහුණ දෙන අපහසුතා පැහැදිලි කිරීමට හෝ පිළිතුරු නොලද යාච්ඤාවලට හේතු පැහැදිලි කර දීමට නොවේ. ඔබ කැඳවා ඇත්තේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට නොව සුවය මෙහෙකිරීමටය. ගැළවීමේ සේවාවෙහිදී මෙන්ම සුව කිරීමේ මෙහෙයේද ප්‍රතිඵල දෙවියන්වහන්සේට භාර කරන්න. ඉවැන්ජලිස්ත එන්. එන්. බොස්වර්ත් දැරූ ආකල්පයම දරන්න. ඔහු පවසා සිටියේ :

> *"මම ජීවත්ව සිටින තුරු තව එක මනුෂ්‍යයෙක් ගැළවීම ලැබීම හෝ සුව වනු දකින්නට නොලැබුණත්, මම දිගටම මුළු ශුභාරංචියම ප්‍රකාශ කිරීමෙහි නියැලී සිටින්නෙමි. මම මාගේ දේව ධර්මය නොවරදින දේව වචනය මත පදනම් කරගනු මිස දැකීමට නොලැබෙන දෙය මත පදනම් නොකිරීමට අධිෂ්ඨනය කරගෙන ඇත්තෙමි."*

මෙම අත්පොතෙහි පිටු මගින් අප ඔබ වෙත භාස්කමක් සඳහා හැකියාව ඔබගේ අතට සපයා දී ඇත්තෙමු. ඔබගේ ජීවිතයෙහි සුවයෙහි බීජයක් රෝපණය කර ඇත්තෙමු. එය ස්වාභාවික ලොවෙහි බීජයකට බොහෝ සේ සමානය. බීජය ජීවය ගෙන දීමට නම් එය පෝෂණය විය යුතුය.

මෙම අධ්‍යයනයෙහිදී ඔබ හට දේව වචනයෙහි හාස්කමේ බීජයක් ලබා දී තිබේ. එය සුවය සඳහා වූ ඇදහිල්ලේ බීජය වේ. ස්වාභාවික ලොවෙහි බීජයක් මුල් ඇද පැළවෙන ආකාරය විස්තර කළ නොහැකි ලෙසටම සුවය නම් විෂය පිළිබඳ සියලු කාරණා ඔබට විස්තර කළ නොහැක. නමුත් ඔබගේ ආත්මයෙහි හා ප්‍රාණයෙහි තැන්පත් කරන ලද බීජය ඔබ පෝෂණය කළහොත්, ඉන් ජීවනය ගෙන දෙනු ඇත.
අවසාන කරමින්, ප්‍රශ්න දෙකක් ඉදිරිපත් කරමු. එනම් :
**අපි ඔබගෙන් විමසන්නේ :** "ඔබ මෙම බීජය ගැන කුමක් කරයිද?".
**යේසුස්වහන්සේ විමසන්නේ :** "වඩා පහසු කුමන එකද, "ඔබගේ පාප ඔබට කමා කරන ලදී" යයි පැවසීමද "නැගිට ඇවිදින්න" යයි පැවසීමද?"

# උපග්‍රන්ථය අ.

## රෝග ලක්ෂණ විමර්ශනය

පහත සඳහන් සෝදිසි කිරීමේ පත්‍ර සැලසුම් කර ඇත්තේ රෝගයක් සඳහා සිදුවිය හැකි හේතු කාරක සොයා දැන ගැනීමට හා අදාළ ලෙස ක්‍රියා කිරීමට සහාය වන ලෙසය. යාච්ඤාවෙන් යුතුව එක් එක් ප්‍රශ්නය සලකා බලන්න. ඔබ මෙම විමර්ශන පත්‍රය සම්පූර්ණ කරන විට දෙවියන්වහන්සේගේ විමසීම හා එළිදරව්ව ඔබට සපයන මෙන් ඉල්ලා සිටින්න.

## ආත්මික විශ්ලේෂණය

- ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ පෞද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගෙන තිබේද?
- ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ පෞද්ගලික සුව කරන්නා ලෙස පිළිගෙන තිබේද?
- දෙවියන්වහන්සේට ඔබව සුව කිරීමට හැකි බවද එසේ කරන බවද ඔබ විශ්වාස කරනවාද?
- ඔබ දිනපතා බයිබලය කියවනවාද?
- ඔබගේ ඇදහිල්ල වැඩිකරගන්නා පිණිස දේව වචනයෙහි සුවවීම පිළිබඳ සඳහන් කාරණා ඔබ අධ්‍යයනය කරනවාද?
- දේව වචනයෙහි සුවවීම පිළිබඳ පොරොන්දු ඔබ අත්පත් කර ගන්නවාද?
- ඔබගේ වචන හා ක්‍රියාවන් දෙවියන්වහන්සේගේ පොරොන්දු ඇදහිල්ලෙන් ස්ථිර කරනවාද නැත්නම් සැක කරනවාද?
- ඔබගේ අවධානය යොමු වී තිබෙන්නේ රෝග ලක්ෂණ කෙරෙහිද නැත්නම් දෙවියන්වහන්සේගේ පොරොන්දු කෙරෙහිද?
- ඔබ දිනපතා යාච්ඤා කරනවාද?
- ඔබ දිනපතා ඔබගේ පාප දෙවියන්වහන්සේට පවසා සමාව අයැද සිටිනවාද?
- ඔබ අනෙක් අයට සමාව දී ඔවුන් උදෙසා යාච්ඤා කරනවාද?
- ඔබ නිතිපතා යාච්ඤාවට පිළිතුරු ලැබීමට බාධා පමුණුවන කාරණා සෝදිසිකොට බලනවාද - පහත සඳහන් කරුණු විමසා බලනවාද?
  - ඕනෑම ආකාරයක පාප
  - හදවතෙහි ඇති පිළිම
  - සමාව නොදීමේ ආත්මය
  - ආත්මාර්ථකාමී බව සහ වැරදි අරමුණු
  - බලයට කෑදරකම, අන් අය තමන්ගේ වාසියට පොලඹවන සුලු යාච්ඤාවල්
  - විවාහක සහකරු/සහකාරියට වැරදි ලෙස සැලකීම
  - ස්වයං-ධර්මිෂ්ඨබව
  - නොඇදහිල්ල
  - ක්‍රිස්තුස්වහන්සේ හා එතුමාගේ වචනය තුළ නොපැවතීම
  - අනුකම්පාව නොමැතිකම
  - වංචාකාරීබව, ආඩම්බරය, අර්ථශූන්‍ය වූ නැවත - නැවත ප්‍රකාශන
  - දෙවියන්වහන්සේගේ කැමැත්තට එකඟව නොඉල්ලීම
  - යේසුස්වහන්සේගේ නාමයෙන් නොඉල්ලීම
  - සාතන්ගේ බාධාවන්
  - පළමුකොට දේව රාජ්‍යය නොසෙවීම.

- ඔබ දැනුවත්වම ශුද්ධ ලියවිල්ලෙහි උපදෙස් පැහැර හරිනවාද - කඩ කරනවාද?

- ඔබ නිතිපතා ශුද්ධ සහභාගිකමට නිසියාකාරව සූදානම් වෙනවාද? සහභාගිකම ලබනවාද?
- ඔබ නිතිපතා ඇදහිල්ලේ පරිසරයක අනෙකුත් ඇදහිලිවන්තයින් පිරිවරාගෙන නමස්කාරයට සහභාගි වෙනවාද?
- ඔබගේ සීයා, ආච්චි, දෙමව්පියන් හෝ ඔබ, කිසියම් අද්භූත (බලි තොවිල් යනාදිය) කාරණාවලට සම්බන්ධ වී තිබේද? එසේ නම්, ඔබ එයින් මිදීමට, එමඟින් ඇතිවිය හැකි ශාපවලින් නිදහස් වීමට යාච්ඤා කොට ඉවත් වී තිබෙනවාද?
- අනෙකුත් ආත්මික කාරණාවලට වඩා ඔබගේ ශරීරයෙහි සුවවීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කර තිබේද?
- ඔබ මුළු සිරුරෙහි, ප්‍රාණයෙහි හා ආත්මයෙහි පරිපූර්ණකමට වඩා ශාරීරික සුවය පමණක් සොයනවාද?
- ඔබ සුව කරන තැනැන්වහන්සේට වඩා සුවය කෙරෙහි අවධානය යොමු කරනවාද?
- පහත සඳහන් කාරණාද ඇතුලත්ව සුව වීම කෙරෙහි බලපාන අනිකුත් සාධක සමඟ ගනුදෙනු කර තිබේද?

  - ඉගැන්වීමෙහි මඳ බව / අඩුපාඩු
  - අවිශ්වාසය
  - ඇදහිල්ල මදිකම
  - බලය මදිකම
  - පෞද්ගලිකව පාපොච්චාරණය නොකළාවූ පාප
  - සම්පූර්ණ කරනු ලැබීම ප්‍රතික්ෂේප කිරීම
  - තීරණය හා ආශාව අඩුකම
  - ඉල්ලීමෙහි ගැටලු : ඉල්ලා නොසිටීම, විශේෂිත ලෙස ඉල්ලා නොසිටීම, වැරදි අරමුණු සහිතව ඉල්ලා සිටීම.
  - අඛණ්ඩව නොපැවතීම.
  - සුවවීමේ ක්‍රියාදාමයෙහිදී අකීකරුකම
  - ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නිසියාකාරව නොවිමසීම : රුධිරය සහ මාංසය පිළිබඳ අර්ථය, ශරීරයෙහි භේද පැවතීම, නුසුදුසු ලෙස කෑම.
  - අශුද්ධ ආත්මය දුරු කර නොතිබීම.
  - දෙවියන්වහන්සේගේ ක්‍රියාවට ප්‍රතිවිරුද්ධව ක්‍රියා කිරීම.
  - ස්වාභාවික නීති උල්ලංඝනය කිරීම.

- ඔබගේ ශරීරය (දෙවියන්වහන්සේගේ මාළිගාව) ඔබ නැවතත් එතුමාට දී තිබේද?
- ඔබගේ ආත්මික "නිවසෙහි" යක්ෂයන්ට නැවත පදිංචි විය නොහැකි වන පරිදි එය ශුද්ධාත්මයෙන් පුරවා තිබේද?
- ඔබට සුවය එකතු කරන පිණිස ඔබ පළමු කොට දේව රාජ්‍යය සොයනවාද?
- ඔබගේ සිරුර උදෙසා පවතින සටනෙහිදී ආත්මික යුද්ධායුධ භාවිත කරනවාද? පහත සඳහන් ආයුධ පරිහරණය කරනවාද?

- දේව වචනය
- යේසුස්වහන්සේගේ ලෙය
- ඔබගේම සාක්ෂියෙහි වචන
- බැඳ දැමීමටත් නිදහස් කිරීමටත් ආධිපත්‍ය බලය
- යාච්ඤාව හා ප්‍රශංසාව
- ආත්මික සටනෙහි යුද්ධායුධ
- ශුද්ධාත්මයාණන්ගේ ආධිපත්‍ය හා බලය
- යේසුස්වහන්සේගේ නාමය

- යාකොබ් 5:13-18 උපදෙස් පරිදි ඔබ සභාවේ වැඩිමහල්ලන් යාච්ඤා කිරීම පිණිස කැඳවූවාද?

ඉහත සඳහන් ලයිස්තුව ඇසුරින් ඔබ හඳුනාගත්තාවූ ගැටලු නිවැරදි කිරීම පිණිස ඔබගේ සැලසුම ලියන්න.

____________________________________________________________

____________________________________________________________

## ශාරීරික විමර්ශනය

- ඔබගේ ආර්ථිකයට දැරිය හැකි පරිදි ඔබ සමබර ආහාර වේලක් ගන්නවාද?
- ඔබ නිතරම ඕනෑවට වඩා හෝ අඩුවෙන් කෑම කනවාද?
- ඔබට ආහාර රටාවේ බරපතල ගැටලු තිබේද?
- ඔබට ආහාර හා සම්බන්ධ පෝෂණ හීනතාවයන්, ආසාත්මිකතාවයන් හෝ ආහාර හා බැඳුණු ශාරීරික දුබලතාවයන් පවතිද?

ඔබගේ ආහාර වේල නිවැරදි කිරීම සඳහා සැලැස්මක් ලියන්න.

____________________________________________________________

____________________________________________________________

- ඔබ සෑහෙන පමණ නින්ද ලබනවාද?
- ඔබ නිවැරදි ව්‍යායාම කරනවාද?
- ඔබ දුම්පානය කරනවාද?
- ඔබ මත්වන, හානිකර පාන වර්ග පානය කරනවාද?
- ඔබ අන්තරාදායක බෙහෙත්, මත්කුඩු භාවිත කරනවාද?
- ඔබ කාමමිථ්‍යාචාරයෙහි යෙදෙනවාද (වේශ්‍යාකම, සමලිංගික සේවනය යනාදී . . . )?
- ඔබට බෙහෙත් නියම කොට තිබේ නම්, එය නියමිත අයුරින් භාවිත කරනවාද?

- ඔබ ඖෂධ මඟින් හා ස්වාභාවික ක්‍රමයෙන් යන දෙයාකාරයෙන්ම සුව වීමට විවෘතව සිටිනවාද?

ඉහත සඳහන් ලයිස්තුව ඇසුරින් ඔබ හඳුනාගත්තාවූ ගැටලු නිවැරදි කිරීම පිණිස ඔබගේ සැලසුම ලියන්න.

____________________________________________________________________

____________________________________________________________________

## හැඟීම් හා මානසික විමර්ශනය:

- ඔබට සුවය ලැබීම වළකා තැබිය හැකි "මනුෂ්‍යන්ගේ චාරිත්‍ර" වලින් ඔබ බැහැරවී තිබේද? (මෙම පොතෙහි එකොළොස්වෙනි සහ දොළොස්වෙනි පරිච්ඡේද බලන්න). එයට පහත සඳහන් ඇදහිලි හෝ නොවිසඳුණු ප්‍රශ්න ඇතුළත් විය හැක.

  - සුවය හා හාස්කම් අද දිනට අයිති නැත.
  - සියලුම මිය ගිය අය නැවත - ජීවනයට ආවේ නැත්තේ ඇයි?
  - දිව්‍ය සුවය සත්‍ය නම් කිතුනුවෝ මැරෙන්නේ ඇයි?
  - නූතන වෛද්‍ය විද්‍යාව නිසා දිව්‍ය සුවය අවශ්‍ය නොවේ.
  - දිව්‍ය සුවය උගන්වන්නේ මිථ්‍යා මතධාරී ආගම් මගිනි.
  - ශරීරය, ප්‍රාණයට වඩා අවධාරණයට ලක්වේ.
  - ඔබ රෝගාතුර වී ඇත්තේ ඔබගේ පාපය නිසාය.
  - ඔබ රෝගීව සිටීම දේව කැමැත්ත වේ.
  - මෙය ධර්මිෂ්ඨයාට පැමිණෙන පීඩාවකි.
  - දිව්‍ය සුවය දුර්ලභ දෙයකි.
  - ඔබගේ රෝගය ඔබට ඇති කුරුසියයි.
  - ඔබගේ රෝගය ඔබගේ මාංශයෙහි කටුව වේ.

- ඔබ මඟහරින, පිළිගැනීමට ප්‍රතික්ෂේප කරන මිනිසුන්, ස්ථාන හෝ ජීවිතයෙහි වකවානු තිබේද?
- ඔබගේ ජීවිතයෙහි කිසියම් පුද්ගලයින්, ස්ථාන, සිදුවීම්, ජීවිතයේ වකවානු සිහි කිරීමෙන් ඔබ තුළ ලැජ්ජාව, වැරදිකාරබව, බය, තරහව, ප්‍රතික්ෂේපය, තිත්තකම ඇතිවේද?
- ඔබව රිදවූ පුද්ගලයින්ට ඔබ සමාව දී තිබේද?
- ඔබගේ පාප සහ අසමත්වීම් පිළිබඳව ඔබ ඔබටම සමාව දී තිබේද?
- ඔබ තුළ කිසියම් ආකාරයක පූර්ව මතයන් පවතිද?
- අතීතයෙහි සිදුවීම් හා බැඳුණු, ඔබව සීමා කරවන බාධකයන් තිබේද? (ඔබට යමක් කිරීමට නොහැකි බවට පත් කළාවූ සිදුවීම්)
- ඔබට නිසියාකාරව පාලනය කර ගත නොහැකි බය තිබේද?
- ඔබට පාලනය කළ නොහැකි විනාශකාරී ද්‍රව්‍ය, පුරුදු හෝ සම්බන්ධතා කෙරෙහි ඇල්මක් පවතිද?
- ඔබගේ හැසිරීම දරුණු ලෙස වෙනස් වන්නාවූ තත්ත්වයන් පවතිනවාද?
- ඔබ වැඩිපුර කාලයක් අසහනයෙන් හා අධෛර්යයට පත්ව සිටිද?
- ඔබ පිළිබඳව ඔබට ඇත්තේ අව තක්සේරුවක්ද?

- ඔබ සාමාන්‍යයෙන් ප්‍රීතිමත්ද?
- ඔබට සාමකාමී ආත්මයක් තිබේද?
- ඔබට විවේචනය දරා ගැනීම අපහසුද?
- ඔබ විවාදයට බර, කෝපවන හා ඉක්මණින් තරහා යන කෙනෙක්ද?
- ඔබ අනාගතය ගැන කනස්සලු වන බයෙන් සිටින කෙනෙක්ද?
- ඔබගේ පැවැත්ම නිරස, නියම අර්ථයකින් තොර එකක් සේ පෙනියාද?
- ඔබ කිසිවෙකු විසින් ශාරීරිකව, ලිංගිකව, මානසිකව හෝ හැඟීම් දූෂණයට ලක් කොට තිබේද? ඔවුන් කෙරෙහි ඔබගේ හැඟීම් සමඟ කෙලෙස ගනුදෙනු කර තිබේද?

ඉහත සඳහන් ලයිස්තුව ඇසුරින් ඔබ හඳුනාගත්තාවූ ගැටලු නිවැරදි කිරීම පිණිස ඔබගේ සැලසුම ලියන්න.

________________________________________

________________________________________

________________________________________

________________________________________

# උපග්‍රන්ථය ආ.

## සුවය සහ මිදීම උදෙසා බයිබලීය පදනම

සුවය සහ මිදීම උදෙසා බයිබලීය පදනම වැඩිදුරටත් අධ්‍යයනය කිරීම සඳහා මෙම උපග්‍රන්ථය භාවිත කරන්න.

### පැරණි ගිවිසුමෙහි සඳහන් දෙවියන්වහන්සේගේ නාම

| | | |
|---|---|---|
| යෙහෝවා - යයිරේ | ස්වාමීන්වහන්සේ සපයන සේක. | උත්පත්ති 22:14<br>අලුත් ගිවිසුම පිලිප්පි 4:19 |
| යෙහෝවා - නිස්සී | ස්වාමීන්වහන්සේ අපගේ ධජය වේ. | නික්මයාම 17: 8-13<br>අලුත් ගිවිසුම යොහන් 15:13 |
| යෙහෝවා - ෂාලෝම් | ස්වාමීන්වහන්සේ අපගේ සමාදානයය | විනිශ්චයකාරයන්ගේ පොත 6:24<br>අලුත් ගිවිසුම එපීස 2:14 |
| යෙහෝවා - රාආ | ස්වාමීන්වහන්සේ අපගේ එඬේරාය | ගීතාවලිය 23:1<br>අලුත් ගිවිසුම යොහන් 10:11 |
| යෙහෝවා - සිඩ්කේනු | ස්වාමීන්වහන්සේ අපගේ ධර්මිෂ්ඨකමය | යෙරෙමියා 23:6<br>අලුත් ගිවිසුම 1 කොරින්ති 1:30 |
| යෙහෝවා - ෂම්මා | ස්වාමීන්වහන්සේ වැඩ සිටින සේක | එසකියෙල් 48:35<br>අලුත් ගිවිසුම හෙබ්‍රෙව් 13:5 |
| **යෙහෝවා - රාෆා** | **ස්වාමීන්වහන්සේ නුඹ සුව කරන්නාය** | නික්මයාම 15:26<br>අලුත් ගිවිසුම යාකොබ් 5:15 |

### සුවය උදෙසා ස්වාමීන්වහන්සේගේ යාච්ඤාව

අප “ස්වාමීන්වහන්සේගේ යාච්ඤාව” ලෙස හඳුන්වන යේසුස්වහන්සේ ආකෘතියක් ලෙස ඉදිරිපත් කළ යාච්ඤාවෙහිදී සුවය සඳහා ඉල්ලීමක්ද ඇතුළත් කළ හැකි වේ.

**“ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණනි”** ඔබ “අපගේ පියාණනි” යයි අමතන විට, උන්වහන්සේගේ සියලු නාම පදනම් කොට ගෙන එතුමා අමතනු ලැබේ. එයට “නුඹ සුව කරන ස්වාමීන්වහන්සේ” යන නමද ඇතුලත්ය.

**“ඔබගේ රාජ්‍යය පැමිණේවා. ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද ඔබගේ කැමැත්ත සිදුවේවා”** : ස්වර්ගයෙහි පාපය හෝ රෝගය නොමැත. අපි ස්වර්ගයෙහි මෙන්ම පොළොවෙහිද එතුමාගේ කැමැත්ත කළ යුතු වේ. එබැවින් අපි පාපය සමඟ මෙන්ම රෝගය සමඟද සටන් කළ යුතුය.

**“අපේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව”** : යේසුස්වහන්සේ පැවසුයේ භෝජන (රොටි) අයිති දරුවන්ට (ඇදහිලිවන්තයන්) බවය. දරුවන්ගේ භෝජනයෙහි කොටසක් නම් ශාරීරික සුවය වේ (මතෙව් 15:21-28).

**“අපේ ණයකාරයන්ට අප කමා කළාක් මෙන් අපේ ණයත් අපට කමා කළ මැනව”**. : මෙම කොටස ආත්මික සුවය පිළිබඳව පවසයි.

**“අප පරීක්ෂාවට නොපමුණුවා නපුරාගෙන් අප ගැළවුව මැනව”**. ඔබ පරීක්ෂාවට විරෝධය දක්වන ආකාරයෙන්ම රෝගයටද විරෝධය දැක්විය යුතුය.

## විනාශයෙහි චක්‍රය

දෙවියන්වහන්සේ පැවසුයේ පළඟැටියන්ද, කෙඳි පළඟැටියන්ද, කපන - පළඟැටියන්ද, පළඟැටි පණුවන්ද නාස්ති කළාවූ අවුරුදු නැවත දෙන බවය (යෝවෙල් 2:25). පළඟැටි පණුවන් ලෙස හඳුන්වා ඇත්තේ පළඟැටියන්ගේ මුල් අවදිය වන දළඹු කාලයයි. කපන පළඟැටියන්ද එම විශේෂයටම අයත් කෘමියෙකි.

මෙම වර්ග තුනම ප්‍රමාණයෙන් කුඩාය. නමුත් සංඛ්‍යාවෙන් විශාලය. එසේම මෙම කෘමීන් මහත් සේ විනාශය ගෙන දෙන හානිදායක කෘමි පවුලක කොටසකි. කෘමීන් තුන් වර්ගයම බිත්තර, දළඹුවා, කෝෂය හා පරිණත කෘමියා යන ජීවන චක්‍රය සම්පූර්ණ කරති. පරිණත කෘමියා ඊළඟ පරම්පරාව සඳහා බිත්තර දමයි. එබැවින් නිමක් නොවන විනාශයෙහි චක්‍රයක් පවතී.

පාපය නිසා ලෝකයෙහි නිමක් නොවන විනාශකාරී චක්‍රයක් ක්‍රියාත්මක වේ. එනිසා ආත්මික පළඟැටි පණුවන්, කෙඳි පළඟැටියන් හා කාදමන පළඟැටියන්ගේ බලපෑම සුව කළ හැක්කේ දෙවියන්වහන්සේ තුළින් පමණකි.

## ශරීරය, ප්‍රාණය හා ආත්මය සමඟ ගනුදෙනු කිරීම

| රෝගාතුර වීම | බයිබලීය ප්‍රතිකර්මය | ස්වාභාවික ප්‍රතිකර්මය |
|---|---|---|
| ආත්මය (පාපය) | පසුතැවිලිවීම හා පව් කියාදීම යේසුස්වහන්සේ තුළින් ගැළවීම හිමි කර ගැනීම. | කිසිවක් නොමැත. |
| ශරීරය | ශාරීරික සුවය උදෙසා ඇදහිල්ලේ යාච්ඤාව යක්ෂයන් මඟින් ක්‍රියාවන් සිදුවන විට යක්ෂයන් දුරු කිරීම. | ස්වාභාවික සුවපත් වීම වෛද්‍ය විද්‍යාත්මකව සුවපත් කිරීම. |
| හැඟීම් | අභ්‍යන්තර සුවය උදෙසා යාච්ඤාව යක්ෂයන් විසින් රෝගාතුර කළ විට දුරු කිරීම. වැරදි හැඟීම් ගැන පාපොච්චාරණය හා පසුතැවීම අන් අයට සමාව දීම අවශ්‍යතාවය අනුව සම්බන්ධතාවයන් පිහිටුවා ගැනීම . | උපදේශනය |
| මනස | ක්‍රියා කිරීමේදී හෝ භෞතිකමය බලපෑමෙන් සිදුවූවක් නම් සුව වීම උදෙසා යාච්ඤා කළ හැක. | උපදේශනය හෝ යක්ෂයන් මඟින් සිදුවූවක් නම් දුරු කිරීම. |

- ඖෂධ ක්‍රියාත්මක වනුයේ රෝගය ස්වාභාවික ක්‍රමයකින් හෝ භෞතික වූ ක්‍රමයකින් හටගෙන තිබේ නම් පමණකි. යක්ෂයන් මඟින් හෝ ආත්මිකව ගැඹුරට කිඳා බැසීමෙන් ඇතිවන රෝග කෙරෙහි ඖෂධවලට බලපෑමක් නොමැත.

**සාරාංශය :**

සියලු නිත්‍යානුකූල සුව වීම් පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙනි. එය යාච්ඤාව තුළින් හෝ ස්වාභාවික ක්‍රියාදාමයක් මඟින් සිදුවිය හැකිය.

සියලු නිත්‍යානුකූල සුවය පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙනි. එය යාච්ඤාව තුළින්, ඖෂධ ඇසුරින් හෝ ස්වාභාවික ක්‍රියාදාමයකින් විය හැක. ශුද්ධ ලියවිල්ල අපට උගන්වන්නේ දෙවියන්වහන්සේ භාස්කම් කරන අතරම සාමාන්‍ය එදිනෙදා සිදුවීම්, එනම් අපට පැහැදිලි කළ හැකි මෙන්ම සිදුවිය හැකියැයි අනුමාන කළ හැකි කාරණා කෙරෙහිද එතුමා ක්‍රියාශීලී වන බවය. (ගීතාවලිය 65 බලන්න. එහි ලොවෙහි ස්වාභාවික ක්‍රියාදාමය කෙරෙහි දෙවියන්වහන්සේගේ ක්‍රියා කිරීම පෙන්වා දෙයි). එබැවින් වැදගත් කාර්යය වනුයේ මෙය වටහාගෙන සියලු සුවයන් පිළිබඳව දෙවියන්වහන්සේට මහිමය දීමය.

**. . . එහෙත් ඔවුන්ට සුවකළේ මා බව ඔව්හු නොදැන සිටියෝය. (හොසියා 11:3)**

## සුවවීමේ වෘක්ෂය

එළිදරව් 22:2හි යොහන්, අලුත් යෙරුසලමෙහි ඇත්තාවූ ගසක කොළ, ජාතීන්ගේ සුවය උදෙසා වන බව පවසයි.

එහි සැපයුම් මාධ්‍යය ජීවනයෙහි ජලයයි. එය :

- පවිත්‍රය.
- පළිඟු මෙන් පැහැදිලි
- එය නික්ම එන්නේ දෙවියන්වහන්සේගේද බැටළුපැටවාණන්ගේද සිංහාසනයෙනි.

එම වෘක්ෂය පිහිටා ඇත්තේ ශුද්ධ වූ නුවරෙහි ගඟ දෙපස, වීථිය මැදය. එය විස්තර වන්නේ :

- ජීවන වෘක්ෂයයි
- පල දොළොස් වර්ගයක් දරයි.
- එය මාස්පතා ඵල දරන බැවින් කිසිවිට වඳ නොවේ.
- එහි කොළ ජාතීන්ගේ සුවය පිණිස වේ.

ජයගන්නන් හට එම ගසෙන් කෑමට ඉඩ ලැබේ (එළිදරව් 2:7, 2:14). එම පල කෑමේ ප්‍රතිඵලය නම්:

- මින්මතු ශාප නොමැත. එළිදරව් 22:3
- ජාතීන් දෙවියන්වහන්සේට මෙහෙ කරති. එළිදරව් 22:3
- තවදුරටත් ඇතුලාන්ත රිදීම්, මරණය, ශෝකය, හැඬීම, වේදනාව, නරක මතක සටහන් නොමැත. (පරණ සිදුවීම් පහවී ගොසිනි.) එළිදරව් 21:4.
- සියලුම දේ අලුත් වී තිබේ. එළිදරව් 21:5

බයිබලයෙහි විවිධ පරිවර්තනවල මෙම වෘක්ෂය ඖෂධයක් ලෙස භාවිත කළ බව (වේමවුන්) සුව කිරීම සඳහා (මොෆට්) සුව කිරීමට අවශ්‍ය ප්‍රතිකර්ම එහි අඩංගු බවද (විලියම්ස්) සඳහන් කරයි.

## වචන අධ්‍යයනය කිරීම

මෙම පාඨමාලාව සඳහා සමීක්ෂණ සහ සූදානම් වීම කිරීමෙහිදී පහත සඳහන් වචන පිළිබඳ අධ්‍යයනය කරන ලදී.

### සුවය :

මෙම වචනය භාවිත කර ඇත්තේ අලුත් ගිවිසුමෙහි පමණකි. ග්‍රීක සම පදය වූ "හයුගිඅයිනෙයින්" පදයෙන්, සුවෙන් පසුවීම, යහපත් හොඳ සෞඛ්‍ය තත්ත්වයකින් පසුවීම, එනම් 3 යොහන් 2 හි සඳහන් පරිදි "හොඳ සුවයෙන් සිටීම" සනිටුහන් කරයි. ක්‍රියා 27:34 හි ගැළවීම සුවය ලෙසට පරිවර්තනය කර තිබේ.

### සුවවීම, සුව කිරීම.

පැරණි ගිවිසුමෙහි, සුව කිරීම පළමුව සඳහන්වන්නේ උත්පත්ති 20:17හිදී දෙවියන්වහන්සේ අබිමෙලෙක්ව සුව කළ සේක යනුවෙනි. පැරණි ගිවිසුමෙහි මෙම පදය 65 වතාවක් පමණ භාවිත කොට තිබේ. සුව කිරීම, නැවතත් සාමාන්‍ය තත්ත්වයට පත්වීම ලෙසින් පැහැදිලි කර දී තිබේ.

සුවය ඉල්ලා දෙවියන්වහන්සේට ආයාචනා කිරීම සුලබ දෙයක් විය.

- ස්වාමීනි මාගේ ඇට චලිතව තිබේ. එබැවින් මා සුව කළ මැනව. ගීතාවලිය 6:2
- ස්වාමීන්වහන්ස, මට සුව වන පිණිස මා සුව කළ මැනව. යෙරෙමියා 17:14
- මනුෂ්‍යයාගේ රෝග පමණක් නොව, අපවිත්‍ර ජලයද සුව කරනු ලැබිය. 2 රාජාවලිය 2:22, එසකියෙල් 47:8, යෙරෙමියා 19:11.
- ජාතියක් සුවපත් වීම සඳහා එම ජාතිය පසුතැවිලිවීමෙන් දෙවියන්වහන්සේගේ සමාව දීම තුළින් ඉටු විය! හොෂෙයා 6:1, යෙරෙමියා 30:17.
- විදේශ නගර පවා පසුතැවිලි වුවහොත් මෙම සුවය අත්දැකිය හැක. යෙරෙමියා 51:8-9
- බොරු අනාගතවක්තෘවරුන්ට චෝදනා කරනු ලැබුයේ ඔවුහු මනුෂ්‍යයන්ගේ ගැඹුරු වේදනා නොසලකා රෝග ලක්ෂණ කෙරෙහි පමණක් ක්‍රියා කරන බැවිනි. යෙරෙමියා 6:14, 8:11.

**අලුත් ගිවිසුමෙහි මෙම වචනයට ඇතුළත් ක්‍රියා පද නම් :**

1. Therapeuo : තෙරපෙවො : සේවය කිරීම හෝ සාත්තු කිරීම.
රෝගියාව රැක බලා ගැනීම, සැලකීම, සුවපත් කිරීම, සුවය ලබා දීම. ප්‍රධාන කොට මතෙව් හා ලූක් පොතෙහිද යොහන් 5:10හි එක් වතාවක්ද ක්‍රියා පොතෙන් පසු එළිදරව් 13:3 හා 12 භාවිතකර තිබේ.

2. ඉයාඔමයි (Iaomai) : සුව කිරීමට ආත්මිකව සහ ශාරීරිකව යන දෙකින්ම සම්පූර්ණයෙන් සුව කිරීම.

   - ශාරීරික සුවය සඳහා උදාහරණ : මතෙව් 15:28, මෙම අර්ථයෙන් 22 වතාවක් භාවිත කොට ඇත.

   - ආත්මික සුව කිරීම් පිළිබඳ උදාහරණ : මතෙව් 13:15, යොහාන් 12:40, ක්‍රියා 28:27, හෙබ්‍රෙව් 12:13, 1 පේතෘස් 2:24.

3. සෝඩ්සෝ (Sozo) : රෝගයකින් හා එහි බලපෑමෙන් බේරා ගැනීම, උදාහරණ සඳහා මාර්ක් 5:23 සහ ලූක් 8:36 බලන්න.

4. ඩියාසෝඩ්සෝ (Diasozo) සම්පූර්ණයෙන්ම බේරා ගැනීම. ලූක් 7:3 බලන්න.

**මෙම පදය සඳහා ඇති නාම පද :**

1. තෙරාපෙයා (Therapeia) රැකබලා ගැනීම හා අවධානය සනිටුහන් කරයි (ලූක් 12:42). ජීවනයේ වෘක්ෂයෙහි කොළවලින් සිදු කරන බලපෑම : එළිදරව් 22:2

2. ඉයාමා (Iama) : අර්ථය සුවය. 1 කොරින්ති 12:9, 28, 30හි බහු වචනාර්ථයෙන් යොදා ගෙන තිබේ.

3. ඉයාසිස් (Iasis) : 2 වන ක්‍රියාපදය හා සමානය. ක්‍රියාදාමය සම්පූර්ණ කිරීම අවධාරණය කරයි. (ලූක් 13:32, ක්‍රියා 4:22, 30).

## සුවය:

මෙම වචනය පැරණි ගිවිසුමෙහි යොදාගෙන නොමැත. අලුත් ගිවිසුමෙහි “ඉයාසිස්” නාම පදයෙහි අර්ථය සුවවීම හෝ රෝගයට පිළියම වේ. උදා: ලූක් 13:32, ක්‍රියා 4:22, ක්‍රියා 4:30. ක්‍රියාපදයක් ලෙස “තෙරපියෝ” යන්නෙහි අරුත මෙහෙ කිරීම වේ. උදා: ක්‍රියා 17:25. සුව කිරීමට, සුවය නැවත ලබාදීමට හා පිළියමක් යෙදීමට උදා: මතෙව් 17:16,18, ලූක් 7:21, 9:1, යොහන් 5:10, ක්‍රියා 28:9 වේ.

## රෝගාතුර වීම:

මෙම වචනය පැරණි ගිවිසුමෙහි හෙබ්‍රෙව් බසින් 60 වාරයක් භාවිත කර තිබේ. පළමු වතාවට එය හමුවන්නේ උත්පත්ති 48:1හිය. මෙම වචනයේ අර්ථය එක් එක් ස්ථානවලදී වෙනස් වේ. මේවා දුර්වලතාවය, සාමාන්‍ය තත්ත්වයෙන් නොසිටීම, අධික වෙහෙස වීම නිසා දුර්වල වීම ලෙස වේ. “රෝගය” නම් නාම පදය පරණ ගිවිසුමෙහි 23 වතාවක් දක්නට ලැබෙන අතර යෙසායා 53:3-4 සඳහන් පරිදි වේදනාවෙන් පසුවීම විස්තර කරයි. සමහරු මෙය ශෝකය හා දුර්වලකම ලෙසට පරිවර්තනය කරති. රෝගයෙහි අර්ථය ද්විතීය කථාව 7:15 සඳහන් කර ඇත.

**අලුත් ගිවිසුමෙහි ලෙඩ යන පදය එහි ක්‍රියා පදය ලෙසට භාවිත කොට ඇත. එයට පහත සඳහන් කාරණා ඇතුළත් වේ.**

1. ඇස්තෙනෙයෝ : Astheneo : දුර්වල වීම, (වැඩක් කරගත නොහැකිවීම, ගිලන්වීම) ශක්තිය හීනවීම, රෝගාතුර වීම.

2. කම්නෝ Kamno : අඛණ්ඩව වෙහෙස වීම නිසා දුර්වල තත්ත්වයට පත්වීම. : හෙබ්‍රෙව් 12:3, යාකොබ් 5:15, මනස වෙහෙසට පත්වීමෙන් ශාරීරිකව සුවපත් වීමට බාධා ගෙන දෙයි.

3. සුනෙකෝ Sunecho : ලෙඩ රෝග විසින් මඩින ලද, හිංසාවට පත්වූ, රෝගය වැළඳී.

**එය විශේෂණ පදයක් ලෙසටද භාවිත කොට තිබේ.**

1. අස්තෙනේස් Asthenes : ශක්තියෙන් තොර, දුබල, ගිලන්ව.

2. අර්රෝස්තොස් Arrhostos : බෙලහීන, රෝගාතුර, ලෙඩවූ පුද්ගලයා, ලෙඩා.

**එහි නාම පදයට ඇතුලත් වනුයේ :**

1. අස්තෙනේස් (Asthenes) : දුර්වලකම, රෝගීබව.

2. නොසොස් (Nosos) : රෝග .

## දුර්වලතා:

මෙම වචනය පැරණි ගිවිසුමෙහි භාවිත කොට නොමැත. අලුත් ගිවිසුමෙහි එයට ඇතුලත් වනුයේ :

1. අස්තෙනෙයා (Astheneia) : ශක්තිය අවශ්‍ය වීම, දුර්වලවීම, ප්‍රතිඵල නිපදවීමට නොහැකියාව: රෝම 8:26, 2 කොරින්ති 11:30, 12:5,9,10, ලූක් 13:11 හි එය "දුර්වලකමේ ආත්මයකි". එනම් සෘජුවම සාතන්ගේ ගුණාංගයකි.

2. ඇස්තෙනේමා (Asthenema) : ඇදහිල්ලේ දුර්වලකම (රෝම 15:1).

## රෝග:

පැරණි ගිවිසුමෙහි පාදයෙහි රෝගයක් පිළිබඳව 1 රාජාවලිය 15:23 සහ 2 ලේකම් 16:12හි සඳහන් වේ. බඩෙහි රෝගයක් පිළිබඳව 2 ලේකම් 21:15හි සඳහන් වේ. රෝගවල ලක්ෂණ නම් :

| | |
|---|---|
| - වේදනාවෙන් කලකිරී | ගීතාවලිය 38:7 |
| - දුෂ්ඨ | ගීතාවලිය 41:8 |
| - ප්‍රබල | 2 ලේකම් 16:12 |
| - සමහර විට සුව කළ නොහැකි | 2 ලේකම් 21:18 |

**අලුත් ගිවිසුමෙහි පහත සඳහන් නාම පද රෝග සඳහා භාවිත කර ඇත.**

1. අස්තෙනෙයා (Astheneia) : ශක්තිය හීන බව, දුර්වලවීම, ලෙඩබව, දුර්වලතා.
2. මලාකියා (Malakia) : මෘදු බව, රෝග . . .
3. නොසොස් (Nosos) : තුවාල වීම, රෝග, දුර්වලතා.
4. මලාකියා (Malakia) : මෘදු බව, දුර්වලකම, රෝගය
5. නොසේමා ( Nosema) : මනසින් දුර්වල විම

පහත සඳහන් ක්‍රියා පද අලුත් ගිවිසුමෙහි භාවිත කර ඇත.

1. අස්තෙනෙයෝ (Astheneo) : ශක්තිය මදිකම, දුර්වලව සිටීම, රෝගාතුරවීම.
2. එකෝ කාකොස් ( Eeho Kakos) : ලෙඩින් පෙළීම හෝ රෝගී බව.

රෝග විවිධ වර්ග ගණනාවක් ඇත. සමහර රෝග නම් සඳහන් කර නොමැත. (මතෙව් 4:24, 14:35, මාර්ක් 1:32-34, ලූක් 4:40). තව සමහරක් නම් කොට තිබේ. (මතෙව් 9:20). යේසුස්වහන්සේ සියලු රෝග සුව කළ සේක. මතෙව් 4:23, 9:35, 14:35, මාර්ක් 1:32, 10:1, ලූක් 6:17, 9:1, යොහන් 5:4, 6:2.

## පීඩාකාරක:

ග්‍රීක භාෂාවෙහි යොදාගෙන ඇති පරිදි මෙය ශාරීරික ආබාධයක් පිළිබඳව නොවෙයි. එයින් අර්ථවත් වන්නේ කරදර, පීඩා, අඩුලුහුඬුකම් හා මහත් ව්‍යසනයන්ය.

**යාකොබ් 5:13-18**

මනුෂ්‍යයෝ කරදරවලට ක්‍රම දෙකකින් ප්‍රතිචාර දක්වති.

1. **සමහරු කරදර පීඩාවන් ලෙස දකිති**. ඔබ පීඩාවට පත්ව සිටී නම්, (පරීක්ෂා, පීඩාවන්, සෝදිසි කරනු ලැබීම්) ඔබ ඔබ ගැනම යාච්ඤා කළ යුතුය. අන් අයට ඔබ සමඟ යාච්ඤා කරන ලෙස කැඳවිය හැක. නමුත් ඔවුහු ඔබගේ පීඩාව පහවන ලෙස යාච්ඤා නොකළ යුතුවේ. ශුද්ධ ලියවිල්ල පවසන්නේ ඔබ කරදරයට පීඩාවට ලක්වූ කල ඔබ යාච්ඤා කළ යුතු බවය. එමඟින් ජයග්‍රාහකයෙකු වීමට ඔබ ඉගෙන ගත යුතු බැවිනි.

2. **සමහරු කරදර, පීඩා සතුටක් ලෙස දකිති**.
ඔවුන් ප්‍රීතිවනුයේ කරදර පැමිණි බැවින් නොවේ. එනමුත් කරදර මධ්‍යයේ පවා ස්වාමීන්වහන්සේ ඒ හා සමඟද එය තුළින්ද ක්‍රියා කරන බව දැන ගැනීම නිසා ඔවුන්ට ප්‍රීති විය හැකි බැවිනි.

රෝගියා උදෙසා යාච්ඤා කරන පිණිස වැඩිමහල්ලන් කැඳවිය යුතුය. මෙහිදී එක් වැඩිමහල්ලෙක් පමණක් නොව ඊට වැඩි ගණනක් සිටිය යුතු බව මතක තබා ගන්න. මෙලෙස සුව කිරීමේ ගෞරවය මිනිසාට නොව දෙවියන්වහන්සේ වෙතට ලැබෙනු ඇත. රෝගියා ඇදහිල්ලේ ක්‍රියාවක් ලෙස වැඩිමහල්ලන් කැඳවිය යුතු අතර යාච්ඤා ඔප්පු කළ යුතුය. එම යාච්ඤාව ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකු විසින් ඇදහිල්ලෙන්, උනන්දුවෙන් ඔප්පු කළ යුතු යාච්ඤාවකි. ඉතා ඕනෑකමින්, ඇදහිල්ලේ යාච්ඤාවක් ඔප්පු කිරීමට දැන සිටියාවූ මිනිසෙකු ලෙස එලියා උදාහරණයකට ගෙන තිබේ. මෙහි පසුබිම දැනගැනීම සඳහා 1 රාජාවලිය 17:1,18:1 සහ ලූක් 4:25 බලන්න. රෝගීන් ගැළවීම ලැබිය යුතුය. (ඔවුන්ගේ ශාරීරික රෝගයෙන්) නැගිටුවනු ලැබිය යුතුය (නැවත ශක්තිමත් බවට). ඔවුන්ගේ පාපයට සමාව ලැබිය යුතුය (ආත්මික සුවය).

සමහර රෝගී අවස්ථාවලදී පාපය හා රෝගය අතර සෘජුවම බැඳී සම්බන්ධතාවයක් පවතින බව මෙම කොටසින් පෙන්නුම් වේ (ගීතාවලිය 41:4 බලන්න). සුවයෙහි ශාරීරික මෙන්ම ආත්මික පැතිකඩක්ද පවතී. එසේම අප ස්වාමීන්වහන්සේ සමඟ හවුල් සම්බන්ධතාවයෙන් ක්‍රියා කරන ක්‍රමයද එමඟින් විදහා දැක්වේ. අප මෙහෙකරන අතර එතුමා නැගිටුවන සේක.

## යේසුස්වහන්සේ සුව කළ පුද්ගලයන්

### යක්ෂ බලපෑම් සඳහන් වූ සිදුවීම්

| | මතෙව් | මාර්ක් | ලූක් |
|---|---|---|---|
| කොර ස්ත්‍රිය | | | 13:10-17 |
| අශුද්ධ ආත්ම සිටි මිනිසා | | 1:23-25 | 4:31-37 |
| ගදරීනයෙහි අශුද්ධ ආත්ම | 8:28-32 | 5:1-13 | 8:26-33 |
| මහලේ රෝගී ස්ත්‍රිය | 9:20-23 | 5:25-34 | 8:43-48 |
| සිරෝෆිනිය කාන්තාවගේ දුව | 15:21-28 | 7:24-30 | |
| දුෂ්ඨ ආත්මයක් තිබූ දරුවා | 17:14-21 | 9:14-29 | 9:37-43 |
| ගොළු යක්ෂ ආත්මය | 9:32-33 | | |
| අන්ධ ගොළු යක්ෂ ආත්මය | 12:22-30 | 3:22-27 | 11:14-26 |

## අධ්‍යයන සටහන් :

පහත සඳහන් වනුයේ විශේෂයෙන්ම යක්ෂ බලපෑම් තිබූ බවට සඳහන් කර ඇති පුද්ගලයන් සුව වීම පිළිබඳව අධ්‍යයන සටහන්ය.

**කුදු ස්ත්‍රිය ලූක් 13:10-17**

මෙම කාන්තාව බඳිනු ලැබ හෝ කුදු වී සිටියාය.

ශාරීරිකව : ඇගේ පිට කොන්ද නැවී තිබිණි. (අපගේ බැල්ම ඉහළට නොව පහළට යොමු කරවන පිණිස සාතන් මෙය කරයි).

ආත්මිකව : අපගේ බැල්ම ඉහළට නොව පහළටය.

මානසිකව : ඇයට කිසිම බලාපොරොත්තුවක් නොමැති බව පවසා තිබිණි.

මූල්‍යමය : ඈ සන්තක සියල්ල වියදම් කොට හමාරය.

මෙම ස්ත්‍රිය සබත් දින දේව මෙහෙයට සහභාගි වූ අතර යේසුස්වහන්සේ ඇයට "ආබ්‍රහම්ගේ දියණියක්" යැයි ඇමතූ සේක (ගලාති 3:7). ඇය ධර්මිෂ්ඨ, දේව භය ඇති පුද්ගලයෙක් විය හැකියයි සිතිය හැකිය. එහෙත් දුර්වලකමේ ආත්මයක් ඇයව වසර 18ක් මුළුල්ලේ බැඳ තැබීය.

මෙම සිදුවීම අපහට සුව කිරීමේ සේවාවෙහිදී ආත්ම විමසීමෙහි පවතින වැදගත්කම පෙන්වා දෙයි. මෙය යක්ෂයා විසින් ඇති කළ රෝගයකි. යේසුස්වහන්සේගේ සේවයෙහිදී එතුමා සාමාන්‍ය ශාරීරික රෝග, එනම් අත් තැබීමෙන් හෝ තෙල් ආලේපයෙන් හෝ සුව කළ හැකි රෝග හා යක්ෂයන්ගේ පීඩාවෙන් ඇතිවූ රෝග අතර වෙනස වටහා ගත් සේක.

ඇදහිලිවන්තයෙක් යක්ෂයාගේ පීඩා කිරීම හේතුවෙන් බාහිරයෙන් බැඳීමකට ලක් වී සිටින කල, බැඳ තබන ආත්මය ලිහා නිදහස් කරනු ලැබිය. එය ඇදහිලිවන්තයෙක් නොවන කෙනෙකුව යක්ෂාවේශ වීමක් නිසා ශාරීරික දුබලතාවයකට පත් වී සිටීමක් නම් එම යක්ෂයා දුරු කර පලවා හරින ලදී. යේසුස්වහන්සේ විමසා සිටියේ "මෙම ස්ත්‍රිය බැම්මෙන් නිදහස් කරන්ට යුතු වූවා නොවේද?" යනුවෙනි. (යේසුස්වහන්සේ තවමත් අසන්නේ, "මෙම ලෙඩුන් සුව කළ යුතුව තිබුණා නොවේද?" යනුවෙනි).

මෙම ස්ත්‍රිය මුදනු ලැබීම සිදුවූයේ සාමාන්‍ය දේව මෙහෙයක් අතරතුරදීය. එමඟින් ආත්මික නායකයන්ගෙන්, විශේෂයෙන්ම සිනගෝගයේ මූලාදෑනියාගෙන් විරුද්ධතා මතු විය. යක්ෂාවේශවූවන් සම්බන්ධව ක්‍රියා කිරීම නූතනයේ පවා බොහෝ ආත්මික නායකයන්ගේ විරෝධයට පාත්‍ර වේ. සමහරු යක්ෂයන් සිටීම පවා පිළිනොගනිති. අනෙක් අය යක්ෂයාට මනුෂ්‍යයාව පීඩාවට පත් කිරීමට හෝ යක්ෂාවේශ වීමට ඇති හැකියාව පිළිනොගනී.

යේසුස්වහන්සේ (කුදුව) බැඳීමට ලක්වී සිටි කාන්තාව පිට අත් තැබූ සේක. එකෙණෙහිම ඇය කෙළින් වී දෙවියන්වහන්සේට මහිමය දුන්නාය. යක්ෂාවේශ හෝ යක්ෂයා විසින් මඩන ලද පුද්ගලයන් සමඟ සිදු කරන සියලු සේවාවන්හිදී දෙවියන්වහන්සේට සියලු ගෞරවය දෙනු විනා එම සුවය බෙදා දීමට සහාය දැක්වූ පුද්ගලයා වෙත ගෞරවය පිදිය යුතු නොවේ.

**අපිරිසිදු ආත්මයක් ඇතිව සිනගෝගයෙහි සිටි මිනිසා : මාර්ක් 1:23-28, ලූක් 4:31-37**

මෙම මිනිසා කපර්ණවුමෙහි සිනගෝගයේ සිටි නමුත්, යේසුස්වහන්සේ ඔහුට ආබ්‍රහම්ගේ පුත්‍රයෙක් යයි අමතන්නේ නැත. එසේම ඔහු දෙවියන්වහන්සේගේ අනුගාමිකයෙකු යැයි සඳහන් කරන්නේද නොමැත. සභාවක සහභාගිකමේ දේව මෙහෙයෙහි නොඇදහිලිවතුන් සහ යක්ෂාවේශවූවන් සිටිය හැකිය. දේව මෙහෙයට සහභාගි වීම නැවත - උත්පාදනයේ හෝ යක්ෂ බලවේගවල බලපෑමෙන් මිදීම තහවුරු නොකරයි.

යේසුස්වහන්සේ ආධිපත්‍ය බලයෙන් යුතුව උගන්වමින් සිටියදී යක්ෂ ආත්මය මොරදෙමින්, "අහෝ ! නාසරීය යේසුස්වහන්ස ඔබට අපෙන් කම මොකද? ඔබ අප විනාශ කරන්ට ආ සේක්ද? ඔබ කවුද කියා දනිමි, ඔබ දෙවියන්වහන්සේගේ ශුද්ධ වූ තැනැන්වහන්සේය" යි කීවේය. යක්ෂයා සැබවින්ම ගීතාවලිය 16:10 හි සඳහන් පදයක් උපුටා දැක්වීය. මෙහිදී එම මනුෂ්‍යයා යක්ෂයන් කිහිප දෙනෙකුගේ ආවේශයට ලක්ව සිටියේය. "අප" යනුවෙන් ප්‍රකාශ කළේ එක් යකෙකුට වැඩි බවය. යක්ෂයන් කණ්ඩායම් ලෙස ක්‍රියා කරති. ඉන් එක යක්ෂයෙක් ප්‍රකාශකයා විය. එම යක්ෂයා "මම දනිමි" යි කීවේය.

යක්ෂයා කතා කිරීමට පටන් ගත් කල, යේසුස්වහන්සේ තරවටු කරමින්, “කතා නොකර, මොහුගෙන් පිටවෙව” යි පැවසිය. යක්ෂයෝ එම මිනිසාව බිම හෙළා, මහත් හඬකින් මොර දී, මිනිසාගෙන් පිටවිය. අවට සිටි අය යේසුස්වහන්සේ අශුද්ධ ආත්ම සමඟ බලයෙන් හා ආධිපත්‍යයෙන් යුතුව ක්‍රියා කළ ආකාරය දැක මවිත වූහ. ඔවුහු පුදුමයට පත්ව “මේ කුමක්ද?” යි විමසූහ. එහි ප්‍රතිඵලයක් ලෙස මේ පිළිබඳ වාර්තාවන්ද, කටකතාවන්ද පැතිර ගියේය.

**ගදරීනයෙහි යක්ෂාවේශ වූ පුද්ගලයා : මතෙව් 8:28-32, මාර්ක් 5:1-13, ලූක් 8:26-33**

මතෙව් පවසන පරිදි කිසි මිනිසෙකුට පාලනය කළ නොහැකි තරම් දරුණු වූ යක්ෂාවේශ වූ මිනිසුන් දෙදෙනෙක් සොහොන් ගෙවල්වල ජීවත් විය. මාර්ක් සහ ලූක් මෙම මනුෂ්‍යයෝ ගත කළාවූ දුක්ඛිත තත්ත්වයෙන් ඉන් එක් අයෙකුගේ මිදීමත් අවධාරණය කරති. එම මිනිසාගේ තත්ත්වය යේසුස්වහන්සේ තම සේවා කාලයෙහිදී මුණ ගැසුණු නරකම තත්ත්වය විය හැක.

මෙහිදී එම මිනිසා බොහෝ යක්ෂයන් විසින් අරක් ගෙන තිබිණි. මෙම මනුෂ්‍යයෝ දෙදෙනාම එතරම්ම බලපෑමට ලක් වී තිබූ බැවින් ඔවුන්ට සාමාන්‍ය සමාජයෙහි ජීවත් විය හැකි නොවීය. ඔවුහු සොහොන් පිට්ටනිවල ජීවත්වූහ. එක් මිනිසෙක් තුළ වූ යක්ෂයෝ තමුන්ව “බල කාණ්ඩයක් - ලෙගියොන්” ලෙස සමූහයක් ලෙස හඳුන්වා දුන්නෝය. මේ යක්ෂයෝ මෙම මිනිසාව දම්වැල්වලින් බැඳ දමාවත් පාලනය කළ නොහැකි තත්ත්වයට පත් කළෝය. යක්ෂයෝ කෙතරම් මෙම මිනිසාට හිරිහැර කළාද කිවහොත් ඔහු මොර ගසමින්, තමාව ගල්වලින් කපා ගනිමින් ඇඳුම් නැඳ එහා මෙහා සක්මන් කරන්නට සැලසීය. යක්ෂයෙකුට එරෙහිව ආධිපත්‍ය බලය රැඳී පවතින්නේ යේසුස්වහන්සේගේ නාමය තුළය.

මෙම සිදුවීමෙහිදී පැවති බාධක වර්ග සලකා බලන්න.

| | |
|---|---|
| ශාරීරික : | දම්වැල් කැඩීම, තමාවම කපා ගැනීම. |
| හැඟීම් තුළ හා මානසික : | මොර ගැසීම |
| සමාජයීය : | සමාජයෙන් වෙන්වී |
| සදාචාර : | නිර්වස්ත්‍රව සිටීම |
| ආත්මිකව : | යක්ෂ සමූහයක් |

යක්ෂයෝ යේසුස්වහන්සේ හඳුනාගෙන “තමුන්ගේ කාලයට පෙර” ඔවුන්ට හිරිහැර කරන්ට පැමිණියාදැයි යේසුස්වහන්සේගෙන් විමසූහ. “ඔවුන්ගේ කාලය” ලෙස මෙහි දැක්වෙන්නේ ගිනි විලෙහි අවසාන විනිශ්චයය.

යක්ෂයෝ තමුන්ට එම ප්‍රදේශයෙන් පිට නොකරන මෙන් ඉල්ලා සිටීමෙන් සමහර විට සාතන් ඔවුන්ව කිසියම් විශේෂිත ප්‍රදේශයකට නියම කර තිබූ බවට සාක්ෂියක් විය හැක. යේසුස්වහන්සේ ඔවුන්ව දුරු කළ පසුව ඌරු රැළ වෙත යාමට අවසර දුන් සේක. මෙයින් ඌරෝ මිය ගියහ. නගර වැසියෝ යේසුස්වහන්සේට පිටව යන ලෙස ඉල්ලා සිටියහ. ඌරන් එම නගර වැසියන්ගේ ජීවිකාව වූ බැවින් යක්ෂයාගේ බලයෙන් මිනිසෙකු මුදවා ගැනීමට වඩා ඔවුන්ට ඌරන් වටිනාකමින් වැඩි විය.

**මහ ලේ රෝගී ස්ත්‍රිය : මතෙව් 9:20-23, මාර්ක් 5:25-34, ලූක් 8:43-48.**

මෙම කාන්තාව අවුරුදු 12ක් මුළුල්ලේ මෙම රෝගයෙන් පීඩා වින්දාය. ඇය බොහෝ වෛද්‍යවරු වෙත ගොස් බොහෝ දේ විඳ ඈ සතු සියල්ල වියදම් කළ නමුත් කිසිම හොඳක් නොවී රෝගය තව බරපතල විය. ඇය අධිෂ්ඨානයෙන් යුතුව දිගටම පැවතියාය. ඇය යේසුස්වහන්සේ ස්පර්ශ කරන පිණිස සෙනඟගෙන් තෙරපී ඉදිරියට ගියාය.

ඇය ඇයටම ඇදහිල්ල කතා කරමින් සම්පූර්ණත්වය සෙව්වාය. සුවය පමණක් නොවේ. “මම සම්පූර්ණ වෙන්න යනවා” යයි ඇය පැවසුවාය. ඇයව සුව කළේ යේසුස්වහන්සේ ස්පර්ශ කිරීම නොව ඇයගේ ඇදහිල්ලය. යේසුස්වහන්සේ ඇයට පැවසුයේ, “ඔබේ ඇදහිල්ල ඔබව සුවකොට ඇත. සමාදානයෙන් යන්න, ඔබේ රෝගයෙන් සම්පූර්ණ සුවය අත් විඳින්න” යනුවෙනි.

ස්ත්‍රිය යේසුස්වහන්සේව ස්පර්ශ කළ විට උන්වහන්සේගෙන් ආනුභාවය නික්ම විය. ඔවුන් දෙදෙනාටම එය දැණුනි. ඇය එම පැයේදීම සම්පූර්ණ සුවය ලැබූ බැවින් තම රෝගයෙන් සුවවූ බව සිරුරට දැනෙන්නට විය. ඇය ඇගේ දුක් විඳීමෙන් නිදහස ලැබූ බැවින් හැඟීම් තුළද සුවය ලැබුවාය. යේසුස්වහන්සේ බොහෝ

විට විමසීමේ ආත්මය භාවිත කළ ද මෙවර එතුමා ස්වාභාවික ක්‍රමය භාවිත කළ සේක. "මට අත ගැසුවේ කවුද?" කියා විමසූ සේක.

**සිරෝෆිනිය කාන්තාවගේ දුවණිය : මතෙව් 15:21-28, මාර්ක් 7:24-30.**

මෙම යෞවණිය අශුද්ධ ආත්මයකින් අරක් ගෙන තිබූ අතර ඇගේ මව, බාහිර ලක්ෂණ අනුව එය හැඳින ගත්තාය. ඇය තම දුව "බලවත් ලෙස යක්ෂාවේශව සිටින්නී" යැයි එතුමාට දැන්නුවාය. යේසුස්වහන්සේ එම මව පෙන්වූ ඇදහිල්ල හේතුවෙන් ඇගේ දුව සුවපත් කළ සේක. එම දුව යේසුස්වහන්සේ ඉදිරියෙහි පෙනී නොසිටියාය. මෙයින් පෙන්නුම් වන්නේ සාතන් විසින් ආවේශ වූ හෝ පීඩා කරනු ලැබූ පුද්ගලයන් මිදීම ලබන පිණිස ශාරීරිකව පෙනී සිටීම අත්‍යාවශ්‍ය නොවන බවය.

මෙය සහ පහත සඳහන් අනෙකුත් සිද්ධීන් තුළින් විදහා දැක්වෙනුයේ, දරුවන් යක්ෂයා විසින් ගොදුරු කර ගැනීමට ලක් විය හැකි බවය. එසේම අත් නැර, නොකඩවාම ඉල්ලා සිටීමේ වැදගත්කම මින් පෙන්නුම් කරයි. සුවය "දරුවන්ට අයිති කෑම" (දෙවියන්වහන්සේගේ දරුවන්ට හිමි දෙය) බව තහවුරු කරයි.

**යක්ෂ ආත්මයකින් පෙළුණාවූ දරුවා : මතෙව් 17:14-21, මාර්ක් 9:14-29, ලූක් 9:37-45.**

ගෝලයෝ අශුද්ධාත්මය දුරු කිරීමට උත්සාහ කළ නුමුත් අසමත් වූහ. යේසුස්වහන්සේ පැවසුයේ, මෙය නොඇදහිල්ල නිසාත්, මෙවැනි යක්ෂ ආත්ම දුරු කළ හැක්කේ යාච්ඤාවෙන් හා නිරාහාරයෙන් පමණක් බවත්ය. අවිශ්වාසයේ වාතාවරණයක් මෙම සිදුවීම කෙරෙහි බලපාන්නට ඇත. මෙය සිදුවන විට ගෝලයෝ ආගමික නායකයන් සමඟ විවාද කරමින් නොඇදහිලිවතුන් මධ්‍යයේ සිටියෝය.

එසේම මෙම කථාවෙන් පෙන්වා දෙන්නේ සමහර යක්ෂයන් අනෙක් යක්ෂයන්ට වඩා බලගතු බවය. මෙම පිරිමි ළමයා පිළිබඳ සඳහන් සියලු ශුද්ධ ලියවිලි එකමුතු කොට ගත් කළ එළිදරව්වන කාරණා නම් :

- ඔහු උන්මත්තකයෙකි. (මානසික වියවුල්ව)
- බොහෝ වේදනා වින්දේය.
- ඔහු බොහෝ විට වතුරට හා ගින්දරට වැටුණි. (විනාශකාරී ආත්මය)
- ආත්මය ඔහුව සුරා, තුවාල කළේය.
- ඔහුට ගොළු ආත්මයක් විය.
- ආත්මය ඔහුව බිම හෙළීය.
- ඔහු දත් මිටි කෑවේය.
- ඔහු ශාරීරිකව ක්‍රමයෙන් දුර්වල විය.
- මෙම තත්ත්වය ළදරු වියේ සිට පැවතිය.

සියලු ගොළු, බිහිරි සහ අපස්මාර රෝගීන් යක්ෂාවේශ වුවන් ලෙස වර්ගීකරණය නොකිරීමට ප්‍රවේසම් විය යුතුය. යක්ෂාවේශ නොවූ බොහෝ ගොළු බිහිරි අය සිටිති. ඔවුන්ට මෙම ප්‍රතිඵලය ගෙන දුන් සමහර රෝග හෝ සිදුවීම් පැවතිය හැකිය.

ලූක් වාර්තා කරන ආකාරයට එම පිරිමි ළමයා යේසුස්වහන්සේ වෙතට පැමිණි අවස්ථාවෙහි යක්ෂයා ඔහුව බිම හෙළා පීඩා කළේය. යේසුස්වහන්සේ යක්ෂයාට තරවටු කොට, දරුවා සුව කළ සේක. මතෙව් වාර්තා කරනුයේ යේසුස්වහන්සේ යක්ෂයාට තරවටු කළ විට යක්ෂයා ඔහුගෙන් බැහැරව ගිය අතර ඔහු එම පැයේදීම සුව වූ බවය.

මාර්ක් මෙම යක්ෂාවේශ සිදුවීම මතෙව් හා ලූක්ට වඩා සවිස්තරාත්මකව වාර්තා කරයි. යේසුස්වහන්සේ එම පියාගෙන් විමසා සිටියේ තම දරුවා කොපමණ කලක් මෙසේ යක්ෂාවේශව සිටියාද යනුවෙනි. පියාගේ පිළිතුර වූයේ ඔහුගේ ළදරු වියේ සිට මෙසේ සිටි බවය.

යේසුස්වහන්සේ, විශ්වාස කිරීමේ ඇති වැදගත්කම එම පියාට අවධාරණය කොට ,ඉන්පසු ගොළු බිහිරි ආත්මයට කථා කොට, පිටතට ඒමටත්, තවදුරටත් ආවේශ නොවීමටත් අණ කළ සේක. යක්ෂ ආත්මය

මහත් හඬින් මොර ගසමින් ළමයා තුළින් නික්ම යන අතර දරුවා සිටි තත්ත්වය දැක බොහෝ දෙනෙකු ඔහු මිය ගිය බව සිතුවෝය. නමුත් යේසුස්වහන්සේ දරුවා අතින් අල්ලා නැගිට වූ සේක.

ගෝලයෝ තමුන්ට යක්ෂාත්මය දුරු කිරීමට නොහැකි වූයේ මන්දැයි යේසුස්වහන්සේගෙන් විමසූ කල එතුමා දුන් පිළිතුර නම්: උන්වහන්සේ කියන සේක්:

> **"නුඹලාගේ ඇදහිල්ලේ මදිකම නිසාය. සැබවක් නුඹලාට කියමි - අබ ඇටයක් පමණ ඇදහිල්ල නුඹලාට ඇත්නම්, මේ කන්දට කථාකොට: මෙතැනින් අහක්ව, එතැනට යවයි කීවත් ඒක යන්නේය: කිසිවක් නුඹලාට බැරි නොවන්නේයයි කී සේක." මතෙව් 17:20-21.**

**මාර්ක් ශුභාරංචියේ යාච්ඤාවෙන් මිස මේ ජාතිය දුරුකරන්ට නුපුළුවනැයි සඳහන් වේ.**

යක්ෂාත්ම සමඟ ක්‍රියාකිරීමෙහිදී ඇදහිල්ලේ, යාච්ඤාවේ හා නිරාහාරයේ ඇති වැදගත්කම යේසුස්වහන්සේගේ පිළිතුරෙන් එළිදරව් වේ. එසේම සමහර යක්ෂයන් දුරු කිරීම අනෙක් යක්ෂයන්ට වඩා අපහසු බවද මෙයින් පෙන්වා දෙයි. යේසුස්වහන්සේ "මෙවැනි ආත්ම දුරුවනුයේ යාච්ඤාවෙන් හා නිරාහාරයෙන් පමණයි" කීමෙන් මෙය වඩා තහවුරු වේ. වැදගත් සටහනක් : මනුෂ්‍යයෝ යේසුස්වහන්සේව ප්‍රතික්ෂේප කළ අතර (යොහාන් 1:11) යක්ෂයෝ උන්වහන්සේව පිළිගත්තෝය (ලූක් 10:15).

**යක්ෂාවේශ ගොළුවා : මතෙව් 9:32-33.**

මෙම මනුෂ්‍යයාව යේසුස්වහන්සේ වෙතට ගෙනෙන ලද්දේ යක්ෂාවේශ වීමක් හේතුවෙන් ගොළුවී සිටීම නිසාය. යක්ෂයාව දුරුකළ විට, ඒ මිනිසාට කතා කළ හැකි විය. රැස්ව සිටි මහ ජනතාව මවිතයට පත්ව "මෙබන්දක් ඉශ්‍රායෙල්හි කිසි කලෙක දකින්නට ලැබුණේ නැතැ"යි කීවෝය. ඵරිසිවරු උන්වහන්සේට චෝදනා කළේ යක්ෂාධිපතියාගේ උපකාරයෙන් යක්ෂයන් දුරු කළේය කියා වේ.

**යක්ෂාවේශ වූ අන්ධ ගොළුවා : මතෙව් 12:22-30, මාර්ක් 3:22-27, ලූක් 11:14-26.**

ආවේශය මඟින් ශාරීරිකව එම මිනිසාව ගොළු හා අන්ධ බවට පත් කර තිබුණි. යේසුස්වහන්සේ යක්ෂාත්මය දුරු කිරීමෙන් මොහුව සුවපත් කළ සේක. මිදීමෙන් පසුව ඔහුට පෙනීම ලැබ, කතා කිරීමට හැකිවිය. යේසුස්වහන්සේ මෙම සිද්ධිය ඇසුරින් යක්ෂයන් දුරු කිරීම සම්බන්ධව දීර්ඝ ඉගැන්වීමක් ඉදිරිපත් කළ සේක. මෙම ඉගැන්වීමෙහි සාරාංශය නම් :

- වෙන්වී භේදව සිටින නිවසක් පවතින්නේ නැත. යක්ෂයෝ තමුන් අරක්ගෙන සිටින ශරීර "නිවෙස්" ලෙස හඳුන්වති. යක්ෂයන්ටත් දෙවියන්වහන්සේගේ ආත්මයටත් එකම ගෙදරක එකට වාසය කළ නොහැක.
- සාතන්ට සාතන්වම දුරු කළ නොහැක.
- යක්ෂයන් දුරු කිරීම දේව රාජ්‍යයෙහි සේවාවේ අංගයකි.
- යක්ෂයන් දුරු කරනුයේ දෙවියන්වහන්සේගේ ආත්මයයි.
- යක්ෂයා පිටතට හෙළීමට පෙර (ඌගේ ක්‍රියා විනාශ කිරීමට පෙර) ශක්තිමත් පුද්ගලයා (සාතන්) බැඳිය යුතුය.
- මෙම සටනෙහි උදාසීන කලාපයක් නැත. ඔබ යේසුස්වහන්සේ සමඟ නොවේ නම් එතුමාට එරෙහිවය.
- යම් කිසිවෙකුගෙන් අශුද්ධ ආත්මයක් දුරු කළ විට, එම ආත්මය වෙනයම් කෙනෙකු තුළට රිංගා ගැනීමට සොයයි.

- කෙනෙකුගේ ශරීරයෙන් යක්ෂයෙක් දුරු කළ පසු ඔහු තම ආත්මික නිවස පුරවා නොගතහොත්, එම යක්ෂයා තවත් යක්ෂයන් සමඟ නැවත - හැරී පැමිණෙනු ඇත. එවන් පුද්ගලයෙකුගේ අවසාන තත්ත්වය මුලින් තත්ත්වයට වඩා භයානක විය හැක.

**අනෙකුත් සිදුවීම්:**

යේසුස්වහන්සේ, යක්ෂාවේශවූවන්ට මෙහෙ කළ ආකාරය පිළිබඳව මෙලෙස සුවිශේෂී අයුරින් සඳහන් නොකළාවූ, එහෙත් පොදුවේ සඳහන් කළාවූ සිදුවීම් රැසක්ද බයිබලයෙහි ඇතුළත් වේ.

- පහත සඳහන් උපුටා ගැනීම්වලදී "සුව විය" යනුවෙන් සඳහන් කොට ඇත්තේ යේසුස්වහන්සේ යක්ෂාත්ම සමඟ ක්‍රියා කළ ආකාරය සනිටුහන් කිරීමටය. මතෙව් 4:24, ලූක් 6:18.
- පහත සඳහන් පදවල "දුරු කළ සේක" යනුවෙන් සඳහන් වන්නේ එතුමා උපයෝගී කරගත් ක්‍රියාකලාපය වේ. මාර්ක් 1:32,-34, 39, 6:13.
- ලූක් 4:41 පවසන්නේ යක්ෂයා "පිටතට පැමිණි" බවකි. ලූක් 7:21 සඳහන් කරන්නේ උන්වහන්සේ ඔවුන්ව "සුව කළ" බවය. මතෙව් 8:16හි වාර්තාවන්නේ එතුමා තම වචනයෙන් "ඔවුන්ව පිට කර හැරිය" බවකි.
- මාර්ක් 16:9 හා ලූක් 8:2-3හි, යේසුස්වහන්සේ මග්දලායේ මරියාගෙන් යක්ෂයන් සත් දෙනෙකු දුරු කළ බව කියැවේ.
- මහා ජන සමූහයක් සිටි අවස්ථාවේදී යේසුස්වහන්සේ යක්ෂයාට කතා කිරීමට අවසර නුදුන්නේය. මාර්ක් 1:32-34.

## යේසුස්වහන්සේ සුව කළාවූ තනි පුද්ගලයන්

**මෙම ස්ථානවල යක්ෂ බලවේග පිළිබඳ සඳහන් නොවේ.**

| | මතෙව් | මාර්ක් | ලූක් | යොහන් |
|---|---|---|---|---|
| පේතෘස්ගේ නැන්දම්මා | 8:14-15 | 1:30-31 | 4:38-39 | |
| කුෂ්ඨ රෝගියා | 8:2-4 | 1:40-42 | | 5:12-13 |
| අංගභාග රෝගියා | 9:1-8:35 | 2:1-12 | 5:17-26 | |
| වියළි අතක් සහිත මිනිසා | 12:9-13 | 3:1-5 | 6:6-11 | |
| යායිරස්ගේ දුව | 9:18-19 | 5:22-24 | | 8:41-42 |
| | 23-26 | 35-43 | | 49-56 |
| ගොළු බිහිරි මිනිසා | 7:32-37 | | | |
| අන්ධයා | 8:22-26 | | | |
| අන්ධ බාර්තිමියස් | 20:30-34 | 10:46-52 | 18:35-43 | |
| ශතාධිපතිගේ සේවකයා | 8:5-13 | | 7: 1-10 | |
| අන්ධයෝ දෙදෙනා | 9:27-30 | | | |
| වැන්දඹුවගේ පුත්‍රයා | | 7:11-15 | | |
| දිය උදර රෝගියා | | | 14:1-6 | |
| කුෂ්ඨ රෝගීන් දසදෙනා | | 17:11-19 | | |
| සේවකයාගේ කන | | 22:49-51 | | |
| රාජ සේවකයාගේ පුත්‍රයා | | | | 4:46-53 |
| කොරා | | | | 5:1-47 |
| උපතින්ම අන්ධ වූ මිනිසා | | | | 9:1-14 |
| ලාසරස් | | | | 11:1-44 |
| කාමමිථ්‍යාචාරික කාන්තාව | | | | 8:1-11 |
| පාපිෂ්ඨ ස්ත්‍රිය | | | 7:36-50 | |

## අධ්‍යයන සටහන්

කිසිදු යක්ෂ බලවේගවල බලපෑමකින් තොරව රෝගී වූ පුද්ගලයන්ගේ සුව වීම් පිළිබඳව අධ්‍යයන සටහන් පහත සඳහන් වේ.

**පේතෘස්ගේ නැන්දම්මා : මතෙව් 8:14-15, මාර්ක් 1:30-31, ලූක් 4:38-39**

ඔවුහු යේසුස්වහන්සේට තම අවශ්‍යතාවය පැවසූහ. උන්වහන්සේ පැමිණ ඇයව අතින් අල්ලා. නැගිටෙවූ සේක. එවිට උණ රෝගය ඉවත් විය. අනෙකුත් ස්ථානවල පවසන පරිදි උන්වහන්සේ ඇයව ස්පර්ශ කොට, උණ රෝගයට තරවටු කළ බවද පැවසේ. ඇය නැගිට ඔවුන්ට උපස්ථාන කළාය.

**ලාදුරු රෝගියා : මතෙව් 8:2-4, මාර්ක් 1:40-43, ලූක් 5:12-13.**

ලාදුරු රෝගියා යේසුස්වහන්සේ දුටු කල, එතුමාට නමස්කාර කරමින්, එහෙත් ප්‍රශ්න කරමින් පැමිණියේය. “ඔබවහන්සේ කැමති සේක් නම් . . . ” යයි ඔහු පැවසීය. යේසුස්වහන්සේ “මම කැමැත්තෙමි” යි කී සේක. සුව වීම පිළිබඳව යේසුස්වහන්සේගේ කැමැත්ත ප්‍රශ්න කළාවූ එකම වාර්තාගත පුද්ගලයා මොහු වේ. යේසුස්වහන්සේ ක්ෂණයකින්ම පිළිතුරු දෙමින්, “මම කැමැත්තෙමි” යි පවසා, අනුකම්පාවෙන් පූර්ණව උන්වහන්සේගේ අත දිගුකොට ඔහුව ස්පර්ශ කළේය. මේ බව කිසි මනුෂ්‍යයෙකුට නොපවසන ලෙසත්, සාක්ෂියක් පිණිස පූජකතුමා වෙත ගොස් පෙනී සිටින ලෙසත් යේසුස්වහන්සේ මෙම මිනිසාට පැවසූ සේක. ඔහු පිටත්ව ගිය අතර “ක්ෂණයකින්ම” ඔහු පවිත්‍ර විය.

**අංශභාග රෝගියා : මතෙව් 9:1-8, 35, මාර්ක් 2:1-12, ලූක් 5:17-26.**

යේසුස්වහන්සේ ඔවුන්ට දේව වචනය ප්‍රකාශ කළ බැවින්, සුව කිරීම සඳහා ස්වාමීන්වහන්සේගේ බලය එම ස්ථානයෙහි පැවතිණි. එතැන ෆරිසිවරු, වෛද්‍යවරු හා ලියන්නන්ද සිටියාහ. නමුත් සුවය පැමිණියේ අධ්‍යාපනික විශාරදයන්ගෙන් හෝ ආගමික නායකයන්ගෙන් නොව දේව වචනය තුළිනි.

රෝගියාගේ මිතුරෝ ඔහුව වහලයේ පියස්සෙන් ගෙතුළට බෑවෝය. මෙම මිත්‍රයෝ “මිදීමෙහි සහකරුවෝ” වූහ. අවශ්‍යතාවයකින් පෙළෙන කෙනෙකු උදෙසා, දෙවියන්වහන්සේ ඔබගෙන් “පියස්ස ඉවත් කිරීමට” අපේක්ෂා කරනවාද?

මෙහිදී ජයගත යුතු වූ බාධක රාශියක් පැවතුණි.

මහා සෙනඟ : යේසුස්වහන්සේ වෙතට යන මඟ අවුරාගෙන සිටියහ. ඔබත් මිදීමත් අතර පවතින මිනිස් බාධකය කුමක්ද?

දේව මෙහෙයෙහි අනුපිළිවෙළ : ඔවුන්ගේ ක්‍රියාව හේතුවෙන් දේව මෙහෙයෙහි අනුපිළිවෙළට බාධා ඇතිවිය. අප කිසිවිටෙකත් මනුෂ්‍යයාගේ අවශ්‍යතාවයන් ඉටු නොකරන තරමට කිසිම වැඩසටහනකට හෝ සැලැස්මකට වහල් වී සිටිය යුතු නොවේ.

ද්‍රව්‍ය වාදය : වහලය පූජා කිරීමට සිදුවිය. මිදීම සඳහා දොරටු විවර කරන පිණිස, අපගේ තර්කානුකූල, සීමාසහිත, ද්‍රව්‍යමය වාද පසෙකින් තැබිය යුතු වේ.

පූර්වයෙන් එළැඹ සිටි මතයන් : ඔවුහු තම මිතුරා සුවය ලැබීමට ගෙන ආවෝය. යේසුස්වහන්සේ කථා කොට, “නුඹේ පව් නුඹට කමා කරන ලදී”යි පැවසූ සේක. මිදීම ලැබීම සඳහා ඔවුන් කලින් එළැඹ සිටි මත ඔවුන්ට අවශ්‍ය දෙය හා එය සිදුවිය යුතු යයි ඔවුන් සිතූ ආකාරය පසෙකින් තැබීමට ඔවුන්ට සිදුවිය.

යේසුස්වහන්සේ මිතුරන්ගේ ඇදහිල්ල දුටු සේක. නුමුත් සුවය ලැබීම සඳහා රෝගියාගේ පාපය ඔහුට බාධාවක්ව පැවති බවද දුටු සේක. මෙම මිනිසා ශාරීරිකව රෝගීව සිටිය අතර, ආත්මිකවද පාපය හේතුවෙන් රෝගීව සිටියේය. එබැවින් යේසුස්වහන්සේ පළමුව පාපය සමඟ ක්‍රියා කළ සේක. මෙම මනුෂ්‍යයා අවට සාකච්ඡාවක් පැවතුණි. එනම්, යේසුස්වහන්සේට මෙය කිරීමට ආධිපත්‍ය බලයක් තිබේද කළ හැකිද නොහැකිද යන බවය. යේසුස්වහන්සේ මිනිසාට කතා කරමින්, “මම නුඹට කියමි . . . ” කී සේක. අප අවට සිටින නොඇදහිලිවන්තයන්ගේ අවිශ්වාසී හා වාද කිරීමේ මහා ඝෝෂාවට ඉහළින් සුවය ලැබීම සඳහා යේසුස්වහන්සේගේ හඬ ඇසිය යුතුය.

මෙම මනුෂ්‍යයෝ යහළුවන් සතුවූ ඇදහිල්ල සුව කිරීමේ ක්‍රියාදාමය ක්‍රියාත්මක කරවීය. ඔබගේ මිතුරන් හට ඔබව යේසුස්වහන්සේ වෙතට රැගෙන යාමෙන් උපකාර කළ හැක. එනමුත් ඔබම තනිව තීරණ ගත යුතු අවස්ථාවන් පැමිණේ. මෙම මනුෂ්‍යයාට අතීතයේ පරාජිතයන් කඩා දමා ක්ෂණිකව කීකරුවීම අවශ්‍ය විය. ඔහුට තම යහන රැගෙන ඇවිද යාමට සිදු විය.

යේසුස්වහන්සේ එම මිනිසාට, නැගිට තම යහන රැගෙන, තමාගේ නිවසට යන්න කියා පැවසූ කෙණෙහිම ඔහු එසේම කරමින් දෙවියන්වහන්සේට ගෞරවය දුන්නේය. ඔහුගේ සුවයට බලා සිටි අයගේ ප්‍රතිචාරය වූයේ මවිතය සහ බිය විමය.

**වියළි අත සහිත මිනිසා : මතෙව් 12:9-13, මාර්ක් 3:1-5, ලූක් 6:6-11.**

මෙම සුවය සිදුවූයේ යේසුස්වහන්සේ සබත් දින, සිනගෝගයෙහි උගන්වමින් සිටි විටය. එය එතුමා සඳහා පරීක්ෂණයක් විය. ලියන්නෝ සහ ඵරිසිවරු යේසුස්වහන්සේ කුමක් කරාවිද කියා බලා සිටියහ. යේසුස්වහන්සේ ඔහුට කතා කොට, "නැගිට මෙහි නැඟී සිටින්න"යි පැවසූ සේක. මෙය සුවය කරා මඟ පෙන්වූ කීකරු කමේ ක්‍රියාවක් විය (ලූක් 6:8). එම මනුෂ්‍යයාට "ඇවිත් මැදින් සිටගන්න" යයි පැවසූයේ, ඔහු මහා සෙනඟගෙන් ඉවතට පැමිණ තමාට අවශ්‍යතාවයක් පවතී යයි පිළිගත යුතු වූ බැවිනි (මාර්ක් 3:3).

"ඔබේ අත දිගු කරන්න" යැයි ඔහුට පැවසූ සේක. මෙය ආබාධයට ලක්වූ සිරුරේ කොටස සම්බන්ධයෙන් ඔහු ගත යුතු වූ ඇදහිල්ලේ ක්‍රියාව විය (මතෙව් 12:13). එය ස්වාභාවික ලොවෙහි සිදුවිය නොහැක්කකි. එනමුත් ඔහු ඇදහිල්ලෙන් ක්‍රියා කළ විට වියළි අත සුව විය. යේසුස්වහන්සේ ප්‍රශ්නවලට ප්‍රශ්නවලින්ම පිළිතුරු දුන් බව සලකන්න. මෙම සුව කිරීම පිළිබඳව වටහා දීම සඳහා උන්වහන්සේ බැටළුවන් පිළිබඳ උදාහරණ කතාවක් පැවසූ සේක. උන්වහන්සේ අවට සිටි ආගමික කායකයන් කෙරෙහි "කෝපයෙන් හා ශෝකයෙන්" පසුවූ බව සටහන් කරගන්න. සුවකිරීමේ සේවාවෙහිදී ඔබටද මෙවැනි හැඟීම් ඇතිවිය හැක.

**යායිරස්ගේ දුව: මතෙව් 9:18-19, 23-26, මාර්ක් 5:22-24, 35-43, ලූක් 8:41-42, 49-56.**

යායිරස්ගේ සිනගෝගයෙහි මුලාදෑනියෙක් විය. ඔහු ඇවිත් යේසුස්වහන්සේගේ පාමුල වැටී, "මාගේ දුව මේ දැන් මළාය." එහෙත් ඔබවහන්සේ ඇවිත් ඈ පිට අත් තැබුවහොත් "එවිට ඈ ජීවත්වේයයි උදක්ම ඉල්ලා සිටියේය.

විවිධ ස්ථානවල මෙම කතාවෙහි දරුවා පිළිබඳව "ඇය මරණාසන්නව සිටියාය." "මරණයට නුදුරුව සිටියාය" යනාදී ලෙස සඳහන් වේ. ඔව්හු නිවසට ළඟාවීමට පෙර, පණිවුඩකරුවෙක් ඇවිත්, "දැන් ස්වාමීන්වහන්සේට කරදර නොකරන්න. ඇය මිය ගියාය"යි දැන්වීය. මේවා භයේ වචන විය. නමුත් යේසුස්වහන්සේ යායිරස්ට පවසා සිටියේ, "භය නොවී ඇදහිල්ලෙන්ම සිටින්න, ඇය සුව වනු ඇත" යනුවෙනි.

යේසුස්වහන්සේ ගෙට ඇතුල් වූ කල, වැලපෙන අයට පවසා සිටියේ දරුවා මියගොස් නොව සැතපී සිටින බවය. ඔවුහු එතුමාට සමච්චල් වන ලෙස සිනාසුණෝය. උන්වහන්සේ ඝෝෂා කරන්නන්ද, නලාකාරයන්ද, වැලපෙන්නන්ද එතැන මහත් කලබලයක් ඇති කළාවූ සියලු දෙනා බැහැර කළ සේක. නිවසෙහි කාමරයෙහි සිටියේ පේතෘස්, යොහන්, යාකොබ් හා දැරියගේ දෙමව්පියන් පමණකි.

උන්වහන්සේ දැරිය අතින් අල්ලා, "යෞවනිය, නැගිටින්නයයි මම ඔබට පවසමි" කී සේක. එකෙණෙහිම ඇගේ ආත්මය ඈ වෙතට පැමිණි අතර ඇය අවදිවී නැගිට සිට ඇවිද්දාය. මහා ජනතාව ඉතා මවිතයට පත් වූහ. යේසුස්වහන්සේ ඇයට කෑම කන්ට දෙන්න යැයි ඉල්ලා සිටි සේක.

**ගොළු බිහිරි මිනිසා : මාර්ක් 7:32-37.**

ඔවුහු යේසුස්වහන්සේ වෙතට ගොළු බිහිරි වූ කටවෙහි ආබාධිත වූ මිනිසෙකු රැගෙන ආවෝය. යේසුස්වහන්සේ ඔහුව මහජනයාගෙන් ඈතට වෙන්ව ගෙනගොස්, ඔහුගේ කන්වල එතුමාගේ ඇඟිලි තබා, කෙළ ගසා ඔහුගේ දිව ස්පර්ශ කළ සේක. යේසුස්වහන්සේ ස්වර්ගය දෙස බලා, සුසුම්ලා, "ඇරේව" යි පැවසූ සේක. එකෙණෙහිම ඔහුගේ කන් විවර වී, ගොතය ඉවත් වී හොඳින් කතා කිරීමට පටන්ගත්තේය.

**බෙත්සයිදාවෙහි අන්ධ මිනිසා : මාර්ක් 8:22-26.**

ඔවුහු අන්ධ මිනිසා යේසුස්වහන්සේ වෙතට ගෙන ආවෝය. උන්වහන්සේ ඔහුව අවිශ්වාසයෙහි වටපිටාවෙන් ඉවතට, එනම් ගමෙන් පිටතට කැඳවාගෙන ගිය සේක (මාර්ක් 8:23). යේසුස්වහන්සේ ඔහුගේ ඇස් පිට

කෙළ ගසා තම දෑත් ඔහු මත තැබූ සේක. ඔහුට යමක් පෙනේදැයි යේසුස්වහන්සේ විමසූ සේක. එවිට එම මිනිසා "මට මිනිසුන් ගස් වාගේ ඇවිදිනු පෙනේ" යයි පිළිතුරු දුන්නේය. නැවතත් යේසුස්වහන්සේ ඔහු මත අත් තැබූ කල, ඔහුව සම්පූර්ණයෙන්ම සුවය ලබා, පැහැදිලිව දුටුවේය. මෙය ක්‍රමයෙන් සිදුවන සුවවීමකට උදාහරණයකි.

**අන්ධ බාර්තිමෙයුස් : මතෙව් 20:30-34, මාර්ක් 10:46-52, ලූක් 18:35-43.**

බාර්තිමෙයුස් - තිමෙයුස්ගේ පුත්‍රයා විය. යේසුස්වහන්සේ යෙරිකෝවෙන් යන විට ඔහු පාර අද්දර හිඟාකමින් සිටියේය. ඔහු ශාරීරිකව පමණක් නොව හිඟන්නෙක් බැවින් සමාජයීය වද හිරිහැර වින්දේය. බාර්තිමෙයුස්ට මහත් ඝෝෂාවක් ඇසී ඒ කිමෙක්දැයි විපරම් කළේය. යේසුස්වහන්සේ පැමිණෙන බව ඔහුට දැනගන්නට ලැබිණි. එවිට ඔහු හා අනෙකුත් අන්ධයෝ කෑ මොර ගසමින්, "දාවිත්ගේ පුත්‍රවූ යේසුස්වහන්ස, අපට කරුණා කළ මැනව" යයි ඉල්ලුවෝය. සෙනඟ ඔවුන්ට තරවටු කළ නමුත් ඔවුහු වඩා ශබ්ද නඟා මොර දුන්හ. යේසුස්වහන්සේ බර්තිමෙයුස්ට පැමිණෙන්නයයි පැවසූ විට ඔහු තමාගේ හිඟන වස්ත්‍ර පසෙක ලා යේසුස්වහන්සේ වෙතට පැමිණියේය. ඔහුට තව දුරටත් හිඟන වස්ත්‍ර අවශ්‍ය නොවීය!

යේසුස්වහන්සේ ඔහුගෙන් විමසුයේ, "මා විසින් නුඹට මක් කරනවාට නුඹ කැමතිද?"යි යනුවෙනි. අපගේ ඉල්ලීමෙහිදී නියත වීම ස්වාමින්වහන්සේ අපගෙන් අපේක්ෂා කරන සේක. අන්ධයෝ පිළිතුරු දෙමින්, අපට පෙනීම ලැබෙන පිණිසයි පැවසූහ. යේසුස්වහන්සේ අනුකම්පාවෙන් යුතුව ඔවුන්ගේ දෑස් ස්පර්ශ කළ සේක. එකෙණෙහිම ඔවුහු පෙනීම ලැබුවෝය. උන්වහන්සේ ඔවුන්ට කථාකොට, "පලයන්න, නුඹේ ඇදහිල්ල නුඹට සුව කළේය" යි පැවසූ සේක. ඔවුහු දෙවියන්වහන්සේට මහිමය දෙමින් පිටව ගියෝය.

මෙම මිනිසාගේ ඇදහිල්ල පහත සඳහන් ගුණාංගයන්ගෙන් පෙන්නුම් විය. :

- දැඩි ලෙස අදිටන් කරගෙන අත්නැර සිටීම.
- යේසුස්වහන්සේ නියම ලෙස කවුද කියා - එනම්: "දාවිත්ගේ පුත්‍රයා" දැකීම.
- දේව කරුණාව කෙරෙහි විශ්වාසය

**ශතාධිපතියාගේ දාසයා සුව කිරීම. මතෙව් 8:5-13, ලූක් 7:1-10.**

මෙහිදී එම දාසයා "ඔහුගේ ප්‍රිය වූ" කෙනෙකු යැයි පැවසේ. ඔහු අංගභාග රෝගයෙන් බොහෝ දුක් වින්දේය. පළමුව ශතාධිපතියා යුදෙව්වන්ගේ වැඩිමහල්ලෝ අත යේසුස්වහන්සේ වෙත පණිවිඩය එවීය. ඔවුහු තමුන්ගේ සිනගෝගය සාදා දුන් ජාතියට ප්‍රේම කළ පුද්ගලයෙකු ලෙස ශතාධිපතියාගේ ගෙට වැඩම කිරීම සුදුසු බව යේසුස්වහන්සේ දැන්වූහ.

ඉන්පසුව ශතාධිපතියා තම මිතුරන් යේසුස්වහන්සේ වෙතට එවමින්, "ඔබවහන්සේ මා ළඟට ඒමට හෝ මම ඔබවහන්සේ ළඟට ඒමට වටී යයි මා නොසිතමි" යි පැවසුවේය. ශතාධිපතියා තමා නොවටිනා බව සිතුවද ආධිපත්‍ය බලය හොඳින් තේරුම් ගත්තේය. යේසුස්වහන්සේ ඒමට සූදානම් වූ විට, ඔහු පැවසුයේ, "ඔබවහන්සේ වචනයක් කතා කළ මැනව, එවිට මාගේ දාසයා සුව වනු ඇත" යනුවෙනි.

යේසුස්වහන්සේ යෑමට කැමැත්තෙන් සිටි සේක. යේසුස්වහන්සේ පුදුමයට පත්ව, ඉශ්‍රායෙල් අතරෙහි පවා මෙබඳු ඇදහිල්ලක් තමා දැක නැති බව පැවසූ සේක. එවිට උන්වහන්සේ "මම එසේ කරමියි" කී සේක. උන්වහන්සේ වාචික වචනය (කතා කළ වචනය) තුළින් සුව කළ සේක. "පලයන්න, නුඹ අදහාගත් ලෙසම නුඹට වේවා"යි කී සේක. සේවකයා එම පැයේදීම සුවපත් විය.

**අන්ධයෝ දෙදෙනා : මතෙව් 9:27-30.**

අන්ධයෝ දෙදෙනා, "දාවිත්ගේ පුත්‍රය, අපට කරුණාකළ මැනව"යි මොර ගසමින් යේසුස්වහන්සේ පසුපස ගියෝය. ඔවුහු ගෙට පැමිණි කළ යේසුස්වහන්සේ ඔවුන්ගෙන්, "මට මේක කරන්ට පුළුවන් කියා නුඹලා විශ්වාස කරනවාද?"යි විමසූ සේක. "එසේය, ස්වාමිනි"යි ඔවුහු පිළිතුරු දුන්හ.

එවිට යේසුස්වහන්සේ ඔවුන්ගේ ඇස් අතගා, "නුඹලාගේ විශ්වාසයේ ප්‍රකාරයට නුඹලාට වේවා"යි කී සේක. ඔවුන්ගේ ඇස් පෑදුණේය. ඔවුහු මේ බව සෑම තැන පතළ කළහ.

**වැන්දඹුවගේ පුත්‍රයා : ලූක් 7:11-15.**

නායින් නුවර විසූ වැන්දඹුවකගේ එකම පුත්‍රයා මියගිය තරුණයා විය. බොහෝ සෙනඟක් අවමංගල්‍ය පෙරහැරේ ඇය සමඟ ගියහ. යේසුස්වහන්සේ ඇය කෙරෙහි අනුකම්පා කොට, අඬන්නට එපා යයි කී සේක. උන්වහන්සේ මිනියට අතගසා (මිනී පෙට්ටියට) "යෞවනය, නැගිටපන්නැයි නුඹට කියමි"යි කී සේක. යෞවනයා නැගිට හිඳ කතා කරන්ට පටන් ගත්තේය. උන්වහන්සේ ඔහුගේ මෑණියන්ට ඔහුව භාරදුන් සේක. ජනතාව දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් යේසුස්වහන්සේ "උතුම් වූ අනාගතවක්තෘවරයෙකු" යයි පැවසූහ.

**දිය උදර රෝගියා : ලූක් 14:1-6.**

මෙම සුවවීම සිදුවූයේ ඵරිසිවරයෙකුගේ නිවසෙහිදීය. සබත් දවසේදී සුව කිරීම සුදුසුද නැතිද යන්න පිළිබඳව සාකච්ඡාවක් සිදුවිය. යේසුස්වහන්සේ තමාගේ තත්ත්වය පැහැදිලි කිරීමට කොටළුවෙකු උදාහරණයට ගත් සේක. යේසුස්වහන්සේ එම මිනිසාව රැගෙන, සුවකොට, පිටත් කර හැරිය සේක.

**කුෂ්ඨ රෝගීන් දසදෙනා : ලූක් 17:11-19.**

මෙම මනුෂ්‍යයෝ ගමෙහි ඈත සිට මොර ගසමින්, "යේසුස්වහන්ස ආචාරීන්වහන්ස, අපට කරුණා කළ මැනව"යි කීවෝය. යාච්ඤාවකින් පසුව ඔවුන්ට ගොස් පූජකයන්ට පෙනී සිටින ලෙස උන්වහන්සේ පැවසූ සේක. ඔවුහු එසැණින්ම සුව නොවූ නමුත් ගමන යමින් සිටියදී සුව වී පවිත්‍ර කරනු ලැබූහ. ඉන් එක් අයෙක් දෙවියන්වහන්සේට මහිමය දෙමින් ප්‍රශංසා කරමින් නැවත හැරී ඇවිත් යේසුස්වහන්සේගේ පාමුල වැටී ස්තුති කළේය. යේසුස්වහන්සේ ඔහුට පැවසුවේ ඔහු සම්පූර්ණ කරනු ලැබූ බවය. නවදෙනෙකු ලාදුරු කුෂ්ඨයෙන් සුවය ලැබූහ. එක් අයෙක් පමණක් සම්පූර්ණයෙන්ම සුව කරනු ලැබීය.

**සේවකයාගේ කන : ලූක් 22:49-51.**

මෙම මිනිසාගේ කන පේතෘස් කපා දැම්මේය. මෙම සුව කිරීම පිළිබඳව පවසා ඇත්තේ යේසුස්වහන්සේ ඔහුගේ කන අතගා සුව කළ බව පමණකි.

**ඇමතිවරයාගේ පුත්‍රයා : යොහන් 4:46-53.**

පුතා කපර්ණවුමෙහි රෝගාතුරව සිටියේය. ඇමතිවරයා යේසුස්වහන්සේ ළඟට විත් මරණාසන්නව සිටින තමාගේ පුත්‍රයා සුව කරන පිණිස එන මෙන් ඉල්ලා සිටියේය. යේසුස්වහන්සේ ඔහුට "යන්න, නුඹේ පුත්‍රයා ජීවත්ව සිටී"යයි පැවසූ සේක. පුත්‍රයා එම පැයේ සිට සුව වීමට පටන් ගත්තේය. මෙය ක්‍රමානුකූල සුවවීමකට තවත් උදාහරණයකි. උණ රෝගය ඔහුගෙන් පහ විය. එවිට මුළු නිවැසියන් සියලු දෙනා විශ්වාස කළහ (පවුලම ගැළවීම).

**බෙත්සෙදාවේ පොකුණ අසල සිටි කොරා : යොහන් 5:1-47.**

මෙම මනුෂ්‍යයා 38 අවුරුද්දක් ශාරීරිකව රෝගාතුර විය. ඔහු අනෙක් මිනිසුන් පිළිබඳව තරහින් මෙන්ම බලාපොරොත්තු විරහිත විය. කෙනෙකු ලෙඩ වූ කල ඇතිවන සමහර බලපෑම් මේවාය. මොහුට ශාරීරික රෝගයක් මෙන්ම ආත්මිකවද ලෙඩ වී සිටියේය (යොහන් 5:14).

යේසුස්වහන්සේ සාමාන්‍යයෙන් එක තැනක සිටි සියලුම රෝගීන් සුව කළ නමුත් මෙම අවස්ථාවෙහිදී සුව කළේ එක් අයෙක් පමණකි. යේසුස්වහන්සේ තම සේවයෙහිදී උන්වහන්සේ අවට පැවති මනුෂ්‍යයන්ගේ අවශ්‍යතාවය මඟින් නොව දෙවියන්වහන්සේ විසින් මඟ පෙන්වනු ලැබූ සේක. යේසුස්වහන්සේ මෙම මිනිසාට සැබෑ කාරණාවට මුහුණ දීමට සැලැස්වූ සේක. උන්වහන්සේ විමසා සිටියේ, "නුඹ සුවය ලබන්ට කැමැත්තෙහිද?" යි යන්නය. අප මෙම වචන විශ්ලේෂණය කොට බලමු.

"කැමැත්තෙහිද?" යන්නෙන් තීරණයක් අපේක්ෂා කෙරිණි. සමහර පුද්ගලයෝ සුව වීමට අකමැතිය. සමහරු රෝගී තත්ත්වය නිසා තමාට ලැබෙන අවධානය හා අනෙකුත් වාසි භුක්ති විඳිති. සමහරු තුරන් වී ස්වාමීන්වහන්සේ සමඟ සිටීමට කැමති වෙති.

"නුඹ", සුවය ලබන්නට අපේක්ෂා කරන පුද්ගලයාගේ සහභාගීත්වය කෙරෙහි යොමු වේ. රෝගියාටත් ඇඳහිල්ල එම තැනැත්තා වෙතට සුවය ගලා ඒමට එක් මාධ්‍යයක් විය හැකිය.

"සුවය" - මනුෂ්‍යයාගේ සැබෑ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කිරීමකි. ඔබගේ ප්‍රමුඛතාවය කුමක්ද? ලෙඩය සුව කර ගැනීමද, සම්පූර්ණ සුවය ලැබීමද? සම්පූර්ණත්වයට පැමිණීමෙන් ඔබව වළකාලන්නේ කුමක්ද? මනුෂ්‍යයාට ලෙඩ සනීප කර ගැනීම අවශ්‍ය වුවද, යේසුස්වහන්සේ සලකන්නේ සම්පූර්ණ කිරීම පිළිබඳවය.

ලබන්නට - වර්තමාන කාල පදයකි. යේසුස්වහන්සේ විමසුවේ, "ඔබට දැන් සුව වීමට ඕනෑද?" කියාය. එම මනුෂ්‍යයාව සම්පූර්ණයෙන් සුවපත් කිරීමක් අවශ්‍ය විය. ඔහු අනෙක් අය කෙරෙහි වෛරයෙන් පසු විය. ඔහු කතා කරමින්, "කිසිවෙක් මට වතුරට පැසීමට උපකාර නොකරයි" යනුවෙන් පැවසීය. මෙම වෛරය දෙවියන්වහන්සේගේ බලය ගලායාමට බාධා කළේය. එම මනුෂ්‍යයා තම අතීතය සමඟ පැවති සම්බන්ධතාවය බිඳ හෙළිය යුතු විය. ඔහු 38 අවුරුද්දක් එතැන සිටි කෙනෙකි. ඔහු ඇදහිල්ලේ කාලයට මාරු විය යුතුය. යේසුස්වහන්සේ ඔහුගේ වාතාවරණයෙන් පිටතට ඒමට, ඔහුට කළ නොහැකි වූ දෙය කිරීමට ඔහුට ආරාධනා කළ සේක.

ඔහුට එක්කෝ පසුගිය වසර 38 හිම පුරුදුව සිටි ආකාරයටම වතුර කළඹන විට පළමුවැනියා ලෙස පැනීමට බලාපොරොත්තුවෙන් එතැනම සිටිය හැකිය. එසේ නොමැති නම් ඔහුට කළ නොහැකි වූ, නැගිට ඇවිදීමට පුළුවන. මෙම මනුෂ්‍යයාට ශාරීරිකව නැවත වැටී වැතිරී සිටීමට සැපයීමක් විය. එය නම් ඔහුගේ යහනය. යේසුස්වහන්සේ ඔහුට නැගිට යහන රැගෙන යන්න යයි කීවේ එබැවිනි. තවදුරටත් ඔහුට එය අවශ්‍යවන්නේ නැත.

**ජාත්‍යන්ධයා (අන්ධව උපන් මිනිසා) : යොහන් 9:1-14.**

මෙම මිනිසා උපතේ සිට අන්ධ විය. යේසුස්වහන්සේ මනුෂ්‍යයාගේ අවධාරණය හේතුවේ සිට (ඇයි) පරමාර්ථය (දෙවියන්වහන්සේගේ මහිමය) වෙතට වෙනතකට යොමු කරවූ සේක. උන්වහන්සේ බිමට කෙළ ගසා, මඩ සාදා, ඇස්වල ගල්වා ගොස් සිලෝවම් පොකුණෙන් සෝදාගන්න යැයි පැවසූ සේක.

**ලාසරුස් : යොහන් 11:1-4.**

යේසුස්වහන්සේගේ හැඟීම් සලකා බලන්න. උන්වහන්සේ ඇඬූ සේක. එතුමා ඇඬුවේ යහළුකම නිසා නොව, පාපය මඟින් ලොවට ගෙනවිත් ඇති ලෙඩ දුක් හා මරණය නිසා හා මිනිසුන් කෙරෙහි තිබූ අනුකම්පාව නිසාය.

**අනාචාරයෙහි හසුවූ ස්ත්‍රිය : යොහන් 8:1-11.**

මෙම සිද්ධියෙහිදී මතකයෙහි සුවය හා ආත්මික සුව කිරීම ඇතුලත් වේ. ඇය "පසුගිය කාරණා අත්හැර දැමිය යුතු විය" (අතීතය). "මනඃකල්පිතය අත් හැරිය යුතු විය" (වර්තමානය).

**පාපිෂ්ඨ ස්ත්‍රිය : ලූක් 7:36-50.**

මෙම කාන්තාව ආත්මිකව රෝගාතුරව සිටි අතර ප්‍රසිද්ධියේ යේසුස්වහන්සේ වෙතට පැමිණියාය. ඇයගේ සමාජයීය සම්බන්ධතාවයන්හි සුවයක්ද අවශ්‍ය විය. ඇයට පව් සමාව ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස ඇදහිල්ලේ ක්‍රියාවක් විලසින් ඇය කැඩුණු, බිඳුන ආත්මයෙන් එතුමාට වන්දනා කළාය.

## බොහෝ මනුෂ්‍යයන් හට යේසුස්වහන්සේ සුව කිරීම.

| | මතෙව් | මාර්ක් | ලූක් |
|---|---|---|---|
| ගලීලයෙහි බොහෝ දෙනෙකු | 4:23-24 | 3:7-12 | 6:17-19 |
| පේතෘස්ගේ දොර ළඟ මහ සෙනඟ | 8:16-17 | 1:32-34 | 4:40-41 |
| බොහෝ යක්ෂයෝ | | 1:39 | |
| කුෂ්ඨ රෝගියා සුව කළ පසු මහත් සෙනඟ | | | 5:14-16 |
| විවිධ සෙනඟ | | | 13:32 |
| මහා සෙනඟක් | 9:35, 12:15-21 | 3:10-11 | |
| යොහන් බව්තීස්තගේ ප්‍රශ්නයෙන් පසුව | 11:2-6 | | 7:18-23 |
| 5000කට කන්ට දීමට පෙර | 14:13-14 | | 9:11 |

| | | |
|---|---|---|
| ගෙනසෙරත්හි මහා සමූහය | 14:34-36 | 6:53-56 |
| 4000කට කන්ට දීමට පෙර | 15:19-31 | |
| යෝර්දානයෙන් එගොඩ මහා සෙනඟ | 19:1-2 | |
| දේව මාළිගාවෙහි සිටි අන්ධ හා කොරු | 21:14 | |
| නාසරෙත්හි රෝගී සමහරෙක් | 13:53-58 | 6:1-6 |

**අධ්‍යයන සටහන් :**

බොහෝ ගණනක් සෙනඟ සුව කිරීම පිළිබඳ අධ්‍යයන සටහන් පහතින් දැක්වේ.

**ගලීලයෙහි බොහෝ දෙනෙක් : මතෙව් 4:23-34, මාර්ක් 3:7-12, ලූක් 6:17-19.**

මහා සෙනඟක් මුළු ගලීලයෙන්ම පැමිණ සුවය හා මිදීම අත්දුටුවෝය.

**පේතෘස්ගේ දොරටුව අභියස සිටි මහා ජනතාව : මතෙව් 8:16-17, මාර්ක් 1:32-34, ලූක් 4:40-41.**

පේතෘස්ගේ නැන්දම්මා සුව කිරීමෙන් පසුව මහා සෙනඟක් එම නිවසෙහි දොරකඩට පැමිණි අතර යේසුස්වහන්සේ ඔවුන්ට මෙහෙ කළ සේක.

**යක්ෂයන් බොහෝ ගණනක් : මාර්ක් 1:39.**

යේසුස්වහන්සේ ගලීලයෙහි දේශනා කොට යක්ෂයන් දුරු කළ සේක.

**කුෂ්ඨ රෝගියා සුව කිරීමෙන් පසු මහත් සෙනඟ : ලූක් 5:14-16.**

කුෂ්ඨ රෝගියාගේ සුවවීම හේතුවෙන් තව බොහෝ රෝගීහු සුවය පතා පැමිණියහ.

**විවිධාකාර වූ මිනිස්සු : ලූක් 13:32.**

මෙම කොටසින් යේසුස්වහන්සේ ජනතාව සුවකළ බව පෙන්වා දෙයි.

**මහත් සමූහයන් : මතෙව් 9:35, 12:15-21, මාර්ක් 3:10-11.**
උන්වහන්සේ අනාගතවාක්‍යය සම්පූර්ණ කරමින් ඔවුන්ව සුව කළ සේක.

**යොහන් බව්තිස්තගේ ප්‍රශ්නයෙන් පසුව : මතෙව් 11:2-6, ලූක් 7:18-23.**
යේසුස්වහන්සේ තමාගේ මෙසියස් බවේ සාක්ෂි ලෙස සිදුවන කාරණා යොහන් බව්තීස්තට ගොස් පවසන මෙන් ඔහුගේ ගෝලයන්ට පැවසූ සේක.

**5,000කට කන්ට දීමට පෙර : මතෙව් 14:13-14, ලූක් 9:11.**

යේසුස්වහන්සේ ඔවුන්ට දේව රාජ්‍යය පිළිබඳව කතා කළ සේක. උන්වහන්සේ අනුකම්පාවෙන් පූර්ණව ලෙඩුන් සුව කළ සේක.

**ගෙනසෙරෙත්හි ජන සමූහයන් : මතෙව් 14:34-36, මාර්ක් 6:53-26.**
මෙහිදී ඔවුහු තම රෝගීන් ඇඳන් පිටින් ගෙනවිත් පාරේ තැබූහ.

**4,000කට කන්ට දීමට පෙර : මතෙව් 15:29-31.**
රෝගීන්ව එතුමාගේ පාමුල තබන ලදී. උන්වහන්සේ ඔවුන්ව සුව කළ සේක. කොරු ඇවිදින්නටද, අන්ධයන්ට පෙනීමද, ගොළුවන් කතා කිරීමටද, ආබාධිතයන් සම්පූර්ණවීමටද පටන් ගති. බොහෝ අය සුව වූහ. ඔවුහු දෙවියන්වහන්සේට ප්‍රශංසා කළහ.

**යෝර්දානයෙන් එගොඩ මහ සෙනඟ : මතෙව් 19:1-2.**
මහත් සෙනඟක් උන්වහන්සේ පසුපස ගිය අතර ඔවුන්ව සුව කරන ලදී .

**දේව මාළිගාවෙහි සිටි අන්ධයෝ සහ කොරු : මතෙව් 21:14.**
විස්තර සපයා දී නොමැත. එහි සඳහන් වනුයේ උන්වහන්සේ මාළිගයේ සිටින විට ඔවුහු එතුමා වෙත පැමිණි බවත් එතුමා සුව කළ බවත්ය.

**නාසරෙත්හි රෝගීව සිටි අය : මතෙව් 13:53-58, මාර්ක් 6:1-6.**

මෙම නගරයෙහි පැවති අවිශ්වාසය පිළිබඳව යේසුස්වහන්සේ මවිත වූ සේක. යේසුස්වහන්සේ ඔවුන්ගේ ගම්වලත් සිනගෝගවලත් ඉගැන්වූ අතර කිහිප දෙනෙකු මත අත් හෙලා සුව කරනු හැර වෙන කිසියම් මහත් කාරණා සිදු කිරීමට නොහැකි විය. ඔවුහු යේසුස්වහන්සේට හුරු පුරුදුව සිටි බැවින් එමඟින් ඔව්හු පසුබෑමකට ලක්වූහ.

## ක්‍රිස්තුස්වහන්සේ සුව කරන තැනැත්තා ලෙස පොදු ප්‍රකාශන.

| | මතෙව් | මාර්ක් | ලූක් |
|---|---|---|---|
| සියලු ආකාර ලෙඩ රෝග සුව කිරීම | 4:23,<br>9:35-36 | | |
| උන්වහන්සේව ස්පර්ශ කළ සැම සුව කිරීම | | 6:56 | |
| යක්ෂයා විසින් පීඩා කළාවූ සියලු දෙනා සුවකිරීම | | | 10:38 |
| තව බොහෝ කාරණා | | | 20:30-31. |

## අධ්‍යයන සටහන්

ක්‍රිස්තුස්වහන්සේ සුව කරන තැනැත්තා ලෙසට පොදු ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යයන සටහන් පහතින් දැක්වේ.

**විවිධාකාරවූ ලෙඩ රෝග සුව කිරීම : මතෙව් 4:23, 9:35-36**

උන්වහන්සේ සිනගෝගයනට, නගරවලට හා ගම්වලට යමින්, උගන්වමින්, දේශනා කරමින් හා සියලු ආකාර රෝගීන් සුවපත් කළ සේක.

**උන්වහන්සේ ස්පර්ශ කළ සියලු දෙනා සුව කිරීම : මාර්ක් 6:56**

යේසුස්වහන්සේ ගිය සැම තැනකම (ගම්වල, නගරවල, රටෙහි) ජනතාව රෝගීන් ගෙනවිත් මග දෙපස පාරෙහි ඔවුන් තැබූහ. උන්වහන්සේව ස්පර්ශ කළාවූ සැම දෙන සුවය ලැබූහ.

**යක්ෂයා විසින් පීඩිත සියලු දෙනා සුව කිරීම : යොහන් 10:38, 20:30-31**

විස්තර සපයා දී නොමැත. එනමුත් ප්‍රකාශනයක් ඉදිරිපත් කොට තිබේ. එනම්, යක්ෂයා විසින් පීඩා කරන ලද සියල්ලෝ සුව කරන ලදී. . . වෙනත් බොහෝ කාරණාද සිදු කරන ලදී . . . "සියල්ල ලියා තැබුවහොත් ලෝකයට එය දරන්නට නොහැකි වන තරම් කාරණා විය." (යොහන් 20:30-31).

## යේසුස්වහන්සේගේ හා ගෝලයන්ගේ හාස්කම් සංසන්දනය කිරීම

සුවකිරීම හා හාස්කම් යේසුස්වහන්සේගෙන් අවසන් නොවීය. මෙම වගුවෙන් පෙන්වා දෙන්නේ ගෝලයෝ යේසුස්වහන්සේගේ ක්‍රියා දිගටම කරගෙන ගිය බවය.

| සිදුවීම | පේතෘස්ගේ ක්‍රියා | පාවුල්ගේ ක්‍රියා |
|---|---|---|
| කොරු සුවකිරීම | දොරටුව අසල<br>ක්‍රියා 3:1 | ලුස්ත්‍රාවේදී<br>ක්‍රියා 14:8 |
| ඔත්පලව සිටි අය | අයිනෙයස් ඔත්පලව අවුරුදු 8<br>ක්‍රියා 9:32 | පබ්ලියස්ගේ පියා උණෙන් ඔත්පලව<br>ක්‍රියා 28:7 |

| | | |
|---|---|---|
| අසාමාන්‍ය ලෙස ස්පර්ශ කරනු ලැබීම | සෙවණැල්ල වස්ත්‍ර<br>ක්‍රියා 5:12 | ලේන්සු /අඳනාකඩ<br>ක්‍රියා 19:11 |
| සමූහයක් සුව වීම | ක්‍රියා 5:16 | ක්‍රියා 28:9 |
| මළවුන් නැගිටුවීම | ක්‍රියා 9:36 | ක්‍රියා 20:7 |

## ගෝලයන් විසින් තනි පුද්ගලයන් සුව කිරීම

**කොර සිඟන්නා සුව කිරීම : ක්‍රියා 3:1, 4:22.**

සුව කරනු ලැබූ තැනැත්තා : මාළිගාවේ දොරටුව අසල හිඟාකමින් සිටි කොර මිනිසා

තත්ත්වය : උපතේ සිට කොර බව

සේවකයන් : පේතෘස් සහ යොහන්

ක්‍රමය : පේතෘස් "අප දෙස බලන්න" යයි පැවසීය. ඔහු ප්‍රකාශ කරමින් තමුන් සතුව දීමට රන් හෝ රිදී නොමැති බවත්, එහෙත් ඔවුන් සතුවූ දෙය දීමට හැකි බවත් පැවසීය. පේතෘස් ඔහුට අණ කරමින් යේසුස්වහන්සේගේ නාමයෙන් නැගිට ඇවිදීමට කීවේය. පේතෘස් ඒ මිනිසාගේ අතින් අල්ලා ඔහුව නැගිට්ටවූ අතර එකෙණෙහිම ඔහුගේ පාද හා විලුඹ සවි විය. කොරා නැගිට, ඇවිද, උඩ පැන, ප්‍රශංසා කළේය. ඔහුගේ සුවයට හේතුව ක්‍රියා 3:16 සහ 4:10 දැකිය හැක.

සටහන් : මෙම මනුෂ්‍යයා මහත් වූ ප්‍රශංසාව, නමස්කාරය හා අගනා දේශනාවල් පැවති දේව මාළිගාවේ දොරටුවලින් පිටත සිටි නමුත් කිසිවිටෙකත් ඔහුගේ අවශ්‍යතාවය සැපිරුණේ නැත. අද දින පවා අපගේ බොහෝ ආගමික ස්ථාන, නමස්කාර ස්ථානවලද මෙය සිදුවේ. දේවස්ථානයෙන් පිටත දොරටුව සමීපයෙහි මිනිසුන්ගේ අවශ්‍යතාවන් නොසලකා හැරී ගොස් පවතී.

**පාවුල්ගේ දෑස් : ක්‍රියා 9:10-19, 22:11-13.**

සුවය ලැබූ තැනැත්තා : පාවුල්

තත්ත්වය : දේව මහිමය මඟින් ඇස් අන්ධ කරනු ලැබීම.

සේවකයා : අනනියස්, දර්ශනයක් හා ස්වාමින්වහන්සේගෙන් ලද ආඥාවක ප්‍රතිඵලය ලෙස ඔහු වෙත ගියේය.

ක්‍රමය : අනනියස් ඔහුගේ දෑත් පාවුල් පිට තැබූ එම පැයේදීම පාවුල්ගේ දෑස්වලින් කොරපොතු වැනි යමක් ඉවත් වී ඔහුට සම්පූර්ණ පෙනීම ලැබීය. ඉන් අනතුරුව ඔහු තම පාපය ප්‍රකාශ කොට, බව්තීස්මය ලබා ආහාර වැළඳිය.

සටහන් : බයිබලය මෙම පුද්ගලයා පිළිබඳව කාරණා කිහිපයක් පවසයි. අනනියස් දෙවියන්වහන්සේ විසින් මහත් ලෙස යොදාගත් පුද්ගලයෙකි. ඔහු දෙවියන්වහන්සේගෙන් දර්ශන ලබාගත්, දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගත් කෙනෙකි. ඔහු පරමාර්ථයකින් යුත් මිනිසෙක් ලෙස, තමාව එව්වේ කවුද, කුමන පරමාර්ථයක් උදෙසාද කියා දැන සිටියේය. ඔහු දේව භක්තිකයෙකු වූ අතර, ව්‍යවස්ථාවට එකඟව ජීවත් වූ යහපත් පිළිගැනීමක් දැරූ කෙනෙකි. එසේම දෙවියන්වහන්සේ ඔහුට කථා කළ විට "මම මෙහිය" පැවසීමෙන්, ඔහු කීකරුවන්ත පුද්ගලයෙකු බවට පෙනේ. ඔහු තමාට අණ කරනු ලැබූ ලෙසට කිරීමට කැමැත්තෙන් එකඟ විය. සාමාන්‍ය අයුරින් නම් පාවුල් පිළිබඳව ඔහු අසා තිබූ කරුණුවලට අනුව එසේ යාම බියජනක වුවත් දේව අණට අනුව යෑමට එකඟ විය. ඔහු අනෙකුත් නායකයන්ව නඟා සිටුවීමට සමත් කෙනෙක් විය. ඔහු අනාගතවක්තෘවරයෙක්ව, දෙවියන්වහන්සේ විසින් සුව කිරීමට, ශුභාරංචිය දේශනා කිරීමට යොදාගත් කෙනෙකු විය. එසේම තම කාලය නාස්ති කිරීමට අකමැති වූ කෙනෙකි. ඔහු පාවුල්හට තම පණිවුඩය දීමෙන් අනතුරුව "ඔබ තව ප්‍රමාද වන්නේ කුමකටද?" යි විමසීය.

**පේතෘස් අයිනෙයස් සුව කිරීම : ක්‍රියා 9:32-35.**

සුවය ලද පුද්ගලයා : අයිනෙයස්

තත්ත්වය : ඔහු අංගභාගයෙන් වසර 8ක් ඔත්පලව සිටියේය.

සේවකයා : පේතෘස්

ක්‍රමය : පේතෘස් ඇදහිල්ලේ ප්‍රකාශනයක් ඉදිරිපත් කරයි, "යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නුඹව සුව කරනු ඇත." ඉන්පසුව ඔහු ඇදහිල්ලේ ක්‍රියාවක් කිරීමට රෝගියාට පවසයි, "නැගිට නුඹේ ඇඳ සකස් කරන්න."

සටහන් : අයිනෙයස් යනු පේතෘස්ට "මග යන අතර හමුවූ තැනැත්තෙකි." අප සාමාන්‍ය දේවස්ථානයකදී මෙන්ම "මග යන අතර පවා හමුවන" පුද්ගලයන්ගේ අවශ්‍යතාවයනට පිළිසරණක් වීමට සූදානමින් සිටිය යුතු වෙමු. මෙම මනුෂ්‍යයාගේ සුවය හේතු කොටගෙන මුළු ලිද්දාව සහ ෂාරොන් ප්‍රදේශය ස්වාමීන්වහන්සේ වෙතට හැරුණෝය. අපගේ නගර වෙතට ශුභාරංචිය ගෙන යාමෙහිදී දෙවියන්වහන්සේගේ බලය විදහා දැක්වීම ප්‍රධාන රහසකි. පේතෘස් අයිනෙයස් හට තම ඇඳ සකසන්න යැයි පැවසුවේ නැවතත් ලෙඩ ඇඳකට වැටීමට පරීක්ෂාවට වැටීමට අවස්ථාව වළකන පිණිසය. එම ඇඳ අවුරුදු 8ක් පුරා සකසා නොතිබූ ඇඳක් විය.

**පේතෘස් දොර්කස් සුව කිරීම : ක්‍රියා 9:36-43.**

සුවය ලැබූ පුද්ගලයා : දොර්කස් (තබීතා). ඇය යහපත්කම් කළාවූ ගෝල ස්ත්‍රියකැයි පැවසේ. ඇය අනුන්ට දුන්නාවූ, වැන්දඹුවනට සේවය කළාවූ ඇඳුම් මසන්නියක් වූවාය.

තත්ත්වය : නොදන්නා රෝගයකින් ඇය මිය ගියාය.

සේවකයා : පේතෘස්

ක්‍රමය : අඬමින්, වැලපෙමින් සිටි වැන්දඹුවන්ව පේතෘස් කාමරයෙන් පිටත්කර හැරියේය. ඔවුහු තබීතා "තමුන් සමඟ සිටියදී" කළ කී දෑ පිළිබඳව මතක් කරමින් සිටි අතර නොඇදහිල්ලෙන් පිරී සිටියෝය. පේතෘස් දණින් හිඳ, යාච්ඤා කොට, "තබීතා, නැගිටින්න" යයි අණ කළේය. ඇය ඇස් ඇර බලා, පේතෘස් දැක, වාඩි වූවාය. පේතෘස් ඇයට අත දී නැගිටුවා ජීවත්ව සිටින ඇයව භාර දුන්නේය. මෙම හාස්කම නිසා බොහෝ දෙනෙක් විශ්වාස කළහ.

සටහන් : වචන දෙකක්, එනම් "තබීතා, නැගිටින්න" ඇයගේ මුළු ඉරණම වෙනස් කළේය. අපි බොහෝ විට වචන බහුලව යොදා ගනිමු. එනමුත්, අනිකුත් අයගේ ජීවිත කෙරෙහි අපගේ වචනවල පවතින බලපෑම කෙසේද?

**ලුස්ත්‍රාවෙහි කොර මිනිසා : ක්‍රියා 14:8-18.**

සුවය ලැබූ තැනැත්තා : නම සඳහන් කර නොමැති එක්තරා මිනිසෙකි.

තත්ත්වය : පාද දුර්වලවූ, උපතේ සිට කොර වූවෙකි. කිසි කලෙකත් ඇවිද නොමැත.

සේවකායා : පාවුල්

ක්‍රමය : එම මිනිසාට සුවය ලැබීමට ඇදහිල්ල ඇති බව පාවුල් දැන ගත්තේය. "නැගිට නුඹේ පාදවලින් කෙළින් සිටපන්න" යැයි ඔහුට අණ කළේය. ඔහු පැන නැගී ඇවිද්දේය.

සටහන් : සිදුවූ දෙය මහ ජනතාව දුටු කල ඔවුහු පාවුල් හා බාර්ණබස් දෙවිවරු කිරීමට උත්සාහ කළහ. නමුත් ඔව්හු තමුන්ගේ ඇඳුම් ඉරාගෙන, තමුන් සාමාන්‍ය මනුෂ්‍යයන් පමණක් බවත්, සුවකළේ සැබෑවූ එකම දෙවියන්වහන්සේ බවත් මහත් හඬින් ප්‍රකාශ කළෝය. කිසියම් සුවවීමක් සඳහා දෙවියන්වහන්සේ යම්කිසි පුද්ගලයෙකු භාවිත කළ විට, දෙවියන්වහන්සේ ඔසවනු වෙනුවට එම පුද්ගලයාව එසවීමට උත්සාහ කරන අය සිටිති. එවිට අපි ඔවුන්ගේ අවධානය හා නමස්කාරය නැවතත් දෙවියන්වහන්සේ වෙතට යොමු කළ යුතු වෙමු.

**ලුස්ත්‍රාවෙහිදී පාවුල් නැගිටවීම : ක්‍රියා 14:19-20.**

සුවය ලැබූ තැනැත්තා : පාවුල්

තත්ත්වය : පාවුල්ට තම සතුරන් විසින් ගල්ගසා ඔහු මිය ගියා යැයි සිතා අත්හැර දමා ගොස් තිබිණි.

සේවකයන් : ගෝලයෝ

ක්‍රමය : ඔවුහු ඔහු වටා රැස්වී බලයෙන් වටකරගන්නා ලදී. ඔවුහු එතැන සිට යාච්ඤා කරන්නට ඇත. එනමුත් බයිබලයෙහි ඒ බව සඳහන් නොකරයි.

සටහන් : පළමු ගෝලයෝ ඔහු අවට සිටගෙන සිටීම පවා (ඔවුන්ගේ වැඩ සිටීම), ඔවුන්ගේ සෙවණැල්ල, ඇඳුම්, සිප වැළඳ ගැනීම් (ක්‍රියා 20:7-12) වල තිබූ බලය, අපි සියලු දෙනා එකමුතුව කරන සේවයෙහි, යාච්ඤාවල්, දේශනාවල් එකමුතු බලයට වඩා වැඩි විය!

**පිලිප්පියෙහි වහල් තරුණිය : ක්‍රියා 16:16-40.**

සුවය ලැබූ තැනැත්තා : නමක් සඳහන් නොකළාවූ තරුණියක්.

තත්ත්වය : යක්ෂාවේශය. ඇයට පේන කීමේ ආත්මයක් තිබූ අතර ඇගේ ස්වාමිවරු ශාස්ත්‍රකීමට ලාභ ප්‍රයෝජන ගැනීමට ඇයව යෙදෙව්වාය.

සේවකයා : පාවුල්

ක්‍රමය : පාවුල් එම ආත්මයට යේසුස්වහන්සේගේ නාමයෙන් පිටතට ඒමට අණකළ අතර එම පැයේම ආත්මය ඇගෙන් දුරුවිය.

සටහන් : මෙම අවස්ථාවෙහිදී පාවුල් අප්‍රසන්නව (කෝපවී) සහ අනුකම්පාවෙන් යුතුව සේවය කළේය. අප අවට සිටින පුද්ගලයන්ගේ ජීවිත යක්ෂයාගේ ක්‍රියා මඟින් පාලනය වෙනු දුටු කල යක්ෂයාගේ බලයට එරෙහිව අප තුළ කෝපයක් හා අප්‍රසන්න බවක් ඇතිවිය යුතු සේම යක්ෂයාගේ පාලනයට යටත්ව සිටින පුද්ගලයා උදෙසා අනුකම්පාවක් ඇතිවිය යුතුය.

**යුතිකස් : ක්‍රියා 20:7-12.**

සුවය ලැබූ තැනැත්තා : යුතිකස් නම් තරුණයෙක්.

තත්ත්වය : පාවුල් දේශනා කරමින් සිටියදී ඔහු උඩුමහලේ ජනේලයෙන් වැටී මළේය.

සේවකයා : පාවුල් ඇදහිල්ලේ ප්‍රකාශනයක් කළේය. "ඝෝෂා නොකරල්ලා, මක්නිසාද මොහුගේ ප්‍රාණය මොහු තුළ තිබේ." පාවුල් ඔහු ළඟට විත්, ඔහු පිට වැටී, ඔහු වැලඳ ගත්තේය. තරුණයා නැවත ජීවත් විය.

සටහන් : මෙම තරුණයා පිළිබඳ ශුද්ධ ලියවිල්ලෙහි වෙන කිසි ස්ථානයක සඳහන් නොවේ. මේ රාත්‍රිය ඔහුගේ ජීවිතයට කෙලෙස බලපාන්නට ඇතිද? මරණින් නැගිටවීමට පෙර ඔහු දෙවියන්වහන්සේගේ කාරණා සම්බන්ධව අලසව හා එතරම් ඇල්මක් නැතිව සිටින්නට ඇති. පාවුල් දේශනා කරන අතර ඔහුට නින්ද යන්ට ඇත්තේ එබැවින් විය හැක. එනමුත් පසුව ඔහු කෙතරම් උනන්දුවක් දැක්වූවාද යත් මුළු රැය පහන් වන තුරු පාවුල් සමඟ කතා කිරීමෙහි යෙදී සිටියේය.

**පාවුල්ට සර්පයා දෂ්ඨ කිරීම : ක්‍රියා 28:3-6.**

සුවය ලැබූ තැනැත්තා : පාවුල්

තත්ත්වය : විෂ සර්පයා දෂ්ඨ කිරීම.

සේවකයා : කිසිවෙක් නැත.

ක්‍රමය : නොමැත.

සටහන් : පාවුල් සර්පයාව ගිනි ගොඩ වෙත ගසා දැමූ අතර ඔහුට කිසි අනතුරක් නොවීය. අපද දෙවියන්වහන්සේගේ කාර්යයයෙහි නියැලි සිටින අතර එවැනි දිව්‍යමය ආරක්ෂාවක් හා සුවයක් අප තුළ ගලායාමට අවශ්‍යය.

**පබ්ලියස්ගේ පියා : ක්‍රියා 28:8.**

සුවය ලැබූ තැනැත්තා : මෙලිත දිවයිනෙහි ප්‍රධානියාවූ පබ්ලියස්ගේ පියා.

තත්ත්වය : උණ සහ රක්තාතිසාරය

සේවකයා : පාවුල්

ක්‍රමය : පාවුල් යාච්ඤා කොට, ඇතුලට ගොස්, ඔහු පිට අත් තැබීය. ඔහු සුව විය.

සටහන් : මුළු දිවයින පුරා සිටි රෝගීහු පැමිණ සුවය ලැබූහ (ක්‍රියා 28:9).

## ගෝලයන් කණ්ඩායම් ලෙසට සුවකිරීම

**බොහෝ පුදුම සහ ලකුණු : ක්‍රියා 2:42-47.**

මෙම පුදුම සහ ලකුණුවල ප්‍රතිඵලය වූයේ ස්වාමීන්වහන්සේ දිනපතා සභාවට සෙනඟ එකතු කිරීම විය. දෙවියන්වහන්සේ බලය මෙයාකාරයෙන් විදහා දැක්වූ අතර ඇදහිලිවන්තයන්ගේ ජීවන රටාව සලකා බලන්න.

ඔව්හු :

- එක්සිත්ව
- දිනපතා දේව මාළිගාවෙහිදී සහ නිවෙස්වල මෙහෙකරමින්
- යහපත් ඉගැන්වීමෙහි නියැලි
- ස්වාමීන්වහන්සේ කෙරෙහි බියෙන් යුතුව
- සහභාගිකමෙහි
- රොටී කැඩීමෙහි
- යාච්ඤාවෙහි
- සරල ජීවිත ක්‍රමයෙහි
- අවශ්‍යතා තිබූ අය පිළිබඳ සැලකීමෙන්
- යහපත් වාර්තාවක් සහිතව
- මනසෙහි එකඟතාවයෙන් (එක් පරමාර්ථයක් හා දර්ශනයක් ඇතිව)

ජීවත් වූවෝය.

**නිසැක බව සහ සුව කිරීමේ ලකුණු සඳහා යාච්ඤාව : ක්‍රියා 4:23-31.**

සුව කිරීමේ සේවාව නිසා ඇතිවූ පීඩාවෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම යාච්ඤාව ඉදිරිපත් විය. ගෝලයෝ ඉල්ලා සිටියේ වචනය නිර්භීතව කතා කිරීමට හැකිවන පිණිසත් දෙවියන්වහන්සේගේ හස්තය සහ යේසුස්වහන්සේගේ නාමය කරණකොටගෙන සුවවීම්, ලකුණු හා පුදුම මඟින් වචනයෙහි සේවාව ස්ථිර කර දෙන පිණිසත්ය.

**යෙරුසලමෙහිදී බොහෝ දෙනා සුවවීම : ක්‍රියා 5:12-16.**

ලෙඩුන් හා අශුද්ධ ආත්ම නිසා බොහෝ රෝගාතුරවූ පුද්ගලයෝ අත් තැබීම මඟින් හා ගෝලයන්ගේ සෙවණැල්ල වැටීමෙන් පවා සුවවූහ.

**ස්තේපන් බොහෝ හාස්කම් සිදු කරයි : ක්‍රියා 6:8-15.**

ස්තේපන් ඇදහිල්ලෙන් බලයෙන් මහත් ප්‍රඥාවෙන් හා තම වචනයෙන් ආත්මයේ බලය සහිත වූ පුද්ගලයෙක් විය. දෙවියන්වහන්සේ ඔහු තුළින් පුදුමද හාස්කම්ද කළ සේක.

**පිලිප් සමාරියෙහි බොහෝ අය සුව කළේය : ක්‍රියා 8:5-8.**

පුදුම ද ලකුණු ද විදහා දැක්විය. විශේෂයෙන්ම අශුද්ධාත්මයෙන් පිරී සිටි අය අංශභාග රෝගීහු හා කොරු සුව වූ බව සඳහන් කර තිබේ. ශුභාරංචිය සහ දෙවියන්වහන්සේගේ බලය විදහා දැක්ම හේතුවෙන් එම නුවර මහත් සතුටක් ඇති විය. සුවය සහ හාස්කම් පේතෘස් සහ යොහන් හට තවදුරටත් සේවය ඉදිරියට පවත්වා ගෙන යාමට සහාය සපයා දුනි.

**පාවුල් සහ බාර්ණබස් පුදුම සහ ලකුණු සිදු කරයි : ක්‍රියා 14:3.**

මෙම මනුෂ්‍යයෝ නිර්භීතව කතා කළ අතර ස්වාමීන්වහන්සේ වචනයට සාක්ෂි දරමින් පුදුම සහ ලකුණු ඉටු කළ සේක.

**පාවුල් එපිසයෙහි රෝගීහු සුවකරයි : ක්‍රියා 19:11-12.**

පාවුල් එපිසයෙහිදී විශේෂ හාස්කම් කළේය. ඔහු පාවිච්චි කළ අඳනාකඩ සහ ලේන්සු රෝගීන් වෙත ගෙන ගිය විට රෝග සුවවිය, අශුද්ධාත්ම දුරු විය. මුල් කාලීන සභාවෙහි හාස්කම් එතරමටම සුලබ වූ බැවින් මෙහි කතෘ මෙම සිදුවීම් "විශේෂ" හාස්කම් ලෙස සටහන් කළ බව මතක තබාගන්න.

**මෝල්ටාවෙහිදී රෝගීන් සුවවීම : ක්‍රියා 28:8-9.**

පබ්ලියස්ගේ පියා සුවය ලැබූ පසුව අනෙක් රෝගීන්ද සුවය පතා පැමිණියහ. මෙම දිවයිනෙහි ශුභාරංචි ප්‍රචාරය සඳහා සුවකිරීම ඉතා සුදුසු මෙවලමක් විය.

**අමතර : හෙබ්‍රෙව් 2:4.**

දෙවියන්වහන්සේ තම වචනයට සාක්ෂි දරමින් විවිධ වූ ලකුණු, පුදුම හා හාස්කම් සිදු කළ සේක.

## ක්‍රියා පොතෙහි සඳහන් සුවවීම්වලට ලැබූ ප්‍රතිඵල

- මහත් ප්‍රීතිය : 8:5-25
- භය : 2:43
- සභා වර්ධනය : 2:42-47, 5:14
- පුදුමය හා වර්ධනය : 3:10-11
- මහත් නායකයන් නැගිටුවීම : (පාවුල්) : 9:10-19
- ශුභාරංචි ප්‍රචාරය : 4:4, 8:5-25, 9:35-43
- පසු උපදෙස් සේවාවන් : 9:35
- දේව වචනය පැහැදිලි කිරීම : 14:3
- නූගත් වුවත් සේවකයන්ට හා සේවයට හොඳ තක්සේරුවක් ලැබීම : 4:13
- දෙවියන්වහන්සේට ගෞරවය, මහිමය ලැබීම : 4:21
- කිසිම තර්කයකට නැගී සිටිය නොහැකි සාක්ෂිය : 4:14-16
- පේන කියන්නන් මායාකාරයන් ඉවත් කර දැමීම : 8:5-25
- විශාල ජන සමූහයකට එකවර මෙහෙකිරීම : 5:16, 28:8-9
- වැරදි ලෙස දේව නමස්කාරය හා ප්‍රශංසාව, නැවත නිවැරදි කරදීම : 3:12-13, 14:8-18
- නායකයන්ට වචනය දේශනා කිරීම අවස්ථාව : 3,4 හා 7 පරිච්ඡේද
- පීඩාව : මුළු සභාවම පීඩා විඳීම, පාවුල්, සීලස්, ස්තේපන්, පේතෘස්, යොහන් හා යාකොබ්.

# උපග්‍රන්ථය ඈ.

## විශ්ලේෂණ පත්‍රිකාව

යේසුස්වහන්සේ ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයා බැවින්, සුව කිරීමේ හා මිදීමේ සේවාවෙහි උදාහරණය එතුමාය. මෙම පත්‍රිකාව සහ උප ග්‍රන්ථයෙහි ඇති කරුණු භාවිත කරගෙන ඔබගේ අධ්‍යයනය තව දුරටත් පුළුල් කරගන්න.

**1. සුවය සහ මිදීම අවශ්‍ය තැනැත්තා විස්තර කරන්න.**

- ඔවුන්ගේ නම දී ඇත්නම්, කුමක්ද?
- ඔවුන්ගේ වයස කීයද?
- ගැහැණු / පිරිමි බව
- ඔවුන්ගේ සමාජ තත්ත්වය කුමක් වීද?
- ඔවුන්ගේ ජාතිය කුමක්ද?

**2. ඔවුන්ගේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න.**

- අනෙක් අය විසින් එය ප්‍රකාශ කළේ කෙසේද?
- එම පුද්ගලයාම එය ප්‍රකාශ කළේ කෙසේද?

**3. එම පුද්ගලයා යේසුස්වහන්සේගෙන් ඉල්ලා සිටියේ කුමක් කරන ලෙසද?**

**4. යේසුස්වහන්සේ එම පුද්ගලයාගේ ගැටලුවට හේතු පෙන්වා දුන්නාද?**

ඔව් ______________ හෝ නැත ______________ . ඔව් නම්, එය කුමක්ද?

**5. සුවවීමට මුල් වූ පුද්ගලයා කවුද?**

- අවශ්‍යතාවය තිබූ පුද්ගලයා? එසේ නම් ඔහු කළේ කුමක්ද?
- අනෙක් අය? එසේ නම්, ඔවුන් කළේ කුමක්ද?
- යේසුස්වහන්සේ? එසේ නම්, උන්වහන්සේ කළේ කුමක්ද?

**6. සේවය සිදු කළ වේලාව :**

- යේසුස්වහන්සේ කීවේ කුමක්ද?
- යේසුස්වහන්සේ කළේ කුමක්ද?
- යේසුස්වහන්සේ රෝගියාට කිරීමට පැවසුවේ කුමක්ද?
- යේසුස්වහන්සේ අනෙක් අයට කිරීමට පැවසුවේ කුමක්ද?
- සුවය ලැබීම උදෙසා කුමන ආකල්පයක් අවශ්‍යයැයි යේසුස්වහන්සේ කී සේක්ද?
- අවශ්‍යතාවයෙන් සිටි පුද්ගලයා ඇදහිල්ලේ කිසියම් ප්‍රකාශනයක් දැක්වූවාද?
- වෙන කිසිවෙකු ඇදහිල්ල දැක්වූවාද? කෙසේද?

**7. සුවය ලැබූ බවට සාක්ෂි:**

- ශාරීරික ලකුණු මොනවාද?
- එම පුද්ගලයා සුව වීමට දැක්වූ ප්‍රතිචාර කෙලෙසද?
- අනෙක් අය සුවවීමට ප්‍රතිචාර දැක්වූයේ කෙලෙසද?

**8. සුවය දිගටම පවත්වා ගැනීම :**

- යේසුස්වහන්සේ එම පුද්ගලයාට යමක් කිරීමට පැවසුවාද? එසේ නම් කුමක්ද?
- එම පුද්ගලයා කළේ කුමක්ද?

**වෙනයම් අදහස් හෝ යෝජනා :**

# ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු

## පළමුවන පරිච්ඡේදය

1. නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ හඬට නුඹ ඕනෑකමින් ඇහුම්කන් දී උන්වහන්සේගේ ඇස් හමුයෙහි හරිව තිබෙන දේ කොට උන්වහන්සේගේ ආඥාවලට කන්දෙමින් උන්වහන්සේගේ සියලු නියෝග රක්ෂා කරන්නෙහි නම් මිසරවරුන් පිට මා පැමිණෙවූ රෝගවලින් එකක්වත් නුඹ පිටට නොපමුණුවන්නෙමි. මක්නිසාද මම වනාහි නුඹ සුවකරන්නාවූ ස්වාමීන්වහන්සේයයි කී සේක. නික්මයාම 15:26.

2. සියලුම කාරණා බෙදිය හැකි ප්‍රධාන අංග දෙක, එනම් ස්වාභාවික හෝ ආත්මික කාරණාය.
1 කොරින්ති 15:44-49 බලන්න.

3. යක්ෂයාගේ රාජ්‍යය සහ දෙවියන්වහන්සේගේ රාජ්‍යයය.

4. සාතන්, යක්ෂයින්, ලෝකය සහ මාංශය.

5. පියවූ දෙවියන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, ශුද්ධාත්මයාණෝ සහ දේව දූතයෝ.

6. "රජ" යන වචනයෙහි අරුත නම්, කිසියම් ස්ථානයක හෝ ප්‍රදේශයක ස්වෛරී පාලකයා යන්න වේ.

7. රාජ්‍යයක් යනු රජතුමා පාලනය කරන්නාවූ ප්‍රදේශය හා එහි ජනතාවය.

8. ආත්මික යුද්ධ වැදීම යනු අදෘෂ්‍යමාන ආත්මික සටන විශ්ලේෂණය කිරීම හා එහි සජීවීව සහභාගීත්වය දැරීමය. එයට ඇතුලත් කාරණා නම්, යහපත් හා දුෂ්ඨ වූ බලවේග පිළිබඳ අධ්‍යයනය, යක්ෂයාගේ උපක්‍රම හා සතුරාගෙන් ජය ගැනීම සඳහා ආත්මික උපක්‍රම යනාදිය අධ්‍යයනය වේ. ආත්මික යුද්ධ වැදීම මෙලෙස විශ්ලේෂණයට සීමා නොවී, මෙම උපක්‍රම තම ජීවිතයෙහි සහ සේවයෙහි ක්‍රියාශීලීව භාවිත කිරීමෙන් සජීවීව එහි නිරත වෙනු ඇත.

9. මෙම මහත් ආත්මික ගැටුම සඳහා හේතුව වන්නේ සාතන් තවමත් සුපිරි පාලකයා වීමට උත්සාහ දැරීමය. ඔහු මිනිසාගේ ශරීරය, ප්‍රාණය හා ආත්මය උදෙසා දරුණු සටනක නිරතව සිටියි. යක්ෂයාගේ උපක්‍රම එල්ල වී ඇත්තේ දෙවියන්වහන්සේ වෙතට, එතුමාගේ සැලසුම හා එතුමාගේ ජනතාව වෙතටය.

10. අප වටහා ගත යුතු කාරණාව නම්, ජීවිතයෙහි සියලු සටන් එය ශාරීරකවුවද, ආත්මික, හැඟීම්, මානසික, වාණිජමය හෝ මනුෂ්‍යයන් අතර වුවද මේ සියල්ල ආත්මික හේතුවකි. බාහිර පෙන්නුම් කිරීමක් පමණක් බවය. ස්වාභාවික ලෝකයෙහිදී මෙම කාරණා ජීවිතයෙහි වාතාවරණය මඟින් සිදුවූවාක් මෙන් පෙනී ගියද, මෙම ස්වාභාවික සටන්වල පදනම පිහිටා ඇත්තේ ආත්මික ලොවෙහිය.

## දෙවන පරිච්ඡේදය

1. නුඹලා නුඹලාගේ දෙවි වූ ස්වාමීන්වහන්සේට මෙහෙකරන්න. උන්වහන්සේ නුඹේ භෝජනයටත් නුඹේ වතුරටත් ආශීර්වාද කරන සේක. මම නුඹ මධ්‍යයෙන් රෝග ඉවත් කරන්නෙමි. නික්මයාම 23:25.

2. මනෝමය සුවය : මෙය ආත්මකරණකොටගෙන, මායා, ෂාමේන්වාදය හෝ ලබ්ධිවාදී සුවකිරීම් හඳුන්වන ද්‍රව්‍යමය නොවූ මනෝමය ස්වභාවයක් විස්තර කරයි.

   අධිස්වභාවික සුවය : දෙවියන්වහන්සේගෙන් නොවූ අධිස්වභාවික සුවයන් තිබේ. අධිස්වභාවික ක්‍රියා කිරීමට සාතන්ට හැකියාව ඇත (නික්මයාම 7:8-13).

වෛද්‍ය සුවය : මේ වර්ගයේ සුවයන් වෛද්‍යවරුන්, සාත්තු සේවකයන්, රෝහල් සහ ඖෂධ කරණකොටගෙන සිදුවේ. නියමානුකූල වෛද්‍යසුවය දෙවියන්වහන්සේගේ වචනයට පටහැනි නොවන අතර එම සුවය දෙවියන්වහන්සේගෙ යහපත්කම දීර්ඝ කිරීමක් ලෙස විස්තර කළ හැකිවේ.

ස්වභාවික සුවය : ශරීරයේ ක්‍රියාකාරිත්වය තුළින් සිදුවන ස්වභාවික සුවය දෙවියන්වහන්සේගේ ක්‍රියාකිරීමය. ස්වභාවික ශරීරයේ ක්‍රියාකිරීම දෙවියන්වහන්සේගේ ස්වභාවය ප්‍රකාශ කරන අතර මනුෂ්‍ය ශරීරය තුළ උන්වහන්සේගේ ප්‍රබල ක්‍රියාකාරිත්වයට සාක්ෂි දරයි. ස්වභාවික සුවය උදෙසා නිසි ආහාර, ස්වභාවික විටමින් හා ඛනිජ වර්ග එමෙන්ම අවශ්‍ය ප්‍රමාණ විවේකය ආදී ස්වභාවික ක්‍රම ඇතුළත් වේ.

ඇදහිල්ලෙන් සුවය : මෙයින් සාමාන්‍යයෙන් අදහස් කරන්නේ දෙවියන්වහන්සේගේ සුවය වේ. නමුත් මෙම සුවයෙහිදී සුවකිරීමේ මෙහෙයේ නියුක්ත සේවකයාගේ මෙන්ම සුවය ලබාගන්නා තැනැත්තාගේ ඇදහිල්ලටද ප්‍රධාන ස්ථානයක් හිමිවේ.

3. "දිව්‍යමය" යන පදයෙන් අවධානය යොමුවන්නේ දෙවියන්වහන්සේ වෙත මිස මනුෂ්‍යයාගේ ඇදහිල්ලේ ප්‍රතිචාර වෙත මිස මනුෂ්‍යයාගේ ඇදහිල්ලේ ප්‍රතිචාර වෙත නොවේ. එමෙන්ම එය මනෝමය ව්‍යාජධර්ම සුවයන් මෙන්ම අධිස්වභාවික සුවයන්ට වඩා වෙනස් වේ. "දිව්‍යමය සුවය" සිදුවිමේදී සතයවූ එකම දෙවියන්වහන්සේ තමන්වහන්සේ ස්වභාවය එළිදරව් කිරීම, උන්වහන්සේගේ පොරොන්දු සම්පූර්ණ කිරීම සහ ක්‍රිස්තුස්වහන්සේගේ සමගිකිරීමේ පූජාවෙන් ශාරීරික, ප්‍රාණ සහ ආත්මික යන ආකාරයන්ගෙන් සම්පූර්ණ සුවයක් ලබාදීම සිදු කෙරේ.

4. "සුවකිරීම" ශාරීරික, හැඟීම්මය සහ මානසික රෝගවලින් සුවකිරීමත් "නිදහස්කිරීම" යක්ෂාත්ම කරණකොටගෙන ඇතිවූ මානසික හා ශාරීරික තත්වයන්ගෙන් නිදහස් කිරීම අදහස් කෙරේ.

5. යේසුස්වහන්සේ සුවකිරීම සහ නිදහස් කිරීමේ ආඥාවෙන් තොරව කිසිවෙකුට ශුභාරංචිය දේශනා කිරීමට ආඥා කළේ නැත. එය රාජ්‍යයේ ශුභාරංචිය වේගවත්ව ප්‍රචාරය කිරීමේ බලය ප්‍රදර්ශනය කිරීමක් වේ.

## තුන්වන පරිච්ඡේදය

1. මාගේ පුත්‍රය, මාගේ වචනවලට ඇහුම්කන්දී, මාගේ කීම්වලට නුඹේ කන නමාපන්න. ඒවා නුඹේ ඇස් ඉදිරියෙන් පහ නොවේවා, නුඹේ සිත තුළ ඒවා තබාගනින්න. මක්නිසාද ඒවා සම්බවන්නන්ට ඒවා ජීවනයත් ඔවුන්ගේ සකල ශරීරයට සුවයත් වේ. සියල්ලටම වඩා නුඹේ සිත ආරක්ෂාකරගනින්න. මක්නිසාද එයින් ජීවනය නික්මෙන්නේය. (හිතෝපදේශ 4:20-23)

2. ඔව්හු එය නොසැලකූහ, ප්‍රතික්ෂේප කළහ, ප්‍රමාද කළහ, එමෙන්ම එය සම්ප්‍රදායයන් අත්දැකීම් නරක උදාහරණ මගින් සහ අසමබරතාවයන් ව්‍යාකූල කරගත්හ.

3. පරච්ඡේද තුනෙහි එන සාකච්ඡාව බලන්න.

4. පරච්ඡේද තුනෙහි එන සාකච්ඡාව බලන්න.

## හතරවන පරිච්ඡේදය

1. තමා ශාපය බවට පත්වීමෙන් යේසුස්වහන්සේ ව්‍යවස්ථාවේ ශාපයෙන් අප නිදහස් කළ සේක. ගසක එල්ලෙන සියල්ලෝ ශාපලද්දෝයයි ලියා තිබෙන ලෙස, ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා ශාපයක්වී, ව්‍යවස්ථාවේ ශාපයෙන් අප මුදාගත්සේක (ගලාති 3:13)

2. ප්‍රථම මනුෂ්‍යයා සහ ස්ත්‍රියවූ ආදම් සහ ඒව කරණකොටගෙන පාපය නිසා රෝගයත් මරණයත් ලෝකයට ඇතුල්විය.

3. සාතන්

4. සිව්වන පරිච්ඡේදයේ සාකච්ඡාව බලන්න.

5. සිව්වන පරිච්ඡේදයේ සාකච්ඡාව හා ඔබගේ පිළිතුරු සසඳන්න.

6. ඔබගේ ගැලවුම්කාරයාණන් ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිගැනීම රෝගයේ හා මරණයේ ශාපයෙන් ඔබට නිදහස් විය හැකිය.

## පස්වන පරිච්ඡේදය

1. මට විපත්ති පැමිණෙන්ට පළමුවෙන් මුළාව ගියෙමි. නුමුත් දැන් ඔබගේ වචනය පවත්වමි. ඔබගේ පනත් ඉගෙනගන්නා පිණිස මට විපත්ති පැමුණුණා යහපති. ඔබගේ නියෝග කිසිකලක සිහි නැති නොකරන්නෙමි. මක්නිසාද ඔබ එයින් මා ප්‍රාණවත් කළ සේක. (ගීතාවලිය 119:67, 71, 93)

2. පාඩමේ සාකච්ජා කරන ලද රෝගයට හේතු කරුණු පහ මෙසේය.

   - ආත්මික නීතින් කඩකිරීම
   - දෙවියන්වහන්සේගේ ස්වභාවික නීතින් කඩකිරීම
   - සාතන්ගේ පහරදීම්
   - ක්‍රිස්තු ශරීරය නිසිලෙස නොවිමසීම
   - ආත්මය ගැළවෙන පිණිස ශරීරය විනාශ කිරීම

3. පස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව බලන්න.

4. පස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව බලන්න.

5. පස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව බලන්න.

6. පස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව බලන්න.

7. පස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව බලන්න.

## හයවන පරිච්ඡේදය

1. ස්වාමිනි, මම මැලවී සිටිමි. එබැවින් මට කරුණාකළ මැනව. ස්වාමිනි මාගේ ඇට චලිතව තිබේ. එබැවින් මා සුවකළ මැනව. මාගේ ආත්මයද අතිශයින් කැලඹී තිබේ. ස්වාමිනි, ඔබ ප්‍රමාදවන්නේ කොපමණකල්ද? ස්වාමින්වහන්සේ මාගේ කන්නලව්ව ඇසූසේක. ස්වාමින්වහන්සේ මාගේ යාච්ඤාව පිළිගන්නා සේක. (ගීතාවලිය 6:2-3, 9)

2. ආත්මිකව, ශාරීරිකව, මානසිකව, හැගීම්මය සහ යක්ෂාත්ම නිසා ඇතිවන රෝගයන්.

3. ආත්මික රෝගය පාපයයි. එය සමග හරියාකාරව ගනුදෙනු නොකළොත් ආත්මික රෝගය ආත්මිකව මාරාන්තිකය.

4. ශාරීරික රෝග වෛද්‍යවරයෙකු විසින් පරීක්ෂා කර සොයාගත හැකි ඉන්ද්‍රියයන්ගේ අසාමාන්‍ය ක්‍රියාකාරිත්වයට අදාළ ප්‍රශ්නයන් නිසා ඇතිවිය හැකිය. ඉන්ද්‍රීමය අසාමාන්‍ය ක්‍රියාකිරීමකදී නියම සැලැස්ම නැතහොත් ශරීරයේ සෛලමය ආබාධයක් කුමන ආකාරයකින් හෝ සිදුවිය හැකිය. ශාරීරික රෝගය ශරීරයේ කොටසක හෝ ඉන්ද්‍රියක වැරදි ක්‍රියාකාරිත්වයක් ඇති කරවන අසාමාන්‍ය ක්‍රියාකාරිත්වයක් නිසා ඇතිවිය හැකිය. එක ශරීර කොටසක ප්‍රශ්නයක් මුළු ශරීරයේ ක්‍රියාකාරිත්වයට බලපාන ක්‍රියාකාරී අසාමාන්‍ය තත්වයන් බොහෝ තත්වයන් නිසා

හටගැනීමට පුළුවන. මේවා අතරින් හෘදය රෝග අධික රුධිර පීඩනය, දියවැඩියාව, ආමාශයේ තුවාල සහ ඔරොත්තු නොදෙන ප්‍රතික්‍රියාවන් ආදිය ප්‍රධාන වේ.

5. කෝපය, ඊර්ෂ්‍යාව හා තිත්තකම වැනි හානිකර ආවේගයන් නිසා හැඟීම්මය රෝගයන් ඇතිවේ.

6. මානසික රෝග, මන්ද බුද්ධික භාවය, රෝගීබව, මානසික වැටීම්, උත්පත්ති ආබාධ සහ මානසික තත්වයන් වැනි හේතූන් නිසා ඇතිවිය හැකිය. මේවා යක්ෂාත්මවල ක්‍රියාකාරිත්වය හේතුකොටගෙන ඇති නොවන තත්වයන්ය.

7. යක්ෂාත්ම හේතුකොටගෙන ඇතිවන රෝගී තත්වයන්ට යක්ෂාවේශය, පීඩනය, ග්‍රහණය සහ යක්ෂාත්ම නිසා ඇතිවන මානසික හා ශාරීරික තත්වයන් බලපැවැත්වේ.

## හත්වන පරිච්ඡේදය

1. මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි. නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමින්වහන්සේ කියන සේක. (යෙරමියා 29:11)

2. දෙවියන්වහන්සේට මහිමය උදෙසා සහ මරණය සඳහා රෝගයන්.

3. නියම කාලයට කලින් සහ නියම කරන ලද කාලයට මරණය.

## අටවන පරිච්ඡේදය

1. නමුත් උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය. පොඩිකරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය. අපට සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිට පැමිණුණේය. උන්වහන්සේගේ පහරවලින් අපට සුවය ලැබී තිබේ. (යෙසායා 53:5)

2. අටවන පරිච්ඡේදයේ සාකච්ඡාව බලන්න.

3. අටවන පරිච්ඡේදයේ සාකච්ඡාව බලන්න.

4. පහත ශුද්ධ ලියවිලි පාඨවලින් සුවය යේසුස්වහන්සේගේ සමගිකිරීමේ පූජාවේ ප්‍රතිලාභයක් බව සනාථ වේ.

   - යෙසායා 53:4-5
   - 1 පේතෘස් 2:24
   - ගීතාවලිය 103:2-3
   - මතෙව් 8:17

5. අටවන පරිච්ඡේදයේ සාකච්ඡාව බලන්න.

6. සියලුම ඇදහිලිවන්තයන් සුවකිරීමේ හා නිදහස්කිරීමේ මෙහෙයේ නියක්ත විය යුතු බව පහත බයිබල් පද සනාථ කරයි.

   - මතෙව් 10:1-42, 16:17-19, 28:16-20
   - මාක් 6:7-13, 16:14-20
   - ලූක් 9:1-6, 10:1-24, 44-53
   - ක්‍රියා 1:1-11

7. ඔබගේ මූලික අවධානය දේව රාජ්‍යය නම් ඔබගේ අවශ්‍ය සියලු දේ ඔබට සපයා දෙනු ඇත.

- ලැබීම සඳහා ඔබ විසින් දිය යුතුය.
- දෙවියන්වහන්සේ සමග කිසිවක් අපහසු නැත.

## නව වන පරිච්ඡේදය

1. සවස්වූ කල යක්ෂාවේශ වූ බොහෝ දෙනෙක් උන්වහන්සේ වෙතට ගෙනෙන ලද්දෝය. උන්වහන්සේ වචන මාත්‍රයකින් රෝගයන් දුරුකළ සේක. රෝගාතුරවූ සියල්ලන් සුවපත් කළ සේක. මෙසේ වූයේ උන්වහන්සේම අපේ දුර්වලකම් ගත් සේක. අපේ රෝග උසුලාගත්සේකැයි අනාගතවක්තෘ යෙසායා කරණකොටගෙන කියන ලද කාරණාව සම්පූර්ණවන පිණිසය. (මතෙව් 8:16-17)

2. - දෙවියන්වහන්සේගේ චරිතය ප්‍රකාශ කරයි.
   - දෙවියන්වහන්සේ මහිමයට පත්කරයි.
   - දෙවියන්වහන්සේ ගැළවුම්කරු හා මෙසියස්වහන්සේ බව ස්ථිරකරයි
   - පණිවුඩකරුවාත් පණිවුඩයත් සනාථ කරයි.
   - ශුභාරංචිය පිළිගැනීමට උද්‍යෝගිමත් කරයි
   - දේව රාජ්‍යය ස්ථානපනය කරයි
   - සතුරාගේ විනිශ්චය ප්‍රකාශ කරයි
   - ආත්මික නායකයන් නැගිටුවයි
   - ප්‍රතිඵලය මහත් ප්‍රීතියක් වෙයි

## දහවන පරිච්ඡේදය

1. නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. කෙසේදයත්: ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන එක්කෙනෙකුට දැනගැනීමේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන වෙන කෙනෙකුට ඇදහිල්ලද, එම ආත්මයාණන්වහන්සේ තුළ තවත් කෙනෙකුට සුවකිරීමේ දීමනාවද, තවත් කෙනෙකුට ආශ්චර්ය කිරීමද තවත් කෙනෙකුට ධර්මවාක්‍ය කීමද, (1 කොරින්ති 12:7-9)

2. ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ ශුද්ධවූ ත්‍රිත්වයේ කොටසකි.

3. දහ වන පරිච්ඡේදයේ සාරාංශය බලන්න.

4. ආත්මික දීමනාවක් යනු ක්‍රිස්තු ශරීර තුළ සේවය කිරීම පිණිස එම ශරීරයේ අවයවයන් ලෙස ඇදහිලිවන්තයෙකුට ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් දෙනු ලබන අධිස්වභාවික හැකියාවන්ය.

5. දෙවියන්වහන්සේගේ බලය තමන් තුළින් ගලායාමට ඉඩදීමෙන් ස්වභාවික ක්‍රමයන්ට අමතරව තවත් අයෙකුව සුවකිරීම පිණිස සුවකිරීමේ දීමනාවන් සහිත ඇදහිලිවන්තයෙකුට හැකියාව දී තිබේ. සියලුම ඇදහිලිවතුන්ට රෝගීන් උදෙසා යාච්ඤා කිරීමට ආඥාකර ඇති නමුත් දෙවියන්වහන්සේ සුවකිරීමේ දීමනාවන් සහිත ඇදහිලිවන්තයන් විශේෂිතවත් නිරන්තරයෙනුත් මෙම මෙහෙය සඳහා භාවිත කරන සේක.

6. - ඉගැන්වීමේ හා දිරිමත්කිරීමේ
   - ඉගැන්වීමේ හා දිරිමත්කිරීමේ
   - ආත්ම විමසීම
   - දැනගැන්මේ වචනය
   - ඇදහිල්ලේ දීමනාව
   - ප්‍රඥාවේ වචනය
   - භාස්කම් කිරීමේ දීමනාව

7. - පාලකවරු සහ එඬේරුන් (ආත්මික නායකයන්) එසකියෙල් 34
   - වැඩිහිටියන්/උපස්ථායකයන් යාකොබ් 5:4
   - සාමාන්‍ය ඇදහිලිවතුන් ලූක් 16:15-18, යාකොබ් 5:16
   - විශේෂ සුවකිරීමේ දීමනා ඇති අය තුළින් 1 කොරින්ති 1:9

- සම්පූර්ණ සභාව තුළින් (සභාව සුවකිරීමේ මධ්‍යස්ථානයක් විය යුතුය) ලූක් 14:16-24

## එකළොස්වන පරිච්ඡේදය

1. මාගේ ආත්මය ධූලියට ඇලේ. ඔබගේ වචනය ලෙස මා ප්‍රාණවත් කළ මැනව. මාගේ මාර්ග කියා දුනිමි. ඔබ මට උත්තරදුන්සේක. ඔබගේ පනත් මට ඉගැන්වුව මැනව. ඔබගේ නියෝග මාර්ගය මට තේරුම්කර දුන මැනව. එවිට ඔබගේ ආශ්චර්ය ක්‍රියා ගැන භාවනා කරන්නෙමි. ශෝකය නිසා මාගේ ආත්මය දියවේ. ඔබගේ වචනය පරිද්දෙන් මා ශක්තිමත් කළ මැනව. (ගීතාවලිය 119:25-28)

2. පරිච්ඡේදයේ එක එක සම්ප්‍රදායට අදාළ ප්‍රතිචාරයන් බලන්න.

## දොළොස්වන පරිච්ඡේදය

1. ". . . උන්වහන්සේ ද ඔවුන්ගේ කන්නලව්ව පිළිගෙන ඔවුන් සුවපත් කරනවා ඇත." (යෙසායා 19:22)

2. සාතන්ගේ දූතයෙකු බව බයිබලය පවසයි.

3. පාවුල්ගේ මාංසයේ කටුව වූයේ ඔහුට පහර දීමට පැමිණි සාතන්ගේ දූතයෙකි.

4. කටුවට ඉඩ දුන්නේ ප්‍රධාන කරුණු තුනක් සඳහා වේ.

   1. ඉන් පාපය වැළකිණි.
   2. එය අනාවැකි සම්පූර්ණ කළේය.
   3. එය ශක්තිය සැපයිය

5. එය ඔහුට පහරදන්නේය.

6. දොළොස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව නක විවධාකාර විද්‍යමානවීමේ ලයිස්තුව බලන්න.

7. පාවුලුතුමා ඔහුගේ දුර්වලතා ගැන කතා කරන්නේ එය "ශක්තිය අවශ්‍ය වීම, දුර්වලකම, තමාගේම ස්වභාවික හැකියා තුළින් ප්‍රතිඵල පෙන්විමට නොහැකි වීම" ආදිය වේ. මෙම දුර්වලතාව තුළින් දෙවියන්වහන්සේගේ බලය හා ශක්තිය විද්‍යමාන විය.

## දහතුන්වන පරිච්ඡේදය

1. රහස්වූ දේ අපේ දෙවිවූ ස්වාමින්වහන්සේට අයිතිය. එහෙත් මේ ව්‍යවස්ථාවේ සියලු වචන අප විසින් පවත්වන පිණිස එළිදරව්කර තිබෙන දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලයටම අයිතිය. (ද්විතිය කථාව 29:29)

2. "විචලයයක්" යනු වෙනස්කම් හෝ වෙනස් ප්‍රතිඵල ගෙන දෙන සාධකයකි.

3. දහතුන්වන පරිච්ඡේදයේ සාකච්ඡාව බලන්න.

## දහහතරවන පරිච්ඡේදය

1. නුඹලා යමින් ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනා කරපල්ලා. රෝගීන් සුවකරපල්ලා. මළවුන් නැගිටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරපල්ලා. යක්ෂයන් දුරුකරපල්ලා, නුඹලා නොමිලයේ ලැබුවහුය. නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:7-8)

2. ඔබේ පිළිතුරු දහහතරවන පරිච්ඡේදයේ සාකච්ඡාව සමග සසඳන්න.

3. ඔබේ පිළිතුරු දහහතරවන පරිච්ඡේදයේ සාකච්ඡාව සමග සසඳන්න.

## පහළොස්වන පරිච්ඡේදය

1. මක්නිසාද අපට සිටින්නේ අපේ දුර්වලකම්වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව් කිරීමක් නැතුව, සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂාකරනු ලැබූ උත්තම පූජකයෙක්ය. එබැවින් අපට දයාව ලැබෙන පිණිසද අපේ ඕනෑකම්වලදී අපට උපකාරයට අනුග්‍රහය සම්බවන පිණිසද නිසැකකමින් කරුණාවේ සිංහාසනයට ළඟාවෙමු. (හෙබ්‍රෙව් 4:15-16)

2. ඔබේ පිළිතුරු පහළොස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමග සසඳන්න.

3. ඔබේ පිළිතුරු පහළොස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමග සසඳන්න.

## දහසය වන පරිච්ඡේදය

1. එහෙයින් අපි ක්ලාන්ත නොවෙමුව. අපේ පිටත මනුෂ්‍යයා ක්ෂයවෙන නමුත්, අපේ ඇතුල් මනුෂ්‍යයා දවසින් දවස අලුත්කරනු ලබන්නේය. මොහොතකට පවතින අපේ සැහැල්ලුවූ දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලා සිටින්නාවූ අපට, ඉතාමත්ම වැඩි වශයෙන් සදාකාල තේජස් භාරයක් සාදාදෙන්නේය. මක්නිසාද පෙනෙන දේ කාලිකය. නොපෙනෙන දේ සදාකාලිකය. (2 කොරින්ති 4:16-18)

2. ඔබේ පිළිතුරු දහසයවන පරිච්ඡේදයේ සාකච්ඡාව සමග සසඳන්න.

## දහහත්වන පරිච්ඡේදය

1. එකල උන්වහන්සේ දොළොස්දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී (ලූක් 9:1)

2. දුර්වලතාවේ ආත්ම, දූෂිත ආත්ම, අශුද්ධාත්ම

3. යක්ෂාත්ම සමග කටයුතු කරන විට ආත්ම විමසීමේ දීමනාව ඉතා වැදගත් වේ. නපුරු ආත්මයක් යමෙකු තුළ හෝ ඔහුට එරෙහිව හෝ ක්‍රියා කරන්නේද නැද්ද යන්න සැණෙකින් විමසීමට ඉන් ඔබට හැකිවේ. එය දූෂිත හෝ බොරු කීමේ ආත්ම මගින් රැවටීම වළකාලයි. මෙම දීමනාව ඇති අයෙකුට යක්ෂාත්ම බලවේගවල උපක්‍රම හා චේතනාවන් හඳුනාගත හැකිය.

4. යක්ෂාත්මයන්ගෙන් පීඩා විඳීම යනු විරුද්ධවීම, පිටත සිට බැඳීම් ගෙනඒම වේ.

5. ඔබගේ ලයිස්තුව දහ හත්වන පරිච්ඡේදයේ දී ඇති ලයිස්තුව සමග සසඳන්න.

6. යක්ෂාත්ම ගැන වසඟවීම යනු යම් කෙනෙක් යක්ෂාත්ම ගැන විශාල උනන්දුවක් දැක්වීම හෝ යක්ෂාත්ම සමග කටයුතු කිරීම වේ.

7. ඔබගේ පිළිතුර දහ හත්වන පරිච්ඡේදයේ දී ඇති සාකච්ඡාව සමග සසඳන්න.

8. ආවේශවීම යනු නපුරු ආත්ම එකක් හෝ දෙකක් හෝ මනුෂ්‍යයෙකුගේ ශරීරයේ වාසය කරමින් ඔවුන්ට අවශ්‍ය ආකාරයට ඒ තැනැත්තාව සම්පූර්ණයෙන්ම පාලනය කිරීම වේ.

9. ඔබගේ ලයිස්තුව දහ හත්වන පරිච්ඡේදයේ දී ඇති ලයිස්තුව සමග සසඳන්න.

10. ඔබගේ පිළිතුර දහ හත්වන පරිච්ඡේදයේ දී ඇති සාකච්ජාව සමග සසඳන්න.

## දහ අට වන පරිච්ඡේදය

1. තවද උන්වහන්සේ තමන් ගෝලයන් දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, අශුද්ධාත්මයන් දුරුකරන්ට ඔවුන් කෙරෙහිද සියලු ආකාර ලෙඩ සහ සියලු ආකාර රෝග සුවකිරීමටද ඔවුන්ට බලය දුන් සේක. (මතෙව් 10:1)

2. සියලුම නැවත උත්පාදනය ලැබූ කිතුනුවන්

3. දහ අට වන පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න.

4. දහ අට වන පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න.

5. දහ අට වන පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න.

## දහ නව වන පරිච්ඡේදව

1. රෝගීන් සුවකරපල්ලා, මළවුන් නැගිටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා, නුඹලා නොමිලයේ ලැබුවහුය. නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:8)

2. දහ නව වන පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න.

3. දහ නව වන පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න.

## විසි වන පරිච්ඡේදය

1. ස්වාමීන් කෙරෙහි ප්‍රීතිමත්වෙව: උන්වහන්සේද ඔබගේ සිතෙහි ආශාවන් ඉෂ්ටකරනසේක. ඔබගේ මාර්ගය ස්වාමීන්ට භාරදෙව: උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබව. උන්වහන්සේ එය ඉෂ්ටකරන සේක. (ගීතාවලිය 37:4-5)

2. ඔබගේ පිළිතුරු විසිවන පරිච්ඡේදයේ සාකච්ජාව හා සසඳන්න.